බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 2 (2)

# විනය පිටකයෙහි

02 වන ග්‍රන්ථය

(ද්විතීය භාගය)

# පාචිත්තිය පාළි

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්
ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහානායකධුරන්ධර
විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය
**ඉඳුරුවේ උත්තරානන්දාභිධාන**
මහාස්ථවිරයන්වහන්සේ විසින් කරන ලද
සිංහල පරිවර්තනය

---

ත්‍රිපිටක පරිවර්තන සම්පාදක මණ්ඩලය විසින්
සංශෝධිත වැ

---

ශ්‍රී බු. ව. 2549
රාජ්‍ය ව. 2005

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series- Volume 2 (ii)

The Second Book in the

**Vinaya-Pitaka**

**2**

# PĀCITTIYAPĀLI (II)

With the Sinhala translation by


**Venerable Vidyāvisārada Pandita**
**Induruwe Uttarānanda**
Mahānāyaka Thera of
Sri Lanka Ramañña Nikāya


Revised and edited by

**The Editorial Board of**
**The Thripitaka Translation Committee**

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## <u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
## <u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
## <u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**“අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”**

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග එල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 28 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:28 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

## විනයපිටකෙ

# පාචිත්තියපාළි

## භික්ඛුනීවිභඞ්ගො

## විනයපිටකයෙහි

# පාචිත්තියපාළි

## භික්ඛුනීවිභඞ්ගය

Free Distribution www.aathaapi.org

''තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.''

''මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි.''

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)



Free Distribution www.aathaapi.org

## පටුන
## CONTENTS


| | පිටුව |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | xiii–xiv |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... | xv |
| ප්‍රස්තාවනා ... ... ... | xvii–xxxii |
| සංකේත නිරූපණය ... ... ... | xxxiii |
| පාළි හෝඩිය ... ... ... | xxxv |
| පාචිත්තිය පාළි – භික්ඛුනීවිභඞ්ග විසය සූචිය ... | xxxvii–xxxx |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2–383 |
| ගාථාදිපාද – අනුක්කමණිකා ... ... | — |
| සංඥානාම – අනුක්කමණිකා ... ... | 385 |
| විසෙසපදනුක්කමණිකා ... ... ... | 387-392 |
| ශුද්ධාශුද්ධ නිරූපණය ... ... ... | 393 |




Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක පයර්‍යාප්තියට ඇතුළත් විනයපිටකයෙහි ග්‍රන්‍ථ පඤ්චකයෙන් දෙවැනි පොත වූයේ **පාචිත්තියපාළි** යයි. එය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්‍ථමාලාවෙහි ද දෙවැනි ග්‍රන්‍ථය ලෙස මුද්‍රණය කරවීමට සම්මත වැ තිබිණ. එහෙත් මුද්‍රණ අවස්ථාවට පැමිණි පසු තිසි තැන ඡේද වෙන් කොට සිංහල අනුවාදය සමග මුද්‍රණය කිරීමෙහි දී පරිහරණයට පහසු නො වන සේ ග්‍රන්‍ථය මහත් වැ යන බව පෙනුණු හෙයින් කාණ්ඩ දෙකක් වශයෙන් මුද්‍රණය කරවන්නට සිදුවිය. එහි භික්ඛුවිභඞ්ගය අවසාන කොට ඇති ග්‍රන්‍ථප්‍රදේශය ප්‍රථමභාගය කොට මුද්‍රණය වී ඇත. මේ ද්විතීය භාගයෙහි 'භික්ඛුනීවිභඞ්ගය' බැසගෙන සිටියේ ය.

මේ ග්‍රන්‍ථයෙහි ද ශෝධනයට පැමිණි තැන් පාඨාන්තරානුසාරයෙන් දතහැකි වෙයි. එහෙත් විශේෂයෙන් මෙහි සඳහන් කළයුතු තැන් කිහිපයෙක් ඇත: 62 වැනි පිට – "බුද්ධං පච්චක්ඛාමි" යනාදියෙහි මුද්‍රිත සිංහලාක්ෂර ග්‍රන්‍ථයන්හි ද, ඡට්ඨසංගීති ශොධනයෙහි ද "පච්චාචික්ඛාමි" යි පෙළෙහි යොදන ලද වෙයි. අප විසින් එය බැහැර කොට මහාවිභඞ්ගයෙහි ආ ලෙසින් හැම තන්හි "පච්චක්ඛාමි" යන රූපය යොදන ලද්දේ යැ. 270 පිට – "නිමන්තිතෙ නිමන්තිත-සඤ්ඤා" යනාදි වාක්‍යප්‍රදේශය සිංහල මුද්‍රිත පොත්වල දක්නට නැත. එහෙත් ශික්ෂාපදාන්තරයන් හා ගැළපෙන හෙයින් ද, ඡට්ඨසංගීති ග්‍රන්‍ථයෙහි ඇති හෙයින් ද පාඨාන්තර වශයෙන් යොදනුම්හ. 284 පිට – ගබ්භිනීවුට්ඨාපන ශික්ෂාපදයෙහි: "තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙන්ති. සා පිණ්ඩාය චරති" යනාදි පාඨයෙහි සිංහල පොත්වල "තා පිණ්ඩාය චරන්ති" යි බහුවචන නිර්දෙශය ඇත. එ ද යුක්ති සලකා "සා පිණ්ඩාය චරති" යි එකවචන නිර්දෙශයෙන් පාඨශෝධනය කරන ලද්දේ ය. මෙබඳු ශෝධිතස්ථාන සලකන්නෝ මැනැවි.

ශ්‍රී ලඞ්කාරාමඤ්ඤනිකායේ මහානායකපදප්‍රාප්ත විද්‍යාවිශාරද රාජකීය පණ්ඩිත ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය ඉඳුරුවේ උත්තරානන්දාභිධාන මහාස්ථවිරයන් වහන්සේ විසින් සිංහල භාෂායෙන් පරිවර්තන කරන ලද පාචිත්තියපාළි භික්ඛුනීවිභඞ්ගය ද වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙහි බහුශ්‍රැත මහතෙරවරුන් විසින් සංස්කරණය කරන ලදු වැ ආවශ්‍යක ශබ්දසූචි ආදිය ද සම්පාදනය කොට අප ගේ ද පරිශ්‍රමයෙන් පාඨශෝධනාදිය කොට මේ පාචිත්තියපාළි ද්විතීය භාගය ද පළ කරවන්නට හැකි වූ බව පවසම්හ.

මේ අධිකාරයෙහි ලා අනුග්‍රාහක වූ අතිගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති උතුමාණන් ද ගරු සංස්කෘතික අමාත්‍ය තැන්පත් ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන් ද කෘතවෙදී වැ සඳහන් කරම්හ. මෙහි ලා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම් තැන්පත් සෝමපාල ජයවර්ධන මහතාණන් දක්වන ලද උද්‍යොගය කෘතඥතා පූර්වක වැ සිහිපත් කළයුතු වේ.

තවද ආරම්භක බෞද්ධමණ්ඩලයෙහි සුධීන් හා ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයට රැදහවලැ වෙහෙස නො බලා පහසුකම් සලසා දෙන මහානායක වජිරාරාමයෙහි නියුක්ත ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතා ද, තිසර මුද්‍රණාලයාධිකාරීන් හා තත් සේවක මණ්ඩලය ද මෙහි ලා සිහිපත් කරම්හ. පර්‍ය්‍යාප්තිශාසනප්‍රවර්තක වූ කුශල හෙතුයෙන් හැම දෙන සුඛභාගී වෙත්වා'යි ආශංසනය කරම්හ.

මෙවගට, ශාසනොදයකාරී,
ලබුගම ලඞ්කානන්ද
මහානායකස්ථවිර

1981 අගෝස්තුමස 22 දින
ත්‍රිපිටක කාර්‍ය්‍යාලයේ දී ය.
115, වජිරාරාම මාවත,
කොළඹ 7.



Free Distribution www.aathaapi.org

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝ සභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ—මාකඩවරවිහාරාධිපති, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි, ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීය පණ්ඩිත, උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ.

කරුණු මෙසේ හෙයින් ආභිසමාචාරික වූත් ආදිබ්‍රහ්මචරියක වූත් ශීලය අධිශීලය නමින් විනයෙහි පැවසෙන බව දතයුතු යි. මෙසේ සලකන කල්හි පරිජි - පචිති දෙගත්හි ඇතුළත් සිකපදත් මහවග - සුළුවග දෙගත්හි ඇතුළත් සිකපදත් අධිශීලයට අයත්බව මැනැවින් හෙළි වෙයි. මේ සිකපදයන් අතුරෙන් කොටසක් **චාරිත්‍ත** විසින් ද කොටසක් **වාරිත්‍ත** විසින් ද පිරියයුතු නු යි සකල විනය පිටකය ම මුලින් කී පරිදි ලෞකික ප්‍රාතිමෝක්‍ෂසංවර **ශීලයට** අයත් වෙයි. ප්‍රාතිමෝක්‍ෂසංවර **ශීලය** ද **චාරිත්‍ත - වාරිත්‍ත** විසින් දෙපරිදි කොට දක්වන ලදි. මෙහි **චාරිත්‍ත** නම් භාග්‍යවතුන් වහන්සේ විසින් කළයුතු යැ යි පනවා වදළ දය කිරීමෙන් පිරියයුතු **ශීලය** යි. **''චාරිත්‍තනාති චරිත්වා පරිපූරෙතබ්බ සීලං''** යනු කී හෙයින් කිරීමෙන් පිරියයුතු ශීලය බව හෙළි වෙයි. **වාරිත්‍ත** නම් භාග්‍යවතුන් වහන්සේ විසින් නො කළ යුතු යැ යි පනවා වදළ දය නොකිරීමෙන් පිරියයුතු ශීලය යි. **''වාරිත්‍තනාති විරතියා අකරණෙන පරිපූරෙතබ්බ සීලං''** යනු ප්‍රකාශිත හෙයින් වෙන්වීමෙන් වරද නො කිරීමෙන් පිරියයුතු ශීලය යි. විනයෙහි වදළ සියලු සිකපදයන් මේ දෙකට ඇතුළත් වන බැවින් සකල විනයපිටකය ම ප්‍රාතිමොක්‍ෂසංවර ශීලය යි පවසන ලද බව සැලකිය යුතු යි.

කරුණු මෙසේ හෙයින් මේ ප්‍රාතිමොක්‍ෂසංවරශීලය **අධිසීල** නමිනුත් බැවහර කරන ලද බව මෙහි ආදියෙහි ම සඳහන් කරන ලදි. **''සද්ධාපපධානං පාතිමොක්ඛසංවරසීලං''** යනු කී හෙයින් ශ්‍රද්ධාව ප්‍රධාන කොට ඇති ප්‍රාතිමොක්‍ෂසංවරශීලයත් **''සතිපපධානං ඉන්ද්‍රියසංවරසීලං''** යනු කී හෙයින් සිහිය ප්‍රධාන කොට ඇති ඉන්ද්‍රිය සංවර ශීලයත් **''විරියපපධානං ආජීවපාරිසුද්ධිසීලං''** යනු කී හෙයින් වීර්‍ය්‍ය ප්‍රධාන කොට ඇති ආජීව පාරිශුද්ධිශීලයත් **''පඤ්ඤාපපධානං පච්චයසන්නිස්සිතසීලං''** යනු කී හෙයින් ප්‍රඥාව ප්‍රධාන කොට ඇති ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයත් යන සිවු පිරිසුදු සිල් රැකීම සතර අපාය දුකින් හා ආත්මානුවාද භීතියෙන් මුදලන බැවින් ප්‍රාතිමොක්‍ෂසංවරශීලය ම බව ධර්මවිනයෙන් මැනවින් හෙළිපෙහෙළි වෙයි.

**සුත්තවිභඞ්ග**

විනයපිටකයට ඇතුළත් **භික්ඛු** විභඞ්ගයත් **භික්ඛුණී** විභඞ්ගයත් යන උභතොවිභඞ්ගය ම **සුත්තවිභඞ්ග** නාම යෙනුදු හඳුන්වනු ලැබේ. මෙහි **සුත්ත** නම් බුද්ධප්‍රඥප්ත ශික්‍ෂාපදය යි. **විභඞ්ග** නම් පදභාජනීය යි. සූත්‍ර සංඛ්‍යාත ශික්‍ෂාපදයත් විභඞ්ග සංඛ්‍යාත ඒ ඒ සිකපදයන්ගේ පදභාජනීයත් දෙක ම **සුත්තවිභඞ්ග** යැ යි දත යුතු යි. ඒ මේ සුත්තවිභඞ්ගය පාරාජික පාළි - පාචිත්තිය පාළි යනු විසින් ග්‍රන්ථ දෙකෙකින් පරිමිත යි. එහෙයින් පාරාජික පාළියෙහි පාරාජිකාදි ඒ ඒ සිකපදයන් හා ඒ සිකපදයන් පද පිළිවෙළින් බෙද අර්ථ විවරණය කරනලදුවූ භාග්‍යවතුන් වහන්සේ විසින් ම තබන ලද පද-භාජනියත් ප්‍රමුඛත්වයෙන් ගෙන **සුත්තවිභඞ්ග** නාමය පාරාජික පාළියට හා පාචිත්තිය පාළියට ආරොපිත යි. එහි පාරාජික පාළියෙහි **පාරාජික - සඞ්ඝාදිසෙස - අනියත - නිස්සග්ගිය** විසින් සිකපදයෝ නවසාලිස් කෙනෙක් වෙති. ඒ සිකපද නවසාලිසෙහි පදභාජනිය ද එහි ඇත. මේ සියල්ල ම **භික්ඛු** විභඞ්ගයට පමණක් ඇතුළත් වෙයි. එසේ ම **භික්ඛු** විභඞ්ගයට ඇතුළත් **පාචිත්තිය - පාටිදෙසනීය - සෙඛිය - අධිකරණසමථ** විසින් සිකපදයෝ එක්සිය අටසැත්තෑ කෙනෙක් ද, **භික්ඛුණී** විභඞ්ගයට



Free Distribution www.aathaapi.org

ඇතුළත් පාරාජික - සඞ්ඝාදිසෙස - නිස්සග්ගිය - පාචිත්තිය - පාටිදෙසනීය - සෙඛිය - අධිකරණසමථ විසින් සිකපදයෝ තෙසියසතර කෙනෙක් ද වෙති. මේ සියල්ලමත් සුත්තවිභඞ්ගයට අයත් වෙයි. ග්‍රන්ථ විසින් පාචිත්තියපාළියට ඇතුළත් වෙයි. මේ නයින් විමසන විට සුත්තවිභඞ්ගය උභතො විභඞ්ග නම් වෙයි. **"සුත්ත විභඞ්ගෙති පදභාජනියෙ"**[1] යනු ටීකාගතවචන බැවින් පදභාජනියට පමණක් ද සුත්තවිභඞ්ග යනු බැවහර වෙයි. සිකපදයක් පාසා පදබෙදීම කොට ඇති බැවින් පදභාජනියට ඒ නාමය ද ගැළපෙන බව පැනෙයි. උභතො විභඞ්ග පරියාපන්න සිකපද සියල්ල ම බුද්ධප්‍රඥප්ත හෙයින් **සෙක්ඛ පණ්ණත්ති** නම්හු හඳුන්වත්. මෙහි හික්මිය යුතු බැවින් සිකයම **සෙක්ඛ** නම්. ඒ සෙක්ඛ සංඛ්‍යාත ශික්ෂාව භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද බැවින් **සෙක්ඛ පණ්ණත්ති** නමු. **"සබ්බාපි උභතො විභඞ්ගපරියාපන්නා සික්ඛාපද පණ්ණත්ති සෙක්ඛපණ්ණත්තීති වුත්තාති ගහෙතබ්බා"**[2] යනු එහෙයින් කියන ලදී:

**සත්තාපත්ති** භාග්‍යවතුන් වහන්සේ විසින් සුත්තවිභඞ්ගයෙහි ලා පනවා වදළ ආපත්ති සතෙක් වෙයි. එනම් **පාරාජික** යැ **සඞ්ඝාදිසෙස** යැ **ථුල්ලච්චය** යැ **පාචිත්තිය** යැ **පාටිදෙසනීය** යැ **දුක්කට** යැ **දුබ්භාසිත** යි. මෙහි පාරාජිකාපත්තිය පළමුවැන්න යි. මේ ආපත්ති සතෙහි **පාරාජික** නම් පරාජිත වීම යි. පරාජයට පැමිණීම යි. **"පාරාජිකොති පරාජිතො පරාජයං ආපන්නො"**[3] යනු අර්ථකථාගත වචන හෙයිනි. මෙහි **පරාජිතො** යන පදය ම **පාරාජිකො** යනු විසින් සිද්ධ යි. **පරා** උපසර්ගයෙහි **ප** කාරස්ථ අකාරයට වෘද්ධිය ද, **ඉ** කාරාගමය ද කර්මාර්ථයෙහි කළ **ත** ප්‍රත්‍යයට **ක** කාරය ද කොට සිද්ධ කිරීම ශාබ්දිකයනට අභිමත යි. මේ වනාහි පුද්ගලවාචක **පාරාජික** ශබ්දය බැවිනි. ශික්ෂාපදවාචක වූ ද ආපත්තිවාචක වූ ද **පාරාජික** ශබ්දය කර්තෘකාරකයෙහි කළ **ක** ප්‍රත්‍යයෙන් සිද්ධවන බව ද සැලකිය යුතු යි. කරුණු මෙසේ හෙයින් **පාරාජික** ශබ්දය ශික්ෂාපද - ආපත්ති - පුද්ගලයන් කෙරෙහි පවත්නා බව ද පැනෙයි. **"අට්ඨානමෙතං ආනන්ද අනවකාසො යං තථාගතො වජ්ජීනං වා වජ්ජිපුත්තකානං වා කාරණා සාවකානං පාරාජිකං සික්ඛාපදං පඤ්ඤත්තං සමූහනෙය්‍ය"** යන තන්හි මෙන් පාරාජික ශබ්දය සිකපදයෙහි පවතී. **"ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකං"** යන තන්හි මෙන් ආපත්තියෙහි පවතී. **"න මයං පාරාජිකා, යො අවහටො සො පාරාජිකො"** යන තන්හි මෙන් පුද්ගලයා කෙරෙහි පවතී. මෙසේ පාරාජික ශබ්දය ශික්ෂාපද - ආපත්ති - පුද්ගල යන තුන් තන්හි පවතී යැ යි දත යුතු යි. සිකපදය පාරාජික නාමය ලබන සැටි **"යො තං අතික්කමති තං පරාජෙති තස්මා පාරාජිකන්ති වුච්චති"** යන්නෙන් ප්‍රකාශිත යි: යමෙක් ඒ සිකපදය ඉක්ම යේ නම් ඔහු පරදවයි. ඒ කාරණයෙන් සිකපදය **පාරාජික** නම් වේ යැයි කියනු ලැබේ. ආපත්තිය පාරාජිකනාමය ලබන සැටි **"යො තං අජ්ඣාපජ්ජති තං පරාජෙති, තස්මා පාරාජිකන්ති වුච්චති"** යන්නෙන් ප්‍රකාශිත යි, යමෙක් ඒ ඇවතට පැමිණේ නම් ඔහු පරදවයි. ඒ කරුණෙන් ආපත්තිය පාරාජිකා නම් වේ යැයි කියනු ලැබේ. පුද්ගලයා පාරාජික නාමය ලබන සැටි **"පුග්ගලො

1. විමතිවිනොදනීටීකා 482 පිටුව
2. විමතිවිනොදනීටීකා 372 පිටුව
3. සමන්තපාසාදිකා 185 පිටුව



Free Distribution www.aathaapi.org

යස්මා පරාජිතො පරාජයමාපන්නො, තස්මා පාරාජිකොති වුච්චති'' යන්නෙන් ප්‍රකාශිත යි. පුද්ගලයා යම් කරුණෙකින් පරදවනලද්දේ පරාජයට පැමිණියේ නම් ඒ කරුණෙන් පුද්ගලයා පාරාජිකයෙකු යි කියනු ලැබේ. මේ අර්ථය ම සඳහා පරිවාර පාළියෙහි ද:

''පාරාජිකන්ති යං වුත්තං තං සුණොහි යථාතථං
චුතො පරද්ධො භට්ඨො ච සද්ධම්මා හි නිරඞ්කතො
සංවාසො ච තහිං නත්ථි තෙනෙතං ඉති වුච්චති''

යනු වදළහ. ආපත්තිය පාරාජිකා යැයි යමක් කියන ලද නම් තතු පරිදි එය අසව. සිකපදය ඉක්ම වූ ඇවතට ද පැමිණි පුද්ගලයා යම් කරුණෙකින් පරාජිත වේ ද චුත වේ ද ත්‍රිවිධ සද්ධර්මයෙන් භ්‍රෂ්ට වූයේත් වේ ද පොහෝපවාරණාදි සඞ්ඝකර්මයෙන් දුරු කෙළේත් වේ ද ඔහු හා එකකර්මාදිසංවාසය නැතියේත් වෙයි. ඒ කාරණයෙන් මේ ආපත්තිය **පාරාජිකා** නමැයි කියනු ලැබේ. මේ සිකපදය පාරාජික නමැයි කියනු ලැබේ. මේ පුද්ගලයා පාරාජික යැයි කියනු ලැබේ යනු මෙහි අදහස යි.

සඞ්ඝාදිසෙසාපත්තිය දෙවැන්න යි. ආපත්තියෙන් නැඟීසිටීම සඳහා මුල මැද අග යන තුන්තන්හි ම සඞ්ඝයා කැමති විය යුතු නු යි **සඞ්ඝාදිසෙස** නම් වෙයි. **''සඞ්ඝො ආදිම්හි චෙව සෙසෙ ච ඉච්ඡිතබ්බො අස්සාති සඞ්ඝාදිසෙසො''** යනු අටුවාහි එහෙයින් කියන ලදි. මේ අදහස වැඩිදුරටත් මෙසේ පැහැදිලි කරන අර්ථකථාව **''ඉමං ආපත්තිං ආපජ්ජිත්වා වුට්ඨාතු කාමස්සයන්තං ආපත්තිවුට්ඨානං, තස්ස ආදිම්හි චෙව පරිවාසදානත්ථාය ආදිතො සෙසෙ මජ්ඣෙ මානත්තදානාය මූලාය පටිකස්සනෙන වා සහමානත්තදානත්ථාය, අවසානෙ අබ්භානත්ථාය ච සඞ්ඝො ඉච්ඡිතබ්බො''**[1] යනාදිය දක්වයි. මේ ඇවතට පැමිණ නැඟීසිටුනා පිසියහුට යම් ඒ ඇවතින් නැඟීසිටීමෙක් වේ ද, ඒ නැඟීසිටුමට මුල දී ම පිරිවෙස් දීම පිණිස ද මුලින් ශේෂ වූ මධ්‍යයෙහි මානත දීම පිණිස ද මුලට ඇදීමකින් හෝ එය හා මානත දීම පිණිස ද, අවසන්හි අබ්භානය පිණිස ද සඞ්ඝයා කැමැති විය යුත්තේ යි. මෙහි ලා එක ද කර්මයක් සඟුන්ගෙන් වෙන් ව කළ නො හැකි නු යි ආදියෙහි ද ශේෂ යැයි කියූ මැදහි ද අවසන්හි ද මේ ඇවතින් නැඟී-සිටුමට සඞ්ඝයා කැමැති වියයුතු මැ යි. එහෙයින් ම **''සඞ්ඝොව තස්සා ආපත්තියා පරිවාසං දෙති, මූලාය පටිකස්සති, මානත්තං දෙති, අබ්භෙති, න සම්බහුලා න එකපුග්ගලො, තෙන වුච්චති සඞ්ඝාදිසෙසොති''**[1] යනු කීහ. සඞ්ඝතෙමේ ම ඒ ඇවතට පිරිවෙස දෙයි. මුලට අදියි. මානත දෙයි. අබ්භානය කරයි. දෙතුන් නමක්වත් එක් නමක්වත් නො කරයි. එහෙයින් මේ ඇවතට **සඞ්ඝාදිසෙස** යැ යි කියනු ලැබේ.

පරිවාරයෙහි ද:

''සඞ්ඝාදිසෙසොති යං වුත්තං තං සුණොහි යථාතථං
සඞ්ඝොව දෙති පරිවාසං මූලාය පටිකස්සති
මානත්තං දෙති අබ්භෙති තෙනෙතං ඉති වුච්චති''

යනු වදළහ, සඞ්ඝාදිසෙස යැ යි යමක් කියන ලද නම් තතු පරිදි එය අසව. සඞ්ඝයා ම පිරිවෙස ද මුලට ඇදීම ද මානත දීම ද අබ්භානය ද දෙන බැවින් මේ ඇවතට **සඞ්ඝාදිසෙස** යැ යි කියනු ලැබේ යනු මෙහි අදහස යි.

---

1. සමන්ත පාසාදිකා, 370-71 පිටු
2. සමන්තපාසාදිකා - 371 පිටුව



Free Distribution www.aathaapi.org

ථුල්ලච්චයාපත්තිය තෙවැන්න යි. ථුල්ලච්චය නම් දේශනාගාමිනී ආපත්තීන් අතුරෙන් මහත්ම වරද යි. **''ථූලො ච සො අච්චයො චෙති ථුල්ලච්චයො''** යනු කර්මධාරය සමාසවාක්‍ය බැවින් ථූල වූයේත් හේ ම නු යි අච්චය වූයේත් හේ ම නු යි **ථුල්ලච්චය** නම් වෙයි. ලකාර ද්විරූප වීමෙන් හා **පූර්ව** ඨකාරස්ථ ඌකාරය හ්‍රස්ව වීමෙන් **ථුල්ලච්චය** යනු සිද්ධ යි. මේ ආපත්තිය උභයවිභඞ්ගයෙහි ගරුකාපත්තීන්ගේ **පූර්වභාග**යෙහි ද ඛන්ධයන්හි ද ඇතුළත් ව ඇති බව පෙනේ.

**''ථුල්ලච්චයන්ති යං වුත්තං තං සුණොහි යථාතථං**
**එකස්ස මූලෙ යො දෙසෙති යො ච තං පතිගණ්හති**
**අච්චයො තෙන සමො නත්ථි තෙනෙතං ඉති වුච්චති''**

යන පරිවාරපාළිගාථාවෙන් පවසන අදහස ද මෙහි ලා සැලකියයුතු යි. **ථුල්ලච්චය** යැ යි යමක් කියන ලද නම් තතුපරිදි එය අසව. යමෙක් එක් මහණෙක්හුගේ සමීපයෙහි දෙසා ද යමෙක් එය පිළිගනී ද එය හා සම වූ දෙසීමෙන් පිරිසිදු වන ඇවැතෙක් නැති ද එහෙයින් මේ ඇවැත **ථුල්ලච්චය** නමැ යි කියනු ලැබේ යනු අදහස යි.

පාචිත්තියාපත්තිය සතරවැන්න යි. මෙහි **පාචිත්තිය** යන්නෙන් නිසඟිපචිති හා ශුද්ධපචිති අදහස්කරනු ලැබේ. නිසඟි වූ වස්තුව පළමු-කොට නිසදා පසු වැ දෙසියයුතු පචිති ඇවැත් නිසඟිපචිති නම්. එසේ නිසැඳීමක් නැති වැ දෙසිය යුතු පචිති ඇවැත් ශුද්ධපචිති නම්. මේ දෙකොටස ම පචිති ඇවැත් දෙසීමෙන් පිරිසිදු වන බැවින් පාචිත්තියාපත්තියට ඇතුළත් වෙති. **පාචිත්තිය** යන වචනයෙහි **''කුසලං ධම්මං පාතෙතීති පාචිත්තියං''** යන නිරුක්ති වන බැවින් කුශල ධර්මය හෙළා නු යි පාචිත්තිය නම් වේ. මෙහි අදහස පරිවාරපාළියෙහි දූ:

**''පාචිත්තියන්ති යං වුත්තං තං සුණොහි යථාතථං**
**පාතෙති කුසලං ධම්මං අරියමග්ගමපරජ්ඣති**
**චිත්තසම්මොහනට්ඨානං තෙනෙතං ඉති වුච්චති''**

යන්නෙන් වදළහ. පාචිත්තියැ යි යමක් කියන ලද නම් තතු පරිදි එය අසව. කුසලධර්මය හෙළා නු යි ආර්යමාර්ගය වරදවා නු යි සිත මුළාකරන කරුණෙක් නු යි මේ ඇවැත **පාචිත්තිය** නමැයි කියනු ලැබේ යනු මෙහි අදහස යි. උභය විභඞ්ගයෙහි නිසඟි පචිති තිසක් ද, **භික්ඛුවිභඞ්ගයෙහි** ශුද්ධපචිති අනූදෙකක් ද, **භික්ඛුණීවිභඞ්ගයෙහි** ශුද්ධපචිති එක්සිය හැටහයක් ද ඇතුළත් වෙයි. මේ සියල්ල ම **පාචිත්තියාපත්තිය** නමින් සප්තාපත්තිකයෙහි ලා සැලකියයුතු යි.

පාටිදෙසනීයාපත්තිය පස්වැන්න යි. මෙහි **පාටිදෙසනීය** නම් **''පටිදෙසෙතබ්බං පාටිදෙසනීයං''** යනු කී හෙයින් ප්‍රතිදෙශනයට යුතු ඇවැතෙකි. **''ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී''** යි සිකපදයෙහි ම ප්‍රතිදෙශනාකාරය දක්වන ලද බැවින් මේ ගාරය්හාපත්තිය **පාටිදෙසනීය** නමින් ම වදළහ. මේ ආපත්තිය පරිවාරපාළියෙහි පැහැදිලි කොට ඇති සැටියෙන් ඇවැතට විෂය වූ කරුණු සියල්ල ම ඇරැපැමෙන් විවරණය කළයුතු බව පෙනේ. හේ මෙසේ ය.

නොනෑ මෙහෙණක විසින් දූතයේ ලත් බොජුනක් තමා මැ සියතින් පිළිගෙන වළඳන මහණහට ගැරහිය යුතු වෙයි. නිමැතුමක් ලත් ගෙවල්හි වළඳන මහණුන්ගෙන් එක් නමක්වත් එහි දත්



Free Distribution www.aathaapi.org

බෙදීමට විධාන කරන මෙහෙණක වුවහොත් ඇය ඉවත් නොකොට දන් වළඳන මහණහට ද ගැරහිය යුතු වෙයි. මද සම්පත් ඇති සැදැහැති දිළිඳු සෙඛ සම්මුතිය ලත් කුලයකට ගොස් නො ගිලන් වැ දන්වළඳන මහණහට ද ගැරහිය යුතු වෙයි. සැක බිය සහිත වන සෙනසුනෙක්හි වසමින් කලින් නො දන්වා ලත් බොජුනක් වළඳන මහණහට ද ගැරහිය යුතු වෙයි. මෙසේ භික්ෂූන් උදෙසා පනවන ලද **ගාරය්හාපත්ති** සතරෙක් වෙයි. තව ද භික්ෂුණීන් අරභයා පනවා වදළ ගාරය්හාපත්ති අටෙකි. නො නැ වූ ම මෙහෙණක් මෙරමා තමාසතු යැ යි මමායනය කළ ගිතෙල් හෝ තෙල් හෝ මී හෝ උක්පැණි හෝ දියමස් හෝ ගොඩමස් හෝ කිරි හෝ දී හෝ වළඳන මෙහෙණහට ද ගැරහිය යුතු වෙයි. ගැරහිය යුතු මේ සියල්ල ම **පාටිදෙසනීයාපත්ති** නමින් වදළහ. මේ ආපත්තිය ද දෙශනාගාමිනී ඇවැත් ගණයට ඇතුළත් වෙයි.

දුක්කටාපත්තිය සවැන්න යි. මෙහි දුක්කට නම් ''දුට්ඨු කතං දුක්කටං'' යනු කී හෙයින් නපුරු කොට කරනලද්ද යි. බුදුන් වදළ ක්‍රමයට නො කොට වරදවා කරන ලද්ද යි. මෙමැ කීහ.
**පරිවාරපාළියෙහි:**

**''දුක්කටන්ති යං වුත්තං තං සුණොහි යථාතථං**
**අපරද්ධං විරුද්ධඤ්ච ඛලිතං යඤ්ච දුක්කටං**
**යං මනුස්සො කරෙ පාපං ආවි වා යදිවා රහො**
**දුක්කටන්ති පවෙදෙන්ති තෙනෙතං ඉති වුච්චති.''**

**දුක්කට** යැ යි යමක් කියන ලද නම් එය නතුපරිදි අසව. බුදුන් වදළ පරිද්දෙන් නො කොට වරදවා පැකිළ කළ මිනිසක්හු එළියෙහි හෝ රහස්හි හෝ යම් පවක් කරන සේ යම් ද නපුරක් කරන ලද නම් මෙය **දුක්කට** යැ යි කියනු ලැබේ යනු මෙහි අදහස යි. ඒ මේ දුක්කට ය පුබ්බපයොග යැ සහපයොග යැ අනාමාස යැ දුරූපචිණ්ණ යැ විනය යැ ඤාත යැ ඤත්ති යැ පටිස්සව යැ යි අටවැදෑරුම් වෙයි.[1] මෙහි **පුබ්බයොග දුක්කට** නම් සොරසිත් ඇති වැ දෙවැන්නකු සොයන විට උදලු ආදිය සොයන විට සොරකම කරන තැනට යන විට සිදුවන දුකුළාව යි. **සහපයොග දුක්කට** නම් අවහාරය සමග යෙදී පවතින දුකුළාව යි. මෙහි පචිති වස්තුවත් දුකුළා වස්තුවත් දෙකම දුකුළාවෙහි ම පිහිටයි. **අනාමාස දුක්කට** නම් නො පැහැසිය යුතු නො ඇල්ලිය යුතු වස්තූන් ස්පර්ශ කිරීමෙන් සිදුවන දුකුළාව යි. දශවිධ රත්නාදිය වැනි දෑය අනාමාසවස්තු නම් වෙයි. **දුරූපචිණ්ණ දුක්කට** නම් බුදුන් විසින් නො කළ යුතු යැ යි වළක්වන ලද දෑය කිරීම නපුරු පුරුද්දක් බැවින් එවැනි දෑය කිරීමෙන් සිදුවන දුකුළාව යි. කෙසෙල් පොල් ආදීන්හි හටගත් ගෙඩි අතපත ගැම වැනි නොමනා පුරුදු පැවැත්වීම මෙයට අයත් වෙයි. **විනය දුක්කට** නම් විනයෙහි පනවන ලද දුකුළාව යි.

පිඩු පිණිස හැසිරෙන මහණක්හුගේ පාත්‍රයෙහි දූහුවිලි වැටුණු කල්හි පාත්‍රය යළිත් නො පිළිගෙන හෝ නොසෝද හෝ ඒ පාත්‍රයෙහි අහර ගන්නාහට වන දුකුළාව **විනයදුක්කට** නමැයි කියනු ලැබේ. **ඤාතදුක්කට** නම් සඞ්ඝභේදය පිණිස තැත් කරනු අසා එය වැළැක්වීමට ඔහුට තමා දත් කරුණු කියා අවවාද නො කරන

1. සමන්තපාසාදිකා 225 පිටුව, සාරත්ථදීපනී 501 පිටුව



Free Distribution www.aathaapi.org

මහණහට වන දුකුළාව යි. **ඥප්තිදුක්කටට** නම් භික්ෂුන්හට නියමිත **පඤ්චසමනුභාෂණකර්මයන්හිත්** භික්ෂුණීන්හට නියමිත අට සමනුභාෂණකර්මයන්හිත් (එකොළොස් වැදෑරුම් සමනුභාෂණ කර්මයන්හි) ඥප්තිය තැබීමෙන් පසු වරද කළාහට සිදුවන දුකුළාව යි. භික්ෂුන්හට යාවතතියක සඟාදිසෙස් සිකපද සතරෙක්හි ද අරිට්ඨ සිකපදයෙහි ද, භික්ෂුණීන්හට යාවතතියක පාරාජික සිකපදයෙහි ද සඟාදිසෙස් සිකපද සතරෙක්හි ද **චණ්ඩකාළී** සිකපදයෙහි ද සමනුභාෂණකර්මය නියමිත බව අර්ථකථා ටීකාදියෙහිත් දක්වෙයි. **පටිස්සවදුක්කටට** නම් වස්විසීම ආදියට ප්‍රතිඥා දී එය පැහැර හැරීමෙන් ප්‍රතිඥාව නිමිති කොට වන දුකුළාව යි. සියලු ම දුක්කටයන් මේ අටෙහි සංග්‍රහ කළයුතු බැවින් සෙසු සත් දුකුළාවනට අයත් නො වූ යම් කරුණෙක් වේ නම් ඒ සියල්ල විනය දුක්කටයෙහි ම ඇතුළත් වියයුතු යැ යි කියති.

**දුබ්භාසිතාපත්තිය** සත්වැන්න යි. මෙහි **දුබ්භාසිත** නම් ආක්‍රොශ කරන අදහසින් තොර වැ කෙළිසිනා පිණිස කියන කිලිටි වචන යි. **ඔමසවාද** පචිති සිකපදයෙන් විවරණය කරන මේ දුබ්භාසිතය ආක්‍රොශාදියෙන් තොර වැ උපසපනක්හට හෝ අනුපසපනක්හට හෝ කෙළි සිනා පිණිස පවසන නො මනා වචන යි. තවද පරිවාරපාළියෙහි:

> **“දුබ්භාසිතන්ති යං වුත්තං තං සුණොහි යථාතථං**
> **දුබ්භාසිතං දුරාභට්ඨං සඞ්කිලිට්ඨඤ්ච යං පදං**
> **යඤ්ච විඤ්ඤූ ගරහන්ති තෙනෙතං ඉති වුච්චති”**

යනු කී හෙයින් **දුබ්භාසිත** යැ යි යමක් කියන ලද නම් එය තතු පරිදි අසව. නපුරු කොට කියන ලද කිලිටි බවට පත් යම් පදයෙක් වේ නම් යම් ද බසකට නැණැතියෝ ගරහත් නම් තෙල වචනය **දුබ්භාසිත** යැ යි කියනු ලැබේ යනු මෙහි අදහස යි. උපසපනක්හට හෝ අනුපසපනක්හට හෝ නො හමුවෙහි කෙළි සිනා පිණිස කියන කල්හි දු **දුබ්භාසිත** ම වේ යැ යි ආචාර්යවරයෝ කියති.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් විනය පිටකයෙහි පනවා වදළ සියලු සිකපදයන් සංකලනය කොට විමසන කල්හි **ආපත්ති** වශයෙන් **සතක්** පනවා වදළ බව දතයුතු යි. ඒ මේ ඇවැත් සත **සප්තාපත්ති** මැයෙන් මෙහි ලා විවරණය කරන ලදි. මේ ඇවැත්රැස **සප්තාපත්තිස්කන්ධ** වශයෙන් හඳුන්වනු ලැබේ. **තුලැසි** - **දුබැසි** ඇවැත් දෙක මාතිකායෙහි නො ආ බැවින් සෙසුපස **පඤ්චාපත්තිස්කන්ධ** වශයෙන් හඳුන්වනු ලැබේ. **මාතිකා** නම් පාතිමොක්ඛපාළිය යි. යම්කිසි උපසපන් **භික්ෂුනමක්** පරිජි ඇවැතකට පැමිණීමෙන් මහණකම මුළුමණින් නැති වන බැවින් සියලු ම පරිජි ඇවැත් **ඡේදාගාමී** විසින් ද, සඟාදිසෙස් ඇවතකට පැමිණීමෙන් මහණකම නැති නොවතුදු ශීලය විපතට වැටෙන්නට ඉන් ඉඩකඩ ලැබියහැකි බැවින් ඉන් නැඟී සිටීමට වත්මානත් පුරා ශුද්ධාන්තයෙහි පිහිටිය හැකිය. එහෙයින් සඟාදිසෙස් ඇවැත් **වුට්ඨානගාමී** විසින් ද, සෙසු තුලැසි – පචිති – පිළිදෙස්නී – දුකුළා – දුබැසි යැ යි කියන ලද ඇවැත් පස ආචාර විපත්තියට වැටීමෙන් පුද්ගලයාගේ අතිවිශිෂ්ට සමාචාරය නැති විය හැකි බැවින් දෙසීමෙන් පිරිසිදු විය යුතු ය. එහෙයින් ඒ ඇවැත් පස **දේශනාගාමී** විසින් ද විනයෙහි සඳහන් වෙයි. මෙසේ සප්තාපත්තීන් පිළිබඳ දැනීම භික්ෂු ජීවිතය රැකීමටත් බැබළීමටත් ඉවහල්වන බව සැලකිය යුතු යි.



Free Distribution www.aathaapi.org

පාමොක් උදෙසීම් දෙකක් සුගත විනයෙහි පැනෙයි.

**පාතිමොක්ඛුද්දෙස:** ඔවාදපාතිමොක්ඛුද්දෙස යැ ආණාපාතිමොක්ඛුද්දෙස යැ යනු ඒ දෙක යි. ඔවාදපාතිමොක්ඛුද්දෙසය සර්වඥ බුදුවරයෝ ම උදෙසති. ආණාපාතිමොක්ඛුද්දෙසය භික්ෂු - භික්ෂුණී උභතොසඞ්ඝයාට පනවා වදරන ලද්දකි. මෙහි **පාතිමොක්ඛුද්දෙස** යන්නෙන් ආණාපාතිමොක්ඛුද්දෙසය ම ගනු ලැබෙ. ආඥාප්‍රාතිමොක්ෂය වනාහි භික්ෂුප්‍රාතිමොක්ෂ යැ භික්ෂුණීප්‍රාතිමොක්ෂ යැ යි දෙපරිදි වෙයි. භික්ෂුප්‍රාතිමොක්ෂය නිදානුද්දෙස යැ පාරාජිකුද්දෙය යැ සඞ්ඝාදිසෙසුද්දෙස යැ අනියතුද්දෙස යැ විත්‍ථාරුද්දෙස යැ යි පස්වැදෑරුම් වෙයි. භික්ෂුණී ප්‍රාතිමොක්ෂය වනාහි නිදානුද්දෙස යැ පාරාජිකුද්දෙය යැ සඞ්ඝාදිසෙසුද්දෙස යැ විත්‍ථාරුද්දෙස යැ යි සතරවැදෑරුම් වෙයි. භික්ෂුණීන්හට අනියතාපත්තියක් නැති බැවින් අනියතුද්දෙසය නැති. පූර්වොක්ත උද්දෙශ පඤ්චකය එකක් පාසා මෙහි ලා හඳුන්වනු ලැබෙ.

1. **නිදානුද්දෙස** නම්: නිදානය උදෙසීම යි. "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ... ආවිකතාහිස්ස ඵාසු හොති. තත්‍ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි... තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි**" යැ යි කියා උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං" යනාදි ක්‍රමයෙන් අවශෙෂය **සුත** (ශ්‍රැතියෙන්) ශබ්දයෙන් ඇස් වූ කල්හි උදෙසන ලද්දේ වෙයි. නිදානය උදෙසා නො නිමි කල්හි **සුත** ශබ්දයෙන් ඇස්විය යුත්තෙක් නම් නැති.[1] "**නිදානං උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං, අයං පඨමො පාතිමොක්ඛුද්දෙසො**"[2] යනු වදළ බැවින් මේ ප්‍රථම ප්‍රාතිමොක්ෂොද්දෙශය යි. "**සුණාතු මෙ අය්‍යෙ**" යනු ආදි කොට ඇති ලෙසින් භික්ෂුණීප්‍රාතිමොක්ෂයෙහි නිදානුද්දෙසය දතයුතු යි.

2. **පාරාජිකුද්දෙස** නම්: භික්ෂුවිභඞ්ගයෙහි වදළ පරිජි සිකපද සතර උදෙසීම යි. පාමොක් උදෙසන කල්හි නිදානය උදෙසා සතර පරිජි උදෙසා අවශෙෂය සුත ශබ්දයෙන් ඇස් වූ කල්හි පාරාජිකුද්දෙසය ද උදෙසන ලද්දේ වෙයි. "**නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං දුතියො පාතිමොක්ඛුද්දෙසො**"[2] යනු වදළ බැවින් මේ ද්විතීය ප්‍රාතිමොක්ෂොද්දෙශය යි. භික්ෂුණී සඞ්ඝයාට පනවන ලද පරිජි අට ඇතුළත් කොට භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි පාරාජිකුද්දෙසය දත යුතු යි.

3. **සඞ්ඝාදිසෙසුද්දෙස** නම්: භික්ෂුවිභඞ්ගයෙහි වදළ සඟවෙසෙස් සිකපද තෙළෙස උදෙසීම යි. පාමොක් උදෙසන කල්හි නිදානය උදෙසා සතර පරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙසුන් උදෙසා අවශෙෂය සුත ශබ්දයෙන් ඇස් වූ කල්හි සඞ්ඝාදිසෙසුද්දෙසය ද උදෙසන ලද්දේ වෙයි. "**නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං තතියො පාතිමොක්ඛුද්දෙසො**" යනු වදළ බැවින් මේ තෘතීය ප්‍රාතිමොක්ෂොද්දෙශය යි. මෙහෙණන්හට පනවා වදළ සඟවෙසෙස් සතළොස ඇතුළත් කොට භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි සඞ්ඝාදිසෙසුද්දෙසය දතයුතු යි.

4. **අනියතුද්දෙස** නම්: භික්ෂුවිභඞ්ගයෙහි වදළ දෙඅනියත සිකපදයන් උදෙසීම යි. පාමොක් උදෙසන කල්හි නිදානය උදෙසා

1. මාතිකට්ඨකථා 2 පිටුව
2. මහාවග්ගපාළි - උපොසථක්ඛන්ධක



Free Distribution www.aathaapi.org

සතර පරිජි උදෙසා තෙළෙස් සඝාවසෙසුන් උදෙසා දෙ අනියතයන් උදෙසා අවශෙෂය සුත ශබ්දයෙන් ඇස්වූ කල්හි අනියතුද්දෙසය ද උදෙසන ලද්දේ වෙයි. "**නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා ද්වෙ අනියතෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං චතුත්ථො පාතිමොක්ඛුද්දෙසො**" යනු වදාළ බැවින් මේ චතුර්ථ ප්‍රාතිමොක්ෂොද්දෙශය යි. භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි මේ අනියතොද්දෙසය නැති. අනියත නම්:

"**අනියතොති යං වුත්තං තං සුණොහි යථාතථං**
**අනියතො න නියතො අනෙකංසිකතං පදං**
**තිණ්ණමඤ්ඤතරං ඨානං අනියතොති පවුච්චති**"

යනු පරිවාරපාළියෙහි වදාළ බැවින් පරිජි–සඝාවසෙස්–පචිති යන ඇවැත් තුනෙන් එකකින් සිදුවන ඇවත එකැතින් නියම නො කළ බැවින් නියත කොට නො කීම යි.

5. **විත්ථාරුද්දෙස** නම්: විස්තර වශයෙන් පාමොක් උදෙසීම යි. භික්ෂුසංඝයාට අයත් නිදානයත් සතර පරිජිත් තෙළෙස් සඝාවසෙසුත් දෙඅනියතයත් තිස් නිසගිපචිතිත් දෙඅනූ ශුද්ධ පචිතිත් සතර පිළිදෙස්නීත් සෙඛියාත් සප්තාධිකරණ සමථයත් උදෙසීමෙන් ප්‍රාති-මොක්ෂය විස්තර වශයෙන් උදෙසන ලද්දේ නම් වෙයි. "**විත්ථාරෙනෙව පඤ්චමො**" යනු වදාළ බැවින් මේ පඤ්චම ප්‍රාතිමොක්ෂොද්දෙශය යි. භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි අනියතය හැර සෙස්ස විස්තර වශයෙන් උදෙසීම විත්ථාරුද්දෙසය යි.

මේ විත්ථාරුද්දෙසයට ඇතුළත් නිස්සග්ගිය–සෙඛිය–අධිකරණසමථ යන වචන පිළිබඳ විවරණයක් මෙහි ලා කළ යුතු ය. මෙහි **නිස්සග්ගිය** නම් සඞ්ඝයාහට හෝ ගණයාහට හෝ පුද්ගලයකුහට හෝ නිස්සජනය කළ යුතු බව යි. **නිස්සග්ගිය** යනු පූර්වභාගයෙහි කළ යුතු විනයකර්මයට නමෙකි. "**අථවා නිස්සජ්ජනං නිස්සග්ගියං, පුබ්බභාගෙ කත්තබ්බස්ස විනයකම්මස්සෙතං නාමං**"[1] යනු අර්ථකථා-ගතවචන යි. නිසගි වූ සිවුරු ආදිය පළමු කොට සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුහට හෝ පවරාදීමෙන් තමා කෙරෙන් බැහැර කිරීම නිස්සජනය යි. මෙය පූර්වභාගයෙහි කළ යුතු විනයකර්මය යි. "**නිස්සග්ගියමස්ස අත්ථීති නිස්සග්ගියම්වෙච්ච තිර තං පාචිත්තියං**" යනු ද එහි ම සඳහන් වන බැවින් නිස්සජනය මේ ආපත්තියට ඇත් නු යි **නිස්සග්ගිය** නම් වේ. ඒ කුමක් ද? පචිති ඇවත යි. මෙසේ බලන විට **නිස්සග්ගිය** යනු නිසැදීමේ විනය-කර්මයටත් ඉන් නැඟුණු පචිති ඇවතටත් නම් වෙයි. වස්තුව නිසැදීමෙන් පසු පචිති ඇවත දෙසිය යුතු යි. පරිවාර පාළියෙහි:

"**නිස්සග්ගියන්ති යං වුත්තං තං සුණොහි යථාතථං**
**සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ එකකස්සෙව එකතො**
**නිස්සජ්ජිත්වාන දෙසෙති තෙනෙතං ඉති වුච්චති**"

යනු වදාළ බැවින් යට කී අදහස මෙයිනුදු පැවසෙයි.

---

1. සමන්තපාසාදිකා 461 පිටුව



Free Distribution www.aathaapi.org

**සේඛිය** නම් ඍජු මාර්ගයට අනුව හැසිරෙන සුළු ත්‍රිශික්‍ෂායෙහි හික්මෙන ශෛක්‍ෂ පුද්ගලයාහට මේ සෙඛිය ධර්මය මුල ද වෙයි. පාදය ද වෙයි. දොරටුව ද වෙයි. සංයමය ද වෙයි. සංවරය ද වෙයි. එහෙයින් මෙවැනි අන් සිකපදයෙක් නැත් මැ යි. මේ අදහස ම පරිවාරපාළියෙහි දු:

**"සෙඛියන්ති යං වුත්තං තං සුණොහි යථාතථං**
**සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො**
**ආදිමෙතං චරණඤ්ච මුඛං සංයම සංවරො**
**සික්ඛා එතාදිසී නත්ථි තෙනෙතං ඉති වුච්චති."**

යනු වදළහ. මේ සිකපද රැකීම ශෛක්‍ෂභාවයට ඉවහල්වන බැවින් ද පැවිදි ශෛක්‍ෂ පුද්ගලයන්ගේ උපරිමාර්ගාධිගමයට පහසු වන බැවින් ද මෙය හා සමාන අන් සිඛයෙක් නැතැ යි කියනු ලැබේ. සෙක්ඛභූමියට ධ්‍යානභූමිය ද සංග්‍රහ වන බැවින් ධ්‍යානලාභීන්ගේ සමාචාරයට ද මේ සෙඛියධර්මයෝ අතිශයින් උපකාර වෙත් මැ යි. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සෙඛියධර්මයන් පැනවීමෙහි දී අනුගමනය කරන ලද්දේ අමුතු ම ක්‍රමයෙකි. වත්තක්ඛන්ධකයෙහි වදළ වත් ද හික්මිය යුතු බැවින් සෙඛිය මැ යි. එහෙයින් පාරාජිකාදීන්හි මෙන් මෙහි පාළියෙහි පරිච්ඡේදයක් නො කරන ලදී. චාරිත්‍රනය දක්වනු පිණිස ද **"යො පන භික්ඛු ඔලම්බෙන්තො නිවාසෙය්‍ය දුක්කටං"** යි නො වදරා **"සික්ඛාකරණීයා"** යනු විසින් පාළිය ආරෝපිත යි. පදභාජනියෙහි වනාහි **"ආපත්ති දුක්කටස්ස"** යනු වදළ බැවින් හැම තන්හි අනාදරිය කරණයෙහි දුක්කට යැ යි දතයුතු යි.[1]

**අධිකරණසමථ** නම් මහණ-මෙහෙණ දෙසතුන්හට අවිශේෂයෙන් සතරවැදෑරුම් අධිකරණයන් සන්හිඳුවීම පිණිස පනවා වදළ සත්දෙන යි. **"චතුබ්බිධං අධිකරණං සමෙන්ති වූපසමෙන්තීති අධිකරණසමථා"**[2] යන අටුවා බසින් ජේ පැහැදිලි වෙයි. සතරවැදෑරුම් විවාදදි අධිකරණයන් ශමනය කෙරෙත් නු යි ව්‍යුපශමනය කෙරෙත් නු යි අධිකරණ සමථයෝ නම් වෙත්. සම්මුඛාවිනය යැ සතිවිනය යැ අමූළ්හවිනය යැ **පටිඤ්ඤාතකරණය** යැ යෙභුය්‍යසිකා යැ තස්සපාපියසිකා යැ තිණවත්ථාරක යැ යන මේ සත්දෙන යි. මෙහි **සම්මුඛාවිනය** නම් සඞ්ඝසම්මුඛතාදි හමුවීම් සතරෙකින් ශමථය කිරීම යි. **සතිවිනය** නම් අමූලික ශීලවිපත්තියෙකින් චෝදනා කරනු ලබන රහත් මහණ නමකට යැදීමක් ඇති කල්හි ඥප්ති චතුර්ථ කර්මයෙන් සතිවිනය දීමෙන් ශමථය කිරීම යි. **අමූළ්හවිනය** නම් උමතු කමින් යුතු මහණක්හු ඉන් මිදී සැපවත් වූ විට උමතු කල්හි තමා කළ නො මහණකම් ගැන චෝදනා නො කරනු පිණිස යැදීමක් කළ කල්හි ඥප්තිචතුර්ථකර්මයෙන් අමූළ්හවිනය දීමෙන් ශමථය කිරීම යි. **පටිඤ්ඤාතකරණ** නම් භික්ෂුනමක් ඇවැත් දෙසීමෙන් පිරිසුදුවීම පිණිසත් සඟවසෙස් ඇවතකින් නැගීසිටීමට පිරිවෙස් වත් මානත් පිරීම පිණිසත් පිළිණ කිරීමෙන් සිදුවන සමථය යි. **යෙභුය්‍යසිකා** නම් බහුල වූ ධර්මවාදී භික්ෂූන්ගේ වචනය පරිදි සිදුකරන ශමථය යි. **තස්සපාපියසිකා** නම් පාපයෙන් උත්සන්න වූ මහණක්හට ඥප්තිචතුර්ථකර්මයෙන් සිදුකළ යුතු ශමථය යි.

1. සාරත්ථදීපනී 879-880 පිටු විමතිවිනොදනී 339 පිටුව
2. සමන්තපාසාදිකා 669 පිටුව



Free Distribution www.aathaapi.org

**තිණවත්ථාරක** නම් කලහකාරක භික්ෂූන් විසින් පැමිණි ඇවැත් අතුරෙන් පරිජි සඟවෙසෙස් ඇවැත් හා ගෘහිප්‍රතිසංයුක්ත ඇවැත් හැර තණපත් ආදියෙකින් අශුචි වසාලන්නාක් මෙන් සෙසු හැම ඇවතක් ම සඟුන් මැද ඇවැත් දෙසීමෙන් පිරිසුදුවීම පිණිස ඥප්ති ද්විතීය කර්මයෙන් සිදුකළ යුතු ශමථය යි. මෙසේ සප්තාධිකරණශමථය සැකෙවින් දත යුතු යි.

**"විනයානිසංස"**

බුද්ධශාසනයෙහි ආයුෂය නම් විනය යි. විනය පවත්නා කල්හි බුදුසසුන පවත්නේ වෙයි. අධිශීල සංඛ්‍යාත ප්‍රාතිමොක්ෂ සංවර ශීලය රකින උපසපන් පැවිදි මහණුන්ගේ බහුලවීම ශාසන චිරස්ථිතියට අත්‍යන්තයෙන් උපකාර වෙයි. එහෙයින් භික්ෂූන්ගේ ආයුෂය වූ ශීලය මැනැවින් රැකගැනීම බුදුසසුන්හි පැවිදි වූ කුලපුත්‍රයන්ගේ පරම යුතුකම යි. භික්ෂුජීවිතය විනය ප්‍රඥප්ති සිද්ධියෙන් සාධ්‍ය වන බැවින් භික්ෂූන් විසින් විනය ප්‍රඥප්තිය මැනැවින් දතයුතු ය. උභතොවිභඞ්ගයත් ඛන්ධකවිනයත් සොළස පරිවාරයත් මැනැවින් ග්‍රහණධාරණය විනයඥානය යි. විනයඥානය ආත්මරක්ෂණයටත් පරරක්ෂණයටත් අතිශයින් පිහිට වෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත පහත දක්වෙන සූත්‍රපාඨයෙන් විනය දැනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජනය බලනු මැනවි. **"විනයො සංවරත්ථාය සංවරො අවිප්පටිසාරත්ථාය අවිප්පටිසාරො පාමුජ්ජත්ථාය පාමුජ්ජං පීතත්ථාය පීති පස්සද්ධත්ථාය පස්සද්ධි සුඛත්ථාය සුඛං සමාධත්ථාය සමාධි යථාභූතඤාණදස්සනත්ථාය යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය නිබ්බිද විරාගත්ථාය විරාගො විමුත්තත්ථාය විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය විමුත්තිඤාණදස්සනං අනුපාද පරිනිබ්බානත්ථාය, එතදත්ථා කථා එතදත්ථා මන්තනා එතදත්ථා උපනිසා එතදත්ථං සොතාවධානං යදිදං අනුපාද චිත්තස්ස විමොක්ඛොති"**[1]

සියලු ම විනයප්‍රඥප්තිය කායවාග්ද්වාරයන්ගේ සංවරය පිණිස ආජීව විසුද්ධිය අවසන් කොට ඇති ශීලයට ප්‍රත්‍යය වෙයි. සංවරය පව් පින් කළ නො කළ වශයෙන් සිත්හි පහළ වන පසුතැවිල්ල නැති කිරීමට ප්‍රත්‍යය වෙයි. අවිප්‍රතිසාරය (පසුතැවිලි නැති බව) දුබල තරුණ ප්‍රීති යැ යි කියන ලද ප්‍රමෝදයට ප්‍රත්‍යය වෙයි. ප්‍රමෝදය බලවත් ප්‍රීතියට ප්‍රත්‍යය වෙයි. බලවත් ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිසංඛ්‍යාත කාය චිත්ත දරථයන්ගේ සන්හිඳීමට ප්‍රත්‍යය වෙයි. ප්‍රශ්‍රබ්ධිය කායික චෛතසික සුඛයට ප්‍රත්‍යය වෙයි. සුඛය සමාධියට ප්‍රත්‍ය වෙයි. චිත්තෛකාග්‍රතා සංඛ්‍යාත සමාධිය තරුණ විදර්ශනා සංඛ්‍යාත යථාභූතඥානදර්ශනයට ප්‍රත්‍යය වෙයි. යථාභූතඥානදර්ශනය නිබ්බිද සංඛ්‍යාත බලවත් විදර්ශනාවට ප්‍රත්‍යය වෙයි. නිබ්බිදව විරාගසංඛ්‍යාත ආර්ය මාර්ගයට ප්‍රත්‍යය වෙයි. විරාගය විමුක්ති සංඛ්‍යාත අර්හත් ඵලයට ප්‍රත්‍යය වෙයි. විමුක්තිය ප්‍රත්‍යයවෙක්ෂාඥාන සංඛ්‍යාත විමුක්තිඥානදර්ශනයට ප්‍රත්‍යය වෙයි. විමුක්තිඥානදර්ශනය අනුපාදපරිනිර්වාණ සංඛ්‍යාත අප්‍රත්‍යපරිනිර්වාණයට ප්‍රත්‍යය වෙයි. ඒ විනයකථාව මේ අර්ථය පිණිස ම වෙයි. විනයමන්ත්‍රණය මේ අර්ථය පිණිස ම වෙයි. **"විනයොසංවරත්ථාය"** යනාදි පරම්පර ප්‍රත්‍යභාව සංඛ්‍යාත උපනිශ්‍රයය ශ්‍රොතාවධාන සංඛ්‍යාත ඇසීමෙන් උපන් නුවණ ද මේ අර්ථය පිණිස ම වෙයි. සතර උපාදානයන්

---

1. පරිවාරපාළි-චූළවග්ගො



Free Distribution www.aathaapi.org

නො ගෙන සිත්හි පහළ වූ අර්හත්ඵලසංඛ්‍යාත විමොක්ෂය ද මේ අරිය පිණිස ම වෙයි. අප්‍රත්‍යය පරිනිර්වාණය පිණිස ම වෙයි යන අදහස යි. මෙසේ පූර්වෝක්ත සූත්‍රපාඨයෙන් විනයඥානයෙහි ප්‍රයෝජනය දත හැකි යි.

කරුණු මෙසේ හෙයින් විනය පිළිබඳ දැනීම අනුපිළිවෙළින් තමාට ම රැකවරණය ලබාදීමෙන් ආත්මරක්ෂණය වෙයි. තමාගේ විනයඥානයෙන් අල්පශ්‍රැත භික්ෂූන්ගේ මහණුවම් රැක ගැනීමට උපදෙස් දියහැකි බැවින් පරරක්ෂණය ද වෙයි. මෙපමණෙක් ද නො වෙයි. මේ විනයානිසංසකථාව නුවණින් විමසන විට විනයධර්මය මැනැවින් පිළිපදනා මහණ ක්‍රමයෙන් අර්හත්ඵලවිමුක්තියට පැමිණ අනුපාදපරිනිර්වාණයෙන් පිරිනිවෙන බව හෙළි වෙයි. විනයෙහි සුප්‍රතිපන්න මහණහු තමාගේ ශීලසම්පත්තිය නිසා පූර්වෙනිවාසානුස්මෘතිඥානාදි ත්‍රිවිද්‍යාවනට පැමිණෙන බව ද ඒ ත්‍රිවිද්‍යාවන් පිළිබඳ ප්‍රභේදකථා විනයපිටකයෙහි දක්නට ලැබෙන බව ද විනයාරීකථායෙන්[1] ම පැහැදිලි වෙයි.

**පාචිත්තියපාළි**

මේ වනාහි විනයපිටකයෙහි දෙවැනි ග්‍රන්ථය යි. පාරාජිකපාළිය පළමු ග්‍රන්ථය යි. පාරාජිකපාළියෙහි වේරඤ්ජ කණ්ඩ යැ පාරාජික කණ්ඩ යැ සඞ්ඝාදිසෙස කණ්ඩ යැ අනියත කණ්ඩ යැ නිස්සග්ගිය කණ්ඩ යැ යි කාණ්ඩ පසෙක් වෙයි. ඒ ප්‍රථම විනය ග්‍රන්ථය ශ්‍රී ලංකා විද්‍යොදය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරී **පණ්ඩිත වේරගොඩ අමරමොළි ස්ථවිරයන් වහන්සේ** විසින් කරන ලද සිංහල පරිවර්තනයෙන් යුක්ත යි. මේ පාචිත්තියපාළිය වනාහි ඛුද්දක යැ පාටිදෙසනීය යැ සෙඛිය යැ අධිකරණසමථ යැ යි භික්ෂුවිභඞ්ගයෙන් අවශිෂ්ට වූ කාණ්ඩ සතරකින් ද භික්ෂුනීවිභඞ්ගයට අයත් පාරාජික යැ සත්තරසක (සඞ්ඝාදිසෙස) යැ නිස්සග්ගිය යැ ඛුද්දක යැ පාටිදෙසනීය යැ සෙඛිය යැ අධිකරණසමථ යැ යි කාණ්ඩ සතෙකින් ද පරිමිත යි. මෙසේ උභයවිභඞ්ගයට අයත් කාණ්ඩ එකොළොසකින් පරිමිත මේ පාචිත්තිය පාළියෙහි මුලට ම භික්ෂූන්හට පනවා වදළ ශුද්ධ පචිත්ති සිකපද දෙඅනූවෙක් අතුළත් වෙයි. මෙය ඛුද්දක නම් කාණ්ඩයට ඇතුළත් කොට ඇත. ඉක්බිති පිළිදෙස්නී සිකපද සතරක් ද, සෙඛිය ධර්ම පන්සැත්තෑවක් ද, අධිකරණසමථ සතක් ද ඇතුළත් වෙයි. භික්ෂුනීවිභඞ්ගයෙහි ස්වරූපයෙන් මෙහෙණන්හට ම පැන වූ පරිජි සිකපද සතරක් ද සඟවෙසෙස් සිකපද දශයක් ද නිසගි සිකපද දෙළොසක් ද ශුද්ධ පචිති සිකපද සයානූවක් ද ස්වරූපයෙන් පනවා වදළ පිළිදෙස්නී සිකපදය සහිත පෙය්‍යාලමුඛයෙන් වදළ සිකපද සත දෑයි පිළිදෙස්නී සිකපද අටක් ද සෙඛිය ධර්මයන්ගෙන් නිදන සහිත දෙකක් ද සප්ත අධිකරණ ශමථයෝ ද ඇතුළත් වෙති. භික්ෂූන්හට පනවා වදළ පරිජි සිකපද සතර ද සඟවෙසෙස් සිකපද සතක් ද, නිසගි සිකපද අටළොසක් ද ශුද්ධපචිති සිකපද සැත්තෑවක් ද, සෙඛිය ධර්මයන් පන්සැත්තෑව ද ඇතුළත් විමෙන් භික්ෂුණී විභඞ්ගය සම්පූර්ණ වෙයි. මෙසේ පාචිත්තිය පාළිය කාණ්ඩ එකොළොසෙකින් පරිමිත කොට සඞ්ගායනා කළ බව පැනෙයි. මෙහි ලා කිය යුතු කරුණු බොහෝ ඇතත් මෙයින් නවතිමි.

---

1. සමන්තපාසාදිකා බාහිරනිදාන, 14 පිටුව.



Free Distribution www.aathaapi.org

**ත්‍රිපිටක පරිවර්තනය**

සිරිබුදුවසින් දෙදහස් පන්සිය වැනි අවුරුද්ද බුද්ධජයන්ති වර්ෂය නමින් බෞද්ධයන් අතර ව්‍යවහාරයට පත්විය. මේ ව්‍යවහාරය රජය ද පිළිගත් බැවින් බුද්ධජයන්තිය නිමිත්තෙන් කටයුතු රැසක් සිදුකිරීමට එවකට පැවති රජය විසින් ලංකා බෞද්ධමණ්ඩලය නමින් ප්‍රබල ගිහි පැවිදි ආයතනයක් පනතක් මගින් පිහිටුවන ලදි. එහි ත්‍රිපිටක පරිවර්තනය පිළිබඳ කාරක සභාවට අයත් ස්ථවිරවරුනට ත්‍රිපිටක ධර්මය සිංහලයට පරිවර්තනය කිරීම පිණිස පිටකත්‍රයට ඇතුළත් පාළි ග්‍රන්ථයන් එවකට අග්‍රාමාත්‍යධුරය දැරූ ශ්‍රීමත් ජෝන් කොතලාවල මන්ත්‍රීශ්වරයාණන් විසින් රජය වෙනුවෙන් පිළිගන්වන ලද බව සඳහන් කළ යුතු වෙයි. ඒ පාළි ග්‍රන්ථයන් පාඨශෝධනය කරමින් සිංහලයට පරිවර්තනය කරවීමට හා මුද්‍රණයෙන් ප්‍රකාශනයට පත්කරවීමට සංස්කාරක මණ්ඩලයෙක් ද පත්විය.

ඒ මේ ත්‍රිපිටක පරිවර්තනය අතිදුෂ්කර කාර්යයෙකි. බසකින් බසකට නගාලීම පරිවර්තන යයි, මේ පරිවර්තනය පදානුගත යැ අර්ථානුගත යැ භාවානුගත යැ යි තුන් පරිද්දෙකින් කළ හැකි ය. පද සම්බන්ධයට අනු වැ නගාලීම පදානුගත පරිවර්තනය යි. ශබ්දාර්ථයට අනු වැ නගාලීම අර්ථානුගත පරිවර්තන යයි, අදහසට අනු ව නගාලීම භාවානුගත පරිවර්තන යයි. මෙය ම අභිප්‍රායාර්ථ පරිවර්තන නමුදු වෙයි. මේ තුන් ක්‍රමයෙන් මේ පරිවර්තනය පදානුගත පරිවර්තනයෙන් හා අර්ථානුගත පරිවර්තනයෙන් සිදු කළ යුතු වෙයි. පාළියට සරිලන පදය සියබසට ගැළපේ දෑ යි විමසමින් ද පාළිවචනයෙහි ශබ්දාර්ථය අර්ථකථාටීකාවනට ගැළපේ දෑ යි විමසමින් ද සමහර පදයන්හි ශබ්ද ලක්ෂණය ව්‍යාකරණ ග්‍රන්ථානුසාරයෙන් විමසමින් ද කළ යුතු බැවිනි. මෙහි භාවානුගත පරිවර්තනයෙක් නො ලැබෙයි. එක් පිටුවෙක්හි සිංහලානුවාදයත් ඒ දෙක මුණ ගැසෙන සේ තැබිය යුතු බැවින් මේ පරිවර්තනයට අභිප්‍රායාර්ථය යොදලීම කළ නො හැක්කෙකි. එහෙත් යම් යම් තන්හි වරහන් තුළ අදහස පැහැදිලි කිරීම පිණිස අභිප්‍රායාර්ථය ද සැකෙවින් මෙහි දු දක්වන ලද බව පැනෙයි. මෙහි අභිප්‍රාය නම් අදහස යි. මේ අදහස අභිධා – ලක්ෂණා දෙකින් දෙන එක් එක් පදයෙහි අර්ථාවබෝධයට වඩා පැතිරී ගිය තාත්පර්‍ය්‍යශක්තිය යි. මහ ත්‍රිපිටක-ධර්මවිෂයෙහි නම් බුද්ධභාෂිතාර්ථය යි. එය පාළි පදයක් දුටු පමණින් තීරණය කළ නො හැකි නම් තාත්පර්‍ය්‍යශක්තිය විමසිය යුතු යි. බුදුන් වදළ ධර්මයෙහි අභිප්‍රායාර්ථය දැනීමට අර්ථකථාටීකාදිය පැරණි මහතෙරුන් ඇසිරි කරන ලද්දේ එහෙයිනි. අර්ථකථාටීකානුසාරයෙන් අභිප්‍රායාර්ථය විස්තර වශයෙන් මේ පරිවර්තනයෙහි ඇතුළත් කිරීමෙන් මේ කාර්‍ය්‍යය සපුරාලිය නො හෙන බව දත යුතු යි. එහෙයින් ආගම ධර්මය දත් නො දත් සියල්ලන්ගේ ම සිත් පිනවීමට මේ පරිවර්තනය කා විසින් නමුදු නො කළ හැකි බව ග්‍රහණධාරණ ශක්තිමතුන් විසින් පිළිගත යුතු යි. යම් කෙනකුන්හට පරිවර්තන-යෙහි අභිප්‍රායාර්ථය නො වැටහේ නම් අර්ථකථාටීකා පරිශීලනයෙන් තදර්ථප්‍රතිපාදනයෙහි යෙදිය යුතු යි.

**උපකෘතිස්මෘති**

මේ පාචිත්තිය පාළි පරිවර්තනයෙහි ලා ආවශ්‍යක ග්‍රන්ථයන් වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පිරිවෙන්හි පුස්තකාලයෙන් ද, බම්බලපිටියේ වජිරාරාම පුස්තකාලයෙන් ද, ඉඳුරුවේ ශ්‍රී විජයධර්ම පිරිවෙන්හි පුස්තකාලයෙන් ද, ඉඳුරුවේ යාලේගම ජයසුමනාරාමයෙහි පුස්තකාලයෙන් ද ලබා



Free Distribution www.aathaapi.org

දතුම්හ. එවකට සංස්කෘතික කාර්‍යාංශයේ සහකාර සම්පාදක ඇම්. ඇන්. පීරිස් මුදලිතුමා විසින් සපයන ලද පාචිත්තියපාළි පුස්කොළ පොත ද මෙහි ලා උපකාර වූ බව සඳහන් කරම්හ. මෙසේ ආවශ්‍යය ග්‍රන්ථයන් සපයා ගෙන පාඨශෝධනය ද කරමින් මේ ග්‍රන්ථය සියබසට නැඟීමෙහි යෙදුණු මා හට මේ කාර්‍යයට ආරම්භයෙහි ම උපකාර කළ දෙනමක් ගැන මෙහි ලා සඳහන් කළ යුතු වෙයි, ඉන් එක නමක් නම් මාතර සිරිමංගල පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත බඹුවිට නන්දාරාමාභිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේ යි, අනෙක් නම නම් වැල්ලවත්තේ ශ්‍රී ධර්මොදය පිරිවෙන්හි ධර්මශාස්ත්‍රය උගත් රාජකීය පණ්ඩිත බලංගොඩ පඤ්ඤාවංස ස්ථවිරනම යි, මේ නම පේරාදෙණි විශ්ව විද්‍යාලයෙහි උපාධි අපේක්ෂකයකු වැ ගිය පසු ශ්‍රී ධර්මොදය පිරිවෙන්හි ධර්මශාස්ත්‍රය ඉගෙනීමෙහි යෙදී සිටි ලද්දුව චන්දිම ස්ථවිර නම උපකාරයට පැමිණියේ ය, සියබසට නැඟූ මේ ග්‍රන්ථයෙහි පිටපත් මැනවින් ලියා දීමෙන් මහත් උපකාරයක් කළ ඒ චන්දිම ස්ථවිර නම අද ජීවතුන් අතර නැතත් මෙයින් ලත් ධර්මදානමය කුශලයට හිමි වනු නිසැක යි, මෙයට අවුරුදු විස්සකට පෙර පරිවර්තනය කොට අවසන් වූ මේ ග්‍රන්ථය එවකට පරිවර්තනභාරය දැරූ සහකාර සම්පාදක මුදලිතැන්පත් පීරිස් මහතාණන්හට පුස්කොළ පොත සමග බාර කළම්හ.

ත්‍රිපිටක පරිවර්තන කාර්‍යාලය දෙමටගොඩ පධානඝර විහාරස්ථානයට ගෙන ගිය පසු ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි ප්‍රධාන සම්පාදක දර්ශනවිශාරද ත්‍රිපිටකවාගීස්වරාචාර්‍ය පරවාහැර සිරිවජිරඤාණාභිධාන නායක මහාස්ථවිරපාදයන් වහන්සේගේ පරිපාලනය යටතේ ත්‍රිපිටක සංස්කාර මණ්ඩලය ක්‍රියාත්මක විය. උන්වහන්සේ විසින් මේ ග්‍රන්ථය ශෝධනය කොට මුද්‍රණයට යොමු කරනු පිණිස මා ඇතුළු තවත් පඬිවරු දෙනමක් පත් කරන ලදහ. එවකට අමරපුර නිකායේ අනුනායක ධුරන්ධර වූ ද අම්බලම්ගොඩ ශාස්ත්‍රොදය පරිවෙණාධිපති වූ ද රාජකීය පණ්ඩිත ධම්මකුසලාභිධාන මහා ස්ථවිරපාදයන් වහන්සේ හා ප්‍රධාන පිරිවෙන් පරීක්ෂක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති අකුරැටියේ අමරවංසාභිධාන නායක ස්ථවිර පාදයන් වහන්සේ මේ ශෝධක මණ්ඩලයට ඇතුළත් වූහ. අපි තෙනම මේ ග්‍රන්ථය ශෝධනය කරමින් මුද්‍රණයට සුදුසු පරිදි සකස් කළම්හ.

මෙසේ සකස් කළ මේ ග්‍රන්ථය ප්‍රධාන සම්පාදක පරවාහැර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් හැකි තරම් ඉක්මනින් මුද්‍රණය කරනු පිණිස මුද්‍රණාලයකට පවරන ලදින් මුල් පිටු අට පමණක් මුද්‍රිත විය. මුද්‍රණ කාර්‍යය නතරවීමත් සමග ම පොත්හි සමහර පිටපත් සොයා ගැනීම ද අපහසු විය. කලෙක් ගතවිය. මේ අතර ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ ආදිම සභාපති-සම්පාදක නාහිමිවරු දෙනම ද අපවත් වූහ. ත්‍රිපිටක පරිවර්තන කාර්යාලය දෙමටගොඩින් කොළඹ විජේරාම මාවතේ පිහිටි මහානායක චාරිකාරාමයට ගෙන යන ලදුවැ එහි ස්ථාපිත විය. පැරණි ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලය ද අභාවයට යාමෙන් ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙක් බිහි විය. මේ මණ්ඩලයේ ව්‍යක්ත විශාරද සභාපති-සම්පාදක නාහිමි වරුන්ගේ අප්‍රතිහත ප්‍රයත්නයෙන් හා සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තැන්පත් සෝමපාල ජයවර්ධන මහතුන්ගේ ස්ථානෝචිත බුද්ධියෙන් මේ ග්‍රන්ථය මුද්‍රණය සඳහා යොමුකරන ලද බව දතුම්හ.



Free Distribution www.aathaapi.org

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ලේඛකාධිකාරිධුරය දරන පණ්ඩිත **දෙරගමුවේ සිරි ධම්මපාල** නායක ස්ථවිරයන් වහන්සේ විසින් දන්වා එවන ලද පරිදි නැතිවුණු පිටපත් යළිත් සියබසට නඟා ලියා යැවීම ද මේ අතරෙහි ම සිදු විය. මේ කාර්යයෙහි ලා වරින්වර ලියන්නට සිදු වූ පිටපත් ලියා දීමෙන් හා වෙනත් පහසුකම් සලසා දීමෙන් හා උපකාර කළ අපගේ ශිෂ්‍යයන් වන ශාස්ත්‍රවේදී **දෙපානම සුගතබන්ධු** ස්ථවිර නමත් ත්‍රිපිටකවේදී **ඉඳුරුවේ අරියකිත්ති** ස්ථවිර නමත් ත්‍රිපිටකවේදී **එගොඩධූවේ ජිනානන්ද** භික්ෂුනමත් සඳහන් කළ යුතු මැ යි. තවද මේ ග්‍රන්ථය යළිත් මුද්‍රණයට යොමු කළ තැන් පටන් ශෝධ්‍යපත්‍රාදිය බැලීමෙන් ද ඌනපූරණාදිය කිරීමෙන් ද සංඥානාම පදනුක්‍රමාදිය සකස් කිරීමෙන් ද මහත් ප්‍රයත්නයක් දැරූ ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ දක්ෂ විචක්ෂණ මහාස්ථවිරපාදයන් වහන්සේලාටත් මෙහි නම් සඳහන් නොයෙක් අයුරෙන් උපකාර කළ ජීවතුන් අතර සිටුනා හැම ගිහි-පැවිදි භවතුන් හටත් පින් පුරවමින් දිගාසිරි පතම්හ.

ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ **සභාපති-සම්පාදක** නාහිමිවරුන් ඇතුළු අපවත් වී වදළ හැම මහතෙරනමකටත් මේ කාර්යයෙහි ලා මට උපකාර කරමින් සිට ඉකුත් වූ ගිහි-පැවිදි පින්වතුනටත් වැල්ලවත්තේ ශ්‍රී ධර්මොදය පිරිවෙන හා ඉඳුරුවේ ශ්‍රී විජයධර්ම පිරිවෙන පිහිටුවා මා පැවිදි කොට සසුන් පිළිවෙත හෙළිකර දුන් අපවත් වී වදළ පූජ්‍යාචාර්ය ඉඳුරුවේ සිරිවිමලතිස්ස මාහිමි තුමාටත් වැල්ලවත්තේ ශ්‍රී ධර්මොදය පරිවෙණාධිපති වැ වැඩවසමින් ධර්ම විනය සහිත භාෂා ශාස්ත්‍රාදිය උගන්වා මා නිසි මගැ යෙද වූ පණ්ඩිතාචාර්ය ත්‍රිපිටකවාගීස්වරාචාර්ය **රස්නකවැවේ සිරිසද්ධම්මවංස** මාහිමිතුමාටත් කොල්ලුපිටියේ ශ්‍රී ධර්මකීර්ත්‍යාරාමාධිපති වැ වැඩසිටිමින් මා හට නොයෙක් අයුරෙන් උදවු උපකාර කළ මාගේ ජ්‍යෙෂ්ඨ ශාසනික සහෝදර **හඬුවාපොළ සිරිවිමලවංස** අනුනායක හිමිතුමාටත් මා හද වඩා පෝෂණය කළ දෙමාපියනටත් මෙයින් මා උපයා සපයා ගත් ධර්මදානමය කුශලය පහන් සිතින් අනුමොදනා කරවම්හ.

මේ ග්‍රන්ථය මුද්‍රණය කරවීමට ආවශ්‍යක ධනය පරිත්‍යාග කරමින් අනුබලප්‍රදානය කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **සංස්කෘතික අමාත්‍යවරයා** ප්‍රමුඛ සංස්කෘතික කාර්‍ය්‍යාංශයේ අධිකාරී-නටත් ශ්‍රී ලංකාවේ **ශ්‍රීමත් ජනාධිපති** උතුමා ප්‍රධාන කොට ඇති **අගමැතිතුමා** සහිත මැති ඇමතිවරුනටත් මුද්‍රණකාර්‍ය්‍යය සිත් අලවන සේ මැනැවින් සිදු කොට දුන් දෙහිවල දුටුගැමුණු වීදියේ **තිසර** මුද්‍රණාලයාධිකාරීනටත් සේවක පිරිසටත් මෙයින් ජනිත ධර්ම-දානමය කුශල ශක්තියෙන් උතුම් නිවන් සැප ලැබෙවා යි ඉත සිතින් පතම්හ.

මෙවගට,

ශාසනස්ථිතිකාමී,

**ඉඳුරුවේ උත්තරානන්ද**

ශ්‍රීලංකාරාමඤ්ඤනිකායේ මහානායක ස්ථවිර

ශ්‍රී ධර්මකීර්ත්‍යාරාමය,
කොල්ලුපිටිය, කොළඹ 3.

2525/1981 ජූලි 31.



Free Distribution www.aathaapi.org

# සංකේත නිරූපණය

සී: සිංහලාක්ෂර, පුස්කොළ පොත්

සීමු. 1, 1910 මුද්‍රණය. බෙන්තර සද්ධාතිස්ස ස්ථවිර සංස්කරණය

සීමු. 2, බු: 2472 මුද්‍රණය. බෙරුවල මෙධාසිරි මහාස්ථවිර සංස්කරණය

මජසං: බුරුමරට ඡට්ඨසංගීති සංස්කරණය

ස්‍යා: තායාක්ෂර මුද්‍රිත පාචිත්තිය පාළි

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a ආ ā ඉ i ඊ ī උ u ඌ ū එ e ඔ o

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mmha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ vha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā ි i ී ī ු ු u ූ ූ ū ෙ e ො o



Free Distribution www.aathaapi.org

# පාචිත්තියපාළි

## විෂය සූචි

භික්ඛුවිභඞ්ගො

### 1 පාරාජිකකණ්ඩං 2–29


| | | | |
|---|---|---|---|
| 1–1. | පඨම පාරාජිකං | .. .. | 1 – 13 |
| 1–2. | දුතියපාරාජිකං | .. .. | 14 – 19 |
| 1–3. | තතියපාරාජිකං | .. .. | 18 – 25 |
| 1–4. | චතුත්ථපාරාජිකං | . | 24 – 29 |


### 2. සත්තරසකං (සඞ්ඝාදිසෙස) 30–91


| | | | |
|---|---|---|---|
| 2– 1. | පඨමසඞ්ඝාදිසෙසො | .. .. | 30 – 35 |
| 2– 2. | දුතිය ,, | .. .. | 34 – 41 |
| 2– 3. | තතිය ,, | .. .. | 40 – 49 |
| 2– 4. | චතුත්ථ ,, | .. .. | 48 – 53 |
| 2– 5. | පඤ්චම ,, | .. .. | 54 – 57 |
| 2– 6. | ඡට්ඨ ,, | .. .. | 58 – 63 |
| 2– 7. | සත්තම ,, | .. .. | 62 – 69 |
| 2– 8. | අට්ඨම ,, | .. .. | 70 – 75 |
| 2– 9. | නවම ,, | .. .. | 76 – 81 |
| 2–10. | දසම ,, | .. .. | 82 – 91 |


### 3. නිස්සග්ගියා 92–133


| | | | |
|---|---|---|---|
| 3– 1. | පඨමසික්ඛාපදං | | 92 – 97 |
| 3– 2. | දුතිය ,, | | 96 – 99 |
| 3– 3. | තතිය ,, | . | 100 – 103 |
| 3– 4. | චතුත්ථ ,, | .. | 104 – 107 |
| 3– 5. | පඤ්චම ,, | .. | 106 – 109 |
| 3– 6. | ඡට්ඨ ,, | .. | 110 – 113 |
| 3– 7. | සත්තම ,, | .. | 112 – 115 |
| 3– 8. | අට්ඨම ,, | .. | 116 – 119 |
| 3– 9. | නවම ,, | .. | 118 – 121 |
| 3–10 | දසම ,, | .. | 122 – 125 |
| 3–11. | එකාදසම ,, | .. | 124 – 129 |
| 3–12. | ද්වාදසම . | | 128 – 131 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 4. පාචිත්තියකණ්ඩො 134–371

#### 4–1 ලසුනවග්ගො 134–157


| | | | | |
|---|---|---|---|---|
| 1. | පඨමසික්ඛාපදං | .. | .. | 134 – 137 |
| 2. | දුතිය ,, | .. | .. | 136 – 139 |
| 3. | තතිය ,, | .. | .. | 138 – 141 |
| 4. | චතුත්ථ ,, | .. | .. | 140 – 141 |
| 5. | පඤ්චම ,, | .. | .. | 142 – 145 |
| 6. | ඡට්ඨ ,, | .. | .. | 144 – 147 |
| 7. | සත්තම ,, | .. | .. | 146 – 149 |
| 8. | අට්ඨම ,, | .. | .. | 150 – 153 |
| 9. | නවම ,, | .. | .. | 152 – 155 |
| 10. | දසම ,, | .. | .. | 154 – 157 |


#### 4–2 අන්ධකාරවග්ගො 158–183


| | | | | |
|---|---|---|---|---|
| 1. | පඨමසික්ඛාපදං | .. | .. | 158 – 161 |
| 2. | දුතිය ,, | .. | .. | 160 – 163 |
| 3. | තතිය ,, | .. | .. | 162 – 165 |
| 4. | චතුත්ථ ,, | .. | .. | 166 – 169 |
| 5. | පඤ්චම ,, | .. | .. | 168 – 171 |
| 6. | ඡට්ඨ ,, | .. | .. | 172 – 175 |
| 7. | සත්තම ,, | .. | .. | 174 – 177 |
| 8. | අට්ඨම ,, | .. | .. | 178 – 179 |
| 9. | නවම ,, | .. | .. | 180 – 183 |
| 10. | දසම ,, | .. | .. | 182 – 183 |


#### 4–3 නග්ගවග්ගො 184–207


| | | | | |
|---|---|---|---|---|
| 1. | පඨමසික්ඛාපදං | .. | .. | 184 – 185 |
| 2. | දුතිය ,, | .. | .. | 184 – 187 |
| 3. | තතිය ,, | .. | .. | 188 – 191 |
| 4. | චතුත්ථ ,, | .. | .. | 192 – 193 |
| 5. | පඤ්චම ,, | .. | .. | 194 – 195 |
| 6. | ඡට්ඨ ,, | .. | .. | 196 – 197 |
| 7. | සත්තම ,, | .. | .. | 198 – 199 |
| 8. | අට්ඨම ,, | .. | .. | 200 – 201 |
| 9. | නවම ,, | .. | .. | 202 – 205 |
| 10. | දසම ,, | .. | .. | 204 – 207 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 4-4 තුවට්ටවග්ගො 208-233


| | | | |
|---|---|---|---|
| 1. | පඨමසික්ඛාපදං | .. .. | 208 – 209 |
| 2. | දුතිය ,, | .. .. | 208 – 211 |
| 3. | තතිය ,, | .. .. | 212 – 215 |
| 4. | චතුත්ථ ,, | .. .. | 214 – 217 |
| 5. | පඤ්චම ,, | .. .. | 216 – 221 |
| 6. | ඡට්ඨ ,, | .. .. | 220 – 225 |
| 7. | සත්තම ,, | .. .. | 224 – 227 |
| 8. | අට්ඨම ,, | .. .. | 226 – 229 |
| 9. | නවම ,, | .. .. | 228 – 231 |
| 10. | දසම ,, | .. .. | 230 – 233 |


### 4-5. චිත්තාගාරවග්ගො 234-255


| | | | |
|---|---|---|---|
| 1. | පඨමසික්ඛාපදං | .. .. | 234 – 237 |
| 2. | දුතිය ,, | .. .. | 236 – 239 |
| 3. | තතිය ,, | .. .. | 238 – 239 |
| 4. | චතුත්ථ ,, | .. .. | 240 – 241 |
| 5. | පඤ්චම ,, | .. .. | 240 – 245 |
| 6. | ඡට්ඨ ,, | .. .. | 244 – 247 |
| 7. | සත්තම ,, | .. .. | 246 – 249 |
| 8. | අට්ඨම ,, | .. .. | 248 – 251 |
| 9. | නවම ,, | .. .. | 250 – 253 |
| 10. | දසම ,, | .. .. | 252 – 255 |


### 4-6. ආරාමවග්ගො 256-281


| | | | |
|---|---|---|---|
| 1. | පඨමසික්ඛාපදං | .. .. | 256 – 259 |
| 2. | දුතිය ,, | .. .. | 260 – 263 |
| 3. | තතිය ,, | .. .. | 262 – 265 |
| 4. | චතුත්ථ ,, | .. .. | 266 – 269 |
| 5. | පඤ්චම ,, | .. .. | 268 – 271 |
| 6. | ඡට්ඨ ,, | .. .. | 270 – 271 |
| 7. | සත්තම ,, | .. .. | 272 – 273 |
| 8. | අට්ඨම ,, | .. .. | 274 – 275 |
| 9. | නවම ,, | .. .. | 276 – 277 |
| 10. | දසම ,, | .. .. | 276 – 281 |




Free Distribution www.aathaapi.org

විෂය සූචි


4-7. ගබ්භිනිවග්ගො 282-313

1. පඨමසික්ඛාපදං .. . 282 – 285
2. දුතිය ,, .. . 284 – 287
3. තතිය ,, .. . 286 – 291
4. චතුත්ථ ,, .. . 290 – 295
5. පඤ්චම ,, .. .. 294 – 297
6. ඡට්ඨ ,, .. . 296 – 301
7. සත්තම ,, .. .. 302 – 307
8. අට්ඨම ,, .. .. 306 – 309
9. නවම ,, .. .. 308 311
10. දසම ,, .. .. 310 313

4-8. කුමාරිභූතවග්ගො 314-349

1. පඨමසික්ඛාපදං .. 314 317
2. දුතිය ,, .. 316 321
3. තතිය ,, .. 320 325
4. චතුත්ථ ,, 326 – 327
5. පඤ්චම ,, 328 – 333
6. ඡට්ඨ ,, 332 – 335
7. සත්තම ,, 334 337
8. අට්ඨම ,, 336 339
9. නවම ,, 340 – 341
10. දසම ,, . 342 – 343
11. එකාදසම ,, . 344 – 345
12. ද්වාදසම ,, . 346 – 347
13. තෙරසම , 348 – 349

4-9. ඡත්තුපාහනවග්ගො 350-371

1. පඨමසික්ඛාපද .. 350 – 353
2. දුතිය ,, .. 352 – 355
3. තතිය ,, .. .. 354 – 357
4. චතුත්ථ ,, .. .. 356 – ''
5. පඤ්චම ,, .. .. 358 – 359
6. ඡට්ඨ ,, .. .. '' – 361
7. සත්තම ,, .. .. 360 – 363
8-9-10. අට්ඨම-නවම-දසම සික්ඛාපදානි 362 – 365
11. එකාදසමසික්ඛාපදං .. 364 – 365
12. ද්වාදසම ,, .. 366 – 367
13. තෙරසම ,, .. .. 368 – 369

5. පාටිදෙසනීයා 372-378

1 පඨම පාටිදෙසනීයං .. .. 372 – 375
8 දුතිය අට්ඨම පාටිදෙසනීයා .. .. 374 – 379

6. සෙඛියා .. .. 378 – 383
7. අධිකරණසමථ .. 382 – 383




Free Distribution www.aathaapi.org

## විනයපිටකෙ

# පාචිත්තියපාළි

## භික්ඛුනීවිභඞ්ගො

Free Distribution www.aathaapi.org

විනයපිටකෙ

# පාචිත්තියපාළි

## භික්ඛුනීවිභඞ්ගො

පාරාජිකකණ්ඩො

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

## 1. 1

### පඨමපාරාජිකං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාළ්හො මිගාරනත්තා භික්ඛුනීසඞ්ඝස්ස විහාරං කත්තුකාමො හොති. අථ ඛො සාළ්හො මිගාරනත්තා භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොච : ඉච්ඡාමහං අය්‍යෙ භික්ඛුනීසඞ්ඝස්ස විහාරං කාතුං, දෙථ මෙ නවකම්මිකං භික්ඛුනින්ති. තෙන ඛො පන සමයෙන චතස්සො භගිනියො භික්ඛුනීසු පබ්බජිතා හොන්ති නන්දා නන්දවතී සුන්දරීනන්දා ථුල්ලනන්දාති. තාසු සුන්දරීනන්දා භික්ඛුනී තරුණපබ්බජිතා හොති,[1] අභිරූපා දස්සනීයා පාසාදිකා පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනී දක්ඛා අනලසා තත්‍රූපායාය වීමංසාය සමන්නාගතා අලං කාතුං අලං සංවිධාතුං. අථ ඛො භික්ඛුනීසඞ්ඝො සුන්දරීනන්දං භික්ඛුනිං සම්මන්නිත්වා සාළ්හස්ස මිගාරනත්තුනො නවකම්මිකං අදාසි. තෙන ඛො පන සමයෙන සුන්දරීනන්දා භික්ඛුනී සාළ්හස්ස මිගාරනත්තුනො නිවෙසනං අභික්ඛණං ගච්ඡති. වාසිං දෙථ එරසුං[2] දෙථ කුඨාරිං දෙථ කුද්දලං,[3] දෙථ නිඛාදනං දෙථාති. සාළ්හොපි මිගාරනත්තා භික්ඛුනු-පස්සයං අභික්ඛණං ගච්ඡති කතාකතං ජානිතුං. තෙ අභිණ්හදස්සනෙන පටිබද්ධචිත්තා අහෙසුං. අථ ඛො සාළ්හො මිගාරනත්තා සුන්දරීනන්දං භික්ඛුනිං දූසෙතුං ඔකාසං අලභමානො එතදෙවත්ථාය භික්ඛුනීසඞ්ඝස්ස භත්තං අකාසි. අථ ඛො සාළ්හො මිගාරනත්තා භත්තග්ගෙ ආසනං පඤ්ඤපෙන්තො එත්තිකා භික්ඛුනියො අය්‍යාය සුන්දරීනන්දාය වුඩ්ඪතරාති එකමන්තං ආසනං පඤ්ඤපෙසි, එත්තිකා නවකතරාති එකමන්තං ආසනං පඤ්ඤපෙසි, පටිච්ඡන්නෙන ඔකාසෙ නිකූටෙ සුන්දරීනන්දාය භික්ඛුනියා ආසනං පඤ්ඤපෙසි. යථා ථෙරා භික්ඛුනියො ජානෙය්‍යුං නවකානං භික්ඛුනීනං සන්තිකෙ නිසින්නාති, නවකාපි භික්ඛුනියො ජානෙය්‍යුං ථෙරානං භික්ඛුනීනං සන්තිකෙ නිසින්නාති.

---

1. තරුණපබ්බජිතා අභිරූපා හොති - මජ්සං
2. පරසුං - මජ්සං
3. කුදලං - මජ්සං

විනයපිටකයෙහි

# පාචිත්තියපාළි

## භික්ෂුණීවිභඞ්ගය

### පාරාජිකකාණ්ඩය

### ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා

### 1. 1

### පළමුවන පරිජිය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සේකැ. එසමයෙහි සාළ්හ මිගාරනප්තෘ තෙමේ භික්ෂුණීසඞ්ඝයාහට වෙහෙරක් කරනු කැමැත්තේ වෙයි. එකල්හි සාළ්හ මිගාරනප්තෘ තෙමේ මෙහෙණන් වෙතැ එළැඹැ තෙල කී යැ 'ආර්යාවෙනි, මම භික්ෂුණී සඞ්ඝයාහට වෙහෙරක් කරනු කැමැත්තෙමි, මාහට නවකම් විදහන මෙහෙණක දෙනුමැනැවැ' යි. එසමයෙහි වනාහි නන්ද යැ නන්දවතී යැ සුන්දරීනන්ද යැ ථුල්ලනන්ද යැ යි සතර බුහුන කෙනෙක් මෙහෙණන් කෙරෙහි පැවිදි වූවාහු වෙති. ඔවුනතුරෙන් සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ තුරුණුවියෙහි පැවිදිවූවා වෙයි. විශිෂ්ට රූ ඇත්තී දැකුම්කලු වූවා පැහැදුම් එළවන්නී පණ්ඩිත වූවා ව්‍යක්ත වූවා නුවණැති වූවා දක්ෂ වූවා අනලස් වූවා වෙයි. ඒ ඒ කම්විෂයෙහි උපාය වූ කළයුතු කම්හි විමසුම් නුවණින් යුතු වූවා ඒ ඒ කම් කරන්නට ද සංවිධාන කරන්නට ද සමර්ථ වූවා වෙයි. ඉක්බිති භික්ෂුණීසඞ්ඝ තෙමේ සුන්දරීනන්ද භික්ෂුණිය සම්මත කොට සාළ්හ මිගාරනප්තෘ හට නවකැමියක කොට දුන්නේ යැ. එසමයෙහි වනාහි සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ සාළ්හ මිගාරනප්තෘහුගේ නිවෙසට නිතර නිතර යයි, 'වැයක් දෙව, පොරොවක් දෙව, කෙටේරියක් දෙව, උදැල්ලක් දෙව, නියනක් දෙව' යි, සාළ්හ මිගාරනප්තෘ තෙමේත් කළ දැය නො කළ දැය දැනගන්නට මෙහෙණවරට නිතර නිතර යයි. ඔහු දෙදෙන නිතර නිතර දැක්මෙන් පිළිබඳ සිත් ඇතියෝ වූහු. එකල්හි සාළ්හ මිගාරනප්තෘ තෙමේ සුන්දරීනන්ද භික්ෂුණිය දූෂණය කරන්නට අවසරයක් නො ලබන්නේ තෙල කරුණ මැ සඳහා භික්ෂුණීසඞ්ඝයාට බතක් (පිළියෙළ) කෙළේ යැ. එකල්හි සාළ්හ මිගාරනප්තෘතෙමේ භක්තාග්‍රයෙහි අසුන් පනවන්නේ මෙතෙක් භික්ෂුණීහු ආර්යා සුන්දරීනන්දවට වැඩිමහලූ හයි එකත්පසෙකැ අසුන් පැනවියැ, මෙතෙක් දෙනා නවක තරහයි එකත්පසෙකැ අසුන් පැනැවී යැ. ස්ථවිර භික්ෂුණීහු (ඕතොමෝ) නවක භික්ෂුණීන්ගේ සමීපයෙහි හිනැයි යමසේ දන්නාහු නම් නවක භික්ෂුණීහු (ඕතොමෝ) ස්ථවිර භික්ෂුණීන්ගේ සමීපයෙහි හිනැයි යමසේ දන්නාහු නම් එසේ සුන්දරීනන්ද මෙහෙණහට පිළිසත් අඟකොණ් පෙදෙසෙකැ අසුනක් පැනවී යැ.

2. අථ ඛො සාළ්හො මිගාරනත්තා භික්ඛුනිසඞ්ඝස්ස කාලං ආරොචාපෙසි, කාලො අය්‍යෙ නිට්ඨිතං භත්තන්ති. සුන්දරීනන්දා භික්ඛුනී සල්ලක්ඛෙත්වා න බහුකතො සාළ්හො මිගාරනත්තා භික්ඛුනිසඞ්ඝස්ස භත්තං අකාසි. මං සො දූසෙතුකාමො, සචාහං ගමිස්සාමි විස්සරො මෙ භවිස්සතීති අන්තෙවාසිනිං[1] භික්ඛුනිං ආණාපෙසි, ගච්ඡ මෙ පිණ්ඩපාතං නීහර, යො ච[2] මං පුච්ඡති ගිලානාති පටිවෙදෙහීති. එවං අය්‍යෙති ඛො සා භික්ඛුනී සුන්දරීනන්දාය භික්ඛුනියා පච්චස්සොසි.

3. තෙන ඛො පන සමයෙන සාළ්හො මිගාරනත්තා බහිද්වාරකොට්ඨකෙ ඨිතො හොති සුන්දරීනන්දං භික්ඛුනිං පටිපුච්ඡන්තො ''කහං අය්‍යෙ අය්‍යා සුන්දරීනන්දා''ති. කහං අය්‍යෙ අය්‍යා සුන්දරීනන්දා''ති එවං වුත්තෙ සුන්දරීනන්දාය භික්ඛුනියා අන්තෙවාසිනී භික්ඛුනී සාළ්හං මිගාරනත්තාරං එතදවොච ගිලානා ආවුසො පිණ්ඩපාතං නීහරිස්සාමීති. අථ ඛො සාළ්හො මිගාරනත්තා යම්පාහං අත්ථාය භික්ඛුනිසඞ්ඝස්ස භත්තං අකාසිං, අය්‍යාය සුන්දරීනන්දාය කාරණාති. මනුස්සෙ ආණාපෙත්වා භික්ඛුනිසඞ්ඝං භත්තෙන පරිවිසථාති වත්වා යෙන භික්ඛුනුපස්සයො තෙනුපසඞ්කමි.

4. තෙන ඛො පන සමයෙන සුන්දරීනන්දා භික්ඛුනී බහාරාමකොට්ඨකෙ ඨිතා හොති සාළ්හං මිගාරනත්තාරං පතිමානෙන්තී, අද්දසා ඛො සුන්දරීනන්දා භික්ඛුනී සාළ්හං මිගාරනත්තාරං දූරතොව ආගච්ඡන්තං දිස්වාන උපස්සයං පවිසිත්වා සසීසං පාරුපිත්වා මඤ්චකෙ නිපජ්ජි. අථ ඛො සාළ්හො මිගාරනත්තා යෙන සුන්දරීනන්දා භික්ඛුනී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සුන්දරීනන්දං භික්ඛුනිං එතදවොච: කිං තෙ අය්‍යෙ අඵාසු කිස්ස නිපන්නාසීති. එවඤ්හෙතං ආවුසො හොති යා අනිච්ඡන්තං[3] ඉච්ඡතීති. ක්‍යාහං තං අය්‍යෙ න ඉච්ඡිස්සාමි. අපිචාහං ඔකාසං න ලභාමි තං දූසෙතුන්ති. අවස්සුතො අවස්සුතාය සුන්දරීනන්දාය භික්ඛුනියා කායසංසග්ගං සමාපජ්ජි.

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ජරාදුබ්බලා චරණගිලානා සුන්දරීනන්දාය භික්ඛුනියා අවිදූරෙ නිසින්නා[4] හොති. අද්දසා ඛො සා භික්ඛුනී සාළ්හං මිගාරනත්තාරං අවස්සුතං අවස්සුතාය සුන්දරීනන්දාය භික්ඛුනියා කායසංසග්ගං සමාපජ්ජන්තං, දිස්වාන උජ්ඣායති ඛියති විපාචෙති: ''කථං හි නාම අය්‍යා සුන්දරීනන්දා අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියිස්සතීති.

---

1. අන්තෙවාසිං, සිමු 1, සී 1,
2. යොපෙ - මජසං
3. අනිච්ඡන්තං - සිමු
4. නිපන්නා - මජසං

2. ඉක්බිති සාළ්හ මිගාරනප්තෘ තෙමේ “ආර්යාවෙනි, බත (පිළියෙළ කොට) නිමවන ලදි, (එයට) සුදුසු කලැ’යි භික්ෂුණී සඞ්ඝයාහට කල් දැන්වීය. සුන්දරීනන්දා භික්ෂුණී තොමෝ (නුවණින්) සලකා “සාළ්හ මිගාරනප්තෘ තෙමේ කළ බුහුමන් ඇතියේ භික්ෂුණී සඞ්ඝයාහට බත පිළියෙළ නො කෙළේ යැ. හේ මා දූෂණය කරනු කැමැත්තේ වෙයි, ඉදින් මම යන්නෙම් නම් මාගේ විප්‍රකාර ශබ්දය වන්නේ”යි අතැවැසි මෙහෙණකට ඇණවූයැ : යා, මා හට පිණ්ඩපාතය ගෙනැ එව, යමෙකුත් මා ගැන පිළිවිසී නම් ගිලනැයි (ඔහුට) දන්වාලව යි. එසේ යැ ආර්යාවෙනි යි ඒ මෙහෙණ සුන්දරීනන්දා මෙහෙණට පිළිවදන් දුන්නා යැ.

3. එසමයෙහි සාළ්හ මිගාරනප්තෘ තෙමේ බිහිදෙර කොටු-යෙහි සුන්දරීනන්දා මෙහෙණ පිළිවිසිමින් සිටියේ වෙයි: “ආර්යාවෙනි, ආර්යා සුන්දරීනන්දා කොහි ද? ආර්යාවෙනි, ආර්යා සුන්දරීනන්දා කොහි”දැයි. මෙසේ කී කල්හි සුන්දරීනන්දා මෙහෙණගේ අතැවැසි මෙහෙණ තොමෝ සාළ්හ මිගාරනප්තෘහට තෙල කිවු යැ : “ඇවැත, ගිලන් යැ පිණ්ඩපාතය ගෙන යන්නෙමි’යි. එකල්හි සාළහ මිගාරනප්තෘ තෙමේ යමක සඳහා මම මෙහෙණසඟනට බත (පිළියෙළ) කෙළෙම් ද (ඒ) සුන්දරීනන්දා ආර්යාව සඳහා යි මිනිසුන් අණවා බතින් මෙහෙණසඟන වළඳවවු’යි කියා මෙහෙණවර වෙතැ එළැඹී-යේ යැ.

4. එසමයෙහි සුන්දරීනන්දා භික්ෂුණී තොමෝ සාළ්හ මිගාරනප්තෘහු බලාපොරොත්තු වන්නී අරමැ පවුරෙන් පිටතැ සිටියා වෙයි. සුන්දරීනන්දා භික්ෂුණී තොමෝ සාළ්හ මිගාරනප්තෘහු එන්නහු දුර දී මැ දැකැ මෙහෙණවරට පිවිස හිස සහිත වැ පෙරෙවැ ඇඳෙහි හොත්තා යැ. එකල්හි සාළ්හ මිගාරනප්තෘ තෙමේ සුන්දරීනන්දා මෙහෙණ වෙතැ එළඹියේ යැ. එළැඹ සුන්දරීනන්දා මෙහෙණට තෙල කී යැ : “ආර්යාවෙනි, ඔබට අපහසු කිමැ, කුමට හො වී”දැයි. ඇවැත්නි, තෙල නො රිසියකු කැමැති වන්නකුට වේ යැයි, ආර්යා-වෙනි, කිම මම තොප නො කැමැතියෙම් ද? වැළිදු මම දූෂණයට අවකාශ නො ලබම් යි කා සසහරායෙන් තෙත්වූයේ කා සසහරා-යෙන් තෙත්වූ සුන්දරීනන්දා මෙහෙණ හා කායසංසර්ගයට පැමිණියේ යි.

5. එසමයෙහි එක්තරා මෙහෙණක් ජරායෙන් දුබලවූවා ගිලන්පා ඇතියා සුන්දරීනන්දා මෙහෙණට නුදුරැතන්හි උන්නා වෙයි. ඒ මෙහෙණ රාගයෙන් තෙත්වූ සාළ්හ මිගාරනප්තෘහු රාගයෙන් තෙත් වූ සුන්දරීනන්දා මෙහෙණ හා කායසංසර්ගයට සමවදනහු දුටුවා යැ. දැකැ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි “කෙසේ නම් රාගයෙන් තෙත්වූ සුන්දරීනන්දා ආය්‍යා තොමෝ රාග-යෙන් තෙත් වූ පිරිමිනියක්හුගේ කායසංසර්ගය ඉවසූ”දැයි.



Free Distribution www.aathaapi.org

6. අථ ඛො යා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි: යා තා භික්ඛුනියො අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තා උජ්ඣායන්ති ඛීයන්ති, විපාචෙන්ති. "කථං හි නාම අය්‍යා සුන්දරීනන්දා අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියිස්සතී" ති අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස. කායසංසග්ගං සාදියිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ[1] භගවතො එතමත්ථං ආරොචෙසුං.

7. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: සච්චං කිර භික්ඛවෙ සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියීති[2]. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා අනනුච්ඡවියං[3] භික්ඛවෙ සුන්දරීනන්දාය භික්ඛුනියා අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. "කථං හි නාම භික්ඛවෙ සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියිස්සතීති නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භීයොභාවාය, අථඛෙවතං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායාති. අථ ඛො භගවා සුන්දරීනන්දං භික්ඛුනිං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨියා[4] සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අප්පිච්ඡස්ස[5] සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

8. තෙන හි භික්ඛවෙ භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච: සඞ්ඝසුට්ඨුතාය සඞ්ඝඵාසුතාය දුම්මඞ්කූනං භික්ඛුනීනං නිග්ගහාය පෙසලානං භික්ඛුනීනං ඵාසුවිහාරාය දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය අප්පසන්නානං[6] පසාදාය පසන්නානං භීයොභාවාය සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

---

1. සුන්දරීනන්දං භික්ඛුනිං අනෙකපරියායෙන විගරහිත්වා - මජ්ඣං ඉත දිස්සතෙ.
2. සාදියතීති - සත්‍ය
3. අනනුච්ඡවිකං – මජ්ඣං
4. අසන්තුට්ඨිතාය – මජ්ඣං
5. අප්පිච්ඡතාය – මජ්ඣං
6. අප්පසන්නානං වා සීමු 2.



Free Distribution www.aathaapi.org

6. ඉක්බිති ඒ මෙහෙණ මෙහෙණන්හට තෙල කරුණ දන්වූ යැ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ සන්තොස් ගුණැති යෝ ලජ්ජිනියෝ හටගත් කුකුස් ඇතියෝ ශික්ෂාකාමිනියෝ වෙද්ද ඔහු තුමූ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: ''කෙසේ නම් සුන්‍දරීනන්‍දා ආර්‍ය්‍යා තොමෝ රාගයෙන් තෙත්වූවා රාගයෙන් තෙත්වූ පිරිමිනියක්හුගේ කායසංසර්ගය ඉවසූ''දැයි. එකල්හි ඒ මෙහෙණෝ මහණුන්හට තෙල කරුණ දන්වූහු. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස්වූවෝ සතොස් ගුණැතියෝ ලජ්ජා ඇතියෝ හටගත් කුකුස් ඇත්තෝ ශික්ෂාකාමීහු වෙද්ද, ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් ''කෙසේ නම් සුන්‍දරීනන්‍දා භික්ෂුණී තොමෝ රාගයෙන් තෙත්වූවා රාගයෙන් තෙත්වූ පිරිමිනියක්හුගේ කායසංසර්ගය ඉවසූ''දැයි. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ සැලකළහ.

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා භික්ෂූ සඞ්ඝයා රැස්කරවා භික්ෂූන් පිළිවුසූ සේකැ සැබෑද මහණෙනි: සුන්‍දරීනන්‍දා මෙහෙණ රාගයෙන් තෙත් වූවා රාගයෙන් තෙත්වූ පිරිමිනියක්හුගේ කායසංසර්ගය ඉවසූ දැයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ. මහණෙනි සුන්‍දරීනන්‍දා මෙහෙණ විසින් කරන ලද්ද නො සුදුසු යැ, නො අනුලොම් යැ, නො නිසි යැ, නො මහණකම් යැ, නො කැප යැ, නො කළයුතු යැ. ''කෙසේ නම් මහණෙනි රාගයෙන් තෙත් වූ සුන්‍දරීනන්‍දා මෙහෙණ රාගයෙන් තෙත්වූ පිරිමිනියක්හුගේ කායසංසර්ගය ඉවසූ''දැයි. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ ප්‍රසන්නයන්ගේ අතිරේක ප්‍රසාදය පිණිස හෝ නො වේ මැයි. මහණෙනි හුදෙක් මේ වනාහි අප්‍රසන්නයන්ගේ අප්‍රසාදය පිණිස ද ප්‍රසන්නයන් කෙරෙහුදු ඇතැම් කෙනෙකුන්ගේ වෙනස්බව පිණිස ද (කරුණු) වේ මැයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සුන්‍දරීනන්‍දා මෙහෙණට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි දුපුස්නා බැව්හි මහත් ගිජුබැව්හි නො සතුටුබැව්හි මුළුබැඳගැනුම්හි අලසබැව්හි නුගුණ වදරා නොයෙක් කරුණෙන් සුබරබැව්හි සුපුස්නා බැව්හි අපිස්බැව්හි සතුටු බැව්හි සලේපැවැතුම්හි කෙලෙස් කැපුම්හි පැහැදුම් එළවීමෙහි නිවනෙහි වැර ඇරැඹුම්හි ගුණ වදරා මහණුන්හට එයට සරිලන එයට අනුලොම්වන දැහැමි කථා කොට මහණුන් ඇමතූසේකැ:

8. එහෙයින් මහණෙනි, මෙහෙණන්හට දසකරුණක් පිණිස සිකපද පනවන්නෙමි. සඟුන්ගේ මනා පිළිගැනුම, සඟුන්ගේ පහසු බව, දුසිල්පුඟුලනට නිගැන්ම, සුසිල් මහණුන්ගේ පහසු විසුම, මෙලෝ ගැහැට වළකාලීම, පරලෝ ගැහැට වැනැසීම, නො පැහැදුනවුන්ගේ පැහැදීම, පැහැදුනවුන්ගේ අයිරා පැහැදීම, සසුන් පැවැත්ම, විනයට රුකුල්දීම පිණිස යැ. මහණෙනි, මෙසේත් මේ සිකපදය මෙහෙණෝ උදෙසත්වා:

**යා පන භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආමසනං වා පරාමසනං වා ගහණං වා ඡුපනං වා පතිපීළනං වා සාදියෙය්‍ය, අයම්පි පාරාජිකා හොති අසංවාසා, උබ්භජාණුමණ්ඩලිකාති.**

9. **යා පනාති:** යා යාදිසා යථායුත්තා යථාජච්චා යථානාමා යථාගොත්තා යථාසීලා යථාවිහාරිනී යථාගොචරා ථෙරා වා නවා වා මජ්ඣිමා වා, එසා වුච්චති යා පනාති.

**භික්ඛුනීති:** භික්ඛිකාති[1] භික්ඛුනී, භික්ඛාචරියං අජ්ඣුපගතාති භික්ඛුනී භින්නපටධරාති භික්ඛුනී සමඤ්ඤාය භික්ඛුනී පටිඤ්ඤාය භික්ඛුනී එහිභික්ඛුනීති භික්ඛුනී තීහි සරණගමනෙහි උපසම්පන්නාති භික්ඛුනී භද්‍රා භික්ඛුනී සාරා භික්ඛුනී සෙඛා භික්ඛුනී අසෙඛා භික්ඛුනී සමග්ගෙන උභතොසඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නාති භික්ඛුනී, තත්‍ර යායං භික්ඛුනී සමග්ගෙන උභතොසඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නා අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අවස්සුතා** නාම: සාරත්තා අපෙක්ඛවතී[2] පටිබද්ධචිත්තා.

**අවස්සුතො** නාම: සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො.

**පුරිසපුග්ගලො** නාම: මනුස්සපුරිසො, න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො විඤ්ඤූ පටිබලො කායසංසග්ගං සමාපජ්ජිතුං.

**අධක්ඛකන්ති:** හෙට්ඨක්ඛකං.

**උබ්භජාණුමණ්ඩලන්ති:** උපරිජාණුමණ්ඩලං.

**ආමසනං** නාම: ආමට්ඨමත්තං.

**පරාමසනං** නාම: ඉතොචිතො ච සඤ්චොපනං.

**ගහණං** නාම: ගහිතමත්තං.

**ඡුපනං** නාම: ඵුට්ඨමත්තං.

**පතිපීළනං වා සාදියෙය්‍යාති:** අඞ්ගං ගහෙත්වා නිප්පීළනං සාදියති.

1. භික්ඛිකාති – මජසං
2. අපෙක්ඛවති – සී; සීමු;



Free Distribution www.aathaapi.org

යම් මෙහෙණක් රාගයෙන් තෙත්වූවා රාගයෙන් තෙත් වූ පිරිමියකුගේ අකුඇටෙන් යටැ දණමඩලෙන් මතු ආමර්ශනය හෝ පරාමර්ශනය හෝ ග්‍රහණය හෝ ස්පර්ශමාත්‍රය හෝ ප්‍රතිපීඩනය හෝ ඉවසා නම් මෝ තොමෝත් පරිජිවූවා සහවාසයට නො නිසි වූවා වෙයි, උබ්භජාණුමණ්ඩලිකා යැ.

9. යා පන: යම් යම්බඳු, යම්බඳු යෙදීම් ඇති යම්බඳු ජාති ඇති යම්බඳු නම් ඇති යම්බඳු ගෝත්‍ර ඇති යම්බඳු සැහැවි ඇති යම්බඳු විහරණ ඇති යම්බඳු පැවැතුම් ඇති ස්ථවිර වූවක් හෝ නවක වූවක් හෝ මධ්‍යම වූවක් හෝ වෙයි නම්, මෝ තොමෝ යා පන යැයි කියනු ලැබේ.

භික්ඛුනී: සිඟානුයි භික්ඛුනී යැ, පිඬු සිඟා පැමිණියා නුයි භික්ඛුනී යැ, බුන් පිළි දරානුයි භික්ඛුනී යැ, බැවහරයෙන් භික්ඛුනීයැ, පිළින කිරීමෙන් භික්ඛුනී යැ, එව මෙහෙණැයි භික්ඛුනී යැ, තුන් සරණ ගමනින් උපසපන්වූවා නුයි භික්ඛුනී යැ, (ශීලාදීන්) භද්‍ර වූවා නුයි භික්ඛුනී යැ, (ශීලාදීන්) සාරවූවා නුයි භික්ඛුනී යැ, භික්මෙනුයි භික්ඛුනී යැ, (මත්තෙහි භික්මිය යුත්තක් නැතිවන බැවින්) අශෛක්ෂ වූවා නුයි භික්ඛුනී යැ, සමඟ වූ දෙ සඟුන් විසින් අකොප්‍ය වූ ශාස්තෘශාසනාර්හ වූ ඥප්තිචතුර්ථ කර්මයෙන් උපසපන් කරන ලද නුයි භික්ඛුනී යැ, එහි යම් මේ මෙහෙණක් සමඟ වූ දෙසඟුන් විසින් අකොප්‍ය වූ ශාස්තෘශාසනාර්හ වූ ඥප්ති චතුර්ථකර්මයෙන් උපසපන් කරන ලද නම් මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස්කරන ලද භික්ෂුණී යි.

අවස්සුතා නම්: (කායසංසර්ගරාගයෙන්) මොනොවට රත්වූ (පිරිමියක් හු කෙරෙහි) අපේක්ෂායෙන් යුක්ත වූ පිළිබඳ සිත් ඇත්තී යැ.

අවස්සුත නම්: (කායසංසර්ගරාගයෙන්) මොනොවට රත්වූ (මාගමකකෙරෙහි) අපේක්ෂායෙන් යුක්ත වූ පිළිබඳ සිත් ඇත්තේ යැ.

පුරිසපුග්ගල නම්: මිනිස් පිරිමියෙකි, යකෙක් නො වෙයි, ප්‍රේත යෙක් නො වෙයි, තිරිසන්ගියෙක් නො වෙයි, කායසංසර්ගරාගයට පැමිණෙන්නට දනුවැති ප්‍රතිබලයෙකි.

අධක්ඛකං: අකුඇටයෙන් යටැ.

උබ්භජාණුමණ්ඩලං: දණමඩලෙන් මත්තෙහි.

ආමසන නම්: පිරිමැදීම් පමණ යැ.

පරාමසන නම්: ඔබ මොබ පිරිමැදීම යැ.

ගහණ නම් ගැනීම් පමණ යැ.

ඡුපන නම්: පැහැසීම් පමණ යැ.

පතිපීළනං වා සාදියෙය්‍ය: අවයවයක් ගෙනැ දැඩිවැ පෙළීම ඉවසයි.



Free Distribution www.aathaapi.org

**අයම්පීති** පුරිමායො උපාදය වුච්චති.

**පාරාජිකා හොතීති:** සෙය්‍යථාපි නාම පුරිසො සීසච්ඡින්නො අභබ්බො තෙන සරීරබන්ධනෙන ජීවිතුං, එවමෙව භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආමසනං වා පරාමසනං වා ගහණං වා ඡුපනං වා පතිපීළනං වා සාදියන්තී අස්සමණී හොති අසක්‍යධීතා. තෙන වුච්චති පාරාජිකා හොතීති.

**අසංවාසාති:** සංවාසො නාම එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා එසො සංවාසො නාම. සො තාය සද්ධිං නත්ථි, තෙන වුච්චති අසංවාසාති.

උභතො අවස්සුතෙ අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති පාරාජිකස්ස. කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස. උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති ථුල්ලච්චයස්ස. කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස.

එකතො අවස්සුතෙ අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති ථුල්ලච්චයස්ස. කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස. උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස.



Free Distribution www.aathaapi.org

**අයම්පි**: පළමු පරිජි වූ මෙහෙණන් ගෙනැ කියනු ලැබෙයි.

**පාරාජිකා හොති**: යම්සේ හිස සුන් පුරුෂයෙක් ඒ සිරිරිබැම්මෙන් දිවිවටන්නට අභව්‍ය වේද, එසේ මැ රාගයෙන් තෙත් වූ මෙහෙණක් රාගයෙන් තෙත් වූ පිරිමිනියක්හුගේ අකුඇටෙන් යටැ දණමඩලෙන් මතු ආමර්ශනය හෝ පරාමර්ශනය හෝ ග්‍රහණය හෝ ස්පර්ශමාත්‍රය හෝ ප්‍රතිපීඩනය හෝ ඉවසන්නී නම් තො මෙහෙණක් වූවා නො සැභැදුවක් වූවා වෙයි. එහෙයින් **පාරාජිකා හොති** යැයි කියනු ලැබේ.

**අසංවාසා**: සංවාස නම් එක්වැ විනයකම් කිරීම යැ, එක්වැ පාමොක් උදෙසීම යැ, සමසික ඇතිබව යි, මෙලෙ සංවාස නම් වේ. ඒ සංවාසය ඇය සමඟ නැති, එහෙයින් (ඕ) **අසංවාසා** යැයි කියනු ලැබේ.

(මෙහෙණකගේ හා පිරිමිනියක්හුගේ) දෙදෙනාගේ රාගයෙන් තෙත් වූ බව ඇති කල්හි අකුඇටෙන් යටැ දණමඩලෙන් මතු කයින් කය පිරිමදී නම් පරිජි ඇවැත් වෙයි. කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් තුලැසි ඇවැත් වෙයි. කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් තුලැසි ඇවැත් වෙයි. කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කයපිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, අකුඇටෙන් මතු දණමඩලෙන් යටැ කයින් කය පිරිමදී නම් තුලැසි ඇවැත් වෙයි. කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වේ.

එකක්හුගේ (මෙහෙණකගේ) රාගයෙන් තෙත් වූ බව ඇති කල්හි අකුඇටෙන් යටැ දණමඩලෙන් මතු කයින් කය පිරිමදී නම් තුලැසි ඇවැත් වෙයි, කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වේ. අකුඇටෙන් මතු දණමඩලෙන් යටැ කයින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි; නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

උභතො අවස්සුතෙ යක්ඛස්ස වා පෙතස්ස වා පණ්ඩකස්ස වා තිරච්ඡානගතමනුස්සවිග්ගහස්ස වා අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති ථුල්ලච්චයස්ස, කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස. උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස.

එකතො අවස්සුතෙ අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස, කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස, කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති, ආපත්ති දුක්කටස්ස. උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං කායෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච, අසතියා, අජානන්තියා, අසාදියන්තියා, උම්මත්තිකාය, ඛිත්තචිත්තාය, වෙදනාට්ටාය, ආදිකම්මිකායාති.

**පඨමපාරාජිකං නිට්ඨිතං[1]**

1. සමත්තං - මජසං.



Free Distribution www.aathaapi.org

දෙදෙනාගේ රාගයෙන් තෙත් වූ බව ඇති කල්හි යක්ෂයකුගේ හෝ ප්‍රේතයකුගේ හෝ පණ්ඩකයකුගේ හෝ තිරිසන්ගිය මිනිස් සිරුර දරුවකුගේ හෝ අකුඇටෙන් යටැ දණමඩලෙන් මතු කයින් කය පිරිමදී නම් තුල්‍යැයි ඇවැත් වෙයි. කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි.

අකුඇටෙන් මතු දණමඬලෙන් යටැ කයින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වේ.

එකක්හුගේ (මෙහෙණකගේ) රාගයෙන් තෙත් වූ බව ඇති කල්හි අකුඇටෙන් යටැ දණමඩලෙන් මතු කයින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වේ.

අකු ඇටෙන් මතු දණමඩලෙන් යටැ කයින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. කයින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි. කය පිළිබැඳියෙකින් කය පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් කය පිළිබැඳියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වෙයි, නිසැගියෙන් නිසැගියක් පිරිමදී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නියට නො සිහියෙන් කරන්නියට නො දන්නියට නො ඉවසන්නියට උම්මත්තිකාවට ක්ෂිප්තචිත්තාවට වේදනාර්තාවට ආදිකර්මිකාවට ඇවැත් නැති.

ප්‍රථම පාරාජිකය නිමි.



Free Distribution www.aathaapi.org

## 1. 2

## දුතියපාරාජිකං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **සුන්දරීනන්දා** භික්ඛුනී සාළ්හෙන මිගාරනත්තුනා ගබ්භිනී හොති. යාව ගබ්භො තරුණො අහොසි තාවච්ඡාදෙසි. පරිපක්කෙ ගබ්භෙ විබ්භමිත්වා විජායි. භික්ඛුනියො **ථුල්ලනන්දං** භික්ඛුනිං එතදවොචුං. සුන්දරීනන්දා ඛො අය්‍යෙ අචිරවිබ්භන්තා විජාතා. කච්චි නො සා භික්ඛුනීයෙව සමානා ගබ්භිනීති. එවං අය්‍යෙති. කිස්ස පන ත්වං අය්‍යෙ ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙසි, න ගණස්ස ආරොචෙසීති. යො එතිස්සා අවණ්ණො මය්හෙසො අවණ්ණො, යා එතිස්සා අකිත්ති, මය්හෙසා අකිත්ති, යො එතිස්සා අයසො මය්හෙසො අයසො, යො එතිස්සා අලාභො මය්හෙසො අලාභො, ක්‍යාහං අය්‍යෙ අත්තනො අවණ්ණං අත්තනො අකිත්තිං අත්තනො අයසං අත්තනො අලාභං පරෙසං ආරොචෙස්සාමීති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙස්සති න ගණස්ස ආරොචෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙසි. න ගණස්ස ආරොචෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙස්සති. න ගණස්ස ආරොචෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙය්‍ය න ගණස්ස ආරොචෙය්‍ය, යද ච සා ඨිතා වා අස්ස චුතා වා නාසිතා වා අවස්සටා වා සා පච්ඡා එවං වදෙය්‍ය: පුබ්බෙවාහං අය්‍යෙ අඤ්ඤාසිං එතං භික්ඛුනිං එවරූපා ච එවරූපා ච සා භගිනීති නො ච ඛො අත්තනා පටිචොදෙස්සං න ගණස්ස ආරොචෙස්සන්ති. අයම්පි පාරාජිකා හොති අසංවාසා වජ්ජපටිච්ඡාදිකාති.**



Free Distribution www.aathaapi.org

## 1. 2

## ද්විතීය පාරාජිකය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති, එසමයෙහි වනාහි සුන්‍දරීනන්‍ද භික්ෂුණී තොමෝ සාළ්හ මිගාරනප්තෲහු කරණ කොටගෙන ගැබිනි වූවා වෙයි. යම්තාක් ගැබ තුරුණු වී ද, ඒ තාක් සැඟවූ යැ. ගැබ මුහුකුරා ගිය කල්හි සිවුරු හැරපියා වැදූ යැ. භික්ෂුණීහු ථුල්ලනන්‍ද මෙහෙණට මෙය කීහු. "ආයසීාවෙනි, සුන්‍දරීනන්‍ද තොමෝ සිවුරු හැරැලූ නොබෝ කල් ඇත්තී වැදූ යැ. කිම ඕ තොමෝ මෙහෙණක වූවා මැ ගැබිනි වූවා නො වේ ද? එසේ යැ ආයසීාවෙනි, කුමකට වනාහි ආයසීාවෙනි, තෙපි පරිජි ඇවැතට පැමිණි මෙහෙණක තමා දනැ දනැ නොමැ චෝදනා කරහු ද? ගණයාට නො දන්වූහු"දයි. මැයට යම් අගුණයෙක් වේ නම් ඒ අගුණය මාහට යැ, මැයට යම් නිඳායෙක් වේ නම් ඒ නිඳාව මා හට යැ, මැයට යම් පරිවාරවිපත්තියෙක් වේ නම් ඒ පරිවාර විපත්තිය මාහට යැ, මැයට යම් අලාභයෙක් වේ නම් ඒ අලාභය මාහට යැ, කිම ආයසීාවෙනි, මම තමාගේ අගුණය තමාගේ නිඳාව තමාගේ පරිවාරවිපත්තිය තමාගේ අලාභය මෙරමා හට දන්වන්නෙම් දයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් ආයසීා ථුල්ලනන්‍ද තොමෝ පරිජි ඇවැතට පැමිණි මෙහෙණක තමා දනැ දනැ නොම චෝදනා කළා ද? ගණයාට නො දන් වූ ද"යි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්‍ද තොමෝ පරිජි ඇවැතට පැමිණි මෙහෙණක තමා දනැ දනැ නොමැ චෝදනා කෙරේ ද? ගණයාට නො දන්වා දයි. සැබැව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු විගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්‍ද මෙහෙණ පරිජි ඇවැතට පැමිණි මෙහෙණක තමා දනැ දනැ නොම චොදනා කළා ද? ගණයාට නො දන්වූ ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද වනාහි මහණෙනි මේ සිකපදය මෙහෙණෝ උදෙසත්වා :

**යම් මෙහෙණක් පරිජි ඇවැතට පැමිණි මෙහෙණකට තමා දනැ දනැ නො මැ චෝදනා කෙරේ නම් ගණයාට නො ඇරොජා නම්, යම් කලෙකුදු ඕ තොමෝ සිටියා හෝ කලුරිය කළා හෝ නැසුණා හෝ (තීර්ථායතනයකට) ගියා හෝ වන්නී ද, පසුවැ ඕ තොමෝ "ආයසීාවෙනි, පෙර මැ මම ඒ බුහුන මෙබඳු ද මෙබඳු ද වූය යි තෙල මෙහෙණ දනිමි. වැළිදු තොමෝ නො මැ චෝදනා කෙරෙම් මැ යැ ගණයාට නො ඇරොජම්මැ" යැයි මෙසේ කියා නම් මෝ තොමෝත් පරිජි වූවා සහවාසයට නො නිසි වූවා වෙයි. වජ්ජපටිච්ඡාදිකා යැ.**



Free Distribution www.aathaapi.org

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ජානාති** නාම: සාමං වා ජානාති, අඤ්ඤෙ වා තස්සා ආරොචෙන්ති, සා වා ආරොචෙති.

**පාරාජිකං ධම්මං අජ්ඣාපන්නන්ති**: අට්ඨන්නං පාරාජිකානං අඤ්ඤතරං පාරාජිකං අජ්ඣාපන්නං.

**නෙවත්තනා පටිචොදෙය්‍යාති**: න සයං චොදෙය්‍ය.

**න ගණස්ස ආරොචෙය්‍යාති**: න අඤ්ඤාසං භික්ඛුනීනං ආරොචෙය්‍ය.

**යදා ච සා ඨිතා වා අස්ස චුතා වාති**: ඨිතා නාම සලිඞ්ගෙන ඨිතා වුච්චති, චුතා නාම: කාලකතා[1] වුච්චති, නාසිතා නාම: සයං වා විබ්භන්තා හොති අඤ්ඤෙහි වා නාසිතා, අවස්සටා නාම: තිත්ථායතනං සඞ්කන්තා වුච්චති.

**සා පච්ඡා එවං වදෙය්‍ය**: පුබ්බෙවාහං අය්‍යෙ අඤ්ඤාසිං එතං භික්ඛුනිං එවරූපා ච එවරූපා ච සා භගිනීති.

**නො ච ඛො අත්තනා පටිචොදෙස්සන්ති**: න සයං වා චොදෙස්සං.

**න ගණස්ස ආරොචෙස්සන්ති**: න අඤ්ඤාසං භික්ඛුනීනං ආරොචෙස්සං.

**අයම්පීති**: පුරිමායො උපාදාය වුච්චති.

**පාරාජිකා හොතීති**: සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො බන්ධනා පමුත්තා[2] අභබ්බා හරිතත්තාය එවමෙව භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙස්සාමි න ගණස්ස ආරොචෙස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ අස්සමණී හොති අසක්‍යධීතා තෙන වුච්චති පාරාජිකා හොතීති.

**අසංවාසාති**: සංවාසො නාම: එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා එසො සංවාසො නාම. සො තාය සද්ධිං නත්ථි තෙන වුච්චති අසංවාසාති.

---

1. කාලඞ්කතා-මජසං
2. පමුත්තො සීමු i  සීමු ii



Free Distribution www.aathaapi.org

3. **යා පන:** යම් යම්බඳු... **භික්ඛුනී:** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ඛුනී ය යි.

**ජානාති** නම් තොමෝ හෝ දනී, අන්හු හෝ ඇයට දන්වත්, ඕ තොමෝ හෝ දන්වයි.

**පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං**; අටවැදෑරුම් පරිජි අතුරෙන් එක්තරා පාරාජිකයකට අවතක:

**නෙවත්තනා පටිචොදෙය්‍ය:** තොමෝ චෝදනා නො කරන්නී යැ.

**න ගණස්ස ආරොචෙය්‍ය:** අන් මෙහෙණන් හට නො දන්වන්නී යැ.

**'යද ච සා ඨිතා වා අස්ස චුතාවා'** යනාදි තන්හි **ඨිතා** නම්: සව ලිඞ්ගයෙහි (ශ්‍රමණවේශයෙහි) සිටියා කියනු ලැබෙයි. **චුතා** නම්; කලුරිය කළා කියනු ලැබෙයි. **නාසිතා** නම්: තොමෝ හෝ සිවුරු හැරපුවා වෙයි, අනුන් විසින් හෝ සිවුරු හරවන ලද්දී වෙයි, **අවසටා** නම්, තීර්ථායතනයකට සංක්‍රාන්ත වූවා කියනු ලැබේ.

**සා පච්ඡා එවං වදෙය්‍ය:** ආයභිාවෙනි පෙර මැ මම ඒ බුහුන මෙබඳු ද මෙබඳු ද වූය යි තෙල මෙහෙණ දනිමි.

**නො ච ඛො අත්තනා පටිචොදෙස්සන්ති:** (මම) තොමෝ හෝ චෝදනා නො කරන්නෙමි.

**න ගණස්ස ආරොචෙස්සං:** අන් මෙහෙණන්හට නො දන්වන්නෙමි

**අයම්පි:** පළමු පරිජි වූ මෙහෙණන් ගෙනෑ කියනු ලැබෙයි.

**පාරාජිකා හොති:** යම් සේ තුවටුණෙන් ගිලිහුණු පඬුවන් කොළයක් තිල්වන් බවට නො නිසි වේ ද, එසේ මැ මෙහෙණක් පරිජි ඇවැතකට පැමිණි මෙහෙණක තමා දනැ දනැ නොම චෝදනා කරන්නෙමි, ගණයාට නො දන්වන්නෙමැ යි ධුරය බහා නැබූ මතුයෙහි නො මෙහෙණක් වූවා නො සැහැ දුවක් වූවා වෙයි. එහෙයින් **පාරාජිකා හොති** යි කියනු ලැබේ.

**අසංවාසා:** සංවාස නම් එක් වැ විනයකම් කිරීම යැ, එක් වැ පාමොක් උදෙසීම යැ, සමසික ඇතිබව යී, තෙලෙ සංවාස නම් වේ. ඒ සංවාසය ඇය සමඟ නැති. එහෙයින් **අසංවාසා** යි කියනු ලැබේ.

**අනාපත්ති:** සඞ්ඝස්ස භණ්ඩනං වා කලහො වා විග්ගහො වා විවාදො වා භවිස්සතීති නාරොචෙති, සඞ්ඝභෙදො වා සඞ්ඝරාජි වා භවිස්සතීති නාරොචෙති, අයං කක්ඛළා ඵරුසා ජීවිතන්තරායං වා බ්‍රහ්මචරියන්තරායං වා කරිස්සතීති නාරොචෙති, අඤ්ඤා පතිරූපා භික්ඛුනියො අපස්සන්තී නාරොචෙති, නච්ඡාදෙතුකාමා නාරොචෙති, පඤ්ඤායිස්සති සකෙන කම්මෙනාති නාරොචෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියපාරාජිකං නිට්ඨිතං.**

## 1. 3

## තතියපාරාජිකං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං අනුවත්තති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති. "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා[1] සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං අනුවත්තිස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං අනුවත්තතීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං අනුවත්තිස්සති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරං අප්පටිකාරං අකතසහායං තමනුවත්තෙය්‍ය. සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා: එසො ඛො අය්‍යෙ, භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තො ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන, අනාදරො අප්පටිකාරො අකතසහායො මාය්‍යෙ එතං භික්ඛුං අනුවත්තීති. එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය. සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, අයම්පි පාරාජිකා හොති අසංවාසා. උක්ඛිත්තානුවත්තිකාති.**

---

1. ථුල්ලනන්දා භික්ඛුනී - මජ.



Free Distribution www.aathaapi.org

සඞ්ඝයාගේ භණ්ඩනයෙක් හෝ කලහයෙක් හෝ විග්‍රහයෙක් හෝ විරුද්ධවාදයෙක් හෝ වන්නේ යැයි නො ඇරොජා නම්, සඞ්ඝභෙදය හෝ සඞ්ඝරාජිය හෝ වන්නේ යැයි නො ඇරොජා නම්, මෝ තොමෝ කැකුළු යැ. පරුෂ යැ දිවියට අනතුරු හෝ බඹසරට අනතුරු හෝ කරන්නී යැයි නො ඇරොජා නම්, අන් සුදුසු මෙහෙණක් නො දක්නී නො ඇරොජා නම්, නො වසනු කැමැත්තී නො ඇරොජා නම්, සිය කැමින් පළට වන්නී යැයි නො ඇරොජා නම් උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

ද්විතීය පාරාජිකය නිමි.

## 1. 3

## තෘතීය පාරාජිකය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ථුල්ලනන්‍දා භික්ෂුනී තොමෝ සමඟ සඟහු විසින් උබෙව්නීකම් කළ ගිජුපැටිකුලෙහි උපන් අරිට්ඨ මහණහු අනුව වැටෙයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දොස් පතුරුවත්, කෙසේ නම් ආයර්‍යා ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ සමඟ සඟහු විසින් උබෙව්නීකම් කළ ගිජුපැටිකුලෙහි උපන් අරිට්ඨ මහණහු අනුව වැටුනී දැයි... සැබෑද මහණෙනි! ථුල්ලනන්‍දා මෙහෙණ සමඟ සඟහු විසින් කළ උබෙව්නීකම් ඇති ගිජුපැටිකුලෙහි උපන් අරිට්ඨ මහණහු අනුව වැටේ ද යි. සැබැව භාග්‍යවතුන් වහන්ස. භගවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්‍දා මෙහෙණ සමඟ සඟහු විසින් උබෙව්නීකම් කළ ගිජුපැටිකුලෙහි උපන් අරිට්ඨ මහණහු අනුවැ වැටුණී ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද වනාහි මහණෙනි මේ සිකපදය මෙහෙණෝ උදෙසත්වා :

**යම් මෙහෙණක් ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් සමඟ සඟහු විසින් උබෙව්නීකම් කළ අනාදරබව ඇති පිළියම් රහිත වූ නො කළ සහායබව ඇති ඒ මහණහු අනුව වැටේ නම් මෙහෙණන් විසින් ඒ මෙහෙණ තොමෝ මෙසේ කිය යුතු වන්නී යැ. "ආයර්‍යාවෙනි තෙල මහණ තෙමේ වනාහි ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් සමඟ සඟහු විසින් උබෙව්නීකම් කරන ලද්දෙක, අනාදරබව ඇතියෙකැ, පිළියම් නැතියෙකැ, නො කළ සහායබව ඇතියෙකි. ආයර්‍යාවෙනි තෙල මහණහු අනුවැ නාහමක් වැටෙව"යි. මෙසේත් මෙහෙණන් විසින් කියනු ලබන ඒ මෙහෙණ එසේ මැ දැඩි වැ වැයම් කරන්නී නම් මෙහෙණන් විසින් ඒ මෙහෙණ එදිවූ දුරැලනු පිණිස තුන් යළ තෙක් සමනුභාෂණකම් කළ යුත්තී යැ, එදිවූ දුරැලනු පිණිස තුන් යළ තෙක් සමනුභාෂණකම් කරනු ලබන්නී එය දුරැලන්නී නම් තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලන්නී නම් මෝ තොමෝත් පරිජිවූවා සහවාසයට නො නිසි වූවා වෙයි.. .උක්ඛිත්තානුවත්තිකා යැ.**



Free Distribution www.aathaapi.org

2. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති** අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සමග්ගො** නාම: සඞ්ඝො සමානසංවාසකො සමානසීමාය ඨිතො.

**උක්ඛිත්තො** නාම: ආපත්තියා අදස්සනෙ වා අප්පටිකම්මෙ වා දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ වා උක්ඛිත්තො.

**ධම්මෙන විනයෙනාති**; යෙන ධම්මෙන යෙන විනයෙන.

**සත්ථුසාසනෙනාති**: ජිනසාසනෙන බුද්ධසාසනෙන.

**අනාදරො** නාම: සඞ්ඝං වා ගණං වා පුග්ගලං වා කම්මං වා නාදියති.

**අප්පටිකාරො** නාම: උක්ඛිත්තො අනොසාරිතො.

**අකතසහායො** නාම: සමානසංවාසකා භික්ඛූ වුච්චන්ති සහායා සො තෙහි සද්ධිං නත්ථි තෙන වුච්චති අකතසහායොති.

**තමනුවත්තෙය්‍යාති**: යංදිට්ඨිකො සො හොති යංඛන්තිකො යංරුචිකො සාපි තංදිට්ඨිකා හොති තං ඛන්තිකා තං රුචිකා.

**සා භික්ඛුනීති**: යා සා උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී.

**භික්ඛුනීහීති**: අඤ්ඤාහි භික්ඛුනීහි යා පස්සන්ති යා සුණන්ති තාහි වත්තබ්බා, එසො ඛො අය්‍යෙ භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තො ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරො අප්පටිකාරො අකතසහායො මාය්‍යෙ එතං භික්ඛුං අනුවත්තී''ති. දුතියම්පි වත්තබ්බා -පෙ- තතියම්පි වත්තබ්බා -පෙ- සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා, එසො ඛො අය්‍යෙ භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තො ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරො අප්පටිකාරො අකතසහායො මාය්‍යෙ එතං භික්ඛුං අනුවත්තී'ති දුතියම්පි වත්තබ්බා – තතියම්පි වත්තබ්බා – සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සමනුභාසිතබ්බා.

**2. යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**සමග්ග** නම්: සමාන සංවාසක සඞ්ඝ තෙමෙ සමාන සීමායෙහි සිටීයේ වෙයි.

**උක්ඛිත්ත** නම්: ඇවැත නො දැක්මෙහි හෝ පිළියම් නො කිරීමෙහි හෝ (ලමුදිට්ඨ) නො දුරලීමෙහි හෝ උක්ඛෙපනී කම් කරන ලද්දේ යි.

**ධම්මෙන විනයෙන:** යම් ධර්මයෙකින් යම් විනයෙකින්,

**සත්ථුසාසනෙන:** ජිනසාසනයෙන්, බුද්ධසාසනයෙන්.

**අනාදර** නම්: සඞ්ඝයා හෝ ගණයා හෝ පුද්ගලයා හෝ කර්මය හෝ නො ගනී.

**අප්පතිකාර** නම්: උඛෙප්නීකම් කරන ලදුයේ සඞ්ඝයාට ඇතුළත් නො කරන ලද්දේ යි.

**අකතසහාය** නම්: සමාන සංවාසක භික්ෂූහු සහායයෝ යැයි කියනු ලැබෙති. හේ ඔවුන් සමග නැති. එහෙයින් **අකතසහාය** යැයි කියනු ලැබේ.

**තමනුවත්තෙය්‍යා:** ඒ උඛෙප්නීකම් කළ මහණ තෙමෙ යම්බඳු **දෘෂ්ටි** ඇතියෙක් යම්බඳු ඉවසීම් ඇතියෙක් යම්බඳු රුචි ඇතියෙක් වේ නම් ඒ මෙහෙණ තොමෝත් එබඳු දෘෂ්ටි ඇත්තී එබඳු ඉවසීම් ඇත්තී එබඳු රුචි ඇත්තී වෙයි.

**සා භික්ඛුනී:** යම් මෙහෙණක් උඛෙප්නීකම් කළ මහණහු අනුව වැටේ නම් ඒ මෙහෙණ යි.

**භික්ඛුනීහි:** අන් මෙහෙණන් විසින්; යම් මෙහෙණ කෙනෙක් දකිත් නම් යම් මෙහෙණ කෙනෙක් අසත් නම් ඔවුන් විසින් ''ආර්‍ය්‍යාවෙනි තෙල මහණ තෙමේ වනාහි ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් සමග සඟහු විසින් උඛෙප්නීකම් කරන ලද්දෙකැ, අනදරබව ඇතියෙකැ, පිළියම් නැතියෙකැ. නො කළ සහාය බව ඇතියෙකි. ආර්‍ය්‍යාවෙනි තෙල මහණහු අනුව නහමක් වැටෙව''යි. කිය යුත්තී ය. දෙවනවටද කිය යුත්තී යැ... තෙවනවටද කියයුත්තී යැ... ඉදින් (එය) දුරලන්නී නම් තෙල දුරලීම මැනැවි. ඉදින් නො දුරලන්නී නම් දුකුළා ඇවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළා ඇවැත් වෙයි. ඒ මෙහෙණ සඟ මැදට ඇදපියා කිය යුත්තී යැ. ''ආර්‍ය්‍යාවෙනි තෙල මහණ තෙමේ වනාහි ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් සමග සඟහු විසින් උඛෙප්නීකම් කරන ලද්දෙකැ, අනදර බව ඇතියෙකැ, පිළියම් නැතියෙකැ, නො කළ සහාය බව ඇතියෙකි. ආර්‍ය්‍යාවෙනි තෙල මහණහු අනුව නහමක් වැටෙව''යි. දෙවනවටද කිය යුත්තී යැ—තෙවනවටද කිය යුත්තී යැ—ඉදින් දුරලන්නී නම් තෙල දුරලීම මැනැවි. ඉදින් නො දුරලන්නී නම් දුකුළා ඇවැත් වෙයි. ඒ මෙහෙණ සමනුභාෂණකර්ම කළ යුත්තී යැ.

එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බා. ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්‍ථන්නාමා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරං අප්පටිකාරං අකතසහායං තමනුවත්තති, සා තං වත්ථුං න පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්‍ථන්නාමං භික්ඛුනිං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය එසා ඤත්ති.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්‍ථන්නාමා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනාදරං අප්පටිකාරං අකතසහායං තමනුවත්තති. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති සඞ්ඝො ඉත්‍ථන්නාමං භික්ඛුනිං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සා අය්‍යාය ඛමති ඉත්‍ථන්නාමාය භික්ඛුනියා සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සා තුණ්හස්ස යස්සා නක්ඛමති සා භාසෙය්‍ය දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨා සඞ්ඝෙන ඉත්‍ථන්නාමා භික්ඛුනී තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා කම්මවාචා පරියොසානෙ ආපත්ති පාරාජිකස්ස.

**අයම්පීති:** පුරිමායො උපාදාය වුච්චති.

**පාරාජිකා හොතීති:** සෙය්‍යථාපි නාම පුථුසිලා ද්වෙධා භින්නා අප්පටිසන්ධිකා හොති එවමෙව භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී, අස්සමණී හොති අසක්‍යධීතා තෙන වුච්චති පාරාජිකා හොතීති.

**අසංවාසාති :** සංවාසො නාම: එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා, එසො සංවාසො නාම. සො තාය සද්ධිං නත්ථි, තෙන වුච්චති අසංවාසාති.



Free Distribution www.aathaapi.org

5. මෙසේ ද වනාහි මහණෙනි සමනුභාෂණකර්ම කළ යුත්තී යැ. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

ආයඝාවෙනි සඞ්ඝ තෙමේ මාවදන් අසාවා. මේ මෙනම් ඇති මෙහෙණ ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් සමඟ සඟනු විසින් උබෙච්නීකම් කළ අනදරබව ඇති පිළියම් රහිත වූ නො කළ සහාය බව ඇති මහණක්හු අනුවැ වැටෙයි, ඕ තොමෝ ඒ වස්තුව නො දුරැලයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙනම් ඇති මෙහෙණහට ඒ වස්තුව දුරැලීම පිණිස සමනුභාෂණකර්ම කරන්නේ යැ. මේ ඥප්තිය යි.

ආයඝාවෙනි සඞ්ඝ තෙමේ මා වදන් අසාවා, මේ මෙනම් ඇති මෙහෙණ තොමෝ ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් සමඟ සඟනු විසින් උබෙච්නීකම් කළ අනදරබව ඇති පිළියම් රහිත වූ නො කළ සහායබව ඇති මහණක්හු අනුවැ වැටෙයි. ඕ තොමෝ වස්තුව නො දුරැලයි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මෙහෙණහට ඒ වස්තුව දුරැලීම පිණිස සමනුභාෂණකර්ම කරයි. ඒ වස්තුව දුරැලීම පිණිස මෙනම් ඇති මෙහෙණහට සමනුභාෂණකර්ම කිරීම යම් ආයඝාවකහට රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වේවා. යමක හට නො රුස්නේ නම් ඕ තොමෝ කියාවා. දෙවනවටදු තෙල කරුණ කියමි ... තෙවනවටදු තෙල කරුණ කියමි ... සඞ්ඝයා විසින් මෙනම් ඇති මෙහෙණ ඒ වස්තුව දුරැලීම පිණිස සමනුභාෂණකර්ම කරන ලද්දී යැ. සඞ්ඝයාහට රුස්නේ යැ, එහෙයින් නිහඬ වෙයි. මෙසේ මෙය දරමි යි.

6. ඥප්තියෙන් දුකුළා යැ. දෙ කම්වදනින් තුලැසි යැ. කම්වදන් පිරියතැ පරිජි ඇවැත් වේ.

7. **අයමපි:** පළමු පරිජි වූ මෙහෙණන් ගෙන කියනු ලැබෙයි.

**පාරාජිකා හොති:** යම්සේ දෙකට බිඳුණු මහත් ගලෙක් යළි නො ගැළපිය හැකි වේ ද, එසේ මැ මෙහෙණ තොමෝ තුන්යළ තෙක් සමනුභාෂණකර්ම කිරීමෙන් නො දුරැලත්තී නම් නො මෙහෙණක් වූවා නො සැහැදුවක් වූවා වෙයි. එහෙයින් "**පාරාජිකා හොති**" යි කියනු ලැබේ.

8. **අසංවාසා** සංවාස නම් එක් වැ විනයකර්ම කිරීම යැ, එක් වැ පාමොක් උදෙසීම යැ, සමසික ඇති බව යි, තෙලෙ සංවාස නම් වේ. ඒ සංවාසය තෙමේ ඇය සමඟ නැති, එහෙයින් අසංවාසා යි කියනු ලැබේ.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා නපටිනිස්සජ්ජති ආපත්ති පාරාජිකස්ස. ධම්මකම්මෙ වෙමතිකා නප්පටිනිස්සජ්ජති ආපත්ති පාරාජිකස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති පාරාජිකස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසමනුභාසන්තියා පටිනිස්සජ්ජන්තියා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

තතියපාරාජිකං නිට්ඨිතං.

## 1. 4

## චතුත්ථපාරාජිකං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථගහණම්පි සාදියන්ති සඞ්ඝාටිකණ්ණග්ගහණම්පි සාදියන්ති. සන්තිට්ඨන්තිපි. සල්ලපන්තිපි සඞ්කෙතම්පි ගච්ඡන්ති. පුරිසස්සපි අබ්භාගමනං සාදියන්ති. ඡන්නම්පි අනුපවිසන්ති[1] කායම්පි තදත්ථාය උපසංහරන්ති, එතස්ස අසද්ධම්මස්ස පතිසෙවනත්ථාය.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථගහණම්පි සාදියිස්සන්ති. සඞ්ඝාටිකණ්ණග්ගහණම්පි සාදියිස්සන්ති. සන්තිට්ඨිස්සන්තිපි. සල්ලපිස්සන්තිපි. සඞ්කෙතම්පි ගච්ඡිස්සන්ති. පුරිසස්සපි අබ්භාගමනං සාදියිස්සන්ති. ඡන්නම්පි අනුපවිසිස්සන්ති. කායම්පි තදත්ථාය උපසංහරිස්සන්ති, එතස්ස අසද්ධම්මස්ස පතිසෙවනත්ථායාති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථගහණම්පි සාදියන්ති. සඞ්ඝාටිකණ්ණග්ගහණම්පි සාදියන්ති. සන්තිට්ඨන්තිපි. සල්ලපන්තිපි සඞ්කෙතම්පි ගච්ඡන්ති. පුරිසස්සපි අබ්භාගමනං සාදියන්ති. ඡන්නම්පි අනුපවිසන්ති. කායම්පි තදත්ථාය උපසංහරන්ති, එතස්ස අසද්ධම්මස්ස පතිසෙවනත්ථායාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ-

1. අනුපවිසන්ති - සීමු.



Free Distribution www.aathaapi.org

9. දුහැම්කම්හි දැහැමිකම් සන් ඇතියා නො දුරලා නම් පරිජි ඇවැත් වෙයි. දැහැම්කම්හි විමති ඇතියා නො දුරලා නම් පරිජි ඇවැත් වෙයි. දැහැම්කම්හි නො දැහැම්කම්සත් ඇතියා නො දුරලා නම් පරිජි ඇවැත් වෙයි. නො දැහැම්කම්හි දැහැම්කම්සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැම්කම්හි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැම්කම්හි නො දැහැම්කම්සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි.

10. සමනුභාෂණකර්ම නො කරන්නියට දුරලන්නියට උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

තෘතීය පාරාජිකය නිමි.

# 1. 4

# චතුර්ථ පාරාජිකය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එකල්හි වනාහි සවග මෙහෙණෝ රාගයෙන් තෙත්වූවාහු රාගයෙන් තෙත් වූ පිරිමි පුඟුලක්හුගේ අත් ගැන්ම ද ඉවසති. සඟළකොන් ගැන්ම ද ඉවසති, වැළතට පැමිණ ද සිටිති. සල්ලාප ද කෙරෙති, සලකුණු කළ තැනට ද යෙති, තමන් වෙතට පිරිමිනියක්හුගේ පැමිණීම ද ඉවසති, පිළිසත් තැනට ද පිවිසෙති, තෙල මෙවුන්දම් සෙවුනා පිණිස ඔහු සඳහා (තමන්ගේ) ශරීරය ද එළවත්.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, ඇදස් පතුරුවත්: "කෙසේ නම් සවග මෙහෙණෝ රාගයෙන් තෙත්වූවාහු රාගයෙන් තෙත් වූ පිරිමි පුඟුලක්හුගේ අත් ගැන්මත් ඉවසූහු ද? සඟළ කොන් ගැන්මත් ඉවසූහු ද? වැළතට පැමිණ සිටීමත් කොළෝ ද? සල්ලාපත් කොළෝ ද? සලකුණු කළ තැනටත් ගියෝ ද? තමන් වෙතට පිරිමිනියක්හුගේ පැමිණීමත් ඉවසූ ද? පිළිසත් තැනටත් පිවිසියෝ ද? තෙල මෙවුන්දම් සෙවුනා පිණිස ඔහු සඳහා ශරීරයත් එළවූහු දැයි. ... සැබෑ ද මහණෙනි සවග මෙහෙණෝ රාගයෙන් තෙත් වූවාහු රාගයෙන් තෙත් වූ පිරිමි පුඟුලක්හුගේ අත් ගැන්මත් ඉවසත් ද? සඟළකොන් ගැන්මත් ඉවසත් ද? වැළතට පැමිණ සිටීමත් කෙරෙත් ද? සල්ලාපත් කෙරෙත් ද? සලකුණු කළ තැනටත් යෙත් ද? තමන් වෙතට පිරිමිනියක්හුගේ පැමිණීමත් ඉවසත් ද? පිළිසත් තැනටත් පිවිසෙත් ද? තෙල මෙවුන්දම් සෙවුනා පිණිස ඔහු සඳහා ශරීරයත් එළවත් දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ...

කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථග්ගහණම්පි සාදියිස්සන්ති සඞ්ඝාටිකණ්ණග්ගහණම්පි සාදියිස්සන්ති සන්තිට්ඨිස්සන්තිපි සල්ලපිස්සන්තිපි සඞ්කෙතම්පි ගච්ඡිස්සන්ති. පුරිසස්සපි අබ්භාගමනං සාදියිස්සන්ති. ඡන්නම්පි අනුපවිසිස්සන්ති, කායම්පි තදත්ථාය උපසංහරිස්සන්ති එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

යා පන භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථග්ගහණං වා සාදියෙය්‍ය සංඝාටිකණ්ණග්ගහණං වා සාදියෙය්‍ය සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා සඞ්කෙතං වා ගච්ඡෙය්‍ය පුරිසස්ස වා අබ්භාගමනං සාදියෙය්‍ය ඡන්නං වා අනුපවිසෙය්‍ය කායං වා තදත්ථාය උපසංහරෙය්‍ය එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය අයම්පි පාරාජිකා හොති අසංවාසා අට්ඨවත්ථුකාති.

3. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

අවස්සුතා නාම, සාරත්තා අපෙක්ඛවතී පටිබද්ධචිත්තා.

අවස්සුතො නාම: සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො.

පුරිසපුග්ගලො නාම: මනුස්සපුරිසො. න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො, විඤ්ඤූ පටිබලො කායසංසග්ගං සමාපජ්ජිතුං.

හත්ථග්ගහණං වා සාදියෙය්‍යාති: හත්ථො නාම; කප්පරං උපාදාය යාව අග්ගනඛා, එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලගහණං[1] සාදියති ආපත්ති ථුල්ලච්චයස්ස.

සඞ්ඝාටිකණ්ණග්ගහණං වා සාදියෙය්‍යාති: එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය නිවත්ථං වා පාරුතං වා ගහණං සාදියති ආපත්ති ථුල්ලච්චයස්ස.

1. අධොජාණුමණ්ඩලං ගහණං සී[ මජ්ඣං, උබ්භක්ඛකං අධොජාණු මණ්ඩලග්ගහණං අට්ඨකථා.



Free Distribution www.aathaapi.org

කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ රාගයෙන් තෙත් වූවාහු රාගයෙන් තෙත් වූ පිරිමි පුහුලක්හුගේ අත් ගැන්මත් ඉවසුහු ද? සඟලකොන් ගැන්මත් ඉවසුහු ද? වැළතට පැමිණ සිටීමත් කොළෝ ද? සල්ලාපත් කොළෝ ද? සලකුණු කළ තැනටත් ගියෝ ද? තමන් වෙතට පිරිමිනියක්හුගේ පැමිණීමත් ඉවසුහු ද? පිළිසන් තැනටත් පිවිසියෝ ද? තෙල මෙවුන්දම් සෙවුනා පිණිස ඔහු සඳහා ශරීරයත් එළවූහු ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

යම් මෙහෙණක් රාගයෙන් තෙත්වූවා රාගයෙන් තෙත් වූ පිරිමි පුහුලක්හුගේ අත් ගැන්ම හෝ ඉවසන්නී නම් සඟලකොන් ගැන්ම හෝ ඉවසන්නී නම් වැළැතට පැමිණ සිටින්නී නම් හෝ සල්ලාප හෝ කරන්නී නම් සලකුණු කළ තැනට හෝ යන්නී නම් තමා වෙතට පිරිමිනියක්හුගේ පැමිණීම හෝ ඉවසන්නී නම් පිළිසන් තැනට හෝ පිවිසෙන්නී නම් තෙල මෙවුන්දම් සෙවුනා පිණිස ඔහු සඳහා ශරීරය හෝ එළවන්නී නම් මෝ තොමෝ පරිජි වූවා සහවාසයට නො නිසි වූවා වෙයි—අට්ඨවත්‍ථුකා යැ.

3. යා පන: යම් යම්බඳු... භික්ඛුනී... මෝ තොමෝ මේ අර්යෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

අවස්සුතා නම්: (කායසංසර්ගරාගයෙන්) මොනොවට රත් වූ (පිරිමිනියක්හු කෙරෙහි) අපෙක්ෂායෙන් යුක්ත වූ පිළිබඳ සිත් ඇත්තී යැ,

අවස්සුත නම්; (කායසංසර්ගරාගයෙන්) මොනොවට රත් වූ (මාගමක කෙරෙහි) අපෙක්ෂායෙන් යුක්ත වූ පිළිබඳ සිත් ඇත්තේ යැ.

පුරිසපුග්ගල නම්: මිනිස් පිරිමිනියෙකි. යක්ෂයෙක් නො වෙයි. ප්‍රේතයෙක් නො වෙයි. තිරිසන්ගියෙක් නො වේ. කායසංසර්ගයට සමවදින්නට දැනුමැති ප්‍රතිබලයෙකි.

හත්‍ථගහණං වා සාදියෙය්‍ය: හත්‍ථ නම් වැළමිට පටන් නිය අග තෙක් යැ. තෙල මෙවුන්දම් සෙවුනා පිණිස අකුඇටෙන් මතු දණමඩලෙන් යටැ ගැන්ම ඉවසා නම් තුලැසි ඇවැත් වේ.

සඞ්ඝාටිකණ්ණගහණං වා සාදියෙය්‍ය: තෙල මෙවුන්දම් සෙවුනා පිණිස හැඳිවත හෝ පොරෝනාව හෝ ගැන්ම ඉවසා නම් තුලැසි ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

**සන්තිට්ඨෙය්‍ය වාති:** එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය පුරිසස්ස හත්ථපාසෙ තිට්ඨති ආපත්ති ථුල්ලච්චයස්ස.

**සල්ලපෙය්‍ය වාති:** එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය පුරිසස්ස හත්ථපාසෙ ඨිතා සල්ලපති ආපත්ති ථුල්ලච්චයස්ස.

**සඞ්කෙතං වා ගච්ඡෙය්‍යාති:** එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය පුරිසෙන ඉත්ථන්නාමං ඔකාසං ආගච්ඡාති වුත්තා ගච්ඡති පදෙ පදෙ ආපත්ති දුක්කටස්ස. පුරිසස්ස හත්ථපාසං ඔක්කන්තමත්තෙ ආපත්ති ථුල්ලච්චයස්ස.

**පුරිසස්ස වා අබ්භාගමනං සාදියෙය්‍යාති:** එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය පුරිසස්ස අබ්භාගමනං[1] සාදියති ආපත්ති දුක්කටස්ස. හත්ථපාසං ඔක්කන්තමත්තෙ ආපත්ති ථුල්ලච්චයස්ස.

**ඡන්නං වා අනුපවිසෙය්‍යාති:** එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය යෙන කෙනචි පටිච්ඡන්නං ඔකාසං පවිට්ඨමත්තෙ ආපත්ති ථුල්ලච්චයස්ස.

**කායං වා තදත්ථාය උපසංහරෙය්‍යාති:** එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය පුරිසස්ස හත්ථපාසෙ ඨිතා කායං උපසංහරති ආපත්ති ථුල්ලච්චයස්ස.

**අයම්පීති:** පුරිමායො උපාදය වුච්චති.

**පාරාජිකා හොතීති:** සෙය්‍යථාපි නාම තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුන විරුළ්හියා එවමෙව භික්ඛුනී අට්ඨමං වත්ථුං පරිපූරෙන්තී අස්සමණී හොති අසක්‍යාධීතා, තෙන වුච්චති පාරාජිකා හොතීති.

**අසංවාසාති:** සංවාසො නාම: එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා එසො සංවාසො නාම සො තාය සද්ධිං නත්ථි, තෙන වුච්චති අසංවාසාති.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තියා අසාදියන්තියා උම්මත්තිකාය ඛිත්තචිත්තාය වෙදනාට්ටාය ආදිකම්මිකායාති.

**චතුත්ථපාරාජිකං නිට්ඨිතං.**

4. උද්දිට්ඨා ඛො අය්‍යායො අට්ඨපාරාජිකා ධම්මා. යෙසං භික්ඛුනී අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා න ලභති භික්ඛුනීහි සද්ධිං සංවාසං යථා පුරෙ තථා පච්ඡා පාරාජිකා හොති අසංවාසා. තත්ථය්‍යායො පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථය්‍යායො[2] තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

**පාරාජිකකණ්ඩො නිට්ඨිතො.**

1 ආගමනං සී. | සීමු.

2. පරිසුද්ධෙත්ථාය්‍යායො – මජසං



Free Distribution www.aathaapi.org

**සහනිසජ්ජ වා:** තෙල මෙවුන්දම් සෙවුනා පිණිස පිරිමිනියක්හුගේ වැළකෙහි සිටී නම් තුලැසි ඇවැත් වේ.

**සල්ලපෙය්‍ය වා:** තෙල මෙවුන්දම් සෙවුනා පිණිස පිරිමිනියක්හුගේ වැළතෙහි සිටියා කතාබහ කෙරේ නම් තුලැසි ඇවැත් වේ.

**සංකෙතං වා ගච්ඡෙය්‍ය:** තෙල මෙවුන්දම් සෙවුනා පිණිස පිරිමිනියක්හු විසින් 'මෙ නම් ඇති පෙදෙසට එව'යි කියන ලද්දී යා නම් පියෙහි පියෙහි දුකුළා ඇවැත් වෙයි. පිරිමිනියාගේ අත්පසට පැමිණි කෙණෙහි තුලැසි ඇවැත් වේ.

**පුරිසස්ස වා අබ්භාගමනං සාදියෙය්‍ය:** තෙල මෙවුන්දම් සෙවුනා පිණිස තමා වෙතට පිරිමිනියක්හුගේ පැමිණීම ඉවසා නම් දුකුළා ඇවැත් වෙයි. අත්පසට පැමිණි කෙණෙහි තුලැසි ඇවැත් වේ.

**ඡන්නං වා අනුපවිසෙය්‍ය:** තෙල මෙවුන්දම් සෙවුනා පිණිස යම් කිසිවකිනුදු පිළිසන් පියෙසකට පිවිසි කෙණෙහි තුලැසි ඇවැත් වේ.

**කායං වා තදත්ථාය උපසංහරෙය්‍ය:** තෙල මෙවුන්දම් සෙවුනා පිණිස පිරිමිනියක්හුගේ වැළැකෙහි සිටියා ශරීරය එළවා නම් තුලැසි ඇවැත් වේ.

**අයමපි:** පළමු පරිජි වූ මෙහෙණන් ගෙනැ කියනු ලැබෙයි.

**පාරාජිකා හොති:** යම් සේ මුදුන්සුන් තල්රුකෙක් යළි වැඩුමට නො තිසි වේ ද, එසේ මැ මෙහෙණ අටවැනි වස්තුව පුරවන්නී නො මෙහෙණක් වූවා නො සැහැ දුවක් වූවා වෙයි. එහෙයින් **පාරාජිකා හොති** යැයි කියනු ලැබේ.

**අසංවාසා:** සංවාස නම් එක් වැ විනයකර්ම කිරීම යැ. එක් වැ පාමොක් උදෙසීම යැ, සමසික ඇති බව යි, තෙලෙ සංවාස නම් වේ. ඒ සංවාස ඇය සමඟ නැති, එහෙයින් **අසංවාසා** යැයි කියනු ලැබේ.

නො සිතා කරන්නියට නො සිහියෙන් කරන්නියට නො දන්නියට නො ඉවසන්නියට උම්මත්තිකාවට ක්ෂිප්තචිත්තාවට වේදනාර්තාවට ආදිකම්මිකාවට ඇවැත් නැති.

**චතුර්ථ පාරාජිකය නිමි.**

4. ආයුෂ්මවෙනි අට පරිජි ඇවැත්හු උදෙසන ලදහු මැ යි. මෙහෙණක් තොමෝ යම් පරිජි කෙනකුන් අතුරෙන් එක්තරා එක්තරා ඇවැතකට පැමිණ මෙහෙණන් සමඟ සංවාසය නො ලබා ද, පෙර යම් සේ නම් පසු වැ එසේ සංවාසය නැත්තී පරිජි වූවා වෙයි. එහි ලා ආයුෂ්මවන් පිළිවිසිමි. කිම පිරිසුදුවහු ද? දෙවන්වටදු පිළිවිසිමි, කිම පිරිසුදුවහු ද? තෙවනවටදු පිළිවිසිමි, කිම පිරිසුදුවහු ද? මෙහි ලා ආයුෂ්මවෝ පිරිසුදු හ. එහෙයින් නිහඬ වෙති. මෙසේ මෙය දරමි යි.

**පාරාජික කාණ්ඩය නිමියේ යි.**



Free Distribution www.aathaapi.org

## 2. 1

## පඨමසඞ්ඝාදිසෙසො

ඉමෙ ඛො පනය්‍යායො සත්තරස සඞ්ඝාදිසෙසා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො භික්ඛුනීසඞ්ඝස්ස උද්දෙසිතං[1] දත්වා කාලකතො හොති. තස්ස ද්වෙ පුත්තා හොන්ති, එකො අස්සද්ධො අප්පසන්නො, එකො සද්ධො පසන්නො, තෙ පෙත්තිකං සාපතෙය්‍යං විභජිංසු. අථ ඛො සො අස්සද්ධො අප්පසන්නො සද්ධං පසන්නං එතදවොච, අම්හාකං උද්දෙසිතො, තං භාජෙමාති. එවං වුත්තෙ සො සද්ධො පසන්නො තං අස්සද්ධං අප්පසන්නං එතදවොච. "මාය්‍යො එවං අවච අම්හාකං පිතුනා භික්ඛුනීසඞ්ඝස්ස දින්නො"ති. දුතියම්පි ඛො සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එතදවොච: අම්හාකං උද්දෙසිතො තං භාජෙමා"ති දුතියම්පි සො සද්ධො පසන්නො තං අස්සද්ධං අප්පසන්නං එතදවොච: "මාය්‍යො එවං අවච "අම්හාකං පිතුනා භික්ඛුනී-සඞ්ඝස්ස දින්නො"ති, තතියම්පි ඛො සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එතදවොච; "අම්හාකං උද්දෙසිතො, තං භාජෙමාති. අථ ඛො සො සද්ධො පසන්නො සචෙ මය්හං භවිස්සති අහම්පි භික්ඛුනීසඞ්ඝස්ස දස්සාමීති තං අස්සද්ධං අප්පසන්නං එතදවොච භාජෙමාති.

2. අථ ඛො සො උද්දෙසිතො තෙහි භාජියමානො තස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස පාපුණි.[2] අථ ඛො සො අස්සද්ධො අප්පසන්නො භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොච: "නික්ඛමථය්‍යො අම්හාකං උද්දෙසිතො"ති. එවං වුත්තෙ ථුල්ලනන්දා භික්ඛුනී තං පුරිසං එතදවොච: "මාය්‍යො එවං අවච, තුම්හාකං පිතුනා භික්ඛුනීසඞ්ඝස්ස දින්නො"ති, දින්නො න දින්නොති වොහාරිකෙ මහාමත්තෙ පුච්ඡිංසු. මහාමත්තා එවමාහංසු: කො අය්‍යෙ ජානාති භික්ඛුනීසඞ්ඝස්ස දින්නොති එවං වුත්තෙ ථුල්ලනන්දා භික්ඛුනී තෙ මහාමත්තෙ එතදවොච. අපිනාය්‍යා[3] තුම්හෙහි දිට්ඨං වා සුතං වා සක්ඛිං ඨපයිත්වා දානං දීයමානන්ති. අථ ඛො තෙ මහාමත්තා සච්චං ඛො අය්‍යා ආහාති තං උද්දෙසිතං භික්ඛුනී සඞ්ඝස්ස අකංසු.

---

1. උදොසිතං මජසං
2. පාපුණාති–සීමු, මජසං,
3. අපිනාමයෙයා, මජසං, අපිනාමයෙය්‍යා, සීමු අපිනාමියාතා, සසං,



Free Distribution www.aathaapi.org

# 2. 1

## ප්‍රථම සඞ්ඝාදිශෙෂය

ආයුෂ්මාවෙනි, මේ සතලොස් සඞ්ඝාදිසෙසධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එකල්හි එක්තරා උපාසක කෙනෙක් මෙහෙණසඟනට බඩුහලක් දී කලුරිය කෙළේ වෙයි. ඔහුට දෙපුත් කෙනෙක් වෙති. එකෙක් (බුදුසසුන්හි) සැදැහැ නැතියේ නො පහන් යැ. එකෙක් සැදැහැ ඇතියේ පහන් යැ. ඔහු පිය සතුධනය බෙදූහු. එකල්හි ඒ සැදැහැ නැති නො පහන්පුත් ඒ සැදැහැ ඇති පහන්පුත්හට මෙය කීයැ: ''අපගේ බඩුහලෙක් වෙයි. එය බෙදමු''යැයි. මෙසේ කී කල්හි ඒ සැදැහැ ඇති පහන්වූයේ ඒ සැදැහැ නැති නො පහන්වූවහුට මෙය කීයැ:'' ආයුෂ් තෙමේ මෙසේ නහමක් කියාවා: අපගේ පියහු විසින් මෙහෙණ සඟනට දෙන ලද්දේ''යැයි. දෙවනවටදු ඒ සැදැහැ නැති නො පහන්වූයේ ඒ සැදැහැ ඇති පහන්වූවහුට මෙය කීයැ: ''අපගේ බඩුහලෙක් වෙයි. එය බෙදමු'' යැයි. දෙවනවටදු ඒ සැදැහැ ඇති පහන්වූයේ ඒ සැදැහැ නැති නො පහන්වූවහුට මෙය කීයැ: ''ආයුෂ්තෙමේ මෙසේ නහමක් කියාවා: අපගේ පියහු විසින් මෙහෙණ සඟනට දෙන ලද්දේ'' යැයි. තෙවනවටදු ඒ සැදැහැ නැති නොපහන්වූයේ ඒ සැදැහැ ඇති පහන්වූවහුට මෙය කීයැ. ''අපගේ බඩුහලෙක් වෙයි. එය බෙදමු'' යැයි. එකල්හි ඒ සැදැහැ ඇති පහන්වූයේ ''ඉදින් මාහට වන්නේ නම් මම්ද මෙහෙණ සඟනට දෙන්නෙමැ''යි ඒ සැදැහැ නැති නොපහන්වූවහුට 'බෙදම්හ'යි කීයැ.

2. ඉක්බිති ඔවුන් විසින් බෙදනු ලබන ඒ බඩුහල ඒ සැදැහැ නැති නොපහන්වූවහුට පැමිණියේයැ, එකල්හි ඒ සැදැහැ නැති නොපහන්වූයේ මෙහෙණින් වෙත එළැඹැ තෙල කීයැ: ''ආයුෂ්මාවෙනි නික්මෙවු, බඩුහල අපගේ යැ''යි. මෙසේ කී කල්හි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ඒ පුරුෂයහට තෙල කිවූ යැ: ආයුෂ් තෙමේ මෙසේ නහමක් කියාවා, තොපගේ පියහු විසින් මෙහෙණ සඟනට දෙන ලද්දේ ''යැයි. දෙන ලද ද නො දෙන ලද දැයි අධිකරණ මහාමාත්‍රයන් පිළිවිසියහ. මහාමාත්‍රයෝ මෙසේ කීහු: ''ආයුෂ්මාවෙනි මෙහෙණ සඟනට දෙන ලදැයි කවරෙක් දනී''දැයි. මෙසේ කී කල්හි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ඒ මහාමාත්‍රයන්හට මෙය කිවූ යැ: ''ආයුෂ්මයෙනි තොප විසින් සාක්ෂ්‍ය තබාගෙන දෙනු ලබන දානයක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේ''දැයි. එකල්හි ඒ මහාමාත්‍රයෝ 'ආයුෂ්මාව සැබෑවක් කියා'යැයි ඒ බඩුහල මෙහෙණ සඟන සතු කළහ.



Free Distribution www.aathaapi.org

3. අථ ඛො සො පුරිසො පරාජිතො උජ්ඣායති ඛීයති විපාචෙති: "අස්සමණියො ඉමා මුණ්ඩා බන්ධකිනියො. කථං හි නාම අම්හාකං උද්දාසිතං අච්ඡින්දාපෙන්තී"ති. ථුල්ලනන්දා භික්ඛුනී මහාමත්තානං එතමත්ථං ආරොචෙසි, මහාමත්තා තං පුරිසං දණ්ඩාපෙසුං. අථ ඛො සො පුරිසො දණ්ඩිතො භික්ඛුනූපස්සයස්ස අවිදූරෙ ආජීවකසෙය්‍යං කාරාපෙත්වා ආජීවකෙ උය්‍යොජෙසි. එත්ථ[1] භික්ඛුනියො අච්චාවදථාති. ථුල්ලනන්දා භික්ඛුනී මහාමත්තානං එතමත්ථං ආරොචෙසි. මහාමත්තා තං පුරිසං බන්ධාපෙසුං, මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "පඨමං භික්ඛුනියො උද්දසිතං අච්ඡින්දාපෙසුං, දුතියං[2] දණ්ඩාපෙසුං තතියං[3] බන්ධාපෙසුං, ඉදානි ඝාතාපෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

4. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා උස්සයවාදිකා විහරිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී උස්සයවාදිකා විහරතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී උස්සයවාදිකා විහරිස්සති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

යා පන භික්ඛුනී උස්සයවාදිකා විහරෙය්‍ය ගහපතිනා වා ගහපතිපුත්තෙන වා දාසෙන වා කම්මකරෙන[4] වා අන්තමසො සමණපරිබ්බාජකෙනාපි, අයං භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.

5. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

---

1. එථ, සිමු
2. දුතියම්පි, සී1 සිමු1
3. තතියම්පි, සී1 සිමු1
4. කම්මකාරෙන, මජ්ඣං



Free Distribution www.aathaapi.org

3. ඉක්බිති ඒ පුරුෂ තෙමේ පැරදුණේ ලමු කොට සිතයි. නුගුණ පවසයි, දෙස් පතුරුවයි: ''කෙසේ නම් මේ මුඩු වඳ නො මෙහෙණෝ අපගේ බඩුහල අසිදගත්හුද''යි. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ මහාමාත්‍රයනට තෙල කරුණ දන්වූ යැ. මහාමාත්‍රයෝ ඒ පුරුෂයහට දඩ ගැස්සූහ. එකල්හි ඒ පුරුෂ තෙමේ දඩ ගසන ලදුයේ මෙහෙණවරට නුදුරු තන්හි ආජීවක සෙනස්නක් කරවා 'තෙල මෙහෙණන්හට ආක්‍රොශ කරවූ'යැයි ආජීවිකයන් නහා යැවී යැ. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ තෙල කරුණ මහාමාත්‍රයන්හට දන්වූ යැ. මහාමාත්‍රයෝ ඒ පුරුෂයා දහගෙහි ලැවූහ. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''මෙහෙණහු පළමු කොට බඩුහල අසිදගත්හ, දෙවනුවැ දඩගැස්සූහ, තෙවනුවැ දහගෙහි ලැවූහ. දැන් මරවන්නාහ''යි. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන එ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු.

4. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති. දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයර්‍ය ථුල්ලනන්දා තොමෝ අධිකරණ කරන්නී වූසු''දැයි... සැබෑ ද මහණෙනි ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ අධිකරණ කරන්නී වෙසේ දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ අධිකරණ කරන්නී වූසූ ද, මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නොවෙයි... මෙසේ මහණෙනි මෙහෙණහු මේ සිකපදය උදෙසත්වා:

**යම් මෙහෙණක් ගැහැවියකු හෝ ගැහැවිපුතකු හෝ දසකු හෝ කම්කරුවකු හෝ යටත්පිරිසෙයින් මහණ පිරිවැජියකුදු සමඟ අධිකරණ කරන්නී වෙසේ නම් මේ මෙහෙණ පළමු (විකුම්කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතුවූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.**

5. **යා පන: යම් යම්බඳු... භික්ඛුනී... මෝතොමෝ මේ** අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණියයි.



Free Distribution www.aathaapi.org

**උස්සයවාදිකා** නාම: අට්ටකාරිකා වුච්චති,

**ගහපති** නාම; යො කොචි අගාරං අජ්ඣාවසති.

**ගහපතිපුත්තො** නාම: යො කොචි[1] පුත්තභාතරො.

**දාසො** නාම: අන්තොජාතො ... ජාතො ධනක්කීතො කරමරානීතො.

**කම්මකරො** නාම: භතකො ආහතකො.

**සමණපරිබ්බාජකො** නාම: භික්ඛුඤ්ච භික්ඛුනිඤ්ච සික්ඛමානඤ්ච සාමණෙරඤ්ච සාමණෙරිඤ්ච ඨපෙත්වා යො කොචි පරිබ්බාජකසමාපන්නො.

අට්ටං කරිස්සාමීති දුතියං වා පරියෙසති ගච්ඡති වා ආපත්ති දුක්කටස්ස. එකස්ස ආරොචෙති ආපත්ති දුක්කටස්ස. දුතියස්ස ආරොචෙති ආපත්ති ථුල්ලච්චයස්ස. අට්ටපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**පඨමාපත්තිකන්ති** : සහවත්ථුජ්ඣාචාරා[2] ආපජ්ජති අසමනුභාසනාය.

**නිස්සාරණීයන්ති** : සඞ්ඝම්හා නිස්සාරීයති.

**සඞ්ඝාදිසෙසොති** : සඞ්ඝොව තස්සා ආපත්තියා මානත්තං දෙති මූලාය පටිකස්සති අබ්භෙති, න සම්බහුලා, න එකා භික්ඛුනී, තෙන වුච්චති සඞ්ඝාදිසෙසොති[3] තස්සෙව ආපත්තිනිකායස්ස නාමකම්මං අධිවචනං තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

**අනාපත්ති:** මනුස්සෙහි ආකඩ්ඪියමානා ගච්ඡති, රක්ඛං[4] යාචති අනොදිස්ස ආචික්ඛති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසඞ්ඝාදිසෙසො***

## 2. 2

## දුතිය සඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ, තෙන ඛො පන සමයෙන **වෙසාලියං** අඤ්ඤතරස්ස ලිච්ඡවිස්ස පජාපති අතිචාරිනී[6] හොති. අථ ඛො සො ලිච්ඡවි තං ඉත්ථිං එතදවොච: ''සාධු විරමාහි අනත්ථං ඛො තෙ කරිස්සාමී''ති. එවම්පි වුච්චමානා නාදියි. තෙන ඛො පන සමයෙන වෙසාලියා[7] ලිච්ඡවිගණො සන්නිපතිතො හොති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සො ලිච්ඡවි තෙ ලිච්ඡවී[8] එතදවොච: ''එකං මෙ අය්‍යො ඉත්ථිං අනුජානාථා''ති- කා නාම සාති. මය්හං පජාපති අතිචරති, තං ඝාතෙස්සාමීති. ජානාහීති.[9]

---

1. යෙ කෙචි – මජසං
2. සහවත්ථුජ්ඣාචාරා – මජසං
3. සඞ්ඝාදිසෙසන්ති – මජසං
4. ආරක්ඛං – මජසං සයා
5. පඨමසඞ්ඝාදිසෙස සික්ඛාපදං – මජසං
6. අතිචරති – සී.
7. වෙසාලිය – මජසං
8. ලිච්ඡවිනො, සීමු. ලිච්ඡවියො, මජසං
9. ජානාහිති, – මජසං

* සඞ්ඝාදිසෙසං පොත්ථකෙසු.



Free Distribution www.aathaapi.org

**උස්සයවාදිකා** නම්: අට්ටකාරිකා කියනු ලැබෙයි.

**ගහපති** නම්: යම් කිසිවෙක් ගිහිගෙයි වෙසේ ද (හේ යැ.)

**ගහපතිපුත්ත** නම්: යම්කිසි දරුවන් හා බෑයන් ඇත්තෙකි.

**දස** නම්: අන්තොජාත යැ ධනක්කීත යැ කරමරානීත යි.

**කම්මකර** නම්: භතක යැ ආහතක යි.

**සමණපරිබ්බාජක** නම්: මහණ ද මෙහෙණ ද සික්මනුව ද හෙරණ ද හෙරණිය ද තබා යම් කිසි පිරිවැජිබවට පැමිණියෙකි.

අධිකරණයක් කරන්නෙ මැ යි දෙවැන්නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. එකක්හට ඇරොජා නම් දුකුළා ඇවැත් වෙයි. දෙවැන්නකුට ඇරොජා නම් ථුලැසි ඇවැත් වෙයි. අධිකරණය අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

**පඨමාපත්තිකං**: වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ පැමිණෙයි, සමනුභාෂණකර්මයෙන් නො වේ.

**නිස්සාරණියං**: සඟහු කෙරෙන් නෙරනු ලබයි.

**සඞ්ඝාදිසෙසො**: සඞ්ඝ තෙමේ මැ ඒ ඇවැතට මානත දෙයි, මූලාය පටිකස්සන කම් කෙරෙයි, අබ්භාන කම් කෙරෙයි, කැඳවයි, සම්බහුලයෝ නො වෙති. එක් මෙහෙණක් ද නො වෙයි. එහෙයින් **සඞ්ඝාදිසෙස** යැයි කියනු ලැබෙයි. ඒ ආපත්ති සමූහයට මැ නාමකර්ම යැ අධිවචන යි. එයිනුදු **සඞ්ඝාදිසෙස** යැයි කියනු ලැබෙ.

මිනිසුන් විසින් අදනා ලබන්නී යා නම්, රැකවරණය යදී නම් නො උදෙසා කියා නම් ඇවැත් නො වේ, උම්මත්තිකාවහට... ආදිකම්මිකාවහට ඇවැත් නැති.

**ප්‍රථම සඞ්ඝාදිශෙෂ යි.**

## 2. 2

## විතීය සඞ්ඝාදිශෙෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ **අනේපිඩු** සිටුහුගේ **ජෙතවන** නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි **විසල්පුර** එක්තරා ලිච්ඡවියකුගේ භාර්‍ය්‍යා තොමෝ ඉක්මවා හැසිරෙන්නී වෙයි, එකල්හි ඒ ලිච්ඡවි තෙමේ ඒ ස්ත්‍රියට මෙය කීයැ: ''මැනැවි විරමණය වව, තාහට නපුරක් කරන්නෙමැ''යි, මෙසේත් කියනු ලබන්නී නො පිළිගතු. එසමයෙහි වනාහි විසල්පුර ලිච්ඡවි ගණයා කිසියම් කටයුත්තක් හෙතු කොට ගෙන රැස්වූයේ වෙයි. එකල්හි ඒ ලිච්ඡවි තෙමේ ඒ ලිච්ඡවීනට මෙය කීයැ: ''ආර්‍ය්‍යයෙනි, එක් ස්ත්‍රියක මාහට අනුදනුව''යි. හෝ නම් කවර යැ? මාගේ භාර්‍ය්‍යාව ඉක්මවා හැසිරෙයි. ඇය නසා ලන්නෙමැයි, දනුව යි (කීයැ.)



Free Distribution www.aathaapi.org

2. අස්සොසි ඛො සා ඉත්ථී "සාමිකො කිර මං ඝාතෙතුකාමො"ති, වරභණ්ඩං ආදාය සාවත්ථිං ගන්ත්වා තිත්ථියෙ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි, තිත්ථියා න ඉච්ඡිංසු පබ්බාජෙතුං. භික්ඛුනියො උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි; භික්ඛුනියො පි න ඉච්ඡිංසු පබ්බාජෙතුං. ථුල්ලනන්දං භික්ඛුනිං උපසඞ්කමිත්වා භණ්ඩකං දස්සෙත්වා පබ්බජ්ජං යාචි, ථුල්ලනන්දා භික්ඛුනී භණ්ඩකං ගහෙත්වා පබ්බාජෙසි.

3. අථ ඛො සො ලිච්ඡවි තං ඉත්ථිං පරියෙසන්තො[1] සාවත්ථිං ගන්ත්වා භික්ඛුනීසු පබ්බජිතං දිස්වාන යෙන රාජා පසෙනදි කොසලො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං පසෙනදිං කොසලං එතද-වොච: "පජාපති මෙ දෙව වරභණ්ඩං ආදාය සාවත්ථිං අනුප්පත්තා තං දෙවො අනුජානාතූ"ති. තෙන හි භණෙ විචිනිත්වා ආචික්ඛාති දිට්ඨා දෙව භික්ඛුනීසු පබ්බජිතාති. සචෙ භණෙ භික්ඛුනීසු පබ්බජිතා න සා ලබ්භා කිඤ්චි කාතුං, ස්වාක්ඛාතො ධම්මො[2] චරතු බ්‍රහ්මචරියං සම්මාදුක්ඛස්ස අන්තකිරියායාති.

4. අථ ඛො සො ලිච්ඡවි උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛුනියො චොරිං පබ්බාජෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තස්ස ලිච්ඡවිස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස.

5. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා චොරිං පබ්බා-ජෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී චොරිං පබ්බාජෙසීති? සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී චොරිං පබ්බාජෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී ජානං චොරිං වජ්ඣං විදිතං අනපලොකෙත්වා රාජානං වා සඞ්ඝං වා ගණං වා පූගං වා සෙණිං වා අඤ්ඤත්‍ර කප්පා වුට්ඨාපෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.**

1. ගවෙසන්තො, මජසං
2. ස්වාක්ඛාතො භගවතා ධම්මො, මජසං



Free Distribution www.aathaapi.org

2. ඒ ස්ත්‍රී තොමෝ 'සැමියා මා නසාලනු කැමැත්තේ ලැ'යි ඇසූයැ, වරබඩු රැගෙන සැවැතට ගොස් තොටුවන් වෙත එළඹ පැවිද්ද යැදූ යැ, තොටුවෝ පැවිදි කරවන්නට නො කැමැති වූහු. මෙහෙණන් වෙත එළඹ පැවිද්ද යැදූ යැ. මෙහෙණෝත් පැවිදි කරවන්නට නො කැමැති වූහු, ථුල්ලනන්දා භික්ෂුණිය වෙත එළඹ බඩුපොදිය දක්වා පැවිද්ද යැදූ යැ, ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ බඩුපොදිය ගෙන පැවිදි කරවූ යැ.

3. ඉක්බිති ඒ ලිච්ඡවි තෙමේ ඒ ස්ත්‍රිය සොයන්නේ සැවැතට ගොස් මෙහෙණන් කෙරෙහි පැවිදිවූවහු දක පසෙනදි කොසොල් රජු වෙත එළඹියේ යැ, එළඹ පසෙනදි කොසොල් රජුහට මෙය කීයැ: "දෙවයෙනි, භාර්‍ය්‍යාව වරබඩු රැගෙන සැවැතට පැමිණියා යැ, දෙවතෙමේ ඇය අනුදනීව"යි, එසේ නම් කොළෙනි, සොයා කියවයි. දෙවයෙනි, මෙහෙණන් කෙරෙහි පැවිදිවූවා දක්නා ලද්දී යැ. ඉදින් කොළෙනි, මෙහෙණන් කෙරෙහි පැවිදි වූ නම් ඕතොමෝ කිසිවක් කරන්නට නො ලබන්නී යැ, ධර්මය ස්වාඛ්‍යාත යැ; මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස බඹසර කෙරේව යි.

4. එකල්හි ඒ ලිච්ඡවි තෙමෙ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: "කෙසේ නම් මෙහෙණෝ සෙරක පැවිදි කරවූහුද"යි. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ ලිච්ඡවිහුගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු.

5. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්; "කෙසේ නම් ආර්‍ය්‍යා ථුල්ලනන්දා තොමෝ සෙරක පැවිදිකරවූ"දැයි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්දා භික්ෂුණිය සෙරක පැවිදි කරවූදැයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැර... ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්දා භික්ෂුණිය සෙරක පැවිදි කරවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ... මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය මෙසේ උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ දනැ දනැ වධයට සුදුසු වූ (එයේ) දන්නා ලද්ද වූ සෙරක රජහු හෝ සඟහු හෝ ගණයා හෝ මුළුව හෝ ශ්‍රෙණිය හෝ නො පිළිවිසැ පෙර පැවිදි වූවක තබා උපසපන් කරවා නම් මේ මෙහෙණ තොමෝත් පළමු, (විකුම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.**

6. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති,

**ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්සා ආරොචෙන්ති, සා වා ආරොචෙති.

**චොරී** නාම: යා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, එසා චොරී නාම.

**වජ්ඣා** නාම: යං කම්මං[1] කත්වා වජ්ඣප්පත්තා හොති,

**විදිතා** නාම; අඤ්ඤෙහි මනුස්සෙහි ඤාතා හොති වජ්ඣා එසාති.

**අනපලොකෙත්වාති**: අනාපුච්ඡා.

**රාජා** නාම: යත්ථ රාජා අනුසාසති, රාජා අපලොකෙතබ්බො.

**සඞ්ඝො** නාම: භික්ඛුනීසඞ්ඝො වුච්චති, භික්ඛුනීසඞ්ඝො අපලොකෙතබ්බො.

**ගණො** නාම: යත්ථ ගණො අනුසාසති, ගණො අපලොකෙතබ්බො,

**පූගො** නාම: යත්ථ පූගො අනුසාසති, පූගො අපලොකෙතබ්බො.

**සෙණි** නාම: යත්ථ සෙණි අනුසාසති, සෙණි අපලොකෙතබ්බො.

**අඤ්ඤත්‍ර කප්පාති**: ඨපෙත්වා කප්පං, කප්පං නාම; ද්වෙ කප්පානි, තිත්ථියෙසු වා පබ්බජිතා හොති අඤ්ඤාසු වා භික්ඛුනීසු පබ්බජිතා අඤ්ඤත්‍ර කප්පා වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති, ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

---

1. කම්මන්ති පදං මජසං' න දිස්සතෙ.



Free Distribution www.aathaapi.org

6. **යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී** ... **මෝතොමෝ මේ අර්යෙහි** ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**ජානාති** නම්: තොමෝ හෝ දනී, අන්හු හෝ ඇයට ඇරොජත්, ඹතොමෝ හෝ ඇරොජයි.

**චොරී** නම්: යමක් පස්මස්සක් හෝ අයිරා **පස්මස්සක් හෝ** අගනා නුදුන් දයක් සොරසිතින් ගනී නම් මෝ **තොමෝ සෙර** නමු.

**වජ්ඣා** නම්: යම් කම්යක් කොට වධයට **සුදුසු වූවා වෙයි.**

**විදිතා** නම්: සෙසු මිනිසුන් විසින් 'මෝ තොමෝ වධයට **සුදුසු** වූවා'යැයි දන්නා ලද්දී වෙයි.

**අනපලොකෙත්වා:** නො පිළිවිසැ,

**රාජ** නම්: යම් තැනෙක රජෙක් අනුශාසනය කෙරේ නම් රජතෙමේ පිළිවිසිය යුත්තේ යැ.

**සඞ්ඝ** නම්: භික්ෂුණිසඞ්ඝයා කියනු ලැබෙයි. භික්ෂුණිසඞ්ඝ තෙමේ පිළිවිසිය යුත්තේ යැ.

**ගණ** නම්: යම් තැනෙක (මල්ලගණාදි) ගණයෙක් **අනුශාසනය** කෙරේ නම් ගණයා **පිළිවිසිය යුත්තේ** යැ.

**පූග** නම්: යම් තැනෙක පුණ්‍ය කාරකාදි මුළුවෙක් අනුශාසනය කෙරේ නම් මුළුව පිළිවිසිය යුත්තේ යැ.

**සෙණි** නම්: යම් තැනෙක ගන්ධිකාදි ශ්‍රෙණියෙක් **අනුශාසනය** කෙරේ නම් ශ්‍රෙණිය පිළිවිසිය යුත්තේ යි.

**අඤ්ඤත්‍ර කප්පා:** කැප බවට ගියක තබා කපප නම්: දෙ **කැපයෙකි** තොටුවන් කෙරෙහි **හෝ** පැවිදිවූවා වෙයි, අන් මෙහෙණන් කෙරෙහි හෝ පැවිදිවූවා වෙයි, කැපබවට ගියක තබා උපසපන් කරවන්නෙමැයි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාවක් හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, ඥප්තියෙන් දුකුළා යැ දෙකම් වදතින් තුලැසි යැ, කම්වදන් පිරියතැ උවදැ මෙමෙහෙණහට **සඟවෙසෙස්** ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරහට ද දුකුළා ඇවැත් වේ:

අයම්පීති; පුරිමං[1] උපාදාය වුච්චති.

**පඨමාපත්තිකන්ති**: සහවත්ථුජ්ඣාචාරා ආපජ්ජති අසමනුභාසනාය. **නිස්සාරණීයන්ති**: සඞ්ඝම්හා නිස්සාරීයති.

**සඞ්ඝාදිසෙසොති**: සඞ්ඝොව තස්සා ආපත්තියා මානත්තං දෙති මූලාය පටිකස්සති අබ්භෙති න සම්බහුලා න එකා භික්ඛුනී තෙන වුච්චති සඞ්ඝාදිසෙසොති. තස්ස චෙව ආපත්තිනිකායස්ස නාමකම්මං අධිවචනං, තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

චොරියා චොරීසඤ්ඤා අඤ්ඤත්‍ර කප්පා වුට්ඨාපෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. චොරියා වෙමතිකා අඤ්ඤත්‍ර කප්පා වුට්ඨාපෙති ආපත්ති දුක්කටස්ස.[2] චොරියා අචොරීසඤ්ඤා අඤ්ඤත්‍ර කප්පා වුට්ඨාපෙති, අනාපත්ති. අචොරියා චොරීසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අචොරියා වෙමතිකා ආපත්ති දුක්කටස්ස, අචොරියා අචොරීසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති**: අජානන්තී වුට්ඨාපෙති, අපලොකෙත්වා වුට්ඨාපෙති, කප්පකතං[3] වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දුතියසඞ්ඝාදිසෙසො

## 2. 3

## තතියසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **භද්දාය කාපිලානියා** අන්තෙවාසිකා[4] භික්ඛුනී භික්ඛුනීහි සද්ධිං භණ්ඩිත්වා ගාමකං[5] ඤාතිකුලං අගමාසි. භද්දා කාපිලානී තං භික්ඛුනිං අපස්සන්තී භික්ඛුනියො පුච්ඡි, "කහං ඉත්ථන්නාමා න දිස්සතී"ති. භික්ඛුනීහි සද්ධිං අය්‍යෙ භණ්ඩිත්වා න දිස්සතීති. අම්මා අමුකස්මිං ගාමකෙ[5] එතිස්සා ඤාතිකුලං, තත්ථ ගන්ත්වා විචිනථාති. භික්ඛුනියො තත්ථ ගන්ත්වා තං භික්ඛුනිං පස්සිත්වා එතදවොචුං: "කිස්ස ත්වං අය්‍යෙ එකිකා ආගතා, කච්චිසි අප්පධංසිතා"ති, අප්පධංසිතම්හි[6] අය්‍යෙති.

1. පුරිමායො, සිමු I සිමු II
2. සඞ්ඝාදිසෙසස්ස, සිමු II
3. කප්පකං, සිමු II
4. අන්තෙවාසි, සී I අන්තෙවාසිනී, මජසං
5. ගාමිකෙ, සයා,
6. අප්පධංසිකාම්හි, මජසං



Free Distribution www.aathaapi.org

**අයමපි:** පළමු සඟවෙසෙස් අවතක ගෙන කියනු ලැබෙයි.

**පඨමාපත්තිකං:** වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ පැමිණෙයි, සමනු භාෂණ කර්මයෙන් නො වෙයි.

**නිස්සාරණීයං:** සඟහු කෙරෙන් නෙරනු ලබයි.

**සඞ්ඝාදිසෙසො:** සඞ්ඝ තෙමේ මැ ඒ ඇවැතට මානත දෙයි, මූලාය පටිකස්සනය කෙරෙයි, අබ්භාන කර් කෙරෙයි. සම්බහුලයෝ නො වෙති, එක් මෙහෙණක් ද නො වෙයි, එහෙයින් සඞ්ඝාදිසෙස යැයි කියනු ලැබෙයි, ඒ ආපත්ති සමූහයට මැ නාමකර්ම යැ අධිවචන යි. එයිනුදු සඞ්ඝාදිසෙස යැයි කියනු ලැබේ.

සෙරක කෙරෙහි සෙරකැයි සන් ඇතියා කැපබවට ගියක තබා උපසපන් කරවා නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, සෙරක කෙරෙහි විමති ඇතියා කැපබවට ගියක තබා උපසපන් කරවා නම් දුකුළා ඇවැත් වෙයි, සෙරක කෙරෙහි නො සෙර සන් ඇතියා කැපබවට ගියක තබා උපසපන් කරවා නම් ඇවැත් නැති, නො සෙර කෙරෙහි සෙරකැයි සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි, නො සෙර කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි, නො සෙර කෙරෙහි නො සෙර සන් ඇතියා නම් ඇවැත් නැති.

නො දන්නී උපසපන් කරවා නම්, පිළිවිසැ උපසපන් කරවා නම්, කැපබවට ගියක උපසපන් කරවා නම්, ඇවැත් නො වේ. උම්මත්තිකාවහට...ආදිකම්මිකාවහට ඇවැත් නැති.

**ද්විතීය සඞ්ඝාදිශෙෂ යි.**

## තෘතීය සංඝාදිශෙෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි භද්‍රා කාපිලානියගේ අතැවැසි මෙහෙණක් මෙහෙණන් සමඟ ඩබර කොට ගම්බද නැකුල-යකට ගියා යැ. භද්‍රා කාපිලානී තොමෝ ඒ මෙහෙණ නො දක්නී මෙහෙණන් පිළිවුසූ යැ. "මෙනම් ඇත්තී කොහිදූයි නො දක්නා ලැබේ."යැයි. ආයඤාවෙනි, මෙහෙණන් සමඟ ඩබර කොට නො දක්නා ලැබේ යැයි. මැණිවරුනි, අසුවල් ගමෙහි මැයගේ නෑ කුලයෙක් වෙයි. එහි ගොස් සොයා බලව යි කිවූ යැ. මෙහෙණෝ එහි ගොස් ඒ මෙහෙණ දැක මෙය කීහු. "ආයඤාවෙනි, තෝ කුමකට හුදෙකලා වැ අවු ද? කිම නො නසනලදූ දූයි, ආයඤාවෙනි. නො නසනා-ලදුයෙම් වෙමැයි (කිවුයැ.)

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡතීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**යා පන භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති

3. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛුනියො සාකෙතා සාවත්ථිං[1] අද්ධානමග්ගප්පටිපන්නා හොන්ති, අන්තරාමග්ගෙ නදී තරිතබ්බා හොති, අථ ඛො තා භික්ඛුනියො නාවිකෙ උපසඞ්කමිත්වා එතදවොචුං, "සාධු නො ආවුසො තාරෙථා"ති. නාය්‍යෙ සක්කා උභො එකතො සකිං තාරෙතුන්ති එකො එකං උත්තාරෙසි, උත්තිණ්ණො උත්තිණ්ණං දූසෙසි, අනුත්තිණ්ණො අනුත්තිණ්ණං දූසෙසි, තා පච්ඡා සමාගන්ත්වා පුච්ඡිංසු. කච්චිසි අය්‍යෙ අප්පධංසිතාති, පධංසිතම්හි අය්‍යෙ ත්වං පන අය්‍යෙ අප්පධංසිතාති, පධංසිතම්හි අය්‍යෙති.

4. අථ ඛො තා භික්ඛුනියො සාවත්ථිං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං: යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී එකා නදීපාරං ගච්ඡිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී එකා නදීපාරං ගච්ඡතීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී එකා නදීපාරං ගච්ඡිස්සතීති නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

1. සාවත්ථියං - Sii

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන්ගමකට ගියා"දැයි... ...සැබෑ ද මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන් ගමකට යා දැයි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ "කෙසේ නම් මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන්ගමකට ගියා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි, ... මෙසේ ද වනාහි මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන් ගමකට යා නම් මේ මෙහෙණ තොමෝත් පළමු (වීකම් කෙණෙහි මැ) පැමි-ණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.**

මෙසේ මේ සිකපදය භාග්‍යවතුන් විසින් මෙහෙණන්හට පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි මෙහෙණෝ දෙදෙනෙක් සාකෙතයෙන් සැවැතට (යනු පිණිස) අද්දන්මහට පිළිපන්නාහු වෙති, අතරමඟෙහි නදියක් තරණය කළ යුතු වෙයි, එකල්හි ඒ මෙහෙණෝ නැවියන් වෙත එළැඹ මෙය කීහු, "ඇවැත්නි, අප එතර කරවන්නාහු නම් මැනැවැ"යි, ආර්‍යාවෙනි, දෙදෙන එක්වැ වරකට එතර කරවන්-නට නො හැක්කැයි. එකෙක් එකෙක එතර කැරැවීයැ. එතර වූයේ එතර වූවහු දූෂණය කෙළේ යැ, එතර නො වූයේ එතර නො වූවහු දූෂණය කෙළේ යි, ඔහු පසුවැ එකතු වැ පිළිවුසුහු. කිම, ආර්‍යාවෙනි, නො නසන ලද දැයි, ආර්‍යාවෙනි, නසන ලදුයෙම් වෙමි, ආර්‍යාවෙනි, තෙපි නො නසන ලද්දවු දැයි, ආර්‍යාවෙනි, නසන ලදුයෙම් වෙමි යි කිවු යැ.

4. ඉක්බිති ඒ මෙහෙණෝ සැවැතට ගොස් මෙහෙණන්හට කෙල කරුණ සැලකළහ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්-වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා (ගඟෙකින් එතෙරට) ගියා"දැයි, ... සැබෑ ද මහණෙනි, මෙහෙ-ණක් තොමෝ හුදෙකලා වූවා ගඟෙකින් එතෙරට යා දැයි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා ගඟෙකින් එතෙරට ගියා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.



Free Distribution www.aathaapi.org

**යා පන භික්ඛුනී එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය, එකා වා නදීපාරං ගච්ඡෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තියො සායං අඤ්ඤතරං ගාමං උපගච්ඡිංසු, තත්ථ අඤ්ඤතරා භික්ඛුනී අභිරූපා හොති දස්සනීයා පාසාදිකා, අඤ්ඤතරො පුරිසො තස්සා භික්ඛුනියා සහදස්සනෙන පටිබද්ධචිත්තො අහොසි.[1] අථ ඛො සො පුරිසො තාසං භික්ඛුනීනං සෙය්‍යං පඤ්ඤපෙන්තො තස්සා භික්ඛුනියා සෙය්‍යං එකමන්තං පඤ්ඤපෙසි. අථ ඛො සා භික්ඛුනී සල්ලක්ඛෙත්වා පරියුට්ඨිතො අයං පුරිසො සචෙ රත්තිං ආගච්ඡිස්සති විස්සරො මෙ භවිස්සතීති භික්ඛුනියො අනාපුච්ඡා අඤ්ඤතරං කුලං ගන්ත්වා සෙය්‍යං කප්පෙසි. අථ ඛො සො පුරිසො රත්තිං ආගන්ත්වා තං භික්ඛුනිං ගවෙසන්තො භික්ඛුනියො සඝට්ටෙසි. භික්ඛුනියො තං භික්ඛුනිං අපස්සන්තියො එවමාහංසු, නිස්සංසයං ඛො සා භික්ඛුනී පුරිසෙන සද්ධිං නික්ඛන්තාති. අථ ඛො සා භික්ඛුනී තස්සා රත්තියා අච්චයෙන යෙන තා භික්ඛුනියො තෙනුපසඞ්කමි. භික්ඛුනියො තං භික්ඛුනිං එතදවොචුං: කිස්ස ත්වං අය්‍යෙ පුරිසෙන සද්ධිං නික්ඛන්තාති. නාහං අය්‍යෙ පුරිසෙන සද්ධිං නික්ඛන්තාති. භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

6. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනී එකා රත්තිං විප්පවසිස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී එකා රත්තිං විප්පවසීති සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී එකා රත්තිං විප්පවසිස්සති නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**යා පන භික්ඛුනී එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය එකා වා නදීපාරං ගච්ඡෙය්‍ය එකා වා රත්තිං විප්පවසෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

1. හොති - මජසං,

**යම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන්ගමකට යා නම් හෝ හුදෙකලා වූවා ගඟෙකින් එතෙරට යා නම් මේ මෙහෙණ තොමෝත් පළමු (වීකුම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හේතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.**

මෙසේ මේ සිකපදය භාග්‍යවතුන් විසින් මෙහෙණුන්හට පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි වනාහි බොහෝ මෙහෙණෝ කොසොල් දනව්වෙහි සිට සැවැතට යන්නාහු සවස එක්තරා ගමකට එළැඹියහ. ඔවුනතුරෙහි එක්තරා මෙහෙණක් තොමෝ විශිෂ්ට රූ ඇත්තී දැකුම්කලු වූවා පැහැදුම් දනවන්නී වෙයි, එක්තරා පුරුෂයෙක් එ මෙහෙණ දක්නා හා මැ පිළිබඳ සිත් ඇත්තේ විය. එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ මෙහෙණන්හට සෙනසුන් පනවන්නේ ඒ මෙහෙණ හට සෙනසුනක් එකත්පසෙකැ පැනවීයැ. එකල්හි ඒ මෙහෙණ තොමෝ 'මේ පුරුෂ (රාග) පර්යවුත්ථිත යැ, ඉදින් රැයෙහි එන්නේ නම් මාහට වියරුහඬෙක් වන්නේ' යැයි සලකා මෙහෙණන් නො පිළිවිසැ එක්තරා කුලයකට ගොස් ශයනය කළා යැ. එකල්හි ඒ පුරුෂ තෙමේ රැයෙහි අවුත් එ මෙහෙණ සොයන්නේ මෙහෙණන් ගටාලී යැ. මෙහෙණෝ එ මෙහෙණ නො දක්නාහු මෙසේ කීහු, "නිසැකයෙන් මැ ඒ මෙහෙණ තොමෝ පිරිමිනියක්හු සමඟ නික්මගතු" යැයි, ඉක්බිති ඒ මෙහෙණ තොමෝ එරැය ඇවෑමෙන් ඒ මෙහෙණන් වෙත එළැඹියා යැ. මෙහෙණෝ එ මෙහෙණහට මෙය කීහු, ආයඝාවෙනි, තෝ කුමකට පිරිමිනියක්හු සමඟ නික්මගතු දැයි, ආයඝාවෙනි, මම පිරිමිනියක්හු සමඟ නො නික්මගතිමි යි මෙහෙණන්හට තෙල කරුණ සැලකළා යැ.

6. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා රැයෙහි වෙන්වැ වුසූ"දැයි ... සැබෑ ද මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා රැයෙහි වෙන් වැ වුසූ දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා රැයෙහි වෙන්වැ වුසූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි, ... මෙසේ වනාහි මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන්ගමකට යා නම් හෝ හුදෙකලා වූවා ගඟෙකින් එතෙරට යා නම් හෝ හුදෙකලා වූවා රැයෙහි වෙන් වැ වසා නම් හෝ මේ මෙහෙණ තොමෝත් පළමු (වීකුම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.**

මෙසේ මේ සිකපදය භාග්‍යවතුන් විසින් මෙහෙණුන්හට පනවන ලද්දේ වෙයි.

7. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො කොසලෙසු ජනපදෙසු සාවත්ථිං අද්ධානමග්ගප්පටිපන්නා හොන්ති. තත්ථ අඤ්ඤතරා භික්ඛුනී වච්චෙන පීළිතා[1] එකිකා ඔහීයිත්වා[2] පච්ඡා අගමාසි මනුස්සා තං භික්ඛුනිං පස්සිත්වා දූසෙසුං. අථ ඛො සා භික්ඛුනී යෙන තා භික්ඛුනියො තෙනුපසඞ්කමි, භික්ඛුනියො තං භික්ඛුනිං එතදවොචුං: "කිස්ස ත්වං අය්යෙ එකිකා ඔහීනා[3] කච්චිසි අප්පධංසිතා'ති. පධංසිතම්හි අය්යෙ'ති.

8. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡතීති සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී එකා ගාමන්තරං ගච්ඡිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය එකා වා නදීපාරං ගච්ඡෙය්‍ය එකා වා රත්තිං විප්පවසෙය්‍ය එකා වා ගණම්හා ඔහීයෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.**

9. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍යාති:** පරික්ඛිත්තස්ස ගාමස්ස පරික්ඛෙපං පඨමං පාදං අතික්කාමෙන්තියා ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං අතික්කාමෙන්තියා ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අපරික්ඛිත්තස්ස ගාමස්ස උපචාරං පඨමං පාදං අතික්කාමෙන්තියා ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං අතික්කාමෙන්තියා ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

---

1. වච්චපීළිතා, සී ।   පීළිතා, සමු ।
2. ඔහීත්වා, මජසං
3. හීනා, සී සමු ।



Free Distribution www.aathaapi.org

7. එසමයෙහි වනාහි බොහෝ මෙහෙණෝ **කොසොල්** දනව්වෙහි සිට සැවැතට (යනු පිණිස) අදන්මඟට පිළිපන්නාහු වෙති, ඔවුනතුරෙහි එක්තරා මෙහෙණක් තොමෝ මහවටනින් පෙළෙණී හුදෙකලා වූවා (ගණයා කෙරෙන්) වෙන්වැ පසු වැ ගියා යැ, මිනිස්සු ඒ මෙහෙණ දැක දූෂණය කළහ. ඉක්බිති ඒ මෙහෙණ තොමෝ ඒ මෙහෙණන් වෙත එළඹියා යැ, මෙහෙණෝ ඒ මෙහෙණහට මෙය කීහු, "ආයඞාවෙනි, කුමකට තෝ හුදෙකලා වූවා පසුවූවා ද? කිම! නො නසන ලදු"දූයි, ආයඞාවෙනි, නසන ලදුයෙමි වෙමැයි (කීවුයැ).

8. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු සොට සිතති, නුගුණු පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා ගණයා කෙරෙන් වෙන්වූ'දූ' යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා ගණයා කෙරෙන් වෙන්වූ දූයි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා ගණයා කෙරෙන් වෙන්වූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි, ... මෙසේ වනාහි මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා අන්ගමකට යා නම් හෝ හුදෙකලා වූවා ගඟකින් එතෙරට යා නම් හෝ හුදෙකලා වූවා රැයෙහි වෙන් වැ වසා නම් හෝ හුදෙකලා වූවා ගණයා කෙරෙන් වෙන් වේ නම් හෝ මේ මෙහෙණ තොමෝත් පළමු (වීකුම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.**

9. **යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මෙ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය:** පරික්ඛිප්ත ග්‍රාමයාගේ **පරික්ෂෙපය පළමු** පයින් ඉක්මවන්නියට තුලැසි ඇවැත් වෙයි, දෙවන පයින් ඉක්මවන්නියට සඟවෙසෙස් ඇවැත් වෙයි, අපරික්ඛිප්තග්‍රාමයාගේ උපචාරය පළමු පයින් ඉක්මවන්නියට තුලැසි ඇවැත් වෙයි, දෙවන පයින් ඉක්මවන්නියට සඟවෙසෙස් ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

**එකා වා නදීපාරං ගච්ඡෙය්‍යාති:** නදී නාම තිමණ්ඩලං පටිච්ඡාදෙත්වා යත්ථ කත්ථචි උත්තරන්තියා භික්ඛුනියා අන්තරවාසකො තෙමියති, පඨමං පාදං උත්තරන්තියා[1] ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං උත්තරන්තියා ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**එකා වා රත්තිං විප්පවසෙය්‍යාති:** සහ අරුණුග්ගමනා දුතියිකාය භික්ඛුනියා හත්ථපාසං විජහන්තියා ආපත්ති ථුල්ලච්චයස්ස විජහිතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**එකා වා ගණම්හා ඔහීයෙය්‍යාති:** අගාමකෙ අරඤ්ඤෙ දුතියිකාය භික්ඛුනියා දස්සනූපචාරං වා සවණූපචාරං වා විජහන්තියා ආපත්ති ථුල්ලච්චයස්ස. විජහිතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**අයම්පීති:** පුරිමායො උපාදය වුච්චති.

**පඨමාපත්තිකන්ති:** සහවත්ථජ්ඣාචාරා ආපජ්ජති අසමනුභාසනාය.

**නිස්සාරණීයන්ති:** සඞ්ඝම්හා නිස්සාරීයති

**සංඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

**අනාපත්ති:** දුතියිකා භික්ඛුනී පක්කන්තා වා හොති විබ්භන්තා, වා කාලඞ්කතා වා පක්ඛසංකන්තා වා, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

තතියසඞ්ඝාදිසෙසො

## 2. 4

## චතුත්ථසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන චණ්ඩකාළී භික්ඛුනී භණ්ඩනකාරිකා හොති කලහකාරිකා විවාදකාරිකා භස්සකාරිකා, සංඝෙ අධිකරණකාරිකා. ථුල්ලනන්දා භික්ඛුනී තස්සා කම්මෙ කයිරමානෙ[2] පටික්කොසති. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී

1. උත්තාරෙන්තියා – සී! මජු!!
2. කරියමානෙ – මජසං.



Free Distribution www.aathaapi.org

**එකා වා නදීපාරං ගච්ඡෙය්‍යාː** නදී නම් තෙමඩුලු වසා යම් කිසි තැනෙක, එතර වන්නා වූ මෙහෙණකගේ හඳනාසිවුර තෙමෙනු ලැබේ නම් එය යි, පළමු පියෙන් එතර වන්නියට තුල්‍යසි ඇවැත් වෙයි, දෙවන පියෙන් එතර වන්නියට සඞ්ඝවෙසෙස් ඇවැත් වේ.

**එකා වා රත්තිං විප්පවසෙය්‍යාː** අරුණ නැඟීම සමඟ මැ දෙවැනි මෙහෙණකගේ අත්පස හරින්නියට තුල්‍යසි ඇවැත් වෙයි, හළ කල්හි සඞ්ඝවෙසෙස් ඇවැත් වේ.

**එකා වා ගණම්හා ඔහීයෙය්‍යාː** නො ගම් අරන්හි දෙවැනි මෙහෙණකගේ දසුන්උවසර හෝ සවන්උවසර හෝ හරින්නියට තුල්‍යසි ඇවැත් වෙයි, හළ කල්හි සඞ්ඝවෙසෙස් ඇවැත් වේ.

**අයම්පි:** පළමු සඞ්ඝවෙසෙස් අවත් මෙහෙණත් ගෙනැ කියනු ලැබෙයි.

**පඨමාපත්තිකංː** වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ පැමිණෙයි, සමනුභාෂණකර්මයෙන් නො වෙයි.

**නිස්සාරණීයංː** සඞ්ඝ කෙරෙන් නෙරනු ලබයි.

**සඞ්ඝාදිසෙසොː** එයිනුදු සඞ්ඝාදිසෙස යැයි කියනු ලැබෙ.

දෙවැනි මෙහෙණ ගියා හෝ ගිහිවූවා හෝ කලුරිය කළා හෝ නොවූපසට ගියා හෝ වේ නම් ඇවැත් නොවේ. ආපදයෙහි, උම්මත්තිකාවට...ආදිකම්මිකාවට ඇවැත් නැති.

තෘතීය සඞ්ඝාදිශෙෂ යි.

## 2. 4

## චතුර්ථ සඞ්ඝාදිශෙෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි චනාහි **චණ්ඩකාලි භික්ෂුණී** තොමෝ ඩබර කරන්නී කලහකරන්නී විරුද්ධවාද කරන්නී බහින්බස් වන්නී සඞ්ඝයා කෙරෙහි අධිකරණ කරන්නී වෙයි, **ථුල්ලනන්‍දා භික්ෂුණී** තොමෝ ඇයට කර්ම කරන කල්හි ඔවුනට පටහැණි වැ කරුණු කියයි. එසමයෙහි චනාහි ථුල්ලනන්‍දා **භික්ෂුණී** තොමෝ



Free Distribution www.aathaapi.org

ගාමකං අගමාසි, කෙනචිදෙව කරණීයෙන. අථ ඛො භික්ඛුනීසඞ්ඝො ථුල්ලනන්දාය භික්ඛුනියා පක්කන්තාය චණ්ඩකාළිං භික්ඛුනිං ආපත්තියා අදස්සනෙ[1] උක්ඛිපි. ථුල්ලනන්දා භික්ඛුනී ගාමකෙ තං කරණීයං තීරෙත්වා පුනදෙව සාවත්ථිං පච්චාගච්ඡි[2]. චණ්ඩකාළී භික්ඛුනී ථුල්ලනන්දාය භික්ඛුනියා ආගච්ඡන්තියා නෙව ආසනං පඤ්ඤපෙසි න පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි. න පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසි, න පානීයෙන ආපුච්ඡි. ථුල්ලනන්දා භික්ඛුනී චණ්ඩකාළිං භික්ඛුනිං එතදවොච: "කිස්ස ත්වං අය්‍යෙ මයි[3] ආගච්ඡන්තියා නෙව ආසනං පඤ්ඤපෙසි. න පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි, න පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසි, න පානීයෙන ආපුච්ඡී"ති එවං හෙතං අය්‍යෙ හොති. යථා තං අනාථායාති. කිස්ස පන ත්වං අය්‍යෙ අනාථාති. ඉමා මං අය්‍යෙ භික්ඛුනියො අයං අනාථා අප්පඤ්ඤාතා නත්ථි ඉමිස්සා කොචි[4] පටිවත්තාති ආපත්තියා අදස්සනෙ උක්ඛිපිංසූති. ථුල්ලනන්දා භික්ඛුනී බාලා එතා අබ්‍යත්තා එතා, නෙතා ජානන්ති කම්මං වා කම්මදොසං වා කම්මවිපත්තිං වා කම්මසම්පත්තිං වා. මයං ඛො ජානාම කම්මම්පි කම්මදොසම්පි කම්මවිපත්තිම්පි කම්මසම්පත්තිම්පි, මයං ඛො අකතං වා කම්මං කාරෙය්‍යාම[5] කතං වා කම්මං කොපෙය්‍යාමාති ලහුං ලහුං භික්ඛුනීසඞ්ඝං සන්නිපාතාපෙත්වා චණ්ඩකාළිං භික්ඛුනිං ඔසාරෙසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලො-කෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙස්සතී"ති-පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලො-කෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

---

1. අදස්සනෙන, [illegible]
2. පච්චාගච්ඡී, සී1 සීමු
3. මං, සී1 සීමු1 සීමු
4. කාචි, මජසං, සීමු
5. කාරාපෙය්‍යාම, සීමු



Free Distribution www.aathaapi.org

කිසියම් ඇවැසි කටයුත්තක් හෙතු කොට ගෙන ගමකට ගියා යැ. එකල්හි භික්ෂුණී සඞ්ඝ තෙමේ ථුල්ලනන්දා භික්ෂුණිය බැහැර ගියා යැයි චණ්ඩකාලී මෙහෙණහට ඇවැත් හෙයින් නො දක්මෙහි උත්කෙෂපණිය කර්මය කෙළේ යැ. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ ගමෙහි ඒ ඇවැසි කටයුත්ත තීරණය කොට යළි සැවැතට පෙරළා පැමිණියා යැ. චණ්ඩකාලී භික්ෂුණී තොමෝ එන ථුල්ලනන්දා මෙහෙණහට අසුනක් නො මැ පැනවූ යැ. පා දෝනා දිය පාපුටුව පා උලන පුවරුව ගෙනා මැ වෙත නැබූ යැ. පෙරගමන් කොට පා සිවුරු නො පිළිගතු. පැනින් නො පිළිවුසු. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ චණ්ඩකාලී මෙහෙණහට මෙය කිවූ යැ: ''ආයඨාවෙනි, තෝ කුමක් හෙයින් මා පැමිණෙන කල්හි අසුනක් නො මැ පැනවූව, පාදෝනාදිය පාපුටුව පා උලන පුවරුව නො මැ වෙත නැබූව, පෙර ගමන් කොට පාසිවුරු නො පිළිගතුව, පැනින් නො පිළිවුසුවැ''යි. ''ආයඨාවෙනි, පිළිසරණ නැතියකට යම්සේ නම් එසේ ම මැයට ද වේ''යැයි. ආයඨාවෙනි, තෝ කුමක් හෙයින් පිළිසරණ නැතියක් වීහි ද? ආයඨාවෙනි, මේ භික්ෂුණීහු ''මැය පිළිසරණ නැත්තියක අප්‍රසිද්ධ යැ, මැය පිළිබඳ කිසියම් පටහැණිවැ කියන්නෙක් නැතැ''යි ඇවැත් හෙයින් නො දක්මෙහි උකෙව්නීකම් කළහ යි. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ ''මොව්හු බාල යැ මොව්හු අවියත්හු යැ මොව්හු කර්මය හෝ කර්මදෝෂය හෝ කර්මවිපත්තිය හෝ කර්මසම්පත්තිය හෝ නො දනිති, ඇපි වනාහි කර්මය ද කර්මදෝෂය ද කර්මවිපත්තිය ද කර්මසම්පත්තිය ද දනුම්හ, ඇපි වනාහි නො කළ කර්මය හෝ කරන්නම්හ, කළ කර්මය හෝ කොපනය කරන්නම්හ''යි යුහු යුහු වැ භික්ෂුණී සඞ්ඝයා රැස්කරවා ලා චණ්ඩකාලී මෙහෙණ අවසාරණය (යළි ඇතුළත් කිරීම) කැරවූ යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති. ''කෙසේ නම් ආයඨා ථුල්ලනන්දා තොමෝ සමඟ සඟහු විසින් ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් උකෙව්නී කම් කරන ලද මෙහෙණක කාරකසඞ්ඝයා නො පිළිවිසැ ගණයාගේ ඡන්දය නො දැනැ අවසාරණය කළා''දැයි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සමඟ සඟහු විසින් ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් උකෙව්නී කම් කරන ලද මෙහෙණක කාරකසඞ්ඝයා නො පිළිවිසැ ගණයාගේ ඡන්දය නො දැනැ (සඟමැදට) ඇතුළත් කළා දැයි, සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ. ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සමඟ සඟහු විසින් ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් උකෙව්නී කම් කරන ලද මෙහෙණක කාරකසඞ්ඝයා නො පිළිවිසැ ගණයාගේ ඡන්දය නො දැනැ ඇතුළත් කළා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... තව ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය මෙසේ උදෙසත්වා.

**"යා පන භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙය්‍ය අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙස"න්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**; -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සමග්ගො** නාම සඞ්ඝො සමානසංවාසකො සමානසීමායං ඨිතො.

**උක්ඛිත්තා** නාම: ආපත්තියා අදස්සනෙ වා අප්පටිකම්මෙ වා අප්පටිනිස්සග්ගෙ වා උක්ඛිත්තා.

**ධම්මෙන විනයෙනාති**: යෙන ධම්මෙන යෙන විනයෙන.

**සත්ථුසාසනෙනාති**: ජිනසාසනෙන බුද්ධසාසනෙන.

**අනපලොකෙත්වා කාරකසඞ්ඝන්ති**: කම්මකාරකසඞ්ඝං අනාපුච්ඡා.

**අනඤ්ඤාය ගණස්ස ඡන්දන්ති**: ගණස්ස ඡන්දං අජානිත්වා, ඔසාරෙස්සාමීති ගණං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**අයම්පීති**: පුරිමායො උපාදය වුච්චති.

**පඨමාපත්තිකන්ති**; සහවත්ථුජ්ඣාචාරා ආපජ්ජති අසමනුභාසනාය.

**නිස්සාරණීයන්ති**; සඞ්ඝම්හා නිස්සාරීයති.

**සංඝාදිසෙසොති** -පෙ- තෙනාපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ඔසාරෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකා ඔසාරෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ඔසාරෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: කම්මකාරකසඞ්ඝං[1] අපලොකෙත්වා ඔසාරෙති, ගණස්ස ඡන්දං ජානිත්වා ඔසාරෙති, වත්තෙ වත්තන්තිං ඔසාරෙති අසන්තෙ කම්මකාරකසඞ්ඝෙ ඔසාරෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසඞ්ඝාදිසෙසො**

1. කාරකං සඞ්ඝං - සීමු



Free Distribution www.aathaapi.org

"යම් මෙහෙණක් තොමෝ සමඟ සඟහු විසින් ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් උක්ෂෙපනී කම් කරන ලද මෙහෙණක කාරකසඞ්ඝයා නො පිළිවිසැ ගණයාගේ ඡන්දය නො දනැ ඇතුළත් කරන්නී නම් මේ මෙහෙණ තොමෝත් පළමු (වීක්‍රම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ" යයි.

3. යා පනා: යම්, යම්බඳු ... භික්ඛුනී ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

සමග්ග නම්: සමානසංවාසක වූ සමාන සීමායෙහි සිටි සඞ්ඝ තෙමේ යි.

උක්ඛිත්තා නම්: ඇවැත් හෙයින් නො දක්මෙහි හෝ නො පිළියම් කිරීමෙහි හෝ නො බැහැර කිරීමෙහි හෝ උක්ෂෙපනී කම් කරන ලද්දී යැ.

ධම්මෙන විනයෙන: යම් ධර්මයෙකින් යම් විනයයෙකින්.

සත්ථුසාසනෙන: ජිනශාසනයෙන් බුද්ධශාසනයෙන්.

අනපලොකෙත්වා කාරකසඞ්ඝං: කර්මය කරන සඟහු නො පිළිවිසැ.

අනඤ්ඤාය ගණස්ස ඡන්දං: ගණයාගේ ඡන්දය නො දනැ ඇතුළත් කරන්නෙමි යි ගණයා හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, ඥප්තියෙන් දුකුළා යැ, දෙ කම් වදනින් තුලැසි යැ. කම් වදන් පිරියනැ සඟවෙසෙස් ඇවැත් වේ.

අයම්පි: පළමු මෙහෙණන් ගෙනැ කියනු ලැබෙයි.

පඨමාපත්තිකං: වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ පැමිණෙයි, සමනු භාෂණකර්මයෙන් නො වෙයි.

නිස්සාරණියං: සඟහු කෙරෙන් නෙරනු ලැබෙයි.

සඞ්ඝාදිසෙසො: ... එයිනුදු සඞ්ඝාදිසෙස යැයි කියනු ලැබෙ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී ඇතුළත් කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, ධර්මකර්මයෙහි විමති ඇත්තී ඇතුළත් කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, ධර්මකර්කයෙහි අධර්ම කර්මසංඥා ඇත්තී ඇතුළත් කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි, අධර්මකර්මයෙහි විමති ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි, අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වේ.

කර්මය කරන සඞ්ඝයා පිළිවිසැ ඇතුළත් කෙරේ නම්, ගණයාගේ ඡන්දය දනැ ඇතුළත් කෙරේ නම් වතෙහි වැටෙන්නිය ඇතුළත් කෙරේ නම් කර්මය කරන සඞ්ඝයා නැති කල්හි ඇතුළත් කෙරේ නම් උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

චතුර්ථ සඞ්ඝාදිසෙස යි.



Free Distribution www.aathaapi.org

## 2 . 5

## පඤ්චමසඞ්ඝාදිසෙසො

1\. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **සුන්දරීනන්ද** භික්ඛුනී අභිරූපා හොති දස්සනීයා පාසාදිකා. මනුස්සා භත්තග්ගෙ සුන්දරීනන්දං භික්ඛුනිං පස්සිත්වා අවස්සුතා අවස්සුතාය සුන්දරීනන්දාය භික්ඛුනියා අග්ගමග්ගානි භොජනානි දෙන්ති. සුන්දරීනන්දා භික්ඛුනී යාවදත්ථං භුඤ්ජති, අඤ්ඤා භික්ඛුනියො න චිත්තරූපං ලභන්ති.

2\. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, ''කථං හි නාම අය්‍යා සුන්දරීනන්දා අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං භොජනීයං[1] සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිස්සති භුඤ්ජිස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං භොජනීයං සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති භුඤ්ජතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං භොජනීයං සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිස්සති භුඤ්ජිස්සති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සංඝාදිසෙස''න්ති.**

3\. යා **පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අවස්සුතා** නාම: සාරත්තා අපෙක්ඛවතී පටිබද්ධචිත්තා.

**අවස්සුතො** නාම: සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො.

**පුරිසපුග්ගලො** නාම: මනුස්සපුරිසො න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො **විඤ්ඤූ** පටිබලො සාරජ්ජිතුං.

---

1\. ඛාදනීයං වා භොජනීයං වා - මජසං,

## 2. 5

## පඤ්චම සඞ්ඝාදිශේෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩ වෙසෙති, එසමයෙහි වනාහි සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ විශිෂ්ට රූ ඇත්තී දකුම්කලු වූවා පැහැදුම් එළවන්නී වෙයි, මිනිස්සු බතගෙහි සුන්දරීනන්ද මෙහෙණ දක රාගයෙන් තෙත් වූවාහු රාගයෙන් තෙත්වූ සුන්දරීනන්ද මෙහෙණහට උතුම් උතුම් බොජුන් දෙති. සුන්දරීනන්ද මෙහෙණ තොමෝ රිසියෙන තාක් වළඳයි. අන් මෙහෙණෝ සිත්සේ නො ලබත්.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්‍ය්‍යා සුන්දරීනන්ද තොමෝ රාගයෙන් තෙත් වූවා රාගයෙන් තෙත් වූ පිරිමිනියක්හුගේ අතින් කෑයුත්තක් බීදිය යුත්තක් සියතින් පිළිගෙන කැවා ද වැළඳූ ද" යි ... සැබෑ ද මහණෙනි, සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ රාගයෙන් තෙත් වූවා රාගයෙන් තෙත් වූ පිරිමිනියක්හුගේ අතින් කෑ යුත්තක් බුදිය යුත්තක් සියතින් පිළිගෙන කා ද වළඳා දයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ රාගයෙන් තෙත් වූවා රාගයෙන් තෙත්වූ පිරිමිනියක්හුගේ අතින් කෑ යුත්තක් බීදිය යුත්තක් සියතින් පිළිගෙන කැවා ද වැළඳූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද වනාහි මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තොමෝ රාගයෙන් තෙත්වූවා රාගයෙන් තෙත් වූ පිරිමිනියක්හුගේ අතින් කෑ යුත්තක් හෝ බීදිය යුත්තක් හෝ සියතින් පිළිගෙනැ කා නම් හෝ වළඳා නම් හෝ මේ මෙහෙණ තොමෝත් පළමු (විතුම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ" යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ෂුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**අවස්සුතා** නම්: රාගයෙන් මොනවට රත් වූ (පිරිමිනියක්හු කෙරෙහි) අපෙක්ෂායෙන් යුක්ත වූ පිළිබඳසිත් ඇත්තී යැ.

**අවස්සුත** නම්: රාගයෙන් මොනවට රත්වූ (මාගමක කෙරෙහි) අපෙක්ෂායෙන් යුක්ත වූ පිළිබඳසිත් ඇත්තේ යැ.

**පුරිසපුග්ගල** නම්: මිනිස් පිරිමිනියෙකි, යකෙක් නො වෙයි, ප්‍රෙතයෙක් නො වෙයි, තිරිසන් ගියෙක් නො වෙයි, රාගයෙන් ඇලෙන්නට දනුමැති ප්‍රතිබලයෙකි.

ඛාදනීයං නාම: පඤ්චභොජනානි උදකදන්තපොණං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

භොජනීයං නාම: පඤ්චභොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං, ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති ථුල්ලච්චයස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අයම්පීති: පුරිමායො උපාදය වුච්චති.

පඨමාපත්තිකන්ති: සහවත්ථුජ්ඣාචාරා ආපජ්ජති අසමනුභාසනාය.

නිස්සාරණීයන්ති: සඞ්ඝම්හා නිස්සාරීයති.

සඞ්ඝාදිසෙසොති: -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති. උදකදන්තපොණං පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස.

එකතො අවස්සුතෙ ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති ථුල්ලච්චයස්ස. උදකදන්තපොණං පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස.

උභතො අවස්සුතෙ යක්ඛස්ස වා පෙතස්ස වා පණ්ඩකස්ස වා තිරච්ඡානගතමනුස්සවිග්ගහස්ස වා හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා[1] ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති ථුල්ලච්චයස්ස. උදකදන්තපොණං පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස.

එකතො අවස්සුතෙ ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස. උදකදන්තපොණං පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: උභතො අනවස්සුතා හොන්ති, අනවස්සුතොති ජානන්තී පටිග්ගණ්හාති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

පඤ්චම සඞ්ඝාදිසෙසො

1. ඛාදනීයං වා භොජනීයං වාති - මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ නදිස්සතෙ.

**ඛාදනීය** නම්: පස් බොජුන් ද දිය හා දැහැටු ද හැර සෙස්ස ඛාදනීය නම් වේ.

**භොජනීය** නම්: බත් යැ කොමු යැ අත්සුණු යැ දියමස් යැ ගොඩමස් යැ යන පස් බොජුනි, කන්නෙම් බුදින්නෙම් යි පිළිගනී නම් තුලැසි ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි සඟවෙසෙස් ඇවැත් වේ.

**ආපත්ති**: පළමු මෙහෙණුන් ගෙනැ කියනු ලැබෙයි.

**පයමාපත්තිකං**: වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ පැමිණෙයි, සමනුභාෂණකර්මයෙන් නො වෙයි.

**නිස්සාරණියං**: සඟහු කෙරෙන් නෙරනු ලබයි.

**සඞ්ඝාදිසෙසො**: ... එයිනුදු සඞ්ඝාදිසෙස යැ යි කියනු ලැබෙයි, දිය හා දැහැටු පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

එකක්හු විසින් රාගයෙන් තෙත් වූ කල්හි කන්නෙම් බුදින්නෙම්යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි තුලැසි ඇවැත් වෙයි. පැන් හා දැහැටු පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

දෙදෙනා විසින් රාගයෙන් තෙත් වූ කල්හි යක්ෂයකුගේ හෝ ප්‍රෙතයකුගේ හෝ පණ්ඩකයකුගේ හෝ තිර්යග්ගතමනුෂ්‍ය ශරීරියකුගේ හෝ අතින් කැ යුත්තක් හෝ බිදිය යුත්තක් හෝ කන්නෙම් බුදින්නෙම් යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි, පරගලායෙහි පරගලායෙහි තුලැසි ඇවැත් වෙයි, පැන් හා දැහැටු පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

එකක්හු විසින් රාගයෙන් තෙත් වූ කල්හි කන්නෙම් බුදින්නෙම් යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි, පරගලායෙහි පරගලායෙහි දුකුළා ඇවැත් වෙයි, පැන් හා දැහැටු පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

දෙදෙනා විසින් රාගයෙන් තෙත් නො වූවාහු වෙත් නම්, රාගයෙන් තෙත් නො වූයේ යැ යි දන්නී පිළිගනී නම්, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පඤ්චම සඞ්ඝාදිසෙස යි.**

## 2. 6

# ඡට්ඨසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ තෙන ඛො පන සමයෙන සුන්දරීනන්දා භික්ඛුනී අභිරූපා හොති දස්සනීයා පාසාදිකා, මනුස්සා භත්තග්ගෙ සුන්දරීනන්දං භික්ඛුනිං පස්සිත්වා අවස්සුතා සුන්දරීනන්දාය භික්ඛුනියා අග්ගග්ගානි භොජනානි දෙන්ති. සුන්දරීනන්දා භික්ඛුනී කුක්කුච්චායන්තී න පතිගණ්හාති. අනන්තරිකා භික්ඛුනී සුන්දරීනන්දං භික්ඛුනිං එතදවොච, "කිස්ස ත්වං අය්‍යෙ න පතිගණ්හාසී"ති. අවස්සුතා අය්‍යෙති. ත්වං පනය්‍යෙ අවස්සුතාති නාහං අය්‍යෙ අවස්සුතාති. කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා. ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වාති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම භික්ඛුනී එවං වක්ඛති "කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා, යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජවා"ති, -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී එවං වදෙති, "කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වා"ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී එවං වක්ඛති "කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජවා"ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:



Free Distribution www.aathaapi.org

## 2 . 6

## ෂෂ්ඨ සඞ්ඝාදිශේෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ විශිෂ්ට රූ ඇත්තී දක්මකලු වූවා ප්‍රසාද එළවන්නී වෙයි, මිනිස්හු බතගෙහි සුන්දරීනන්ද මෙහෙණ දැක රාගයෙන් තෙත් වූවාහු සුන්දරීනන්ද මෙහෙණට උතුම් උතුම් බොජුන් දෙති. සුන්දරීනන්ද භික්ෂුණී තොමෝ කුකුසන්නී නො පිළිගනී. අනතුරුවැ හුන් මෙහෙණ සුන්දරීනන්ද මෙහෙණට මෙය කිවු යැ. "ආර්යාවෙනි, කුමක් හෙයින් තෙපි නො පිළිගනිවු ද" යි. ආර්යාවෙනි, රාගයෙන් තෙත් වූයේ යැ, ආර්යාවෙනි, තෙපි වනාහි රාගයෙන් තෙත් වූවහු ද යි. 'ආර්යාවෙනි, මම රාගයෙන් තෙත් නො වූයෙමැ'යි. ආර්යාවෙනි, යම් හෙයෙකින් තෙපි රාග-යෙන් තෙත් නො වූවහු නම් තෙල මිනිස් පිරිමිතියා රාගයෙන් තෙත් වූයේ හෝ තෙත් නො වූයේ හෝ තොපට කුමක් කරන්නේ ද? එබැවින් ආර්යාවෙනි, තෙල මිනිස් පිරිමිතියා කෑ යුතු හෝ බීදිය යුතු හෝ යමක් දේ නම් එය තෙපි සියතින් පිළිගෙන කව හෝ වළඳව හෝ යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මෙහෙණක් තොමෝ ආර්යාවෙනි, යම් හෙයෙකින් තෙපි රාගයෙන් තෙත් නො වූවහු නම් තෙල මිනිස් පිරිමිතියා රාගයෙන් තෙත් වූයේ හෝ තෙත් නො වූයේ හෝ තොපට කුමක් කරන්නේ ද, එබැවින් ආර්යාවෙනි, තෙල මිනිස් පිරිමිතියා කෑ යුතු හෝ බීදිය යුතු හෝ යමක් දේ නම් එය තෙපි සියතින් පිළිගෙන කව හෝ වළඳව හෝ යි මෙසේ කිවුද" යි...සැබෑ ද මහණෙනි, මෙහෙණක් තොමෝ ආර්යාවෙනි, යම් හෙයෙකින් තෙපි රාගයෙන් තෙත් නො වූවහු නම් තෙල මිනිස් පිරිමිතියා රාගයෙන් තෙත් වූයේ හෝ තෙත් නො වූයේ හෝ තොපට කුමක් කරන්නේ ද, එබැවින් ආර්යාවෙනි, තෙල මිනිස් පිරිමිතියා කෑ යුතු හෝ බීදිය යුතු හෝ යමක් දේ නම් එය තෙපි සියතින් පිළිගෙන කව හෝ වළඳව හෝ යි මෙසේ කිවු ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, "මෙහෙණක් තොමෝ ආර්යාවෙනි, යම් හෙයෙකින් තෙපි රාගයෙන් තෙත් නො වූවහු නම් තෙල මිනිස් පිරිමිතියා රාගයෙන් තෙත් වූයේ හෝ තෙත් නො වූයේ හෝ තොපට කුමක් කරන්නේ ද, එබැවින් ආර්යාවෙනි, තෙල මිනිස් පිරිමිතියා කෑ යුතු හෝ බීදිය යුතු හෝ යමක් දේ නම් එය තෙපි සියතින් පිළිගෙන කව හෝ වළඳව හෝ" යි මෙසේ කිවු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණහු මේ සිකපදය උදෙසත්වා.



Free Distribution www.aathaapi.org

**“යා පන භික්ඛුනී එවං වදෙය්‍ය: කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වාති. අයම්පි භික්ඛුනී පඨමාපත්තිකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං”න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**එවං වදෙය්‍යාති:** කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වාති උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස. තස්සා වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ, අජ්ඣොහාරෙ ආපත්ති ථුල්ලච්චයස්ස. භොජනපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**අයම්පීති:** පුරිමායො උපාදාය වුච්චති.

**පඨමාපත්තිකන්ති:** සහවත්ථුජ්ඣාචාරා ආපජ්ජති අසමනුභාසනාය.

**නිස්සාරණීයන්ති:** සඞ්ඝම්හා නිස්සාරීයති.

**සඞ්ඝාදිසෙසොති:** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

උදකදන්තපොණං පටිග්ගණ්හාති උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස. තස්සා වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති' ආපත්ති දුක්කටස්ස.

එකතො අවස්සුතෙ, යක්ඛස්ස වා පෙතස්ස වා පණ්ඩකස්ස වා තිරච්ඡානගතමනුස්සවිග්ගහස්ස වා හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා ඛාද වා භුඤ්ජ වාති උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස. තස්සා වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස. භොජනපරියොසානෙ ආපත්ති ථුල්ලච්චයස්ස. උදකදන්තපොණං පටිග්ගණ්හාති උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස. තස්සා වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස.



Free Distribution www.aathaapi.org

"යම් මෙහෙණක් තොමෝ "ආයසීාවෙනි, යම් හෙයෙකින් තෙපි රාගයෙන් තෙත් නො වූවහු නම් තෙල මිනිස් පිරිමිනියා රාගයෙන් තෙත් වූයේ හෝ තෙත් නො වූයේ හෝ තොපට කුමක් කරන්නේ ද, එබැවින් ආයසීාවෙනි, තෙල මිනිස් පිරිමිනියා කෑ යුතු හෝ බිදිය යුතු හෝ යමක් දේ නම් එය තෙපි සියතින් පිළිගෙන කව හෝ වළඳව හෝ"යි මෙසේ කියා නම්, මේ මෙහෙණ තොමෝත් පළමු (වීතුම් කෙණෙහි මැ) පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ" යයි.

3. යා පන: යම්, යම්බඳු ... භික්ඛුනී ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී වෙයි.

එවං වදෙය්‍ය: ආයසීාවෙනි, යම් හෙයෙකින් තෙපි රාගයෙන් තෙත් නො වූවහු නම් තෙල මිනිස් පිරිමිනියා රාගයෙන් තෙත් වූයේ හෝ තෙත් නො වූයේ හෝ තොපට කුමක් කරන්නේ ද, එබැවින් ආයසීාවෙනි, තෙල මිනිස් පිරිමිනියා කෑයුතු හෝ බිදිය යුතු හෝ යමක් තොපට දේ නම් එය තෙපි සියතින් පිළිගෙන කව හෝ වළඳව හෝ යි නියොග කරා නම් දුකුළා ඇවැත් වෙයි, ඇයගේ වචනයෙන් කන්නෙමි බුදින්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලාශයෙහි පරගලාශයෙහි තුලැයි ඇවැත් වෙයි. බොජුන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

අයම්පි: පළමු මෙහෙණන් ගෙනැ කියනු ලැබෙයි.

පඨමාපත්තිකං: වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ පැමිණෙයි, සමනුභාෂණ කර්මයෙන් නො වෙයි.

නිස්සාරණියං: සඟහු කෙරෙන් නෙරනු ලබයි.

සඞ්ඝාදිසෙසො: ... එයිනුදු සඞ්ඝාදිසෙස ය යි කියනු ලැබෙයි.

පැන් හා දැහැටු පිළිගනුව යි නියොග කරා නම් දුකුළා ඇවැත් වෙයි. ඇයගේ වචනයෙන් කන්නෙමි බුදින්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

එකක්හු විසින් රාගයෙන් තෙත් වූ කල්හි යක්ෂයකුගේ හෝ ප්‍රෙතයකුගේ හෝ පණ්ඩකයකුගේ හෝ තිර්යග්‍යතමනුෂ්‍ය ශරීරියකුගේ හෝ අතින් කෑ යුත්තක් හෝ බිදිය යුත්තක් හෝ කව හෝ වළඳව හෝ යි නියොග කරා නම් දුකුළා ඇවැත් වෙයි. ඇයගේ වචනයෙන් කන්නෙමි බුදින්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලාශයෙහි පරගලාශයෙහි දුකුළා ඇවැත් වෙයි. බොජුන් අවසන්හි තුලැයි ඇවැත් වෙයි. පැන් හා දැහැටු පිළිගනුව යි නියොග කරා නම් දුකුළා ඇවැත් වෙයි. ඇයගේ වචනයෙන් කන්නෙමි බුදින්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

**අනාපත්ති:** අනවස්සුතොති ජානන්ති උය්‍යොජෙති කුපිතා න පතිගණ්හාතීති උය්‍යොජෙති කුලානුද්දයතාය න පතිගණ්හාතීති උය්‍යොජෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසඞ්ඝාදිසෙසො

## 2. 7

## සත්තමසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන චණ්ඩකාළී භික්ඛුනී භික්ඛුනීහි සද්ධිං භණ්ඩිත්වා කුපිතා අනත්තමනා එවං වදෙති බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි[1] සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, ''කථං හි නාම අය්‍යා චණ්ඩකාළී[1] කුපිතා අනත්තමනා එවං වක්ඛති'' බුද්ධං පච්චක්ඛාමි[2] ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා, තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ චණ්ඩකාළී භික්ඛුනී කුපිතා අනත්තමනා එවං වදෙති: බුද්ධං පච්චක්ඛාමි -පෙ- කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ චණ්ඩකාළී භික්ඛුනී කුපිතා අනත්තමනා එවං වක්ඛති බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා, තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

---

1. චණ්ඩකාළී භික්ඛුනී - මජ්ඣ, මජ්ඣ
2. පච්චාචික්ඛාමි - සිඋසු



Free Distribution www.aathaapi.org

රාගයෙන් තෙත් නො වූයේ යැ යි දන්නී නියොග කෙරේ නම්, කිපියා නො පිළිගනී යයි නියොග කෙරේ නම්, කුලය කෙරෙහි අනුකම්පායෙන් නො පිළිගනී යයි නියොග කෙරේ නම්, උම්මත්තිකාවට.... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**ෂෂ්ඨ සඞඝාදිශෙෂ යි.**

## 2. 7

## සප්තම සඞඝාදිශෙෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්හි **ජෙතවන** නම් **අනේපිඬු** සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි **චණ්ඩකාළී භික්ෂුණී** තොමෝ මෙහෙණන් සමඟ ඩබර කොට කිපියා නො සියමන් (සතුටු) වූවා මෙසේ කියයි "බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞඝයා ප්‍රත්‍යාඛ්‍යානය කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම, මෙ මැ ශාක්‍යදුහිතෘ ශ්‍රමණීහු මැ ශ්‍රමණීහු නම් වෙත් ද? ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති. මම ඔවුන්ගේ හමුවෙහි බඹසර වෙසෙමැ"යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලඝු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්‍යා චණ්ඩකාළී කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම, මෙ ශාක්‍යදුහිතෘ ශ්‍රමණීහු මැ ශ්‍රමණීහු නම් වෙත් ද? ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති. මම ඔවුන්ගේ හමුවෙහි බඹසර වෙසෙමැ යි මෙසේ කිවුදැ"යි ... සැබෑද මහණෙනි, චණ්ඩකාළී භික්ෂුණී කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි ... කිම, මෙ ශාක්‍යදුහිතෘ ශ්‍රමණී හු මැ ශ්‍රමණීහු නම් වෙත් ද? ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති. මම ඔවුන්ම හමුයෙහි බඹසර වෙසෙමැයි මෙසේ කියා ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, චණ්ඩකාළී භික්ෂුණී කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි. කිම මෙ ශාක්‍ය දුහිතෘ ශ්‍රමණීහු මැ ශ්‍රමණීහු නම් වෙත් ද? ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති. මම ඔවුන් හමුවෙහි බඹසර වෙසෙ මැ යි මෙසේ කිවු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි, ... මෙසේ ද මහණෙනි, මෙහෙණහු මේ සික‍පදය උදෙසත්වා:



Free Distribution www.aathaapi.org

''යා පන භික්ඛුනී කුපිතා අනත්තමනා එවං වදෙය්‍ය බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති. සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා: ''මාය්‍යෙ කුපිතා අනත්තමනා එවං අවච, බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමී''ති. අභිරමය්‍යෙ ස්වාක්ඛාතො ධම්මො චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති. එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා, තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුනී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙස''න්ති.

3. යා පනාති: යා යාදිසා –පෙ– භික්ඛුනීති –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

කුපිතා අනත්තමනාති: අනභිරද්ධා ආහතචිත්තා ඛිලජාතා.

එවං වදෙය්‍යාති: බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති.

සා භික්ඛුනීති: යා සා එවං වාදිනී භික්ඛුනී.



Free Distribution www.aathaapi.org

"යම් මෙහෙණක් තොමෝ කිපියා නො සතුටු වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි' කිම ශාක්‍ය දුහිතෘ වූ මේ ශ්‍රමණීහු මැ ශ්‍රමණීහු නම් වෙත් ද ? ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති, මම ඔවුන් හමුයෙහි බඹසර වෙසෙමැ යි මෙසේ කියා නම් ඒ මෙහෙණ (අන්) මෙහෙණන් විසින් මෙසේ කිය යුතු වන්නී යැ, "ආය්‍යාවෙනි, කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම ශාක්‍යදුහිතෘ වූ ද? ලජ්ජා ඇති කුකුස් ඇති මේ ශ්‍රමණීහු මැ ශ්‍රමණීහු නම් වෙත් ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති, මම ඔවුන් හමුයෙහි බඹසර වෙසෙමැයි මෙසේ නාහමක් කියන්නැ, ආය්‍යාවෙනි, සිත් අලව, ධර්මය ස්වාඛ්‍යාත යැ මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස බඹසර වස"යි. මෙසේත් ඒ මෙහෙණ (අන්) මෙහෙණන් විසින් කියනු ලබන්නී එසේ මැ දඩි වැ ගනී නම් ඒ මෙහෙණ (අන්) මෙහෙණන් විසින් ඒ දෘෂ්ටිය දුරැලීම පිණිස තුන් යළ තෙක් සමනුභාෂණ කර්ම කළයුත්තී යැ, ඉදින් තුන් යළ තෙක් සමනුභාෂණ කර්ම කරනු ලබන්නී එය දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි, ඉදින් නො දුරැලා නම් මේ මෙහෙණ ද තුන් යළ අවසන්හි පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ" ය යි.

3. යා පන: යම්,යම්බඳු...භික්ඛුනී ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

කුපිතා අනත්තමනා: නො ඇලුණු හැපුණු සිත් ඇත්තී හටගත් (පිළිසු) හුල් ඇත්තී;

එවං වදෙය්‍ය: බුද්දන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යා- ඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාය කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම ශාක්‍යදුහිතෘ වූ මේ ශ්‍රමණීහු මැ ශ්‍රමණීහු නම් වෙත් ද? ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති, මම ඔවුන් හමුයෙහි බඹසර වෙසෙමැ යි.

සා භික්ඛුනී: යමක් මෙසේ කියනු සුලු නම් ඒ මෙහෙණ යැ.



Free Distribution www.aathaapi.org

භික්ඛුනීහීති: අඤ්ඤාහි භික්ඛුනීහි යා පස්සන්ති යා සුණන්ති තාහි වත්තබ්බා: "මාය්‍යෙ කුපිතා අනත්තමනා එවං අවච, බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා, තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමී"ති. අභිරමය්‍යෙ ස්වාක්ඛාතො ධම්මො චර බ්‍රහ්මචරියං සම්මාදුක්ඛස්ස අන්තකිරියායා"ති. දුතියම්පි වත්තබ්බා – තතියම්පි වත්තබ්බා – සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා: "මාය්‍යෙ කුපිතා අනත්තමනා එවං අවච බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා, තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති. අභිරමය්‍යෙ ස්වාක්ඛාතො ධම්මො චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා"ති. දුතියම්පි වත්තබ්බා –පෙ– තතියම්පි වත්තබ්බා –පෙ– සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස, සා භික්ඛුනී සමනුභාසිතබ්බා, එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බා, ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

5. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා භික්ඛුනී කුපිතා අනත්තමනා එවං වදෙති. බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා, තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සංඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, එසා ඤත්ති.

භික්ඛුනීහි: අන් මෙහෙණන් විසින් යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් "ආයඛාවෙනි, කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම ශාක්‍යදුහිතෘ වූ යම් මෙහෙණ කෙනෙක් වෙත් නම් මෙහෙණ මොවුහු මැ ද? හටගත් ලජ්ජා ඇති හටගත් කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ මෙහෙණහු ද වෙති, මම ඔවුන් හමුයෙහි බඹසර කරන්නෙමැ යි මෙසේ නහමක් කියන්නැ, ආයඛා-වෙනි, සිත් අලව, ධර්මය ස්වාඛ්‍යාත යැ. මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස බඹසර කරව''යි කිය යුත්තී යැ, දෙවනවටදු කිය යුත්තී යැ තෙවනවට දු කියයුත්තී යැ, ඉදින් දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි, ඉදින් නො දුරලා නම් දුකුළා ඇවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළා ඇවැත් වෙයි. එ මෙහෙණ සඟමැදට දු ඇද කියැ යුතු යැ. "ආර්යාාවෙනි, කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම ශාක්‍යදුහිතෘ වූ යම් මෙහෙණ කෙනෙක් වෙත් නම් මෙහෙණ මොවුහු මැ ද? හටගත් ලජ්ජා ඇති හටගත් කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ මෙහෙණහු ද වෙති, මම ඔවුන් හමුයෙහි බඹසර කරන්නෙමැ යි මෙසේ නහමක් කියන්නැ, ආයඛාවෙනි, සිත් අලව, ධර්මය ස්වාඛ්‍යාත යැ, මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස බඹසර කරව''යි. දෙවනවට දු කිය යුතු යැ, ... තෙවනවට දු කිය යුත්තී යැ, ... ඉදින් දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලා නම් දුකුළා ඇවැත් වෙයි. එ මෙහෙණ සමනුභාෂණකර්ම කළ යුත්තී යැ, මෙසේ ද වනාහි මහණෙනි, සමනුභාෂණකර්ම කළ යුත්තී යැ, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දන්විය යුත්තේ යි.

5. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මේ මෙනම් ඇති මෙහෙණ කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම ශාක්‍යදුහිතෘ වූ යම් ශ්‍රමණී කෙනෙක් වෙත් නම් ශ්‍රමණීහු මොවුහු ම ද? හටගත් ලජ්ජා ඇති හටගත් කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති, මම ඔවුන් හමුයෙහි බඹසර කරන්නෙමැ යි මෙසේ කියයි. ඕ තොමෝ ඒ වස්තුව නො දුරැලයි. ඉදින් සඟහට පැමිණිකල් ඇත්තේ නම් ඒ වස්තුව සඞ්ඝ තෙමේ දුරැලීම පිණිස මෙ නම් ඇති මෙහෙණහට සමනුභාෂණකර්ම කරන්නේ යැ, මේ ඥප්තිය යි.

6. සුණාතු මෙ අය්‍යො සංඝො, අයං ඉත්ථන්නාමා භික්ඛුනී කුපිතා අනත්තමනා එවං වදෙති. බුද්ධං පච්චක්ඛාමි ධම්මං පච්චක්ඛාමි සඞ්ඝං පච්චක්ඛාමි සික්ඛං පච්චක්ඛාමි කින්නුමාව සමණියො යා සමණියො සක්‍යධීතරො සන්තඤ්ඤාපි සමණියො ලජ්ජිනියො කුක්කුච්චිකා, සික්ඛාකාමා, තාසාහං සන්තිකෙ බ්‍රහ්මචරියං චරිස්සාමීති. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති සංඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුනියා සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨා සංඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, ඛමති සංඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

7. ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තියා ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති.

8. අයම්පීති: පුරිමායො උපාදාය වුච්චති.

යාවතතියකන්ති: යාව තතියං සමනුභාසනාය ආපජ්ජති. න සහවත්ථජ්ඣාචාරා.

නිස්සාරණීයන්ති: සඞ්ඝම්හා නිස්සාරීයති.

සඞ්ඝාදිසෙසොති: -පෙ- තෙනපි වුච්චති සංඝාදිසෙසොති.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසමනුභාසන්තියා, පටිනිස්සජ්ජන්තියා, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසඞ්ඝාදිසෙසො.



Free Distribution www.aathaapi.org

6. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදත් අසාවා, මේ මෙනම් ඇති මෙහෙණ කිපියා නො සියමන් වූවා බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරමි, කිම ශාක්‍යදුහිතෘ වූ යම් ශ්‍රමණී කෙනෙක් වෙත් නම් ශ්‍රමණීහු මෙවුහු ම ද? හටගත් ලජ්ජා ඇති හටගත් කුකුස් ඇති ශික්ෂා කැමැති අන්‍ය වූ ශ්‍රමණීහු ද වෙති. මම ඔවුන්ගේ හමුයෙහි බඹසර කරන්නෙමැ යි මෙසේ කියයි. ඕ තොමෝ ඒ වස්තුව නො දුරලයි, සඞ්ඝ තෙමේ ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් ඇති මෙහෙණට සමනුභාෂණ කර්ම කරයි, ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් ඇති මෙහෙණට සමනුභාෂණ කර්මය යම් ආර්යාවකට රුස්නේ වී නම් ඕ තොමෝ නිහඬ වන්නී යැ, යමකට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ, දෙවනවට දු තෙල කරුණ කියමි ... තෙවනවට දු තෙල කරුණ කියමි ... සඞ්ඝයා විසින් ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් ඇති මෙහෙණ තොමෝ සමනුභාෂණ කර්ම කරන ලද්දී යැ. සඞනට රුස්නේ යැ, එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි යි.

7. ඥප්තියෙන් දුකුළා යැ, දෙකම් වදනින් තුලැයි යැ, කම්වදන් පිරිණතැ සඞවෙසෙස් ඇවැත් වෙයි, සඞවෙසෙසට පැමිණියාට ඥප්තියෙහි දුකුළා ද, දෙකම් වදනෙහි තුලැයි ද සන්හිදෙයි.

8. අයම්පි: පළමු මෙහෙණන් ගෙනැ කියනු ලැබෙයි.

**යාවතතියකං**: තුන් යළ තෙක් සමනුභාෂණයෙන් පැමිණෙයි. වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ නො වේ.

**නිස්සාරණීයං**: සඞහු කෙරෙන් නෙරනු ලබයි.

**සඞ්ඝාදිසෙසො**:...එයිනුදු **සඞ්ඝාදිසෙස** යැ යි කියනු ලැබේ.

ධම්කම්යෙහි ධම්කම්සංඥා ඇත්තී නො දුරලා නම් සඞවෙසෙස් ඇවැත් වෙයි, ධම්කම්යෙහි විමති ඇත්තී නො දුරලා නම් සඞවෙසෙස් ඇවැත් වෙයි, ධම්කම්යෙහි අධර්මකර්මසංඥා ඇත්තී නො දුරලා නම් සඞවෙසෙස් ඇවැත් වෙයි.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි, අධර්මකර්මයෙහි විමති ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වේ.

සමනුභාෂණකර්ම නො කරන්තියට, දුරලන්තියට, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සප්තම සඞ්ඝාදිසේෂ යි.**

## 2. 8

### අට්ඨමසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන චණ්ඩකාළී භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වදෙති: ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියොති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා චණ්ඩකාළී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වක්ඛති "ඡන්දගාමිනියො ච භික්ඛුනියො -පෙ- භයගාමිනියො ච භික්ඛුනියොති -පෙ- සච්චං කිර භික්ඛවෙ චණ්ඩකාළී භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වදෙති: ඡන්දගාමිනියො ච භික්ඛුනියො -පෙ- භයගාමිනියො ච භික්ඛුනියො" ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම භික්ඛවෙ චණ්ඩකාළී භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වක්ඛති: ඡන්දගාමිනියො ච භික්ඛුනියො -පෙ- භයගාමිනියො ච භික්ඛුනියො" ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වදෙය්‍ය: "ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියො"ති' සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා: මාය්‍යෙ කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං අවච, ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියො"ති අය්‍යා ඛො ඡන්දාපි ගච්ඡෙය්‍ය දොසාපි ගච්ඡෙය්‍ය මොහාපි ගච්ඡෙය්‍ය භයාපි ගච්ඡෙය්‍යාති. එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා, තස්ස[1] පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුනී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙසන්ති.**

---

1. තස්ස වත්ථුස්ස - සිමු. ii

# 2. 8

## අෂ්ටම සඞ්ඝාදිශෙෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි චණ්ඩකාළී භික්ෂුණී තොමෝ කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා මෙසේ කියයි, "භික්ෂුණීහු ඡන්‍දයෙනුදු අගතියට ගියාහු යැ. භික්ෂුණීහු දෙවෂයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු මොහයෙනුදු අගතියට ගියාහු යැ භික්ෂුණීහු භයයෙනුදු අගතියට ගියාහු"යැ යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්යා චණ්ඩකාළී තොමෝ කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්‍දයෙනුදු අගතියට ගියාහු යැ, ... භික්ෂුණීහු භයයෙනුදු අගතියට ගියාහු යැ යි මෙසේ කිවු ද? ... සැබැ ද මහණෙනි, චණ්ඩකාළී මෙහෙණ කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන්වූවා භික්ෂුණීහු ඡන්‍දයෙනුදු අගතියට ගියාහු යැ ... භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යැ යි මෙසේ කියා ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, චණ්ඩකාළී මෙහෙණ කිසියම් අධිකරණයෙක්හි පැරැද-ගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්‍දයෙනුදු අගතියට ගියාහු යැ ... භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යැ යි මෙසේ කිවු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යම් මෙහෙණක් කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු දෙවෂයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු මොහයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යැ යි මෙසේ කියා නම් ඒ මෙහෙණ (අන්) මෙහෙණන් විසින් මෙසේ කියයුතු වන්නී යැ, ආර්යාවෙනි, කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු දෙවෂයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු මොහයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යැ යි මෙසේ නහමක් කියන්නැ. ආර්යාව වනාහි ඡන්දයෙනුදු අගතියට යන්නී යැ. දෙවෂයෙනුදු අගතියට යන්නීයැ, මොහයෙනුදු අගතියට යන්නී යැ භයෙනුදු අගතියට යන්නී යැ යි. මෙසේත් ඒ මෙහෙණ මෙහෙණන් විසින් කියනු ලබන්නී එසේ මැ දැඩි වැ ගත්තී නම් ඒ මෙහෙණ මෙහෙණන් විසින් ඒ වස්තුව දුරැලීම පිණිස තුන් යළ තෙක් සමනුභාෂණ කම් කළ යුත්තී යැ, ඉදින් තුන් යළ තෙක් සමනුභාෂණ කම් කරනු ලබන්නී ඒ වස්තුව දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලා නම් මේ මෙහෙණද තුන් යළ අවසන්හි පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියා වේ, ය යි.

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**කිස්මිඤ්චිදෙව අධිකරණෙති:** අධිකරණං නාම චත්තාරි අධිකරණානි: විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං.

**පච්චාකතා** නාම: පරාජිතා වුච්චති.

**කුපිතා අනත්තමනාති:** අනභිරද්ධා ආහතචිත්තා ඛිලජාතා.

**එවං වදෙය්‍යාති:** ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියොති.

**සා භික්ඛුනීති:** යා සා එවං වාදිනී භික්ඛුනී.

**භික්ඛුනීහීති:** අඤ්ඤාහි භික්ඛුනීහි. යා පස්සන්ති යා සුණන්ති තාහි වත්තබ්බා, "මායෙය්‍ය කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං අවච, ඡන්දගාමිනියො ච භික්ඛුනියො –පෙ– භයගාමිනියො ච භික්ඛුනියො"ති. අය්‍යා ඛො ඡන්දාපි ගච්ඡෙය්‍ය දොසාපි ගච්ඡෙය්‍ය මොහාපි ගච්ඡෙය්‍ය භයාපි ගච්ඡෙය්‍යාති: දුතියම්පි වත්තබ්බා – පෙ– තතියම්පි වත්තබ්බා –පෙ– සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා, "මායෙය්‍ය කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං අවච, ඡන්දගාමිනියො ච භික්ඛුනියො –පෙ– භයගාමිනියො ච භික්ඛුනියො" ති. අය්‍යා ඛො ඡන්දාපි ගච්ඡෙය්‍ය –පෙ– භයාපි ගච්ඡෙය්‍යාති. දුතියම්පි වත්තබ්බා –පෙ– තතියම්පි වත්තබ්බා –පෙ– සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං; නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සමනුභාසිතබ්බා. එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බා. ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

"සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වදෙති ඡන්දගාමිනියො ච භික්ඛුනියො –පෙ– භයගාමිනියො ච භික්ඛුනියොති. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සංඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය එසා ඤත්ති.

3. යා පන: යම්, යම්බඳු...භික්ෂුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

කිස්මිඤ්චිදෙව අධිකරණෙ: අධිකරණ නම් විවාදධිකරණ යෑ අනුවාදධිකරණ යෑ ආපත්තාධිකරණ යෑ කිච්චාධිකරණයෑ යි සතර අධිකරණයෙකි.

පච්චාකතා නම්: පැරැදගියා කියනු ලැබේ.

කුපිතා අනත්තමනා: නො ඇලුණු හැපුණුසිත් ඇත්තී හටගත් (පිළිසු) හුල්ඇත්තී,

එවං වදෙය්‍ය: භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යෑ, භික්ෂුණීහු ද්වේෂයෙනුදු අගතියට ගියාහු යෑ, භික්ෂුණීහු මොහයෙනුදු අගතියට ගියාහු යෑ, භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යෑ යි.

සා භික්ඛුනී: යමක් මෙසේ කියන සුලු නම් ඒ මෙහෙණ යෑ;

භික්ඛුනීහි: අන් මෙහෙණන් විසින්: යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් ''ආර්යාවෙනි, කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යෑ... භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යෑ යි මෙසේ නහමක් කියන්නෑ, ආර්යාව වනාහි ඡන්දයෙනුදු අගතියට යන්නී යෑ, ද්වේෂයෙනුදු අගතියට යන්නී යෑ, මොහයෙනුදු අගතියට යන්නී යෑ, භයෙනුදු අගතියට යන්නීයෑ'' යි කිය යුත්තී යෑ. දෙවනවට ද කියයුත්තී යෑ...තෙවනවට ද කියයුත්තී යෑ,.. ඉදින් දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි, ඉදින් නො දුරැලා නම් දුකුළා ඇවැත් වෙයි, අසා නො කියත් නම් දුකුළා ඇවැත් වෙයි. ඒ මෙහෙණ සහමැදට ද ඇද කියයුත්තී යෑ, ''ආර්යාවෙනි, කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යෑ...භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යෑ යි මෙසේ නහමක් කියන්නෑ, ආර්යාව වනාහි ඡන්දයෙනුදු අගතියට යන්නී යෑ...භයෙනුදු අගතියට යන්නීයෑ'යි, දෙවනවට ද කියයුත්තී යෑ...තෙවනවට ද කියයුත්තී යෑ...ඉදින් දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි, ඉදින් නො දුරැලා නම් දුකුළා ඇවැත් වෙයි, ඒ මෙහෙණ සමනුභාෂණ කම් කළයුත්තී යෑ, මෙසේ ද මහණෙනි; සමනුභාෂණ කම් කළයුත්තී යෑ, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දන්විය යුත්තේ යි.

''ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මේ මෙනම් ඇති මෙහෙණ කිසියම් අධිකරණයෙක්හි පැරැදගියා කිපියා නො සියමන් වූවා භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යෑ...භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යෑ යි මෙසේ කියයි, ඕ තොමෝ ඒ වස්තුව නො දුරැලයි, ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ ඒ වස්තුව දුරැලීම පිණිස මෙනම් ඇති මෙහෙණට සමනුභාෂණ කර්ම කරන්නේ යෑ. මේ ඥප්ති යි.



Free Distribution www.aathaapi.org

සුණාතු මෙ අය්‍යෙ සංඝො අයං ඉත්ථන්නාමා භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං වදෙති ඡන්දගාමිනියො ච භික්ඛුනියො -පෙ- භයගාමිනියො ච භික්ඛුනියොති සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති සංඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුනියා සමනුභාසනා, තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සා තුණ්හස්ස යස්සා නක්ඛමති සා භාසෙය්‍ය දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨා සංඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තියා ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති.

**අයම්පීති:** පුරිමායො උපාදය වුච්චති.

**යාවතතියකන්ති:** යාව තතියං සමනුභාසනාය ආපජ්ජති න සහවත්ථජ්ඣාචාරා.

**නිස්සාරණීයන්ති:** සඞ්ඝම්හා නිස්සාරීයති.

සඞ්ඝාදිසෙසොති: -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසමනුභාසන්තියා, පටිනිස්සජ්ජන්තියා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසඞ්ඝාදිසෙසො.



Free Distribution www.aathaapi.org

ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මේ මෙනම් ඇති මෙහෙණ කිසියම් අධිකරණයෙක්හි පැරදගියා කිපියා නො සියමන් වූවා "භික්ෂුණීහු ඡන්දයෙනුදු අගතියට ගියාහු යැ...භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු යැ"යි මෙසේ කියයි, ඕ තොමෝ ඒ වස්තුව නො දුරලයි, සඞ්ඝ තෙමේ ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් ඇති මෙහෙණට සමනුභාෂණ කර්ම කරයි. ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් ඇති මෙහෙණට සමනුභාෂණ කර්මය යම් ආර්යාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වන්නී යැ, යමකට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ, දෙවනවට ද තෙල කරුණ කියමි...තෙවනවට ද තෙල කරුණ කියමි...සඞ්ඝයා විසින් ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් ඇති මෙහෙණ සමනුභාෂණ කර්ම කරන ලද්දී යැ, සඟනට රුස්නේ යැ, එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි යි.

ඥප්තියෙන් දුකුළා යැ, දෙකම් වදනින් තුලැසි යැ, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වෙයි, සඟවෙසෙස් ඇවදියට ඥප්තියෙහි දුකුළා ද දෙකම්වදනෙහි තුලැසි ද සන්හිදෙත්.

අයම්පි: පළමු මෙහෙණන් ගෙනැ කියනු ලැබෙයි.

යාවතතියකං: තුන් යළ තෙක් සමනුභාෂණයෙන් පැමිණෙයි, වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ නො වේ.

නිස්සාරණීයං:...සඟනු කෙරෙන් නෙරනු ලැබෙයි.

සංඝාදිසෙසො:...එයිනුදු සඞ්ඝාදිසෙස යැ යි කියනු ලැබේ.

ධර්ම කර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී නො දුරලා නම් සඟවෙසෙස් ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇත්තී නො දුරලා නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇත්තී නො දුරලා නම් සඟවෙසෙස් ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධම්කම්සංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි, අධම්කම්යෙහි විමති ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි, අධම් කම්යෙහි අධම්කම්සංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වේ.

සමනුභාෂණකම් නො කරන්නියට, දුරලන්නියට, උම්මත්තිකාවට...ආදිකම්මිකාවට ඇවැත් නැති.

**අෂ්ටම සඞ්ඝාදිශෙෂ යි.**



Free Distribution www.aathaapi.org

# 2 . 9

## නවමසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා අන්තෙවාසිකා භික්ඛුනියො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො සංසට්ඨා විහරිස්සන්ති, පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො සංසට්ඨා විහරිස්සන්ති පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකාති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

''භික්ඛුනියො පනෙව සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, තා භික්ඛුනියො භික්ඛුනීහි එවමස්සු වචනීයා, භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සංඝො වණ්ණෙතීති එවඤ්ච තා භික්ඛුනියො භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍යුං, තා භික්ඛුනියො භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාව තතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජෙය්‍යුං ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජෙය්‍යුං ඉමාපි භික්ඛුනියො යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙස''න්ති.



Free Distribution www.aathaapi.org

# 2 . 9

## නවම සඞ්ඝාදිසෙසය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණියගේ අතැවැසි භික්ෂුණීහු (ගෘහකාර්යාදීන්හි) මුසුවූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණසඟනට වෙහෙසන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වෙසෙති.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් භික්ෂුණීහු මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වුසුහුද" යි...සැබෑ ද මහණෙනි, භික්ෂුණීහු මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වෙසෙද්ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි, භික්ෂුණීහු මුසුවූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතු ගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙ-සන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වුසුහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස නො වෙයි...මෙසේ ද මහණෙනි, මෙහෙණහු මේ සිකපදය උදෙසත්වා :

**"භික්ෂුණීහු (මිථ්‍යාජීව ඇතැයි) අකීර්ති ශබ්ද මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු (නොනිසි, කායවචී කර්මයන්) ඇතියාහු මෙහෙණසඟනට වෙහෙසන්නාහු අනන් මනන් වරද වසාලන්නාහු වෙසෙත් නම් ඒ භික්ෂුණීන්ට (අන්) මෙහෙණන් විසින් මෙසේ කියයුතු යැ. "බුහුනෝ මැ මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු වෙසෙති. ආර්යාවෙනි, (මුසුවීමෙන්) වෙන් වවු. බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැ යි. මෙසේත් ඒ භික්ෂුණීහු (අන්) මෙහෙණන් විසින් කියනු ලබන්නාහු එසේ මැ දැඩි වැ ගන්නාහු නම් ඒ භික්ෂුණීන්ට මෙහෙණන් විසින් එය දුරැලීම පිණිස තුන් යළ තෙක් සමනුභාෂණ කර්ම කළයුතු යැ. ඉදින් තුන් යළ තෙක් සමනුභාෂණකර්ම කරනු ලබන්නාහු එය දුරැලන්නාහු නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලන්නාහු නම් මේ මෙහෙණන් තුන් යළ අවසන්හි පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙර නට හෙතු වූ සඟවෙසෙස් ඇවැතට පැමිණියාහු වෙති"යි.**



Free Distribution www.aathaapi.org

3. භික්ඛුනියො පනෙවාති: උපසම්පන්නායො වුච්චන්ති.

**සංසට්ඨා විහරන්තීති,** සංසට්ඨා නාම: අනනුලොමිකෙන කායිකවාචසිකෙන සංසට්ඨා විහරන්ති.

**පාපාචාරාති;** පාපකෙන ආචාරෙන සමන්නාගතා.

**පාපසද්දාති;** පාපකෙන කිත්තිසද්දෙන අබ්භුග්ගතා.

**පාපසිලොකාති:** පාපකෙන මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති.

**භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකාති:** අඤ්ඤමඤ්ඤිස්සා කම්මෙ කයිරමානෙ පටික්කොසන්ති.

**අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකාති:** අඤ්ඤමඤ්ඤිස්සා[2] වජ්ජං පටිච්ඡාදෙන්ති.

4. **තා භික්ඛුනියොති;** යා තා සංසට්ඨා භික්ඛුනියො.

**භික්ඛුනීහීති:** අඤ්ඤාහි භික්ඛුනීහි. යා පස්සන්ති යා සුණන්ති තාහි වත්තබ්බා, භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතීති. දුතියම්පි වත්තබ්බා - තතියම්පි වත්තබ්බා - සචෙ පටිනිස්සජ්ජන්ති ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජන්ති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස. තා භික්ඛුනියො සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා, භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතීති. දුතියම්පි වත්තබ්බා - තතියම්පි වත්තබ්බා - සචෙ නිස්සජ්ජන්ති ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජන්ති ආපත්ති දුක්කටස්ස. තා භික්ඛුනියො සමනුභාසිතබ්බා, එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බා ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො ඉත්ථන්නාමා ච ඉත්ථන්නාමා ච භික්ඛුනියො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා තා තං වත්ථුං නප්පටිනිස්සජ්ජන්ති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛුනියො සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය එසා ඤත්ති.

---

1. ජීවිකං - මජසං
2. අඤ්ඤමඤ්ඤං - මජසං



Free Distribution www.aathaapi.org

3. **භික්ඛුනියො පනෙව:** උපසපන්හු යැ යි කියනු ලැබෙති,

**සංසට්ඨා විහරන්ති:** සංසට්ඨා නම්: පැවිදියනට අනුලොම් නො වන කාවිසිබුහුට්කම්න් මුසු වූවාහු වෙසෙත්.

**පාපාචාරා;** ලාමක ආචාරයෙන් සමන්වාගත වූවාහු.

**පාපසද්දා:** ලාමක කීර්තිශබ්දයෙන් උස්වැ පැනනැංගාහු.

**පාපසිලොකා:** ලාමක මිථ්‍යාජීවයෙන් දිවි වටති.

**භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා:** අනන්මනන් කම් කරන කල්හි ප්‍රතික්ෂෙප කෙරෙති,

**අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා:** අනන් මනන් වරද වසාලත්,

**තා භික්ඛුනියො:** මුසුවූ යම් ඒ මෙහෙණ කෙනෙක්.

**භික්ඛුනීහි:** අන් මෙහෙණන් විසින්; යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් කියයුත්තාහු යැ, "බුහුනෙනි මැ මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු අනන් මනන් වරද වසාලන්නාහු වෙසෙති, ආර්යාවෙනි, (මුසු වීමෙන්) වෙන් වවු, බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ"යැ යි, දෙවන වට දු කියයුත්තාහු යැ...තෙවනවට දු කියයුත්තාහු යැ,...ඉදින් දුරැලත් නම් මෙසේ තෙල දුරැලීම මැනැවි, ඉදින් නො දුරැලත් නම් දුකුළා ඇවැත් වෙයි, අසා නො කියත් නම් දුකුළා ඇවැත් වෙයි, ඒ භික්ෂුණීහු සඟමැදට දු ඇද කියයුත්තාහු යැ," බුහුනෙනි මැ මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වෙසෙති, ආර්යාවෙනි, (මුසු වීමෙන්) වෙන් වවු, බුහුනන්ගේ විවේකය-මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ"යැ යි, දෙවනවට දු කියයුත්තාහු යැ... තෙවනවට දු කියයුත්තාහු යැ, ... ඉදින් දුරැලත් නම් මෙසේ තෙල දුරැලීම මැනැවි, ඉදින් නො දුරැලත් නම් දුකුළා ඇවැත් වෙයි, ඒ භික්ෂුණීහු සමනුභාෂණකර්ම කළයුත්තාහු යැ. මෙසේ ද මහණෙනි, සමනුභාෂණකර්ම කළයුත්තාහු යැ, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දන්විය යුත්තේ යි.

ආයඪාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මෙ නම් ඇති ද මෙ නම් ඇති ද භික්ෂුණීහු මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වෙසෙති. ඔවුහු ඒ වස්තුව නො දුරැලති. ඉදින් සඟනට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ ඒ වස්තුව දුරැලීම පිණිස මෙ නම් ඇති ද මෙ නම් ඇති ද මෙහෙණන්ට සමනුභාෂණකර්ම කරන්නේ යැ. මේ ඥප්ති යැ.

6. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො ඉත්ථන්නාමා ච ඉත්ථන්නාමා ච භික්ඛුනියො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, තා තං වත්ථුං නප්පටිනිස්සජ්ජන්ති සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛුනියො සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය ච ඉත්ථන්නාමාය ච භික්ඛුනීනං සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය, දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨා සඞ්ඝෙන ඉත්ථන්නාමා ච ඉත්ථන්නාමා ච භික්ඛුනියො තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

7. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තීනං ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති, ද්වෙ තිස්සො එකතො සමනුභාසිතබ්බා. තතුත්තරිං න සමනුභාසිතබ්බා.

8. **ඉමාපි භික්ඛුනියොති**: පුරිමායො උපාදාය වුච්චන්ති.

**යාවතතියකන්ති**; යාවතතියං සමනුභාසනාය ආපජ්ජන්ති, න සහවත්ථුජ්ඣාචාරා.

**නිස්සාරණීයන්ති**: සඞ්ඝම්හා නිස්සාරීයති,

**සඞ්ඝාදිසෙසොති**: -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජන්ති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකා නප්පටිනිස්සජ්ජන්ති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජන්ති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසමනුභාසන්තීනං පටිනිස්සජ්ජන්තීනං උම්මත්තිකානං ඛිත්තචිත්තානං, වෙදනට්ටානං, ආදිකම්මිකානන්ති.

නවමසඞ්ඝාදිසෙසො



Free Distribution www.aathaapi.org

6. ආයුෂ්මාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මෙ නම් ඇති ද මෙ නම් ඇති ද භික්ෂුණීහු මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙසන්නාහු අනන්මනන් වරද වසාලන්නාහු වෙසෙති, එවුහු ඒ වස්තුව නො දුරැලති. සඞ්ඝ තෙමේ ඒ වස්තුව දුරැලීම පිණිස මෙ නම් ඇති ද මෙ නම් ඇති ද මෙහෙණන්ට සමනුභාෂණකර්ම කෙරෙයි. ඒ වස්තුව දුරැලීම පිණිස මෙ නම් ඇති ද මෙ නම් ඇති ද මෙහෙණන්ට සමනුභාෂණකර්මය යම් ආයුෂ්මාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වන්නී ය. යමකට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ. දෙවනවට ද තෙල කරුණ කියමි ... තෙවනවට ද තෙල කරුණ කියමි... සඞ්ඝයා විසින් ඒ වස්තුව දුරැලීම පිණිස මෙ නම් ඇති ද මෙ නම් ඇති ද භික්ෂුණීහු සමනුභාෂණකර්ම කරන ලද්හු යැ. සඟනට රුස්නේ යැ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි යි.

7. ඥප්තියෙන් දුකුළා යැ, දෙකම්වදනින් තුලැසි යැ, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වෙයි. සඟවෙසෙස් අවනියට ඥප්තියෙහි දුකුළා ද දෙකම්වදනෙහි තුලැසි ද සන්සිඳෙයි. දෙතුන් දෙනෙක් එකට සමනුභාෂණකර්මකළ යුත්තාහු යැ, ඉන් මත්තෙහි සමනු-භාෂණකර්ම නො කළ යුත්තාහු යි.

8. ඉමාපි භික්ඛුනියො: පළමු මෙහෙණන් ගෙනැ කියනු ලැබෙති.

**යාවතතියකං:** තුන් යළ තෙක් සමනුභාෂණයෙන් පැමිණෙති. වස්තු ව්‍යතික්‍රමණය සමඟ මැ නො වේ.

**නිස්සාරණීයං:** සඟහු කෙරෙන් නෙරනු ලබයි.

**සඞ්ඝාදිසෙසො:** ... එයිනුදු සඞ්ඝාදිසෙස යැ යි කියනු ලැබෙයි.

ධම්කම්යෙහි ධම්කම්සංඥා ඇතියාහු නො දුරැලත් නම් සඟ වෙසෙස් ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියාහු නො දුරැලත් නම් සඟවෙසෙස් ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියාහු නො දුරැලත් නම් සඟවෙසෙස් ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියාහු නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියාහු නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියාහු නම් දුකුළා ඇවැත් වේ.

සමනුභාෂණකර්ම නො කරන්නියට, දුරැලන්නියට, උම්මත්තිකාවට, ක්ෂිප්තචිත්තාවට වෙදනාතීාවට ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නවම සඞ්ඝාදිශෙෂ යි.**



Free Distribution www.aathaapi.org

## 2 . 10

### දසම සඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී සඞ්ඝෙන[1] සමනුභට්ඨා භික්ඛුනියො එවං වදෙති, සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා එවංසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා තා සඞ්ඝො න කිඤ්චි ආහ. තුම්හඤ්ඤෙව[2] සඞ්ඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සා[3] දුබ්බල්‍යා එවමාහ. භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතීති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා සඞ්ඝෙන සමනුභට්ඨා භික්ඛුනියො එවං වක්ඛති ''සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ, මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා -පෙ- විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී''ති. අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං, භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ථුල්ලනන්දා භික්ඛුනී සඞ්ඝෙන සමනුභට්ඨා භික්ඛුනියො එවං වක්ඛති සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා -පෙ- විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී''ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි, සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සඞ්ඝෙන සමනුභට්ඨා භික්ඛුනියො එවං වදෙති ''සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා -පෙ- විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී''ති.

---

1. භික්ඛුනීසඞ්ඝෙන – සීමු
2. තුය්හඤ්ඤෙව – සී। තුම්හෙයෙව – සයා
3. වෙභස්සියා – මජසං

## දශම සඞ්ඝාදිශෙෂය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි චනාහි ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද මෙහෙණන්හට මෙසේ කියයි. ''ආයඝාවෙනි, තෙපි මුසු වූවාහු මැ වාසය කරවූ. තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ. මෙබඳු පැවැතුම් ඇති මෙබඳු කිතුගොස් ඇති මෙබඳු දිවෙල් ඇති මෙහෙණසඟනට වෙහෙසන්නා වූ අනත්මනන් වරද වසාලන්නාවූ අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති. සඞ්ඝ තෙමේ ඔවුනට කිසිවක් නො කියයි. සඞ්ඝ තෙමේ තොපට මැ හෙලා දැකීමෙන් ද අවමන් කිරීමෙන් ද නො ඉවසීමෙන් ද කටමැත දෙඩීමෙන් ද (තොපගේ මැ) දුබල බැවින් ද මෙසේ කියයි. ''බුහුනෝ මැ මුසු වූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණසඟනට වෙහෙසන්නාහු අනත්මනන් වරද වසාලන්නාහු වෙසෙති. ආයඝාවෙනි, වෙන් වවු. බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ''යැ යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයඝී ථුල්ලනන්‍ද තොමෝ සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද මෙහෙණන්ට ''ආයඝාවෙනි, තෙපි මුසු වූවාහු මැ වාසය කරවූ. තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ, මෙබඳු පැවැතුම් ඇති මෙබඳු කිතුගොස් ඇති ... අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති, ආයඝාවෙනි, වෙන් වවු, බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැ යි මෙසේ කිවුද''යි. එකල්හි ඒ භික්ෂුණීහු මහණුන්ට තෙල කරුණ ඇරොවූහු. භික්ෂූහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද මෙහෙණන්ට ආයඝාවෙනි, තෙපි මුසු වූවාහු මැ වාසය කරවූ, තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ, මෙබඳු පැවැතුම් ඇති මෙබඳු කිතුගොස් ඇති ... අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති, ආයඝාවෙනි, වෙන් වවු, බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැ යි මෙසේ කිවු''ද? එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්ට තෙල කරුණ ඇරොවූහු.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා භික්ෂුසඞ්ඝයා රැස්කරවා භික්ෂූන් පිළිවුසූ සේක. සැබෑ ද මහණෙනි, ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද මෙහෙණන්ට ''ආයඝාවෙනි, තෙපි මුසු වූවාහු මැ වාසය කරවූ, තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ. මෙබඳු පැවැතුම් ඇති මෙබඳු කිතුගොස් ඇති ... අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති. ආයඝාවෙනි, වෙන් වවු: බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ''යැ යි මෙසේ කියා ද?



Free Distribution www.aathaapi.org

සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- ''කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සඞ්ඝෙන සමනුභට්ඨා භික්ඛුනියො එවං වක්ඛති සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා -පෙ- විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී''ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

යා පන භික්ඛුනී එවං වදෙය්‍ය ''සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ යන්ති යඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා එවංසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා තා සඞ්ඝො න කිඤ්චි ආහ. තුම්හඤ්ඤෙව සඞ්ඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සා දුබ්බල්‍යා එවමාහ: 'භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනී සඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සංඝො වණ්ණෙතී''ති.

යා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා; '' මාය්‍යෙ එවං අවච සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ, මා තුම්හෙ නානා විහරිත්ථ, සන්ති සංඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා එවංසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා තා සංඝො න කිඤ්චි ආහ, තුම්හඤ්ඤෙව සංඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සා දුබ්බල්‍යා එවමාහ. භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා. විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සංඝො වණ්ණෙතී''ති, එවඤ්ච සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය අයම්පි භික්ඛුනී යාවතතියකං ධම්මං ආපන්නා නිස්සාරණීයං සඞ්ඝාදිසෙස'න්ති.



Free Distribution www.aathaapi.org

සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ සංඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද මෙහෙණන්ට "ආර්යාවෙනි තෙපි මුසුවූවාහු මැ වාසය කරවූ, තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ, මෙබඳු පැවැතුම් ඇති මෙබඳු කිතුගොස් ඇති... අන්‍ය භික්ෂුණීහු ද සංඝයා කෙරෙහි වෙති. ආර්යාවෙනි වෙන් වවූ බුහුනන්ගේ විවේකය මැ සංඝ තෙමේ වර්ණනා කෙරේ යැ''යි මෙසේ කිවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා :

යම් මෙහෙණක් තොමෝ මෙසේ කියා නම් "ආර්යාවෙනි තෙපි මුසුවූවාහු මැ වාසය කරවූ. තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ, මෙබඳු ලමු පැවැතුම් ඇති මෙවැනි ලමු කිතුගොස ඇති මෙබඳු ලමු දිවෙල් ඇති මෙහෙණී සඟනට වෙහෙස කරන්නා වූ අනන්මන වරද වසාලන්නා වූ අන්‍ය භික්ෂුණීහු ද සංඝයා කෙරෙහි වෙති, සඞ්ඝ තෙමේ ඔවුනට කිසිවක් නො කිය යි, සඞ්ඝ තෙමේ තොපට මැ හෙළා දැකීමෙන් ද අවමන් කිරීමෙන් ද නො ඉවසීමෙන් ද කටමැත දෙඩීමෙන් (ධිය බලය පාමින්) ද (තොපගේ මැ) දුබල බැවින් ද මෙසේ කියයි. "බුහුනෝ මැ මුසුවූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙස කරන්නාහු අනන්මන වරද වසාලන්නාහු වෙසෙත්මැ යි. ආර්යාවෙනි වෙන්වවූ, බුහුනන්ගේ විවේකය සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේයැ යි.

ඒ මෙහෙණ (අන්) මෙහෙණන් විසින් මෙසේ කිවයුතු වන්නීයැ. "ආර්යාවෙනි මෙසේ නහමක් කියව, ආර්යාවෙනි තෙපි මුසුවූවාහු ම වාසය කරවූ, තෙපි වෙන් වැ නහමක් වාසය කරවූ, මෙබඳු ලමු පැවතුම් ඇති මෙබඳු ලමු කිතුගොස් ඇති මෙබඳු ලමු දිවෙල් ඇති මෙහෙණසඟනට වෙහෙස කරන්නාවූ අනන්මන වරද වසාලන්නා වූ අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති. සඞ්ඝ තෙමේ ඔවුනට කිසිවක් නො කියයි. සඞ්ඝ තෙමේ තොපට මැ හෙළා දැකීමෙන් ද අවමන් කිරීමෙන් ද නො ඉවසීමෙන් ද කටමැත දෙඩීමෙන් ද (තොපගේ මැ) දුබල බැවින් ද මෙසේ කියයි. බුහුනෝ මැ මුසුවූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙල් ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙස කරන්නාහු අනන්මන වරද වසාලන්නාහු වෙසෙත් මැ යි. ආර්යාවෙනි වෙන් වවූ, බුහුනන්ගේ මැ විවේකය සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැයි. මෙසේත් (අන්) මෙහෙණන් විසින් කියනු ලබන්නා වූ ඒ මෙහෙණ එසේ මැ දැඩි වැ ගන්නී නම් (අන්) මෙහෙණන් විසින් ඒ මෙහෙණ තුන් යළ තෙක් ඒ වස්තුව දුරැලීම පිණිස සමනුභාෂණකර්ම කළයුත්තී යැ. ඉදින් තුන් යළ තෙක් සමනුභාෂණකර්ම කරනු ලබන්නී එය දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලා නම් මේ මෙහෙණ තොමෝ තුන් යළ අවසන්හි පැමිණිය යුතු ඇවැත් ඇති (සඟහු කෙරෙන්) නෙරනට හේතු වූ සඟ වෙසෙස් ඇවැතට පැමිණියා වේ යැයි.



Free Distribution www.aathaapi.org

**යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**එවං වදෙය්‍යා:** සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවං සද්ද එවංසිලොකා, භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, තා සඞ්ඝො න කිඤ්චි ආහ තුම්හඤ්ඤෙව සඞ්ඝො.

**උඤ්ඤායාති:** අවඤ්ඤාය **පරිභවෙනාති:** පරිභව්‍යතාය[1] **අක්ඛන්තියාති:** කොපෙන. **වෙභස්සාති;** විභස්සිකතාය[2]. **දුබ්බල්‍යාති:** අප්පබලතාය[3]. එවමාහ භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්ද පාපසිලොකා භික්ඛුනීසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යෙ විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතීති.

**සා භික්ඛුනීති:** යා සා එවං වාදිනී භික්ඛුනී.

**භික්ඛුනීහීති:** අඤ්ඤාහි භික්ඛුනීහි, යා පස්සන්ති යා සුණන්ති තාහි වත්තබ්බා: "මාය්‍යෙ එවං අවච සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො -පෙ- විවිච්චථය්‍යෙ විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී"ති. දුතියම්පි වත්තබ්බා -පෙ- තතියම්පි වත්තබ්බා -පෙ- සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා මාය්‍යෙ එවං අවච සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො -පෙ- විවිච්චථය්‍යෙ විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතීති. දුතියම්පි වත්තබ්බා -පෙ- තතියම්පි වත්තබ්බා -පෙ- සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සමනුභාසිතබ්බා එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බා ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

---

1. පාරිභබ්‍යතා - මජ්සං
2. විභස්සීකතා - මජ්සං
3. අප්පබලතා - මජ්සං



Free Distribution www.aathaapi.org

3. **යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී ...,** මෝසොමෝ මෙ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**එවං වදෙය්‍ය:** ආයමාවෙනි තෙපි මුසුවූවාහු මැ වාසය කරවු, තෙපි නහමක් වෙන් වැ වාසය කරවු, මෙබඳු ලමු පැවැතුම් ඇති මෙබඳු ලමු කිතුගොස් ඇති මෙබඳු ලමු දිවෙල් ඇති මෙමෙහෙණ සඟනට වෙහෙස කරන්නා වූ අනත්මන වරද වසාලන්නා වූ අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති. සඞ්ඝ තෙමේ ඔවුනට කිසිවක් නො කියයි සඞ්ඝ තෙමේ තොපට මැ (කියයි).

**උඤ්ඤාය:** අවඥායෙන්; **පරිභවෙන:** පිරිබැව් බැවින්; **අක්ඛන්තියා:** කෝපයෙන්; **වෙභස්සා:** බලය පවසන සටමැන දෙඩීමෙන්; **දුබ්බල්‍යා:** අපක්ෂතායෙන්; මෙසේ කියයි. බුහුනෝ මැ මුසුවූවාහු ලමු පැවතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙලි ඇතියාහු මෙමෙහෙණ සඟනට වෙහෙස කරන්නාහු අනත්මන වරද වසාලන්නාහු වෙසෙත් මැ යි. ආයමාවෙනි වෙන්වවු, බුහුනන්ගේ මැ විවේකය සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැ යි.

**සා භික්ඛුනී:** යමක් මෙසේ කියනසුලු නම් ඒ මෙහෙණ යි.

**භික්ඛුනීහි:** අන් මෙහෙණන් විසින්; යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම්, ඔවුන් විසින් කිය යුත්තී යැ, ආයමාවෙනි, මෙසේ නහමක් කියව, ආයමාවෙනි, තෙපි මුසුවූවාහු මැ වාසය කරවු, තෙපි වෙන් වැ නහමක් වාසය කරවු, සඞ්ඝයා කෙරෙහි අන්‍ය භික්ෂුණීහු ද වෙති ... ආයමාවෙනි වෙන් වවු, බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැ යි. දෙවනවටදු කිය යුත්තී යැ, තෙවනවටදු කිය යුත්තී යැ. ඉදින් දුරලා නම් මෙසේ තෙල දුරලීම මැනැවි. ඉදින් නො දුරලා නම් දුකුළා ඇවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළා ඇවැත් වෙයි. ඒ මෙහෙණ තොමෝ සඟමැදට ද ඇදපියා කිය යුත්තී යැ ආයමාවෙනි, මෙසේ නහමක් කියව, "ආයමාවෙනි, තෙපි මුසුවූවාහු මැ වාසය කරවු, තෙපි නාමක් වෙන් වැ වාසය කරවු. සඞ්ඝයා කෙරෙහි අන්‍ය භික්ෂුණීහු ද වෙති ... ආයමාවෙනි, වෙන්වවු, බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ යැ යි, දෙවනවට ද කිය යුත්තීයැ... තෙවනවටදු කිය යුත්තී යැ. ඉදින් දුරලා නම් මෙසේ තෙල දුරලීම මැනැවි, ඉදින් නො දුරලා නම් දුකුළා ඇවැත් වෙයි. ඒ මෙහෙණ තොමෝ සමනුභාෂණකර්ම කළ යුත්තී යැ. මෙසේ ද වනාහි මහණෙනි ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දන්විය යුත්තේ යි.



Free Distribution www.aathaapi.org

5. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා භික්ඛුනී සඞ්ඝෙන සමනුභට්ඨා භික්ඛුනියො එවං වදෙති: සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා එවංසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා තා සඞ්ඝො න කිඤ්චි ආහ. තුම්හඤ්ඤෙව සඞ්ඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සා දුබ්බල්‍යා එවමාහ: "භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා, විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී"ති. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය එසා ඤත්ති.

6. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමා භික්ඛුනී සංඝෙන සමනුභට්ඨා භික්ඛුනියො එවං වදෙති: සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ මා තුම්හෙ නානා විහරිත්ථ සන්ති සඞ්ඝෙ අඤ්ඤාපි භික්ඛුනියො එවාචාරා එවංසද්දා එවංසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා තා සඞ්ඝො න කිඤ්චි ආහ. තුම්හඤ්ඤෙව සඞ්ඝො උඤ්ඤාය පරිභවෙන අක්ඛන්තියා වෙභස්සා දුබ්බල්‍යා එවමාහ: "භගිනියො ඛො සංසට්ඨා විහරන්ති පාපාචාරා පාපසද්දා පාපසිලොකා භික්ඛුනිසඞ්ඝස්ස විහෙසිකා අඤ්ඤමඤ්ඤිස්සා වජ්ජපටිච්ඡාදිකා විවිච්චථය්‍යො විවෙකඤ්ඤෙව භගිනීනං සඞ්ඝො වණ්ණෙතී"ති. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුනියා සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, සා තුණ්හස්ස යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨා සඞ්ඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

7. ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස සංඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තියා ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති.



Free Distribution www.aathaapi.org

5. ආයුෂ්මාවෙනි සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙ නම් ඇති මෙහෙණ තොමෝ සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද්දී මෙහෙණක් හට මෙසේ කියයි. ''ආයුෂ්මාවෙනි තෙපි මුසුවූවාහු මැ වාසය කරවු, තෙපි නහමක් වෙන් වැ වාසය කරවු, මෙබඳු ලමු පැවැතුම් ඇති මෙබඳු ලමු කිතුගොස් ඇති මෙබඳු ලමු දිවෙලි ඇති මෙහෙණ සඟනට වෙගෙස කරන්නා වූ අනන්මන වරද වසා ලන්නා වූ අන්‍ය භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති, සඞ්ඝ තෙමේ ඔවුනට කිසිවක් නො කියයි, සඞ්ඝ තෙමේ තොපට මැ හෙළා දැකීමෙන් ද අවමන් කිරීමෙන් ද නො ඉවසීමෙන් ද කටමැත දෙඩීමෙන්ද (තොපගේ මැ) දුබල බැවින් ද මෙසේ කියයි, ''බුහුනෝ මැ මුසුවූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙලි ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙස කරන්නාහු අනන්මන වරද වසාලන්නාහු වෙසෙත් මැයි. බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ''යැ යි. ඕ තොමෝ ඒ වස්තුව නො දුරැල යි, ඉදින් සඞ්ඝයා හට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මෙහෙණහට ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සමනුභාෂණකර්ම කරන්නේ යැ. මේ ඥප්තිය යි.

6. ආයුෂ්මාවෙනි සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මෙ නම් ඇති මෙහෙණ තොමෝ සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද්දී මෙහෙණක් හට මෙසේ කියයි, ''ආයුෂ්මාවෙනි තෙපි මුසුවූවාහු මැ වාසය කරවු. තෙපි නහමක් වෙන් වැ වාසය කරවු. මෙබඳු ලමු පැවැතුම් ඇති මෙබඳු ලමු කිතුගොස් ඇති මෙබඳු ලමු දිවෙලි ඇති මෙහෙණ සඟනට වෙහෙස කරන්නා වූ අනන්මන වරද වසාලන්නා වූ අන්‍ය වූ භික්ෂුණීහු ද සඞ්ඝයා කෙරෙහි වෙති, සඞ්ඝ තෙමේ ඔවුනට කිසිවක් නො කියයි, සඞ්ඝ තෙමේ තොපට මැ හෙළා දැකීමෙන් ද අවමන් කිරීමෙන් ද නො ඉවසීමෙන් ද කටමැත දෙඩීමෙන් ද (තොපගේ මැ) දුබල බැවින් ද මෙසේ කියයි. ''බුහුනෝ මැ මුසුවූවාහු ලමු පැවැතුම් ඇතියාහු ලමු කිතුගොස් ඇතියාහු ලමු දිවෙලි ඇතියාහු මෙහෙණ සඟනට වෙහෙස කරන්නාහු අනන්මන වරද වසාලන්නාහු වෙසෙති මැයි. ආයුෂ්මාවෙනි, වෙන් වවු, බුහුනන්ගේ විවේකය මැ සඞ්ඝ තෙමේ වර්ණනා කෙරේ''යැ යි. ඕ තොමෝ ඒ වස්තුව නො දුරැලයි, සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මෙහෙණ හට ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සමනුභාෂණකම් කෙරෙයි, යම් ආයුෂ්මාවකට මෙ නම් ඇති මෙහෙණහට ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සමනුභාෂණය රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වන්නී යැ. යමක්හට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ. දෙවනවට දු තෙල කරුණ කියමි... තෙවනවට දු තෙල කරුණ කියමි... මෙ නම් ඇති මෙහෙණ තොමෝ ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සඞ්ඝයා විසින් සමනුභාෂණකර්ම කරන ලද්දී යැ. සඞ්ඝයාහට රුස්නේ යැ, එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරම් යි.

7. ඥප්තියෙන් දුකුළා යැ, දෙකම්වදනින් තුලැසි යැ. කම්වදන් පිරියතැ, සඟවෙසෙස් ඇවැත් වෙයි, සඟවෙසෙස් ඇත්තිය හට ඥප්තියෙහි දුකුළා ද දෙකම්වදනෙහි තුලැසිහු ද සන්සිඳෙත්.

8. **අයම්පීති:** පුරිමායො උපාදාය වුච්චති.

**යාවතතියකන්ති:** යාවතතියං සමනුභාසනාය ආපජ්ජති න සහවත්ථුජ්ඣාචාරා.

**නිස්සාරණීයන්ති:** සඞ්ඝම්හා නිස්සාරීයති.

**සඞ්ඝාදිසෙසොති:** සඞ්ඝොව තස්සා ආපත්තියා මානත්තං දෙති මූලාය පටිකස්සති අබ්භෙති න සම්බහුලා න එකා භික්ඛුනී, තෙන වුච්චති සඞ්ඝාදිසෙසොති. තස්සෙව ආපත්තිනිකායස්ස නාමකම්මං අධිවචනං තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසමනුභාසන්තියා, පටිනිස්සජ්ජන්තියා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දසමසඞ්ඝාදිසෙසං.**

9. උද්දිට්ඨා ඛො අය්‍යායො සත්තරසසඞ්ඝාදිසෙසා ධම්මා නව පඨමාපත්තිකා අට්ඨ යාවතතියකා, යෙසං භික්ඛුනී අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජති තාය[1] භික්ඛුනියා උභතොසඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං. චිණ්ණමානත්තා භික්ඛුනී[2] යත්ථ සියා වීසතිගණො භික්ඛුනීසඞ්ඝො තත්ථ සා භික්ඛුනී අබ්භෙතබ්බා. එකායපි චෙ ඌනො වීසතිගණො භික්ඛුනීසඞ්ඝො තං භික්ඛුනිං අබ්භෙය්‍ය සා ච භික්ඛුනී අනබ්භිතා තා ච භික්ඛුනියො ගාරය්හා අයං තත්ථ සාමීචි. තත්ථාය්‍යායො පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථාය්‍යායො, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

තස්සුද්දානං

උස්සයං චොරී ගාමන්තං උක්ඛිත්තං බාධනෙන ච
කිං කොධනා කුපිතා නිස්සට්ඨා සංසට්ඨා අඤ්ඤාය තෙ දසාති[3].

**සත්තරසකං නිට්ඨිතං**

1. තා, සී· මජ්ඣ
2. චිණ්ණමානත්තාය භික්ඛුනියා, සී· මජ්ඣ· ස්‍යා
3. සංසට්ඨා අඤ්ඤාය තෙ දසාති - සී· මජ්ඣ



Free Distribution www.aathaapi.org

8. **අයමපි:** පළමු මෙහෙණන් ගෙන කියනු ලැබේ යි.

**යාවතතියකං:** තුන් යළ තෙක් සමනුභාෂණකර්මයෙන් ඇවැදී. වස්තුව්‍යතික්‍රමණය සමඟ මැ නො වේ.

**නිස්සාරණීයං:** සඞ්ඝයා කෙරෙන් නෙරනු ලබ යි.

**සඞ්ඝාදිසෙසො:** සඞ්ඝ තෙමේ මැ ඒ ඇවැතට මානත දෙයි, මුලට අදියි, අබ්භාන කර්ම් කෙරෙයි, ගණයා නො වේ යි, එක් මෙහෙණක් නො වේ. එහෙයින් **සඞ්ඝාදිසෙස** යැයි කියනු ලැබේ යි, ඒ ආපත්ති සමූහයට මැ නාම කර්ම් යැ, අධිවචන යි. එයිනුදු **සඞ්ඝාදිසෙස** යැයි කියනු ලැබේ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී නො දුරලා නම් සඟාවශෙෂ ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇත්තී නො දුරලා නම් සඟාවශෙෂ ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇත්තී නො දුරලා නම් සඟාවශෙෂ ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වේ.

සමනුභාෂණකර්ම නො කරන්නියට, දුරලන්නියට උම්මත්තිකාව හට... ආදිකර්මිකාවහට ඇවැත් නැති.

**දශම සඞ්ඝාදිශේෂය නිමි.**

9. ආයුෂ්මාවෙනි, ප්‍රථමාපත්තික නව දෙනෙක් ද යාවතතියක අට දෙනෙක් දැයි සතළොස් සඟාවශෙෂ ධර්මහු උදෙසන ලදහු මැ යි. යම් සඟාවශෙෂයුන් අතුරෙහි මෙහෙණ තොමෝ එක්තරා එක්තරා ඇවතකට හෝ අවදී ද, ඒ මෙහෙණ විසින් දෙ සඟුන් කෙරෙහි පක්ෂමානතෙහි හැසිරිය යුතු යි. හසළ මානත ඇති මෙහෙණ තොමෝ යම් තැනෙකැ විංශතිගණයා ඇති භික්ෂුණීසඞ්ඝ තෙමේ වන්නේ ද ඒ මෙහෙණ තොමෝ අබ්භාන කළ යුත්තීය. එක්නමකගෙනුදු උනු වූ විංශති ගණයා ඇති භික්ෂුණීසඞ්ඝ තෙමේ ඒ මෙහෙණ අබ්භාන කරන්නේ නම් ඒ මෙහෙණ තොමෝත් අබ්භාන නො කරන ලදුවා මැ වෙයි. ඒ භික්ෂුණීහු ද ගැරහිය යුත්තාහු යැ. මේ එහි ලා (පිළිපැදිය යුතු) සාමීචිය යි. එහි ලා ආයුෂ්මාවන් පිළිවිසමි, කිම පිරිසුදුවහු ද? දෙවන වට දු පිළිවිසමි, කිම පිරිසුදුවහු ද? තෙවනවට දු පිළිවිසමි, කිම: පිරිසුදු- වහු ද? ආයුෂ්මාවෝ මෙහි ලා පිරිසුදු හ, එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි යි.

**ඔවුන්ගේ උද්දානය:**

උස්සය (වාදිකා) යැ චොරී යැ ගාමන්තර යැ ඛාදනාය සමඟ උක්ඛිත්තා යැ 'කිං තෙ' යැ කුපිතා යැ කිසම්සැව් යැ සංසට්ඨා යැ උභෝසඳා යැ යි ඒ සිකපද දශයෙකි.

**ශප්ත දශකය නිමියේ ය.**

# නිස්සග්ගියා

## 3. 1

### පඨම සික්ඛාපදං

ඉමෙ ඛො පනය්‍යායො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා උද්දෙසං **ආගච්ඡන්ති**.

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො බහූ පත්තෙ සන්නිචයං කරොන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම භික්ඛුනියො බහූ පත්තෙ සන්නිචයං කරිස්සන්ති පත්තවාණිජ්ජං[1] වා භික්ඛුනියො කරිස්සන්ති ආමත්තිකාපණං වා පසාරෙස්සන්ති" ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො පත්තසන්නිචයං කරිස්සන්ති"ති -පෙ- "සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො පත්තසන්නිචයං කරොන්ති"ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො පත්තසන්නිචයං කරිස්සන්ති." නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී පත්තසන්නිචයං කරෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියන්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පත්තො** නාම: ද්වෙ පත්තා අයොපත්තො මත්තිකාපත්තො. තයො පත්තස්ස වණ්ණා උක්කට්ඨො පත්තො මජ්ඣිමො පත්තො ඔමකො පත්තො. උක්කට්ඨො නාම පත්තො: අඩ්ඪාළ්හකොදනං ගණ්හාති චතුභාගං ඛාදනං තදුපියඤ්ච[2] ව්‍යඤ්ජනං. මජ්ඣිමො නාම පත්තො: නාළිකොදනං ගණ්හාති චතුභාගං ඛාදනං තදුපියඤ්ච ව්‍යඤ්ජනං. ඔමකො නාම පත්තො: පත්ථොදනං ගණ්හාති චතුභාගං ඛාදනං තදුපියඤ්ච ව්‍යඤ්ජනං. තතො උක්කට්ඨො අපත්තො ඔමකො අපත්තො.

---

1 පත්තවාණිජ්ජං - සීමු ii

2. තදුපියං - මජසං

# නිසග්ගිපාචිත්ති

## 3. 1

## පළමු සික‍පදය

ආයෂ්මාවෙනි මේ තිස් නිසග්ගි පචිත්ති ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1\. එසමයෙහි භාග්‍යවත් බුදුහු **සැවැතැ ජේතවන** නම් **අනේපිඩු** සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මෙහෙණෝ බොහෝ පාත්‍ර රැස් කෙරෙති. මිනිස්සු විහාරචාරිකාවෙහි හැසිරෙන්-නාහු දැක ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් භික්ෂුණීහු බොහෝ පාත්‍ර රැස් කොළෝ ද, භික්ෂුණීහු පාත්‍ර වෙළඳාමක් හෝ කොළෝ ද, බඳුන්වෙළඳ හලක් හෝ විවෘත කොළෝ"දැ යි.

2\. **භික්ෂුණීහු** ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු මැයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිනති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් සවග මෙහෙණෝ පාත්‍ර රැස් කොළෝ"දැයි ... "සැබෑ ද මහණෙනි සවග මෙහෙණෝ පාත්‍ර රැස්-කෙරෙද්දැ"යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... "කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ පාත්‍ර රැස් කොළෝද්දැ"යි. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි .. මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සික‍පදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ පාත්‍ර රැස් කෙරේ නම් නිසග්ගි පචිත්ති වේ යයි.**

3\. **යා පනා:** යම් යම්බඳු.... **භික්ඛුනී**..... මෝතොමෝ මේ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**පත්ත නම්:** යමුවාපය මැටිමුවාපයැයි දෙ පාත්‍රයෙකි. උත්කෘෂ්ට පාත්‍ර යැ මධ්‍යම පාත්‍ර යැ ඔමක පාත්‍ර යැයි පාත්‍රය පිළිබඳ ප්‍රමාණ තුනෙකි. උත්කෘෂ්ට පාත්‍රය නම් මගද නැළියෙන් දෙ නැළියක බත් ද ඉන් සිවු වැනි කොටසක් පමණ වූ මුද්ග සූපය ද එයට සරිලන ව්‍යඤ්ජනය ද ගන්නේ වෙයි. මධ්‍යම පාත්‍රය නම් නැළියක බත් ද ඉන් සිවුවැනි කොටසක් පමණ වූ මුද්ගසූපය ද එයට සරිලන ව්‍යඤ්ජනය ද ගන්නේ වෙයි. ඔමක පාත්‍රය නම් අඩ නැළියක බත් ද ඉන් සිවුවැනි කොටසක් පමණ වූ මුද්ගසූපය ද එයට සරිලන ව්‍යඤ්ජනය ද ගන්නේ වෙයි. ඒ උත්කෘෂ්ට පාත්‍රයෙන් උත්කෘෂ්ට වූයේ අපාත්‍රය වෙයි. (ඒ ඔමක පාත්‍රයෙන්) ඔමක වූයේ අපාත්‍රය වේ.



Free Distribution www.aathaapi.org

**සන්නිචයං කරෙය්‍යාති**: අනධිට්ඨිතො අවිකප්පිතො.

**නිස්සග්ගියො හොතීති**: සහ අරුණුග්ගමනා නිස්සග්ගියො හොති. නිස්සජ්ජිතබ්බො සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බො. තාය භික්ඛුනියා සඞ්ඝං උපසංකමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො. "අයං මෙ අය්‍යෙ පත්තො රත්තාතික්කන්තො නිස්සග්ගියො, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨපත්තො දාතබ්බො.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං පත්තො ඉත්ථන්නාමාය භික්ඛුනියා නිස්සග්ගියො සඞ්ඝස්ස නිස්සට්ඨො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සංඝො ඉමං පත්තං ඉත්ථන්නාමාය භික්ඛුනියා දදෙය්‍යාති.

තාය භික්ඛුනියා සම්බහුලා භික්ඛුනියො උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයා "අයං මෙ අය්‍යායො පත්තො රත්තාතික්කන්තො නිස්සග්ගියො ඉමාහං අය්‍යානං නිස්සජ්ජාමී"ති නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය ආපත්ති පටිග්ගහෙතබ්බා නිස්සට්ඨපත්තො දාතබ්බො.

සුණාතු මෙ අය්‍යායො අයං පත්තො ඉත්ථන්නාමාය භික්ඛුනියා නිස්සග්ගියො අය්‍යානං නිස්සට්ඨො යදි අය්‍යානං පත්තකල්ලං අය්‍යායො ඉමං පත්තං ඉත්ථන්නාමාය භික්ඛුනියා දදෙය්‍යුන්ති.

තාය භික්ඛුනියා එකං භික්ඛුනිං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයා: "අයං මෙ අය්‍යෙ පත්තො රත්තාතික්කන්තො නිස්සග්ගියො, ඉමාහං අය්‍යාය නිස්සජ්ජාමී"ති නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. තාය භික්ඛුනියා ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨපත්තො දාතබ්බො ඉමං පත්තං අය්‍යාය දම්මීති.



Free Distribution www.aathaapi.org

**සන්නිචයං කරෙය්‍ය:** නො ඉටූ නො විකැපූ පය යි.

**නිස්සග්ගියං හොති:** අරුණ නැගීම සමඟ නිසැගි වෙයි. සඞ්ඝයාට හෝ ගණයාට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේද වනාහී මහණෙනි, නිසැජිය යුතුයි. ඒ මෙහෙණ විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟසිවුර එකස් කොට වැඩිමහලු මෙහෙණන්ගේ පා වැඳ උත්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ "ආර්යාවෙනි, මාගේ මේ පාත්‍රය රැයක් ඉක්ම ගියේ නිසැගි විය. මම මෙය සඞ්ඝයාට නිසජමි"යි මෙසේ කිය යුතු වන්නේ යැ. නිසැජි ඇවැත් දෙසිය යුතුයි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් ඇවැත් පිළිගත යුතුයි. නිසැජු පය දිය යුතුයි.

ආර්යාවෙනි, සඞ්ඝතෙමේ මවදන් අසාවා. මෙනම් ඇති මෙහෙණගේ මේ පාත්‍රය තෙමේ නිසැගි වූයේ සඞ්ඝයාට නිසදන ලද්දේ යැ. ඉදින් සඟනට පැමිණි කල් ඇත්තේ නම් මේ පාත්‍රය සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මෙහෙණහට දෙන්නේ යැයි.

ඒ මෙහෙණ විසින් බොහෝ මෙහෙණන් වෙත එළඹ උතුරුසඟසිවුර එකස් කොට වැඩිමහලු මෙහෙණන්ගේ පා වැඳ උත්කුටුකයෙන් හිඳ, "ආර්යාවෙනි, මාගේ මේ පාත්‍රය රැයක් ඉක්මගියේ නිසගි විය. මම මෙය ආර්යාවනට නිසජමි"යි මෙසේ කියයුතු වන්නාහ. නිසැජි ඇවැත් දෙසිය යුතුයි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් ඇවැත් පිළිගත යුතුයි. නිසැජු පය දිය යුතුයි.

ආර්යාවෝ, මා විදන් අසත්වා. මේ නම් ඇති මෙහෙණගේ මේ පාත්‍රය තෙමේ නිසැගි වූයේ ආර්යාවනට නිසදන ලද්දේ යැ. ඉදින් ආර්යාවනට පැමිණි කල් ඇත්තේ නම් ආර්යාවෝ මේ පාත්‍රය මේ නම් ඇති මෙහෙණහට දෙන්නාහු නම් මැනැවැ යි.

ඒ මෙහෙණ විසින් එක් මෙහෙණක වෙත එළඹ උතුරුසඟසිවුර එකස් කොට උත්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ "ආර්යාවෙනි, මාගේ මේ පාත්‍රය තෙමේ රැයක් ඉක්මගියේ නිසැගි විය. මම මෙය ආර්යාවහට නිසජමි"යි මෙසේ කියයුතු වන්නී යැ. නිසැජි ඇවැත් දෙසිය යුතුයි. ඒ මෙහෙණ විසින් ඇවැත් පිළිගත යුතුයි. මේ පාත්‍රය ආර්යාවහට දෙමියි නිසැජු පය දිය යුතුයි.



Free Distribution www.aathaapi.org

රත්තාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං. රත්තාතික්කන්තෙ වෙමතිකා නිස්සග්ගියං පාචිත්තියං. රත්තාතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං. අනධිට්ඨිතෙ අධිට්ඨිතසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං. අවිකප්පිතෙ විකප්පිතසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං. අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං. අනට්ඨෙ නට්ඨසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං. අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤා -පෙ- අභින්නෙ භින්නසඤ්ඤා -පෙ- අවිලුත්තෙ විලුත්තසඤ්ඤා නිස්සග්ගියං පාචිත්තියං.

නිස්සග්ගියං පත්තං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස. රත්තානතික්කන්තෙ අතික්කන්තසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. රත්තානතික්කන්තෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. රත්තානතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** අන්තො අරුණං[1] අධිට්ඨෙති විකප්පෙති විස්සජ්ජෙති නස්සති විනස්සති භිජ්ජති අච්ඡින්දිත්වා ගණ්හන්ති විස්සාසං ගණ්හන්ති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො නිස්සට්ඨපත්තං න දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ නිස්සට්ඨපත්තො න දාතබ්බො යා න දදෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

**පඨමසික්ඛාපදං.**

## 3 . 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො ගාමකාවාසෙ වස්සං වුත්ථා[2] සාවත්ථිං අගමංසු වත්තසම්පන්නා ඉරියාපථසම්පන්නා දුච්චොළා ලූඛචීවරා. උපාසකා තා භික්ඛුනියො පස්සිත්වා ඉමා භික්ඛුනියො වත්තසම්පන්නා ඉරියාපථසම්පන්නා දුච්චොළා ලූඛචීවරා, ඉමා භික්ඛුනියො අච්ඡින්නා භවිස්සන්තීති භික්ඛුනිසඞ්ඝස්ස අකාලචීවරං අදංසු. ථුල්ලනන්දා භික්ඛුනී අම්හාකං කඨිනං අත්ථතං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙසි. උපාසකා තා භික්ඛුනියො පස්සිත්වා එතදවොචුං. අපය්‍යාහි චීවරං ලද්ධන්ති. න මයං ආවුසො චීවරං ලභාම අය්‍යා ථුල්ලනන්දා[3] අම්හාකං කඨිනං අත්ථතං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙසීති. උපාසකා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙස්සතී"ති.

---

1. අන්තො අරුණෙ - මජ්සං
2. වස්සංවුට්ඨා - මජ්සං
3. අය්‍යා චුල්ලනන්ද භික්ඛුනී - සිමු i.



Free Distribution www.aathaapi.org

රැය ඉක්ම ගිය කල්හි ඉක්ම ගිය සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. රැය ඉක්ම ගිය කල්හි විමති ඇතියා නම් නිසැඟි පචිති වෙයි. රැය ඉක්ම ගිය කල්හි නො ඉක්ම ගිය සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. නො ඉවූ කල්හි ඉවූ සන් ඇතියා නාම් නිසැඟි පචිති වෙයි. නො විකැපූ කල්හි විකැපූ සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. නො හළ කල්හි හළ සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. නො නට කල්හි නට සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. නො නැසුණු කල්හි නැසුණු සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. නො බුන් කල්හි බුන් සන් ඇතියා නම් නිසැඟි පචිති වෙයි. නො පැහැරැ ගත් කල්හි පැහැරැ ගත් සන් ඇතියා නම් නිසැඟි පචිති වේ.

නිසැඟි පය නො නිසැජැ වළඳා නම් දුකුළා ඇවැත් වෙයි. රැය නො ඉක්ම ගිය කල්හි ඉක්ම ගිය සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. රැය නො ඉක්ම ගිය කල්හි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. රැය නො ඉක්ම ගිය කල්හි නො ඉක්ම ගිය සන් ඇතියා නම් ඇවැත් නැති.

අරුණ තුළ ඉටා නම්, විකපා නම්, හැරැපියා නම්, නැසේ නම්, වැනැසේ නම්, බිඳේ නම්, අසිඳැ ගනිත් නම්, විස්වස් වැ ගනිත් නම්, උම්මත්තිකාවහට ... ආදිකම්මිකාවහට ඇවැත් නැති.

එසමයෙහි වනාහි සවග මෙහෙණෝ නිසැජු පය නො දෙත්. භාග්‍යවත්හට මෙ කරුණ සැලකළහ. ''මහණෙනි' නිසැජු පය නො දිය යුතු නො වෙයි. යම් මෙහෙණක් නො දේ නම් දුකුළා ඇවැත් වේ'' යැ යි.

**පළමු සිකපද යි.**

## 3. 2

## දෙවැනි සිකපදය

1. ශ්‍රාවස්ති නිදනයි – එසමයෙහි බොහෝ මෙහෙණෝ ගම්-බද අවසෙක්හි වස්වැස නිමියාහු වත් සපන් වූවාහු ඉරියවු සපන් වූවාහු දිරු සිවුරු ඇත්තාහු රළු සිවුරු ඇත්තාහු සැවැතට ගියහ. උවසුවෝ ඒ මෙහෙණන් දැක මෙ භික්ෂුණීහු වත්සපන්හ. ඉරියැවු සපන්හ. දිරු සිවුරු ඇතියහ. රළු සිවුරු ඇතියහ, මෙ භික්ෂු-ණීහු අසිදගතුවෝ වන්නාහයි මෙමෙහෙණ සඟනට නො කල් සිවුරු දුන්හ. **ථුල්ලනන්ද භික්ෂුණී** තොමෝ අප විසින් කඨිනය අතුරන ලදී. (එබැවින්) කාලචීවරයැ යි ඉටා බෙදූ යැ. උවසුවෝ ඒ මෙහෙණන් දැක ''ආයභාවන් විසින් සිවුරු ලබන ලදද''යි, මෙය කීහු. ඇවැත්නි, අපි සිවුරු නො ලබම්හ. ආයභී ථුල්ලනන්ද තොමෝ අප විසින් කඨිනය අතුරන ලද යැ. කාලචීවරයැ යි ඉටා බෙදවාලූ යැ යි මෙය කීහු. උවසුවෝ ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් ආයභී ථුල්ලනන්ද තොමෝ අකාලචීවරය කාලචීවරයැ යි ඉටා බෙදවූද''යි.



Free Distribution www.aathaapi.org

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං උපාසකානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා **භික්ඛුනියො** අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා **භික්ඛුනී** අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙස්සති නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ **භික්ඛුනියො** ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියන්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා **භික්ඛුනීති**.

**අකාලචීවරං** නාම: අනත්ථතෙ කඨිනෙ එකාදසමාසෙ උප්පන්නං අත්ථතෙ කඨිනෙ සත්තමාසෙ උප්පන්නං කාලෙපි ආදිස්ස දින්නං එතං අකාලචීවරං නාම.

අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙති පයොගෙ දුක්කටං පටිලාභෙන නිස්සග්ගියං හොති නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපිතං නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අකාලචීවරෙ අකාලචීවරසඤ්ඤා කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අකාලචීවරෙ වෙමතිකා කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙති ආපත්ති දුක්කටස්ස. අකාලචීවරෙ කාලචීවරසඤ්ඤා කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙති අනාපත්ති.[1] කාලචීවරෙ අකාලචීවරසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. කාලචීවරෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. කාලචීවරෙ කාලචීවරසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති**: අකාලචීවරං කාලචීවරසඤ්ඤා භාජාපෙති, කාලචීවරං කාලචීවරසඤ්ඤා භාජාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං.**

1. කාලචීවරෙ කාලචීවරසඤ්ඤා කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙති අනාපත්ති - සිමු II



Free Distribution www.aathaapi.org

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ උවසුවන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු මැයි, යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ . . . ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් ආයර්‍ය ථුල්ලනන්‍දා තොමෝ අකාලචීවරය කාලචීවරයෑ යි ඉටා බෙදවූ"ද යි . . . සැබෑද මහණෙනි ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ අකාලචීවරය කාලචීවරයෑ යි ඉටා බෙදවූ ද යි. සැබෑව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ . . . කෙසේ නම් මහණෙනි , ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ අකාලචීවරය කාලචීවරයෑ යි ඉටා බෙදවූ ද යි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. . . . මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා,

**යම් මෙහෙණක් තොමෝ අකාලචීවරය කාලචීවරයෑ යි ඉටා බෙදවා නම් නිසගි පචිති වේ යයි.**

3. යා පන: යම් යම්බඳු . . . **භික්ෂුනී** . . . මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**අකාලචීවර නම:** කෙළින් නො අතුළ කල්හි එකොළොස් මස තුළ උපන්නේ ද කෙළින් අතුළ කල්හි සත්මස තුළ උපන්නේ ද වෙයි. කාලයෙහිදු උදෙසා දෙන ලද කෙල සිවුර අකාලචීවර නම් වේ.

අකාලචීවරය කාලචීවරයෑයි ඉටා බෙදවා නම් පියෝහි දුකුළා වෙයි. පිළිලැබීමෙන් නිසැගි වේ. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේ ද වනාහි මහණෙනි, නිසැජිය යුතුයි . . . ආයර්‍යාවෙනි, මේ අකාල චීවරය කාලචීවරයෑයි ඉටා මා විසින් බෙදවන ලදී. (එහෙයින්) මෙය නිසැගි විය. මම මෙය සඟනට නිසජ්මි . . .දෙන්නේ යෑ . . . දෙන්නාහු යෑ . . . ආයර්‍යාවට දෙමි යි.

අකාලචීවරයෙහි කාලචීවරයෑ යි සන් ඇතියා කාලචීවරයෑ යි ඉටා බෙදවා නම් නිසැගි පචිති වෙයි. අකාලචීවරයෙහි විමති ඇතියා කාලචීවරයෑ යි ඉටා බෙදවා නම් දුකුළා ඇවැත් වෙයි. අකාලචීවරයෙහි කාලචීවරයෑ යි සන් ඇතියා කාලචීවරයෑ යි ඉටා බෙදවා නම් ඇවැත් නැති. කාලචීවරයෙහි අකාලචීවරයෑ යි සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. කාලචීවරයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වේ. කාලචීවරයෙහි කාලචීවරයෑ යි සන් ඇතියා නම් ඇවැත් නැති.

අකාලචීවරය කාලචීවරයෑ යි සන් ඇතියා බෙදවා නම්, කාලචීවරය කාලචීවරයෑ යි සන් ඇතියා බෙදවා නම්, උම්මත්තිකාවහට . . .ආදිකම්මිකාවහට ඇවැත් නැති.

**දෙවන සිකපද යි.**



Free Distribution www.aathaapi.org

## 3. 3

## තතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤතරාය භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා පරිභුඤ්ජති[1]. අථ ඛො සා භික්ඛුනී තං චීවරං සංහරිත්වා[2] නික්ඛිපි. ථුල්ලනන්දා භික්ඛුනී තං භික්ඛුනිං එතදවොච: "යන්තෙ අය්‍යෙ මයා සද්ධිං චීවරං පරිවත්තිතං කහං තං චීවර"න්ති. අථ ඛො සා භික්ඛුනී තං චීවරං නීහරිත්වා ථුල්ලනන්දාය භික්ඛුනියා දස්සෙසි. ථුල්ලනන්දා භික්ඛුනී තං භික්ඛුනිං එතදවොච: "හන්දය්‍යෙ තුය්හං චීවරං, ආහර මෙ තං චීවරං. යං තුය්හං තුය්හමෙවෙතං. යං මය්හං මය්හමෙවෙතං. ආහර මෙතං සකං පච්චාහරා"ති අච්ඡින්දි. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථංහි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා සා පච්ඡා එවං වදෙය්‍ය හන්දය්‍යෙ තුය්හං චීවරං, ආහර මෙ තං චීවරං, යං තුය්හං තුය්හමෙවෙතං යං මය්හං මය්හමෙවෙතං, ආහර මෙතං චීවරං සකං පච්චාහරාති අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියන්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

---

1. පරිභුඤ්ජි, - මජසං,
2. සංහරිත්වා - මජසං,

## 3. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදනයි - එසමයෙහි ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ එක්තරා මෙහෙණක හා සමග සිවුරක් පරිවර්තනය කොට පිරිබෝ කරයි. එකල්හි ඒ මෙහෙණ තොමෝ ඒ සිවුර හකුලා බහා තැබූ යැ. ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ ඒ මෙහෙණහට මෙය කීවු යැ. ''ආර්‍ය්‍යාවෙනි, තා විසින් මා සමග යම් සිවුරෙක් පරිවර්තනය කරන ලද ද, ඒ සිවුර කොහිදැ''යි. එකල්හි ඒ මෙහෙණ තොමෝ ඒ සිවුර බැහැරට ගෙන ථුල්ලනන්‍ද භික්ෂුණියහට දක්වූ යැ. ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ ඒ මෙහෙණහට මෙය කීවුයැ. ''ආර්‍ය්‍යාවෙනි, තාගේ සිවුර ගනුව. මාගේ තෙල සිවුර ගෙනෙව. යම් සිවුරක් තාගේ නම් ඒ සිවුර තාහට මැයි. යම් සිවුරෙක් මාගේ නම් ඒ සිවුර මාහට මැයි. මාගේ තෙල සිවුර ගෙනෙව. සිය සිවුර පෙරළා ගනුව''යි අසිඳගත්තු යැ. එකල්හි ඒ මෙහෙණ තොමෝ මෙහෙණන්හට තෙල කරුණ සැලකළාය.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්, ''කෙසේ නම් ආර්‍ය්‍යා ථුල්ලනන්‍ද තොමෝ මෙහෙණක හා සමග සිවුරක් පරිවර්තනය කොට අසිඳගත්තුදැ''යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ මෙහෙණක හා සමග සිවුරක් පරිවර්තනය කොට අසිඳගත්තුදැ''යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ . . . කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ මෙහෙණක හා සමග සිවුරක් පරිවර්තනය කොට අසිඳගත්තුද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි . . . මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ මෙහෙණක හා සමග සිවුරක් පිරිවැටුම් කොට පසු වැ මෙසේ කියන්නී ද ''ආර්‍ය්‍යාවෙනි, තාගේ සිවුර ගනුව, මාගේ තෙල සිවුර ගෙනෙව, යම් සිවුරෙක් තාගේ නම් ඒ සිවුර තාහටමැ යි. යම් සිවුරෙක් මාගේ නම් ඒ සිවුර මාහටමැ යි. මාගේ තෙල සිවුර ගෙනෙව සිය සිවුර පෙරළා ගනුව''යි. මෙසේ කියා අසිඳ ගනී නම් හෝ අසිඳ ගන්වා නම් හෝ නිසගි පචිති වේ යැයි.**

3. යා පන: යම් යම්බඳු . . . භික්ඛුනී . . . මෝතොමෝ මේ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.



Free Distribution www.aathaapi.org

4. **භික්ඛුනියා සද්ධින්ති:** අඤ්ඤාය භික්ඛුනියා සද්ධිං

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගපච්ඡිමං.[1]

**පරිවත්තෙත්වාති:** පරිත්තෙන වා විපුලං විපුලෙන වා පරිත්තං

**අච්ඡින්දෙය්‍යාති:** සයං අච්ඡින්දති නිස්සග්ගියං පාචිත්තියං

**අච්ඡින්දාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති දුක්කටස්ස. සකිං ආණත්තා බහුකම්පි අච්ඡින්දති නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ චීවරං භික්ඛුනියා සද්ධිං පරිවත්තෙත්වා අච්ඡින්දිතං[2] නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා නිස්සග්ගියං පාචිත්තියං. උපසම්පන්නාය වෙමතිකා චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා නිස්සග්ගියං පාචිත්තියං. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා නිස්සග්ගියං පාචිත්තියං.

අඤ්ඤං පරික්ඛාරං පරිවත්තෙත්වා අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය සද්ධිං චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං පරිවත්තෙත්වා අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** සා වා දෙති, තස්සා වා විස්සාසන්තී[3]. ගණ්හාති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං.**

---

1. විකප්පනූපගං පච්ඡිමං - මජසං.
2. අච්ඡින්නං, - මජසං
3. විස්සසන්ති - මජසං

**භික්ඛුනියා සද්ධිං:** අන් මෙහෙණක හා සමග,

**චීවර** නම්: සවැදෑරුම් සිවුරු අතුරෙහි යටත් පිරිසෙයින් විකැපුමට සුදුසු වූ එක්තරා සිවුරෙකි.

**පරිවත්තෙත්වා:** කුඩා දෑයෙකින් මහත් දෑයක් හෝ මහත් දෑයෙකින් කුඩා දෑයක් හෝ යැ.

**අඤ්ඤාතිකාය:** තොමෝ අසිඳ ගනී නම නිසැඟි පචිති වේ.

**අඤ්ඤාතිකපෙයාය:** අනෙකක්හට අණවා නම් දුකුළා ඇවැත් වෙයි. එක් යළක් අණවන ලද්දී බොහෝ දෑයකුත් අසිඳ ගනී නම් නිසැඟි පචිති වේ. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේ ද වනාහි මහණෙනි, නිසැජිය යුතුයි . . . ආයුෂ්මාවෙනි, මා විසින් මේ සිවුර මෙහෙණක හා සමග පිරිවැටුම් කොට අසිඳ ගන්නා ලද්දේ නිසැඟි විය. මම මෙය සඟනට නිසජම් . . . දෙන්නේ යැ . . . දෙන්නාහු යැ . . . ආයුෂ්මාවහට දෙමියි.

උපසපනක කෙරෙහි උපසපන් සන් ඇතියා සිවුරක් පිරිවැටුම් කොට අසිඳැ ගනී නම් හෝ අසිඳැ ගන්වා නම් හෝ නිසැඟි පචිති වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා සිවුරක් පිරිවැටුම් කොට අසිඳැ ගනී නම් හෝ අසිඳැ ගන්වා නම් හෝ නිසැඟි පචිති වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන් සන් ඇතියා සිවුරක් පිරිවැටුම් කොට අසිඳැ ගනී නම් හෝ අසිඳැ ගන්වා නම් හෝ නිසැඟි පචිති වේ.

අන් පිරිකරක් පිරිවැටුම් කොට අසිඳැ ගනී නම් හෝ අසිඳැ ගන්වා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක සමග සිවුරක් හෝ අන් පිරිකරක් හෝ පිරිවැටුම කොට අසිඳැ ගනී නම් හෝ අසිඳැ ගන්වා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන් සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන් සන් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

ඔතොමෝ හෝ දේ නම්, ඇය කෙරෙහි විස්වස් ඇත්තී හෝ ගනී නම්, ඇවැත් නැත. උම්මත්තිකාවහට. . . . ආදිකම්මිකාවහට ඇවැත් නැති.

**තෙවන සිකපදයි**

## 3. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී ගිලානා හොති. අථ ඛො අඤ්ඤතරො උපාසකො යෙන ථුල්ලනන්දා භික්ඛුනී තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොච "කිං තෙ අය්යෙ අඵාසු, කිං ආහරියතූ"ති. සප්පිනා මෙ ආවුසො අත්ථොති. අථ ඛො සො උපාසකො අඤ්ඤතරස්ස ආපණිකස්ස ඝරා කහාපණස්ස සප්පිං ආහරිත්වා ථුල්ලනන්දාය භික්ඛුනියා අදාසි. ථුල්ලනන්දා භික්ඛුනී[1] "න මෙ ආවුසො සප්පිනා අත්ථො, තෙලෙන මෙ අත්ථො"ති. අථ ඛො සො උපාසකො යෙන සො ආපණිකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං ආපණිකං එතදවොච "න කිරය්යො අය්යාය සප්පිනා අත්ථො තෙලෙන අත්ථො. හන්ද තෙ සප්පිං, තෙලං මෙ දෙහී"ති. සචෙ මයං අය්යා වික්කීතං භණ්ඩං පුන ආදියිස්සාම[2] කදා අම්හාකං භණ්ඩං වික්කායිස්සති. සප්පිස්ස කයෙන සප්පි හටං. තෙලස්ස කයං ආහර, තෙලං හරිස්සතීති. අථ ඛො සො උපාසකො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම අය්යා ථුල්ලනන්දා අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියන්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති:- -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අඤ්ඤං විඤ්ඤාපෙත්වාති;** යං කිඤ්චි විඤ්ඤාපෙත්වා,

**අඤ්ඤං විඤ්ඤාපෙය්‍යාති:** තං ඨපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්යෙ අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපිතං, නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්යාය දම්මීති.

---

1. ථුල්ලනන්දා භික්ඛුනී එවමාහාති දිස්සතෙ මරම්ම ඡට්ඨ සඞ්ගීති පිටකෙ
2. ආහරිස්සාම, සිමු i සී ii

## 3. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදානයි - එසමයෙහි වනාහි ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ ගිලන් වූවා වෙයි. එකල්හි එක්තරා උවසුවෙක් ථුල්ලනන්‍දා භික්ෂුණිය වෙත එළැඹියේ යැ. එළැඹ ථුල්ලනන්‍දා භික්ෂුණියහට මෙය කීයැ. "ආර්‍ය්‍යාවෙනි, ඔබට කිනම් අපාසුවෙක්ද? ඔබට කුමක් ගෙන එනු ලබනු මනාදැයි. ඇවැත, මට ගිතෙලින් ප්‍රයොජන වෙයි. එකල්හි ඒ උවසු තෙමේ එක්තරා වෙළෙඳක්හුගේ ගෙයින් කහවණුවක ගිතෙල් ගෙනවුත් ථුල්ලනන්‍දා භික්ෂුණියහට දුන්නේ යැ. ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ "ඇවැත, මට ගිතෙලෙන් ප්‍රයොජන නොවේ, මට තල තෙලෙන් ප්‍රයොජන වේ" යැයි (කීවුයැ.) එකල්හි ඒ උවසු තෙමේ ඒ වෙළෙඳා වෙත එළැඹියේ යැ. එළැඹැ ඒ වෙළෙඳහට මෙය කීයැ. "ආර්‍ය්‍යය, ආර්‍ය්‍යාවහට ගිතෙලෙන් ප්‍රයොජන නොවේ ල, තලතෙලෙන් ප්‍රයොජන වේල, ඔබගේ ගිතෙල් ගන්නැ, මට තලතෙල් දෙන්නැ" යි. "ආර්‍ය්‍යය, ඉදින් අපි විකුණන ලද බඩු යළි ගන්නෙමු නම් කෙදිනෙක අපගේ බඩු විකිණෙන්නෝ ද? ගිතෙල් මිලයෙන් ගිතෙල් ගෙනයන ලදී. තලතෙල් මිල ගෙනෙව. (එකල්හි) තලතෙල් ගෙන යනු නෝ යැ යි. එකල්හි ඒ උවසු තෙමේ ලමු කොට සිතයි. නුගුණ පවසයි, දෙස් පතුරුවයි. "කෙසේ නම් ආර්‍ය්‍යා ථුල්ලනන්ද තොමෝ අනෙකක් විනවා අනෙකක් විනවූද"යි. . . "සැබෑද මහණෙනි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ අනෙකක් විනවා අනෙකක් විනවූද"යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ . . . කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ අනෙකක් විනවා අනෙකක් විනවූද"යි. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි . . . මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් අනෙකක් විනවා (ඉන්) අනෙකක් විනවා නම් නිසඟි පචිති වේ යයි.**

2. **යා පන:** යම් යම්බඳු . . . **භික්ඛුනී** . . . මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**අඤ්ඤං විඤ්ඤාපෙත්වා:** යම් කිසිවක් විනවා,

**අඤ්ඤං විඤ්ඤාපෙය්‍ය:** එය තබා අනෙකක් විනවා නම් පියෝහි දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසඟි වෙයි. සඟනට හෝ ගණයාට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේ ද වනාහි මහණෙනි නිසැජිය යුතු යි . . . ආර්‍ය්‍යාවෙනි, මා විසින් අනෙකක් විනවා (ඉන්) අනෙකක් විනවන ලදී. (එහෙයින්) මෙය නිසැඟි විය. මම මෙය සඟනට නිසජමි"යි . . . දෙන්නේ යැ . . . දෙන්නාහු යැ . . . ආර්‍ය්‍යාවහට දෙමී යි.



Free Distribution www.aathaapi.org

අඤ්ඤෙ අඤ්ඤසඤ්ඤා අඤ්ඤං විඤ්ඤාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤෙ වෙමතිකා අඤ්ඤං විඤ්ඤාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤෙ අනඤ්ඤසඤ්ඤා අඤ්ඤං විඤ්ඤාපෙති නිස්සග්ගියං පාචිත්තියං.

අනඤ්ඤෙ අඤ්ඤසඤ්ඤා අනඤ්ඤං විඤ්ඤාපෙති ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤෙ වෙමතිකා අනඤ්ඤං විඤ්ඤාපෙති ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤෙ අනඤ්ඤසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** තඤ්ඤෙව විඤ්ඤාපෙති, අඤ්ඤඤ්ච විඤ්ඤාපෙති. ආනිසංසං දස්සෙත්වා විඤ්ඤාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං.**

## 3. 5

## පඤ්චමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන **ථුල්ලනන්දා භික්ඛුනී** ගිලානා හොති. අථ ඛො අඤ්ඤතරො උපාසකො යෙන ථුල්ලනන්දා **භික්ඛුනී** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථුල්ලනන්දං **භික්ඛුනිං** එතදවොච කච්චි අය්‍යෙ ඛමනීයං කච්චි යාපනීය''න්ති. න මෙ ආවුසො ඛමනීයං න යාපනීයන්ති. අමුකස්ස අය්‍යෙ ආපණිකස්ස ඝරෙ කහාපණං නික්ඛිපිස්සාමි. තතො යං ඉච්ඡෙය්‍යාසි තං ආහරාපෙය්‍යාසීති. ථුල්ලනන්දා **භික්ඛුනී** අඤ්ඤතරං සික්ඛමානං ආණාපෙසි, ගච්ඡ සික්ඛමානෙ අමුකස්ස ආපණිකස්ස ඝරා කහාපණස්ස තෙලං ආහරාති. අථ ඛො සා සික්ඛමානා තස්ස ආපණිකස්ස ඝරා කහාපණස්ස තෙලං ආහරිත්වා ථුල්ලනන්දාය **භික්ඛුනියා** අදාසි. ථුල්ලනන්දා භික්ඛුනී න මෙ සික්ඛමානෙ තෙලෙන අත්ථො සප්පිනා මෙ අත්ථොති. අථ ඛො සා සික්ඛමානා යෙන සො ආපණිකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං ආපණිකං එතදවොච: ''න කිර ආවුසො අය්‍යාය තෙලෙන අත්ථො සප්පිනා අත්ථො හන්ද තෙ තෙලං, සප්පිං මෙ දෙහීති. සචෙ මයං අය්‍යෙ වික්කීතං භණ්ඩං පුන ආදියිස්සාම කදා අම්හාකං භණ්ඩං වික්කායිස්සති. තෙලස්ස කයෙන තෙලං හටං. සප්පිස්ස කයං ආහර සප්පිං හරිස්සතීති.

අනෙකෙක්හි අන්සන් ඇතියා අනෙකක් විනවා නම් නිසගි පචිති වෙයි. අනෙකෙක්හි විමති ඇතියා අනෙකක් විනවා නම් නිසගි පචිති වෙයි. අනෙකෙක්හි නො අන්සන් ඇතියා අනෙකක් විනවා නම් නිසගි පචිති වෙයි.

නො අනෙකෙක්හි අන්සන් ඇතියා නො අනෙකක් විනවා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකෙක්හි විමති ඇතියා නො අනෙකක් විනවා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකෙක්හි නො අන්සන් ඇතියා නම් ඇවැත් නැති.

එයම විනවා නම්, අනෙකකුත් විනවා නම්, අනුසස් දක්වා විනවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවහට . . . ආදිකම්මිකාවහට ඇවැත් නැති.

සතරවන සිකපදයි.

## 3. 6

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදනායි – එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ගිලන්වූවා වෙයි. එකල්හි එක්තරා උවසුවෙක් ථුල්ලනන්දා භික්ෂුණිය වෙත එළඹියේ යැ. එළැඹැ ථුල්ලනන්දා භික්ෂුණියට ''කිම ආර්යාවෙනි, ඉවසිය හැකිද? කිම යැපියහැකිදැ''යි මෙය කීයැ, ''ඇවැත, මට ඉවසිය නො හැකියැ, යැපිය නො හැකියැ''යි. ආර්යා-වෙනි, අසුවල් වෙළෙඳාගේ ගෙහි කහවණුවක් තබත්තෙමි, එයින් යමක් කැමැත්තෙහිනම් එය ගෙන්වාගන්නේ යැයි. ථුල්ලනන්දා භික්ෂුණීතොමෝ, ''යා සික්මනුව, අසුවල් වෙළෙඳාගේ ගෙයින් කහවණුවකට තලතෙල් ගෙනෙව''යි එක්තරා සික්මනුවකට ඇණවූයැ. එකල්හි ඒ සික්මනු තොමෝ ඒ වෙළෙන්දගේ ගෙයින් කහවණුවකට තලතෙල් ගෙනවුත් ථුල්ලනන්දා භික්ෂුණියට දුන්නායැ. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ සික්මනුව, ''මට තලතෙලෙන් ප්‍රයෝජන නොවෙයි මට ගිතෙලෙන් ප්‍රයොජන වේයයි'' (කීවුයැ.) එකල්හි ඒ සික්මනු තොමෝ ඒ වෙළෙඳා වෙත එළැඹියා යැ. එළැඹැ ඒ වෙළෙඳහට මෙය කිවු යැ. ''ඇවැත, ආර්යාවහට තල තෙලෙන් ප්‍රයෝජන නොවේල. ගිතෙලෙන් ප්‍රයෝජන වේල. ඔබගේ තලතෙල් ගන්නැ. මට ගිතෙල් දෙන්නැ''යි. ආර්යාවෙනි, ඉදින් අපි විකුණන ලද බඩු යළි ගන්නෙමු නම් කෙදිනෙකැ අපගේ බඩු විකිණෙන්නේද? තල තෙල් මිලයෙන් තලතෙල් ගෙන යන ලදි. ගිතෙල් මිල ගෙනෙව. (එකල්හි) ගිතෙල් ගෙන යන්නේයැයි.

2. අථ ඛො සා සික්ඛමානා රොදන්තී අට්ඨාසි. භික්ඛුනියො තං සික්ඛමානං එතදවොචුං: ''කිස්ස ත්වං සික්ඛමානෙ රොදසී''ති. අථ ඛො සා සික්ඛමානා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියන්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අඤ්ඤං චෙතාපෙත්වාති:** යං කිඤ්චි චෙතාපෙත්වා;

**අඤ්ඤං චෙතාපෙය්‍යාති:** තං ඨපෙත්වා අඤ්ඤං චෙතාපෙති පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අඤ්ඤෙ අඤ්ඤසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤෙ වෙමතිකා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤෙ අනඤ්ඤසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං.

අනඤ්ඤෙ අඤ්ඤසඤ්ඤා අනඤ්ඤං චෙතාපෙති ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤෙ වෙමතිකා අනඤ්ඤං චෙතාපෙති ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤෙ අනඤ්ඤසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** තඤ්ඤෙව චෙතාපෙති, අඤ්ඤඤ්ච චෙතාපෙති, ආනිසංසං දස්සෙත්වා චෙතාපෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

2. එකල්හි ඒ සික්මනු තොමෝ හඬමින් සිටියා යැ, මෙහෙණෝ ඒ සික්මනුවහට මෙය කීහු, "සික්මනුව. කුමකට තෝ හඬහිදැ"යි. එකල්හි ඒ සික්මනු තොමෝ මෙහෙණන්හට තෙල කරුණ දැන්වූය. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, තුගුණ පවසති, දෙස් පතුරුවත්, "කෙසේ නම් ආර්ය ථුල්ලනන්දා තොමෝ අනෙකක් දන්වාලා අනෙකක් දැන්වූදැ"යි, ... සැබෑද මහණෙනි ථුල්ලනන්දා භික්ෂුණීතොමෝ අනෙකක් දන්වාලා අනෙකක් දැන්වූද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ අනෙකක් දන්වාලා අනෙකක් දැන්වූදයි. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ අනෙකක් දන්වාලා (ඉන්) අනෙකක් දන්වා නම් නිසගි පචිති වෙ යැයි.**

3. **යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මෙ අර්ථ යෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණිය** යි.

**අඤ්ඤං චෙතාපෙත්වා:** යම් කිසිවක් දන්වාලා;

**අඤ්ඤං චෙතාපෙය්‍ය:** එය තබා අනෙකක් දන්වා නම් පියෙහි දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැඟි වෙයි. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේ ද වනාහි මහණෙනි නිසැජිය යුතුයි ... ආර්යාවෙනි මා විසින් අනෙකක් දන්වාලා (ඉන්) අනෙකෙක් දන්වන ලදී, මෙය නිසැඟි විය. මම මෙය සඟනට නිසජමි යි...දෙන්නේ යැ...දෙන්නාහු යැ...ආර්යාවහට දෙමියි.

අනෙකෙක්හි අන්සත් ඇතියා අනෙකක් දන්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකෙක්හි විමති ඇතියා අනෙකක දන්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකෙක්හි නො අන්සත් ඇතියා අනෙකක් දන්වා නම් නිසඟි පචිති වෙයි.

නො අනෙකෙක්හි අන්සත් ඇතියා නො අනෙකක් දන්වා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකෙක්හි විමති ඇතියා නො අනෙකක් දන්වා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකෙක් හි නො අන්සත් ඇතියා නම් ඇවැත් නැති.

එය මැ දන්වා නම්, අනෙකකුත් දන්වා නම්, අනුසස් දක්වා දන්වා නම් ඇවැත් නැත. උම්මත්තිකාවහට ... ආදිකම්මිකාවහට ඇවැත් නැති.

**පස්වන සිකපදය නිමි.**

## 3. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන උපාසකා භික්ඛුනී සඞ්ඝස්ස චීවරත්ථාය ඡන්දකං සංහරිත්වා[1] අඤ්ඤතරස්ස පාවාරිකස්ස ඝරෙ පරික්ඛාරං නික්ඛිපිත්වා භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං: "අමුකස්ස අය්‍යෙ පාවාරිකස්ස ඝරෙ චීවරත්ථාය පරික්ඛාරො නික්ඛිත්තො තතො චීවරං ආහරාපෙත්වා භාජෙථා"ති. භික්ඛුනියො තෙන පරික්ඛාරෙන භෙසජ්ජං චෙතාපෙත්වා පරිභුඤ්ජිංසු. උපාසකා ජානිත්වා උජ්ඣායන්ති ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්තී"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං උපාසකානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියන්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙනාති:** අඤ්ඤස්සත්ථාය දින්නෙන;

**සංඝිකෙනාති:** සඞ්ඝස්ස න ගණස්ස න එකභික්ඛුනියා.

**අඤ්ඤං චෙතාපෙය්‍යාති:** යං අත්ථාය දින්නං තං ඨපෙත්වා අඤ්ඤං චෙතාපෙති පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

---
1. සඞ්ඝරිත්වා - මජසං



Free Distribution www.aathaapi.org

# 3. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්තිනිදනයි – එසමයෙහි උවසුවෝ මෙහෙණ සඟනගේ සිවුරු පිණිස මෙරමා සැඳ හා රිසි දනවා ගත් පිරිකරක් එක්තරා පිළිවෙළෙඳක්හුගේ ගෙහි තබා මෙහෙණන් වෙත එළැඹැ මෙයකීහු. ''ආර්යාවෙනි, අසුවල් පිළිවෙළෙඳහුගේ ගෙහි සිවුරු පිණිස පිරිකරෙක් තබනලදී. එයින් සිවුරු ගෙන්වාගෙන බෙද ගනු මැනැවැ''යි. මෙහෙණෝ ඒ පිරිකරින් බෙහෙත් මිලදී ගන්වා වැළඳූහ. උවසුවෝ දැන ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්. ''කෙසේ නම් මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූහු දැ''යි.

2. භික්ෂුණීහු ලමු නොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ උවසුන්ගේ (අකීර්තිශබ්දය) ඇසූහු මැ යි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් මිලදී ගැන්වූහු දැ''යි. සැබෑද මහණෙනි මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් මිලදී ගන්වත්දැ''යි ... සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් මිලදී ගැන්වූහු දැ''යි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් මිල දී ගන්වා නම් නිසඟි පචිති වේ යයි.**

3. **යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන:** අනෙකක් සඳහා දුන්;

**සඞ්ඝිකෙන:** සඟනට යැ ගණයාහට නො වෙයි. එක් මෙහෙණකට නො වේ.

**අඤ්ඤං චෙතාපෙය්‍ය:** යමක් සඳහා දෙන ලදද, එය තබා අනෙකක් මිලදී ගන්වා නම් පියෝහි දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැගි වෙයි. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේ ද චනාහි මහණෙනි, නිසැජිය යුතු යි...ආර්යාවෙනි, අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් සඟසතු පිරිකරින් මා විසින් අනෙකක් මිලදී ගන්වන ලදී. මෙය නිසැඟි විය. මම මෙය සඟනට නිසජ්මි යි... දෙන්නේ යැ... දෙන්නාහු යැ ... ආර්යාවහට දෙමියි.



Free Distribution www.aathaapi.org

අඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ වෙමතිකා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. නිස්සට්ඨං පටිලභිත්වා යථාදානෙ උපනෙතබ්බං.

අනඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** සෙසකං උපනෙති, සාමිකෙ අපලොකෙත්වා උපනෙති, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**ඡට්ඨසික්ඛාපදං**

## 3. 7

## සත්තමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන උපාසකා භික්ඛුනීසඞ්ඝස්ස චීවරත්ථාය ඡන්දකං සංහරිත්වා අඤ්ඤතරස්ස පාවාරිකස්ස ඝරෙ පරික්ඛාරං නික්ඛිපිත්වා භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං: අමුකස්ස අය්‍යෙ පාවාරිකස්ස ඝරෙ චීවරත්ථාය පරික්ඛාරො නික්ඛිත්තො, තතො චීවරං ආහරාපෙත්වා භාජෙථා''ති. භික්ඛුනියො තෙන ච පරික්ඛාරෙන සයම්පි යාචිත්වා භෙසජ්ජං චෙතාපෙත්වා පරිභුඤ්ජිංසු. උපාසකා ජානිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන[1] අඤ්ඤං චෙතාපෙස්සන්තී''ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන[1] අඤ්ඤං චෙතාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියන්ති.**

---

1. සංයාචිකෙන - මජසං



Free Distribution www.aathaapi.org

අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි, අනෙකක් සඳහා දෙනලද්දෙහි විමති ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකක් සඳහා දෙන ලද්දෙහි නො අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගන්වානම් නිසඟි පචිති වෙයි. නිසැඳුදයක් පිළිලැබ දෙනලද පරිදි එළවිය යුතු යි.

නො අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙනලද සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකක් සඳහා දෙන ලද්දෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකක් සඳහා දෙනලද්දෙහි නො අනෙකක් සඳහා දෙනලද සත් ඇතියා නම් ඇවැත් නැති.

ඉතිරිවූවක් (අනෙකක් සඳහා) එළවා නම්, හිමියන් පිළිවිසැ එළවා නම් ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවහට...ආදිකම්මිකාවහට ඇවැත් නැති.

සවන සිකපදය නිමි.

## 3. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්තිනිදනයි – එ සමයෙහි වනාහි උවසුවෝ මෙහෙණ සඟනගේ සිවුරු පිණිස මෙරමා සැඳ හා රිසි දනවා ගත් පිරිකරක් එක්තරා පිළිවෙළෙඳක්හුගේ ගෙහි තබා මෙහෙණින් වෙත එළැඹැ මෙය කීහ. ''ආර්යාවෙනි, අසුවල් පිළිවෙළෙඳහුගේ ගෙහි සිවුරු පිණිස පිරිකරෙක් තබන ලදී, එයින් සිවුරු ගෙන්වාගෙන බෙදගනු මැනැවැ''යි. මෙහෙණෝ ඒ පිරිකරිනුදු තුමූ මැ ඉල්වා ගෙන බෙහෙත් මිලයට ගන්වා වැළඳූහ. උවසුවෝ දැන ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් සඟ සතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූ හු දැ''යි...සැබෑද මහණෙනි, මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් සඟසතු පිරිකරින් අනෙකක් මිල දී ගන්වත්දැ''යි සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් සඟසතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූහු ද යි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් තොමෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වාගත් සඟසතු පිරිකරින් අනෙකක් මිලදී ගන්වා නම් නිසඟිපචිති වෙ යයි.**

**2.** **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙනාති:** අඤ්ඤස්සත්ථාය දින්නෙන.

**සංඝිකෙනාති:** සඞ්ඝස්ස න ගණස්ස න එකභික්ඛුනියා,

**සඤ්ඤාචිකෙනාති:** සයං යාචිත්වා,

**අඤ්ඤං චෙතාපෙය්‍යාති:** යං අත්ථාය දින්නං, තං ඨපෙත්වා අඤ්ඤං චෙතාපෙති පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති, නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සංඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපිතං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ වෙමතිකා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. නිස්සට්ඨං පටිලභිත්වා යථාදත්තෙ උපනෙතබ්බං.

අනඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** සෙසකං උපනෙති, සාමිකෙ අපලොකෙත්වා උපනෙති, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**සත්තමසික්ඛාපදං**



Free Distribution www.aathaapi.org

2. යා පන: යම් යම්බඳු ... භික්ෂුනී ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන**: අනෙකක් සඳහා දුන්;

**සඞ්ඝිකෙන**: සඟනට යැ, ගණයාහට නො වෙයි, එක් මෙහෙණකට නො වේ,

**සඤ්ඤාචිකෙන**: තමා විසින් ඉල්වාගත්;

**අඤ්ඤං චෙතාපෙය්‍ය**: යමක් සඳහා දෙන ලද ද, එය තබා අනෙකක් මිලදී ගත්වානම් පියෝති දුකුළා වෙයි, ප්‍රතිලාභයෙන් නිසැඟි වෙයි. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතුයි. මෙසේ ද වනාහි මහණෙනි, නිසැජිය යුතුයි ... ආර්යාවෙනි, අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් සඟසතු පිරිකරින් මාවිසින් අනෙකක් මිල දී ගත්වන ලදී. මෙය නිසැඟිවිය. මම මෙය සඟනට නිසජ්මියි ... දෙන්නේ යැ ... දෙන්නාහුයැ ... ආර්යාවහට දෙමියි.

අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගත්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකක් සඳහා දෙන ලද්දෙහි විමති ඇතියා අනෙකක් මිලදී ගත්වානම් නිසඟි පචිති වෙයි. අනෙකක් සඳහා දෙනලද්දෙහි නො අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගත්වා නම් නිසඟි පචිති වෙයි. නිසැජුද්දය පිළිලැබ දෙන ලද පරිදි එළවිය යුතුයි.

නො අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකක් සඳහා දෙන ලද්දෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො අනෙකක් සඳහා දෙනලද්දෙහි නො අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා නම් ඇවැත් නැති.

ඉතිරිවූවක් එළවානම්, හිමියන් පිළිවිසැ එළවා නම්, ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවහට ... ආදිකම්මිකාවහට ඇවැත් නැති.

**සත්වන සික්ඛපදය යි.**



Free Distribution www.aathaapi.org

## 3. 8

## අට්ඨමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස පරිවෙණවාසිකා භික්ඛුනියො යාගුයා කිලමන්ති. අථ ඛො සො පූගො භික්ඛුනීනං යාගු අත්ථාය ඡන්දකං සංහරිත්වා අඤ්ඤතරස්ස ආපණිකස්ස ඝරෙ පරික්ඛාරං නික්ඛිපිත්වා භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොච: "අමුකස්ස අය්‍යා ආපණිකස්ස ඝරෙ යාගු අත්ථාය පරික්ඛාරො නික්ඛිත්තො තතො තණ්ඩුලං ආහරාපෙත්වා යාගුං පචාපෙත්වා පරිභුඤ්ජථා"ති. භික්ඛුනියො තෙන පරික්ඛාරෙන භෙසජ්ජං චෙතාපෙත්වා පරිභුඤ්ජිංසු. අථ ඛො සො පූගො ජානිත්වා උජ්ඣායති ඛිය්‍යති විපාචෙති; "කථං හි නාම භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙනාති:** අඤ්ඤස්සත්ථාය දින්නෙන.

**මහාජනිකෙනාති:** ගණස්ස න සඞ්ඝස්ස න එකභික්ඛුනියා.

**අඤ්ඤං චෙතාපෙය්‍යාති:** යං අත්ථාය දින්නං, තං ඨපෙත්වා අඤ්ඤං චෙතාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති, නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ වෙමතිකා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. නිස්සට්ඨං පටිලභිත්වා යථාදානෙ උපනෙතබ්බං.



Free Distribution www.aathaapi.org

## 3. 8

# අටවන සිකපදය

1. ශ්‍රාවස්තිනිදාන යි - එසමයෙහි එක්තරා මුළුවක්හුගේ පිරිවෙන් වැසි මෙහෙණෝ හුළුකැතින් මිරිකෙත්. එකල්හි ඒ මුළුව මෙහෙණුන්ගේ හුළුකැත් පිණිස මෙරමා සඳ හා රිසි දනවා ගත් පිරිකරක් එක්තරා වෙළඳක්හුගේ ගෙහි තබා මෙහෙණුන් වෙත එළඹැ මෙය කී යැ: ආර්යාවෙනි, අසුවල් වෙළඳහුගේ ගෙහි හුළුකැත් පිණිස පිරිකරෙක් තබන ලදී. එයින් සහල් ගෙන්වාගෙන හුළුකැත් පිසවා වළඳනු මැනැවැ යි. මෙහෙණෝ ඒ පිරිකරින් බෙහෙත් මිලදී ගන්වා වැළඳූහ. එකල්හි ඒ මුළුව දන ලමුකොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි, ''කෙසේ නම් මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූහු දැ''යි...සැබෑද මහණෙනි, මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් මිල දී ගන්වත් දැ''යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා :

**''යම් මෙහෙණක් තොමෝ අනෙකක් උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වේ''යයි.**

2. **යා පන**: යම්, යම්බඳු...**භික්ෂුනී**...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරනලද **භික්ෂුණී** යි.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන**: අනෙකක් සඳහා දුන්

**මහාජනිකෙන**: ගණහට යැ සඟනට නො වෙයි, එක්මෙහෙණකට නො වේ.

**අඤ්ඤං චෙතාපෙය්‍ය**: යමක් සඳහා දෙනලද ද, එය තබා අනෙකක් මිල දී ගන්වා නම් පියෝති දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැඟි වෙයි. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතු යි. මෙසේ ද වනාහි මහණෙනි, නිසැජිය යුතු යි....ආර්‍ය්‍යාවෙනි, අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් ගණසතු පිරිකරින් මා විසින් අනෙකක් මිල දී ගන්වන ලදී, මෙය නිසැඟි විය. මම මෙය සඟනට නිසජමි යි ... දෙන්නේ යැ...දෙන්නාහු යැ ... ආර්යාවට දෙමි යි.

අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙනලද සත් ඇතියා අනෙකක් මිල දී ගන්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකක් සඳහා දෙන ලද්දෙහි විමති ඇතියා අනෙකක් මිල දී ගන්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකක් සඳහා දෙන ලද්දෙහි නො අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිල දී ගන්වා නම් නිසැඟි පචිති වෙයි. නිසැජූ දෑය පිළිලැබ දෙන ලද පරිදි එළවිය යුතු යි.

අනඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** සෙසකං උපනෙති, සාමිකෙ අපලොකෙත්වා උපනෙති, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

## 3. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස පරිවෙණවාසිකා භික්ඛුනියො යාගුයා කිලමන්ති. අථ ඛො සො පූගො භික්ඛුනීනං යාගු අත්ථාය ඡන්දකං සංහරිත්වා අඤ්ඤතරස්ස ආපණිකස්ස ඝරෙ පරික්ඛාරං නික්ඛිපිත්වා භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොච: "අමුකස්ස අය්‍යෙ ආපණිකස්ස ඝරෙ යාගු අත්ථාය පරික්ඛාරො නික්ඛිත්තො. තතො තණ්ඩුලං[1] ආහරාපෙත්වා යාගුං පචාපෙත්වා පරිභුඤ්ජථා"ති. භික්ඛුනියො තෙන ච පරික්ඛාරෙන සයම්පි යාචිත්වා භෙසජ්ජං චෙතාපෙත්වා පරිභුඤ්ජිංසු. සො පූගො ජානිත්වා උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තී"ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

2. **යා පනාති;** යා යාදිසා -පෙ- **භික්ඛුනීති**; -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

---
1. තණ්ඩුලෙ — මජසං



Free Distribution www.aathaapi.org

අනෙකක් සඳහා නො දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනෙකක් සඳහා නො දෙන ලද්දෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනෙකක් සඳහා නො දෙන ලද්දෙහි අනෙකක් සඳහා නො දෙන ලද සත් ඇතියා නම් ඇවැත් නැති.

ඉතිරිවූවක් එළවා නම්, හිමියන් පිළිවිසැ එළවා නම්, ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

අටවන සිකපදය.

## 3. 9

## නවවන සිකපදය

1. ශ්‍රාවස්තිනිදන යි - එසමයෙහි එක්තරා මුළුවක්හුගේ පිරිවෙන් වැසි මෙහෙණෝ හුළුකැනින් මිරිකෙත්. එකල්හි ඒ මුළුව මෙහෙණන්ගේ හුළුකැන් පිණිස මෙරමා සඳ හා රිසි දනවා ගත් පිරිකරක් එක්තරා වෙළෙඳක්හුගේ ගෙහි තබා මෙහෙණන් වෙත එළැඹැ මෙය කී යැ. ආර්යාවෙනි, අසුවල් වෙළෙඳාගේ ගෙහි හුළු කැන් පිණිස පිරිකරෙක් තබනලදි. එයින් සහල් ගෙන්වා හුළුකැන් පිසවා වළඳනු මැනැවැ''යි, මෙහෙණෝ ඒ පිරිකරිනුදු තුමූ මැ ඉල්වා බෙහෙත් මිල දී ගන්වා වැළඳූහ. ඒ මුළුව දන ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි. ''කෙසේ නම් මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූහු ද යි...සැබෑද මහණෙනි; මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා ඉල්වාගත් ගණසතු පිරිකරින් අනෙකක් මිල දී ගන්වත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් ගණසතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූහු ද යි, මහණෙනි, මෙය අප්‍රසන්න යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා ;

**''යම් මෙහෙණක් අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වාගත් ගණසතු පිරිකරින් අනෙකක් මිලදී ගන්වා නම් නිසගිපචිති වේ''යයි.**

2. යා පන; යම්, යම්බඳු...භික්ෂුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.



Free Distribution www.aathaapi.org

අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙනාති: අඤ්ඤස්සත්ථාය දින්නෙන,

මහාජනිකෙනාති: ගණස්ස න සඞ්ඝස්ස න එකභික්ඛුනියා.

සඤ්ඤාචිකෙනාති: සයං යාචිත්වා.

අඤ්ඤං චෙතාපෙය්‍යාති: යං අත්ථාය දින්නං තං ඨපෙත්වා අඤ්ඤං චෙතාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා, එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- ඉදං මෙ අය්‍යෙ අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී''ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ වෙමතිකා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං, අඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං, නිස්සට්ඨං පටිලභිත්වා යථාදානෙ උපනෙතබ්බං.

අනඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අනාපත්ති.

අනාපත්ති: සෙසකං උපනෙති, සාමිකෙ අපලොකෙත්වා උපනෙති, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

නවමසික්ඛාපදං.



Free Distribution www.aathaapi.org

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන :** අනෙකක් සඳහා දුන්.

**මහාජනිකෙන :** ගණයාහට යෑ, සඟනට නො වෙයි, එක් මෙහෙණකට නො වේ.

**සඤ්ඤාචිකෙන:** තමා විසින් ඉල්වා ගත්.

**අඤ්ඤංචෙතාපෙය්‍යා:** යමක් සඳහා දෙන ලද ද, එය තබා අනෙකක් මිලදී ගන්වා නම් පියෝති දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැඟි වෙයි. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතු යි. මෙසේ ද මහණෙනි, නිසැජිය යුතු යි. ... ආර්යාවෙනි, අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් ගණසතු පිරිකරින් මා විසින් අනෙකක් මිලදී ගන්වන ලදී. මෙය නිසැඟි විය, මම මෙය සඟනට නිසජමි යි ... දෙන්නේ යෑ ... දෙන්නාහු යෑ ...ආර්යාවට දෙමි යි.

අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙනලද සත් ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි, අනෙකක් සඳහා දෙනලද්දෙහි විමති ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි, අනෙකක් සඳහා දෙන ලද්දෙහි නො අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වේ. නිසැජු දය පිළිලැබ දෙන ලද පරිදි එළවිය යුතු යි.

අනෙකක් සඳහා නො දෙනලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි, අනෙකක් සඳහා නොදෙන ලද්දෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි, අනෙකක් සඳහා නො දෙනලද්දෙහි අනෙකක් සඳහා නො දෙන ලද සත් ඇතියා නම් ඇවැත් නැති.

ඉතිරි වූවක් එළවා නම්, හිමියන් පිළිවිසැ එළවා නම් ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නවවන සිකපද යි.**

## 3. 10

### දසමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී බහුස්සුතා හොති භාණිකා විසාරද පට්ඨා ධම්මිං කථං[1] කාතුං. බහූ මනුස්සා ථුල්ලනන්දං භික්ඛුනිං පයිරුපාසන්ති. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා පරිවෙණං උද්‍රියති[2]. මනුස්සා ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොචුං: "කිස්සිදං තෙ අය්‍යෙ පරිවෙණං උද්‍රියතී"ති. නත්ථාවුසො දායකා නත්ථි කාරකාති. අථ ඛො තෙ මනුස්සා ථුල්ලනන්දාය භික්ඛුනියා පරිවෙණත්ථාය ඡන්දකං සංහරිත්වා ථුල්ලනන්දාය භික්ඛුනියා පරික්ඛාරං අදංසු. ථුල්ලනන්දා භික්ඛුනී තෙන ච පරික්ඛාරෙන සයම්පි යාචිත්වා භෙසජ්ජං චෙතාපෙත්වා පරිභුඤ්ජි. මනුස්සා ජානිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති;** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙනාති:** අඤ්ඤස්සත්ථාය දින්නෙන,

**පුග්ගලිකෙනාති:** එකාය භික්ඛුනියා න සඞ්ඝස්ස න ගණස්ස,

**සඤ්ඤාචිකෙනාති:** සයං යාචිත්වා,

**අඤ්ඤං චෙතාපෙය්‍යාති:** යං අත්ථාය දින්නං තං ඨපෙත්වා අඤ්ඤං චෙතාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- "ඉදං මෙ අය්‍යෙ අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපිතං නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- අය්‍යාය දම්මීති.

---

1. ධම්මිකථං - මජු
2. උන්ද්‍රියති - මජ්සං.



Free Distribution www.aathaapi.org

## දසවන සික‍පදය

1. ශ්‍රාවස්තිනිදාන යි - එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ බොහෝ ඇසූපිරූ තැන් ඇත්තී පිරිවැහූ බණදහම් ඇත්තී විශාරද වූවා දහැමි කථා කියන්නට අග්‍රවූවා වෙයි. බොහෝ මිනිස්සු ථුල්ලනන්ද භික්ෂුණිය ඇසිරි කෙරෙති. එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණියගේ පිරිවෙන බිඳ වැටෙයි, මිනිස්සු ථුල්ලනන්ද භික්ෂුණියට "ආර්යාවෙනි, ඔබගේ මේ පිරිවෙන කුමක් හෙයින් බිඳවැටේ"ද යි මෙය කීහු. ඇවැත්නි, දයකයෝ නැතියහ. කාරකයෝ නැතියහයි. එකල්හි ඒ මිනිස්සු ථුල්ලනන්ද භික්ෂුණියගේ පිරිවෙන පිණිස (මෙරමා) සඳ හා රිය් දනවා පිරිකරක් ථුල්ලනන්ද භික්ෂුණියට දුන්හු. ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ඒ පිරිකරින්ද තොමෝ මැ යැද බෙහෙත් මිල දී ගන්වා වැළඳූ යැ. මිනිස්සු දනැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වා ගත් පුඟුල්සතු පිරිකරින් අනෙකක් මිලදී ගැන්වූ ද"යි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වාගත් පුඟුල්සතු පිරිකරින් අනෙකක් මිලදී ගන්වා ද යි, සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වාගත් පුඟුල්සතු පිරිකරින් අනෙකක් මිල දී ගැන්වූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසාදුන් තමා විසින් ඉල්වාගත් පුඟුල්සතු පිරිකරින් අනෙකක් මිලදී ගන්වා නම් නිසගි පචිති වේ" යයි.**

2. **යා පන**: යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන**: අනෙකක් සඳහා දුන්.

**පුග්ගලිකෙන**: එක් මෙහෙණකහට යැ, සඟනට නො වෙයි, ගණයාහට නො වේ.

**සඤ්ඤාචිකෙන**: තමා විසින් ඉල්වා ගත්.

**අඤ්ඤං චෙතාපෙය්‍ය**: යමක් සඳහා දෙන ලද ද, එය තබා අනෙකක් මිලදී ගන්වා නම් පියෝහි දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැගි වෙයි. සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතු යි, මෙසේ ද මහණෙනි, නිසැජිය යුතු යි ...ආර්යාවෙනි. අනෙකක් සඳහා දුන් අනෙකක් උදෙසා දුන් තමා විසින් ඉල්වාගත් පුඟුල් සතු පිරිකරින් මා විසින් අනෙකක් මිලදී ගන්වන ලදී. මෙය නිසැගි විය. මම මෙය සඟනට දෙමි යි ... දෙන්නේ යැ ... දෙන්නාහු යැ ... ආර්යාවට දෙමි යි.



Free Distribution www.aathaapi.org

අඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ වෙමතිකා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අඤ්ඤං චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. නිස්සට්ඨං පටිලභිත්වා යථාදනෙ උපනෙතබ්බං.

අනඤ්ඤදත්ථිකෙ අඤ්ඤදත්ථිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනඤ්ඤදත්ථිකෙ අනඤ්ඤදත්ථිකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** සෙසකං උපනෙති, සාමිකෙ අපලොකෙත්වා උපනෙති, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං.

## 3. 11

## එකාදසමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන **ථුල්ලනන්දා** භික්ඛුනී බහුස්සුතා හොති භාණිකා විසාරද පට්ඨා ධම්මිං කථං කාතුං. අථ ඛො රාජා **පසෙනදි කොසලො** සීතකාලෙ මහග්ඝං කම්බලං පාරුපිත්වා යෙන ථුල්ලනන්දා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථුල්ලනන්දං භික්ඛුනිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං ථුල්ලනන්දා භික්ඛුනී ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො රාජා පසෙනදි කොසලො ථුල්ලනන්දාය භික්ඛුනියා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොච: "වදෙය්‍යාසි අය්‍යෙ යෙන අත්ථො"ති. සචෙ මෙ ත්වං මහාරාජ දාතුකාමොසි ඉමං කම්බලං දෙහීති. අථ ඛො රාජා පසෙනදි කොසලො ථුල්ලනන්දාය භික්ඛුනියා කම්බලං දත්වා උට්ඨායාසනා ථුල්ලනන්දං භික්ඛුනිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි. අනෙකක් සඳහා දෙන ලද්දෙහි විමති ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි, අනෙකක් සඳහා දෙන ලද්දෙහි අනෙකක් සඳහා නො දෙන ලද සත් ඇතියා අනෙකක් මිලදී ගන්වා නම් නිසඟි පචිති වෙයි, නිසැඡු දුය පිළිලැබ දෙන ලද පරිදි එළවිය යුතු යි.

අනෙකක් සඳහා නො දෙන ලද්දෙහි අනෙකක් සඳහා දෙන ලද සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනෙකක් සඳහා නො දෙන ලද්දෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනෙකක් සඳහා නො දෙන ලද්දෙහි අනෙකක් සඳහා නො දෙන ලද සත් ඇතියා නම් ඇවැත් නැති.

ඉතිරි වූවක් එළවා නම්, හිමියන් පිළිවිසැ එළවා නම් ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සිකපද යි.

## 3. 11

## එකොළොස්වන සිකපදය

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්‍ෂුණී බොහෝ ඇසූපිරූ තැන් ඇත්තී පිරිවැහූ බණදහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍රවූවා වෙයි, එකල්හි ප්‍රසෙනජිත් කොශල රජතෙමේ ශීතකාලයෙහි මහඇඟි පලසක් පොරවා ථුල්ලනන්ද භික්‍ෂුණිය වෙත එළැඹියේ යැ. එළැඹ ථුල්ලනන්ද භික්‍ෂුණිය සකසා වැඳ එකත්පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන්නාවූ මැ ප්‍රසෙනජිත් කොශල රජහට ථුල්ලනන්ද භික්‍ෂුණී තොමෝ දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වූ යැ. මොනවට කරුණු ගැන්වූ යැ. මොනවට තෙද ගැන්වූ යැ, මොනවට සතුටු කරවූ යැ, එකල්හි ප්‍රසෙනජිත් කොශල රජ තෙමේ ථුල්ලනන්ද භික්‍ෂුණිය විසින් දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වන ලදුයේ මොනවට කරුණු ගන්වන ලදුයේ මොනවට තෙදගන්වන ලදුයේ මොනවට සතුටු කරවන ලදුයේ ථුල්ලනන්ද භික්‍ෂුණියට ''ආර්යාවෙනි, යමෙකින් ප්‍රයෝජනයෙක් වේ නම් කියන්නැ''යි මෙය කීයැ. ඉදින් මහරජ, දෙනුකැමැත්තෙහි නම් මේ පලස මට දෙන්නැ යි කීවූ යැ. එකල්හි ප්‍රසෙනජිත් කොශල රජතෙමේ ථුල්ලනන්ද භික්‍ෂුණියට පලස දී හුනස්නෙන් නැඟිට ථුල්ලනන්ද භික්‍ෂුණිය සකසා වැඳ පැදකුණු කොට ගියේ යි.

2. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "මහිච්ඡා ඉමා භික්ඛුනියො අසන්තුට්ඨා, කථං හි නාම රාජානං කම්බලං විඤ්ඤාපෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා රාජානං කම්බලං විඤ්ඤාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී රාජානං කම්බලං විඤ්ඤාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී රාජානං කම්බලං විඤ්ඤාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු;

**"ගරුපාපුරණං[1] පන භික්ඛුනියා චෙතාපෙන්තියා චතුක්කංසපරමං චෙතාපෙතබ්බං, තතො චෙ උත්තරිං[2] චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

3. ගරුපාපුරණං නාම: යං කිඤ්චි සීතකාලෙ පාපුරණං;

**චෙතාපෙන්තියාති:** විඤ්ඤාපෙන්තියා.

**චතුක්කංසපරමං චෙතාපෙතබ්බන්ති:** සොළසකහාපණග්ඝනකං චෙතාපෙතබ්බං.

**තතො චෙ උත්තරිං චෙතාපෙය්‍යාති:** තතුත්තරිං විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- "ඉදං මෙ අය්‍යෙ ගරුපාපුරණං අතිරෙකචතුක්කංසපරමං චෙතාපිතං නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අතිරෙකචතුක්කංසෙ අතිරෙකසඤ්ඤා චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකචතුක්කංසෙ වෙමතිකා චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකචතුක්කංසෙ ඌනකසඤ්ඤා චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං.

ඌනකචතුක්කංසෙ අතිරෙකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ඌනකචතුක්කංසෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ඌනකචතුක්කංසෙ ඌනකසඤ්ඤා[3] අනාපත්ති.

---

1. ගරුපාවුරණං - මජසං.
2. උත්තරි - මජසං.
3. ඌනකචතුක්කංසඌනකසඤ්ඤා-සීමු ||



Free Distribution www.aathaapi.org

2. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්; ''මේ භික්ෂුණීහු මහත් ගිජුකම් ඇතියාහු යැ, ලදදයින් නො සතුටුවන්නාහු යැ, කෙසේ නම් රජහුගෙන් පලසක් විනවූහුද''යි, භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්ද) ඇසූහු මැ යි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්; ''කෙසේ නම් ආර්‍යා ථුල්ලනන්ද රජුගෙන් පලසක් විනවූ දැ''යි...සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී රජහුගෙන් පලසක් විනවූ දැ යි, සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී රජහුගෙන් පලසක් විනවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා;

**ගරු පොරෝනයක් විනවන මෙහෙණක විසින් සොළොස්කහවණුවක් පරම කොට ඇතියක් විනවිය යුතුයි, ඉදින් ඉන් මත්තෙහි විනවා නම් නිසගි පචිති වේ යැයි.**

3. **ගරුපාපුරණ** නම්: ශීතකාලයෙහි යම් කිසි පොරෝනයක්;

**චෙතාපෙන්තියා**: විනවන්නිය විසින්;

**චතුක්කංසපරමං චෙතාපෙතබ්බං**: සොළොස් කහවණුවක් අගය ඇතියක් විනවිය යුතු යි.

**තතො චෙ උත්තරිං චෙතාපෙය්‍ය**: ඉන් මත්තෙහි විනවා නම් පියෝගි දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැගි වෙයි, සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතු යි. මෙසේ ද මහණෙනි, නිසැජිය යුතු යි ... ''ආර්‍යාවෙනි, අයිරා සොළොස් කහවණුවක් පරම කොට ඇති මේ ගරු පොරෝනය මා විසින් විනවන ලදු වැ නිසැගි විය. මම මෙය සඟනට නිසජමි''යි ... දෙන්නේ යැ ... දෙන්නාහුයැ ... ආර්‍යාවට දෙමි යි.

අයිරා සොළොස් කහවණුයෙහි අයිරාසත් ඇතියා විනවා නම් නිසගි පචිති වෙයි, අයිරා සොළොස් කහවණුයෙහි විමති ඇතියා විනවා නම් නිසගි පචිති වෙයි, අයිරා සොළොස් කහවණුයෙහි ඌනසත් ඇතියා විනවා නම් නිසගි පචිති වෙයි.

ඌනු සොළොස් කහවණුයෙහි අයිරාසත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ඌනුසොළොස් කහවණුයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ඌනුසොළොස් කහවණුයෙහි ඌනසත් ඇතියා නම් ඇවැත් නැති.



Free Distribution www.aathaapi.org

අනාපත්ති: චතුක්කංසපරමං චෙතාපෙති, ඌනකචතුක්කංසපරමං චෙතාපෙති, ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, මහග්ඝං චෙතාපෙතුකාමස්ස අප්පග්ඝං චෙතාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

එකාදසමසික්ඛාපදං.

## 3. 12

## ද්වාදසමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී බහුස්සුතා හොති භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං. අථ ඛො රාජා පසෙනදි කොසලො උණ්හකාලෙ මහග්ඝං ඛොමං පාරුපිත්වා යෙන ථුල්ලනන්දා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථුල්ලනන්දං භික්ඛුනිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං ථුල්ලනන්දා භික්ඛුනී ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි. අථ ඛො රාජා පසෙනදි කොසලො ථුල්ලනන්දාය භික්ඛුනියා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොච: ''වදෙය්‍යාසි අය්‍යෙ යෙන අත්ථො''ති. සචෙ මෙ ත්වං මහාරාජ දාතුකාමොසි, ඉමං ඛොමං දෙහීති. අථ ඛො රාජා පසෙනදි කොසලො ථුල්ලනන්දාය භික්ඛුනියා ඛොමං දත්වා උට්ඨායාසනා ථුල්ලනන්දං භික්ඛුනිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

2. මනුස්සා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: ''මහිච්ඡා ඉමා භික්ඛුනියො අසන්තුට්ඨා, කථං හි නාම රාජානං ඛොමං විඤ්ඤාපෙස්සන්තී''ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛිය්‍යන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා රාජානං ඛොමං විඤ්ඤාපෙස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී රාජානං ඛොමං විඤ්ඤාපෙසීති. සච්චං භගවා.



Free Distribution www.aathaapi.org

සොළොස් කහවණු පරම කොට ඇතියක් විනවා නම්, උනුසොළොස් කහවණු පරම කොට ඇතියක් විනවා නම්, නෑයන්ගෙන්, පැවැරුවන්ගෙන්, අනෙකක්හු සඳහා නම්, තමාගේ ධනයෙන්, මහඇඟියක් විනවනු කැමැතියහුගෙන් මඳ අගය ඇතියක් විනවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**එකොළොස්වන සිකපද යි.**

## 3. 12

## දොළොස්වන සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති, එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ බොහෝ ඇසුපිරුතැන් ඇත්තී පිරිවැහූ බණදහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍රවූවා වෙයි. එකල්හි ප්‍රසෙනජිත් කොශල රජ තෙමේ උෂ්ණකාලයෙහි මහඇඟි කොමු පිළියක් පෙරෙවගෙන ථුල්ලනන්ද භික්ෂුණිය වෙත එළැඹියේ යැ. එළැඹැ ථුල්ලනන්ද භික්ෂුණිය සකසා වැඳ එකත් පසෙකැ හුන්නා වූ ප්‍රසෙනජිත් කොශල රජහට ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වූ යැ. මොනවට කරුණු ගැන්වූ යැ. මොනවට තෙද ගැන්වූ යැ, මොනවට සතුටු කරවූ යැ, එකල්හි ප්‍රසෙනජිත් කොශල රජ ථුල්ලනන්ද භික්ෂුණිය විසින් දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වන ලදුයේ මොනවට කරුණු ගන්වන ලදුයේ මොනවට තෙදගන්වන ලදුයේ මොනවට සතුටු කරවන ලදුයේ ථුල්ලනන්ද භික්ෂුණියට "ආර්යාවෙනි, යමෙකින් ප්‍රයෝජනයෙක් වේ නම් කියන්නැ''යි මෙය කීයැ. ඉදින් මහරජ දෙනු කැමැත්තෙහි නම් මේ කොමු පිළිය මට දෙන්නැ යි කිවූ යැ. එකල්හි ප්‍රසෙනජිත් කොශල රජ ථුල්ලනන්ද භික්ෂුණියට කොමු පිළිය දී හුනස්නෙන් නැඟිට ථුල්ලනන්ද භික්ෂුණිය සකසා වැඳ පැදකුණු කොට ගියේ යි.

2. මිනිස්සු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "මේ භික්ෂුණීහු මහත් ගිජුකම් ඇතියාහු ය, ලද දෙයින් නො සතුටු වූවාහු යැ, කෙසේ නම් රජහුගෙන් කොමු පිළියක් විනවූහු''ද යි, භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු මැ යි, යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද රජහුගෙන් කොමු පිළියක් විනවූ''ද යි ... සැබැ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී රජහුගෙන් කොමු පිළියක් විනවූ ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස,



Free Distribution www.aathaapi.org

විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී රාජානං ඛොමං විඤ්ඤාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ;

**"ලහුපාවුරණං[1] පන භික්ඛුනියා චෙතාපෙන්තියා අඩ්ඪතෙය්‍යකංසපරමං චෙතාපෙතබ්බං. තතො චෙ උත්තරිං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

3. **ලහුපාවුරණං** නාම: යං කිඤ්චි උණ්හකාලෙ පාවුරණං.

**චෙතාපෙන්තියාති**: විඤ්ඤාපෙන්තියා.

**අඩ්ඪතෙය්‍යකංසපරමං චෙතාපෙතබ්බන්ති:** දසකහාපණග්ඝනකං චෙතාපෙතබ්බං.

**තතො චෙ උත්තරිං චෙතාපෙය්‍යාති:** තදුත්තරිං විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා එකභික්ඛුනියා වා. එවඤ්ච පන භික්ඛවෙ, නිස්සජ්ජිතබ්බං -පෙ- "ඉදං මෙ අය්‍යෙ ලහුපාවුරණං අතිරෙක අඩ්ඪතෙය්‍යකංසපරමං චෙතාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- අය්‍යාය දම්මීති.

අතිරෙකඅඩ්ඪතෙය්‍යකංසෙ අතිරෙකසඤ්ඤී චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකඅඩ්ඪතෙය්‍යකංසෙ වෙමතිකා චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකඅඩ්ඪතෙය්‍යකංසෙ ඌනකසඤ්ඤී චෙතාපෙති නිස්සග්ගියං පාචිත්තියං.

ඌනකඅඩ්ඪතෙය්‍යකංසෙ අතිරෙකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඌනකඅඩ්ඪතෙය්‍යකංසෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ඌනකඅඩ්ඪතෙය්‍යකංසෙ ඌනකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අඩ්ඪතෙය්‍යකංසපරමං චෙතාපෙති, ඌනකඅඩ්ඪතෙය්‍යකංසපරමං චෙතාපෙති, ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, මහග්ඝං චෙතාපෙතුකාමස්ස අප්පග්ඝං චෙතාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**ද්වාදසමසික්ඛාපදං.**

1. ලහුපාවුරණං - මජසං;



Free Distribution www.aathaapi.org

භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී රජහුගෙන් කොමු පිළියක් විනාවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"ලුහු පොරෝනයක් විනවන මෙහෙණක විසින් දසකහවණුවක් පරම කොට ඇතියක් විනාවිය යුතු යි. ඉදින් ඉන් මත්තෙහි විනවා නම් නිසඟි පචිති වේ" යයි.**

8. **ලහුපාපුරණ** නම්: උෂ්ණකාලයෙහි යම් කිසි පොරෝනයක්.

**චෙතාපෙන්තියා**: විනවන්නිය විසින්.

**අඩ්ඪතෙය්‍යාකංසපරමං චෙතාපෙතබ්බං**: දසකහවණු අගය ඇතියක් විනාවිය යුතු යි.

**තතො චෙ උත්තරිං චෙතාපෙය්‍ය:** ඉන් මත්තෙහි විනවා නම් පියෝහි දුකුළා වෙයි. ප්‍රතිලාභයෙන් නිසැඟි වෙයි, සඟනට හෝ ගණයාහට හෝ එක් මෙහෙණකට හෝ නිසැජිය යුතු යි. මෙසේ ද මහණෙනි, නිසැජිය යුතු යි ... "ආර්යාවෙනි, අයිරා දස කහවණුවක් පරම කොට ඇති මේ ලුහු පොරෝනය මා විසින් විනවන ලදු වැ නිසැඟි විය. මම මෙය සඟනට නිසජමි"යි ... දෙන්නේ යැ ... දෙන්නාහු යැ ... ආර්යාවට දෙමි යි.

අයිරා දසකහවණුයෙහි අයිරාසන් ඇතියා විනවා නම් නිසඟි පචිති වෙයි. අයිරා දසකහවණුයෙහි විමති ඇතියා විනවා නම් නිසඟි පචිති වෙයි. අයිරා දසකහවණුයෙහි උනුසන් ඇතියා විනවා නම් නිසඟි පචිති වෙයි.

උනු දසකහවණුයෙහි අයිරාසන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. උනු දසකහවණුයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. උනු දසකහවණුයෙහි උනුසන් ඇතියා නම් ඇවැත් නැති.

දසකහවණු පරම කොට ඇතියක් විනවා නම්, උනු දසකහවණු පරම කොට ඇතියක් විනවා නම්, නෑයන්ගෙන්, පැවරූවන්ගෙන්, අනෙකක්හු සඳහා නම්; තමාගේ ධනයෙන්, මහඇඟියක විනවනු කැමැතියහුගෙන් මඳ අගය ඇතියක් විනවා නම්; ඇවැත්, නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**දොළොස්වන සිකපද යි.**

තස්සං උද්දානං :

පත්තං අකාලකාලඤ්ච - පරිවත්තෙන ච විඤ්ඤාපෙ
චෙතාපෙත්වා අඤ්ඤදත්ථි - සඞ්ඝිකඤ්ච මහාජනී
සඤ්ඤාචිකා පුග්ගලිකා - චතුක්කංසඩ්ඪතෙය්‍යකාති.

උද්දිට්ඨා ඛො අය්‍යායො තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා. තත්ථාය්‍යායො පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථාය්‍යායො තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

නිස්සග්ගියා නිට්ඨිතා[1]

1. භික්ඛුනීවිභඞ්ගෙ නිස්සග්ගියකණ්ඩං නිට්ඨිතං, මජසං;

ඔවුන්ගේ උද්දානය :

පත්ත යැ අකාල කාල යැ පරිවත්ත යැ විඤ්ඤාපන යැ චෙතාපන යැ අඤ්ඤදත්තික යැ සඞ්ඝික යැ මහාජනික යැ සඤ්ඤාචික යැ පුග්ගලික යැ චතුක්කංස (පරම)යැ අඩ්ඪතෙය්‍ය (කංසපරම) යැ යි.

ආර්යාවෙනි, තිස් නිසඟි පචිති ධම්හු උදෙසන ලද්හු මැ යි, එහිලා ආර්යාවන් පිළිවිසිමි. කිම පිරිසුදුවහු ද? දෙවනවට ද පිළිවිසිමි. කිම පිරිසුදුවහු ද? තෙවනවට ද පිළිවිසිමි, කිම පිරිසුදුවහු ද? ආර්යාවෝ මෙහි ලා පිරිසුදුහ, එහෙයින් නිහඬයහ, මෙසේ මෙය දරමි යි.

නිසැඟි නිමියහ.



Free Distribution www.aathaapi.org

# පාචිත්තිය ඛණ්ඩං

## 1 ලසුනවග්ගො

### 4. 1. 1

### පඨමසික්ඛාපදං

ඉමෙ ඛො පනාය්‍යායො ඡසට්ඨිසතා පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන උපාසකෙන භික්ඛුනිසඞ්ඝො ලසුනෙන පවාරිතො හොති. යාසං අය්‍යානං ලසුනෙන අත්ථො අහං ලසුනෙනාති. ඛෙත්තපාලො ච ආණත්තො හොති. සචෙ හි භික්ඛුනියො ආගච්ඡන්ති. එකෙකාය[1] භික්ඛුනියා ද්වෙ තයො භණ්ඩිකෙ දෙහීති. තෙන ඛො පන සමයෙන සාවත්ථියං උස්සවො හොති. යථාභතං ලසුනං පරික්ඛයං අගමාසි. භික්ඛුනියො තං උපාසකං උපසඞ්කමිත්වා එතදවොචුං. "ලසුනෙන ආවුසො අත්ථො"ති. නත්ථය්‍යො[2] යථාභතං ලසුනං පරික්ඛීණං ඛෙත්තං ගච්ඡථාති. ථුල්ලනන්දා භික්ඛුනී ඛෙත්තං ගන්ත්වා න මත්තං ජානිත්වා බහුං ලසුනං හරාපෙසි[3]. ඛෙත්තපාලො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛුනියො න මත්තං ජානිත්වා බහුං ලසුනං හරාපෙස්සන්තී"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තස්ස ඛෙත්තපාලස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා න මත්තං ජානිත්වා බහුං ලසුනං හරාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී න මත්තං ජානිත්වා බහුං ලසුනං හරාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී න මත්තං ජානිත්වා බහුං ලසුණං හරාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

3. භූතපුබ්බං භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස පජාපතී අහොසි. තිස්සො ච ධීතරො නන්දා නන්දවතී සුන්දරීනන්දා. අථ ඛො භික්ඛවෙ සො බ්‍රාහ්මණො කාලං කත්වා අඤ්ඤතරං හංසයොනිං උපපජ්ජි. තස්ස සබ්බසොවණ්ණමයා පත්තා අහෙසුං. සො තාසං එකෙකං පත්තං දෙති. අථ ඛො භික්ඛවෙ ථුල්ලනන්දා

1. එකමෙකාය-මජසං,
2. න එත්ථය්‍යො-සිමු ii
3. ආහරාපෙසි-සිමු i සිමු ii



Free Distribution www.aathaapi.org

# පාචිත්තිය කාණ්ඩය

## ලසුනවර්ගය

### 4. 1. 1

### පළමු සික‍පදය

ආයුෂ්මාවෙනි, මේ එක්සිය සසැටක් පචිති ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි එක්තරා උවසුවකු විසින් භික්ෂුණී සඞඝ තෙමේ ලූහුනෙන් පවරන ලද්දේ වෙයි. යම් ආයුෂ්මා කෙනකුන්ට ලූහුනෙන් ප්‍රයෝජන වේ නම් මම ලූහුනෙන් (පවරමි) යි. ඉදින් මෙහෙණෝ පැමිණෙත් නම් එක් එක් මෙහෙණකට දෙතුන් ලූහුනු පොකුරක් දෙවයි කෙත්පල් තෙමේත් අණවන ලද්දේ වෙයි. එසමයෙහි වනාහි සැවැතෙහි උත්සවයෙක් වෙයි. ගෙනවුත් තුබූ ලූහුනු නිමාවට ගියේ යැ. මෙහෙණෝ ඒ උවසු වෙත එළැඹැ ඇවැත, ලූහුනෙන් ප්‍රයොජන වේ යයි, තෙල කරුණ කීහු. නැත ආයුෂ්මාවෙනි, ගෙනවුත් තුබූ ලූහුනු අවසන් විය. කෙතට යනු මැනැවැ යි. ථුල්ලනන්ද භික්ෂුණී කෙතට ගොස් පමණ නොදන බොහෝ ලූහුනු ගෙන්වා ගතු යැ. කෙත්පල් තෙමේ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: "කෙසේ නම් මෙහෙණෝ පමණ නොදන බොහෝ ලූහුනු ගෙන්වා ගත්තු ද"යි.

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන. ඒ කෙත්පල්හුගේ (අකීර්ති ශබ්දය) ඇසූහු යි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආයුෂ්මා ථුල්ලනන්ද පමණ නො දන බොහෝ ලූහුනු ගෙන්වා ගතු ද යි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී පමණ නො දන බොහෝ ලූහුනු ගෙන්වා ගතු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී පමණ නො දන බොහෝ ලූහුනු ගෙන්වා ගතු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි . . . දැහැමි කථා කොට මහණුන් ඇමතූහ.

3. මහණෙනි, පෙරැවූවක් කියමි. ථුල්ලනන්ද භික්ෂුණී එක්තරා බමුණක්හුගේ අඹු වූ යැ. නන්ද යැ නන්දවතී යැ සුන්දරිනන්ද යැයි දියණියෝ තිදෙනෙක් ද වූහ. එකල්හි මහණෙනි, ඒ බමුණු තෙමේ කලුරිය කොට එක්තරා හංසයොනියෙකැ උපන්නේ යැ. ඔහුගේ පියාපත් සියල්ල රන්මුවා විය. හෙතෙමේ ඔවුනට එක් එක් පියා–පතක් දෙයි. එකල්හි මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ

භික්ඛුනී අයං හංසො අම්හාකං එකෙකං පත්තං දෙතීති තං හංසරාජං[1] ගහෙත්වා නිප්පත්තං අකාසි. තස්ස පුන ජායමානා පත්තා සෙතා සම්පජ්ජිංසු. තදපි භික්ඛවෙ ථුල්ලනන්දා, භික්ඛුනී අතිලොභෙන සුවණ්ණා පරිහීනා, ඉදානි ලසුණා පරිහායිස්සතීති.

'යං ලද්ධං තෙන තුට්ඨබ්බං – අතිලොභො හි පාපකො
හංසරාජං ගහෙත්වාන – සුවණ්ණා පරිහායථා'ති.

අථ ඛො භගවා ථුල්ලනන්දං භික්ඛුනිං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යා පන භික්ඛුනී ලසුණං ඛාදෙය්‍ය පාචිත්තිය''න්ති.**

4. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ලසුණං** නාම: මාගධකං[2] වුච්චති. ඛාදිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

ලසුණෙ ලසුණසඤ්ඤා ඛාදති ආපත්ති පාචිත්තියස්ස ලසුණෙ වෙමතිකා ඛාදති ආපත්ති පාචිත්තියස්ස. ලසුණෙ අලසුණසඤ්ඤා ඛාදති ආපත්ති පාචිත්තියස්ස.

අලසුණෙ ලසුණසඤ්ඤා ආපත්ති[3] දුක්කටස්ස. අලසුණෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස අලසුණෙ අලසුණ සඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** පලණ්ඩුකෙ භඤ්ජනකෙ හරීතකෙ චාවලසුණෙ[4] සූපසම්පාකෙ මංසසම්පාකෙ තෙලසම්පාකෙ සාළවෙ උත්තරිභඞ්ගෙ උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං[5].**

## 4. 1. 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථි නිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො සම්බාධෙ ලොමං සංහරාපෙත්වා අචිරවතියා නදියා වෙසියාහි සද්ධිං නග්ගා එකතිත්ථෙ නහායන්ති. වෙසියා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො සම්බාධෙ ලොමං සංහරාපෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති''.

1. හංසරාජානං—සිමු i සිමු ii සි iii
2. මාගධං, සි i සිමු ii
3. අලසුණෙ ලසුණසඤ්ඤා ඛාදති ආපත්ති – මජසං, HO:
4. චාපලසුණෙ, මජසං
5. ලසුණ සික්ඛාපදං පඨමං, මජසං, සිමු i,



Free Distribution www.aathaapi.org

මේ හංස තෙමේ අපට එක් එක් පියාපතක් දේ යයි ඒ හංසරාජයා අල්වාගෙන පියාපත් නැතියක්හු කළා යැ. ඔහුගේ යළි හටගත්තා පියාපත්හු සුදු වැ හටගත්හ. එද ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ අතිලොභයෙන් රනින් පිරිහිණ. දන් ලූනුනෙන් පිරිහේ යයි.

"යමක් ලද නම් එයින් තුටුවිය යුතු යි. අතිලොභය වනාහි ලාමක යැ. හස්රජහු අල්වාගෙන රනින් පිරිහිණැ" යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ථුල්ලනන්ද භික්ෂුණියට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යම් මෙහෙණක් ලූනුනු කානම් පචිති වේ" යයි.

4. යා පන: යම්, යම්බඳු ... භිකුනී ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

ලසුන නම්: මගදරට උපනැ යි කියනු ලැබෙයි. කන්නෙමැයි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

ලූනුනෙහි ලූනුනු සත් ඇතියා කා නම් පචිති ඇවැත් වෙයි. ලූනුනෙහි විමති ඇතියා කා නම් පචිති ඇවැත් වෙයි, ලූනුනෙහි නො ලූනුනු සත් ඇතියා කා නම් පචිති ඇවැත් වේ.

නො ලූනුනෙහි ලූනුනු සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි, නො ලූනුනෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි, නො ලූනුනෙහි නො ලූනුනු සත් ඇතියා නම් ඇවැත් නැති.

පෙළ ලූනුනෙහි, සැ ලූනුනෙහි, පලාවන් ලූනුනෙහි, මීදුළු නැති ලූනුනෙහි, සූපසම්පාකයෙහි, මංසසම්පාකයෙහි, තෙල සම්පාකයෙහි. ගිවුළු සාලවයෙහි, අවුළුපත්හි, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

පළමු සිකපද යි.

## 4. 1. 2

## දෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි - එසමයෙහි වනාහි සවග මෙහෙණෝ පිළිසත් පියෙසෙහි ලොම් හරවා අචිරවතී නදියෙහි වෙසඟනන් සමග නග්න වැ එක් තොටෙහි ස්නානය කෙරෙත්. වෙසඟනෝ ලමූ කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ ගෘහී කාමභොගිනීන් මෙන් පිළිසන පියෙසෙහි ලොම් හැරවූහු"ද යි.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තාසං වෙසියානං උජ්ඣායන්තීනං ඛීයන්තීනං විපාචෙන්තීනං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො සම්බාධෙ ලොමං සංහරාපෙස්සන්තී"ති.-පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො සම්බාධෙ ලොමං සංහරාපෙන්තීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො සම්බාධෙ ලොමං සංහරාපෙස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**"යා පන භික්ඛුනී සම්බාධෙ ලොමං සංහරාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සම්බාධො** නාම: උභො උපකච්ඡකා මුත්තකරණං.

**සංහරාපෙය්‍යාති**: එකම්පි ලොමං සංහරාපෙති ආපත්ති පාචිත්තියස්ස. බහුකෙපි ලොමෙ සංහරාපෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති**: ආබාධපච්චයා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං.**

## 4. 1. 3

## තතියසික්ඛාපදං.

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛුනියො අනභිරතියා පීළිතා ඔවරකං පවිසිත්වා තලඝාතකං කරොන්ති. භික්ඛුනියො තෙන සද්දෙන උපධාවිත්වා තා භික්ඛුනියො එතදවොචුං: "කිස්ස තුම්හෙ අය්‍යෙ පුරිසෙහි[1] සද්ධිං සම්පදුස්සථාති. න මයං අය්‍යෙ පුරිසෙහි සද්ධිං සම්පදුස්සාමාති. භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො තලඝාතකං කරිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො තලඝාතකං කරොන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො තලඝාතකං කරිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"තලඝාතකෙ පාචිත්තිය"න්ති**

1. පුරිසෙන - මජසං.

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරු– වන ඒ වෙසඟනන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මෙහෙණෝ පිළිසත් පියෙසෙහි ලොම් හැරවූහු ද"යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙ- ණෝ පිළිසත් පියෙසෙහි ලොම් හරවත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණෝ පිළිසත් පියෙසෙහි ලොම් හැරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් පිළිසත් පියෙසෙහි ලොම් හරවා නම් පචිති වේ" යයි.**

3. **යා පන** : යම්, යම්බඳු ... **භික්ෂුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**සම්බාධ** නම්: දෙ කිසිල්ල යැ මූත්‍රකරණ යි.

**සංහරාපෙය්‍ය**: එක්ලොමකුදු හරවා නම් පචිති ඇවැත් වෙයි. බොහෝ වූ ද ලොම් හරවා නම් පචිති ඇවැත් වේ.

ආබාධප්‍රත්‍යයෙන්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**දෙවන සිකපද යි.**

## 4. 1. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි දෙ මෙහෙණ කෙනෙක් අනභිරතයෙන් පිඩිත වූවාහු ගබට පිවිස තලඝාතකය කෙරෙති. භික්ෂුණීහු ඒ ශබ්දයෙන් දිවැ අවුත් ඒ මෙහෙණන්ට "ආය්‍යාවෙනි, තෙපි කුමකට පුරුෂයන් සමඟ දූෂ්‍යාවහුද"යි කීහු. ආය්‍යාවෙනි, අපි පුරුෂයන් සමඟ නො ම දූෂ්‍යාවම්හ යි. මෙහෙණන්ට තෙල කරුණ ඇරොජූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ තලඝාතකය කොළෝද"යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ තල– ඝාතකය කෙරෙද්ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ තලඝාතකය කළෝ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"තලඝාතකයෙහි පචිති වේ" යයි.**



Free Distribution www.aathaapi.org

3. **තලඝාතකං** නාම: සම්ඵස්සං සාදියන්තී අන්තමසො උප්පලපත්තෙනපි මුත්තකරණෙ පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති**: ආබාධපච්චයා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං**

## 4. 1. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා පුරාණරාජොරොධා භික්ඛුනීසු පබ්බජිතා හොති. අඤ්ඤතරා භික්ඛුනී අනභිරතියා පීළිතා යෙන සා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුනිං එතදවොච: "රාජා ඛො අය්‍යෙ තුම්හෙ චිරාචිරං ගච්ඡති කථං තුම්හෙ ධාරෙථා"ති. ජතුමට්ඨකෙන[1] අය්‍යෙති. කිං එතං අය්‍යෙ ජතුමට්ඨකන්ති. අථ ඛො සා භික්ඛුනී තස්සා භික්ඛුනියා ජතුමට්ඨකං ආචික්ඛි. අථ ඛො සා භික්ඛුනී ජතුමට්ඨකං ආදියිත්වා ධොවිතුං විස්සරිත්වා එකමන්තං ඡඩ්ඩෙසි. භික්ඛුනියො මක්ඛිකාහි සම්පරිකිණ්ණං පස්සිත්වා එවමාහංසු "කස්සිදං කම්මන්ති" සා එවමාහ මය්හිදං කම්මන්ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී ජතුමට්ඨකං ආදියිස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී ජතුමට්ඨකං ආදියීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී ජතුමට්ඨකං ආදියිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**"ජතුමට්ඨකෙ පාචිත්තිය"න්ති**

3. **ජතුමට්ඨකං** නාම: ජතුමයං කට්ඨමයං පිට්ඨමයං මත්තිකාමයං. **ආදියෙය්‍යාති**: සම්ඵස්සං සාදියන්ති අන්තමසො උප්පලපත්තම්පි මුත්තකරණං පවෙසෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති**: ආබාධපච්චයා[2] උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං**

---

1. ජතුමට්ඨකෙන, ම ii, - මජසං.
2. ආබාධපච්චයා- මජසං



Free Distribution www.aathaapi.org

3. **තලඝාතක** නම්: පහස ඉවසන්නී යටත් පිරිසෙයින් උපුල් පතිනුදු මුත්‍ර කරණයෙහි පහර දේ නම් පචිති ඇවැත් වේ.

ආබාධප්‍රත්‍යයෙන්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**තෙවන සිකපදය යි.**

## 4. 1. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි පෙර ගිහි බැවිහි රජහුගේ ඇතොවුරෙහි වූ එක්තරා ස්ත්‍රියක් මෙහෙණන් කෙරෙහි පැවිදි වූවා වෙයි. එක්තරා මෙහෙණක් අනභිරතියෙන් පෙළුණී ඒ මෙහෙණ වෙත එළැඹියා යැ. එළැඹ ඒ මෙහෙණහට "ආර්‍ය්‍යාවෙනි, රජ තෙමෙ වනාහි කලින් කල තොප වෙතට පැමිණෙයි. තෙපි කෙසේ ඉවසා දරව් දැ"යි තෙල කරුණ කිවු යැ. ආර්‍ය්‍යාවෙනි, ජතුමට්ටකයෙනි. ආර්‍ය්‍යාවෙනි, තෙල ජතුමට්ටකය කිමෙක් දැ යි. එකල්හි ඒ මෙහෙණ ඒ මෙහෙණහට ජතුමට්ටකය පැහැදිලි කොට කිවු යැ. එකල්හි ඒ මෙහෙණ ජතුමට්ටකය (ප්‍රයොජනයට) ගෙන දෙවන්නට නො සිහි කොට එකත්පසෙක දැමූ යැ. මෙහෙණෝ මැස්සන්ගෙන් හාත්පසින් ගැවසී ගන්නා ලද්ද දැක "මේ නාගේ කාර්‍ය්‍යයක්දැ"යි කීහු. ඕ තොමෝ මෙය මාගේ කාර්‍ය්‍යයෙකැ යි කිවු යැ.

2. යම් ඒ මෙහෙණ කෙණෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්, "කෙසේ නම් මෙහෙණක් ජතුමට්ටකය (ප්‍රයොජනයට) ගතුදැ" යි... "සැබෑද මහණෙනි, මෙහෙණක් ජතුමට්ටකය [ප්‍රයොජනයට] ගතුදැ" යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... "කෙසේ නම් මහණෙනි මෙහෙණක් ජතුමට්ටකය ගතු ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි .... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා"

**"ජතුමට්ටකයෙහි පචිති වේ" යැ යි.**

3. **ජතුමට්ටක** නම්: ලහමුවා යැ දැවමුවා යි පිටි මුවා යැ මැටිමුවා යැ.

**ආදියෙයය**: පහස ඉවසන්නී යටත් පිරිසෙයින් උපුල් පතකුදු මුත්‍ර කරණයට පිවිස්වා නම් පචිති ඇවැත් වේ.

ආබාධප්‍රත්‍යයෙන් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සතරවන සිකපද යි.**



Free Distribution www.aathaapi.org

## 4. 1. 5

### පඤ්චමසික්ඛාපදං.

1\. තෙන සමයෙන බුද්ධො භගවා **සක්කෙසු** විහරති **කපිල-වත්ථුස්මිං නිග්‍රොධාරාමෙ.** අථ ඛො **මහාපජාපති ගොතමී** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා අධොවාතෙ අට්ඨාසි. ''දුග්ගන්ධො භගවා මාතුගාමො''ති. අථ ඛො භගවා ආදියන්තු ඛො භික්ඛුනියො උදකසුද්ධිකන්ති, මහාපජාපතිං ගොතමිං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො මහාපජාපති ගොතමී භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

2\. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. ''**අනුජානාමි භික්ඛවෙ භික්ඛුනීනං උදකසුද්ධික''න්ති.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී භගවතා උදකසුද්ධිකා අනුඤ්ඤාතාති අතිගම්භීරං උදකසුද්ධිකං ආදියන්තී මුත්තකරණෙ වණං අකාසි. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

3\. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනී අතිගම්භීරං උදකසුද්ධිකං ආදියිස්සතී''ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී අතිගම්භීරං උදක සුද්ධිකං ආදියීති.[1] සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී අතිගම්භීරං උදකසුද්ධිකං ආදියිස්සති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''උදකසුද්ධිකං පන භික්ඛුනියා ආදියමානාය ද්වඞ්ගුලපබ්බපරමං ආදාතබ්බං. තං අතික්කාමෙන්තියා පාචිත්තිය''න්ති.**

4\. **උදකසුද්ධිකං** නාම: මුත්තකරණස්ස ධොවනා වුච්චති.

**ආදියමානායාති:**[2] ධොවන්තියා.

**ද්වඞ්ගුලපබ්බපරමං ආදාතබ්බන්ති;** ද්වීසු අඞ්ගුලීසු දෙව **පබ්බපරමා** ආදාතබ්බා.

---

1. ආදියීසතති - සිමු
2. ආදියන්තියා, සිමු සි,



Free Distribution www.aathaapi.org

# 4. 1. 5

## පස්වන සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් පුර නුගඅරම්හි වැඩැවෙසෙති. එකල්හි මහාප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වෙත එළැඹියා යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැඳ ''භාග්‍යවතුන් වහන්ස, මාගම දූගඳයැ''යි යටි සුළහෙහි සිටියා යැ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ''භික්ෂුණීහු උදකශුද්ධිකය ගනිත්වා''යි. මහාප්‍රජාපතී ගෞතමීයට දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වූ සේක. මොනවට කරුණු ගැන්වූ සේක. මොනවට තෙද ගැන්වූ සේක. මොනවට සතුටු කරවූ සේක. එකල්හි මහාප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් විසින් දැහැමි කථාවෙන් මොනවට කරුණු දක්වන ලද්දී මොනවට කරුණු ගන්වන ලද්දී මොනවට තෙද ගන්වන ලද්දී මොනවට සතුටු කරවන ලද්දී භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට ගියා යැ.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූ සේක. ''මහණෙනි, මෙහෙණන්ට උදකශුද්ධිකය අනුදනිමි''යි. එසමයෙහි එක්තරා මෙහෙණක් භාග්‍යවතුන් විසින් උදකශුද්ධිකය අනුදන වදරන ලදැ යි ඉතා ගැඹුරට උදකශුද්ධිකය ගන්නී මූත්‍ර කරණයෙහි වණයක් කළා යැ. එකල්හි ඒ මෙහෙණ මෙහෙණන්ට තෙල කරුණ ඇරොජූ යැ.

3. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණක් ඉතා ගැඹුරට උදක ශුද්ධිකය ගතු'' ද යි ... සැබෑද මහණෙනි. මෙහෙණක් ඉතා ගැඹුරට උදක ශුද්ධිකය ගතු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් ඉතා ගැඹුරට උදක ශුද්ධිකය ගතුද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''උදක ශුද්ධිකය ගනු ලබන මෙහෙණ විසින් දෙ ඇඟිලි දෙපුරුකක් පරම කොට ගත යුතු යි. එය ඉක්මවන්නියට පචිති වේ'' යැයි.**

4. **උදකශුද්ධික** නම්: මූත්‍රකරණය පිළිබඳ දෙවීම කියනු ලැබෙ.

**ආදියමානාය:** දෙවන්නිය විසින්:

**ද්වඞ්ගුලපබ්බපරමං ආදාතබ්බං:** දෙ ඇඟිල්ලෙහි දෙ පුරුකක් පරම කොට ගත යුතු යි.

**තං අතික්කාමෙන්තියාති:** සමඵස්සං සාදියන්ති අන්තමසො කෙසග්ගමත්තම්පි අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

අතිරෙකද්වඞ්ගුලපබ්බෙ අතිරෙකසඤ්ඤා ආදියති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකද්වඞ්ගුලපබ්බෙ වෙමතිකා ආදියති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකද්වඞ්ගුලපබ්බෙ ඌනකසඤ්ඤා ආදියති ආපත්ති පාචිත්තියස්ස.

ඌනකද්වඞ්ගුලපබ්බෙ අතිරෙකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ඌනකද්වඞ්ගුලපබ්බෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ඌනකද්වඞ්ගුලපබ්බෙ ඌනකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ද්වඞ්ගුලපබ්බපරමං ආදියති, ඌනකද්වඞ්ගුලපබ්බපරමං ආදියති, ආබාධපච්චයා, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඤ්චමසික්ඛාපදං.**

## 4. 1. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන **ආරොහන්තො**[1] නාම මහාමත්තො භික්ඛුසු පබ්බජිතො හොති. තස්ස පුරාණදුතියිකා භික්ඛුනීසු පබ්බජිතා හොති. තෙන ඛො පන සමයෙන සො භික්ඛු තස්සා භික්ඛුනියා සන්තිකෙ භත්තවිස්සග්ගං කරොති. අථ ඛො සා භික්ඛුනී තස්ස භික්ඛුනො භුඤ්ජන්තස්ස පානීයෙන ච විධූපනෙන ච උපතිට්ඨිත්වා අච්චාවදති. අථ ඛො සො භික්ඛු තං භික්ඛුනිං අපසාදෙසි.[2] "මා භගිනි එවරූපං අකාසි. නෙතං කප්පතී"ති. "පුබ්බෙ මං ත්වං එවඤ්ච එවඤ්ච කරොසි. ඉදානි එත්තකං න සහසී"ති පානීයථාලකං මත්ථකෙ ආසුම්භිත්වා විධූපනෙන පහාරං අදාසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී භික්ඛුස්ස පහාරං දස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී භික්ඛුස්ස පහාරං අදාසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී භික්ඛුස්ස පහාරං දස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨෙය්‍ය පාචිත්තිය"න්ති.**

---

1. රොහන්තො, - සිමු. 2. අපසාදෙසි, - මජසං,



Free Distribution www.aathaapi.org

තං අතික්කාමෙන්තියා: පහස ඉවසන්නී යටත් පිරිසෙයින් කෙසගක් පමණකුදු ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

අයිරා දෙඇඟිලි දෙපුරුකෙහි අයිරා සත් ඇතියා ගනී නම් පචිති ඇවැත් වෙයි. අයිරා දෙඇඟිලි දෙපුරුකෙහි විමති ඇතියා ගනී නම් පචිති ඇවැත් වෙයි. දෙඇඟිලි දෙපුරුකෙහි ඌනසත් ඇතියා ගනී නම් පචිති ඇවැත් වේ.

ඌනු දෙඇඟිලි දෙපුරුකෙහි අයිරා සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ඌනු දෙඇඟිලි දෙපුරුකෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ඌනු දෙඇඟිලි දෙපුරුකෙහි ඌනු සත් ඇතියා නම් ඇවැත් නැති.

දෙඇඟිලි දෙපුරුකක් පරම කොට ගනී නම්, ඌනු දෙඇඟිලි දෙපුරුකක් පරම කොට ගනී නම්, ආබාධප්‍රත්‍යයයෙන්, අවැත් නොවේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපද යි.**

## 4. 1. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි **ආරොහන්ත** නම් මහාමාත්‍රයෙක් මහණුන් කෙරෙහි පැවිදි වූයේ වෙයි. ඔහුගේ පැරැණි අඹු මෙහෙණුන් කෙරෙහි පැවිදි වූවා වෙයි. එසමයෙහි වනාහි ඒ මහණ තෙමේ එ මෙහෙණ වැළතෙහි බත්කිස කෙරෙයි. එකල්හි ඒ මෙහෙණ වළඳන ඒ මහණහට පැනින් ද තල්වැටින් පවන් සැළීමෙන් ද [උවටැන් කරමින්] වෙතැ සිට [පැවිදි සිරිත] ඉක්මවා [පස්කම් සැපමුසු] වදන් බෙණෙයි. එකල්හි ඒ මහණ තෙමේ එ මෙහෙණහට "බුහුන, මෙබන්දක් නහමක් කරව, මෙය නො කැපයැ"යි අප්‍රසාදය පළ කෙළේ යැ. පෙර. තෝ මට මෙසේත් මෙසේත් කෙරෙහි, දැන් මෙවිවරකුත් නො ඉවසහි යැ යි පැන්තලිය හිසමතැ වත් කොට තල්වැටින් පහර දුන්නා යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් මහණක්හට පහර දුන්නාදැ"යි ... සැබෑද මහණෙනි, මෙහෙණක් මහණක්හට පහර දුන්නා දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි මෙහෙණක් මහණක්හට පහරදුන්නාද මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් වළඳන මහණක්හට පැනින් හෝ තල්වැටින් හෝ යුතු වැ වෙතැ එළැඹැ සිටී නම් පචිති වේ"යයි.**



Free Distribution www.aathaapi.org

3. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුස්සාති:** උපසම්පන්නස්ස.

**භුඤ්ජන්තස්සාති:** පඤ්චන්නං භොජනානං අඤ්ඤතරං භොජනං භුඤ්ජන්තස්ස.

**පානීයං** නාම: යං කිඤ්චි පානීයං,

**විධූපනං** නාම: යා කාචි වීජනී[1]

**උපතිට්ඨෙය්‍යාති:** හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤා පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකා පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤා පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

හත්ථපාසං විජහිත්වා උපතිට්ඨති ආපත්ති දුක්කටස්ස. ඛාදනීයං ඛාදන්තස්ස උපතිට්ඨති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නස්ස උපතිට්ඨති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** දෙති දාපෙති, අනුපසම්පන්නං ආණාපෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**ඡට්ඨසික්ඛාපදං.**

## 4. 1. 7

## සත්තමසික්ඛාපදං.

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො සස්සකාලෙ ආමකධඤ්ඤං විඤ්ඤාපෙත්වා නගරං අතිහරන්ති. ද්වාරට්ඨානෙ දෙථය්‍යා භාගන්ති පලිබුද්ධිත්වා[2] මුඤ්චිංසු. අථ ඛො තා භික්ඛුනියො උපස්සයං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං.

1. බීජනී - මජසං,
2. පලිබුන්ධෙත්වා - මජසං,



Free Distribution www.aathaapi.org

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**භික්ඛුස්ස:** උපසපනක්හට.

**භුඤ්ජන්තස්ස:** පස් බොජුනෙන් එක්තරා බොජුනක් වළඳන්නාහට.

**පානීය** නම්: යම්කිසි පියයුතු දියක්.

**විධූපන** නම්: යම්කිසි විජනියක්.

**උපතිට්ඨෙය්‍ය:** අත්පසැ සිටී නම් පචිති ඇවැත් වෙයි.

උපසපනක්හු කෙරෙහි උපසපන් සත් ඇතියා පැනින් හෝ විජනියෙන් හෝ යුතු වැ වෙතැ සිටී නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියා පැනින් හෝ විජනියෙන් හෝ යුතු වැ වෙතැ සිටී නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියා පැනින් හෝ විජනියෙන් හෝ යුතු වැ වෙතැ සිටී නම් පචිති ඇවැත් වේ.

අත්පස හැරපියා වෙතැ සිටී නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු වෙතැ සිටී නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක් කෙරෙහි උපසපන්සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

දේ නම්, දෙවා නම්, අනුපසපනක්හු අණවා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

සවන සිකපද යි.

## 4. 1. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි මෙහෙණෝ අස්වනු කල්හි අමු ධාන්‍යය විනවා නුවරට ගෙන එති. [නුවර] දෙරටු-තන්හි ආයබාවෙනි, කොටසක් දෙවුයැ යි හිරිහැර කොට මුදලූහ. එකල්හි ඒ මෙහෙණෝ මෙහෙණවරට ගොස් මෙහෙණන්ට කෙල කරුණ ඇමරාජුහු.



Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “කථං හි නාම භික්ඛුනියො ආමකධඤ්ඤං විඤ්ඤාපෙස්සන්ති''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ආමකධඤ්ඤං විඤ්ඤාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා, -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ආමකධඤ්ඤං විඤ්ඤාපෙස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

“යා පන භික්ඛුනී ආමකධඤ්ඤං විඤ්ඤාපෙත්වා වා විඤ්ඤ-පාපෙත්වා වා[1] භජ්ජිත්වා වා භජ්ජාපෙත්වා වා කොට්ටෙත්වා වා කොට්ටාපෙත්වා වා පචිත්වා වා පචාපෙත්වා වා පරිභුඤ්ජෙය්‍ය පාචිත්තිය''න්ති.

3. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

ආමකධඤ්ඤං නාම: සාලි වීහි යවො ගොධුමො කඞ්ගු වරකො කුද්රූසකො.

විඤ්ඤාපෙත්වාති: සයං විඤ්ඤාපෙත්වා.

විඤ්ඤාපාපෙත්වාති: අඤ්ඤං විඤ්ඤාපාපෙත්වා[2].

භජ්ජිත්වාති: සයං භජ්ජිත්වා.

භජ්ජාපෙත්වාති: අඤ්ඤං භජ්ජාපෙත්වා.

කොට්ටෙත්වාති: සයං කොට්ටෙත්වා,

කොට්ටාපෙත්වාති: අඤ්ඤං කොට්ටාපෙත්වා.

පචිත්වාති: සයං පචිත්වා.

පචාපෙත්වාති: අඤ්ඤං පචාපෙත්වා. භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: ආබාධපච්චයා අපරණ්ණං විඤ්ඤාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං.

---

1. විඤ්ඤත්වා වා විඤ්ඤාපෙත්වා වා - සිමු i, මජසං;
2. විඤ්ඤාපෙත්වා - සිමු i සිමු ii මජසං,

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ අමු ධාන්‍යය විනවුහු"දැයි... "සැබෑද මහණෙනි, මෙහෙණෝ අමු ධාන්‍යය විනවත්"දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ.... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ අමු ධාන්‍යය විනවූහුද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙයත්වා:

**"යම් මෙහෙණක් තොමෝ අමු ධාන්‍යය විනවා හෝ විනවවා හෝ බැද හෝ බදවා හෝ කොටා හෝ කොටවා හෝ පිසැ හෝ පිසවා හෝ වළඳා නම් පචිති ඇවැත් වේ" යයි.**

3. **යා පන:** යම් යම්බඳු...**භික්ඛුනී**... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**ආමකධඤ්ඤ** නම්: හැල් යැ **වී** යැ යව යැ **තිරිඟු** ය කඞගු යැ වරා යැ අමු යැ.

**විඤ්ඤාපෙත්වා:** තමා විසින් විනවා.

**විඤ්ඤාපාපෙත්වා:** මෙරමා ලවා විනවවා.

**හජ්ජිත්වා:** තෙමේ බැද.

**හජ්ජාපෙත්වා:** මෙරමා ලවා බදවා.

**කොට්ටෙත්වා:** තෙමේ කොටා.

**කොට්ටාපෙත්වා:** මෙරමා ලවා කොටවා.

**පචිත්වා:** තෙමේ පිසැ.

**පචාපෙත්වා:** මෙරමා ලවා පිසවා.

බුදින්නෙමැ යි පිළිගන් නම් දුකුළා ඇවැත් වෙයි. පරභලායෙහි පරභලායෙහි පචිති ඇවැත් වේ.

ආබාධ ප්‍රත්‍යයෙන්, [මුං උඳු ඈ] අපරණ්ණයක් විනවා නම්, ඇවැත් නො වේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සත්වන සිකපදය**

# 4. 1. 8

## අට්ඨමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බ්‍රාහ්මණො නිබ්බිට්ඨරාජභටො තඤ්ඤෙව භටපථං යාචිස්සාමීති සීසං නහායිත්වා භික්ඛුනූපස්සයං උපනිස්සාය[1] රාජකුලං ගච්ඡති. අඤ්ඤතරා භික්ඛුනී කටාහෙ වච්චං කත්වා තිරොකුඩ්ඩෙ ඡඩ්ඩන්තී තස්ස බ්‍රාහ්මණස්ස මත්ථකෙ ආසුම්හි. අථ ඛො සො බ්‍රාහ්මණො උජ්ඣායති ඛීයති විපාචෙති: "අස්සමණියො ඉමා මුණ්ඩා වන්ධකිනියො[2] කථං හි නාම ගූථකටාහං මත්ථකෙ ආසුම්හිස්සන්ති. ඉමාසං උපස්සයං ඣාපෙස්සාමී"ති උම්මුකං[3] ගහෙත්වා උපස්සයං පවිසති. අඤ්ඤතරො උපාසකො උපස්සයා නික්ඛමන්තො අද්දස තං බ්‍රාහ්මණං උම්මුකං ගහෙත්වා උපස්සයං පවිසන්තං, දිස්වාන තං බ්‍රාහ්මණං එතදවොච "කිස්ස ත්වං භො උම්මුකං ගහෙත්වා උපස්සයං පවිසසී"ති. ඉමා මං භො මුණ්ඩා වන්ධකිනියො ගූථකටාහං මත්ථකෙ ආසුම්භිංසු. ඉමාසං උපස්සයං ඣාපෙස්සාමීති. ගච්ඡ භො බ්‍රාහ්මණ මඞ්ගලං එතං සහස්සං ලච්ඡසි තඤ්ච භටපථන්ති. අථ ඛො සො බ්‍රාහ්මණො සීසං නහායිත්වා රාජකුලං ගන්ත්වා සහස්සං අලත්ථ තඤ්ච භටපථං.

2. අථ ඛො සො උපාසකො උපස්සයං පවිසිත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙත්වා පරිභාසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී[4] උච්චාරං තිරොකුඩ්ඩෙ ඡඩ්ඩෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී උච්චාරං තිරොකුඩ්ඩෙ ඡඩ්ඩෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී උච්චාරං තිරොකුඩ්ඩෙ ඡඩ්ඩෙස්සති නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා තිරොකුඩ්ඩෙ වා තිරොපාකාරෙ වා ඡඩ්ඩෙය්‍ය වා ඡඩ්ඩාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**උච්චාරො** නාම: ගූථො වුච්චති.

**පස්සාවො** නාම: මුත්තං වුච්චති.

**සඞ්කාරං** නාම: කචවරං වුච්චති.

---

1. උපනිස්සාය - සිමු ii, මජසං.
2. බන්ධකිනියො-මජසං.
3. උම්මුක්කං - සිමු සිමු සිමුii
4. භික්ඛුණියො - සිමු - මජසං.



Free Distribution www.aathaapi.org

## 4. 1. 8

## අටවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි එක්තරා බමුණෙක් බැළයට සේවා කරන රාජභටයෙක් වූයේ ඒ භටමාර්ගය මැ ඉල්වන්නෙමැ යි හිස දෙවා සනහා මෙහෙණවරට සමීපමාර්ගයෙන් රජගෙදරට යෙයි. එක්තරා මෙහෙණක් කබලෙක්හි වස කිස කොට බිතුයෙන් ඔබබෙහි දමාපියන්නී ඒ බමුණාගේ හිස මත්තෙහි හෙළූ යැ. එකල්හි ඒ බමුණු ලමු කොට සිතයි. නුගුණ පවසයි. දෙස් පතුරුවයි. "මේ මුඩු වදලියෝ වූ නො මෙහෙණෝ කෙසේ නම් වසුරු බඳුනක් හිසමත්තෙහි හෙළූහු ද? මොවුන්ගේ අසපුව දවන්නෙමැ යි ගිනිහුලක් ගෙනැ අසපුවට පිවිසෙයි. එක්තරා උවසුවෙක් මෙහෙණවරින් නික්මෙන්නේ ගිනිහුලක් ගෙනැ මෙහෙණවරට පිවිසෙන ඒ බමුණා දිටී. දැකැ එ බමුණුහට "පින්වත තෝ කුමකට ගිනිහුලක් ගෙනැ මෙහෙණවරට පිවිසෙහි" දැ යි කී යැ. පින්වත මේ මුඩු වඳගැහැණු වසුරු බඳුනක් මා මත්තෙහි හෙළූහ. මොවුන්ගේ මෙහෙණවර දවාලන්නෙමි යි. පින්වත් බමුණ යා තෙලෙ මඟුල් යැ. දහසක් ද ඒ භටමාර්ගය ද ලබනෙහි යැ යි. එකල්හි ඒ බමුණු තෙමේ හිස දෙවා නහා රජගෙදරට ගොස් දහසක් ද ඒ භටමාර්ගය ද ලැබී.

2. ඉක්බිති ඒ උවසු මෙහෙණවරට පිවිස මෙහෙණන් හට තෙල කරුණ ඇරොජා [යළි මෙබන්දක් නො කරන්නැ යි] බියගැන්වී යැ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් තොමෝ මල භිත්තියෙන් පිටත්හි දමාපූ දැ"යි ... සැබැ ද මහණෙනි මෙහෙණක් මල භිත්තියෙන් පිටත්හි දමාපියද්දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි මෙහෙණක් මල භිත්තියෙන් පිටත්හි දමාපූද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් මල හෝ මූ හෝ කසළ හෝ ඉඳුල් හෝ භිත්තියෙන් පිටතැ හෝ පවුරෙන් පිටතැ හෝ දමාපියා නම් හෝ දමාපියවා නම් හෝ පචිති වේ" යයි.**

3. **යා** පන: යම් යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**උච්චාර** නම්: ගූථය කියනු ලැබෙයි.

**පස්සාව** නම්: මූත්‍ර කියනු ලැබෙයි.

**සඞ්කාර** නම්: කසළ කියනු ලැබෙයි.



Free Distribution www.aathaapi.org

**විඝාසං** නාම: චලකානි වා අට්ඨිකානි වා උච්චිට්ඨොදකං වා

**කුඩ්ඩො** නාම: තයො කුඩ්ඩා ඉට්ඨකාකුඩ්ඩො සිලාකුඩ්ඩො දරුකුඩ්ඩො.

**පාකාරො** නාම: තයො පාකාරා ඉට්ඨකාපාකාරො සිලාපාකාරො දරුපාකාරො.

**තිරොකුඩ්ඩෙති:** කුඩ්ඩස්ස පරතො.

**තිරොපාකාරෙති:** පාකාරස්ස පරතො.

**ඡඩ්ඩෙය්‍යාති:** සයං ඡඩ්ඩෙති ආපත්ති පාචිත්තියස්ස.

**ඡඩ්ඩාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති දුක්කටස්ස. සකිං ආණත්තා බහුකම්පි ඡඩ්ඩෙති ආපත්ති පාචිත්තියස්ස

**අනාපත්ති;** ඔලොකෙත්වා ඡඩ්ඩෙති, අවලඤ්ජෙ ඡඩ්ඩෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

## 4. 1. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස භික්ඛුනුපස්සයං නිස්සාය යවඛෙත්තං හොති. භික්ඛුනියො උච්චාරම්පි පස්සාවම්පි සඞ්කාරම්පි විඝාසම්පි හරිතෙ[1] ඡඩ්ඩෙන්ති. අථ ඛො සො බ්‍රාහ්මණො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛුනියො අම්හාකං යවඛෙත්තං දූසෙස්සන්තී"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තස්ස බ්‍රාහ්මණස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො උච්චාරම්පි පස්සාවම්පි සඞ්කාරම්පි විඝාසම්පි හරිතෙ ඡඩ්ඩෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො උච්චාරම්පි පස්සාවම්පි සඞ්කාරම්පි විඝාසම්පි හරිතෙ ඡඩ්ඩෙන්තීති. සච්චං භගවා විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො උච්චාරම්පි පස්සාවම්පි සඞ්කාරම්පි විඝාසම්පි හරිතෙ ඡඩ්ඩෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

1. ඛෙත්තෙ - මජසං



Free Distribution www.aathaapi.org

**විසාය** නම්: සප හෝ ඇට හෝ ඉඳුල්දිය හෝ යෑ.

**කුඩ්ඩ** නම්: ගඩොළු බිතු යෑ සෙල් බිතු යෑ දැව බිතු යෑයි බිතු තුනෙකි.

**පාකාර** නම්: ගඩොළු පවුරු යෑ සෙල් පවුරු යෑ දැව පවුරු යෑයි පවුරු තුනෙකි.

**තිරොකුඩ්ඩෙ**: බිතුයෙන් ඔබ්බෙහි;

**තිරො පාකාරෙ**: පවුරෙන් ඔබ්බෙහි;

**ඡඩ්ඩෙය්‍ය**: තෙමේ දමාපියා නම් පචිති ඇවැත් වෙයි.

**ඡඩ්ඩාපෙය්‍ය**: මෙරමා අණවා නම් දුකුළා ඇවැත් වෙයි, වරක් අණවන ලද්දී බොහෝ වරකුදු දමාපියා නම් පචිති ඇවැත් වේ.

බලා දමාපියා නම්, යංතන මහක් නැති තන්හි දමාපියා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති,

**අටවන සිකපදය යි.**

## 4. 1. 9

## නවවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදනයි – **එසමයෙහි** වනාහි **එක්තරා** **බමුණෙක්හුගේ** යව කෙතෙක් මෙහෙණවරක් ඇසිරි කොට වෙයි. මෙහෙණෝ මල ද මූ ද කසළ ද ඉඳුල් ද නිල්වත් ගොයමෙහි දමාපියති. එකල්හි ඒ බමුණු ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුව යි. "කෙසේ නම් මෙහෙණෝ අපගේ යවකෙත දූෂණය කළාහු"ද යි.

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ බමුණාගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු මැයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහුද ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ මල ද මූ ද ඉඳුල් ද නිල්වත් ගොයමෙහි දමාපූහු ද" යි ... සැබෑද මහණෙනි; මෙහෙණෝ මල ද මූ ද කසළ ද ඉඳුල් ද නිල්වත් ගොයමෙහි දමා ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ මල ද මූ ද කසළ ද ඉඳුල් ද නිල්වත් ගොයමෙහි දමාපූහු ද? මහණෙනි; මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යා පන භික්ඛුනී උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා හරිතෙ ඡඩ්ඩෙය්‍ය වා ඡඩ්ඩාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනී ති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**උච්චාරො** නාම: ගූථො වුච්චති.

**පස්සාවො** නාම: මුත්තං වුච්චති.

**සඞ්කාරං** නාම: කචවරං වුච්චති.

**විඝාසං** නාම: චලකානි වා අට්ඨිකානි වා උච්ඡිට්ඨොදකං වා.

**හරිතං** නාම: පුබ්බණ්ණං අපරණ්ණං යං මනුස්සානං උපභොගපරිභොගං රොපිමං.

**ඡඩ්ඩෙය්‍යාති:** සයං ඡඩ්ඩෙති ආපත්ති පාචිත්තියස්ස.

**ඡඩ්ඩාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති දුක්කටස්ස. සකිං ආණත්තා බහුකම්පි ඡඩ්ඩෙති ආපත්ති පාචිත්තියස්ස.

හරිතෙ හරිතසඤ්ඤා ඡඩ්ඩෙති වා ඡඩ්ඩාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. හරිතෙ වෙමතිකා ඡඩ්ඩෙති වා ඡඩ්ඩාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. හරිතෙ අහරිතසඤ්ඤා ඡඩ්ඩෙති වා ඡඩ්ඩාපෙති වා. ආපත්ති පාචිත්තියස්ස.

අහරිතෙ හරිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අහරිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අහරිතෙ අහරිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ඡඩ්ඩිතඛෙත්තෙ ඡඩ්ඩෙති, සාමිකෙ අපලොකෙත්වා ඡඩ්ඩෙති[1], උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

**නවමසික්ඛාපදං.**

## 4. 1. 10

## දසමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ.** තෙන ඛො පන සමයෙන රාජගහෙ ගිරග්ගසමජ්ජො හොති. ඡබ්බග්ගියා භික්ඛුනියො ගිරග්ගසමජ්ජං දස්සනාය අගමංසු. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො නච්චම්පි ගීතම්පි වාදිතම්පි දස්සනාය ආගච්ඡිස්සන්ති සෙය්‍යථාපි ගිහීකාමභොගිනියො"ති.

1. අනාපත්ති මිලොකෙත්වා ඡඩ්ඩෙති, මෙජ්ඣම්මරියාදගෙ ඡඩ්ඩෙති, සාමිකෙ ආපුච්ඡිත්වා අපලොකෙත්වා ඡඩ්ඩෙති, - මජසං,

"යම් මෙහෙණක් මල හෝ මූ හෝ කසළ හෝ ඉඳුල් හෝ නිල්වන් ගොයමෙහි දමාපියා නම් හෝ දමවාපියා නම් හෝ පචිති වේ" යයි.

3. යා පන: යම් යම්බඳු... භික්ෂුනී... මේතොමෝ මෙ අර්යෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**උච්චාර** නම්: ගූථ ය කියනු ලැබෙයි.

**පස්සාව** නම්: මූත්‍ර කියනු ලැබෙයි.

**සඞ්කාර** නම්: කසළ කියනු ලැබෙයි.

**විඝාස** නම්: සප හෝ ඇට හෝ ඉඳුල්දිය හෝ යැ.

**හරිත** නම්: යම් දයෙක් මිනිසුන්ගේ උපභොග පරිභොගයට රොප ය කරන ලදද [ඒ] පූර්වාන්න යැ අපරාන්න යැ යි.

**ඡඩ්ඩෙය්‍ය:** තොමෝ දමාපියා නම් පචිති ඇවැත් වෙයි.

**ඡඩ්ඩාපෙය්‍ය:** මෙරමාහට අණවා නම් දුකුළා ඇවැත් වෙයි. වරක් අණවන ලද්දී බොහෝ වරකුදු දමාපියා නම් පචිති ඇවැත් වේ.

නිල්වනෙහි නිල්වන් සත් ඇතියා දමාපියා නම් හෝ දමවාපියා නම් හෝ පචිති ඇවැත් වෙයි. නිල්වනෙහි විමති ඇතියා දමාපියා නම් හෝ දමවාපියා නම් හෝ පචිති ඇවැත් වෙයි. නිල්වනෙහි නො නිල්වන් සත් ඇතියා දමාපියා නම් හෝ දමවාපියා නම් හෝ පචිති ඇවැත් වේ.

නො නිල්වනෙහි නිල්වන් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො නිල්වනෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො නිල්වනෙහි නො නිල්වන් සත් ඇතියා නම් ඇවැත් නැති.

හැරූ දමන ලද කෙතෙහි දමාපියා නම්, හිමියන් පිළිවිසැ දමාපියා නම් ඇවැත් නොවේ, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

නවවන සිඛපද යි.

## 4. 1. 10

## දසවන සිඛපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර වෙළුවන නම් කලන්දක නිවාපයෙහි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි රජගහ නුවර ගිරග නැටුමෙක් වෙයි. සවග මෙහෙණෝ ගිරග නැටුම දකිනු පිණිස ගියහ. මිනිස්සු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් මෙහෙණෝ ගෘහී කාමභොගිනීන් මෙන් නැටුම් ද ගැයුම් ද වැයුම් ද දකිනු පිණිස ආවාහු ද"යි.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො නච්චම්පි ගීතම්පි වාදිතම්පි දස්සනාය ගච්ඡිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො නච්චම්පි ගීතම්පි වාදිතම්පි දස්සනාය ගච්ඡන්තී"ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො නච්චම්පි ගීතම්පි වාදිතම්පි දස්සනාය ගච්ඡිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**නච්චං** නාම: යං කිඤ්චි නච්චං;

**ගීතං** නාම: යං කිඤ්චි ගීතං;

**වාදිතං** නාම: යං කිඤ්චි වාදිතං;

දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතා පස්සති වා සුණාති වා ආපත්ති පාචිත්තියස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති වා සුණාති වා ආපත්ති පාචිත්තියස්ස. එකමෙකං දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතා පස්සති වා සුණාති වා ආපත්ති පාචිත්තියස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති වා සුණාති වා ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ආරාමෙ ඨිතා පස්සති වා සුණාති වා භික්ඛුනියා ඨිතොකාසං වා නිසින්නොකාසං වා නිපන්නොකාසං වා ආගන්ත්වා නච්චන්ති වා ගායන්ති වා වාදෙන්ති වා පටිපථං ගච්ඡන්ති පස්සති වා සුණාති වා සතිකරණීයෙ ගන්ත්වා පස්සති වා සුණාති වා, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං.

## ලසුනවග්ගො පඨමො.

තස්සුද්දානං

ලසුනං සංහරෙ ලොමං - තලසට්ටකඤ්ච සුද්ධිකං,

භුඤ්ජන්තාම කධඤ්ඤෙන - ද්වෙ විඝාසෙන දස්සනාති.



Free Distribution www.aathaapi.org

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු මැයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්, "කෙසේ නම් සවග මෙහෙණෝ නැටුම් ද ගැයුම් ද වැයුම් ද දකිනු පිණිස ගියාහු ද" යි ... සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ නැටුම් ද ගැයුම් ද වැයුම් ද දකිනු පිණිස යෙද්ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ නැටුම් ද ගැයුම් ද වැයුම් ද දකිනු පිණිස ගියාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද, මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**"යම් මෙහෙණක් නටනු හෝ ගයනු හෝ වයනු හෝ දකිනු පිණිස යා නම් පචිති වේ" යයි.**

3. **යා පන:** යම් යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මේ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**නච්ච** නම්: යම් කිසි නැටීමක්.

**ගීත** නම්: යම් කිසි ගැයීමක්.

**වාදිත** නම්: යම් කිසි වැයීමක්.

දකිනු පිණිස යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියා දකී නම් හෝ අසා නම් හෝ පචිති ඇවැත් වෙයි. දසුන් උවසර හැරැපියා පුන පුනා දකී නම් හෝ අසා නම් හෝ පචිති ඇවැත් වෙයි. එකක් එකක් දකිනු පිණිස යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියා දකී නම් හෝ අසා නම් හෝ පචිති ඇවැත් වෙයි. දසුන් උවසර හැරැපියා පුන පුනා දකී නම් හෝ අසා නම් හෝ පචිති ඇවැත් වේ.

අරමෙහි සිටියා දකී නම් හෝ අසා නම් හෝ, මෙහෙණක්හු සිටි තෙනට හෝ හුන්තෙනට හෝ හොත්තෙනට හෝ අවුත් නටත් නම් හෝ ගයත් නම් හෝ වයත් නම් හෝ, පෙරැමග යන්නී දකී නම් හෝ අසා නම් හෝ, ඇවැසි කරුණක් ඇති කල්හි ගොස් දකී නම් හෝ අසා නම් හෝ ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සිකපද යි.

## ප්‍රථම ලසුන වර්ග යි.

**එහි උද්දානය :–**

ලසුන යැ ලොමසංහරණ යැ තලඝාතක යැ ජතුමට්ටක යැ උදක සුද්ධික යැ ආමකධඤ්ඤ ය සමඟ භුඤ්ජන්ත යැ විසාස දෙක යැ දස්සන යැ යි.

# 4. 2. 1

## පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **භද්දාය-කාපිලානියා** අන්තෙවාසිභික්ඛුනියා[1] ඤාතකො පුරිසො ගාමකා සාවත්ථිං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සා භික්ඛුනී තෙන පුරිසෙන සද්ධිං රත්තන්ධකාරෙ අප්පදීපෙ එකෙනෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**රත්තන්ධකාරෙති**: ඔග්ගතෙ[2] සුරියෙ.

**අප්පදීපෙති**: අනාලොකෙ

**පුරිසො** නාම: මනුස්සපුරිසො, න යක්ඛො න පෙතො න තිරච්ඡාන ගතො විඤ්ඤූ පටිබලො සන්තිට්ඨිතුං සල්ලපිතුං.

**සද්ධින්ති**: එකතො.

---

1. අන්තෙවාසිය භික්ඛුනියා - මජසං,
2. ඔග්ගතෙ - සී i සීමු ii



Free Distribution www.aathaapi.org

## 4. 2. 1

## පළමුවන සිකපදය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතෑ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩෑ වෙසෙති. එසමයෙහි වනාහි භද්‍රාකාපිලානියගේ අතැවැසි මෙහෙණකගේ ඤාති පුරුෂයෙක් තෙමේ කිසියම් ඇවැසි කටයුත්තක් පිණිස ගමින් සැවැතට පැමිණියේ යැ. එකල්හි ඒ මෙහෙණ තොමෝ හුදෙකලා වූ ඒ පිරිමිනියා සමග පහනක් නැති රෑ අඳුරෙහි හුදෙකලා වූවා වෙතෑ සිටීම ද කෙරෙයි. සල්ලාප ද කෙරෙයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් තොමෝ පහනක් නැති රෑ අඳුරෙහි හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතෑ සිටීමත් කළා ද? සල්ලාපත් කළා ද"යි ... සැබෑද මහණෙනි, මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා පහනක් නැති රෑ අඳුරෙහි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතෑ සිටීමත් කෙරේද? සල්ලාපත් කෙරේ දැයි. සැබැවෑ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි මෙහෙණක් තොමෝ හුදෙකලා වූවා පහනක් නැති රෑ අඳුරෙහි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතෑ සිටීමත් කළාද? සල්ලාපත් කළාද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් හුදෙකලාවූවා පහනක් නැති රෑ අඳුරෙහි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතෑ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ පචිති වේ" යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යී.

**රත්තන්ධකාරෙ**: හිරු අවරට ගිය කල්හි.

**අප්පදීපෙ:** එළියක් නැති.

**පුරිස නම:** මිනිස් පිරිමිනියෙකි. යකෙක් නොවෙයි. ප්‍රේත-යෙක් නොවෙයි. තිරිසන් ගියෙක් නොවෙයි. වෙතෑ සිටින්නට සල්ලාප කරන්නට දැනුමැති ප්‍රතිබලයෙකි.

**සද්ධිං:** එක්වැ.

**එකෙනෙකාති:** පුරිසො චෙව හොති භික්ඛුනී ච,

**සන්තිට්ඨෙය්‍යවාති:** පුරිසස්ස හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

**සල්ලපෙය්‍යවාති:** පුරිසස්ස හත්ථපාසෙ ඨිතා සල්ලපති ආපත්ති පාචිත්තියස්ස.

හත්ථපාසං විජහිත්වා සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස. යක්ඛෙන වා පෙතෙන වා පණ්ඩකෙන වා තිරච්ඡානගත-මනුස්සවිග්ගහෙන වා සද්ධිං සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** යො කොචි විඤ්ඤූ දුතියො හොති, අරහොපෙක්ඛා අඤ්ඤවිහිතා සන්තිට්ඨති වා සල්ලපති වා, උම්මත්තිකාය -පෙ- ආදි-කම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

## 4. 2. 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන **භද්දාය කාපිලානියා** අන්තෙවාසිභික්ඛුනියා[1] ඤාතකො පුරිසො ගාමකා සාවත්ථිං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සා **භික්ඛුනී** භගවතා පටික්ඛිත්තං රහොපටිච්ඡන්නෙ ආසනෙ... 

2. යා තා **භික්ඛුනියො** අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති **ඛීයන්ති** විපාචෙන්ති: "කථං හි නාම **භික්ඛුනී** පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපී" ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ **භික්ඛුනී** පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙ-නෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා-පෙ- කථං හි නාම **භික්ඛවෙ, භික්ඛුනී** පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපි. නෙතං **භික්ඛවෙ,** අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ **භික්ඛුනියො** ඉමං සික්ඛාපදං **උද්දිසන්තු:**

**"යා පන භික්ඛුනී පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

---

1. අන්තෙවාසිනියා භික්ඛුනියා - මජ්සං

**එකෙනෙකා:** පුරුෂයෙක් ද වෙයි. මෙහෙණක් ද වෙයි.

**සන්තිට්ඨෙය්‍ය වා:** පිරිමිනියක්හුගේ අත්පසැ සිටී නම් පචිති ඇවැත් වේ.

**සල්ලපෙය්‍ය වා:** පිරිමිනියක්හුගේ අත්පසැ සිටියා සල්ලාප කෙරේ නම් පචිති ඇවැත් වේ.

අත්පස හැරපියා වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. යක්‍ෂයකු හෝ ප්‍රෙතයකු හෝ පණ්ඩකයකු හෝ තිරිසන් ගිය මිනිස් සිරිරි ඇතියක්හු හෝ සමග වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වේ.

යම් කිසි දනුමැති දෙවැන්නෙක් වේ නම්, නොරහුරෙහි රිසි නැතියා, අන්‍යවිහිත වූවා වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ ඇවැත් නොවේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

පළමුවන සිකපද යි.

## 4. 2. 2

## දෙවන සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි භද්‍රාකාපිලානියගේ අතැවැසි මෙහෙණකගේ ඥාති පුරුෂයෙක් තෙමේ කිසියම් ඇවැසි කටයුත්තක් පිණිස ගමින් සැවැතට පැමිණියේ යැ. එකල්හි ඒ මෙහෙණ තොමෝ හුදෙකලා වූවා පහනක් නැති රෑ අඳුරෙහි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටින්නට සල්ලාප කරන්නට භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලදයි එම පිරිමිනියා සමග පිළිසත් පියෙසෙක්හි හුදෙකලා වූවා වෙතැ සිටීම ද කෙරෙයි. සල්ලාපද කෙරෙයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්: ''කෙසේ නම් හුදෙකලා වූ මෙහෙණක් තොමෝ පිළිසත් පියෙසෙක්හි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කළාද සල්ලාපත් කළාද''යි. ... සැබෑ ද මහණෙනි, හුදෙකලා වූ මෙහෙණක් තොමෝ පිළිසත් පියෙසෙක්හි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කළාද සල්ලාපත් කළාදැයි. සැබැව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් පිළිසත් තැනක පිරිමියකු සමග එකලා ව සිටින්නී ද, සල්ලාපත් කරන්නීද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් තොමෝ පිළිසත් පියෙසෙක්හි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග හුදෙකලා වූවා වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ පචිති වේ යයි.''**



Free Distribution www.aathaapi.org

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පටිච්ඡන්නො** නාම: ඔකාසො කුඩ්ඩෙන වා කවාටෙන වා කිලඤ්ජෙන වා සාණිපාකාරෙන වා රුක්ඛෙන වා ථම්භෙන වා කොත්ථලියා[1] වා යෙන කෙනචි පටිච්ඡන්නො හොති.

**පුරිසො** නාම: මනුස්සපුරිසො න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො විඤ්ඤූ පටිබලො සන්තිට්ඨිතුං සල්ලපිතුං.

**සද්ධින්ති:** එකතො,

**එකෙනෙකාති:** පුරිසො චෙව හොති භික්ඛුනී ච.

**සන්තිට්ඨෙය්‍ය වාති:** පුරිසස්ස හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

**සල්ලපෙය්‍ය වාති;** පුරිසස්ස හත්ථපාසෙ ඨිතා සල්ලපති ආපත්ති පාචිත්තියස්ස.

හත්ථපාසං විජහිත්වා සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස. යක්ඛෙන වා පෙතෙන වා පණ්ඩකෙන වා තිරච්ඡානගතමනුස්සවිග්ගහෙන වා සද්ධිං සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** යො කොචි විඤ්ඤූ දුතියො හොති, අරහොපෙක්ඛා අඤ්ඤවිහිතා සන්තිට්ඨති වා සල්ලපති වා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං.**

## 4. 2. 3

## තතියසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන **භද්දාය කාපිලානියා** අන්තෙවාසිනීභික්ඛුනියා ඤාතකො පුරිසො ගාමකා සාවත්ථිං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සා භික්ඛුනී භගවතා පටික්ඛිත්තං පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිතුං සල්ලපිතුන්ති තෙනෙව පුරිසෙන සද්ධිං අජ්ඣොකාසෙ එකෙනෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපි.

---

1. කොත්ථලිකාය වා - මජ්සං,



Free Distribution www.aathaapi.org

3. යා පන: යම් යම්බඳු ... භික්ෂුනී ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පටිච්ඡන්න** නාම: බිත්තියෙන් හෝ කවුළුයෙන් හෝ කළාලින් හෝ කඩතුරා පවුරෙන් හෝ රුකින් හෝ වැඩින් හෝ කොතැල්ල කින් හෝ යම් කිසිවෙකින් පිළිසන් වූ පියෙසෙක් වෙයි.

**පුරිස** නාම: මිනිස් පිරිමිනියෙකි, යක්ෂයෙක් නො වෙයි. ප්‍රේතයෙක් නො වෙයි. තිරිසන්ගියෙක් නො වෙයි. වෙතැ සිටින්නට සල්ලාප කරන්නට දැනුමැති ප්‍රතිබලයෙකි.

**සද්ධිං:** එක් වැ.

**එකෙනෙකා:** පිරිමිනියෙක් ද වෙයි. මෙහෙණක් ද වෙයි.

**සන්තිට්ඨෙය්‍ය වා:** පිරිමිනියක්හුගේ අත්පසැ සිටි නම් පචිති ඇවැත් වෙයි.

**සල්ලපෙය්‍ය වා:** පිරිමිනියක්හුගේ අත්පසැ සිටියා සල්ලාප කෙරේ නම් පචිති ඇවැත් වෙයි.

අත්පස හැරපියා වෙතැ සිටි නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. යක්ෂයකු හෝ ප්‍රේතයකු හෝ පණ්ඩකයකු හෝ තිරිසන් ගිය මිනිස් සිරිරි ඇතියක්හු හෝ සමඟ වෙතැ සිටි නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වේ.

යම් කිසි දැනුමැති දෙවැන්නෙක් වේ නම්, නොරහසෙහි පිසි ඇතියා අනාවිසිත වැ වෙතැ සිටි නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ ඇවැත් නො වේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දෙවන සිකපද යි.

## 4. 2. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි - එසමයෙහි වනාහි භද්‍රාකාපිලානියගේ අතැවැසි මෙහෙණකගේ ඥාති පුරුෂයෙක් කිසියම් ඇවැසි කටයුත්තක් පිණිස ගමින් සැවැතට පැමිණියේ ය. එකල්හි ඒ මෙහෙණ හුදෙකලා වූවා පිළිසන් පියෙසෙක්හි හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් සල්ලාප කිරීමත් භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලද යී හුදෙකලා වූවා හුදෙකලා වූ ඒ පිරිමිනියා සමග මැ එළිමහන්හි වෙතැ සිටීම ද කෙරෙයි. සල්ලාප ද කෙරෙයි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. යා පනාති; යා යාදිසා -පෙ- භික්ඛුනීති; -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අජ්ඣොකාසො** නාම: අප්පටිච්ඡන්නො හොති කුඩ්ඩෙන වා කවාටෙන වා කිලඤ්ජෙන වා සාණිපාකාරෙන වා රුක්ඛෙන වා ථම්භෙන වා කොත්ථලියා වා යෙන කෙනචි අප්පටිච්ඡන්නො හොති.

**පුරිසො** නාම: මනුස්සපුරිසො, න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො විඤ්ඤූ පටිබලො සන්තිට්ඨිතුං සල්ලපිතුං.

**සද්ධින්ති:** එකතො.

**එකෙනෙකාති:** පුරිසො චෙව හොති භික්ඛුනී ච.

**සන්තිට්ඨෙය්‍ය වාති:** පුරිසස්ස හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

**සල්ලපෙය්‍ය වාති:** පුරිසස්ස හත්ථපාසෙ ඨිතා සල්ලපති ආපත්ති පාචිත්තියස්ස.

හත්ථපාසං විජහිත්වා සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස. යක්ඛෙන වා පෙතෙන වා පණ්ඩකෙන වා තිරච්ඡානගතමනුස්සවිග්ගහෙන වා සද්ධිං සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති;** යො කොචි විඤ්ඤූ දුතියො හොති, අරහොපෙක්ඛා අඤ්ඤවිහිතා සන්තිට්ඨති වා සල්ලපති වා, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං.**



Free Distribution www.aathaapi.org

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මෙහෙණක් තොමෝ එළිමහන්හි හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කළා ද සල්ලාපත් කළා ද යි.... සැබෑද මහණෙනි මෙහෙණක් එළිමහන්හි හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමි-නියක්හු සමග වෙතැ සිටීමත් කෙරේද සල්ලාපත් කෙරේ දැයි, සැබෑවැ භාග්‍යවතුන් වහන්ස භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි මෙහෙණක් තොමෝ එළිමහන්හි හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කළාද සල්ලාපත් කළා ද යි... මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**යම් මෙහෙණක් එළිමහන්හි හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ පචිති වේ යයි.**

3. යා පන: යම්, යම්බඳු ... භික්ෂුනී... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අජ්ඣෝකාස** නම්: බිතුයෙන් හෝ කවුළුවෙන් හෝ කළාලින් හෝ කඩතුරා පවුරෙන් හෝ රුකින් හෝ වැටින් හෝ කොතැලියෙන් හෝ යම් කිසිවකින් නො පිළිසත් වූ පියසෙක් වෙයි.

**පුරිස** නම්: මිනිස් පිරිමිනියෙකි, යක්ෂයෙක් නො වෙයි, ප්‍රෙතයෙක් නො වෙයි. තිරිසන්ගියෙක් නො වෙයි. වෙතැ සිටින්නට සල්ලාප කරන්නට දැනුමැති ප්‍රතිබලයෙකි.

**සද්ධිං**: එක් වැ;

**එකෙනෙකා**: පිරිමිනියෙක් ද වෙයි මෙහෙණක් ද වෙයි.

**සන්තිට්ඨෙය්‍ය වා**: පිරිමිනියක්හුගේ අත්පසැ සිටිනම් පචිති ඇවැත් වෙයි.

**සල්ලපෙය්‍ය වා**: පිරිමිනියක්හුගේ අත්පසෙහි සිටියා සල්ලාප කෙරේ නම් පචිති ඇවැත් වෙයි.

අත්පස හැරපියා වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. යක්ෂයකු හෝ ප්‍රෙතයකු හෝ පණ්ඩකයකු හෝ තිරිසන්ගිය මිනිස් සිරිරි ඇතියක්හු හෝ සමඟ වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වේ.

යම් කිසි දැනුමැති දෙවැන්නෙක් වේ නම්, නො රහුරෙහි රිසි ඇතියා අන්‍යවිහිත වැ වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ ඇවැත් නැත. උම්මත්තිකාවට...ආදිකම්මිකාවට ඇවැත් නැති.

තෙවන සිකපද යි.

චතුත්ථ සික්ඛාපදං [4. 2. 4]

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී රථියායපි[1] බ්‍යූහෙපි සිඞ්ඝාටකෙපි පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපි නිකණ්ණිකම්පි ජප්පෙති දුතියිකම්පි භික්ඛුනිං උය්‍යොජෙති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා රථියායපි බ්‍යූහෙපි සිඞ්ඝාටකෙපි පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපි නිකණ්ණිකම්පි ජප්පෙස්සති[2] දුතියිකම්පි භික්ඛුනිං උය්‍යොජෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී රථියායපි බ්‍යූහෙපි සිඞ්ඝාටකෙපි පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨතිපි සල්ලපතිපි නිකණ්ණිකම්පි ජප්පෙති දුතියිකම්පි භික්ඛුනිං උය්‍යොජෙතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී රථියායපි බ්‍යූහෙපි සිඞ්ඝාටකෙපි පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨිස්සතිපි සල්ලපිස්සතිපි නිකණ්ණිකම්පි ජප්පෙස්සති. දුතියිකම්පි භික්ඛුනිං උය්‍යොජෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යා පන භික්ඛුනී රථියාය වා බ්‍යූහෙ වා සිඞ්ඝාටකෙ වා පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨෙය්‍ය වා සල්ලපෙය්‍ය වා නිකණ්ණිකං වා ජප්පෙය්‍ය දුතියිකං වා භික්ඛුනිං උය්‍යොජෙය්‍ය පාචිත්තිය"න්ති.

3. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

රථියා[3] නාම: රච්ඡා වුච්චති.

බ්‍යූහං නාම: යෙනෙව පවිසන්ති තෙනෙව නික්ඛමන්ති.

සිඞ්ඝාටකො නාම: චච්චරං වුච්චති.

පුරිසො නාම: මනුස්සපුරිසො න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො විඤ්ඤූ පටිබලො සන්තිට්ඨිතුං සල්ලපිතුං.

සද්ධින්ති: එකතො.

1. රථිකායපි - මජසං: රථියාපි - සිමු ii
2. ජප්පිස්සති - මජසං
3. රථිකා - මජසං



Free Distribution www.aathaapi.org

## 4. 2. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ මාවෙහි ද කොවෙහි ද සිවුමංසලෙහි ද හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කෙරෙයි. සල්ලාපත් කෙරෙයි. කන්මුලැ කෙඳිරීමත් කෙරෙයි. දෙවන මෙහෙණක නහා යැවීමත් කෙරෙයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්, "කෙසේ නම් ආර්ය ථුල්ලනන්ද මාවෙහි ද කොවෙහි ද සිවුමංසලෙහි ද හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කළා ද? සල්ලාපත් කළා ද? කන්මුලැ කෙඳිරීමත් කළා ද? දෙවන මෙහෙණක නහා යැවීමත් කළා ද යි. ... සැබෑද මහණෙනි ථුල්ලනන්ද භික්ෂුණී මාවෙහි ද කොවෙහි ද සිවුමංසලෙහි ද හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කෙරේ ද, සල්ලාපත් කෙරේ ද, කන්මුලැ කෙඳිරීමත් කෙරේ ද, දෙවන මෙහෙණක නහා යැවීමත් කෙරේ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි ථුල්ලනන්ද භික්ෂුණී මාවෙහි ද කොවෙහි ද සිවුමංසලෙහි ද හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටීමත් කළාද? සල්ලාපත් කළා ද? කන්මුලැ කෙඳිරීමත් කළා ද? දෙවන මෙහෙණක නහා යැවීමත් කළා ද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**"යම් මෙහෙණක් මාවෙහි හෝ කොවෙහි හෝ සිවුමංසලෙහි හෝ හුදෙකලා වූවා හුදෙකලා වූ පිරිමිනියක්හු සමග වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ කන්මුලැ කොඳුරා නම් හෝ දෙවන මෙහෙණක නහා යවා නම් හෝ පචිති වේ" යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**රථියා** නම්: වීථිය කියනු ලැබෙයි.

**බ්‍යූහ** නම්: යම් මඟකින් මැ පිවිසෙත් ද ඒ මඟින් මැ නික්මෙත්.

**සිඞ්ඝාටක** නම්: සිවුමංසල කියනු ලැබෙයි.

**පුරිස** නම්: මිනිස් පිරිමිනියෙකි. යක්ෂයෙක් නො වෙයි. ප්‍රේතයෙක් නො වෙයි. තිරිසන්ගියෙක් නො වෙයි. වෙතැ සිටින්නට සල්ලාප කරන්නට දැනුමැති ප්‍රතිබලයෙකි.

**සද්ධිං:** එක් වැ:



Free Distribution www.aathaapi.org

**එකෙනෙකාති:** පුරිසො චෙව හොති භික්ඛුනී ච.

**සන්තිට්ඨෙය්‍ය වාති:** පුරිසස්ස හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

**සල්ලපෙය්‍ය වාති:** පුරිසස්ස හත්ථපාසෙ ඨිතා සල්ලපති ආපත්ති පාචිත්තියස්ස.

**නිකණ්ණිකං වා ජප්පෙය්‍යාති;** පුරිසස්ස උපකණ්ණකෙ ආරොචෙති ආපත්ති පාචිත්තියස්ස.

**දුතියිකං වා භික්ඛුනිං උය්‍යොජෙය්‍යාති:** අනාචාරං ආචරිතුකාමා දුතියිකම්පි[1] භික්ඛුනිං උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස. දස්සනූපචාරං වා සවණූපචාරං වා විජහන්තියා ආපත්ති දුක්කටස්ස. විජහිතෙ ආපත්ති පාචිත්තියස්ස. හත්ථපාසං විජහිත්වා සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස. යක්ඛෙන වා පෙතෙන වා පණ්ඩකෙන වා තිරච්ඡානගත මනුස්සවිග්ගහෙන වා සද්ධිං සන්තිට්ඨති වා සල්ලපති වා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** යො කොචි විඤ්ඤූ දුතියො හොති, අරහොපෙක්ඛා අඤ්ඤවිහිතා සන්තිට්ඨති වා සල්ලපති වා, න අනාචාරං ආචරිතුකාමා සතිකරණීයෙ දුතියිකං භික්ඛුනිං උය්‍යොජෙති උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

චතුත්ථසික්ඛාපදං.

## 4. 2. 5

## පඤ්චමසික්ඛාපදං

1\. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී අඤ්ඤතරස්ස කුලස්ස කුලූපිකා හොති නිච්චභත්තිකා. අථ ඛො සා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කාමි. තස්ස කුලස්ස දාසී ඝරං සම්මජ්ජන්තී තං ආසනං භාජනන්තරිකාය පක්ඛිපි. මනුස්සා තං ආසනං අපස්සන්තා තං භික්ඛුනිං එතදවොචුං. කහං තං අය්‍යෙ ආසනන්ති. නාහං තං ආවුසො ආසනං පස්සාමීති. දෙථය්‍යෙ[2] තං ආසනන්ති පරිභාසිත්වා නිච්චභත්තකං[3] උපච්ඡින්දිංසු[4]. අථ ඛො තෙ මනුස්සා ඝරං සොධෙන්තා තං ආසනං භාජනන්තරිකාය පස්සිත්වා තං භික්ඛුනිං ඛමාපෙත්වා නිච්චභත්තකං පට්ඨපෙසුං.

---

1. දුතියිකං - සිමු ii
2. දෙහය්‍යා – සී.මු.
3. නිච්චභත්තං–මජසං.
4. පච්ඡින්දිංසු–මජසං. HO



Free Distribution www.aathaapi.org

**එකෙනෙකා:** පිරිමිනියෙක් ද වෙයි. මෙහෙණක් ද වෙයි.

**සන්තිට්ඨෙය්‍යය වා:** පිරිමිනියක්හුගේ අත්පසැ සිටී නම් පචිති ඇවැත් වෙයි.

**සල්ලපෙය්‍යය වා:** පිරිමිනියක්හුගේ අත්පසැ සිටියා සල්ලාප කෙරේ නම් පචිති ඇවැත් වෙයි.

**නිකණ්ණිකං වා ජපෙය්‍යය:** පිරිමිනියක්හු කන්මුලැ ඇරොජා නම් පචිති ඇවැත් වෙයි.

**දුතියිකං වා භික්ඛුනිං උය්‍යොජෙය්‍යය:** අනාචාරයෙහි හැසිරෙනු කැමැත්තී දෙවන මෙහෙණකුදු නභා යවා නම් දුකුළා ඇවැත් වෙයි. දක්‍සුන් උවසර හෝ සවන් උවසර හෝ හැරැපියන කල්හි දුකුළා ඇවැත් වෙයි. හැරැසූ කල්හි පචිති ඇවැත් වෙයි. අත්පස හැරැපියා වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. යක්ෂයකු හෝ ප්‍රෙතයකු හෝ පණ්ඩකයකු හෝ තිරිසන් ගිය මිනිස් සිරිරි ඇතියක්හු හෝ සමඟ වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වේ.

යම් කිසි දනුමැති දෙවැන්නෙක් වේ නම්, නො රැඹුරෙහි රිසි ඇතියා අනාචීතිත වැ වෙතැ සිටී නම් හෝ සල්ලාප කෙරේ නම් හෝ, අනාචාරයෙහි නො හැසිරෙනු කැමැතියා ඇවැසි කටයුත්තක් ඇති කල්හි දෙවන මෙහෙණක නභා යවා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවහට... ආදිකම්මිකාවහට ඇවැත් නැති.

සතරවන සිකපදය යි.

## 4. 2. 5

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදනයි - එසමයෙහි වනාහි එක්තරා මෙහෙණක් තොමෝ එක්තරා කුලයක්හුගේ නිතිබත් වළඳන කුලූපිකාවක් වෙයි. එකල්හි ඒ මෙහෙණ තොමෝ පෙරවරුයෙහි හැඳ පෙරවැ පාසිවුරු ගෙන ඒ කුලය වෙතැ එළඹියා යැ. එළැඹැ අස්නෙහි හිඳ හිමියන් නො පිළිවිසැ බැහැර ගියා යැ. ඒ කුලයෙහි දසී තොමෝ හමදින්නී ඒ අසුන බඳුන් අතුරෙයි බහාලූ යැ. මිනිස්සු ඒ අසුන නො දක්නාහු එ මෙහෙණහට ''ආර්යාවෙනි, ඒ අසුන කොහිද''යි කීහු. ඇවැත්නි, මම ඒ අසුන නොදක්මියි. 'ආය්‍ය්‍යාවෙනි, ඒ අසුන දෙව'යි නැතිගන්වා නිතිබත සිඳෑලූහ. එකල්හි ඒ මිනිස්සු ගෙය ශුද්ධකරන්නාහු ඒ අසුන බඳුන් අතුරෙහි දක එ මෙහෙණ කමාකරවා නිතිබත (යළි) තැබූහු.



Free Distribution www.aathaapi.org

2. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කමිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කාමීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කමිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කමෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පුරෙභත්තං** නාම: අරුණුග්ගමනං උපාදය යාව මජ්ඣන්හිකා. **කුලං** නාම: චත්තාරි කුලානි ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං,

**උපසඞ්කමිත්වාති**: තත්ථ ගන්ත්වා,

**ආසනං** නාම: පල්ලඞ්කස්ස ඔකාසො වුච්චති.

**නිසීදිත්වාති**: තස්මිං නිසීදිත්වා,

**සාමිකෙ අනාපුච්ඡා පක්කමෙය්‍යාති**: යො තස්මිං කුලෙ මනුස්සො විඤ්ඤූ තං අනාපුච්ඡා ආනොවස්සකං අතික්කාමෙන්තියා ආපත්ති පාචිත්තියස්ස. අජ්ඣොකාසෙ උපචාරං අතික්කාමෙන්තියා ආපත්ති පාචිත්තියස්ස.

අනාපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා පක්කමති ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ වෙමතිකා පක්කමති ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා පක්කමති ආපත්ති පාචිත්තියස්ස.

පල්ලඞ්කස්ස අනොකාසෙ ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස, ආපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති**: ආපුච්ඡා ගච්ඡති, අසංහාරිමෙ, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඤ්චමසික්ඛාපදං.**



Free Distribution www.aathaapi.org

2. ඉක්බිති ඒ මෙහෙණ තොමෝ මෙහෙණන්ට තෙල කරුණ ඇරොවූහ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති. දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණක් පෙරබත්හි කුලයන් වෙතැ එළැඹැ අසුනෙක්හි හිඳ හිමියන් නො පිළිවිසැ බැහැර ගියා දැ''යි ... සැබෑද මහණෙනි මෙහෙණක් පෙරබත්හි කුලයන් වෙතැ එළැඹැ අසුනෙක්හි හිඳ හිමියන් නො පිළිවිසැ බැහැර ගියා ද යි, සැබෑවැ භාග්‍යවතුන් වහන් , භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි මෙහෙණක් පෙරබත්හි කුලයන් වෙතැ එළැඹැ අසුනෙක්හි හිඳ හිමියන් නො පිළිවිසැ බැහැර ගියා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි,... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් පෙරබත්හි කුලයන් වෙතැ එළැඹැ අසුනෙක්හි හිඳ හිමියන් නො පිළිවිසැ බැහැර යා නම් පචිති වේ''** යයි.

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පුරෙභත්ත** නම්: අරුණ නැඟීම පටන් මද්දහන තෙක්.

**කුල** නම්: ක්ෂත්‍රිය කුල යැ බ්‍රාහ්මණ කුල යැ වෛශ්‍ය කුලයැ ශූද්‍ර කුල යැ යි කුල සතරෙකි.

**උපසඞ්කමිත්වා:** එහි ගොස්.

**ආසන** නම්: පලඟෙක්හි අවකාශය කියනු ලැබෙයි.

**නිසීදිත්වා:** එහි හිඳ,

**සාමිකෙ අනාපුච්ඡා පක්කමෙය්‍ය:** ඒ කුලයෙහි දනුමැති යම් මිනිසෙක් වේ නම් ඔහු නො පිළිවිසැ නිසවන ඉක්මවන්නියට පචිති ඇවැත් වෙයි. එළිමහනෙහි උවසර ඉක්මවන්නියට පචිති ඇවැත්වේ.

නො පිළිවිසියෙහි නො පිළිවිසි සන් ඇතියා බැහැර යේ නම් පචිති ඇවැත් වෙයි. නො පිළිවිසියෙහි විමති ඇතියා බැහැර යේ නම් පචිති ඇවැත් වෙයි. නො පිළිවිසියෙහි පිළිවිසි සන් ඇතියා බැහැර යේ නම් පචිති ඇවැත් වේ.

පලඟෙක අනවකාශයෙහි දුකුළා ඇවැත් වෙයි. පිළිවිසි-යෙහි නො පිළිවිසියන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිළිවිසි-යෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිළිවිසියෙහි පිළිවිසි සන් ඇතියා නම් ඇවැත් නැති.

පිළිවිසැ යා නම්, නො ගෙනැ යා හැකි අස්නෙහි නම්, ඇවැත් නැත. ගිලන් වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපදය යි.**

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදති පි අභිනිපජ්ජති පි. මනුස්සා ථුල්ලනන්දං භික්ඛුනිං හිරියමානා ආසනෙ නෙව අභිනිසීදන්ති, න අභිනිපජ්ජන්ති, මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදිස්සති පි අභිනිපජ්ජිස්සති පී"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදිස්සති පි අභිනිපජ්ජිස්සති පී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදති පි අභිනිපජ්ජති පීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදිස්සති පි අභිනිපජ්ජිස්සති පි, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනී පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පච්ඡාභත්තං** නාම: මජ්ඣන්හිකෙ වීතිවත්තෙ යාව අත්ථඞ්ගතෙ සූරියෙ.

**කුලං** නාම: චත්තාරි කුලානි ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං.

**උපසඞ්කමිත්වාති**: තත්ථ ගන්ත්වා.

**සාමිකෙ අනාපුච්ඡාති**: යො තස්මිං කුලෙ මනුස්සො සාමිකො දාතුං තං අනාපුච්ඡා.

**ආසනං** නාම: පල්ලඞ්කස්ස ඔකාසො වුච්චති.

**අභිනිසීදෙය්‍යාති**: තස්මිං අභිනිසීදති ආපත්ති පාචිත්තියස්ස.

**අභිනිපජ්ජෙය්‍යාති**: තස්මිං අභිනිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස.



Free Distribution www.aathaapi.org

## 4. 2. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පසුබත්‍ කුලයන් වෙත එළැඹ හිමියන් නො පිළිවිසැ අසුනෙහි හිඳීම ද කෙරෙයි. වැදහොවීම ද කෙරෙයි. මිනිස්සු ථුල්ලනන්ද භික්ෂුණියගෙන් ලජ්ජිත වෙන්නාහු අසුනෙහි නොමැ හිඳිත්, නොමැ හොවිත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයයා ථුල්ලනන්ද තොමෝ පසුබත්‍ කුලයන් වෙත එළැඹ හිමියන් නො පිළිවිසැ අසුනෙහි හිඳීම කළා ද? වැදහොවීම කළා දූ යි.

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයයා ථුල්ලනන්ද තොමෝ පසුබත්‍ කුලයන් වෙත එළැඹ හිමියන් නො පිළිවිසැ අසුනෙහි හිඳීමත් කළා ද? වැදහොවීමත් කළා දූ යි... සැබෑද මහණෙනි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පසුබත්‍ කුලයන් වෙත එළැඹ හිමියන් නො පිළිවිසැ අසුනෙහි හිඳීමත් කෙරේද? වැද හොවීමත් කෙරේ දූ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... ''කෙසේ නම් මහණෙනි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පසුබත්‍ කුලයන් වෙත එළඹ හිමියන් නො පිළිවිසැ අසුනෙහි හිඳීමත් කළාද? වැද හොවීමත් කළා දූ යි. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් පසුබත්‍ කුලයන් වෙත එළැඹ හිමියන් නො පිළිවිසැ අසුනෙහි හිඳිනම් හෝ වැද හොවී නම් හෝ පචිති වේ''යයි.**

3. **යා පන:** යම්, යම්බඳු...භික්ඛුනී .. මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පච්ඡාභත්ත** නම්, මද්දහන ඉක්මගිය කල්හි හිරු අවරට යන තෙක්.

**කුල** නම්; ක්ෂත්‍රියකුල යැ බ්‍රාහමණකුල යැ වෛශ්‍යකුල යැ ශුද්‍රකුල යැ යි කුල සතරෙකි.

**උපසඞ්කමිත්වා:** එහි ගොස්.

**සාමිකෙ අනාපුච්ඡා:** ඒ කුලයෙහි දෙන්නට හිමි යම් මිනිසෙක් වේ නම් ඔහු නො පිළිවිසැ.

**ආසන** නම්: පලඟෙක්හි අවකාශය කියනු ලැබෙයි.

**අභිනිසීදෙය්‍ය:** එහි හිඳි නම් පචිති ඇවැත් වෙයි.

අනාපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා ආසනා අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ වෙමතිකා ආසනෙ අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා ආසනෙ අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

පලඞ්ඛස්ස අනොකාසෙ ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ආපුච්ඡා ආසනෙ අභිනිසීදති වා අභිනිපජ්ජති වා ධුවපඤ්ඤත්තෙ, ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**ඡට්ඨසික්ඛාපදං.**

## 4. 2. 7

## සත්තමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තියො සායං අඤ්ඤතරං ගාමං උපගන්ත්වා අඤ්ඤතරං බ්‍රාහ්මණකුලං උපසඞ්කමිත්වා ඔකාසං යාචිංසු. අථ ඛො සා බ්‍රාහ්මණී තා භික්ඛුනියො එතදවොච "ආගමෙථ අය්‍යෙ යාව බ්‍රාහ්මණො ආගච්ඡතී"ති. භික්ඛුනියො යාව බ්‍රාහ්මණො ආගච්ඡතීති සෙය්‍යං සන්ථරිත්වා එකච්චා නිසීදිංසු, එකච්චා නිපජ්ජිංසු, අථ ඛො සො බ්‍රාහ්මණො රත්තිං ආගන්ත්වා තං බ්‍රාහ්මණිං එතදවොච, කා ඉමාති. භික්ඛුනියො අය්‍යාති. නික්කඩ්ඪථ[1] ඉමා මුණ්ඩා බන්ධකිනියොති ඝරතො නික්කඩ්ඪාපෙසි.

2. අථ ඛො තා භික්ඛුනියො සාවත්ථිං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො විකාලෙ කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා අභිනිසීදිස්සන්තිපි අභිනිපජ්ජිස්සන්තිපී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො විකාලෙ කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා අභිනිසීදන්තිපි අභිනිපජ්ජන්තිපී"ති සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො විකාලෙ කුලානි උපසම්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා අභිනිසීදිස්සන්තිපි අභිනිපජ්ජිස්සන්තිපි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

1. නික්කඩ්ඪථ සීමු i - මජසං,



Free Distribution www.aathaapi.org

නො පිළිවිසියෙහි නො පිළිවිසි සත් ඇතියා අසුනෙහි හිඳී නම් හෝ වැද හොවී නම් පචිති ඇවැත් වෙයි. නො පිළිවිසියෙහි විමති ඇතියා අසුනෙහි හිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවැත් වෙයි. නො පිළිවිසියෙහි පිළිවිසි සත් ඇතියා අසුනෙහි හිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවැත් වේ.

පලහෙක අවකාශයෙහි දුකුළා ඇවැත් වෙයි. පිළිවිසියෙහි නො පිළිවිසි සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිළිවිසියෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිළිවිසියෙහි පිළිවිසි සත් ඇතියා නම් ඇවැත් නැති.

පිළිවිසැ අසුනෙහි හිඳී නම් හෝ වැද හොවී නම් හෝ ඇවැත් නැති. නිති පැනවූයෙහි, ගිලන් වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

සවන සිකපද යි.

## 4. 2. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි බොහෝ මෙහෙණෝ කොසොල් දනව්වෙහි සිට සැවැතට යන්නාහු සවස එක්තරා ගමකට පැමිණ එක්තරා බමුණු කුලයක් වෙතැ එළැඹැ ඉඩක් ඉල්ලූහ. එකල්හි ඒ බැමිණි ඒ මෙහෙණන්ට "ආය්‍ය්‍යාවෙනි බමුණා එන තෙක් ඉවසවයි කිවු යැ. මෙහෙණෝ බමුණා එන තෙක් ශයනය අතුරා ඇතැම්හු හුන්හ. ඇතැම්හු හොත්හ. එකල්හි ඒ බමුණු රැ අවුත් එබැමිණිට මොහු කවුරුදැ යි කී යැ. ආය්‍ය්‍යය, මෙහෙණෝ යැ. මේ මුඩු වඳලියන් ඇදදමවයි ගෙයින් ඇදදූමවී යැ.

2. ඉක්බිති ඒ මෙහෙණෝ සැවැතට ගොස් මෙහෙණන්ට තෙල කරුණ ඇරොවූහ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ විකාලයෙහි කුලයන් වෙතැ එළැඹැ හිමියන් නො පිළිවිසැ ශය්‍යාව අතුරා හිඳීමත් කළෝ ද? වැද හොවීමත් කළෝ දැ යි ... සැබෑද මහණෙනි, මෙහෙණෝ විකාලයෙහි කුලයන් වෙතැ එළැඹැ හිමියන් නො පිළිවිසැ ශය්‍යාව අතුරා හිඳීමත් කෙරෙත් ද? වැද හොවීමත් කෙරෙත් දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි මෙහෙණෝ විකාලයෙහි කුලයන් වෙතැ එළැඹැ හිමියන් නො පිළිවිසැ ශය්‍යාව අතුරා හිඳීමත් කළෝ ද,? වැද හොවීමත් කළෝ ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.



Free Distribution www.aathaapi.org

**"යා පන භික්ඛුනී විකාලෙ කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**විකාලො** නාම: අත්ථඞ්ගතෙ සූරියෙ යාව අරුණුග්ගමනා.
**කුලං** නාම: චත්තාරිකුලානි ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං.

**උපසඞ්කමිත්වාති:** තත්ථ ගන්ත්වා.

**සාමිකෙ අනාපුච්ඡාති:** යො තස්මිං කුලෙ මනුස්සො සාමිකො දතුං තං අනාපුච්ඡා.

**සෙය්‍යං** නාම: අන්තමසො **පණ්ණසන්ථාරොපි.**

**සන්ථරිත්වාති:** සයං සන්ථරිත්වා.

**සන්ථරාපෙත්වාති:** අඤ්ඤං සන්ථරාපෙත්වා.

**අභිනිසීදෙය්‍යාති:** තස්මිං අභිනිසීදති ආපත්ති පාචිත්තියස්ස.

**අභිනිපජ්ජෙය්‍යාති:** තස්මිං අභිනිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස.

අනාපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස අනාපුච්ඡිතෙ වෙමතිකා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

ආපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ආපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදති වා අභිනිපජ්ජති වා, ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**සත්තමසික්ඛාපදං.**

**"යම් මෙහෙණක් විකාලයෙහි කුලයන් වෙතැ එළැඹැ හිමියන් නො පිළිවිසැ ශය්‍යාව අතුරා හෝ අතුරුවා හෝ හිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවැත් වේ'' යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්යෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**විකාල** නම්: හිරු අවරට ගිය කල්හි අරුණ නැඟීම තෙක්.

**කුල** නම්: ක්ෂත්‍රියකුල යැ බ්‍රාහමණකුල යැ වෛශ්‍යකුල යැ ශූද්‍රකුල යැ යි කුල සතරෙකි.

**උපසඞ්කමිත්වා:** එහි ගොස්.

**සාමිකෙ අනාපුච්ඡා:** ඒ කුලයෙහි දෙන්නට හිමි යම් මිනිසෙක් වේ නම් ඔහු නො පිළිවිසැ.

**සෙය්‍යා** නම්; යටත් පිරිසෙයින් කොළ ඇතිරියකුත්.

**සන්ථරිත්වා:** තොමෝ අතුරා.

**සන්ථරාපෙත්වා:** මෙරමා ලවා අතුරුවා.

**අභිනිසීදෙය්‍ය;** එහි හිඳී නම් පචිති ඇවැත් වෙයි.

**අභිනිපජ්ජෙය්‍ය:** එහි වැද හොවී නම් පචිති ඇවැත් වෙයි.

නො පිළිවිසියෙහි නො පිළිවිසිසත් ඇතියා ශය්‍යාව අතුරා හෝ අතුරුවා හෝ හිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවැත් වෙයි. නො පිළිවිසියෙහි විමති ඇතියා ශය්‍යාව අතුරා හෝ අතුරුවා හෝ හිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවැත් වෙයි. නො පිළිවිසියෙහි පිළිවිසිසත් ඇතියා ශය්‍යාව අතුරා හෝ අතුරුවා හෝ හිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවැත් වේ.

පිළිවිසියෙහි නො පිළිවිසිසත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිළිවිසියෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිළිවිසියෙහි පිළිවිසියත් ඇතියා නම් ඇවැත් නැති.

පිළිවිසැ ශය්‍යාව අතුරා හෝ අතුරුවා හෝ හිඳී නම් හෝ වැද හොවී නම් හෝ, ඇවැත් නැත. ගිලන්වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සත්වන සිකපදයි.**



Free Distribution www.aathaapi.org

## 4. 2. 8

## අට්ඨමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන **භද්දාය කාපිලානියා** අන්තෙවාසී භික්ඛුනී[1] භද්දං කාපිලානිං සක්කච්චං උපට්ඨෙති. භද්දා කාපිලානී භික්ඛුනියො එතදවොච: ''අයං මං අය්‍යා භික්ඛුනී සක්කච්චං උපට්ඨෙති ඉමිස්සාහං චීවරං දස්සාමී''ති. අථ ඛො සා භික්ඛුනී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙසි: ''අහං කිර අය්‍යෙ අය්‍යං න සක්කච්චං **උපට්ඨෙමි,** න කිර මෙ අය්‍යා චීවරං දස්සතී''ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙස්සතී''ති –පෙ– සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– ''කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙස්සති.'' නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**දුග්ගහිතෙනාති:** අඤ්ඤථා ගහිතෙන.

**දූපධාරිතෙනාති:** අඤ්ඤථා උපධාරිතෙන.

**පරන්ති:** උපසම්පන්නං උජ්ඣාපෙති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා උජ්ඣාපෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා උජ්ඣාපෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා උජ්ඣාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නං උජ්ඣාපෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස, අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

**අට්ඨමසික්ඛාපදං**

---

1. අන්තෙවාසිනී – මජසං. අන්තෙවාසී – සීමු, සීමුii

## 4. 2. 8

## අටවන සික‍පදය

1. ශ්‍රාවස්ති නිදනයි – එසමයෙහි වනාහි **භද්‍රා කාපිලානියගේ** අතැවැසි මෙහෙණක් තොමෝ භද්‍රා කාපිලානියට සකසා උවටැන් කෙරෙයි. **භද්‍රා** කාපිලානී තොමෝ මෙහෙණන්ට ''ආයඞාවෙනි, මේ මෙහෙණ මට සකසා උවටැන් කෙරෙයි. මැයට මම සිවුරක් දෙන්නෙමි''යි මෙය කිවු යැ. එකල්හි ඒ මෙහෙණ වරදවා ගන්නා ලද්දුයෙන් වරදවා දරන ලද්දුයෙන් මෙරමා ලමු කොට සිතවූ යැ. ආයඞාවෙනි, මම වනාහි ආයඞාවහට සකසා උවටැන් නො කෙරෙම් ල, ආයඞා තොමෝ මට සිවුරක් නො දෙන්නී ලැ යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණක් තොමෝ වරදවා ගන්නා ලද්දුයෙන් වරදවා දරන ලද්දුයෙන් මෙරමා ලමු කොට සිනවූ''**ද** යි ... සැබෑද මිහණෙනි, මෙහෙණක් තොමෝ වරදවා ගන්නා ලද්දුයෙන් වරදවා දරන ලද්දුයෙන් මෙරමා ලමු කොට සිතවූ **ද** යි. සැබැවැ භාගාවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් තොමෝ වරදවා ගන්නා ලද්දුයෙන් වරදවා දරන ලද්දුයෙන් මෙරමා ලමු කොට සිතවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙහෙණහු මේ සිකපදය මෙසේ උදෙසත්වා:

**''යම් මෙහෙණක් වරදවා ගන්නා ලද්දුයෙන් වරදවා දරන ලද්දුයෙන් මෙරමා ලමු කොට සිතවා නම් පචිති වේ'' යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**දුග්ගහිතෙන:** අන් පරිද්දෙකින් ගන්නා ලද්දුයෙන්,

**දූපධාරිතෙන:** අන් පරිද්දෙකින් දරන ලද්දුයෙන්.

**පරං:** උපසපනක ලමු කොට සිතවා නම් පචිති ඇවැත් වෙයි.

උපසපනක කෙරෙහි උපසපන්සඤ් ඇතියා ලමු කොට සිතවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා ලමු කොට සිතවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන්සඤ් ඇතියා ලමු කොට සිතවා නම් පචිති ඇවැත් වේ.

අනුපසපනක ලමු කොට සිතවා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන්සඤ් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන්සඤ් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**අටවන සික‍පද යි.**

## 4. 2. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අත්තනො භණ්ඩකං අපස්සන්තියො චණ්ඩකාළිං භික්ඛුනිං එතදවොචුං: "අපයොය්‍ය අම්හාකං භණ්ඩකං පස්සෙය්‍යාසී"ති. චණ්ඩකාළී භික්ඛුනී උජ්ඣායති ඛීයති විපාචෙති: "අහමෙව නූන චොරී, අහමෙව නූන අලජ්ජිනී" යා අය්‍යායො[1] අත්තනො භණ්ඩකං අපස්සන්තියො තා මං එවමාහංසු: "අපයොය්‍ය අම්හාකං භණ්ඩකං පස්සෙය්‍යාසී"ති. සචාහං අය්‍යෙ තුම්හාකං භණ්ඩකං ගණ්හාමි අස්සමණී හොමි බ්‍රහ්මචරියා චවාමි නිරයං උපපජ්ජාමි, යා පන මං අභූතෙන එවමාහ සාපි අස්සමණී හොතු බ්‍රහ්මචරියා චවතු නිරයං උපපජ්ජතූති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා චණ්ඩකාළී අත්තානම්පි පරම්පි නිරයෙනපි බ්‍රහ්මචරියෙනපි අභිසපිස්සතී"ති –පෙ– සච්චං කිර භික්ඛවෙ, චණ්ඩකාළී භික්ඛුනී අත්තානම්පි පරම්පි නිරයෙනපි බ්‍රහ්මචරියෙනපි අභිසපතීති,[2] සච්චං භගවා, විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම භික්ඛවෙ, චණ්ඩකාළී භික්ඛුනී අත්තානම්පි පරම්පි නිරයෙනපි බ්‍රහ්මචරියෙනපි අභිසපිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු;

**"යා පන භික්ඛුනී අත්තානං වා පරං වා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපෙය්‍ය පාචිත්තියන්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අත්තානන්ති:** පච්චත්තං

**පරන්ති:** උපසම්පන්නං

නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපති[3] ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපති ආපත්ති පාචිත්තියස්ස, උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපති ආපත්ති පාචිත්තියස්ස.

1. අය්‍යා – සිමු::
2. අභිසපෙසීති – සිමු::
3. අභිසපෙති – සිමු::



Free Distribution www.aathaapi.org

## 4. 2. 9

## නවවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ තමාගේ බඩු නො දක්නාහු චණ්ඩකාළී මෙහෙණට "ආයඖවෙනි, අපගේ බඩු දක්නෙහි"ද යි මෙය කීහු. චණ්ඩකාළී මෙහෙණ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: යම්, ආයඖ කෙනෙක් තමාගේ බඩු නො දක්නාහු ද, ඔහු මට "ආයඖවෙනි, අපගේ බඩු දක්නෙහි"ද යි මෙසේ කීහු යැ. මම් මැ එකාන්තයෙන් සෙරකිම් වෙම් ද, මම් මැ එකාන්තයෙන් ලජ්ජා නැතියකිම් වෙම් ද, ඉදින් ආයඖවෙනි, තොපගේ බඩු ගනිම් නම් නො මෙහෙණකිම් වෙමි. බඹසරින් ගිලිහෙමි, නිරයෙහි උපදිමි. යමක් වනාහි අභූතයෙන් මා හට මෙසේ කිවු ද, ඕ තොමෝත් නො මෙහෙණක් වේවා, බඹසරින් ගිලිහේවා, නිරයෙහි උපදීවා යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ආයඖ චණ්ඩකාළී තොමෝ තමාට ද මෙරමාට ද නිරයෙනුදු බඹසරිනුදු හැවූ"ද යි ... සැබෑද මහණෙනි, චණ්ඩකාළී මෙහෙණ තමාට ද මෙරමාට ද නිරයෙනුදු බඹසරිනුදු හවා ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, චණ්ඩකාළී මෙහෙණ තමාට ද මෙරමාට ද නිරයෙනුදු බඹසරිනුදු හැවූ ද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තමාහට හෝ මෙරමා හට හෝ නිරයයෙන් හෝ බඹසරින් හෝ හවා නම් පචිති වේ" යයි.**

3. **යා පනඃ** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අත්තානං:** තමා කෙරෙහි.

**පරං:** උපසපනකට නිරයයෙන් හෝ බඹසරින් හෝ හවා නම් පචිති ඇවැත් වේ.

උපසපනක කෙරෙහි උපසපන්සත් ඇතියා නිරයයෙන් හෝ බඹසරින් හෝ හවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා නිරයයෙන් හෝ බඹසරින් හෝ හවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන්සත් ඇතියා නිරයයෙන් හෝ බඹසරින් හෝ හවා නම් පචිති ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

තිරච්ඡානයොනියා වා පෙත්තිවිසයෙන වා මනුස්සදෙහගෙන වා අභිසපති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නං අභිසපති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස, අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති :** අත්ථපුරෙක්ඛාරාය, ධම්මපුරෙක්ඛාරාය, අනුසාසනිපුරෙක්ඛාරාය උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

නවමසික්ඛාපදං

## 4. 2. 10

### දසමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන **චණ්ඩකාළී භික්ඛුනී** භික්ඛුනීහි සද්ධිං භණ්ඩිත්වා අත්තානං වධිත්වා වධිත්වා රොදති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා චණ්ඩකාළී අත්තානං වධිත්වා වධිත්වා රොදිස්සතී''ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, චණ්ඩකාළී භික්ඛුනී අත්තානං වධිත්වා වධිත්වා රොදතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, චණ්ඩකාළී භික්ඛුනී අත්තානං වධිත්වා වධිත්වා රොදිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී අත්තානං වධිත්වා වධිත්වා රොදෙය්‍ය පාචිත්තිය''න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අත්තානන්ති:** පච්චත්තං.

වධති[1] රොදති ආපත්ති පාචිත්තියස්ස. වධති න රොදති ආපත්ති දුක්කටස්ස, රොදති න වධති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** ඤාතිබ්‍යසනෙන වා භොගබ්‍යසනෙන වා රොගබ්‍යසනෙන වා ඵුට්ඨා රොදති න වධති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං

**අන්ධකාරවග්ගො[2] දුතියො**

**තස්සුද්දානං:**

අන්ධකාරෙ පටිච්ඡන්නෙ අජ්ඣොකාසෙ සිඞ්ඝාටකෙ,
දෙව නාපුච්ඡා විකාලෙ ච දුග්ගාහී නිරයෙ වධීති.

---

1. වධිත්වා වධිත්වා—මජසං.
2. රත්තන්ධකාරවග්ගො – සී මු[illegible]



Free Distribution www.aathaapi.org

6, තිරශ්චීන යොනියෙන් හෝ ප්‍රෙතවිෂයයෙන් හෝ මනුෂ්‍ය දෞර්භාග්‍යයෙන් හෝ හවා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනකට හවා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන්සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන්සන් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

අර්ථය පෙරටු කොට කියන්නියට, ධර්මය පෙරටු කොට කියන්නියට, අනුශාසනය පෙරටු කොට කියන්නියට, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

නවවන සිකපද යි.

## 4. 2. 10

## දසවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි චණ්ඩකාළී මෙහෙණ මෙහෙණන් සමග කලහ කොට තමාට පැහැරැ පැහැරැ හඬයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්‍ය්‍යා චණ්ඩකාළී තමාට පැහැරැ පැහැරැ හැඬූ"ද යි. ... සැබෑද මහණෙනි, චණ්ඩකාළී මෙහෙණ තමාට පැහැරැ පැහැරැ හැඬූ ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, චණ්ඩකාළී මෙහෙණ තමාට පැහැරැ පැහැරැ හැඬූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තමාට පැහැරැ පැහැරැ හඬා නම් පචිති වේ" යයි.**

2. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී ..** මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අත්තානං:** තමා කෙරෙහි.

පහරා නම් හඬා නම් පචිති ඇවැත් වෙයි. පහරා නම් නො හඬා නම් දුකුළා ඇවැත් වෙයි. හඬා නම් නො පහරා නම් දුකුළා ඇවැත් වෙයි.

ඥාතිව්‍යසනයෙන් හෝ භොගව්‍යසනයෙන් හෝ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දී හඬා නම් නො පහරා නම්, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සිකපද යි.

ද්විතීය අන්ධකාර වර්ග යි.

**එහි උද්දානය:**

රත්තන්ධකාර යැ පටිච්ඡන්න යැ අජෙඣාකාස යැ සිඩ්සාටක යැ අනාපුච්ඡා දෙක යැ විකාල යැ දුග්ගහිත යැ නිරය යැ වධ යැ යි.



Free Distribution www.aathaapi.org

## 4. 3. 1

### පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො **අචිරවතියා** නදියා වෙසියාහි සද්ධිං නග්ගා එකතිත්ථෙ නහායන්ති. වෙසියා තා භික්ඛුනියො උප්පණ්ඩෙසුං: "කින්නු ඛො නාම තුම්හාකං අය්‍යෙ දහරානං දහරානං[1] බ්‍රහ්මචරියං චිණ්ණෙන. නනු නාම කාමා පරිභුඤ්ජිතබ්බා. යදා ජිණ්ණා භවිස්සථ තදා බ්‍රහ්මචරියං චරිස්සථ. එවං[2] තුම්හාකං උභො අත්ථා පරිග්ගහිතා භවිස්සන්තී"ති භික්ඛුනියො වෙසියාහි උප්පණ්ඩියමානා මඞ්කූ[3] අහෙසුං. අථ ඛො තා භික්ඛුනියො උපස්සයං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ, භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච සඞ්ඝසුට්ඨුතාය –පෙ– විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී නග්ගා නහායෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**නග්ගා නහායෙය්‍යාති:** අනිවත්ථා වා අපාරුතා වා නහායති පයොගෙ දුක්කටං, නහානපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** අච්ඡින්නචීවරිකාය නට්ඨචීවරිකාය[4] ආපදාසු උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

## 4. 3. 2

### දුතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛුනීනං උදක සාටිකා අනුඤ්ඤාතා හොති. ඡබ්බග්ගියා භික්ඛුනියො භගවතා උදකසාටිකා අනුඤ්ඤාතාති අප්පමාණිකායො උදකසාටිකායො ධාරෙන්ති[5] පුරතොපි පච්ඡතොපි ආකඩ්ඪන්තා[6] ආහිණ්ඩන්ති.

---

1. අය්‍යෙ දහරානං – මජසං
2. එවං – මජසං: එවඤ්ච – සී ii
3. මඞ්කු – සීමු i සීමු ii සී ii
4. අච්ඡින්නචීවරිකාය වා නට්ඨචීවරිකාය වා – සීමු i
5. ධාරෙසුං – මජසං
6. කඩ්ඪන්තා – සීමු ii



Free Distribution www.aathaapi.org

# 4. 3. 1

## පළමු සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **සැවැතැ ජේතවන** නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි බොහෝ මෙහෙණෝ **අචිරවතී** නදියෙහි වෙසඟනන් සමඟ නග්න වැ එක් තොටැ ස්නානය කෙරෙති. වෙසඟනෝ ඒ මෙහෙණන්හට කෙළිකවට කම් කළහ: ''ආයඹාවෙනි, ඉතා තරුණ වූ තොපට බඹසර පුරුදු කිරීමෙන් කිනම් ප්‍රයොජනයක් ද? කාමයෝ පරිභොග කළ යුත්තෝ නො වෙත් ද? යම් කලෙකැ මහලුවූවෝ වන්නාහු නම් එකල්හි බඹසර හැසිරෙවු. මෙසේ වනාහි තොප විසින් දෙ කරුණ මැ අයත් කොට ගන්නා ලද්දේ වන්නේ''යැ යි. වෙසඟනන් විසින් කෙළි කවට කම් කරනු ලබන මෙහෙණෝ මකුවූහු. එකල්හි ඒ මෙහෙණෝ මෙහෙණවරට ගොස් මෙහෙණන්ට තෙල කරුණු ඇරොජූහ. මෙහෙණෝ මහණුන්ට තෙල කරුණ ඇරොජූහ. මහණෝ භාග්‍යවතුන්ට තෙල කරුණ ඇරොජූහු. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසර යෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක: එසේ නම් මහණෙනි, මෙහෙණන්ට දස කරුණක් පිණිස සිකපද පනවන්නෙමි. සඞසයාගේ මනා පිළිගැන්ම පිණිස යැ ... විනයට රුකුල් පිණිස යැ මෙසේ මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් නග්න වැ ස්නාන කෙරේ නම් පචිති වේ''යයි.**

2. **යා පන:** යම්, යම්බඳු ... **භික්‍ෂුනී** ... මේ තොමේ මේ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**නග්ගා නහායෙය්‍ය:** නො හඳනා ලද්දී හෝ නො පොරවන ලද්දී හෝ ස්නාන කෙරේ නම් පියෝහි දුකුළා ඇවැත් වෙයි. සැනැහුම් පිරියනැ පචිති ඇවැත් වේ.

අසිඳැගත් සිවුරු ඇතියාට නට සිවුරු ඇතියාට ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පළමු සිකපද යි.**

# 4. 3. 2

## දෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි - එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙහෙණන්ට දියසළුව අනුදන්නා ලද්දේ වෙයි. සවග මෙහෙණෝ භාග්‍යවතුන් වහන්සේ විසින් දියසළුව අනුදන්නා ලද යි පමණ ඉක්ම වූ දියසළු දරත්, ඉදිරිපසිනුදු පසුපසිනුදු අදිමින් ඇවිදිත්.



Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො අප්පමාණිකායො උදකසාටිකායො ධාරෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො අප්පමාණිකායො උදකසාටිකායො ධාරෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො අප්පමාණිකායො උදකසාටිකායො ධාරෙස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"උදකසාටිකම්පන භික්ඛුනියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං: දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ද්වෙ විදත්ථියො. තං අතික්කාමෙන්තියා ඡෙදනකං පාචිත්තිය"න්ති.**

3. **උදකසාටිකා**[1] නාම: යාය නිවත්ථා[2] නහායති,

**කාරයමානායාති**: කරොන්තියා වා කාරාපෙන්තියා වා. පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං: දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ද්වෙ විදත්ථියො, තං අතික්කාමෙත්වා කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං. පටිලාභෙන ඡින්දිත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස, අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: පමාණිකං කරොති, ඌනකං කරොති, අඤ්ඤෙන කතං පමාණාතික්කන්තං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති, විතානං වා භුම්මත්ථරණං[3] වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දුතියසික්ඛාපදං

1. උදකසාටිකානාම-සීමු ii
2. නිවත්ථාය- සයා,
3. භුම්මත්ථරණං - මජසං.



Free Distribution www.aathaapi.org

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණෝ පමණ ඉක්ම වූ දියසළු දරුහු''ද යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙණෝ පමණ ඉක්ම වූ දියසළු දරත් ද යි. සැබැවැ භාග්‍ය වතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණෝ පමණ ඉක්ම වූ දියසළු දරුහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''දියසළුවක් කරවනු ලබන මෙහෙණක විසින් පමණ ඇති වැ කැරැවිය යුතු යි. එහි මේ පමණ යෑ: දිගින් සුගත් වියතින් සිවු වියතෙක. සරසින් දෙවියතෙකි, එ පමණ ඉක්මවන්නියට සිඳැලීමෙන් පසු දෙසිය යුතු ඇවැත් වේ''යයි.**

3. **උදකසාටිකා** නම්: යමෙකින් හඳනා ලද්දී සනහා නම් හෝ යැ.

**කාරයමානාය:** කරන්නිය විසින් හෝ කරවන්නිය විසින් හෝ පමණ ඇති වැ කැරැවිය යුතු යි. එහි මේ පමණ යෑ: දිගින් සුගත් වියතින් සිවු වියතෙක. සරසින් දෙවියතෙකි. එපමණ ඉක්ම වා කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝහි දුකුළා වෙයි. පිළිලැබීමෙන් සිඳැ පචිති දෙසිය යුතු.

තමා විසින් නිමාම් නො කරන ලද්ද තොමෝ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද තොමෝ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් පිළිලැබ පිරිබෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

පමණ ඇති කොට කෙරේ නම්, ඌනු කොට කෙරේ නම්, මෙරමා විසින් කරන ලද පමණ ඉක්මවූවක් පිළිලැබ සිඳපියා පිරිබෝ කෙරේ නම්, වියනක් හෝ බුමුතුරුණක් හෝ කඩතුරාවක් හෝ බිස්සක් හෝ මාවුලාවක් හෝ කෙරේ නම්, ඇවැත් නො වෙයි. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**දෙවන සිකපදයි.**

## 4. 3. 3

### තතියසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරිස්සා භික්ඛුනියා මහග්ඝ චීවරදුස්සස්ස චීවරං දුක්කතං[1] හොති දුස්සිබ්බිතං. ථුල්ලනන්දා භික්ඛුනී තං භික්ඛුනිං එතදවොච: ''සුන්දරං ඛො ඉදං තෙ අය්‍යෙ චීවරදුස්සං. චීවරඤ්ච ඛො දුක්කතං දුස්සිබ්බිත''න්ති. විසිබ්බෙමි[2] අය්‍යෙ සිබ්බිස්සසීති[3]. ආමය්‍යෙ සිබ්බිස්සාමීති[4]. අථ ඛො සා භික්ඛුනී තං චීවරං විසිබ්බෙත්වා ථුල්ලනන්දාය භික්ඛුනියා අදාසි. ථුල්ලනන්දා භික්ඛුනී සිබ්බිස්සාමි සිබ්බිස්සාමීති නෙව සිබ්බෙති[5] න සිබ්බාපනාය උස්සුක්කං කරොති. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා භික්ඛුනියා චීවරං විසිබ්බාපෙත්වා නෙව සිබ්බිස්සති න සිබ්බාපනාය උස්සුක්කං කරිස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා චීවරං විසිබ්බාපෙත්වා නෙව සිබ්බෙති න සිබ්බාපනාය උස්සුක්කං කරොතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා චීවරං විසිබ්බාපෙත්වා නෙව සිබ්බිස්සති නසිබ්බාපනාය උස්සුක්කං කරිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී භික්ඛුනියා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව සිබ්බෙය්‍ය න සිබ්බාපනාය උස්සුක්කං කරෙය්‍ය අඤ්ඤත්‍ර චතූහපඤ්චාහා පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

---

1. දුක්කටං - මජසං.
2. සිබ්බෙමි - සිමු.
3. සිබ්බිස්සසීති - මජසං.
4. සිබ්බිස්සාමීති - මජසං.
5. සිබ්බති - මජසං.

## 4. 3. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි එක්තරා මෙහෙණ-කගේ මාඇඟි සිවුරු පිළියෙන් සිවුරෙක් නො මනා කොට කරන ලද්දේ නො මනා කොට ගෙත්තම් කරන ලද්දේ වෙයි. ථුල්ලනන්ද භික්ෂුණී එ මෙහෙණට මෙය කීවුයැ. "ආර්යාවෙනි, තොපගේ මේ සිවුරු පිළිය සොඳුරු එහෙත් සිවුර නො මනා කොට කරන ලද්දේ නො මනා කොට ගෙත්තම් කරන ලද්දේ මැ"යි. ආර්යාවෙනි, ගෙත්තම් හරනෙමි. ගෙත්තම් කෙරෙහි ද යි. එසේ යැ ආර්යාවෙනි, ගෙත්තම් කරන්නෙමි යි. එකල්හි ඒ මෙහෙණ ඒ සිවුර ගෙත්තම් හැර ථුල්ලනන්ද භික්ෂුණියට දුනු යැ. ථුල්ලනන්ද භික්ෂුණී "ගෙත්තම් කරන්නෙමි ගෙත්තම් කරන්නෙමි" යි නොම ගෙත්තම් කරයි. ගෙත්තම් කැරැවීම් පිණිස වැයම් නො කරයි. එකල්හි ඒ මෙහෙණ මෙහෙණන්ට නෙල කරුණ ඇරොප්පු යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති "කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද නොමෝ මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් හරවා නො මැ ගෙත්තම් කළා ද? ගෙත්තම් කැරැවීම් පිණිස වැයම් නො කළා"දැ යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් හරවා නොමැ ගෙත්තම් කෙරේ ද? ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් හරවා නොමැ ගෙත්තම් කළා ද? ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කළා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් හැර හෝ ගෙත්තම් හරවා හෝ පසුවැ අනාතුරක් නැත්තී සිවුදිනක් පස්දිනක් තබා නො මැ ගෙත්තම් කෙරේ නම් ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති වේ" යැයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.



Free Distribution www.aathaapi.org

**භික්ඛුනියාති:** අඤ්ඤාය භික්ඛුනියා.

**චීවරං නාම:** ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං.

**විසිබ්බෙත්වාති:** සයං විසිබ්බෙත්වා.

**විසිබ්බාපෙත්වාති:** අඤ්ඤං විසිබ්බාපෙත්වා.

**සා පච්ඡා අනන්තරායිකිනීති:** අසති අන්තරායෙ.

**නෙව සිබ්බෙය්‍යාති:** න සයං සිබ්බෙය්‍ය.

**න සිබ්බාපනාය උස්සුක්කං කරෙය්‍යාති:** න අඤ්ඤං ආණාපෙය්‍ය.

**අඤ්ඤත්‍ර චතුහපඤ්චාහාති:** ඨපෙත්වා චතුහපඤ්චාහං නෙව සිබ්බෙස්සාමි න සිබ්බාපනාය උස්සුක්කං කරිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව සිබ්බෙති න සිබ්බාපනාය උස්සුක්කං කරොති අඤ්ඤත්‍ර චතුහපඤ්චාහා ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව සිබ්බෙති න සිබ්බාපනාය උස්සුක්කං කරොති අඤ්ඤත්‍ර චතුහපඤ්චාහා ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව සිබ්බෙති න සිබ්බාපනාය උස්සුක්කං කරොති අඤ්ඤත්‍ර චතුහපඤ්චාහා ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤං පරික්ඛාරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව සිබ්බෙති න සිබ්බාපනාය උස්සුක්කං කරොති අඤ්ඤත්‍ර චතුහපඤ්චාහා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව සිබ්බෙති න සිබ්බාපනාය උස්සුක්කං කරොති අඤ්ඤත්‍ර චතුහපඤ්චාහා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** සති අන්තරායෙ, පරියෙසිත්වා න ලභති, කරොන්තී චතුහපඤ්චාහං අතික්කාමෙති, ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති,

**තතියසික්ඛාපදං**

**භික්ඛුනියා:** අන් මෙහෙණකගේ.

**චීවර** නම්: සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා සිවුරෙකි.

**විසිබ්බෙත්වා:** තොමෝ ගෙත්තම් හැරැ.

**විසිබ්බාපෙත්වා:** මෙරමා ලවා ගෙත්තම් හරවා.

**සා පච්ඡා අනන්තරායිකිනී:** අනතුරක් නැති කල්හි.

**නෙව සිබ්බෙය්‍ය:** තොමෝ ගෙත්තම් නො කරන්නේ යැ.

**න සිබ්බාපනාය උස්සුක්කං කරෙය්‍ය:** මෙරමාහට නො අණවන්නේ යැ.

**අඤ්ඤත්‍ර චතුහපඤ්චාහං:** සිවු දිනක් පස් දිනක් තබා නො මැ ගෙත්තම් කරන්නෙමි. ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කරන්නෙ මි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

උපසපනක කෙරෙහි උපසපන් සත් ඇතියා සිවුරක් ගෙත්තම් හැරැ හෝ ගෙත්තම් හරවා හෝ ඕ තොමෝ පසුවැ අනතුරක් නැත්තී සිවු දිනක් පස් දිනක් තබා තොමැ ගෙත්තම් කෙරේ නම් ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා සිවුරක් ගෙත්තම් හැරැ හෝ ගෙත්තම් හරවා හෝ ඕ තොමෝ පසු වැ අනතුරක් නැත්තී සිවුදිනක් පස්දිනක් තබා නො මැ ගෙත්තම් කෙරේ නම් ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන් සත් ඇතියා සිවුරක් ගෙත්තම් හැරැ හෝ ගෙත්තම් හරවා හෝ ඕ තොමෝ පසු වැ අනතුරක් නැත්තී සිවුදිනක් පස්දිනක් තබා නො මැ ගෙත්තම් කෙරේ නම් ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති ඇවැත් වේ.

අන් පිරිකරක් ගෙත්තම් හැරැ හෝ ගෙත්තම් හරවා හෝ ඕ තොමෝ පසු වැ අනතුරක් නැත්තී සිවුදිනක් පස්දිනක් තබා නො මැ ගෙත්තම් කෙරේ නම් ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනැගේ සිවුරක් හෝ අන්පිරිකරක් හෝ ගෙත්තම් හැරැ හෝ ගෙත්තම් හරවා හෝ ඕ තොමෝ පසු වැ අනතුරක් නැත්තී සිවු දිනක් පස් දිනක් තබා නො මැ ගෙත්තම් කෙරේ නම් ගෙත්තම් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා නො ලබා නම්, කරන්නී සිවු දිනක් පස් දිනක් ඉක්මවා නම්, ඇවැත් නැත. ගිලන්වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති

**තෙවන සිකපද යි.**

# 4. 3. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථි නිදානං:– තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භික්ඛුනීනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමන්ති, තානි චීවරානි චිරං නික්ඛිත්තානි කණ්ණකිතානි හොන්ති. තානි භික්ඛුනියො ඔතාපෙන්ති, භික්ඛුනියො තා භික්ඛුනියො එතදවොචුං; 'කස්සිමානි අය්‍යෙ චීවරානි කණ්ණකිතානීති''. අථ ඛො තා භික්ඛුනියො භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'කථං හි නාම භික්ඛුනියො භික්ඛුනීනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමිස්සන්තී''ති –පෙ– සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො භික්ඛුනීනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො භික්ඛුනීනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී පඤ්චාහිකං සඞ්ඝාටිචාරං[1] අතික්කාමෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පඤ්චාහිකං සඞ්ඝාටිචාරං අතික්කාමෙය්‍යාති:** පඤ්චමං දිවසං පඤ්චචීවරානි නෙව නිවාසෙති න පාරුපති න ඔතාපෙති පඤ්චමං දිවසං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

පඤ්චාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤා ආපත්ති පාචිත්තියස්ස. පඤ්චාහාතික්කන්තෙ වෙමතිකා ආපත්ති පාචිත්තියස්ස. පඤ්චාහාතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤා ආපත්ති පාචිත්තියස්ස.

පඤ්චාහානතික්කන්තෙ[2] අතික්කන්තසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. පඤ්චාහානතික්කන්තෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. පඤ්චාහානතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** පඤ්චමං දිවසං පඤ්චචීවරානි නිවාසෙති වා පාරුපති වා ඔතාපෙති වා, ගිලානාය ආපදාසු උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං**

---

1. සඞ්ඝාටිවාරං--සතා,
2. පඤ්චාහා අනතික්කන්තෙ – මජසං,



Free Distribution www.aathaapi.org

## 4. 3. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදානයි – එසමයෙහි වනාහි මෙහෙණෝ මෙහෙණන් අතැ සිවුරු තබා හඳනය සහිත උතුරුසඟ සිවුරෙන් යුතු වැ දනවුසැරි සැරීමට යෙති. ඒ සිවුරු බොහෝ කල් බහා තබන ලද්දාහු හටගත් පුස් ඇතියාහු වෙති. ඒ සිවුරු මෙහෙණෝ වියළවත්. මෙහෙණෝ ඒ මෙහෙණන්ට "ආර්යාවෙනි, හටගත් පුස් ඇති මේ සිවුරු කවරක්හුගේද"යි තෙල කරුණ කීහු. එකල්හි ඒ මෙහෙණෝ මහණුන්ට තෙල කරුණ ඇරොජූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් මෙහෙණෝ මෙහෙණන් අතැ සිවුරු තබා හඳනය සහිත උතුරු සඟ සිවුරෙන් යුතු වැ දනවු සැරිසැරීමට ගියාහු ද"යි. සැබෑද මහණෙනි, මෙහෙණෝ මෙහෙණන් අතැ සිවුරු තබා හඳනය සහිත උතුරු සඟ සිවුරෙන් යුතු වැ දනවු සැරිසැරීමට යෙද්ද"යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ මෙහෙණන් අතැ සිවුරු තබා හඳනය සහිත උතුරු සඟ සිවුරෙන් යුතු වැ දනවු සැරිසැරීමට ගියාහු ද? මහණෙනි, මේය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා :

**"යම් මෙහෙණක් පස්දිනක් සිවුරු පිරිවැටුම ඉක්මවා නම් පචිති වේ" යයි.**

3. **යා පන**; යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ නොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පඤ්චාහිකං සඞ්ඝාටිචාරං අතික්කාමෙය්‍ය**: පස්වන දිනයෙහි සිවුරුපස නොම හඳී නම් නො මැ පොරවා නම් නො මැ වියළා නම් පස්වන දිනය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

පස්දිනය ඉක්මගිය කල්හි ඉක්මගිය සත් ඇතියා නම් පචිති ඇවැත් වෙයි. පස්දිනය ඉක්මගිය කල්හි විමති ඇතියා නම් පචිති ඇවැත් වෙයි. පස්දිනය ඉක්මගිය කල්හි නො ඉක්මගිය සත් ඇතියා නම් පචිති ඇවැත් වේ.

පස්දිනය නො ඉක්මගිය කල්හි ඉක්මගිය සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පස්දිනය නො ඉක්මගිය කල්හි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පස්දිනය නො ඉක්මගිය කල්හි නො ඉක්ම ගිය සත් ඇතියා නම් ඇවැත් නැති.

පස්වන දිනයෙහි සිවුරු පස හඳී නම් හෝ පොරවා නම් හෝ වියළා නම් හෝ, ඇවැත් නැත. ගිලන් වූවාට ආපදයෙහි උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සතරවන සිකපද යි.**



Free Distribution www.aathaapi.org

## 4. 3. 5

### පඤ්චමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා **භික්ඛුනී** පිණ්ඩාය චරිත්වා අල්ලචීවරං පත්ථරිත්වා විහාරං **පාවිසි.** අඤ්ඤතරා **භික්ඛුනී** තං චීවරං පාරුපිත්වා ගාමං පිණ්ඩාය පාවිසි. **සා** නික්ඛමිත්වා **භික්ඛුනියො පුච්ඡි:** ''අපය්‍යො මය්හං චීවරං පස්සෙය්‍යාථා''ති. **භික්ඛුනියො** තස්සා **භික්ඛුනියා** එතමත්ථං ආරොචෙසුං. අථ **ඛො සා භික්ඛුනී උජ්ඣායති ඛීයති** විපාචෙති: ''කථං හි නාම **භික්ඛුනී** මය්හං **චීවරං** අනාපුච්ඡා පාරුපිස්සතී''ති. අථ ඛො සා **භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං** ආරොචෙසි.

2. යා තා **භික්ඛුනියො** අප්පිච්ඡා -පෙ- තා **උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති:** ''කථං හි නාම **භික්ඛුනී භික්ඛුනියා චීවරං** අනාපුච්ඡා පාරුපිස්සතී''ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, **භික්ඛුනී භික්ඛුනියා චීවරං** අනාපුච්ඡා පාරුපති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, **භික්ඛුනී භික්ඛුනියා** චීවරං අනාපුච්ඡා පාරුපිස්සතී 'ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, **භික්ඛුනියො** ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යා පන භික්ඛුනී චීවරසඞ්කමනීයං ධාරෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**චීවරසඞ්කමනීයං** නාම: උපසම්පන්නාය පඤ්චන්නං චීවරානං අඤ්ඤතරං චීවරං. තස්සා වා අදින්නං තං වා අනාපුච්ඡා නිවාසෙති වා පාරුපති වා ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා චීවරසඞ්කමනීයං ධාරෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා චීවරසඞ්කමනීයං ධාරෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා චීවරසඞ්කමනීයං ධාරෙති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නාය චීවරසඞ්කමනීයං ධාරෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** සා වා දෙති, තං වා ආපුච්ඡා නිවාසෙති වා පාරුපති වා, අච්ඡින්නචීවරිකාය, නට්ඨචීවරිකාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඤ්චමසික්ඛාපදං**



Free Distribution www.aathaapi.org

# 4. 3. 5

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදනයි – එ සමයෙහි චනාහි එක්තරා මෙහෙණක් පිඩුපිණිස හැසිරැ තෙත් සිවුර විදහා වෙහෙරට පිවිසියා යැ. එක්තරා මෙහෙණක් ඒ සිවුර පෙරව ගමට පිඩුපිණිස පිවිසියා යැ. ඕ තොමෝ (වෙහෙරින්) නික්ම ''ආයඝාවෙනි මාගේ සිවුර දුටුවහු දැ'' යි මෙහෙණන් පිළිවුසූ යැ. මෙහෙණෝ ඒ මෙහෙණට තෙල කරුණ ඇරොජුහු. ඉක්බිති ඒ මෙහෙණ ලමුකොට සිතයි; නුගුණ පවසයි, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණක් මාගේ සිවුර නො පිළිවිසැ පෙරවූ දැ'' යි එකල්හි ඒ මෙහෙණ මෙහෙණන් ට තෙලකරුණ ඇරොජූ යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමුකොට සිතති නුගුණ පවසති දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණක් මෙහෙණකගේ සිවුරක් නො පිළිවිසැ පෙරවූ දැ''යි ... සැබෑද මහණෙනි, මෙහෙණක් මෙහෙණකගේ සිවුරක් නොපිළිවිසැ පෙරවූද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් මෙහෙණක ගේ සිවුරක් නො පිළිවිසැ පෙරවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේසිකපදය උදෙසත්වා:

''යම් මෙහෙණක් යළි දියයුතු සිවුරක් ධරා නම් පචිති වේ'' යයි.

3. යා පන : යම්, යම්බඳු ... භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්ථ යෙහි ලා අදහස් කරනලද භික්ෂුණී යි.

**චීවරසංකමනීය** නම් : උපසපනකගේ සිවුරුපස අතුරෙන් එක්තරා සිවුරෙකි. ඇය විසින් නො දුන් හෝ ඇය නො පිළිවිසැ හෝ හඳී නම් හෝ පොරවා නම් හෝ පචිති ඇවැත් වේ.

උපසපනක කෙරෙහි උපසපන් සත් ඇතියා යළි දියයුතු සිවුරක් ධරා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා යළි දිය යුතු සිවුරක් ධරා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන් සත් ඇතියා යළි දියයුතු සිවුරක් ධරා නම් පචිති ඇවැත් වේ.

අනුපසපනකගේ යළි දියයුතු සිවුරක් ධරා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනු පසපනක කෙරෙහි අනුපසපන් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

ඕ මැ දේ නම් හෝ ඇය පිළිවිසැ හෝ හඳී නම් පොරවා නම්, අසිඳගත් සිවුරු ඇතියාට (ඇවැත් නොවෙයි), නට සිවුරු ඇතියාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

පස්වන සිකපද යි.

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා උපට්ඨාකකුලං ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොච: "භික්ඛුනිසඞ්ඝස්ස අය්‍යෙ චීවරං දස්සාමා"ති. ථුල්ලනන්දා භික්ඛුනී තුම්හෙ බහුකිච්චා බහුකරණීයාති අන්තරායං අකාසි. තෙන ඛො පන සමයෙන තස්ස කුලස්ස ඝරං ඩය්හති, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අම්හාකං[1] දෙය්‍යධම්මං අන්තරායං කරිස්සති උභයෙනම්හා[2] පරිහීනා[3] භොගෙහි ච පුඤ්ඤෙන චා"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා ගණස්ස චීවරලාභං අන්තරායං කරිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී ගණස්ස චීවරලාභං අන්තරායං අකාසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ගණස්ස චීවරලාභං අන්තරායං කරිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ගණස්ස චීවරලාභං අන්තරායං කරෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ගණො** නාම: භික්ඛුනීසඞ්ඝො වුච්චති.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගපච්ඡිමං,[4]

**අන්තරායං කරෙය්‍යාති:** කථං ඉමෙ චීවරං දදෙය්‍යුන්ති[5] අන්තරායං කරොති ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤං පරික්ඛාරං අන්තරායං කරොති ආපත්ති දුක්කටස්ස. සම්බහුලානං භික්ඛුනීනං වා එකභික්ඛුනියා වා අනුපසම්පන්නාය වා චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං අන්තරායං කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** ආනිසංසං දස්සෙත්වා නිවාරෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසික්ඛාපදං

---

1. ථුල්ලනන්දා ගණස්ස අම්හාකං—සිමු॥
2. උභයෙනාම්හ—මජසං.
3. පරිබාහිරා—මජසං.
4. විකප්පනූපගං පච්ඡිමං—මජසං.
5. කථං ඉමෙ චීවරං න දදෙය්‍යුන්ති—මජසං. සිමු॥ සී॥



Free Distribution www.aathaapi.org

# 4. 3. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි — එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුනිය ගේ උපස්ථායක කුලය ථුල්ලනන්ද භික්ෂුණියට මෙය කීයැ. ''ආයඝාවෙනි මෙහෙණ සඟනට සිවුරක් දෙන්නෙමු'' යි. ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ තෙපි බොහෝ කිස ඇතියහ. බොහෝ ඇවැසි කටයුතු ඇතියහ යි අනතුරු කළා යැ. එ සමයෙහි වනාහි ඒ කුලයාගේ ගෙය දැවෙයි. ඔහු ලමුකොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයඝා ථුල්ලනන්ද තොමෝ අපගේ පිදියයුතු වස්තුවට අනතුරු කළා ද ? අපි භොගයෙන් ද පිනෙන් ද යි දෙපසින් පිරිහුණමෝහ''යි.

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයඝා ථුල්ලනන්ද තොමෝ ගණයාගේ චීවරලාභයට අනතුරු කළා ද''යි ...සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී ගණයාගේ චීවරලාභයට අනතුරු කළා ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී ගණයාගේ චීවරලාභයට අනතුරු කළා ද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් ගණයාගේ චීවරලාභයට අනතුරු කෙරේ නම් පචිති වේ'' යයි.**

3. **යා පන :** යම්, යම්බඳු ... **භික්ෂුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණියයි.

**ගණ නම් :** භික්ෂුණී සංඝයා කියනු ලැබේ.

**චීවර නම් :** සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා විකැපීමට සුදුසු පැසුළු සිවුර යි.

**අන්තරායං කරෙය්‍ය :** කෙසේ මොහු සිවුරක් දෙන්නාහු ද යි අනතුරු කෙරේ නම් පචිති ඇවැත් වෙයි. අන් පිරිකරකට අනතුරු කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. බොහෝ මෙහෙණන්ගේ හෝ එක් මෙහෙණකගේ හෝ අනුපසපනකගේ හෝ චීවරලාභයට හෝ අන්‍යපරිෂ්කාරලාභයට හෝ අනතුරු කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

අනුසස් දක්වා වළකා නම්, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සවන සිකපද යි**

## 4. 3. 7

### සත්තමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන භික්ඛුනීසඞ්ඝස්ස අකාලචීවරං උප්පන්නං හොති. අථ ඛො භික්ඛුනීසඞ්ඝො තං චීවරං භාජෙතුකාමො සන්නිපති. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා අන්තෙවාසී භික්ඛුනියො[1] පක්කන්තා හොන්ති. ථුල්ලනන්දා භික්ඛුනී තා භික්ඛුනියො එතදවොච: ''අය්‍යා භික්ඛුනියො පක්කන්තා න තාව චීවරං භාජයිස්සතී''ති[2] ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහි[3]. භික්ඛුනියො න තාව චීවරං භාජයිස්සන්තීති පක්කමිංසු[4] ථුල්ලනන්දා භික්ඛුනී අන්තෙවාසිභික්ඛුනීසු[5] ආගතාසු තං චීවරං භාජාපෙසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහිස්සතී''ති –පෙ– සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ධම්මිකො** නාම **චීවරවිභඞ්ගො:** සමග්ගො භික්ඛුනීසඞ්ඝො සන්නිපතිත්වා භාජෙති.

**පටිබාහෙය්‍යාති:** කථං ඉදං[6] චීවරං භාජෙය්‍යාති[7] පටිබාහති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මිකෙ ධම්මිකසඤ්ඤා පටිබාහති ආපත්ති පාචිත්තියස්ස. ධම්මිකෙ වෙමතිකා පටිබාහති ආපත්ති දුක්කටස්ස. ධම්මිකෙ අධම්මිකසඤ්ඤා පටිබාහති අනාපත්ති.

අධම්මිකෙ ධම්මිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මිකෙ අධම්මිකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ආනිසංසං දස්සෙත්වා පටිබාහති උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

**සත්තමසික්ඛාපදං.**

---

1. අන්තෙවාසිනියො භික්ඛුනියො – මජසං.
2. භාජියිස්සතීති–සීමු; පී; භාජීයිස්සතීති – මජසං
3. පටිබාහති – මජසං
4. විපක්කමිංසු – සභා.
5. අන්තෙවාසිසු භික්ඛුනීසු – මජසං.
6. ඉමං – මජසං.
7. න භාජෙය්‍යාති – සීමු



Free Distribution www.aathaapi.org

# 4. 3. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එ සමයෙහි වනාහි මෙහෙණ සඟනට නො කල් සිවුරෙක් උපන්නේ වෙයි. එකල්හි මෙහෙණසඟහු ඒ සිවුර බෙදනු කැමැති ව රැස්වූහ. එසමයෙහි ථුල්ලනන්ද භික්ෂුණියගේ අතැවැසි මෙහෙණෝ බැහැර ගියාහු වෙති. ථුල්ලනන්ද භික්ෂුණී ඒ මෙහෙණන්ට මෙය කිවූ යැ. ''ආයණිවෙනි මෙහෙණෝ බැහැර ගියාහු යැ. (එන) තෙක් සිවුර නො බෙදන්නේ යැයි දැහැමි සිවුරු බෙදීම වැළැක්වූ යැ. මෙහෙණෝ එතෙක් සිවුරු නො බෙදන්නේ යැ යි බැහැර ගියාහු යැ. ථුල්ලනන්ද භික්ෂුණී අතැවැසි මෙහෙණන් පැමිණි කල්හි ඒ සිවුර බෙදවූ යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයණි ථුල්ලනන්ද තොමෝ දැහැමි සිවුරු බෙදීම වැළැක්වූ ද''යි... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී දැහැමි සිවුරු බෙදීම වැළැක්වූ ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී දැහැමි සිවුරු බෙදීම වැළැක් වූ ද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් දැහැමි සිවුරු බෙදීම වළක්වා නම් පචිති වේ'' යයි.**

3. **යා පන** : යම්, යම්බඳු ... **භික්ෂුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලං අදහස් කරනලද භික්ෂුණියි.

**ධම්මිකචීවර විභංග නම්** : සමග වූ මෙහෙණසඟහු රැස්වී බෙදති.

**පටිබාහෙය්‍ය** : කෙසේ මේ සිවුර බෙද දූ යි වළක්වා නම් පචිති ඇවැත් වේ.

දැහැමියෙහි දැහැමිසත් ඇතියා වළක්වා නම් පචිති ඇවැත් වෙයි. දැහැමියෙහි විමති ඇතියා වළක්වා නම් දුකුළා ඇවැත්වෙයි. දැහැමියෙහි නොදැහැමිසත් ඇතියා වළක්වානම් ඇවැත් නැති.

නො දැහැමියෙහි දැහැමිසත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමියෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමියෙහි නො දැහැමිසත් ඇතියා නම් ඇවැත් නැති.

අනුසස් දක්වා වළක්වා නම්, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සත්වන සිකපද යි**



Free Distribution www.aathaapi.org

## 4. 3. 8

### අට්ඨමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී නටානම්පි නට්ටකානම්පි[1] ලඞ්ඝිකානම්පි[2] සොකසායිකානම්පි[3] කුම්භථූණිකානම්පි[4] සමණචීවරං දෙති මය්හං පරිසතිං[5] වණ්ණං භාසථාති. නටාපි නට්ටකාපි ලඞ්ඝිකාපි සොකසායිකාපි කුම්භථූණිකාපි ථුල්ලනන්දාය භික්ඛුනියා පරිසතිං වණ්ණං භාසන්ති: "අය්‍යා ථුල්ලනන්දා බහුස්සුතා භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං. දෙථ අය්‍යාය කරොථ අය්‍යායා"ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අගාරිකස්ස සමණචීවරං දස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී අගාරිකස්ස සමණචීවරං දෙතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී අගාරිකස්ස සමණචීවරං දස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සමණචීවරං දදෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අගාරිකො** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**පරිබ්බාජකො** නාම: භික්ඛුඤ්ච සාමණෙරඤ්ච ඨපෙත්වා යො කොචි පරිබ්බාජකසමාපන්නො.

**පරිබ්බාජිකා** නාම: භික්ඛුනිඤ්ච සික්ඛමානඤ්ච සාමණෙරිඤ්ච ඨපෙත්වා යා කාචි පරිබ්බාජිකසමාපන්නා.

**සමණචීවරං** නාම: කප්පකතං වුච්චති. දෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** මාතාපිතුන්නං[6] දෙති තාවකාලිකං දෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

---

1. නාටකානම්පි - මජසං.
2. ලඞ්ඝකානම්පි - මජසං.
3. සොකජ්ඣායිකානම්පි මජසං.
4. කුම්භථූණිකානම්පි - මජසං.
5. පරිසති මජසං.
6. මාතාපිතූනං - මජසං



Free Distribution www.aathaapi.org

## 4. 3. 8

## අටවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එ සමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ "මාගේ ගුණ පිරිස්හි කියවයි නටවන්නන්ට ද නටන්නන්ට ද පනින්නන්ට ද ඉඳුරුදූලියන්ට ද කළකිඩියරුන්ට ද මහණ සිවුරු දෙයි. නටවන්නෝ ද නටන්නෝ ද පනින්නෝ ද ඉඳුරුදූලියෝ ද කළකිඩියරු ද ථුල්ලනන්ද භික්ෂුණියගේ ගුණ පිරිස්හි කියති: "ආයර්‍යා ථුල්ලනන්ද තොමෝ බොහෝ ඇසූ පිරූතැන් ඇත්තී පිරිවැහු බණදහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කරන්නට අග්‍රවූවා වෙයි. ආයර්‍යාවට දෙවු. ආයර්‍යාවහට (සත්කාර) කරවයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආයර්‍යා ථුල්ලනන්ද තොමෝ ගිහියකුට මහණසිවුරු දුනු දැ"යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී ගිහියකුට මහණ සිවුරු දේ දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී ගිහියකුට මහණසිවුරු දුනු ද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත් වා:

**"යම් මෙහෙණක් ගිහියකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජිනියකට හෝ මහණසිවුරු දේ නම් පචිති වේ" යයි.**

3. **යා පන :** යම්, යම්බඳු ... **භික්ෂුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණියි.

**අගාරික** නම් : ගෙහි වෙසෙන යම් කිසිවෙක්.

**පරිබ්බාජක** නම් : මහණ ද මෙහෙණ ද තබා පිරිවැජිබවට පැමිණි යම් කිසිවෙකි.

**පරිබ්බාජිකා** නම් : මෙහෙණ ද භික්මනුව ද හෙරණිය ද තබා පිරිවැජිබවට පැමිණි යම් කිසිවක.

**සමණචීවර** නම් : කප්බින්දු ඔබනලද සිවුර කියනු ලැබේ. දේ නම් පචිති ඇවැත් වේ.

මවුපියන්ට දේ නම්, තව්කැලි කොට දේ නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

අටවන සිකපද යි.

## 4. 3. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා උපට්ඨාකකුලං ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොච: "සචෙ මයං අය්‍යෙ සක්කොම භික්ඛුනීසඞ්ඝස්ස චීවරං දස්සාමා"ති. තෙන ඛො පන සමයෙන වස්සං වුත්ථා භික්ඛුනියො චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. ථුල්ලනන්දා භික්ඛුනී තා භික්ඛුනියො එතදවොච: "ආගමෙථ අය්‍යෙ, අත්ථි භික්ඛුනීසඞ්ඝස්ස චීවරපච්චාසා"ති. භික්ඛුනියො ථුල්ලනන්දං භික්ඛුනිං එතදවොචුං: ගච්ඡය්‍යෙ[1] තං චීවරං ජානාහීති. ථුල්ලනන්දා භික්ඛුනී යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ මනුස්සෙ එතදවොච: "දෙථාවුසො භික්ඛුනීසඞ්ඝස්ස චීවර"න්ති. න මයං අය්‍යෙ සක්කොම භික්ඛුනීසඞ්ඝස්ස චීවරං දාතුන්ති. ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙස්සතී"ති.–පෙ– සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය–පෙ–එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**දුබ්බලචීවරපච්චාසා** නාම: සචෙ මයං සක්කොම දස්සාම කරිස්සාමාති වාචා භින්නා හොති.

**චීවරකාලසමයො** නාම: අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමො මාසො, අත්ථතෙ කඨිනෙ පඤ්චමාසා.

**චීවරකාලසමයං අතික්කාමෙය්‍යාති:** අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමං දිවසං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස. අත්ථතෙ කඨිනෙ කඨිනුද්ධාරදිවසං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

---

1. ගවෙසථං -- සිමු



Free Distribution www.aathaapi.org

## 4. 3. 9

## නච්චන සික්ඛපදය

1. ශ්‍රාවස්ති නිදාන යි— එ සමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණියගේ උපස්ථායක කුලය ථුල්ලනන්ද භික්ෂුණියට මෙය කී යැ: ආයඝාවෙනි, "ඉදින් අපි හැකියමෝ නම් මෙහෙණ සඟනට සිවුරක් දෙම් හ" යි. එ සමයෙහි වස්වැස නිමවූ මෙහෙණෝ සිවුරු බෙදනු කැමැත්තාහු රැස්වූහ. ථුල්ලනන්ද භික්ෂුණී ඒ මෙහෙණන්ට මෙය කිවු යැ: "ආයඝාවෙනි පොරොත්තු වවු; මෙහෙණසඟනට චීවරප්‍රත්‍යාශාව ඇතැ" යි. මෙහෙණෝ ථුල්ලනන්ද භික්ෂුණියට මෙය කීහු; ආයඝාවෙනි, "යව ඒ සිවුර දනුව" යි. ථුල්ලනන්ද භික්ෂුණී ඒ කුලය වෙත එළඹියා ය. එළැඹැ ඒ මිනිසුන්ට මෙය කිවු යැ: ඇවැත්නි, "මෙහෙණ සඟනට සිවුරක් දෙව" යි. "ආයඝාවෙනි, අපි මෙහෙණ සඟනට සිවුරක් දෙන්නට නො හැකියම්හ" යි. ථුල්ලනන්ද භික්ෂුණී මෙහෙණන්හට තෙල කරුණ ඇරොජූ යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආයඝා ථුල්ලනන්ද තොමෝ සිවුරක් ලබනා දුබල රිසියෙන් චීවරකාලසමය ඉක්මවූ දැ"යි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී සිවුරක් ලබන දුබල රිසියෙන් චීවරකාලසමය ඉක්මවූ දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී සිවුරක් ලබන දුබල රිසියෙන් චීවරකාල සමය ඉක්ම වූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත් වා:

**"යම් මෙහෙණක් තොමෝ සිවුරක් ලබන දුබල රිසියෙන් චීවර කාලසමය ඉක්මවා නම් පචිති වේ" යයි.**

3. යා පන : යම්, යම්බඳු ... භික්ඛුනී : ... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**දුබ්බලචීවරපච්චාසා** නම : ඉදින් අපි හැකියමෝ නම් දෙන්නමු කරන්නමු යි වාග් භෙද කළා වෙයි.

**චීවරකාලසමය** නම : කෙළින් නො අතුළ කල්හි වස්සානය පිළිබඳ පැසුළුමස යැ. කෙළින් අතුළ කල්හි පස්මස යි.

**චීවරකාලසමයං අතික්කාමෙය්‍ය :** කෙළින් නො අතුළ කල්හි වස්සානය පිළිබඳ පැසුළු දවස ඉක්මවා නම් පචිති ඇවැත් වෙයි. කෙළින් අතුළ කල්හි කෙළින් උදුරන දවස ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

දුබ්බලචීවරෙ දුබ්බලචීවරසඤ්ඤා චීවරකාලසමයං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස. දුබ්බලචීවරෙ වෙමතිකා චීවරකාලසමයං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුබ්බලචීවරෙ අදුබ්බලචීවරසඤ්ඤා චීවරකාලසමයං අතික්කාමෙති අනාපත්ති.

අදුබ්බලචීවරෙ දුබ්බලචීවරසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අදුබ්බලචීවරෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අදුබ්බලචීවරෙ අදුබ්බලචීවරසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ආනිසංසං දස්සෙත්වා නිවාරෙති[1] උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**නවමසික්ඛාපදං**

## 4. 3. 10

## දසමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන උපාසකෙන සඞ්ඝං උද්දිස්ස විහාරො කාරාපිතො හොති. සො තස්ස විහාරස්ස මහෙ උභතො සඞ්ඝස්ස අකාලචීවරං දාතුකාමො හොති. තෙන ඛො පන සමයෙන උභතො සඞ්ඝස්ස කඨිනං අත්ථතං හොති. අථ ඛො සො උපාසකො සඞ්ඝං උපසඞ්කමිත්වා කඨිනුද්ධාරං යාචි, භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ කඨිනං උද්ධරිතුං" එවඤ්ච පන භික්ඛවෙ උද්ධරිතබ්බං, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

2. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො කඨිනං උද්ධරෙය්‍ය එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, සඞ්ඝො කඨිනං උද්ධරති යස්සායස්මතො ඛමති කඨිනස්ස උබ්භාරො[2] සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. උබ්භතං සඞ්ඝෙන කඨිනං ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

3. අථ ඛො සො උපාසකො භික්ඛුනීසඞ්ඝං උපසඞ්කමිත්වා කඨිනුද්ධාරං යාචි. ථුල්ලනන්දා භික්ඛුනී චීවරං අම්හාකං භවිස්සතීති. කඨිනුද්ධාරං පටිබාහි. අථ ඛො සො උපාසකො උජ්ඣායති ඛීයති විපාචෙති: කථං හි නාම භික්ඛුනියො අම්හාකං කඨිනුද්ධාරං න දස්සන්තීති. අස්සොසුං ඛො භික්ඛුනියො තස්ස උපාසකස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස

1. වාරෙති--සිමු!!
2. උද්ධාරො - මජ්ඣං.

දුබල සිවුරෙහි දුබල සිවුරුසන් ඇතියා චීවරකාලසමය ඉක්මවා නම් පචිති ඇවැත් වෙයි. දුබල සිවුරෙහි විමති ඇතියා චීවරකාලසමය ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි. දුබල සිවුරෙහි නො දුබල සිවුරුසන් ඇතියා චීවරකාලසමය ඉක්මවා නම් ඇවැත් නැති.

නො දුබල සිවුරෙහි දුබල සිවුරු සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දුබල සිවුරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දුබල සිවුරෙහි නො දුබල සිවුරුසන් ඇතියා නම් ඇවැත් නැති.

අනුසස් දක්වා වළක්වා නම්, උම්මත්තිකාවහට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නවවන සිකපදය යි.**

## 4. 3. 10

## දසවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි — එසමයෙහි වනාහි එක්තරා උවසුවකු විසින් සඞසයා උදෙසා විහාරයෙක් කරවන ලද්දේ වෙයි. හෙ තෙමේ ඒ විහාර පූජොත්සවයෙහි දෙ සඟුන්හට අයල් සිවුරක් දෙනු කැමැතියේ වෙයි. එසමයෙහි වනාහි දෙ සඟුන් විසින් කඨිනය අතුරන ලද්දේ වෙයි. එකල්හි ඒ උවසු මේ සඞසයා වෙතැ එළැඹැ කඨින ඉදිරිම යැදී යැ. භාග්‍යවතුන්හට තෙල කරුණ ඇරොජූහු. එකල්හි භාග්‍ය-වතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූ සේක. 'මහණෙනි, කඨිනය උදුරන්නට අනුදනිමි' මෙසේ ද මහණෙනි, ඉදිරිය යුතුයි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞසයා දන්විය යුත්තේ යි.

2. ස්වාමීනි සඞසයා මවදන් අසාවා. ඉදින් සඞසයාට පැමිණි කල් ඇත්තේ නම් සඞසයා කඨිනය උදුරන්නේ යැ. මේ ඥප්ති යි.

ස්වාමීනි සඞසයා ම වදන් අසාවා. සඞසයා කඨිනය උදුරයි. යම් ආයුෂ්මත් කෙනකු කඨිනය ඉදිරිම රුස්නේ නම් හෙ නිහඬ වන්නේ යැ. යමක්හට නො රුස්නේ නම් හෙ කියන්නේ යැ. සඞසයා විසින් කඨින උදුරන ලදී. සඞසයාට රුස්නේ යැ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි යි.

3. ඉක්බිති ඒ උවසු මෙහෙණසඟුන් වෙතැ එළැඹැ කඨින ඉදිරිම යැදී යැ. ථුල්ලනන්ද භික්ෂුණී සිවුර අපට වන්නේ යයි කඨින ඉදිරිම වැළැක්වූ යැ. එකල්හි ඒ උවසු ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: ''කෙසේ නම් මෙහෙණෝ අපට කඨින ඉදිරිම නො දුන්නු ද'' යි. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ උවසුවාගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු.

විපාචෙන්තස්ස. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහිස්සතීති" -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහතීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහෙය්‍ය පාචිත්තිය"න්ති.**

5. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ධම්මිකො නාම කඨිනුද්ධාරො:** සමග්ගො භික්ඛුනීසඞ්ඝො සන්නිපතිත්වා උද්ධරති.

**පටිබාහෙය්‍යාති:** කථං ඉදං කඨිනං උද්ධරෙය්‍යාති[1] පටිබාහති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මිකෙ ධම්මිකසඤ්ඤා පටිබාහති ආපත්ති පාචිත්තියස්ස. ධම්මිකෙ වෙමතිකා පටිබාහති ආපත්ති දුක්කටස්ස. ධම්මිකෙ අධම්මිකසඤ්ඤා පටිබාහති අනාපත්ති.

අධම්මිකෙ ධම්මිකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මිකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මිකෙ අධම්මිකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ආනිසංසං දස්සෙත්වා පටිබාහති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති,

දසමසික්ඛාපදං

**නග්ගවග්ගො තතියො**

**තස්සුද්දානං:**

නග්ගොදකං විසිබ්බෙත්වා - පඤ්චාහසංකමානීයං
ගණචීවරකං සමණං - දුබ්බලං කඨිනෙන චාති.[2]

1. න උද්ධරෙය්‍යාති- මජ්සං.
2. දුබ්බලකඨිනෙන - සීමු:



Free Distribution www.aathaapi.org

4. යම් ඒ මෙහෙණ යෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් ''කෙසේ නම් ආයර්‍ය්‍යා ථුල්ල නන්ද තොමෝ දැහැමි වූ කඨින ඉදිරීම වැළැක්වූ'' ද යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී දැහැමි වූ කඨින ඉදිරීම වැළැක් වූ ද යි. සැබැවි, භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී දැහැමි වූ කඨින ඉදිරීම වැළැක්වූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා :

**''යම් මෙහෙණක් දැහැමි වූ කඨින ඉදිරීම වළක්වා නම් පචිති වේ'' යයි.**

යා පන : යම්, යම්බඳු ... **භික්ඛුනී** : ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**ධම්මිකකඨිනුද්ධාර** නම් : සමග වූ මෙහෙණ සඟහු රැස්වී උදුරති.

**පටිබාහෙයා** : කෙසේ මේ කඨින උදුරන්නේ ද යි වළක්වා නම් පචිති ඇවැත් වේ.

දැහැමියෙහි දැහැමි සත් ඇතියා වළක්වා නම් පචිති ඇවැත් වෙයි. දැහැමියෙහි විමති ඇතියා වළක්වා නම් දුකුළා ඇවැත් වෙයි. දැහැමියෙහි නො දැහැමිසත් ඇතියා වළක්වා නම් ඇවැත් නැති.

නො දැහැමියෙහි දැහැමිසත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමියෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමි යෙහි නො දැහැමිසත් ඇතියා නම් ඇවැත් නැති.

අනුසය් දක්වා වළක්වා නම්, උම්මත්තිකාවට ... ආදි කම්මිකාවට ඇවැත් නැති.

**දසවන සිකපද යි.**

**තෘතීය නග්න වර්ග යි.**

එහි උද්දානය :—

නග්ග යැ උදක (සාටිකා) යැ විසිබ්බන යැ පඤ්චාහික යැ (චීවර) සඞ්කමනීය යැ ගණ යැ (චීවර) විභඞ්ග යැ සමණ (චීවර) යැ දුබ්බල යැ කඨිනයෙන් ද යි.

## 4. 4. 1

### පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙය්‍යුං පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනියොති:** උපසම්පන්නායො වුච්චන්ති.

**ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙය්‍යුන්ති:** එකාය නිපන්නාය අපරා නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස. උට්ඨහිත්වා පුනප්පුනං නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** එකාය නිපන්නාය අපරා නිසීදති උභො වා නිසීදන්ති උම්මත්තිකානං -පෙ- ආදිකම්මිකානන්ති."

**පඨමසික්ඛාපදං නිට්ඨිතං**

## 8. 6. 3

### දුතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ද්වෙ එකත්ථරණපාපුරණා[1] තුවට්ටෙන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු-නියො ද්වෙ එකත්ථරණපාපුරණා තුවට්ටෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

1. එකත්ථරණ පාවුරණා-මජසං; HO



Free Distribution www.aathaapi.org

## 4. 4. 1

## පළමු සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි මෙහෙණෝ දෙදෙනෙක් එක් ඇඳෙහි එක් වැ හොවිත්, මිනිස්සු විහාරචාරිකායෙහි ඇවිදින්නාහු දැකැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ දෙදෙනෙක් ගෘහී කාමභොගිනියන් මෙන් එක් ඇඳෙහි එක් වැ හොත්හු දැ''යි. භික්ෂුනීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් ''කෙසේ නම් මෙහෙණෝ දෙදෙනෙක් එක් ඇඳෙහි එක් වැ හොත්හු දැ''යි ... සැබෑද මහණෙනි, මෙහෙණෝ දෙදෙනෙක් එක් ඇඳෙහි එක් වැ හොවිත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ දෙදෙනෙක් එක් ඇඳෙහි එක් වැ හොත්හු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණෝ දෙදෙනෙක් එක් ඇඳෙහි එක් වැ හොවිත් නම් පචිති වේ'' යයි,**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනියො:** උපසපන් වූවෝ කියනු ලැබෙත්.

**ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙය්‍යුං:** එකක හොත් කල්හි අනෙකක් හොවී නම් පචිති ඇවැත් වෙයි. දෙදෙන මැ හොවිත් නම් පචිති ඇවැත් වෙයි, නැඟිට පුන පුනා හොවිත් නම් පචිති ඇවැත් වේ.

එකක හොත් කල්හි අනෙකක් හිඳී නම්, දෙදෙන මැ හිඳිත් නම්, උම්මත්තිකාවනට ... ආදිකම්මිකාවනට ඇවැත් නැති.

**පළමු සිකපදයි.**

## 4. 4. 2

## දෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ දෙදෙනෙක් එක් මැ ඇතිරි පොරෝනා ඇති වැ හොවිත්. මිනිස්සු විහාරචාරිකායෙහි ඇවිදින්නාහු දැකැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් මෙහෙණෝ දෙදෙනෙක් එක් මැ ඇතිරි පොරෝනා ඇති වැ ගෘහිකාමභොගිනියන් මෙන් හොත්හු''දැයි, භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු.



Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ද්වෙ එකත්ථරණපාපුරණා තුවට්ටෙස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො ද්වෙ එකත්ථරණපාපුරණා තුවට්ටෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො ද්වෙ එකත්ථරණ-පාපුරණා තුවට්ටෙස්සන්ති, නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනියො ද්වෙ එකත්ථරණපාපුරණා තුවට්ටෙය්‍යුං පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනියොති** උපසම්පන්නායො වුච්චන්ති.

**ද්වෙ එකත්ථරණපාපුරණා තුවට්ටෙය්‍යුන්ති:** තස්මිඤ්ඤෙව අත්ථරිත්වා තස්මිඤ්ඤෙව පාරුපන්ති ආපත්ති පාචිත්තියස්ස.

එකත්ථරණපාපුරණෙ එකත්ථරණපාපුරණසඤ්ඤා තුවට්ටෙන්ති ආපත්ති පාචිත්තියස්ස, එකත්ථරණපාපුරණෙ වෙමතිකා තුවට්ටෙන්ති ආපත්ති පාචිත්තියස්ස, එකත්ථරණපාපුරණෙ නානත්ථරණපාපුරණසඤ්ඤා තුවට්ටෙන්ති ආපත්ති පාචිත්තියස්ස.

එකත්ථරණෙ නානාපාපුරණසඤ්ඤා[1] ආපත්ති දුක්කටස්ස. නානත්ථරණෙ එකපාපුරණසඤ්ඤා[2] ආපත්ති දුක්කටස්ස. නානත්ථරණ-පාපුරණෙ එකත්ථරණපාපුරණසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. නානත්ථරණ-පාපුරණෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. නානත්ථරණපාපුරණෙ නානත්ථරණපාපුරණසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** වවත්ථානං දස්සෙත්වා නිපජ්ජන්ති, උම්මත්තිකානං -පෙ- ආදිකම්මිකානන්ති.

**දුතියසික්ඛාපදං.**

1. නානාපාවුරණෙ-සයා.
2. එකපාවුරණෙ-සයා.



Free Distribution www.aathaapi.org

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මෙහෙණෝ දෙදෙනෙක් එක් මැ ඇතිරි පොරෝනා ඇති වැ හොත්හු දැ" යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ දෙදෙනෙක් එක් මැ ඇතිරි පොරෝනා ඇති වැ හොවිත් ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ දෙදෙනෙක් එක් මැ ඇතිරි පොරෝනා ඇති වැ හොත්හු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා :

**"යම් මෙහෙණෝ දෙදෙනෙක් එකක් මැ ඇතිරි පොරෝනා ඇති වැ හොවිත් නම් පචිති වේ" ය යි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනියො:** උපසපන්වූවෝ කියනු ලැබෙත්.

**ද්වෙ එකත්ථරණපාපුරණා තුවට්ටෙය්‍යුං:** එය මැ අතුරා එය මැ පොරවත් නම් පචිති ඇවැත් වේ.

එකාස්තරණප්‍රාවරණයෙහි එකාස්තරණප්‍රාවරණසංඥා ඇතියාහු එක්වැ හොවිත් නම් පචිති ඇවැත් වෙයි. එකාස්තරණප්‍රාවරණයෙහි විමති ඇතියාහු එක් වැ හොවිත් නම් පචිති ඇවැත් වෙයි. එකාස්තරණ-ප්‍රාවරණයෙහි නානාස්තරණප්‍රාවරණසංඥා ඇතියාහු එක් වැ හොවිත් නම් පචිති ඇවැත් වේ.

එකාස්තරණයෙහි නානාප්‍රාවරණසංඥා ඇතියාහු නම් දුකුළා ඇවැත් වෙයි. නානාස්තරණයෙහි එකප්‍රාවරණසංඥා ඇතියාහු නම් දුකුළා ඇවැත් වෙයි. නානාස්තරණප්‍රාවරණයෙහි එකාස්තරණප්‍රාවරණ සංඥා ඇතියාහු නම් දුකුළා ඇවැත් වෙයි. නානාස්තරණප්‍රාවරණ-යෙහි විමති ඇතියාහු නම් දුකුළා ඇවැත් වෙයි. නානාස්තරණ-ප්‍රාවරණයෙහි නානාස්තරණප්‍රාවරණසංඥා ඇතියාහු නම් ඇවැත් නැති.

අතරක් දක්වා හොවිත් නම් ඇවැත් නොවේ. උම්මත්තිකාවනට... ආදිකම්මිකාවනට ඇවැත් නැති.

**දෙවන සිකපද යි.**

## තතියසික්ඛාපදං

1. සාවත්ථී නිදානං - තෙන බො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී බහුස්සුතා හොති භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං. භද්දාපි කාපිලානී[1] බහුස්සුතා හොති භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං උළාරසම්භාවිතා. මනුස්සා අය්‍යා භද්දා කාපිලානී බහුස්සුතා භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං උළාරසම්භාවිතාති, භද්දං කාපිලානිං පඨමං පයිරුපාසිත්වා පච්ඡා ථුල්ලනන්දං භික්ඛුනිං පයිරුපාසන්ති. ථුල්ලනන්දා භික්ඛුනී ඉස්සාපකතා ''ඉමා කිර අප්පිච්ඡා සන්තුට්ඨා පවිවිත්තා අසංසට්ඨා යා ඉමා සඤ්ඤත්තිබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්තී''ති භද්දාය කාපිලානියා පුරතො චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති. උද්දිසතිපි උද්දිසාපෙතිපි සජ්ඣායම්පි කරොති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අය්‍යාය භද්දාය කාපිලානියා සඤ්චිච්ච අඵාසුං කරිස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී භද්දාය කාපිලානියා සඤ්චිච්ච අඵාසුං කරොතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී භද්දාය කාපිලානියා සඤ්චිච්ච අඵාසුං කරිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී භික්ඛුනියො සඤ්චිච්ච අඵාසුං කරෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුනියාති:** අඤ්ඤාය භික්ඛුනියා.

**සඤ්චිච්චාති:** ජානන්ති සඤ්ජානන්ති චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො.

**අඵාසුං කරෙය්‍යාති:** ඉමිනා ඉමිස්සා අඵාසු භවිස්සතීති අනාපුච්ඡා පුරතො චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති උද්දිසති වා උද්දිසාපෙති වා සජ්ඣායං වා කරොති ආපත්ති පාචිත්තියස්ස.

---

1. භද්ද කාපිලානී - සී මු; ii



Free Distribution www.aathaapi.org

## 4. 4. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි — එසමයෙහි වනාහි ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ බොහෝ ඇසූපිරූතැන් ඇත්තී පිරිවැහු බණදහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කරන්නට අග්‍රවූවා වෙයි. භද්‍රා කාපිලානී තොමෝත් බොහෝ ඇසූපිරූතැන් ඇත්තී පිරිවැහු බණදහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කරන්නට අග්‍රවූවා උදර පුද්ගලයන් විසින් සම්භාවිත වූවා වෙයි. මිනිස්සු ආර්යා භද්‍රා කාපිලානී තොමෝ බොහෝ ඇසූපිරූතැන් ඇත්තී පිරිවැහු බණ දහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍රවූවා උදර පුද්ගලයන් විසින් සම්භාවිත වූවා යැයි භද්‍රා කාපිලානිය පළමු කොට පර්යුපාසනය කොට පසුව ථුල්ලනන්‍ද භික්ෂුණිය පර්යුපාසනය කෙරෙත්. ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද්දී "මොහු වනාහි අපිස්වූවාහු සන්තුෂ්ට වූවාහු ප්‍රවිවික්ත වූවාහු අමිශ්‍ර වූවාහුය. යම්බඳු මොහු හැහවීම් බහුල කොට ඇතියාහු විනවීම් බහුල කොට ඇතියාහු වෙසෙද්දැයි භද්‍රා කාපිලානියගේ ඉදිරියෙහි සක්මන් ද කෙරෙයි, සිටීම ද කෙරෙයි, හිඳීම ද කෙරෙයි, ශයනය ද කෙරෙයි, උදෙසීම ද කෙරෙයි, උදෙසවා ගැනීම ද කෙරෙයි, හැදෑරීම ද කෙරෙයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති,. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්යා ථුල්ලනන්‍ද තොමෝ ආර්යා භද්‍රා කාපිලානියහට දැනැදැනැ අපහසු බව කළා දැයි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්‍ද මෙහෙණ භද්‍රා කාපිලානියහට දැන දැන අපහසු බව කෙරේදැයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ භද්‍රා කාපිලානියහට දැනැදැනැ අපහසුබව කළා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් මෙහෙණකට දැනැ දැනැ අපහසුබව කෙරේ නම් පචිති වේ" ය යි.**

**3. යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝතොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**භික්ඛුනියා:** අන් මෙහෙණකට.

**සඤ්චිච්ච:** දන්නී මොනවට දන්නී සිතා නිසැක සිත මෙහෙයවා ව්‍යතික්‍රමයැ.

**අඵාසුං කරෙය්‍ය:** මෙයින් මැයහට අපහසුවෙක් වන්නේ යැයි නො පිළිවිසැ ඉදිරියෙහි සක්මන් කෙරේ නම් හෝ සිටී නම් හෝ හිඳී නම් හෝ ශයනය කෙරේ නම් හෝ උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ හැදෑරීම කෙරේ නම් හෝ පචිති ඇවැත් වේ.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා සඤ්චිච්ච අඵාසුං කරොති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා සඤ්චිච්ච අඵාසුං කරොති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා සඤ්චිච්ච අඵාසුං කරොති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නාය සඤ්චිච්ච අඵාසුං කරොති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** න අඵාසුං කත්තුකාමා, ආපුච්ඡා පුරතො චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති උද්දිසති වා උද්දිසාපෙති වා සජ්ඣායං වා කරොති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං.**

## 4. 4. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන **ථුල්ලනන්දා භික්ඛුනී** දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙති න උපට්ඨාපනාය උස්සුක්කං කරොති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙස්සති න උපට්ඨාපනාය උස්සුක්කං කරිස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙති න උපට්ඨාපනාය උස්සුක්කං කරොතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙස්සති න උපට්ඨාපනාය උස්සුක්කං කරිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙය්‍ය න උපට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.



Free Distribution www.aathaapi.org

උපසපනක කෙරෙහි උපසපන්සඤ ඇතියා දැනැදැනැ අපහසු බව කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා දැනැදැනැ අපහසුබව කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන්සඤ ඇතියා දැනැදැනැ අපහසුබව කෙරේ නම් පචිති ඇවැත් වේ.

අනුපසපනකහට දැනැදැනැ අපහසුබව කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන්සඤ ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන්සඤ ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

අපහසුබව නො කරනු කැමැත්තී නම්, පිළිවිසැ ඉදිරියෙහි සක්මන් කෙරේ නම් හෝ සිටී නම් හෝ හිඳීනම් හෝ ශයනය කෙරේ නම් හෝ උදෙසා නම් හෝ උදෙස්වා නම් හෝ හැදෑරීම කෙරේ නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**තෙවන සිකපද යි.**

## 4. 4. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ දුකටපත් සහජිවනියහට නොමැ උවැටන් කෙරෙයි. උවැටන් කැරැවීමට උත්සාහ නො කෙරෙයි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්, "කෙසේ නම් ආර්යා ථුල්ලනන්‍දා තොමෝ දුකටපත් සහජීවිනියහට නොමැ උවැටන් කළා ද? උවැටන් කැරැවීමට උත්සාහ නො කළා"දැයි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ දුකටපත් සහජිවනියහට නො මැ උවැටන් කෙරේද? උවැටන් කැරැවීමට උත්සාහ නො කෙරේදැයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ දුකටපත් සහජිවනියහට නොමැ උවැටන් කළා ද? උවැටන් කැරැවීමට උත්සාහ නො කළා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තොමෝ දුකටපත් සහජීවනියට නො මැ උවැටන් කෙරේ නම් උවැටන් කැරැවීමට උත්සාහ නො කෙරේ නම් පචිති වේ" ය යි.**

3. **යා පනා:** යම්, යම්බඳු ... **භික්ඛුනී:** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**දුක්ඛිතා** නාම: ගිලානා වුච්චති.

**සහජීවිනී** නාම: සද්ධිවිහාරිනී වුච්චති.

**නෙව උපට්ඨෙය්‍යාති**: න සයං උපට්ඨෙය්‍ය.

**න උපට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍යාති**: න අඤ්ඤං ආණාපෙය්‍ය නෙව උපට්ඨෙස්සාමි න උපට්ඨාපනාය උස්සුක්කං කරිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස. අන්තෙවාසිනිං වා අනුපසම්පන්නං වා නෙව උපට්ඨෙති න උපට්ඨාපනාය උස්සුක්කං කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: සති අන්තරායෙ පරියෙසිත්වා න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

චතුත්ථසික්ඛාපදං.

## 4. 4. 5

## පඤ්චමසික්ඛාපදං

1. **සාවත්ථිනිදානං** - තෙන ඛො පන සමයෙන **භද්දා කාපිලානී සාකෙතෙ** වස්සං උපගතා හොති. සා කෙනචිදෙව උබ්බාළ්හා[1] ථුල්ලනන්දාය භික්ඛුනියා සන්තිකෙ දූතං පාහෙසි. "සචෙ මෙ අය්‍යා ථුල්ලනන්දා උපස්සයං දදෙය්‍ය ආගච්ඡෙය්‍යාමහං සාවත්ථි"න්ති. ථුල්ලනන්දා භික්ඛුනී එවමාහ: "ආගච්ඡතු දස්සාමී"ති. අථ ඛො භද්දා කාපිලානී සාකෙතා **සාවත්ථිං** අගමාසි. ථුල්ලනන්දා භික්ඛුනී භද්දාය කාපිලානියා උපස්සයං අදාසි. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී බහුස්සුතා හොති භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං. භද්දාපි කාපිලානී බහුස්සුතා[2] හොති භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං උළාරසම්භාවිතා. මනුස්සා අය්‍යා භද්දා කාපිලානී බහුස්සුතා භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං උළාරසම්භාවිතාති භද්දං කාපිලානිං පඨමං පයිරුපාසිත්වා පච්ඡා ථුල්ලනන්දං භික්ඛුනිං පයිරුපාසන්ති. ථුල්ලනන්දා භික්ඛුනී ඉස්සාපකතා "ඉමා කිර අප්පිච්ඡා සන්තුට්ඨා පවිවිත්තා අසංසට්ඨා යා ඉමා සඤ්ඤත්තිබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්තී"ති කුපිතා අනත්තමනා භද්දං කාපිලානිං උපස්සයා නික්කඩ්ඪි.

---

1. යා කෙනචිදෙව කරණීයෙන උබ්බාළ්හා-මජසං,
2. බහුස්සුතායෙව -මජසං



Free Distribution www.aathaapi.org

**දුක්ඛිතා** නම්: ගිලනැයි කියනු ලැබෙයි.

**සහජීවිනී** නම්: සද්ධිවිහාරිනී කියනු ලැබෙයි.

**නෙව උපට්ඨෙය්‍යා:** නොමෝ උවටැන් නො කෙරෙයි.

**න උපට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍යා:** මෙරමාහට නො අණවයි.

නොමැ උවටැන් කරන්නෙමි උවටැන් කැරැවීමට උත්සාහ නො කරන්නෙමි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වෙයි. අතැවැසිනියකට හෝ අනුපසපනකහට හෝ නොමැ උවටැන් කෙරේ නම් උවටැන් කැරැවීමට උත්සාහ නො කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

අනතුරක් ඇතිකල්හි, සොයා නො ලබා නම්, ඇවැත් නැත. ගිලනහට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සතරවන සිකපද යි.**

## 4. 4. 5

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි විනාහි භද්‍රා කාපිලානී තොමෝ සාකෙතයෙහි වස් එළැඹියා වෙයි. ඕතොමෝ කිසියම් කරුණෙකින් උවදුරට පැමිණියා ථුල්ලනන්ද භික්ෂුණියගේ සමීපයෙහි දූතයකු යැවූ යැ. ''ඉදින් ආය්‍යා ථුල්ලනන්ද තොමෝ මාහට අසපුවක් දෙන්නී නම් මම සැවැතට එන්නෙමි''යි. ථුල්ලනන්ද භික්ෂුණී 'පැමිණේවා දෙන්නෙමැ'යි මෙසේ කිවූ යැ. ඉක්බිති භද්‍රා කාපිලානී තොමෝ සාකෙතයෙන් සැවැතට පැමිණියා යැ. ථුල්ලනන්ද භික්ෂුණී භද්‍රා කාපිලානියහට අසපුවක් දුනු යැ. එසමයෙහි ථුල්ලනන්ද භික්ෂුණී බොහෝ ඇසූපිරුතැන් ඇත්තී පිරිවැහූ බණ දහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍ර වූවා වෙයි. භද්‍රා කාපිලානී තොමෝත් බොහෝ ඇසූපිරුතැන් ඇත්තී පිරිවැහූ බණ දහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍ර වූවා උදාර සම්භාවිතවූවා වෙයි. මිනිස්සු ආය්‍යා භද්‍රා කාපිලානී තොමෝ බොහෝ ඇසූපිරුතැන් ඇත්තී පිරිවැහූ බණදහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍ර වූවා උදාරසම්භාවිතවූවායයි භද්‍රා කාපිලානිය පළමුව පර්යූපාසනය කොට පසු වැ ථුල්ලනන්ද භික්ෂුණිය පර්යූපාසනය කෙරෙත්. ථුල්ලනන්ද භික්ෂුණී ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද්දී ''යම්බඳු මොහු හැහැවීම් බහුල කොට ඇතියාහු විනවීම් බහුල කොට ඇතියාහු වෙසෙත් ද, මොහු අපිස් ඇතියාහු ල, ලද දෙයින් සතුටු වන්නාහු ල, ප්‍රකර්ෂවිවෙක ඇතියාහු ල, ගිහියන් හා නොගැටුනාහු ලැ යි, කිපියා නො සියමත් වූවා භද්‍රා කාපිලානිය අසපුවෙන් ඇද දැමූ යැ.



Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අය්‍යාය භද්දාය කාපිලානියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී භද්දාය කාපිලානියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී භද්දාය කාපිලානියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී භික්ඛුනියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුනියාති:** අඤ්ඤාය භික්ඛුනියා.

**උපස්සයො** නාම: කවාටබද්ධො වුච්චති.

**දත්වාති:** සයං දත්වා.

**කුපිතා අනත්තමනාති:** අනභිරද්ධා ආහතචිත්තා ඛිලජාතා.

**නික්කඩ්ඪෙය්‍යාති:** ගබ්භෙ ගහෙත්වා පමුඛං නික්කඩ්ඪති ආපත්ති පාචිත්තියස්ස. පමුඛෙ ගහෙත්වා බහි නික්කඩ්ඪති ආපත්ති පාචිත්තියස්ස. එකෙන පයොගෙන බහුකෙපි ද්වාරෙ අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

**නික්කඩ්ඪාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති දුක්කටස්ස.* සකිං ආණත්තා බහුකෙපි ද්වාරෙ අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති පාචිත්තියස්ස.

---

* ආණාපෙත්වා නික්කඩ්ඪාපෙති ආපත්ති පාචිත්තියස්සාති ලිඛිතං විය දිස්සති. එත්ථ අඤ්ඤං ආණාපෙති ආපත්ති පාචිත්තියස්සාති මරම්මරට්ඨ සඞ්ගීති පිටකෙ පරිසොධිතං.



Free Distribution www.aathaapi.org

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද නොමෝ ආර්යා භද්‍රා කාපිලානියට අසපුවක් දී කිපියා නොසියමන් වූවා ඇදදැමූ දැ'' යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී භද්‍රා කාපිලානියට අසපුවක් දී කිපියා නො සියමන් වූවා ඇදදැමූ දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී භද්‍රා කාපිලානියට අසපුවක් දී කිපියා නොසියමන් වූවා ඇද දැමූද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් මෙහෙණකට අසපුවක් දී කිපියා නොසියමන් වූවා ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ පචිති වේ'' යැ යි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භිකුනී** ... මේ නොමෝ මේ අර්යෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**භිකුනියා:** අන් මෙහෙණකට.

**උපස්සය නම:** කවුළු බැඳියේ කියනු ලැබේ.

**දත්වා:** නොමෝ දී.

**කුපිතා අනත්තමනා:** නො ඇලුනි හැනුනු සිතැත්තී හටගත් ක්‍රොධහුල් ඇත්තී.

**නිකඩෙඩ්‍යය:** ගැබෙහි ගෙනැ අග්දෙරියට ඇද දමානම් පචිති ඇවැත් වෙයි. අග්දෙරියෙහි ගෙනැ බැහැරට ඇද දමා නම් පචිති ඇවැත් වෙයි. එක් පියොවෙකින් බොහෝ වූද දෙර ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

**නිකඩ්ඩාපෙය්‍යය:** මෙරමාහට අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. වරක් අණවන ලද්දී බොහෝ වූ ද දෙර ඉක්මවා නම් පචිති ඇවැත් වේ. උපසපනක කෙරෙහි උපසපන්සන් ඇත්තී අසපුවක් දී කිපියා නො සියමන් වූවා ඇදදමා නම් හෝ ඇදදමවා නම් හෝ පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා අසපුවක් දී කිපියා නො සියමන් වූවා ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන් සන් ඇත්තී අසපුවක් දී කිපියා නො සියමන් වූවා ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ පචිති ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. අකවාටබද්ධා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නං කවාටබද්ධා වා අකවාටබද්ධා වා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අලජ්ජිනිං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා උම්මත්තිකං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා භණ්ඩනකාරිකං -පෙ- කලහකාරිකං -පෙ- විවාදකාරිකං -පෙ- භස්සකාරිකං -පෙ- සඞ්ඝෙ අධිකරණකාරිකං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා අන්තෙවාසිනිං වා සද්ධිවිහාරිනිං වා නසම්මාවත්තන්තිං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා තස්සා පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

පඤ්චමසික්ඛාපදං

## 4. 4. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන චණ්ඩකාළී භික්ඛුනී සංසට්ඨා විහරති ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි.[1] යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා චණ්ඩකාළී සංසට්ඨා විහරිස්සති ගහපතිනාපි ගහපතිපුත්තෙනාපී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, චණ්ඩකාළී භික්ඛුනී සංසට්ඨා විහරති ගහපතිනාපි ගහපතිපුත්තෙනාපීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, චණ්ඩකාළී භික්ඛුනී සංසට්ඨා විහරිස්සති ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

1. ගහපතිපුත්තෙනාපි - මජසං HO

ඇයගේ පිරිකර ඇදදමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. කවුළු නො බැඳියකින් ඇදදමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. ඇයගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කවුළු බැඳියකින් හෝ කවුළු නො බැඳියකින් හෝ ඇද දමා නම් හෝ ඇදදමවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. ඇයගේ පිරිකර ඇදදමා නම් හෝ ඇදදමවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන් සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන් සන් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

අලජ්ජිනියක ඇදදමා නම් හෝ ඇද දමවා නම් හෝ ඇයගේ පිරිකර ඇද දමානම් හෝ ඇද දමවා නම් හෝ උම්මත්තිකාවක ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ ඇයගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ ඩබරකාරියක ... කලහකාරියක ... විවාදකාරියක ... භස්සකාරියක ... සඞසයා කෙරෙහි අධිකරණකාරියක ඇදදමා නම් හෝ ඇදදමවා නම් හෝ ඇයගේ පිරිකර ඇද දමා නම් හෝ ඇදදමවා නම් හෝ මොනවට නො පවත්නා අතවැසිනියක හෝ සද්ධිවිහාරිනියක හෝ ඇදදමා නම් හෝ ඇද-දමවා නම් හෝ ඇයගේ පිරිකර ඇදදමා නම් හෝ ඇදදමවා නම් හෝ, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපද යි**

## 4. 4. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි චණ්ඩකාළී භික්ෂුණී ගැහැවියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී වෙසෙයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් ආයර්‍යා චණ්ඩකාළී ගැහැවියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී වුසූ දැ" යි ... සැබෑද මහණෙනි, චණ්ඩකාළී භික්ෂුණී ගැහැවියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී වෙසේ දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, චණ්ඩකාළී භික්ෂුණී ගැහැවියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී වුසූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යා පන භික්ඛුනී සංසට්ඨා විහරෙය්‍ය ගහපතිනා වා ගහපතිපුත්තෙන වා සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා: "මාය්‍යෙ සංසට්ඨා විහරි ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි. විවිච්චය්‍යෙ විවෙකඤ්ඤෙව භගිනියා සඞ්ඝො වණ්ණෙතී''ති. එවඤ්ච සා[1] භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය සා භික්ඛුනී භික්ඛුනීහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය පාචිත්තිය''න්ති.

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සංසට්ඨා** නාම: අනනුලොමිකෙන කායිකවාචසිකෙන සංසට්ඨා.

**ගහපති** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**ගහපතිපුත්තො** නාම: යෙ කෙචි පුත්තභාතරො.[2]

**සා භික්ඛුනීති:** යා සා සංසට්ඨා භික්ඛුනී.

**භික්ඛුනීහීති:** අඤ්ඤාහි භික්ඛුනීහි.

යා පස්සන්ති යා සුණන්ති තාහි වත්තබ්බා "මාය්‍යෙ සංසට්ඨා විහරි ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි විවිච්චය්‍යෙ, විවෙකඤ්ඤෙව භගිනියා සඞ්ඝො වණ්ණෙතී''ති. දුතියම්පි වත්තබ්බා -තතියම්පි වත්තබ්බා සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා: "මාය්‍යෙ සංසට්ඨා විහරි ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි, විවිච්චය්‍යෙ, විවෙකඤ්ඤෙව භගිනියා සඞ්ඝො වණ්ණෙතීති. දුතියම්පි වත්තබ්බා— තතියම්පි වත්තබ්බා. සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සා භික්ඛුනී සමනුභාසිතබ්බා. එවඤ්ච පන භික්ඛවෙ, සමනුභාසිතබ්බා බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා භික්ඛුනී සංසට්ඨා විහරති ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි, සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය එසා ඤත්ති.

1. එවඤ්ච පන සා - මජසං,
2. යො කොචි පුත්තභාතරො - සී.මු.

"යම් මෙහෙණක් ගැහැවියකු සමග හෝ ගැහැවිපුතකු සමග හෝ හැනුනී වෙසේ නම් ඒ මෙහෙණ තොමෝ මෙහෙණන් විසින් මෙසේ කියයුතු වන්නී යැ: "ආයඵාවෙනි, ගැහැ–වියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී නහමක් වසව. ආර්යාවෙනි, වෙන්වව, සඞසයා බුහුනගේ විවෙකය මැ වණිනා කෙරේ යැ''යි. මෙසේ ද ඒ මෙහෙණ තොමෝ මෙහෙණන් විසින් කියනු ලබන්නී එසේ මැ දැඩිවැ ගනී නම් ඒ මෙහෙණ තොමෝ මෙහෙ-ණන් විසින් එය දුරලනු පිණිස තුන්යළ තෙක් සමනුභාෂණය කළ යුත්තී යැ. තුන් යළ තෙක් සමනුභාෂණය කරනු ලබන්නී එය දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලා නම් පචිති වේ'' ය යි.

2. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**සංසට්ඨා** නම්: අනුලොම් නොවූ කායිකවාචසික ප්‍රයොගයෙන් හැනුනී යැ.

**ගහපති** නම්: යම් කිසිවෙක් ගෙයි වෙසේ නම් හේ යැ.

**ගහපතිපුත්ත** නම්: යම් කිසි දරුබැ තෙනෙක්.

**සා භික්ඛුනී**: ගිහියන් හා හැනීසිටි යම් ඒ මෙහෙණක් තොමෝ යැ.

**භික්ඛුනීහි:** අන් මෙහෙණන් විසිනි.

යම් මෙහෙණ කෙනෙක් දකිත් ද යම් මෙහෙණ කෙනෙක් අසත් ද ඔවුන් විසින් කිය යුතුයැ. ආයඵාවෙනි, ගැහැවියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී නහමක් වසව. ආර්යාවෙනි, වෙන්වව, සඞසයා බුහුනගේ විවෙකය මැ වණිනා කෙරේ යැ යි. දෙවනවට ද කිය යුත්තී යැ ... තෙවනවට ද කිය යුත්තී යැ. ඉදින් දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලා නම් දුකුළා ඇවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළා ඇවැත් වෙයි. ඒ මෙහෙණ සඟමැදට ද ඇද කිය යුත්තී යැ. ආර්යාවෙනි, ගැහැවියකු හා ද ගැහැවිපුතකු හා ද හැනුනී නහමක් වසව. ආර්යාවෙනි, වෙන් වව. සඞසයා බුහුනගේ විවෙකය මැ වණිනා කෙරේ යැ යි. දෙවනවට ද කිය යුත්තී යැ... තෙවනවට ද කිය යුත්තී යැ. ඉදින් දුරැලා නම් මෙසේ තෙල දුරැලීම මැනැවි. ඉදින් නො දුරැලා නම් දුකුළා ඇවැත් වේ. ඒ මෙහෙණ සමනුභාෂණය කළ යුත්තී යැ. මෙසේ ද මහණෙනි, සමනුභාෂණය කළ යුත්තී යැ. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞසයා දැන්විය යුත්තේ යි.

ආර්යාවෙනි, සඞසයා මවදන් අසාවා, මේ මෙනම් ඇති මෙහෙණ ගැහැවියා ද ගැහැවිපුතු ද සමඟ හැනීගියා වාසය කෙරෙයි. ඕතොමෝ ඒ වස්තුව නො දුරලයි. ඉදින් සඟනට පැමිණිකල් ඇත්තේ නම් සඞස තෙමේ මෙනම් ඇති මෙහෙණහට ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සමනුභාෂණය කරන්නේ යැ. මේ ඥප්ති යි.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා භික්ඛුනී සංසට්ඨා විහරති ගහපතිනාපි ගහපතිපුත්තෙනාපි. සා තං වත්ථුං නප්පටිනිස්සජ්ජති. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. යස්සා අය්‍යාය ඛමති, ඉත්ථන්නාමාය භික්ඛුනියා සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සා තුණ්හස්ස යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨා සඞ්ඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා නප්පටිනිස්සජ්ජති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා නප්පටිනිස්සජ්ජති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසමනුභාසන්තියා, පටිනිස්සජ්ජන්තියා, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසික්ඛාපදං.

## 4. 4. 7

## සත්තමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං— තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරන්ති. ධුත්තා දූසෙන්ති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරිස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:



Free Distribution www.aathaapi.org

ආර්යාවෙනි සඞසයා මවදන් අසාවා. මේ මෙනම ඇති මෙහෙණ ගැහැවියා ද ගැහැවිපුතු ද සමඟ හැනීගියා වාසය කෙරෙයි. ඕතොමෝ ඒ වස්තුව නො දුරලයි. සඞසයා මෙනම ඇති මෙහෙණහට ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සමනුභාෂණය කෙරෙයි. මෙනම් ඇති මෙහෙණහට ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සමනුභාෂණය යම් ආයඞාවකට රුස්නේ නම් ඕතොමෝ නිහඬ වන්නී යැ, යමකට නො රුස්නේ නම් ඕතොමෝ කියන්නී යැ. දෙවනවට දු තෙල කරුණ කියමි ... තෙවනවට දු තෙල කරුණ කියමි. ... මෙනම් ඇති මෙහෙණ ඒ වස්තුහුගේ දුරැලීම පිණිස සඞසයා විසින් සමනුභාෂණය කරන ලද්දී යැ. සඞනට රුස්නේ යැ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි යි.

ඥප්තියෙන් දුකුළා යැ. දෙකම් වදනින් දෙදුකුළා යැ. කම් වදන් පිරියතැ පවිති ඇවැත් වෙයි.

දහැම්කම්හි දහැම්කම් සඤ් ඇත්තී නො දුරැලා නම් පවිති ඇවැත් වෙයි. දහැම්කම්හි විමති ඇත්තී නො දුරැලා නම් පවිති ඇවැත් වෙයි. දහැම්කම්හි නො දහැම්කම් සඤ් ඇත්තී නො දුරැලා නම් පවිති ඇවැත් වේ.

නො දහැම්කම්හි දහැම්කම් සඤ් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දහැම්කම්හි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො දහැම්කම්හි නො දහැම්කම් සඤ් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

සමනුභාෂණය නො කරන්තියට, දුරැලන්තියට, උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

සවන සිකපද යි.

## 4. 4. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ සැක සහිතැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටතුළැ ගැල් සාත්තු නැතියාහු චාරිකායෙහි හැසිරෙත්. ධූර්තයෝ දූෂණය කෙරෙත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්, ''කෙසේ නම් මෙහෙණෝ සැකසහිතැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටතුළැ ගැල්සාත්තු නැතියාහු චාරිකාවෙහි හැසුරුණාහු ද''යි... හැබැද මහණෙනි, මෙහෙණෝ සැකසහිතැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටතුළැ ගැල් සාත්තු නැතියාහු හැසුරුණාහු දයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ සැකසහිතැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටතුළැ ගැල්සාත්තු නැතියාහු චාරිකාවෙහි හැසුරුණාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:



Free Distribution www.aathaapi.org

"යා පන භික්ඛුනී අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරෙය්‍ය පාචිත්තිය"න්ති.

**යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අන්තොරට්ඨෙති:** යස්ස විජිතෙ විහරති තස්ස රට්ඨෙ.

**සාසඞ්කං** නාම තස්මිං මග්ගෙ චොරානං නිවිට්ඨොකාසො දිස්සති භුත්තොකාසො දිස්සති ඨිතොකාසො දිස්සති නිසින්නොකාසො දිස්සති නිපන්නොකාසො දිස්සති.

**සප්පටිභයං** නාම: තස්මිං මග්ගෙ චොරෙහි මනුස්සා හතා දිස්සන්ති විලුත්තා දිස්සන්ති ආකොටිතා දිස්සන්ති.

**අසත්ථිකා** නාම: විනා සත්ථෙන

**චාරිකං චරෙය්‍යාති:** කුක්කුටසම්පාදෙ ගාමෙ ගාමන්තරෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සත්ථෙන සහ ගච්ඡති, ඛෙමෙ අප්පටිභයෙ ගච්ඡති, ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං

## 4. 4. 8

## අට්ඨමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරන්ති. ධුත්තා දූසෙන්ති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

"යා පන භික්ඛුනී තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකා චාරිකං චරෙය්‍ය පාචිත්තිය"න්ති.



Free Distribution www.aathaapi.org

**"යම් මෙහෙණක් තොමෝ සැක සහිතයැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රට තුළැ ගැල් සාත්තු නැතියා චාරිකායෙහි හැසිරේ නම් පචිති වේ" ය යි.**

2. **යා පන:** යම්, යම්බඳු...භික්ඛුනී... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අන්තොරට්ඨෙ:** යමක්හුගේ රටෙහි වෙසේ නම් ඔහුගේ රටෙහි යැ.

**සාසඞ්ක** නම්: එ මඟෙහි සොරුන් වුසූ තැනෙක් පැනෙයි. අහර-කිස කළ තැනෙක් පැනෙයි. සිටි තැනෙක් පැනෙයි, හුන් තැනෙක් පැනෙයි. හොත් තැනෙක් පැනේ.

**සප්පටිභය** නම්: එ මඟෙහි සොරුන් විසින් නසන ලද මිනිස්සු පැනෙති. වොලෝ ගන්නා ලද්දහු පැනෙති. කොළන ලද්දහු පැනෙති.

**අසත්ථිකා** නම්: ගැල් සාත්තුව හැර.

**චාරිකං චරෙය්‍ය:** කුකුළු ගමන් ඇති ගමෙහි නම් ගමතුරෙහි ගමතුරෙහි පචිති ඇවැත් වෙයි. නො ගමවූ අරන්හි අඩයොත්නෙහි අඩයොත්නෙහි පචිති ඇවැත් වේ.

ගැල් සාත්තුව සමග යේ නම් ඝේමෙ වූ ප්‍රතිභය රහිත වූ ගමෙහි යේ නම් ඇවැත් නැත. ආපදයෙහි උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සත්වන සික්‍ෂපද යි.**

## 4. 4. 8

## අටවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි මෙහෙණෝ සැක සහිතයැයි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටින් පිටතැ ගැල් සාත්තු නැතියාහු චාරිකාවෙහි හැසිරෙත්. ධූර්තයෝ දූෂණය කෙරෙත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මෙහෙණෝ සැක සහිතයැයි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටින් පිටතැ ගැල් සාත්තු නැතියාහු චාරිකාවෙහි හැසුරුණාහු ද"යි, ... සැබෑද මහණෙනි, මෙහෙණෝ සැක සහිතයැයි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටින් පිටතැ ගැල් සාත්තු නැතියාහු චාරිකාවෙහි හැසිරෙත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ සැක සහිතයැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටින් පිටතැ ගැල් සාත්තු නැතියාහු චාරිකාවෙහි හැසුරුණාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තොමෝ වනාහි සැක සහිතැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ රටින් පිටතැ ගැල් සාත්තු නැතියා චාරිකාවෙහි හැසිරේ නම් පචිති වේ" ය යි.**

2. **යා පනාති:** යා යාදිසා —පෙ— **භික්ඛුනීති:** —පෙ— අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**තිරොරට්ඨෙති:** යස්ස විජිතෙ විහරති තං ඨපෙත්වා අඤ්ඤස්ස රට්ඨෙ.

**සාසඞ්කං** නාම: තස්මිං මග්ගෙ චොරානං නිවිට්ඨොකාසො දිස්සති භුත්තොකාසො දිස්සති ඨිතොකාසො දිස්සති නිසින්නොකාසො දිස්සති නිපන්නොකාසො දිස්සති.

**සප්පටිභයං** නාම: තස්මිං මග්ගෙ චොරෙහි මනුස්සා හතා දිස්සන්ති විලුත්තා දිස්සන්ති ආකොටිතා දිස්සන්ති.

**අසත්ථිකා** නාම: විනා සත්ථෙන.

**චාරිකං චරෙය්‍යාති:** කුක්කුටසම්පාදෙ ගාමෙ ගාමන්තරෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සත්ථෙන සහ ගච්ඡති, ඛෙමෙ අප්පටිභයෙ ගච්ඡති, ආපදාසු උම්මත්තිකාය —පෙ— ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

## 4. 4. 9

## නවමසික්ඛාපදං,

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අන්තොවස්සං චාරිකං චරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අන්තොවස්සං චාරිකං චරිස්සන්ති. හරිතානි තිණානි[1] සම්මද්දන්තා එකින්ද්‍රියං ජීවං විහෙඨෙන්තා බහූ ඛුද්දකෙ පාණෙ සඞ්ඝාතං ආපාදෙන්තා"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං යා තා භික්ඛුනියො අප්පිච්ඡා —පෙ— තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛුනියො අන්තොවස්සං චාරිකං චරිස්සන්තී"ති —පෙ— සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො අන්තොවස්සං චාරිකං චරන්ති" ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා —පෙ— කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො අන්තොවස්සං චාරිකං චරිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය —පෙ— එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනී අන්තොවස්සං චාරිකං චරෙය්‍ය පාචිත්තිය"න්ති.**

1. හරිතානි තිණානිච – මජසං, සිමු ii



Free Distribution www.aathaapi.org

2. **යා පන:** යම්, යම්බඳු...**භිකුණී**...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**තිරොරට්ඨය** නම්: යමක්හුගේ රටෙහි වෙසේ නම් එය තබා අනෙකක්හුගේ රටෙහි යැ.

**සාසඞ්ක** නම්: එ මඟෙහි සොරුන් වුසූ තැනෙක් පැනෙයි. අහර කිය කළ තැනෙක් පැනෙයි. සිටි තැනෙක් පැනෙයි. හුන් තැනෙක් පැනෙයි, හොත් තැනෙක් පැනේ.

**සප්පටිභය** නම්: එ මඟෙහි සොරුන් විසින් නැසූ මිනිස්සු පැනෙති, වොලොගන්නා ලද්දහු පැනෙති. කොළන ලද්දහු පැනෙත්.

**අසත්ථිකා** නම්: ගැල් සාත්තුව හැර.

**චාරිකං චරෙය්‍ය:** කුකුළු ගමන් ඇති ගමෙහි නම් ගමතුරෙහි ගමතුරෙහි පචිති ඇවැත් වෙයි. නොගම් වූ අරන්හි අඩයොත්නෙහි අඩයොත්නෙහි පචිති ඇවැත් වේ.

ගැල් සාත්තුව සමග යේ නම්. ක්ෂෙම වූ ප්‍රතිභය රහිත වූ ගමෙහි යේ නම් ඇවැත් නැත. ආපදයෙහි උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

අටවන සිකපද යි.

## 4. 4. 9

## නවවන සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර **වෙළුවන** නම් **කලන්දක** නිවාපයෙහි වැඩැවෙසෙති, එසමයෙහි වනාහි මෙහෙණෝ ඇතුළුවසැ චාරිකායෙහි හැසිරෙත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මෙහෙණෝ ඇතුළු වසැ නිල්තණ මඩින්නෝ එකෙන්ද්‍රිය ජීවය පෙළන්නෝ බොහෝ කුඩා පණුවන් විනාශයට පමුණුවන්නාහු චාරිකායෙහි හැසුරුණාහු ද"යි.

2. **භික්ෂුණීහු** ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ ඇතුළු වසැ චාරිකායෙහි හැසුරුණාහු ද යි... සැබෑද මහණෙනි, මෙහෙණෝ ඇතුළු වසැ චාරිකායෙහි හැසිරෙත් දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ ඇතුළු වසැ චාරිකායෙහි හැසුරුණාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තොමෝ ඇතුළු වසැ චාරිකායෙහි හැසිරේ නම් පචිති වේ" ය යි.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා **භික්ඛුනීති.**

**අන්තොවස්සන්ති:** පුරිමං වා තෙමාසං **පච්ඡිමං වා** තෙමාසං අවසිත්වා.

**චාරිකං චරෙය්‍යාති:** කුක්කුටසම්පාදෙ ගාමෙ ගාමන්තරෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සත්තාහකරණීයෙන ගච්ඡති, කෙනචි උබ්බාළ්හා ගච්ඡති, ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**නවමසික්ඛාපදං.**

## 4. 4. 10

## දසමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ.** තෙන ඛො පන සමයෙන **භික්ඛුනියො** තත්ථෙව රාජගහෙ **වස්සං** වසන්ති. තත්ථ හෙමන්තං තත්ථ ගිම්හං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "ආහුන්දරිකා භික්ඛුනීනං දිසා අන්ධකාරා න ඉමාසං දිසා පක්ඛායන්තී''ති.[1]

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං **උජ්ඣා-යන්තානං** ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරො-චෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙන හි භික්ඛවෙ, භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච: සඞ්ඝසුට්ඨුතාය -පෙ- සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී වස්සං වුත්ථා චාරිකං න පක්කමෙය්‍ය අන්තමසො ඡප්පඤ්චයොජනානිපි පාචිත්තිය''න්ති.**

---

1. පෙක්ඛායන්තීති - සිමු.



Free Distribution www.aathaapi.org

3. **යා පන:** යම්, යම්බඳු... **භික්ෂුණී**...මෝ තොමෝ මේ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අනෙකාවස්සං:** පළමු තෙමස හෝ පැසුළු තෙමස හෝ නො වැස.

**චාරිකං චරෙය්‍ය:** කුකුළු ගමන් ඇතිගමෙහි නම ගමතුරෙහි ගමතුරෙහි පචිති ඇවැත් වෙයි. නොගම් වූ අරන්හි අඩයොත්නෙහි අඩයොත්නෙහි පචිති ඇවැත් වේ.

සත්තාහකරණීයයෙන් යේ නම්, කිසිවකු විසින් උවදුරු කරන ලද්දී යේ නම්, ආපදයෙහි උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

නවම සිකපද යි.

## 4. 4. 10

## දසම සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර වෙළුවන නම් **කලන්දකනිවාපයෙහි** වැඩ වෙසෙති, එසමයෙහි වනාහි මෙහෙණෝ එහි මැ රජගහනුවර වස් වෙසෙති. හිමින් සමය එහි යැ. ගිම්න් සමය එහි යැ. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "මෙහෙණන්ට දිගුහු හකයහ, අඳුරුයහ, මොවුනට දිසාවෝ නො වැටහෙති"යි.

2. **භික්ෂුණීහු** ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. එකල්හි ඒ මෙහෙණෝ භික්ෂූන්ට තෙල කරුණ ඇරොජූහු. භික්ෂූහු භාග්‍යවතුන්ට තෙල කරුණ ඇරොජූහු. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක. එසේ නම් මහණෙනි, මෙහෙණන්හට දස කරුණක් පිණිස සිකපද පනවන්නෙමි. සඞ්ඝයාගේ මනාබව පිණිස යැ... සසුන් චිරකල් පැවැත්ම පිණිස යැ. විනයට රුකුල් පිණිස යැ. මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසන්වා:

**"යම් මෙහෙණක් තොමෝ වැස නිමවූ වස් ඇතියා යටත් පිරිසෙයින් සපස් යොදුනකුදු චාරිකායෙහි නොයේ නම් පචිති වේ" ය යි.**

3. යා පනාති: යා යාදිසා —පෙ— භික්ඛුනීති: —පෙ— අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

වස්සං වුත්ථා නාම: පුරිමං වා තෙමාසං පච්ඡිමං වා තෙමාසං වස්සං වුත්ථා චාරිකං න පක්කමිස්සාමි අන්තමසො ඡප්පඤ්ච යොජනානිපීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: සති අන්තරායෙ පරියෙසිත්වා දුතියිකං භික්ඛුනිං න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය —පෙ— ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං.

## තුවට්ටවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

සයාපාවරණාඵාසු දුක්ඛිතා උපස්සයෙන ච
සංසට්ඨා ද්වෙ රට්ඨා අන්තොවස්සෙන චාරිකාති.



Free Distribution www.aathaapi.org

3. යා පන: යම්, යම්බඳු...භික්ෂුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**වස්සංවුත්ථා** නම්: පළමු තෙමස හෝ පැසුළු තෙමස හෝ වැස නිමවූ වස් ඇතියා යටත් පිරිසෙයින් සපස් යොදුනකුදු චාරිකායෙහි නො යන්නෙම් යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා දෙවන මෙහෙණක නො ලබා නම් ඇවැත් නැත. ගිලන් වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සිකපද යි.

## චතුර්ථ තුවට්ට වර්ග යි.

එහි උද්දානය :-

සොයා යැ එකත්‍ථරණ යැ අඵාසුක යැ දුක්ඛිත යැ උපස්සය සමඟ සංසට්ඨ යැ අන්තොරට්ඨ—තිරොරට්ඨ දෙක යැ අන්තො-වස්සය සමඟ චාරිකා යැ යි.

# 4. 5. 1

## පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන රඤ්ඤො **පසෙනදිස්ස කොසලස්ස** උය්‍යානෙ චිත්තාගාරෙ පටිභානචිත්තං කතං හොති. බහූ මනුස්සා චිත්තාගාරං දස්සනාය ගච්ඡන්ති. ඡබ්බග්ගියාපි භික්ඛුනියො චිත්තාගාරං දස්සනාය අගමංසු. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො චිත්තාගාරං දස්සනාය ගච්ඡිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො'ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො චිත්තාගාරං දස්සනාය ගච්ඡිස්සන්ති''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො චිත්තාගාරං දස්සනාය ගච්ඡන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො චිත්තාගාරං දස්සනාය ගච්ඡිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී රාජාගාරං වා චිත්තාගාරං වා ආරාමං වා උය්‍යානං වා පොක්ඛරණිං වා දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**රාජාගාරං** නාම: යත්ථ කත්ථචි රඤ්ඤො කීළිතුං රමිතුං කතං හොති.

**චිත්තාගාරං** නාම: යත්ථ කත්ථචි මනුස්සානං කීළිතුං රමිතුං කතං හොති.

**ආරාමො** නාම: යත්ථ කත්ථචි මනුස්සානං කීළිතුං රමිතුං කතං හොති.

**උය්‍යානං** නාම: යත්ථ කත්ථචි මනුස්සානං කීළිතුං රමිතුං කතං හොති.

**පොක්ඛරණී** නාම: යත්ථ කත්ථචි මනුස්සානං කීළිතුං රමිතුං කතං හොති.



Free Distribution www.aathaapi.org

# 4. 5. 1

## පළමු සික්ඛාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එසමයෙහි වනාහි ප්‍රසෙනජිත් කොශල රාජයාගේ උයනෙහි වූ චිත්‍රාගාරයෙහි ප්‍රතිභාන චිත්‍රයෙක් කරන ලද්දේ වෙයි. බොහෝ මිනිස්සු චිත්‍රාගාරය දැකීම පිණිස යෙති. සවග මෙහෙණෝ ද චිත්‍රාගාරය දැකීම පිණිස ගියාහු ය ... මිනිස්සු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ ගෘහී කාමභොගිනියන් මෙන් චිත්‍රාගාරය දැකීම පිණිස ගියාහු දැ"යි.

2. භික්ෂුණීහු ලමුකොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවගමෙහෙණෝ චිත්‍රාගාරය දැකීම පිණිස ගියාහු දැ" යි. ... සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ චිත්‍රාගාරය දැකීම පිණිස යෙත් දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණෝ චිත්‍රාගාරය දැකීම පිණිස ගියාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් රාජාගාරයක් හෝ චිත්‍රාගාරයක් හෝ ආරාමයක් හෝ උයනක් හෝ පොකුණක් හෝ දැකීම පිණිස යේ නම් පචිති වේ" යයි.**

3. **යා පන:** යම්, **යම්බඳු** ... **භික්ෂුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස්කරන ලද **භික්ෂුණී** යි.

**රාජාගාර** නම්: යම්කිසි තැනෙකැ රජුට කෙළනට ඇලෙන්නට කරන ලද්දේ වෙයි.

**චිත්‍රාගාර** නම්: යම්කිසි තැනෙකැ මිනිසුනට කෙළනට ඇලෙන්නට කරන ලද්දෙක් වෙයි.

**ආරාම** නම්: යම්කිසි තැනෙකැ මිනිසුනට කෙළනට ඇලෙන්නට කරන ලද්දෙක් වෙයි.

**උයාන** නම්: යම්කිසි තැනෙකැ මිනිසුනට කෙළින්නට ඇලෙන්නට කරන ලද්දෙක් වෙයි.

**පොක්ඛරණී** නම්: යම්කිසි තැනෙකැ මිනිසුනට කෙළනට ඇලෙන්නට කරනලද්දී වේ.

දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතා පස්සති ආපත්ති පාචිත්තියස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති ආපත්ති පාචිත්තියස්ස. එකමෙකං දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතා පස්සති ආපත්ති පාචිත්තියස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ආරාමෙ ඨිතා පස්සති, ගච්ඡන්ති වා ආගච්ඡන්ති වා පස්සති, සති කරණීයෙ ගන්ත්වා පස්සති, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

## 4, 5. 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථි නිදානං- තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ආසන්දිම්පි පල්ලඞ්කම්පි පරිභුඤ්ජන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො ආසන්දිම්පි පල්ලඞ්කම්පි පරිභුඤ්ජිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො''ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො ආසන්දිම්පි පල්ලඞ්කම්පි පරිභුඤ්ජිස්සන්ති''ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ආසන්දිම්පි පල්ලඞ්කම්පි පරිභුඤ්ජන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ආසන්දිම්පි පල්ලඞ්කම්පි පරිභුඤ්ජිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී ආසන්දිං වා පල්ලඞ්කං වා පරිභුඤ්ජෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ආසන්දි** නාම: අතික්කන්තපමාණා වුච්චති.

**පල්ලඞ්කො** නාම: ආහරිමෙහි වාළෙහි කතො හොති.

**පරිභුඤ්ජෙය්‍යාති:** තස්මිං අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.



Free Distribution www.aathaapi.org

දැකීම පිණිස යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියා දකී නම් පචිති ඇවැත් වෙයි. දසුන් උවසර හැරපියා පුනපුනා දකී නම් පචිති ඇවැත් වෙයි. එකක් එකක් දැකීම පිණිස යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියා දකී නම් පචිති ඇවැත් වෙයි. දසුන් උවසර හැරපියා පුනපුනා දකී නම් පචිති ඇවැත් වේ.

අරමෙහි සිටියා දකී නම්, යන්නී හෝ එන්නී හෝ දකී නම්, කරණී ඇති කල්හි ගොස් දකී නම්, අවැත් නැත. ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පළමු සිකපද යි.**

## 4. 5. 2

## දෙවන සිකපදය

1. **ශ්‍රාවස්ති නිදන යි** — **එසමයෙහි** ව්නාහි මෙහෙණෝ දික්හහළා පුවු ද පලඟ ද **පිරිබෝ කරති.** මිනිස්සු විහාරචාරිකාවෙහි ඇවිදින්නාහු දැකැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ ගෘහී කාමභොගිනියන් මෙන් දික්හහළා පුවු ද පලඟ ද පිරිබෝ කළාහු දැ''යි.

2. භික්ෂුණීහු ලමුකොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ දික්හහළා පුවු ද පලඟ ද පිරිබෝ කළාහු දැ''යි ... සැබැ ද මහණෙනි මෙහෙණෝ දික්හහළා පුවු ද පලඟ ද පිරිබෝ කරත් දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ දික්හහළා පුවු ද පලඟ ද පිරිබෝ කළාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි; මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් දික්හහලා පුවු හෝ පලඟ හෝ පිරිබෝ කෙරේ නම් පචිති වේ''ය යි.**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ෂුනී** ... මේ නොමෝ වෙ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**ආසන්දි නම්:** ඉක්ම වූ පමණ ඇතියා කියනු ලැබේ.

**පලඞ්ක නම්:** ඇරැහිඳුවා කළ වග රුවින් කරන ලද්දේ වෙයි.

**පරිභුඤ්ජෙය්‍යය:** එහි වැදහිඳී නම් හෝ වැද හොවී නම් හෝ පචිති ඇවත් වේ.

**අනාපත්ති:** ආසන්දියා පාදෙ ඡින්දිත්වා පරිභුඤ්ජති, පල්ලඞ්කස්ස වාළෙ භින්දිත්වා පරිභුඤ්ජති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං**

## 4. 5. 3

## තතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො සුත්තං කන්තන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො සුත්තං කන්තිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති.

2. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො සුත්තං කන්තිස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො සුත්තං කන්තන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො සුත්තං කන්තිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී සුත්තං කන්තෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සුත්තං** නාම: ඡ සුත්තානි. ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගං.

**කන්තෙය්‍යාති:** සයං කන්තති පයොගෙ දුක්කටං උජ්ජවුජ්ජවෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** කන්තිතසුත්තං කන්තති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං**



Free Distribution www.aathaapi.org

දික්හගළා පුටුවෙහි පා සිඳපියා පිරිබෝ කෙරේ නම්, පලඟෙහි වගරු බිඳපියා පිරිබෝ කෙරේ නම්, ඇවැත් නොවේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දෙවන සිකපද යි.

## 4. 5. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි — එසමයෙහි වනාහි සවග මෙහෙණෝ හූ කටිති. මිනිස්සු විහාරචාරිකාවෙහි ඇවිදින්නාහු දැක ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ ගෘහී කාමභොගිනියන් මෙන් හූ කැටුහු ද''යි.

2. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණෝ හූ කැටුහු ද''යි ... සැබෑද මහණෙනි සවග මෙහෙණෝ හූ කටිත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණෝ හූ කැටුහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් හූ කටී නම් පචිති වේ''යයි.**

3. **යා පන:** යම්, යම් බඳු ... **භික්ඛුනී** ... මෝ ොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**සූත්‍රක** නම්: හූ සයෙකි. කොමුහූ යැ, කපුහූ යැ, නියැදහූ යැ, පලස් හූ යැ, හණහූ යැ, මුසුහූ යැ.

**කණෙනතයා:** තොමෝ කටී නම් පියෝහි දූකුළා වෙයි. කැට නගා නගා හිද්දෙහි ඔත්කල්හි පචිති ඇවැත් වේ.

කටින ලද හුයක් කටී නම් ඇවැත් නොවේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

තෙවන සිකපද යි.



Free Distribution www.aathaapi.org

# 4. 5. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථිනිදානං– තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ගිහීවෙය්‍යාවච්චං කරොන්ති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො ගිහීවෙය්‍යාවච්චං කරිස්සන්තී''ති. –පෙ– සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ගිහීවෙය්‍යාවච්චං කරොන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. –පෙ– කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ගිහීවෙය්‍යාවච්චං කරිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී ගිහීවෙය්‍යාවච්චං කරෙය්‍ය පාචිත්තිය''න්ති.**

2. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ගිහී වෙය්‍යා වච්චං** නාම: අගාරිකස්ස යාගුං වා භත්තං වා ඛාදනීයං වා පචති, සාටකං වා වෙඨනං වා ධොවති, ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** යාගුපානෙ සඞ්ඝභත්තෙ චෙතියපූජාය අත්තනො වෙය්‍යාවච්චකරස්ස යාගුං වා භත්තං වා ඛාදනීයං වා පචති සාටකං වා වෙඨනං වා ධොවති උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

චතුත්ථසික්ඛාපදං.

# 4. 5, 5

## පඤ්චමසික්ඛාපදං

සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ථුල්ලනන්දං භික්ඛුනිං උපසඞ්කමිත්වා එතදවොච: ''එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහී''ති. ථුල්ලනන්දා භික්ඛුනී සාධූති පටිස්සුණිත්වා[1] නෙව වූපසමෙති න වූපසමාය උස්සුක්කං කරොති. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

---

1. පටිස්සුණිත්වා සිමුi සිමුii HO

## 4. 5. 4

## සිවුවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි– එසමයෙහි වනාහි මෙහෙණෝ ගිහියන් පිළිබඳ වතාවත් කෙරෙති. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ ගිහියන් පිළිබඳ වතාවත් කළාහු දැ''යි...සැබෑද මහණෙනි මෙහෙණෝ ගිහියන් පිළිබඳ වතාවත් කෙරෙත් දැ යි... සැබැවැ භාග්‍ය-වතුන් වහන්ස භගවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි මෙහෙණෝ ගිහියන් පිළිබඳ වතාවත් කළාහුද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් ගිහියන් පිළිබඳ වතාවත් කෙරේ නම් පචිති වේ''ය යි.**

2. **යා පන:** යම්, යම්බඳු...භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්‍ථයෙහි ලා අදහස් කරනලද භික්ෂුණී යි.

**ගිහිවෙය්‍යාවච්ච** නම්: ගිහියකුහට කැඳක් හෝ බතක් හෝ කෑ යුත්තක් හෝ පිසා නම්, සළුවක් හෝ වෙළුමක් හෝ දෙවා නම් පචිති ඇවැත් වේ.

හඹු පීමෙහි සඟබත්හි සැපිදුමෙහි තමාගේ වතාවත්කරුට කැඳක් හෝ බතක් හෝ කෑ යුත්තක් හෝ පිසා නම්, සළුවක් හෝ වෙළුමක් හෝ දෙවා නම් ඇවැත් නො වේ. උම්මත්තිකාවට ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සිවුවන සික්පද යි.**

## 4. 5. 5

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි — එසමයෙහි වනාහි එක්තරා මෙහෙණක් තොමෝ **ථුල්ලනන්‍දා** භික්ෂුණිය වෙත එළඹැ ''ආයාණිවෙනි එව මේ අධිකරණය සන්සිඳුව''යි කිවු යැ. ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ ''මැනැවැ''යි ගිවිසැ නො මැ සන්සිඳුවයි. සන්සිඳුවාලීම පිණිස වෑයම් නො කෙරෙයි. එකල්හි ඒ මෙහෙණ මෙහෙණන්ට තෙල කරුණ ඇරෙව්වු යැ.


Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා භික්ඛුනියා 'එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහී'ති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා නෙව වූපසමෙස්සති න වූපසමාය උස්සුක්කං කරිස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා 'එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහී'ති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා නෙව වූපසමෙති න වූපසමාය උස්සුක්කං කරොතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා 'එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහී'ති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා නෙව වූපසමෙස්සති න වූපසමාය උස්සුක්කං කරිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනී භික්ඛුනියා එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහීති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව වූපසමෙය්‍ය න වූපසමාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුනියාති:** අඤ්ඤාය භික්ඛුනියා.

**අධිකරණං** නාම: චත්තාරි අධිකරණානි. විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං.

**එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහීති:** එහය්‍යෙ ඉමං අධිකරණං විනිච්ඡෙහි.

**සා පච්ඡා අනන්තරායිකිනීති:** අසති අන්තරායෙ.

**නෙව වූපසමෙය්‍යාති:** න සයං වූපසමෙය්‍ය.

**න වූපසමාය උස්සුක්කං කරෙය්‍යාති:** න අඤ්ඤං ආණාපෙය්‍ය. නෙව වූපසමෙස්සාමි න වූපසමාය උස්සුක්කං කරිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා අධිකරණං නෙව වූපසමෙති න වූපසමාය උස්සුක්කං කරොති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකා අධිකරණං නෙව වූපසමෙති න වූපසමාය උස්සුක්කං කරොති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා අධිකරණං නෙව වූපසමෙති න වූපසමාය උස්සුක්කං කරොති ආපත්ති පාචිත්තියස්ස.



Free Distribution www.aathaapi.org

2. යම් මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලඹු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයඝා ථුල්ලනන්දා මෙහෙණක විසින් 'ආයඝාවෙනි එව මේ අධිකරණය සන්සිඳව' යි කියනු ලබන්නී 'මැනැවැ'යි ගිවිසැ නො මැ සන්සිඳවූ ද? සන්සිඳවා ලීම පිණිස වැයම් නො කළා දූයි ... සැබෑ ද මහණෙනි ථුල්ලනන්දා භික්ෂුණී මෙහෙණක විසින් 'ආයඝාවෙනි එව මේ අධිකරණය සන්සිඳවයි කියනු ලබන්නී මැනැවැ යි ගිවිසැ නො මැ සන්සිඳවා ද සන්සිඳවාලීම පිණිස වැයම් නො කෙරේ ද' යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... ''කෙසේ නම් මහණෙනි ථුල්ලනන්දා භික්ෂුණී මෙහෙණක විසින් 'ආයඝාවෙනි එව මේ අධිකරණය සන්සිඳව' යි කියනු ලබන්නී මැනැවැ යි ගිවිසැ නොම සන්සිඳවූද සන්සිඳවාලීම පිණිස වැයම් නො කළා ද යි. මහණෙනි මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් මෙහෙණක විසින් 'ආයඝාවෙනි එව මේ අධිකරණය සන්සිඳව'යි කියනු ලබන්නී මැනැවැයි ගිවිසැ පසුවැ අනතුරක් නැත්තී නොමැ සන්සිඳවා නම් සංසිඳවීමට වැයම් නො කෙරේ නම් පචිති වේ''ය යි,**

3. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**භික්ඛුනියා:** අන් මෙහෙණක විසින්.

**අධිකරණ නම්:** විවාදධිකරණ යැ අනුවාදධිකරණ යැ ආපත්තාධිකරණ යැ කිච්චාධිකරණ යැ යි සතර අධිකරණයෙකි.

**එහයෙය්‍ය ඉමං අධිකරණං වූපසමෙහි:** ආයඝාවෙනි එව මේ අධිකරණය විනිශ්චය කරව.

**සා පච්ඡා අනන්තරායිකිනී:** අනතුරක් නැති කල්හි.

**නෙව වූපසමෙය්‍යා:** තොමෝ නො සන්සිඳුව යි.

**න වූපසමාය උස්සුක්කං කරෙය්‍ය:** මෙරමාහට නො අණවයි. නො මැ සන්සිඳවන්නෙමි, සන්සිඳවාලීම පිණිස වැයම් නො කරන්නෙමි යි ධුරනික්ෂේපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

උපසපනක කෙරෙහි උපසපන්සත් ඇතියා අධිකරණය නො මැ සන්සිඳවා නම් සන්සිඳවාලීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි විමති ඇතියා අධිකරණය නොම සන්සිඳුවා නම් සන්සිඳවාලීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක කෙරෙහි අනුපසපන්සත් ඇතියා නො මැ සන්සිඳවා නම් සන්සිඳවාලීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

අනුපසම්පන්නාය අධිකරණං නෙව වූපසමෙති න වූපසමාය උස්සුක්කං කරොති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** සති අන්තරායෙ, පරියෙසිත්වා න ලභති, ගිලානාය ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

පඤ්චමසික්ඛාපදං

## 4. 5. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන **ථුල්ලනන්දා භික්ඛුනී** නටානම්පි නටකානම්පි ලඞ්ඝිකානම්පි සොකසායිකානම්පි කුම්භථූණිකානම්පි සහත්ථා ඛාදනීයං භොජනීයං දෙති, මය්හං පරිසතිං වණ්ණං භාසථාති. නටාපි නටකාපි ලඞ්ඝිකාපි සොකසායිකාපි කුම්භථූණිකාපි ථුල්ලනන්දාය භික්ඛුනියා පරිසතිං වණ්ණං භාසන්ති: "අය්‍යා ථුල්ලනන්දා බහුස්සුතා භාණිකා විසාරදා පට්ඨා ධම්මිං කථං කාතුං. දෙථ අය්‍යාය කරොථ අය්‍යායා"ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අගාරිකස්ස සහත්ථා ඛාදනීයං භොජනීයං දස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අගාරිකස්ස සහත්ථා ඛාදනීයං භොජනීයං දෙතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී අගාරිකස්ස සහත්ථා ඛාදනීයං භොජනීයං දස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**"යා පන භික්ඛුනී අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අගාරිකො** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**පරිබ්බාජකො** නාම: භික්ඛුඤ්ච සාමණෙරඤ්ච ඨපෙත්වා යො කොචි පරිබ්බාජකසමාපන්නො.

අනුපසපනක පිළිබඳ අධිකරණය නො මැ සන්සිඳවා නම් සන්සිඳවාලීම පිණිස වැයම් නො කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි උපසපන්සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි අනුපසපන් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා නො ලබා නම්, ඇවැත් නො වේ. ගිලන්වූවාට ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපද යි.**

## 4. 5. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි ථුල්ලනන්‍ද භික්ෂුණී තොමෝ නටවන්නන්ට ද නටන්නන්ට ද පනින්නන්ට ද ඉඳුරුදලියන්ට ද කළකිඩියරුන්ට ද පිරිස්හි මාගේ ගුණකියව යි සියතින් කෑ යුත්තක් හෝ බිදිය යුත්තක් හෝ දෙයි. නටවන්නෝ ද නටන්නෝ ද පනින්නෝ ද ඉඳුරුදලියෝ ද කළකිඩියරු ද පිරිස්හි ථුල්ලනන්‍ද භික්ෂුණියගේ ගුණ කියති. ආයඊ වූ ථුල්ලනන්‍ද තොමෝ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තී පිරිවැහූ බණ දහම් ඇත්තී විශාරද වූවා දැහැමි කථා කියන්නට අග්‍ර වූවා වෙයි. ආයඊාවට දෙවු ආයඊාවට (සත්කාර) කරව යි.

2 යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආයඊා ථුල්ලනන්‍ද ගිහියකුහට සියතින් කෑ යුත්තක් බිදිය යුත්තක් දුනු ද"යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්‍ද භික්ෂුණී ගිහියකුහට සියතින් කෑ යුත්තක් බිදිය යුත්තක් දේ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි ථුල්ලනන්‍ද භික්ෂුණී ගිහියකුහට සියතින් කෑ යුත්තක් බිදිය යුත්තක් දුනු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් ගිහියකුහට හෝ පිරිවැජියකුහට හෝ පිරිවැජිනියකට හෝ සියතින් කෑ යුත්තක් හෝ බිදිය යුත්තක් හෝ දේ නම් පචිති වේ"යයි.**

3. **යා පන; යම්, යම්බඳු...භික්ෂුනී:** ... මෝ තොමෝ මේ අත්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අගාරික** නම්: යම් කිසිවෙක් ගෙහි වෙසෙ යි ද (හේ යැ)

**පරිබ්බාජක** නම්: මහණ ද බෙරණ ද තබා පිරිවැජිබවට පැමිණි යම් කිසිවෙකි.



Free Distribution www.aathaapi.org

**පරිබ්බාජිකා** නාම: භික්ඛුඤ්ච සික්ඛමානඤ්ච සාමණෙරඤ්ච ඨපෙත්වා යා කාචි පරිබ්බාජිකසමාපන්නා.

**ඛාදනීයං** නාම: පඤ්චභොජනානි උදකදන්තපොණං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම: පඤ්චභොජනානි. ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං.

**දදෙය්‍යාති:** කායෙන වා කායපටිබද්ධෙන වා නිස්සග්ගියෙන වා දෙති ආපත්ති පාචිත්තියස්ස. උදකදන්තපොණං දෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** දපෙති න දෙති, උපනික්ඛිපිත්වා දෙති, බාහිරාලොපං[1] දෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසික්ඛාපදං

## 4. 5. 7

## සත්තමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං- තෙන ඛො පන සමයෙන **ථුල්ලනන්දා භික්ඛුනී ආවසථචීවරං** අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති. **අඤ්ඤා** උතුනියො **භික්ඛුනියො** න **ලභන්ති.** යා තා **භික්ඛුනියො** අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති **ඛීයන්ති** විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ආවසථචීවරං** නාම: උතුනියො භික්ඛුනියො පරිභුඤ්ජන්තූති දින්නං හොති.

**අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජෙය්‍යාති:** ද්වෙ තිස්සො රත්තියො පරිභුඤ්ජිත්වා චතුත්ථදිවසෙ ධොවිත්වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරාය[2] වා අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

---

1. බාහිරාලෙපං-මජසං,
2. සාමණෙරියා-මජසං,



Free Distribution www.aathaapi.org

**පරිබ්බාජිකා** නම්: මෙහෙණ ද භික්මනුව ද හෙරණියද තබා පිරිවැජි බවට පැමිණි යම් කිසිවක.

**ඛාදනීය** නම්: පස් බොජුන දිය දැහැටි තබා සෙස්ස ඛාදනීය නම් වේ.

**භොජනීය** නම: පස් බොජුනැ, බත් යැ, කොමු යැ, අත්සුණු යැ, දියමස් යැ, ගොඩමස් යැ.

**දදෙය්‍යා**: කයින් හෝ කයපිළිබැඳියකින් හෝ නිසැගියෙන් හෝ දේ නම් පචිති ඇවැත් වේ. දිය දැහැටි දේ නම් දුකුළා ඇවැත් වේ.

දෙවානම්, නො දේ නම්, වෙතැ තබා දේ නම්, බැහැරි පිඩක් දේ නම් උම්මත්තිකාවට ...ආදිකම්මිකාවට ඇවැත් නැති. ඇවැත් නො වේ.

සවන සිකපද යි.

## 4. 5. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි — එසමයෙහි වනාහි ථුල්ලනන්‍දා භික්ෂුණී ආවසථ චීවරය නො නිසැජැ පිරිබෝ කෙරෙයි. අනෙක් ඔසප්වූ මෙහෙණෝ නො ලබත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආය්‍ය්‍යා ථුල්ලනන්‍දා තොමෝ ආවසථචීවරය නොනිසැජැ පිරිබෝ කළා ද''යි ... සැබෑද මහණෙනි ථුල්ලනන්‍දා භික්ෂුණී ආවසථචීවරය නො නිසැජැ පිරිබෝ කෙරේ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි ථුල්ලනන්‍දා භික්ෂුණී ආවසථචීවරය නොනිසැජැ පිරිබෝ කළා ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා;

**''යම් මෙහෙණක් ආවසථචීවරය නොනිසැජැ පිරිබෝ කෙරේ නම් පචිති වේ'' යයි.**

2. **යා පන**: යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**ආවසථචීවර** නම: ඔසප්වූ මෙහෙණෝ පිරිබෝ කෙරෙත්ව යි දෙන ලද්දේ වෙයි.

**අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජෙය්‍යා**: දෙතුන් රැයක් පිරිබෝ කොට සිවුවන දිනයෙහි දෙවා මෙහෙණකට හෝ භික්මනුවකට හෝ හෙරණියකට හෝ නොනිසැජැ පිරිබෝ කෙරේ නම් පචිති ඇවැත් වේ.

අනිස්සජ්ජිතෙ[1] අනිස්සජ්ජිතසඤ්ඤා පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අනිස්සජ්ජිතෙ වෙමතිකා පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අනිස්සජ්ජිතෙ නිස්සජ්ජිතසඤ්ඤා පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

නිස්සජ්ජිතෙ අනිස්සජ්ජිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. නිස්සජ්ජිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. නිස්සජ්ජිතෙ නිස්සජ්ජිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** නිස්සජ්ජිත්වා පරිභුඤ්ජති, පුනපරියායෙන පරිභුඤ්ජති. අඤ්ඤා උතුනියො න හොන්ති, අච්ඡින්නචීවරිකාය, නට්ඨචීවරිකාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං

## 4. 5. 8

## අට්ඨමසික්ඛාපදං

සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කාමි. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දාය භික්ඛුනියා ආවසථො ඩය්හති. භික්ඛුනියො එවමාහංසු: "හන්දය්‍යෙ භණ්ඩකං නීහරාමා"ති. එකච්චා එවමාහංසු: "න මයං අය්‍යෙ නීහරිස්සාම යං කිඤ්චි නට්ඨං සබ්බං අම්හෙ අභියුඤ්ජිස්සතී"ති. ථුල්ලනන්දා භික්ඛුනී පුනදෙව තං ආවසථං පච්චාගන්ත්වා භික්ඛුනියො පුච්ඡි, "අපය්‍යෙ භණ්ඩකං නීහරිත්ථා"ති "න මයං අය්‍යෙ නීහරිම්හා"ති. ථුල්ලනන්දා භික්ඛුනී උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛුනියො ආවසථෙ ඩය්හමානෙ භණ්ඩකං න නීහරිස්සන්තී"ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කාමීති.[2] සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමෙය්‍ය පාචිත්තිය"න්ති.**

1. අනිස්සජ්ජිතෙ - සීමු. සීමුii
2. පක්කාමීති - මජසං,



Free Distribution www.aathaapi.org

නොනිසැඳු සිවුරෙහි නොනිසැඳුසන් ඇතියා පිරිබෝ කෙරේ නම් පචිති ඇවැත් වෙයි. නොනිසැඳු සිවුරෙහි විමති ඇතියා පිරිබෝ කෙරේ නම් පචිති ඇවැත් වෙයි. නොනිසැඳු සිවුරෙහි නිසැඳුසන් ඇතියා පිරිබෝ කෙරේ නම් පචිති ඇවැත් වේ.

නිසැඳු සිවුරෙහි නොනිසැඳු සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නිසැඳු සිවුරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වේ. නිසැඳු සිවුරෙහි නිසැඳු සන් ඇතියා නම් ඇවැත් නැති.

නිසැඳු පිරිබෝ කෙරේ නම්, නැවත පිළිවෙළින් පිරිබෝ කෙරේ නම්, අන් මෙහෙණෝ ඔසප් නොවූවෝ වෙත් නම්, ඇසිඳගත් සිවුරු ඇතියාට, නට සිවුරු ඇතියාට, ඇවැත් නො වේ. ආපදයෙහි, උම්මත්තිකාවට ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සත්වන සිකපද යි.**

## 4. 5. 8

## අටවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි — එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ආවාසය නොනිසැඳ චාරිකාවට ගියා යැ. එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණියගේ ආවාසය දැවේ. භික්ෂුණීහු මෙසේ කීහු: ''ආය්‍ය්‍යාවෙනි එසේ නම් බඩු බැහැර කරම්හ''යි. ඇතැම් මෙහෙණ කෙනෙක් ''ආය්‍ය්‍යාවෙනි, අපි බැහැර නො කරම්හ. යමක් නැසුණේ නම් (ඒ) සියල්ල අපගෙන් විචාරා'' යැ යි මෙසේ කීහු. ථුල්ලනන්ද භික්ෂුණී නැවැත ඒ ආවාසයට පෙරළා අවුත් මෙහෙණන් පිළිවුසූ යැ. ආය්‍ය්‍යාවෙනි, බඩු බැහැර කළහු ද යි. ආය්‍ය්‍යාවෙනි, අපි නො බැහැර කළම්හ. ථුල්ලනන්ද භික්ෂුණී ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: ''කෙසේ නම් මෙහෙණෝ ආවාසය දැවෙන කල්හි බඩු බැහැර නො කළාහුද'' යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: ''කෙසේ නම් ආය්‍ය්‍යා ථුල්ලනන්ද තොමෝ ආවාසය නො නිසැඳ චාරිකාවට ගියා ද''යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී ආවාසය නො නිසැඳ චාරිකාවට ගියා ද යි. සැබෑ වැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි ථුල්ලනන්ද භික්ෂුණී ආවාසය නො නිසැඳ චාරිකාවට ගියා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් ආවාසය නොනිසැඳ චාරිකාවට යේ නම් පචිති වේ'' යයි.**

3\. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

ආවසථො නාම: කවාටබද්ධො වුච්චති.

අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමෙය්‍යාති: භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරාය වා අනිස්සජ්ජිත්වා පරික්ඛිත්තස්ස ආවසථස්ස පරික්ඛෙපං අතික්කාමෙන්තියා ආපත්ති පාචිත්තියස්ස. අපරික්ඛිත්තස්ස ආවසථස්ස උපචාරං අතික්කාමෙන්තියා ආපත්ති පාචිත්තියස්ස.

අනිස්සජ්ජිතෙ අනිස්සජ්ජිතසඤ්ඤා පක්කමති ආපත්ති පාචිත්තියස්ස. අනිස්සජ්ජිතෙ වෙමතිකා පක්කමති ආපත්ති පාචිත්තියස්ස. අනිස්සජ්ජිතෙ නිස්සජ්ජිතසඤ්ඤා පක්කමති ආපත්ති පාචිත්තියස්ස.

අකවාටබද්ධං අනිස්සජ්ජිත්වා පක්කමති ආපත්ති දුක්කටස්ස. නිස්සජ්ජිතෙ අනිස්සජ්ජිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. නිස්සජ්ජිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. නිස්සජ්ජිතෙ නිස්සජ්ජිතසඤ්ඤා අනාපත්ති.

අනාපත්ති: නිස්සජ්ජිත්වා පක්කමති, සති අන්තරායෙ පරියෙසිත්වා, න ලභති, ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

## 4. 5. 9

## නවමසික්ඛාපදං

1\. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං පරියාපුණන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං පරියාපුණිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති.

3. යා පන: යම්, යම්බඳු...භික්ෂුණී ... මේ තොරමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

ආවසථ නම්: කවුළු බැඳියේ කියනු ලැබේ.

**අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමෙය්‍ය:** මෙහෙණකට හෝ හික්මනුවකට හෝ හෙරණියකට හෝ නොනිසැජ්ජ පිරිකෙව් කළ ආවාසයෙහි පරික්ෂේපය ඉක්මවන්නියට පචිති ඇවැත් වෙයි. නො පිරිකෙව් කළ ආවාසයෙහි උවසර ඉක්මවන්නියට පචිති ඇවැත් වේ.

නොනිසැජියෙහි නොනිසැජු සත් ඇතියා බැහැර යේ නම් පචිති ඇවැත් වෙයි. නොනිසැජියෙහි විමති ඇතියා බැහැර යේ නම් පචිති ඇවැත් වෙයි. නොනිසැජියෙහි නිසැජුසත් ඇතියා බැහැර යේ නම් පචිති ඇවැත් වේ.

කවුළු නො බැඳියක් නොනිසැජ බැහැර යේ නම් දුකුළා ඇවැත් වෙයි. නිසැජියෙහි නොනිසැජුසත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නිසැජියෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වේ. නිසැජියෙහි නිසැජු සත් ඇතියා නම් ඇවැත් නැති.

නිසැජ බැහැර යේ නම්, අනතුරක් ඇති කල්හි, සොයා නො ලබා නම්, ඇවැත් නො වේ. ගිලන්වූවාට ආපදයෙහි, උම්මත්තිකාවට ආදිකම්මිකාවට ඇවැත් නැති.

අටවන සිකපද යි.

## 4. 5. 9

## නවවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි — එසමයෙහි ඡබ්බග්ගිය මෙහෙණෝ තිරශ්චීනවිද්‍යා පුහුණු කෙරෙත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් ''කෙසේනම් මෙහෙණෝ ගිහිකාමභොගිනියන් මෙන් තිරශ්චීනවිද්‍යා පුහුණු කළාහු ද''යි.

**2.** අප්පිච්ඡා ... අනෙ භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං පරියාපුණිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං පරියාපුණන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං පරියාපුණිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී තිරච්ඡානවිජ්ජං පරියාපුණෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**තිරච්ඡානවිජ්ජං**[1] නාම: යං කිඤ්චි බාහිරකං අනත්ථසංහිතං.

**පරියාපුණෙය්‍යාති:** පදෙන පරියාපුණාති පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස. අක්ඛරාය පරියාපුණාති අක්ඛරක්ඛරාය ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ලෙඛං පරියාපුණාති ධාරණං පරියාපුණාති ගුත්තත්ථාය පරිත්තං පරියාපුණාති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

නවමසික්ඛාපදං

## 4. 5. 10

### දසමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං වාචෙන්ති. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං වාචෙස්සන්ති සෙය්‍යථාපි ගිහිනියො කාමභොගිනියො"ති.

---

1. තිරච්ඡානවිජ්ජා, - මජසං.



Free Distribution www.aathaapi.org

2. භික්ෂුණීහු ලමුකොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේනම් සවග මෙහෙණෝ තිරශ්චීනවිද්‍යා පුහුණු කළාහු දැ"යි ... "සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ තිරශ්චීනවිද්‍යා පුහුණු කෙරෙත් දැ"යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණෝ තිරශ්චීනවිද්‍යා පුහුණු කළාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යම් මෙහෙණක් තිරශ්චීනවිද්‍යා පුහුණු කෙරේ නම් පචිති වේ" යයි.

3. යා පන: යම්, යම්බඳු ... භික්ඛුනී ... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

තිරච්ඡානවිජ්ජා නම්: අවැඩින් යුත් බැහැරි යම් කිසිවකි.

පරියාපුණෙය්‍ය: පෙදෙන් පුහුණු කෙරේ නම් පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වෙයි. අකුරින් පුහුණු කෙරේ නම් අකුරෙහි අකුරෙහි පචිති ඇවැත් වේ.

ලිවීම පුහුණු කෙරේ නම්, දැරීම පුහුණු කෙරේ නම්, ආරක්‍ෂාව පිණිස මන්ත්‍ර පුහුණු කෙරේ නම් ඇවැත් නො වේ. උම්මත්තිකාවට ආදිකම්මිකාවට ඇවැත් නැත.

නවවන සිකපද යි.

## 4. 5. 10

## දසවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි — එසමයෙහි වනාහි සවග මෙහෙණෝ තිරශ්චීන විද්‍යා හදාරවත්. මිනිස්සු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේනම් මෙහෙණෝ ගිහිකාමභෝගිනියන් මෙන් තිරශ්චීනවිද්‍යා හැදෑරවූහු දැ යි.

2. අසොසාසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං වාචෙස්සන්ති"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං වාචෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං වාචෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යා පන භික්ඛුනී තිරච්ඡානවිජ්ජං වාචෙය්‍ය පාචිත්තිය"න්ති.

3. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**තිරච්ඡානවිජ්ජං** නාම: යං කිඤ්චි බාහිරකං අනත්ථසංහිතං.

**වාචෙය්‍යාති:** පදෙන වාචෙති පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස අක්ඛරාය වාචෙති අක්ඛරක්ඛරාය ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ලෙඛං වාචෙති ධාරණං වාචෙති ගුත්තත්ථාය පරිත්තං වාචෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං.

## චිත්තාගාරවග්ගො පඤ්චමො

**තස්සුද්දානං:**

රාජා සඤ්චි සුත්තඤ්ච ගිහිවූපසමෙන ච,
දදෙද චීවරාවසථං පරියාපුණවාචනෙති.



Free Distribution www.aathaapi.org

2. භික්ෂුණීහු ලමු කොට සිතන, නුගුණ පවසන, දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණෝ තිරශ්චීන විද්‍යා හැදෑරූවූහු ද යි ... 'සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ තිරශ්චීන විද්‍යා හදරවත් ද'යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නාම් මහණෙනි, සවග මෙහෙණෝ තිරශ්චීන විද්‍යා හැදෑරූවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

''යම් මෙහෙණක් තිරශ්චීනවිද්‍යා හදරවා නම් පචිති වේ'' යයි.

3. **යා පන:** යම්, යම්බඳු ... භික්ඛුනී ... මෝ කොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**තිරච්ඡානවිජ්ජා** නම්: අවැඩින් යුත් බැහැරි යම්කිසි විද්‍යාවකි.

වාචෙය්‍ය: පදයෙන් හදරවා නම් පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වෙයි. අකුරින් හදරවා නම් අකුරෙහි අකුරෙහි පචිති ඇවැත් වේ.

ලිවීම හදරවා නම්, දැරීම හදරවා නම්, ආරක්ෂාව පිණිස මන්ත්‍ර හදරවා නම් ඇවැත් නො වේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**දසවන සිකපද යි.**

## පසළොස්වම චිත්තාගාර වර්ග යි

**එහි උද්දානය:**

රාජාගාර යැ ආසන්දි යැ සුත්ත යැ ගිහි (වෙයාවච්ච) යැ වූපසම යැ (ආහාර) දන යැ චීවර යැ ආවසථ යැ පරියාපුණන යැ වාචන යැ යි.

## 4. 6. 1

## පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ ගාමකාවාසෙ එකචීවරා චීවරකම්මං කරොන්ති. භික්ඛුනියො අනාපුච්ඡා ආරාමං පවිසිත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමිංසු. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අනාපුච්ඡා ආරාමං පවිසිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො අනාපුච්ඡා ආරාමං පවිසිස්සන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අනාපුච්ඡා ආරාමං පවිසිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අනාපුච්ඡා ආරාමං පවිසෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

2. තෙන ඛො පන සමයෙන තෙ භික්ඛූ තම්හා ආවාසා පක්කමිංසු. භික්ඛුනියො "අය්‍යා පක්කන්තා"ති ආරාමං නාගමිංසු[1] අථ ඛො තෙ භික්ඛූ පුනදෙව තං ආවාසං පච්චාගච්ඡිංසු. භික්ඛුනියො 'අය්‍යා ආගතා'ති ආපුච්ඡා ආරාමං පවිසිත්වා යෙන තෙ භික්ඛූ තෙන උපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා භික්ඛුනියො තෙ භික්ඛූ එතදවොචුං: "කිස්ස තුම්හෙ භගිනියො ආරාමං නෙව සම්මජ්ජිත්ථ. න පානීයං පරිභොජනීයං උපට්ඨාපිත්ථා"ති. භගවතා අය්‍යා සික්ඛාපදං පඤ්ඤත්තං[2] "න අනාපුච්ඡා ආරාමො පවිසිතබ්බො"ති. තෙන මයං න ආගමිම්හාති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ සන්තං භික්ඛුං ආපුච්ඡා ආරාමං පවිසිතුං." එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී සන්තං භික්ඛුං අනාපුච්ඡා ආරාමං පවිසෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

1. නාගමිංසු-මජසං.
2. පඤ්ඤත්තං හොති – මජසං.



Free Distribution www.aathaapi.org

## 4. 6. 1

## පළමු සිකපදය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩැවෙසෙති. එ සමයෙහි වනාහි බොහෝ භික්‍ෂූහු ගම්බද අවසෙක්හි එක් සිවුරක් ඇතියාහු සිවුරුකම් කෙරෙත්. මෙහෙණෝ නො පිළිවිසැ අරමට පිවිස ඒ භික්‍ෂූන් වෙත එළඹියහ. භික්‍ෂූහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ නො පිළිවිසැ අරමට පිවිසියාහු දැ''යි ... සැබෑද මහණෙනි, මෙහෙණෝ නො පිළිවිසැ අරමට පිවිසෙත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ නො පිළිවිසැ අරමට පිවිසියාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් නො පිළිවිසැ අරමට පිවිසේ නම් පචිති වේ''යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් මෙහෙණන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

2. එ සමයෙහි වනාහි ඒ භික්‍ෂූහු ඒ අවසින් බැහැර ගියහ. මෙහෙණෝ ආයුෂ්මයෝ බැහැර ගියාහ යි අරමට නො පැමිණියහ. එකල්හි ඒ භික්‍ෂූහු යළිත් ඒ අවසට පෙරළා ආහ. මෙහෙණෝ ආයුෂ්මයෝ ආවාහ යි පිළිවිසැ අරමට පිවිස ඒ භික්‍ෂූන් වෙත එළඹියහ. එළැඹැ ඒ භික්‍ෂූන් වැඳ එකත් පසෙකැ සිටියහ. එකත් පසෙකැ සිටියාවූ ඒ මෙහෙණන්ට ඒ භික්‍ෂූහු මෙය කීහු: 'බුහුනෙනි, තෙපි කුමක් හෙයින් අරම නො මැ හැමදුහු ද? පැන් හා පිරිබෝදිය නො මැ එළවා තැබූහු දැ'යි. ආයුෂ්මයෙනි, භාග්‍යවතුන් විසින් 'නො පිළිවිසැ අරමට නො පිවිසියයුතු'යැ යි සිකපදයෙක් පනවනලදී. එහෙයින් අපි නො පැමිණියම්හ යි. භාග්‍යවතුන්ට මෙතල කරුණ ඇසෙරූහු ... 'මහණෙනි, ඇති මහණක්හු පිළිවිසැ අරමට පිවිසෙන්නට අනුදනිමි'යි. මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් ඇති මහණක්හු නො පිළිවිසැ අරමට පිවිසේ නම් පචිති වේ''යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් මෙහෙණන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.



Free Distribution www.aathaapi.org

3. තෙන ඛො පන සමයෙන තෙ භික්ඛූ තම්හා ආවාසා පක්කමිත්වා පුනදෙව තං ආවාසං පච්චාගච්ඡිංසු. භික්ඛුනියො "අය්‍යා පක්කන්තා"ති අනාපුච්ඡා ආරාමං පවිසිංසු. තාසං කුක්කුච්චං අහොසි. භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං "න සන්තං භික්ඛුං අනාපුච්ඡා ආරාමො පවිසිතබ්බො"ති. මයඤ්චම්හා සන්තං භික්ඛුං අනාපුච්ඡා ආරාමං පවිසිම්හා. කච්චිනු ඛො මයං පාචිත්තියං ආපත්තිං ආපන්නාති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ජානං සභික්ඛුකං ආරාමං අනාපුච්ඡා පවිසෙය්‍ය පාචිත්තිය"න්ති.**

4. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්සා ආරොචෙන්ති සො වා ආරොචෙති.

**සභික්ඛුකො ආරාමො** නාම: යත්ථ භික්ඛූ රුක්ඛමූලෙපි වසන්ති.

**අනාපුච්ඡා ආරාමං පවිසෙය්‍යාති:** භික්ඛුං වා සාමණෙරං වා ආරාමිකං වා අනාපුච්ඡා පරික්ඛිත්තස්ස ආරාමස්ස පරික්ඛෙපං අතික්කාමෙන්තියා ආපත්ති පාචිත්තියස්ස, අපරික්ඛිත්තස්ස ආරාමස්ස උපචාරං ඔක්කමන්තියා ආපත්ති පාචිත්තියස්ස.

සභික්ඛුකෙ සභික්ඛුකසඤ්ඤා සන්තං භික්ඛුං අනාපුච්ඡා ආරාමං පවිසති ආපත්ති පාචිත්තියස්ස. සභික්ඛුකෙ වෙමතිකා සන්තං භික්ඛුං අනාපුච්ඡා ආරාමං පවිසති ආපත්ති දුක්කටස්ස. සභික්ඛුකෙ අභික්ඛුකසඤ්ඤා සන්තං භික්ඛුං අනාපුච්ඡා ආරාමං පවිසති අනාපත්ති.

අභික්ඛුකෙ සභික්ඛුකසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අභික්ඛුකෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අභික්ඛුකෙ අභික්ඛුකසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** සන්තං භික්ඛුං ආපුච්ඡා පවිසති අසන්තං භික්ඛුං අනාපුච්ඡා පවිසති සීසානුලොකිකා[1] ගච්ඡති, යත්ථ භික්ඛුනියො සන්නිපතිතා හොන්ති, තත්ථ ගච්ඡති ආරාමෙන මග්ගො හොති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

1. සීසානුලොමිකා-- මීii

3. එ සමයෙහි වනාහි ඒ භික්ෂූහු ඒ අවසින් බැහැර ගොස් නැවැතත් එ මැ අවසට පෙරළා ආහ. මෙහෙණෝ ආයුෂ්මයෝ බැහැර ගියාහු යයි නො පිළිවිසැ අරමට පිවිසියහ. ඒ මෙහෙණන්ට කුකුසෙක් විය, භාග්‍යවතුන් විසින් 'ඇති මහණක්හු නො පිළිවිසැ අරමට නො පිවිසියයුතු ය'යි සිකපදයෙක් පනවන ලදී. අපි ඇති මහණක්හු නො පිළිවිසැ අරමට පිවිසියෙමු. කිම? අපි පචිති ඇවැතට පැමිණියමෝ ද යි. භාග්‍යවතුන්ට මෙපල කරුණ ඇරොදූහු. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දහැම් කථා කොට මහණුන් ඇමැතූසේක ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් දන දන මහණුන් සහිත අරමකට නො පිළිවිසැ පිවිසේ නම් පචිති වේ"යයි.**

4. යා පන: යම්, යම්බඳු ... භික්ෂූනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණිය යි.

**ජානාති නම්:** තොමෝ හෝ දනියි. අන්හු හෝ ඇයට ඇරොජති. ඔහු හෝ ඇරොජත්.

**සභික්ඛුක ආරාම නම්:** යම් තැනෙක රුක්මුලෙක්හි ද මහණෝ වෙසෙත්ද ඒ අරම.

**අනාපුච්ඡා ආරාමං පවිසෙය්‍ය:** මහණක්හු හෝ හෙරණක්හු හෝ ආරාමිකයක්හු හෝ නො පිළිවිසැ පිරිකෙව් කළ අරම්හි පරික්ෂේපය ඉක්මවන්නියට පචිති ඇවැත් වෙයි. නො පිරිකෙව් කළ අරම්හි උවසරට බසින්නියට පචිති ඇවැත් වේ.

භික්ෂුසහිතයෙහි භික්ෂුසහිතසංඥා ඇතියා ඇති මහණක්හු නො පිළිවිසැ අරමට පිවිසේ නම් පචිති ඇවැත් වෙයි. භික්ෂුසහිතයෙහි විමති ඇතියා ඇති මහණක්හු නො පිළිවිසැ අරමට පිවිසේ නම් දුකුළා ඇවැත් වෙයි. භික්ෂුසහිතයෙහි භික්ෂුරහිතසංඥා ඇතියා ඇති මහණක්හු නො පිළිවිසැ අරමට පිවිසේ නම් ඇවැත් නැති.

භික්ෂුරහිතයෙහි භික්ෂුසහිතසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. භික්ෂුසහිතයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වේ. භික්ෂුරහිතයෙහි භික්ෂුරහිතසංඥා ඇතියා නම් ඇවැත් නැති.

ඇති මහණක්හු පිළිවිසැ පිවිසේ නම්, නැති මහණක්හු නො පිළිවිසැ පිවිසේ නම්, හිස අනුව බලමින් යේ නම්, යම් තැනෙකැ මෙහෙණෝ රැස්වූවාහු වෙත් ද එහි යේ නම්. අරම්හි මග වේ නම්, ගිලන්වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පළමු සිකපද යි.**



Free Distribution www.aathaapi.org

## 4. 6. 2

## දුතියසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා මහාවනෙ විහරති කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන ආයස්මතො උපාලිස්ස උපජ්ඣායො ආයස්මා කප්පිතකො සුසානෙ විහරති. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියානං භික්ඛුනීනං මහන්තතරා[1] භික්ඛුනී කාලකතා[2] හොති. ඡබ්බග්ගියා භික්ඛුනියො තං භික්ඛුනිං නීහරිත්වා ආයස්මතො කප්පිතකස්ස විහාරස්ස අවිදූරෙ ඣාපෙත්වා ථූපං කත්වා ගන්ත්වා තස්මිං ථූපෙ රොදන්ති. අථ ඛො ආයස්මා කප්පිතකො තෙන සද්දෙන උබ්බාළ්හො තං ථූපං භින්දිත්වා පකිරෙසි. ඡබ්බග්ගියා භික්ඛුනියො "ඉමිනා කප්පිතකෙන අම්හාකං අය්‍යාය ථූපො භින්නො හන්ද නං ඝාතෙමා"ති මන්තෙසුං. අඤ්ඤතරා භික්ඛුනී ආයස්මතො උපාලිස්ස එතමත්ථං ආරොචෙසි. ආයස්මා උපාලි ආයස්මතො කප්පිතකස්ස එතමත්ථං ආරොචෙසි. අථ ඛො ආයස්මා කප්පිතකො විහාරා නික්ඛමිත්වා නිලීනො අච්ඡි. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛුනියො යෙනායස්මතො කප්පිතකස්ස විහාරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතො කප්පිතකස්ස විහාරං පාසාණෙහි ච ලෙඩ්ඩූහි ච ඔත්ථරාපෙත්වා මතො කප්පිතකොති පක්කමිංසු.

2. අථ ඛො ආයස්මා කප්පිතකො තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. අද්දසංසු ඛො ඡබ්බග්ගියා භික්ඛුනියො ආයස්මන්තං කප්පිතකං පිණ්ඩාය චරන්තං. දිස්වාන එවමාහංසු: "අයං කප්පිතකො ජීවති. කො නු ඛො අම්හාකං මන්තං සංහරී"ති. අස්සොසුං ඛො ඡබ්බග්ගියා භික්ඛුනියො "අය්‍යෙන කිර උපාලිනා අම්හාකං මන්තො සංහටො"ති. තා ආයස්මන්තං උපාලිං අක්කොසිංසු: "කථං හි නාම අයං කාසාවටො මලමජ්ජනො නිහීනජච්චො අම්හාකං මන්තං සංහරිස්සතී"ති.

යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො අය්‍යං උපාලිං අක්කොසිස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො උපාලිං අක්කොසන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො උපාලිං අක්කොසිස්සන්තීති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය – පෙ – එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසථ:

**"යා පන භික්ඛුනී භික්ඛුං අක්කොසෙය්‍ය වා පරිභාසෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

---

1. මහත්තරා - මජ්ඣං. මහතරා
2. කාලඞ්කතා - මජ්ඣං.



Free Distribution www.aathaapi.org

## 4. 6. 2

## දෙවන සිකපදය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුහු **විසල්පුර** මහවෙනෙහි කූටාගාරශාලෙහි වැඩවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උපාලි තෙරුන්ගේ උපාධ්‍යාය වූ ආයුෂ්මත් **කප්පිතක** තෙරණුවෝ සොහොනෙහි වෙසෙති. එසමයෙහි වනාහි සවග මෙහෙණන් අතුරෙහි මහතෙර වූ මෙහෙණ තොමෝ කළුරිය කළා වෙයි. සවග මෙහෙණෝ ඒ මෙහෙණ ගෙන ගොස් ආයුෂ්මත් කප්පිතක තෙරුන්ගේ විහාරයට නුදුරෙහි දවා තුඹක් කොට ගොස් ඒ තුඹ ළඟ හඬත්. එකල්හි ආයුෂ්මත් කප්පිතක තෙරණුවෝ ඒ ශබ්දයෙන් පීඩිත වූවාහු ඒ තුඹ බිඳ විසුරුවාලූහ. සවග මෙහෙණෝ “මේ කප්පිතකයා විසින් අපගේ ආර්‍යාවගේ තුඹ බිඳින ලදී. එබැවින් ඔහු නසාලම්හ”යි මන්ත්‍රණය කළාහු යැ. එක්තරා මෙහෙණක් ආයුෂ්මත් උපාලි තෙරුන්ට තෙල කරුණ ඇරෙවූහ. ආයුෂ්මත් උපාලි තෙරණුවෝ ආයුෂ්මත් කප්පිතක තෙරුන්ට තෙල කරුණ ඇරෙවූහ. එකල්හි ආයුෂ්මත් කප්පිතක තෙරණුවෝ වෙහෙරින් නික්ම සැඟවී හුන්හ. එකල්හි සවග මෙහෙණෝ ආයුෂ්මත් කප්පිතක තෙරුන්ගේ විහාරයට එළඹියහ. එළැඹ ආයුෂ්මත් කප්පිතක තෙරුන්ගේ විහාරය පහණින් ද කැටින් ද වතුරුවා කප්පිතක මළේ යැ යි බැහැර ගියහ.

2. ඉක්බිති ආයුෂ්මත් **කප්පිතක** තෙරණුවෝ ඒ රැය ඇවෑමෙන් පෙරවරුහි ගැඳ පෙරවැ පා සිවුරු ගෙන විසල්පුරට පිඬු පිණිස පිවිසියහ. සවග මෙහෙණෝ පිඬු පිණිස හැසිරෙන ආයුෂ්මත් කප්පිතක තෙරුන් දැක මෙසේ කීහු. “මේ කප්පිතක තෙමේ ජීවත් වෙයි, කවරෙක් අපගේ මන්ත්‍රණය ගෙන ගියේ ද”යි, සවග මෙහෙණෝ “ආර්‍ය උපාලි තෙරුන් විසින් අපගේ මන්ත්‍රණය ගෙන යන ලද”යි ඇසූහු. ඔහු ආයුෂ්මත් උපාලි තෙරුන්ට ආක්‍රොශ කළහ: කෙසේ නම් මේ කාසාවට (කහවත් හැඳ නැහැවිකම් කළ මලහරින හීනජාති ඇතියේ අපගේ මන්ත්‍රණය ගෙන ගියේ ද”යි.

3. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලඹු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: “කෙසේ නම් සවග මෙහෙණෝ උපාලි ආර්‍යන්ට ආක්‍රොශ කොළෝ”ද යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙණෝ උපාලිහට ආක්‍රොශ කෙරෙත් ද යී, සැබෑව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණෝ උපාලිහට ආක්‍රොශ කළෝ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි, මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**“යම් මෙහෙණක් මහණක්හට ආක්‍රොශ කෙරේ නම් හෝ බිය එළවා නම් හෝ පචිති වේ”යි.**

4. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුනන්ති:** උපසම්පන්නං.

**අක්කොසෙය්‍ය වාති:** දසහි වා අක්කොසවත්ථූහි අක්කොසති එතෙසං වා අඤ්ඤතරෙන ආපත්ති පාචිත්තියස්ස.

**පරිභාසෙය්‍ය වාති:** භයං උපදංසෙති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤා අක්කොසති වා පරිභාසති වා ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකා අක්කොසති වා පරිභාසති වා ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤා අක්කොසති වා පරිභාසති වා ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නං අක්කොසති වා පරිභාසති වා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අත්ථපුරෙක්ඛාරාය ධම්මපුරෙක්ඛාරාය අනුසාසනී-පුරෙක්ඛාරාය උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං.**

## 4. 6. 3

## තතියසික්ඛාපදං

1. සාවත්ථි නිදානං — තෙන ඛො පන සමයෙන **චණ්ඩකාළී භික්ඛුනී** භණ්ඩනකාරිකා හොති කලහකාරිකා විවාදකාරිකා භස්සකාරිකා සඞ්ඝෙ අධිකරණකාරිකා. **ථුල්ලනන්දා භික්ඛුනී** තස්සා කම්මෙ කයිරමානෙ[1] පටික්කොසති. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී ගාමකං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අථ ඛො භික්ඛුනීසඞ්ඝො 'ථුල්ලනන්දා භික්ඛුනී පක්කන්තා''ති චණ්ඩකාළිං භික්ඛුනිං ආපත්තියා අදස්සනෙ උක්ඛිපි. ථුල්ලනන්දා භික්ඛුනී ගාමකෙ තං කරණීයං තීරෙත්වා පුනදෙව සාවත්ථිං පච්චාගඤ්ඡි.[2] චණ්ඩකාළී භික්ඛුනී ථුල්ලනන්දාය භික්ඛුනියා ආගච්ඡන්තියා නෙව ආසනං පඤ්ඤපෙසි. න පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි න පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසි. න පානීයෙන ආපුච්ඡි. ථුල්ලනන්දා භික්ඛුනී චණ්ඩකාළිං භික්ඛුනිං එතදවොච:

---

1. කරියමානෙ - මජ්ඣං
2. පච්චාගච්ඡි - මජ්ඣං,



Free Distribution www.aathaapi.org

4. යා පන: යම්, යම්බඳු ... භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

භික්ඛුං: උපසපනාක්හු.

අක්කොසෙය්‍යවා: දශආක්‍රොශවස්තුවෙන් හෝ ඔවුනතුරෙන් එක්තරයකින් හෝ ආක්‍රොශ කෙරේ නම් පචිති ඇවැත් වෙයි.

පරිභාසෙය්‍ය වා: බිය දක්වා නම් පචිති ඇවැත් වේ.

උපසපනාක්හු කෙරෙහි උපසපන්සන් ඇතියා ආක්‍රොශ කෙරේ නම් හෝ බය දක්වා නම් හෝ පචිති ඇවැත් වෙයි, උපසපනාක්හු කෙරෙහි විමති ඇතියා ආක්‍රොශ කෙරේ නම් හෝ බිය දක්වා නම් හෝ පචිති ඇවැත් වෙයි, උපසපනාක්හු කෙරෙහි අනුපසපන්සන් ඇතියා ආක්‍රොශ කෙරේ නම් හෝ බිය දක්වා නම් හෝ පචිති ඇවැත් වේ.

අනුපසපනාක්හට ආක්‍රොශ කෙරේ නම් හෝ බිය දක්වා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. අනුපසපනාක්හු කෙරෙහි උපසපන්සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනාක්හු කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනාක්හු කෙරෙහි අනුපසපන්සන් ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

අර්ථය පෙරටු කොට කියන්නියට, ධර්මය පෙරටු කොට කියන්නියට, අනුශාසනය පෙරටු කොට කියන්නියට, උම්මත්තිකාවට ... ආදි කම්මිකාවට ඇවැත් නැති.

දෙවන සික්ඛාපදයි.

## 4. 6. 3

## තෙවන සික්ඛාපදය

1. ශ්‍රාවස්ති නිදානයි – එසමයෙහි වනාහි චණ්ඩකාළී භික්ෂුණී තොමෝ ඩබරකරන්නී කලහකරන්නී විවාදකරන්නී දෙඩමළුකම් කරන්නී සඞ්ඝයා කෙරෙහි අධිකරණ කරන්නී වෙයි. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ ඇයට කම් කරනු ලබන කල්හි පටහැණි වැ කරුණු කියයි, එසමයෙහි වනාහි ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ කිසියම් ඇවැසි කටයුත්තකින් ගමකට ගියා යැ. එකල්හි භික්ෂුණීසඞ්ඝ තෙමේ ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ බැහැර ගියා යැ යි චණ්ඩකාළී භික්ෂුණියට ඇවැත් නො දක්මෙහි උක්ඛෙපනීකම් කෙළේ යැ. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ ගමෙහි ඒ ඇවැසි කටයුත්ත නිරණය කොට නැවැතත් සැවැතට පෙරළා අවු යැ. චණ්ඩකාළී භික්ෂුණී තොමෝ එන්නා වූ ථුල්ලනන්දා භික්ෂුණියට අසුන් නො මැ පැනවූ යැ. පාදෝදාදිය දෙවූ පා තබන පුටුව නො දෙවූ පාතබන පුටුව නො මැ එළවා තැබූ යැ. පෙර ගමන් කොට පා සිවුරු නො පිළිගතූ යැ. පැනින් නො පිළිවුසූ යැ. ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ චණ්ඩකාළී භික්ෂුණියට මෙය කිවූ යැ:



Free Distribution www.aathaapi.org

“කිස්ස ත්වං අය්‍යෙ මයි ආගච්ඡන්තියා නෙව ආසනං පඤ්ඤපෙසි න පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි. න පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගණ්හෙසි. න පානීයෙන ආපුච්ඡී”ති. “එවං ඛො තං අය්‍යෙ හොති යථා තං අනාථායා”ති. “කිස්ස පන ත්වං අය්‍යෙ අනාථා”ති “ඉමා මං අය්‍යෙ භික්ඛුනියො අයං අනාථා අප්පඤ්ඤාතා නත්ථි ඉමිස්සා කාචි පටිවත්තාති[1] ආපත්තියා අදස්සනෙ උක්ඛිපිංසූ”ති. ථුල්ලනන්දා භික්ඛුනී බාලා එතා අබ්‍යත්තා එතා නෙතා ජානන්ති කම්මං වා කම්මදොසං වා කම්මවිපත්තිං වා කම්මසම්පත්තිං වාති චණ්ඩීකතා ගණං පරිභාසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති “කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා චණ්ඩීකතා ගණං පරිභාසිස්සතී” -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී චණ්ඩීකතා ගණං පරිභාසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී චණ්ඩීකතා ගණං පරිභාසිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**“යා පන භික්ඛුනී චණ්ඩීකතා ගණං පරිභාසෙය්‍ය පාචිත්තිය”න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**චණ්ඩීකතා** නාම: කොධනා වුච්චති.

**ගණො** නාම: භික්ඛුනී සඞ්ඝො වුච්චති.

**පරිභාසෙය්‍යාති:** බාලා එතා අබ්‍යත්තා එතා, නෙතා ජානන්ති කම්මං වා කම්මදොසං වා කම්මවිපත්තිං වා කම්මසම්පත්තිං වාති පරිභාසති ආපත්ති පාචිත්තියස්ස. සම්බහුලා භික්ඛුනියො වා එකභික්ඛුනිං[2] වා අනුපසම්පන්නං වා පරිභාසති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අත්ථපුරෙක්ඛාරාය ධම්මපුරෙක්ඛාරාය අනුසාසනිපුරෙක්ඛාරාය උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං**

1. පතිවත්තාති - මජසං.
2. එකං භික්ඛුනිං - මජසං



Free Distribution www.aathaapi.org

ආර්යාවෙනි, තෝ කුමක් හෙයින් මා එන කල්හි අසුන් නොමැ පැනවූ, පා දෝනාදිය දෙවූ පා තබන පුටුව නො දෙවූ පා තබන පුටුව නො මැ එළවා නැබූව, පෙර ගමන් කොට පා සිවුරු නො පිළිගතුව, පැනින් නො පිළිවුසුව යි, ආර්යාවෙනි, මෙය මෙසේ මැ යි. පිළිසරණ නැතියකට මෙනි. ආර්යාවෙනි, තෝ කුමක් හෙයින් පිළිසරණ නැතියෙහි ද? ආර්යාවෙනි, මේ භික්ෂුණීහු "මෝ තොමෝ පිළිසරණ නැතියකැ අප්‍රසිද්ධ යැ, මැය පිළිබඳ වැ කිසියම් පටහැණී ව කියන්නියක් නැතැ"යි ඇවැත් නො දක්මෙහි උකෙවනීකම් කළහ යි, ථුල්ලනන්‍දා භික්ෂුණී තොමෝ මෙව්හු බාලයෝ යැ, මෙව්හු අව්‍යක්තහු යැ. මෙව්හු කර්මය හෝ කර්මදෝෂය හෝ කර්මවිපත්තිය හෝ කර්මසම්පත්තිය හෝ නො දනිති යි කළසැඩබව ඇත්තී ගණයා නැති ගැන්වූ යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලඹු කොට සිතති, නුගුණ පවසති, දෙය් පතුරුවත්: "කෙසේ නම් ආර්ය ථුල්ල-නන්‍දා තොමෝ කළ සැඩබව ඇත්තී ගණයා නැතිගැන්වූ"ද යි... සැබෑද මහණෙනි, ථුල්ලනන්‍දා මෙහෙණ කළ සැඩබව ඇත්තී ගණයා නැතිගැන්වූ ද යි, සැබැව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්‍දා මෙහෙණ කළ සැඩබව ඇත්තී ගණයා නැතිගැන්වූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් කළ සැඩබව ඇත්තී ගණයා නැති ගන්වා නම් පචිති වෙ"යි.**

3. යා පන: යම්, යාබඳු ... භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**චණ්ඩිකතා** නම්: කොධනාව කියනු ලැබෙයි.

**ගණ** නම්: මෙහෙණසඟ කියනු ලැබෙයි.

**පරිභාසෙය්‍ය**: මෙව්හු බාලයෝ යැ මෙව්හු අව්‍යක්තහු යැ, මෙව්හු කර්මය හෝ කර්මදෝෂය හෝ කර්ම විපත්තිය හෝ කර්ම සම්පත්තිය හෝ නො දනිති යි නැතිගන්වා නම් පචිති ඇවැත් වෙයි. බොහෝ මෙහෙණන්ට හෝ එක් මෙහෙණකට හෝ අනුපසපනකට හෝ නැති ගන්වා නම් දුකුළා ඇවැත් වේ.

අර්ථය පෙරටු කොට කියන්නියට, ධර්මය පෙරටු කොට කියන්නියට, අනුශාසනය පෙරටු කොට කියන්නියට, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**තෙවන සිකපදයි.**

## 4. 6. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථි නිදානං — තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බ්‍රාහ්මණො භික්ඛුනියො නිමන්තෙත්වා භොජෙසි. භික්ඛුනියො භුත්තාවී පවාරිතා ඤාතිකුලානි ගන්ත්වා එකච්චා භුඤ්ජිංසු එකච්චා පිණ්ඩපාතං ආදාය අගමංසු. අථ ඛො සො බ්‍රාහ්මණො පටිවිස්සකෙ එතදවොච: ''භික්ඛුනියො මයා අය්‍යා සන්තප්පිතා. එථ තුම්හෙපි සන්තප්පෙස්සාමී''ති තෙ එවමාහංසු ''කිං ත්වං අය්‍යො අම්හෙ සන්තප්පෙස්සසි. යාපි තයා නිමන්තිතා තාපි අම්හාකං ඝරානි ආගන්ත්වා එකච්චා භුඤ්ජිංසු එකච්චා පිණ්ඩපාතං ආදාය අගමංසූති.

2. අථ ඛො සො බ්‍රාහ්මණො උජ්ඣායති ඛීයති විපාචෙති: ''කථං හි නාම භික්ඛුනියො අම්හාකං ඝරෙ භුඤ්ජිත්වා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති, න චාහං පටිබලො යාවදත්ථං දාතු''න්ති. අස්සොසුං ඛො භික්ඛුනියො තස්ස බ්‍රාහ්මණස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො භුත්තාවී පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්තී''ති–පෙ– සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො භුත්තාවී පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජන්තී''ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා, කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො භුත්තාවී පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු :

**''යා පන භික්ඛුනී නිමන්තිතා වා පවාරිතා වා ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**නිමන්තිතා** නාම: පඤ්චන්නං භොජනානං අඤ්ඤතරෙන භොජනෙන නිමන්තිතා.

**පවාරිතා** නාම: අසනං පඤ්ඤායති භොජනං පඤ්ඤායති හත්ථපාසෙ ඨිතා අභිහරති පටික්ඛෙපො පඤ්ඤායති.

**ඛාදනීයං** නාම : පඤ්චභොජනානි යාගුං යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම: පඤ්චභොජනානි. ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං .



Free Distribution www.aathaapi.org

# 4. 6. 4

## සිවුවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි එක්තරා බමුණෙක් මෙහෙණන් පවරා වැළඳවී යැ. වළඳා අවසන් කළ පැවරූ මෙහෙණෝ නෑ කුලයනට ගොස් ඇතැම් කෙනෙක් වැළඳූහ. ඇතැම් කෙනෙක් පිණ්ඩපාතය ගෙන ගියහ. එකල්හි ඒ බමුණු අසල්වැසියනට මෙය කී යැ. ආයර්‍ය්‍යයෙනි, මා විසින් මෙහෙණෝ සතප්පනලදහ, තෙපිදු එවු සතප්පවන්නෙමි. ඔහු මෙසේ කීහු: ආයර්‍ය්‍යය, කිම තෝ අප සතප්පවන්නෙයි ද? තා විසින් යම් මෙහෙණ කෙනෙක් පවරන ලදහු ද, ඔහු දු අපගේ ගෙවලට අවුත් ඇතැම් කෙනෙක් වැළඳූහ. ඇතැම් කෙනෙක් පිණ්ඩපාතය ගෙන ගියහ යි.

2. එකල්හි ඒ බමුණු ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: ''කෙසේ නම් මෙහෙණෝ අපගේ ගෙහි වළඳා අන් තැනෙකැ වැළඳුහු ද? මම සෑහෙන පමණ දෙන්නට ප්‍රතිබල නො වෙමි''දුයි භික්ෂුණීහු, ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ බමුණගේ (අකීර්ති ශබ්දය) ඇසූහු යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: ''කෙසේ නම් වළඳා අවසන් කළ පැවැරූ මෙහෙණෝ අන්තැනෙකැ වැළඳුහු දූ''යි ... සැබෑද මහණෙනි, වළඳා අවසන් කළ පැවරූ මෙහෙණෝ අන්තැනෙකැ වළඳත් දූ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් වළඳා අවසන් කළ පැවරූ මෙහෙණෝ අන් තැනෙකැ වැළඳුහු ද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**'' යම් මෙහෙණක් නිමතනලද්දී හෝ පවරන ලද්දී හෝ කෑ යුත්තක් හෝ බිදියයුත්තක් හෝ කා නම් බුදී නම් හෝ පචිති වේ'' යයි.**

3. යා පන: යම්, යම්බඳු ... භික්ෂුනී ... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරනලද භික්ෂුණී යි.

**නිමන්තිතා** නම්: පස් බොජුන් අතුරෙන් එක්තරා බොජුනෙකින් නිමතන ලද්දී යැ.

**පවාරිතා** නම්: අඩාළ කළ බොජුන පැනෙයි, පැවරීමට නො පොහොනා බොජුන පැනෙයි, අත්පස සිටියා වෙයි, කයින් එළවයි, ප්‍රතික්ෂෙපය පැනේ.

**ඛාදනීය** නම්: පස්බොජුන, හබු යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවකය තබා සෙස්ස ඛාදනීය නම් වේ.

**භොජනීය** නම්: පස් බොජුනැ: බත් යැ කොමු යැ අත්සුණු යැ දියමස් යැ ගොඩමස් යැ.

ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.*

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** නිමන්තිතා අප්පවාරිතා යාගුං පිවති, සාමිකෙ අපලොකෙත්වා භුඤ්ජති යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං**

## 4. 6. 5

## පඤ්චමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී සාවත්ථියං අඤ්ඤතරිස්සා විසිඛාය පිණ්ඩාය චරමානා යෙන අඤ්ඤතරං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො තෙ මනුස්සා තං භික්ඛුනිං භොජෙත්වා එතදවොචුං: "අඤ්ඤාපි අය්යා භික්ඛුනියො ආගච්ඡන්තූ"ති. අථ ඛො සා භික්ඛුනී 'කථං හි නාම[1] භික්ඛුනියො නාගච්ඡෙය්යු'න්ති භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොච: අමුකස්මිං අය්යෙ ඔකාසෙ වාළා සුනඛා චණ්ඩො බලිවද්දො චික්ඛල්ලො ඔකාසො, මා ඛො තත්ථ අගමිත්ථාති. අඤ්ඤතරාපි භික්ඛුනී තස්සා විසිඛාය පිණ්ඩාය චරමානා යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො තෙ මනුස්සා තං භික්ඛුනිං භොජෙත්වා එතදවොචුං "කිස්ස අය්යෙ භික්ඛුනියො න ආගච්ඡන්තී"ති.

2. අථ ඛො සා භික්ඛුනී තෙසං මනුස්සානං එතමත්ථං ආරොචෙසි. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී කුලං මච්ඡරායිස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී කුලං මච්ඡරායතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී කුලං මච්ඡරායිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී කුලමච්ඡරිනී අස්ස පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

---

*. නිමන්තිතෙ නිමන්තිතසඤ්ඤා ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස, නිමන්තිතෙ වෙමතිකා ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස, නිමන්තිතෙ අනිමන්තිතසඤ්ඤා ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. - මජසං. (මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙයෙව දිස්සතෙ)

1. කථං අඤ්ඤා - සයා.



Free Distribution www.aathaapi.org

කත්නෙමි බුදින්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

යාමකාලිකය සත්තාහකාලිකය යාවජ්වකය අහර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වේ.

නිමතන ලද්දී නො පවරන ලද්දී හඹු බෝ නම්, හිමියන් පිළිවිසැ වළඳා නම්, යාමකාලිකය සත්තාහකාලිකය යාවජ්වකය කරුණක් ඇති කල්හි වළඳා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සිවුවන සිකපද යි.**

## 4. 6. 5

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි එක්තරා මෙහෙණක් සැවැතැ එක්තරා වීථියෙකැ පිඩු පිණිස හැසිරෙන්නී එක්තරා කුලයක් වෙත එළඹියා යැ. එළැඹැ පැන වූ අසුනෙහි හුනු යැ. එකල්හි ඒ මිනිස්සු ඒ මෙහෙණ වළඳවා මෙය කීහු: ''ආයසීාවෙනි, අන් මෙහෙණෝ ද එත්වා''යි. එකල්හි ඒ මෙහෙණ කෙසේ නම් මෙහෙණෝ නො එන්නාහු දැ යි මෙහෙණන් වෙත එළැඹැ මෙය කිවූ යැ. ''ආයසීාවෙනි, අසුවල් පෙදෙසෙහි ව්‍යාලශුනකයෝ යැ, සැඩ ගොන් යැ, මඩපියෙස් යැ. එහි නහමක් යව යි. එක්තරා මෙහෙණක් නොමෝත් ඒ වීථියෙහි පිඩු පිණිස හැසිරෙන්නී ඒ කුලය වෙත එළඹියා යැ. එළැඹැ පැනවූ අසුනෙහි හුනු යැ. එකල්හි ඒ මිනිස්සු ඒ මෙහෙණ වළඳවා මෙය කීහු: ''ආයසීාවෙනි, කුමක් හෙයින් මෙහෙණෝ නො එත් දැ'' යි.

2. එකල්හි ඒ මෙහෙණ ඒ මිනිසුන්හට තෙල කරුණ ඇරෙවු යැ. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණ, කුලය කෙරෙහි මසුරුකම් කළා දැ''යි... සැබෑද මහණෙනි, මෙහෙණ, කුලය කෙරෙහි මසුරුකම් කෙරේ දැයි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණ, කුලය කෙරෙහි මසුරුකම් කළා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් වනාහි කුල මසුරුකම් කරනසුලු වූවා වේ නම් පචිති වේ''යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... භික්ෂුනී ... මෝ නොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරනලද භික්ෂුණී යි.

**කුලං** නාම: චත්තාරි කුලානි. ඛත්තිය කුලං බ්‍රාහ්මණ කුලං වෙස්සකුලං සුද්දකුලං.

**මච්ඡරිනී අස්සාති:** කථං භික්ඛුනියො නාගච්ඡෙය්‍යුන්ති. භික්ඛුනීනං සන්තිකෙ කුලස්ස අවණ්ණං භණති[1] ආපත්ති පාචිත්තියස්ස. කුලස්ස වා සන්තිකෙ භික්ඛුනීනං අවණ්ණං භණති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** කුලං න මච්ඡරායන්තී සන්තංයෙව ආදීනවං ආචික්ඛති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

පඤ්චමසික්ඛාපදං.

## 4. 6. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො ගාමකාවාසෙ වස්සං වුත්ථා සාවත්ථිං අගමංසු. භික්ඛුනියො තා භික්ඛුනියො එතදවොචුං: ''කත්ථය්‍යායො වස්සං වුත්ථා කච්චි ඔවාදො ඉද්ධො අහොසී''ති. නත්ථ'ය්‍යො තත්ථ භික්ඛූ, කුතො ඔවාදො ඉද්ධො භවිස්සතීති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිස්සන්තී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසෙය්‍ය පාචිත්තිය''න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අභික්ඛුකො ආවාසො** නාම: න සක්කා හොති ඔවාදය වා සංවාසාය වා ගන්තුං.

වස්සං වසිස්සාමීති සෙනාසනං පඤ්ඤාපෙති පානීයං පරිභොජනීයං උපට්ඨපෙති[2] පරිවෙණං සම්මජ්ජති ආපත්ති දුක්කටස්ස. සහ අරුණුග්ගමනා ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති :** වස්සූපගතා භික්ඛූ පක්කන්තා වා හොන්ති විබ්භන්තා වා කාලකතා වා පක්ඛසඞ්කන්තා වා ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසික්ඛාපදං.

---

1. භාසති--මජසං.
2. උපට්ඨාපෙති--සීමු: සීමු:ii.



Free Distribution www.aathaapi.org

**කුල** නම්: ක්ෂත්‍රියකුල යෑ බ්‍රාහමණකුල යෑ වෛශ්‍යකුල යෑ ශූද්‍රකුල යෑ යි කුල සතරෙකි.

**මච්ඡරිනී අසස**: කෙසේ මෙහෙණෝ නො එන්නාහු දැ යි මෙහෙණන් වෙත කුලය පිළිබඳ නුගුණ කියා නම් පචිති ඇවැත් වෙයි. කුලය වෙත හෝ මෙහෙණන් පිළිබඳ නුගුණ කියා නම් පචිති ඇවැත් වේ.

කුලයට මසුරුකම් නො කරන්නී ඇති මැ දෙසක් කියා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපද යි.**

## 4. 6. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එ සමයෙහි වනාහි බොහෝ මෙහෙණෝ ගම්බද අවසෙක්හි වස් වැස නිමියාහු සැවැතට ගියාහු යෑ. මෙහෙණෝ ඒ මෙහෙණන්ට මෙය කීහු: ආයඝාවෝ නො තැන්හි වස් වැස හිටියාහු ද? කිම, අවවාද සමෑදා වී දැ යි. ආයඝාවෙනි, එහි භික්ෂූහු නැත. කොතැනින් අවවාද සමෑදා වන්නේ ද? යම් ඒ මෙහෙණ කෙණෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: "කෙසේ නම් මෙහෙණෝ භික්ෂූන් රහිත ආවාසයෙහි වස්වුසුහු දැ"යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ භික්ෂූන් රහිත ආවාස-යෙහි වස් වසත් දැ යි, සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ භික්ෂූන් රහිත ආවාසයෙහි වස් වුසුහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද වනාහි මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් භික්ෂූන් රහිත ආවාසයෙහි වස් වසා නම් පචිති වේ"යයි.**

3. **යා පන**: යම්, යම්බඳු ... භික්ෂුනී ... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**අභික්ඛුක** ආවාස නම්: සදහම් ඇසීම පිණිස හෝ පොහෝපවුරුණු පිළිවිසීම පිණිස හෝ යන්නට නො හැක්කේ වෙයි.

වස් වසන්නෙමි යි සෙනසුන් පනවා නම් පැන් පිරිබෝදිය එළවා තබා නම් පිරිවෙන හමදී නම් දුකුළා ඇවැත් වෙයි. අරුණ නැගීම සමග පචිති ඇවැත් වේ.

වස් එළැඹුණු භික්ෂූහු බැහැරැ ගියාහු හෝ උපැවිදිවූවාහු හෝ කලුරිය කළාහු හෝ තීර්ථායතනයකට ගියාහු හෝ වෙත් නම්, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සවන සිකපද යි.**

## 4. 6. 7

### සත්තමසික්ඛාපදං.

1. සාවත්ථි නිදානං– තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුනියො ගාමකාවාසෙ වස්සං වුත්ථා සාවත්ථිං අගමංසු. භික්ඛුනියො තා භික්ඛුනියො එතදවොචුං: "කත්ථය්‍යායො වස්සං වුත්ථා කත්ථ[1] භික්ඛුසඞ්ඝො පවාරිතො"ති. න මයං අය්‍යෙ භික්ඛුසඞ්ඝං පවාරෙමාති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො වස්සං වුත්ථා භික්ඛුසඞ්ඝං නප්පවාරෙස්සන්තී"ති. –පෙ– සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො වස්සං වුත්ථා භික්ඛුසඞ්ඝං නප්පවාරෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. –පෙ– කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො වස්සං වුත්ථා භික්ඛුසඞ්ඝං නප්පවාරෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී වස්සං වුත්ථා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි නප්පවාරෙය්‍ය දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**වස්සං වුත්ථා** නාම: පුරිමං වා තෙමාසං පච්ඡිමං වා තෙමාසං වුත්ථා උභතොසඞ්ඝෙ තීහි ඨානෙහි නප්පවාරෙස්සාමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වාති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සති අන්තරායෙ පරියෙසිත්වා න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං

1. කච්චි – ස්‍යා



Free Distribution www.aathaapi.org

## 4. 6. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි බොහෝ මෙහෙණෝ ගම්බද අවසෙක්හි වස් වැස හිටියාහු සැවැතට ගියාහු ය. මෙහෙණෝ ඒ මෙහෙණන්ට මෙය කීහු: ආයඨාවෝ කොතැන්හි වස් වැස නිමියාහු ද, කොතැන්හි භික්‍ෂුසඞ්ඝ තෙමෙ පවරනලද්දේ ද යි. ආයඨා-වෙනි, අපි භික්‍ෂුසඞ්ඝයා නො පවරමු, යම් ඒ මෙමෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පවරත්: "කෙසේ නම් මෙහෙණෝ වස් වැස නිමියාහු භික්‍ෂුසඞ්ඝයා නො පැවැරූහු ද"යි ... සැබෑද මහණෙනි, මෙහෙණෝ වස් වැස නිමියාහු භික්ෂුසඞ්ඝයා නො පවරත්ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ වස් වැස නිමියාහු භික්ෂුසඞ්ඝයා නො පැවැරූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යම් මෙහෙණක් වස් වැස නිමියාහු දෙසඟුන් කෙරෙහි දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ සැකයෙන් හෝ (යන) තුන් කරුණෙන් නො පවරා නම් පචිති වේ"යයි.

2. යා පන: යම්, යම්බඳු ... භික්‍ෂුණී ... මේ තොමෝ මේ අත්ථි-යෙහි ලා අදහස් කරනලද භික්‍ෂුණී යි.

**වස්සං වුත්‍ථා** නම්: පළමු තෙමස හෝ පැසුළු තෙමස හෝ වැස නිමියාහු දෙසඟුන් කෙරෙහි දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ සැකයෙන් හෝ යන තුන් කරුණෙන් නො පවරන්නෙමි යි ධුරනික්‍ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

**අනාපත්ති:** අනතුරක් ඇති කල්හි, සොයා නො ලබා නම්, ගිලන් වූවාට ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

සත්වන සිකපද යි.

## 4. 6. 8

## අට්ඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවදන්ති. භික්ඛුනියො ඡබ්බග්ගියා භික්ඛුනියො එතදවොචුං: 'එථ'ය්‍යෙ ඔවාදං ගමිස්සාමා'ති. යම්පි මයං අය්‍යෙ ගච්ඡෙය්‍යාම ඔවාදස්ස කාරණා අය්‍යා ඡබ්බග්ගියා ඉධෙව අම්හෙ[1] ඔවදන්තීති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවාදං න ගච්ඡිස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවාදං න ගච්ඡන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවාදං න ගච්ඡිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

"යා පන භික්ඛුනී ඔවාදාය වා සංවාසාය වා න ගච්ඡෙය්‍ය පාචිත්තිය"න්ති.

2. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

ඔවාදො නාම: අට්ඨ ගරුධම්මා.

සංවාසො නාම: එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා. ඔවාදාය වා සංවාසාය වා න ගච්ඡිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: සති අන්තරායෙ පරියෙසිත්වා දුතියිකං භික්ඛුනිං න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

---

1. ඉධෙව ආගන්ත්වා අම්හෙ - මජසං.



Free Distribution www.aathaapi.org

## 4. 6. 8

## අටවන සික‍පදය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුහු ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්නුගෙඅරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණෝ මෙහෙණ වරට එළැඹ සවග මෙහෙණන්ට අවවාද කෙරෙති. මෙහෙණෝ සවග මෙහෙණන්ට මෙය කීහු: ආයුෂ්මෙනි, එවු, අවවාදයට යමහයි ආයුෂ්මෙනි, අපි යම තැනකටදු අවවාද හෙතුවෙත් යන්නමෝ නම සවග ආයුෂ්මයෝ මෙහි මැ අපට අවවාද කෙරෙති යි. යම ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම සවග මෙහෙණෝ අවවාදයට නො ගියාහු ද"යි ... සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ අවවාදයට නො යෙත් ද යි. සැබැව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම මහණෙනි, සවග මෙහෙණෝ අවවාදයට නො ගියාහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම මෙහෙණක් ගරුදහම ඇසීම පිණිස හෝ පොහෝපවුරුණු පිළිවිසීම පිණිස හෝ නො යේ නම පචිති වේ"යයි.**

2. යා පන: යම, යම්බඳු ... භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරනලද භික්ෂුණී යි.

ඕවාද නම: අෂ්ට ගරුධර්මයෝ යැ.

සංවාස නම: එකකම් යැ, එකොද්දෙශ යැ, සමශික්ෂතා යැ, ගරුදහම ඇසීම පිණිස හෝ පොහෝ පවුරුණු පිළිවිසීම පිණිස හෝ නො යන්නෙමි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා දෙවැනි මෙහෙණක නො ලබා නම, ගිලන්වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**අටවන සිකපද යි.**

## 4. 6. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො උපොසථම්පි න පුච්ඡන්ති. ඔවාදම්පි න යාචන්ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො උපොසථම්පි න පුච්ඡිස්සන්ති ඔවාදම්පි න යාචිස්සන්ති''ති, -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො උපොසථම්පි න පුච්ඡන්ති ඔවාදම්පි න යාචන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො උපොසථම්පි න පුච්ඡිස්සන්ති ඔවාදම්පි න යාචිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

''අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා උපොසථපුච්ඡකඤ්ච ඔවාදූපසඞ්කමනඤ්ච තං අතික්කාමෙන්තියා පාචිත්තිය''න්ති.

2. **අන්වද්ධමාසන්ති:** අනුපොසථිකං.

**උපොසථො** නාම: ද්වෙ උපොසථා චාතුද්දසිකො ච පණ්ණරසිකො ච.

**ඔවාදො** නාම: අට්ඨගරුධම්මා. උපොසථම්පි න පුච්ඡිස්සාමි ඔවාදම්පි න යාචිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සති අන්තරායෙ, පරියෙසිත්වා දුතියිකං භික්ඛුනිං න ලභති, ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

නවමසික්ඛාපදං.

## 4. 6. 10

## දසමසික්ඛාපදං

සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙසි. අථ ඛො සො පුරිසො තං භික්ඛුනිං දූසෙතුං උපක්කමි. සා විස්සරමකාසි, භික්ඛුනියො උපධාවිත්වා තං භික්ඛුනිං එතදවොචුං: ''කිස්ස ත්වං අය්‍යෙ විස්සරමකාසී''ති. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

## 4. 6. 9

### නවවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එ සමයෙහි වනාහි මෙහෙණෝ පොහොය ද නො පිළිවිසිති. අවවාදය ද නො යදිත්. භික්ෂූහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ පොහොයත් නො පිළිවුසුහු ද? අවවාදයත් නො යැදුහු ද යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ පොහොයත් නො පිළිවිසිත් ද අවවාදත් නො යදිත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ පොහොයත් නො පිළිවුසුහු ද? අවවාදයත් නො යැදුහුද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"අඩමසක් පාසා මෙහෙණක විසින් භික්ෂුසඞ්ඝයා වෙතින් පොහොය පිළිවිසීම ද අවවාදය පිණිස එළැඹීම ද යි දෙදහම්හු බලාපොරොත්තු විය යුත්තාහ. එය ඉක්මවන්නියට පචිති වේ"යයි.**

2. අනවද්ධමාසං: පොහොයක් පාසා.

උපොසථ නම්: තුදුස්වක යැ, පසළොස්වක ද යි දෙ පොහොයකි.

ඔවාද නම්: අෂ්ටගරුධර්මයෝ යැ. පොහොයත් නොපිළිවිසින්-නෙමි. අවවාදයත් නො යදින්නෙමි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා දෙවන මෙහෙණක නො ලබා නම්, ගිලන්වූවාට, ආපදයෙහි උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නවවන සිකපද යි.**

## 4. 6. 10

### දසවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එ සමයෙහි වනාහි එක්තරා මෙහෙණක් (සිරුරැ) යට පෙදෙසැ හටගත් ගඩක් හුදෙකලා වූ පිරිමියකු ලවා හුදෙකලා වූවා බිඳවූ යැ. එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ මෙහෙණ දූෂණය කරන්නට වෑයම් කෙළේ යැ. ඕ තොමෝ වියරුහඬක් කළා යැ. මෙහෙණෝ වෙතැ දුවැ අවුත් ඒ මෙහෙණට මෙය කීහු: ආර්‍යාවෙනි, කුමක් හෙයින් තෝ වියරුහඬක් කෙළෙහි ද යි. එකල්හි ඒ මෙහෙණ තොමෝ මෙහෙණන්ට තෙල කරුණ ඇරෑහ් යැ.

යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙස්සතී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං වා රුහිතං[1] වා අනපලොකෙත්වා සඞ්ඝං වා ගණං වා පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙය්‍ය වා ඵාලාපෙය්‍ය වා ධොවාපෙය්‍ය වා ආලිම්පාපෙය්‍ය වා බන්ධාපෙය්‍ය වා මොචාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පසාඛං** නාම: අධොනාභි උබ්භජාණුමණ්ඩලං.

**ජාතන්ති:** තත්ථ ජාතං.

**ගණ්ඩො** නාම: යො කොචි ගණ්ඩො.

**රුහිතං** නාම: යං කිඤ්චි වණං.[2]

**අනපලොකෙත්වාති:** අනාපුච්ඡා.

**සඞ්ඝො** නාම: භික්ඛුනීසඞ්ඝො වුච්චති.

**ගණො** නාම: සම්බහුලා භික්ඛුනියො වුච්චන්ති.

**පුරිසො** නාම: මනුස්සපුරිසො. න යක්ඛො න පෙතො න තිරච්ඡානගතො විඤ්ඤූ පටිබලො දූසෙතුං.

**සද්ධින්ති:** එකතො.

**එකෙනෙකාති:** පුරිසො චෙව හොති භික්ඛුනී ච.

---

1. රුධිතං – මජසං ; රුචිතං, සීමු සීමු
2. වණො – සීමු සීමු සීයු ස්‍යා



Free Distribution www.aathaapi.org

යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණක් (සිරුරු) යට පෙදෙසැ හටගත් ගඩක් හුදෙකලා වූ පිරිමිනියකු ලවා හුදෙකලා වූවා බිඳවූ ද"යි ... සැබෑද මහණෙනි, මෙහෙණක් (සිරුරු) යට පෙදෙසැ හටගත් ගඩක් හුදෙකලා වූ පිරිමිනියකු ලවා හුදෙකලා වූවා බිඳවූ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් තොමෝ (සිරුරු) යට පෙදෙසැ හටගත් ගඩක් හුදෙකලා වූ පිරිමිනියකු ලවා හුදෙකලා වූවා බිඳවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් (සිරුරු) යට පෙදෙසැ හටගත් ගඩක් හෝ වණයක් හෝ සඞ්ඝයා හෝ ගණයා හෝ නො පිළිවිසැ හුදෙකලා වූ පිරිමිනියකු ලවා හුදෙකලා වූවා බිඳවා නම් හෝ පළවා නම් හෝ දෙවවා නම් හෝ අලෙව් දෙවා නම් හෝ බඳවා නම් හෝ මුදවා නම් හෝ පචිති වේ"යයි.**

2. **යා පන:** යම්, යම්බඳු ... භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පසාඛ** නම්: නැබෙන් යට දණමඩලෙන් මතු.

**ජාතං:** එහි හටගත්.

**ගණ්ඩ** නම්: යම්කිසි ගඩෙකි.

**රුහිත** නම්: යම්කිසි වණයෙකි.

**අනපලොකෙත්වා:** නො පිළිවිසැ.

**සඞ්ඝ** නම්: භික්ෂුණී සඞ්ඝ තෙමේ කියනු ලැබේ.

**ගණ** නම්: බොහෝ මෙහෙණෝ කියනු ලැබෙත්.

**පුරිස** නම්: මිනිස් පිරිමිනියෙකි. යකෙක් නො වෙයි. ප්‍රෙතයෙක් නො වෙයි. තිරිසනෙක් නො වෙයි. දූෂණය කරන්නට දැනුමැති ප්‍රතිබලයෙකි.

**සද්ධිං:** එක් වැ;

**එකෙනෙකා:** පිරිමිනියෙක් ද වෙයි. මෙහෙණක් ද වේ.



Free Distribution www.aathaapi.org

භින්දති ආණාපෙති ආපත්ති දුක්කටස්ස. භින්නෙ ආපත්ති පාචිත්තියස්ස. ඵාලෙහීති ආණාපෙති ආපත්ති දුක්කටස්ස. ඵාලිතෙ ආපත්ති පාචිත්තියස්ස. ධොවාති ආණාපෙති ආපත්ති දුක්කටස්ස. ධොවිතෙ[1] ආපත්ති පාචිත්තියස්ස. ආලිම්පාති ආණාපෙති ආපත්ති දුක්කටස්ස. ලිත්තෙ[2] ආපත්ති පාචිත්තියස්ස. බන්ධාහීති ආණාපෙති ආපත්ති දුක්කටස්ස. බද්ධෙ ආපත්ති පාචිත්තියස්ස. මොචෙහීති ආණාපෙති ආපත්ති දුක්කටස්ස. මුත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: අපලොකෙත්වා භෙදාපෙති වා ඵාලාපෙති වා ධොවාපෙති වා ආලිම්පාපෙති වා බන්ධාපෙති වා මොචාපෙති වා, යා කාචි විඤ්ඤූ දුතියිකා[3] හොති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං.

## ආරාමවග්ගො ඡට්ඨො.

තස්සුද්දානං:

ආරාමසඞ්කාස චණ්ඩි ච — භුඤ්ජෙය්‍යා කුලමච්ඡරී,
වස්සපවාරණොවාද — දෙව ධම්මා පසාඛෙන චාති.

1. ධොතෙ - සයා;
2. ආලිත්තෙ - සයා.
3. දුතියා - සයා.



Free Distribution www.aathaapi.org

'බිඳුවයි' අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. බුන් කල්හි පචිති ඇවැත් වෙයි. 'පළව'යි අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. පැළුණු කල්හි පචිති ඇවැත් වෙයි. 'දෙවව'යි අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. දෙවූ කල්හි පචිති ඇවැත් වෙයි. 'ආලෙපනය කරව'යි. අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ආලෙපනය කළ කල්හි පචිති ඇවැත් වෙයි. 'බඳුව'යි අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. බැඳි කල්හි පචිති ඇවැත් වෙයි. 'මුදව'යි අණ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. මිදුණු කල්හි පචිති ඇවැත් වේ

පිළිවිසැ බිඳුවා නම් හෝ පළවා නම් හෝ දෙවවා නම් හෝ ආලෙප කරවා නම් හෝ බඳවා නම් හෝ මුදවා නම් හෝ යම්කිසි නුවණැති දෙවැන්නක් වේ නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සික්‍ෂපද යි.

## ෂෂ්ඨ ආරාම වර්‍ග යි.

එහි උද්දනය:

ආරාම යැ අංකකාස යැ චණ්ඩිකත යැ භුඤ්ජන යැ කුල-මච්ජරී යැ වස්‍ස යැ පවාරණ යැ ඕවාද යැ ද්‍වෙ ධම්ම යැ පසාඛ-යෙන් දූ යි වර්‍ගය වේ.



Free Distribution www.aathaapi.org

## 4. 7. 1

## පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙන්ති. සා පිණ්ඩාය චරති.[1] මනුස්සා එවමාහංසු: දෙථ අය්‍යාය භික්ඛං ගරුභාරා[2] අය්‍යාති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං, යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙස්සන්තී"ති, -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ගබ්භිනිං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ගබ්භිනී** නාම: ආපන්නසත්තා වුච්චති.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචාරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා, කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස[3].

ගබ්භිනියා ගබ්භිනිසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස[4]. ගබ්භිනියා වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති දුක්කටස්ස. ගබ්භිනියා අගබ්භිනිසඤ්ඤා වුට්ඨාපෙති අනාපත්ති.

අගබ්භිනියා ගබ්භිනිසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අගබ්භිනියා වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අගබ්භිනියා අගබ්භිනිසඤ්ඤා අනාපත්ති.

---

1. තා පිණ්ඩාය චරන්ති - සීමු I සීමු II
2. ගරුගබ්භා—සයා.
3. පාචිත්තියස්ස—සීමු I සීමු II
4. දුක්කටස්ස—සීමු I සීමු II



Free Distribution www.aathaapi.org

# 4. 7. 1

## පළමු සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එ සමයෙහි චනාහි මෙහෙණෝ ගැබිනිය උපසපන් කරවත්. ඕතොමෝ පිඩු පිණිස හැසිරෙයි. මිනිස්සු මෙසේ කීහු: ආයණාවට පිඩු දෙවූ, ආර්යා තොමෝ ගැබබර ඇත්තී යැ. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ ගැබිනියක උපසපන් කරවූහු දැ''යි. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඕහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ ගැබිනියක උපසපන් කරවූහු දැ''යි... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ ගැබිනියක උපසපන් කරවත් දැ''යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ ගැබිනියක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් ගැබිනියක උපසපන් කරවා නම් පචිති වේ''යයි.**

2. යා පන: යම්, යම් බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**ගබ්භිනී** නම්: පිළිසිඳගත් දරු ඇත්තී කියනු ලැබේ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවත්තේ යැ.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරියක හෝ පාත්‍රය හෝ සිවුරක් හෝ සොයා නම්, සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤප්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියෙතැ උවදු මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජර මෙහෙණට ද දුකුළා ඇවැත් වේ.

ගැබිනිය කෙරෙහි ගැබිනිසත් ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ගැබිනිය කෙරෙහි විමති ඇතියා උපසපන් කරවා නම් දුකුළා ඇවැත් වෙයි. ගැබිනිය කෙරෙහි නො ගැබිනි සත් ඇතියා උපසපන් කරවා නම් ඇවැත් නැති.

නො ගැබිනිය කෙරෙහි ගැබිනිසත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො ගැබිනිය කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. නො ගැබිනිය කෙරෙහි නො ගැබිනිසත් ඇතියා නම් ඇවැත් නැති.



Free Distribution www.aathaapi.org

6. **අනාපත්ති:** ගබ්භිනිං අගබ්භිනීසඤ්ඤා වුට්ඨාපෙති අගබ්භිනිං අගබ්භිනීසඤ්ඤා වුට්ඨාපෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

## 4. 7. 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පායන්තිං වුට්ඨාපෙන්ති. සා පිණ්ඩාය චරති[1]. මනුස්සා එවමාහංසු දෙථ අය්‍යාය භික්ඛං සදුතියිකා අය්‍යාති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො පායන්තිං වුට්ඨාපෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම භික්ඛුනියො පායන්තිං වුට්ඨාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො පායන්තිං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො පායන්තිං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී පායන්තිං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පායන්තී** නාම: මාතා වා හොති ධාතී වා.[2]

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචාරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි දුක්කටා, කම්මවාචා පරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස, ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

පායන්තියා පායන්තීසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. පායන්තියා වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති දුක්කටස්ස. පායන්තියා අපායන්තීසඤ්ඤා වුට්ඨාපෙති අනාපත්ති.

---

1. තා පිණ්ඩාය චරන්ති - සිමු. සිමු II
2. මාතා වා හොතු ධාති වා - මජසං



Free Distribution www.aathaapi.org

6. ගැබිනිය නො ගැබිනි සත් ඇතියා උපසපන් කරවා නම්, නො ගැබිනිය නො ගැබිනි සත් ඇතියා උපසපන් කරවා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට.. ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පළමු සිකපද යි.**

## 4. 7. 2

## දෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ කිරි පොවන්නිය උපසපන් කරවති. ඕතොමෝ පිඩු පිණිස හැසිරෙයි. මිනිස්සු මෙසේ කීහු. 'ආර්යාවට පිඬු දෙවු, ආර්යා තොමෝ දෙවැන්නකු ඇත්තී'යැ යි. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ කිරිපොවන්නියක උප-සපන් කරවූහු දැ''යි. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ කිරිපොවන්නිය උපසපන් කරවූහු දැ''යි...සැබෑ ද මහණෙනි,මෙහෙණෝ කිරිපොවන්නිය උපසපන් කරවත් දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ කිරිපොවන්නිය උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් කිරි පොවන්නිය උපසපන් කරවා නම් පචිති වේ''යයි.**

2. **යා පනා:** යම්, යම්බඳු...භික්ෂුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පායන්තී** නම්: මව හෝ වෙයි, කිරිමව හෝ වෙයි.

**වුට්ඨාපෙය්‍යා:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම්, සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඥප්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම් වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජර මෙහෙණට ද දුකුළා ඇවැත් වේ.

කිරිපොවන්නිය කෙරෙහි කිරිපොවන්නී සත් ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. කිරිපොවන්නිය කෙරෙහි විමති ඇතියා උපසපන් කරවා නම් දුකුළා ඇවැත් වෙයි. කිරිපොවන්නිය කෙරෙහි කිරිනොපොවන්නීසත් ඇතියා උපසපන් කරවා නම් ඇවැත් නැති.

අපායන්තියා පායන්තිසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අපායන්තියා වෙමතිකා ආපත්ති දුක්කටස්ස, අපායන්තියා අපායන්තිසඤ්ඤී, අනාපත්ති.

**අනාපත්ති:** පායන්තිං අපායන්තිසඤ්ඤා වුට්ඨාපෙති, අපායන්තිං අපායන්තිසඤ්ඤී වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දුතියසික්ඛාපදං

## 4. 7. 3

## තතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙන්ති, තා බාලා හොන්ති අබ්‍යත්තා. න ජානන්ති කප්පියං වා අකප්පියං වා. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "අනුජානාමි භික්ඛවෙ සික්ඛමානාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දාතුං". එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා. තාය සික්ඛමානාය සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො, අහං අය්‍යෙ ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය සික්ඛමානා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචාමීති. දුතියම්පි යාචිතබ්බා. තතියම්පි යාචිතබ්බා. බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

2. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය සික්ඛමානා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමාය සික්ඛමානාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දදෙය්‍ය, එසා ඤත්ති.



Free Distribution www.aathaapi.org

කිරිපොවන්නිය කෙරෙහි කිරිපොවන්නී සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. කිරි නො පොවන්නිය කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. කිරි නො පොවන්නිය කෙරෙහි කිරි නො පොවන්නී සත් ඇතියා නම් ඇවැත් නැති.

කිරිපොවන්නිය කිරි නො පොවන්නී සත් ඇතියා උපසපන් කරවා නම්, කිරි නො පොවන්නිය කිරි නො පොවන්නී සත් ඇතියා උපසපන් කරවා නම්, ඇවැත් නැත. උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දෙවන සික්පද යි.

## 4. 7. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එ සමයෙහි වනාහි මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති හික්මනුව උපසපන් කරවති. ඔහු නො දැනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්-වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති හික්මනුව උපසපන් කරවූහු ද"යි... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ දෙවසක් සැවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති හික්මනුව උපසපන් කරවත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති හික්මනුව උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට භික්ෂූන් ඇමැතූසේක. 'මහණෙනි, හික්මනුවට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂා-සම්මුතිය දෙන්නට අනුදනිමි'. මෙසේ ද වනාහි මහණෙනි, දියයුතු යැ. ඒ හික්මනුව විසින් සඞ්ඝයා වෙත එළැඹැ උතුරු සඟ සිවුර එකස් කොට මෙහෙණන්ගේ පා වැඳ උළුලුයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කිය යුතු වන්නේ යැ: ආර්යාවෙනි, මෙනම් ඇති ආයඝාවගේ හික්මනු වූ මෙනම් ඇති මම දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂා-සම්මුතිය සඞ්ඝයාගෙන් යදිමි යි. දෙවනාවටද යැදිය යුතු යැ. තෙවනවටද යැදිය යුතු යි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දන්විය යුත්තේ යි.

2. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාවගේ හික්මනු වූ මෙනම් ඇති මෝ තොමෝ සඞ්ඝයාගෙන් දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂාසම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙනම් ඇති හික්මනුවට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙන්නේ යැ. මේ ඤත්ති යි.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමාය අය්‍යාය සික්ඛමානා සංඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචති, සඞ්ඝො ඉත්ථන්නාමාය සික්ඛමානාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දෙති. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය සික්ඛමානාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතියා දානං, සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සංඝෙන ඉත්ථන්නාමාය සික්ඛමානාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුති, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

සා සික්ඛමානා එවං වදෙහීති වත්තබ්බා: පාණාතිපාතා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං[1] සමාදියාමි. අදින්නාදානා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං සමාදියාමි. අබ්‍රහ්මචරියා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං සමාදියාමි. මුසාවාදා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං සමාදියාමි. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං සමාදියාමි. විකාලභොජනා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං සමාදියාමි. අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ද්වෙ වස්සානීති:** ද්වෙ සංවච්ඡරානි.

**අසික්ඛිතසික්ඛා** නාම: සික්ඛා වා න දින්නා හොති, දින්නා වා සික්ඛා කුපිතා.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි දුක්කටා, කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

1. අවීතික්කම්ම සමාදානං - මජ්ඣං

ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාවගේ භික්මනු වූ මෙනම් ඇති මෙ තොමෝ සඞ්ඝයාගෙන් දෙවසක් සවැදැරුම් දහම්හි ශික්ෂාසම්මුතිය යදියි. සඞ්ඝ තෙමේ මෙනම් ඇති භික්මනුවට දෙවසක් සවැදැරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙයි. මෙනම් ඇති භික්මනුවට දෙවසක් සවැදැරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වන්නී යැ. යමකට නො රුස්නේ නම් ඕතොමෝ කියන්නී යැ. සඞ්ඝයා විසින් මෙනම් ඇති භික්මනු-වට දෙවසක් සවැදැරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙන ලද්දී යැ. සඞ්ඝයාහට රුස්නේ යැ. එහෙයින් නිහඬයහ. මෙය මෙසේ දරමි''යි.

ඒ භික්මනු තොමෝ මෙසේ කියව යි කිය යුත්තී යැ. පණිවායෙන් වැළකීම දෙවසක් නො ඉක්ම විය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි. අයිනාදනින් වැළකීම දෙවසක් නො ඉක්ම විය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි. අබ්‍රම්සරින් වැළකීම දෙවසක් නො ඉක්ම විය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි. මුසවායෙන් වැළකීම දෙවසක් නො ඉක්ම විය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි. මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙරින් වැළකීම දෙවසක් නො ඉක්ම විය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි. විකල් බොජුනෙන් වැළකීම දෙවසක් නො ඉක්ම විය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්ට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් දෙවසක් සවැදැරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති භික්මනුව උපසපන් කරවා නම් පචිති වේ''යයි.**

3. **ය**: **පන**: යම්, යම්බඳු...**භික්මුනී**...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**දෙව වසානි**: දෑවුරුද්දක්;

**අසික්ඛිතසික්ඛා** නම්: සික හෝ නො දෙන ලද්දී වෙයි. දෙන ලද සික කිපියා හෝ වෙයි.

**වුට්ඨාපෙය්‍ය**: උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම්, සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඥප්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් දුකුළා වෙති. කම් වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැක් වෙයි. ගණයාට ද ඇජර මෙහෙණට ද දුකුළා ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ, අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං**

## 4. 7. 4

## චතුත්ථසික්ඛාපදං.

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්ති. භික්ඛුනියො එවමාහංසු: ''එථ සික්ඛමානා ඉමං ජානාථ, ඉමං දෙථ, ඉමං ආහරථ, ඉමිනා අත්ථො, ඉමං කප්පියං කරොථා''ති. තා එවමාහංසු: ''න මයං අය්‍යෙ සික්ඛමානා භික්ඛුනියො මය''න්ති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙස්සන්තීති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සංඝෙන අසම්මතං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. ''අනුජානාමි භික්ඛවෙ, ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය වුට්ඨානසම්මුතිං දාතුං'' එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බා. තාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය සංඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: අහං අය්‍යෙ ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා, සික්ඛමානා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචාමීති. දුතියම්පි යාචිතබ්බා තතියම්පි යාචිතබ්බා. බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සංඝො ඤාපෙතබ්බො.



Free Distribution www.aathaapi.org

ධම්මකම්මයෙහි ධම්මකම් සංඥා ඇත්තී උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධම්මකම්මයෙහි විමති ඇත්තී උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධම්මකම්මයෙහි අධම්මකම් සංඥා ඇත්තී උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.

අධම්මකම්මයෙහි ධම්මකම්සංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි විමති ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි අධම්මකම්සංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වේ.

දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සික්මනුවක උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

තෙවන සිකපද යි.

## 4. 7. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි - එ සමයෙහි වනාහි මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරන ලද හික්මනුවක උපසපන් කරවත්. මෙහෙණෝ මෙසේ කීහු: "එවු හික්මනුවෙනි, මෙය දනිවු, මෙය දෙවු, මෙය ගෙන එවු, මෙයින් ප්‍රයොජන යැ, මෙය කැප කරවු" යයි. ඔහු මෙසේ කීහු: "ආර්යාවෙනි, අපි හික්මනුවෝ නො වම්හ. අපි මෙහෙණෝ වම්හ"යි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරන ලද හික්මනුවක උපසපන් කරවූහු ද"යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරන ලද හික්මනුවක උපසපන් කරවද්දු යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරන ලද හික්මනුවක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමැතූ සේක. මහණෙනි, දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති හික්මනුවට වුට්ඨානසම්මුතිය දෙන්නට අනුදනිමි. මෙසේ ද වනාහි මහණෙනි, දිය යුතු යැ. දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති ඒ හික්මනුව විසින් සඞ්ඝයා වෙත එළැඹැ උතුරු සඟසිවුර එකස් කොට මෙහෙණන්ගේ පා වැඳ උළුඩුයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කිය යුතු වන්නේ යැ: ආර්යාවෙනි, මෙනම් ඇති ආර්යාව කෙරෙහි දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති හික්මනු වූ මෙ නම් ඇති මම සඞ්ඝයාගෙන් වුට්ඨාන-සම්මුතිය යදිමි යි. දෙවනවට ද යැදිය යුතුයැ. තෙවනවට ද යැදිය යුතු යැ. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

2. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සික්ඛමානා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය වුට්ඨානසම්මුතිං දදෙය්‍ය, එසා ඤත්ති.

3. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සික්ඛමානා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචති, සඞ්ඝො ඉත්ථන්නාමාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය වුට්ඨානසම්මුතිං දෙති. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය වුට්ඨානසම්මුතියා දානං. සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය වුට්ඨානසම්මුති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුභරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ද්වෙ වස්සානීති:** ද්වෙ සංවච්ඡරානි.

**සික්ඛිතසික්ඛා** නාම: ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**අසම්මතා** නාම: ඤත්ති දුතියෙන කම්මෙන වුට්ඨානසම්මුති න දින්නා හොති.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචා පරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.



Free Distribution www.aathaapi.org

2. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහි දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙ නම් ඇති මේ හික්මනු තොමෝ සඞ්ඝයාගෙන් වුට්ඨානසම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙනම් ඇති හික්මනුවට වුට්ඨානසම්මුතිය දෙන්නේ යෑ. මේ ඤත්ති යෑ.

ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙ නම් ඇති ආර්යාව කෙරෙහි දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙ නම් ඇති මේ හික්මනු තොමෝ සඞ්ඝයාගෙන් වුට්ඨානසම්මුතිය යදියි. සඞ්ඝ තෙමේ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙ නම් ඇති හික්මනුවට වුට්ඨානසම්මුතිය දෙයි. දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙ නම් ඇති හික්මනුවට වුට්ඨානසම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වන්නී යෑ. යමකට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යෑ. දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙනම් ඇති හික්මනුවට සඞ්ඝයා විසින් වුට්ඨාන සම්මුතිය දෙන ලද්දී යෑ, සඞ්ඝයාහට රුස්නේ යෑ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමියි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්ට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරන ලද හික්මනුවක උපසපන් කරවා නම් පචිති වේ"**යයි.

3. යා පන: යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**ද්වෙ වස්සානි:** දෑවුරුද්දක්.

**සික්ඛිතසික්ඛා** නම්: සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇත්තී යෑ.

**අසම්මතා** නම්: **ඤප්ති** ද්විතීය කර්මයෙන් වුට්ඨානසම්මුතිය නො දෙන ලදුවා වෙයි.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම්, සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. **ඤප්තියෙන්** දුකුළා වෙයි. දෙකම්වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජර මෙහණට ද දුකුළා ඇවැත් වේ.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සංඝෙන සම්මතං වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං.**

## 4. 7. 5

## පඤ්චමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙන්ති. තා අක්ඛමා හොන්ති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං[1] ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසිකජාතිකා[2] හොන්ති.

යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙස්සන්ති. ඌනද්වාදසවස්සා හි[3] භික්ඛවෙ, ගිහිගතා අක්ඛමා හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසිකජාතිකා හොති. ද්වාදසවස්සා ච ඛො භික්ඛවෙ, ගිහිගතා ඛමා හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසිකජාතිකා හොති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය --පෙ-- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

1. තිබ්බානං - මජසං,
2. අනධිවාසකජාතිකා,-මජසං,
3. ඌනදසවස්සා- මජසං



Free Distribution www.aathaapi.org

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇත්තී උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇත්තී උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇත්තී නම දුකුළා ඇවැත් වෙයි, අධර්මකර්මයෙහි විමති ඇත්තී නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්ම සංඥා ඇත්තී නම් දුකුළා ඇවැත් වේ.

දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත කරන ලද තිස්මනුවක උපසපන් කරවා නම් ඇවැත් නැති. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සතරවන සිකපද යි.**

## 4. 7. 5.

## පස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි මෙහෙණෝ උනු දෙළොස්වස් ඇති, පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවති. ඔහු සිහිලස උණුසුම් සාගිනි පවස නො සිහිය හැකියෝ වෙති. ඩැහැමැසි මදුරු වා හිරුරැස් දිග්දැපහස ද දුබැසි දුවදනා වදන්මග ද සිරිරි පිළිබැඳි උපන් නො සිහිය හැකි බහල තියුණු රළු නො මිහිරි නො මනාවඩනා දිවිහරන වෙයිනුදු නො ඉවසන සුල්ලෝ වෙත්.

යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ උනු දෙළොස්වස් ඇති, පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවූහු ද" යි... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ උනුදෙළොස් වස් ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවත් ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ උනුදෙළොස් වස් ඇති, පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවූහු ද? මහණෙනි, උනුදෙළොස් වස් ඇති, පිරිමිනියක්හු අතරට ගියා සිහිලස උණුසුම සාගිනි පවස නො සිහිය හැකියා මැ වෙයි. ඩැහැමැසි මදුරු වා හිරුරැස් දිග්දැ පහස ද දුබැසි දුවදනා වදන්මග ද සිරිරි පිළිබැඳි උපන් නො සිහිය හැකි බහල තියුණු රළු නො මිහිරි නො මනාවඩන දිවිහරන වෙයිනුදු නො ඉවසන සුලුවූවා වෙයි. මහණෙනි, දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා සිහිලස උණුසුම් සාගිනි පවස සිහිය හැකියා ද වෙයි. ඩැහැමැසි මදුරු වා හිරුරැස් දිග්දැ පහස ද දුබැසි දුවදනා වදන්මග ද සිරිරි පිළිබැඳි උපන් නො සිහිය හැකි බහල තියුණු රළු නො මිහිරි නො මනාවඩන දිවිහරන වෙයිනුදු ඉවසන සුලු වූවා ද වෙයි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:



Free Distribution www.aathaapi.org

"යා පන භික්ඛුනී ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.

3. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

ඌනද්වාදසවස්සා නාම: අප්පත්තද්වාදසවස්සා.

ගිහිගතා නාම: පුරිසන්තරගතා වුච්චති.

වුට්ඨාපෙය්‍යාති: උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

ඌනද්වාදසවස්සාය ඌනද්වාදසවස්සසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ඌනද්වාදසවස්සාය වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති දුක්කටස්ස. ඌනද්වාදසවස්සාය පරිපුණ්ණසඤ්ඤා වුට්ඨාපෙති අනාපත්ති.

පරිපුණ්ණද්වාදසවස්සාය ඌනද්වාදසවස්සසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. පරිපුණ්ණද්වාදසවස්සාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස. පරිපුණ්ණද්වාදසවස්සාය පරිපුණ්ණසඤ්ඤා අනාපත්ති.

අනාපත්ති: ඌනද්වාදසවස්සං පරිපුණ්ණසඤ්ඤා වුට්ඨාපෙති පරිපුණ්ණද්වාදසවස්සා පරිපුණ්ණසඤ්ඤා වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

පඤ්චමසික්ඛාපදං.

## 4. 7. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙන්ති. තා බාලා හොන්ති අබ්‍යත්තා. න ජානන්ති කප්පියං වා අකප්පියං වා. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ-



Free Distribution www.aathaapi.org

**"යම් මෙහෙණක් ඌනුදෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපත් කරවා නම් පචිති වේ"යයි.**

3. **යා පන:** යම්, යම්බඳු ... භික්ඛුනී ... මෝ තොමෝ වේ අර්යෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**ඌනද්වාදසවස්සා** නම්: නො පත් දෙළොස්වස් ඇතියා.

**ගිහීගතා** නම්: පිරිමිකියක්හු අතරට ගියා කියනු ලැබෙයි.

**වුට්ඨාපෙය්‍ය:** උපසපත් කරවයි.

උපසපත් කරවත්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඥප්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදතින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරට ද දුකුළා ඇවැත් වේ.

ඌනුදෙළොස්වස් ඇතියා කෙරෙහි ඌනුදෙළොස්වස් සත් ඇතියා උපසපත් කරවා නම් පචිති ඇවැත් වෙයි. ඌනුදෙළොස් වස් ඇතියා කෙරෙහි විමති ඇතියා උපසපත් කරවා නම් දුකුළා ඇවැත් වෙයි. ඌනුදෙළොස්වස් ඇතියා කෙරෙහි පිරිපුන් සත් ඇතියා උපසපත් කරවා නම් ඇවැත් නැති.

පිරිපුන් දෙළොස්වස් ඇතියා කෙරෙහි ඌනුදෙළොස්වස් සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිරිපුන් දෙළොස්වස් ඇතියා කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිරිපුන් දෙළොස්වස් ඇතියා කෙරෙහි පිරිපුන් සත් ඇතියා නම් ඇවැත් නැති.

ඌනුදෙළොස්වස් ඇතියක පිරිපුන් සත් ඇතියා උපසපත් කරවා නම්, පිරිපුන් දෙළොස්වස් ඇතියක පිරිපුන් සත් ඇතියා උපසපත් කරවා නම්, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපද යි.**

## 4.7.6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි– එසමයෙහි වනාහි මෙහෙණෝ පිරිපුන් දෙළෝස් වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති, පිරිමිනියක්හු අතරට ගියක උපසපත් කරවති. ඔහු නො අනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිය් වූවෝ ...

තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙස්සන්තී"ති-පෙ-සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙන්තීති සච්චං භගවා. විගරහි බුද්ධො භගවා, -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ, පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දාතුං" එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බා: තාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: අහං අය්යෙ ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්යාය පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛා සම්මුතිං යාචාමීති. දුතියම්පි යාචිතබ්බා - තතියම්පි යාචිතබ්බා - බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

2. සුණාතු මෙ අය්යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්යාය පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ අය්යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්යාය පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දෙති, යස්සා අය්යාය ඛමති ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතියා දානං. සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.



Free Distribution www.aathaapi.org

ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවූහු ද''යි... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූ සේක. 'මහණෙනි, පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියකට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙන්නට අනුදනිමි'යි. මෙසේ ද වනාහි මහණෙනි, දියයුතු යැ. ඒ පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියක විසින් සඞසයා වෙත එළැඹ උතුරුසඟසිවුර එකස් කොට මෙහෙණන්ගේ පා වැඳ උළුලුයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ. ආර්යාවෙනි, මෙ නම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් දෙළොස් වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙ නම් ඇති මම සඞසයාගෙන් දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂාසම්මුතිය යදිමි යි. දෙවන වටදු යැදිය යුතුයැ. තෙවනවට දු යැදිය යුතුයැ. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞස තෙමෙ දැන්විය යුත්තේ යි.

2. ආර්යාවෙනි, සඞස තෙමෙ මවදන් අසාවා. මෙ නම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙ නම් ඇති මෝ තොමෝ සඞසයාගෙන් දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂා සම්මුතිය යදියි. ඉදින් සඞසයාට පැමිණි නල් ඇත්තේ නම් පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙ නම් ඇත්තියට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂා සම්මුතිය දෙන්නේ යැ, මේ දැන්වීම යැ.

ආර්යාවෙනි, සඞස තෙමෙ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙනම් ඇති මෝතොමෝ සඞසයාගෙන් දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂා සම්මුතිය යදියි. සඞස තෙමෙ පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙ නම් ඇත්තියට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙයි. පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙ නම් ඇත්තියට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂා සම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕතොමෝ නිහඬවන්නී යැ. යමකට නො රුස්නේ නම් ඕතොමෝ කියන්නී යැ සඞසයා විසින් පිරිපුන් දෙළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙ නම් ඇත්තියට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙන ලද්දී යැ. සඞසයාට රුස්නේ යැ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමියි.



Free Distribution www.aathaapi.org

සා පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා එවං වදෙහීති වත්තබ්බා: පාණාතිපාතා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කම්මසමාදානං සමාදියාමි -පෙ- විකාලභොජනා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කම්මසමාදානං සමාදියාමීති. අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනී පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පරිපුණ්ණද්වාදසවස්සා** නාම: පත්තද්වාදසවස්සා.

**ගිහිගතා** නාම: පුරිසන්තරගතා වුච්චති.

**ද්වෙ වස්සානීති:** ද්වෙ සංවච්ඡරානි.

**අසික්ඛිතසික්ඛා** නාම: සික්ඛා වා න දින්නා හොති. දින්නා වා සික්ඛා කුපිතා.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති. සීමං වා සම්මන්නති. ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා[1] ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං වුට්ඨාපෙති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**ඡට්ඨසික්ඛාපදං.**

1. ධම්මකම්ම සඤ්ඤා වුට්ඨාපෙති - මජසං.



Free Distribution www.aathaapi.org

පිරිපුන් දොළොස්වස් ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ ඕ තොමෝ මෙසේ කියව යි කිය යුත්තී යැ. දෙවසක් පණීවායෙන් වැළකීම නො ඉක්ම වියයුතු සමාදනයක් කොට සමාදන් වෙමි ... දෙවසක් විකල් බොජුනෙන් වැළකීම නො ඉක්මවිය යුතු සමාදනයක් කොට සමාදන් වෙමියි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්ට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි නො හික්මුණු සිට ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවා නම් පචිති වේ"යයි.**

3. **යා පන:** යම්, යම්බඳු . . . භික්ෂුනී. . . මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**පරිපුණ්ණද්වාදසවස්සා** නම්: පැමිණි දෙළොස්වස් ඇතියා යැ.

**ගිහීගතා** නම්: පිරිමිනියක්හු අතරට ගියා කියනු ලැබෙයි.

**ද්වෙ වස්සානි:** දැවුරුද්දක්.

**අසික්ඛිතසික්ඛා** නම්: ශික්ෂාව නො දෙන ලද්දී හෝ වෙයි; දෙන ලද ශික්ෂාව **කොපා වූවා හෝ වේ.**

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජර්හ හෝ සිවුරක් හෝ සොයා නම්, සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. **ඥප්තියෙන්** දුකුළා වෙයි. දෙකම්වදනින් දෙ දුකුළා වෙයි. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරමෙහෙණට ද දුකුළා ඇවැත් වේ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇති පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සවන සිකපද යි.**

## 4.7.7

### සත්තමසික්ඛාපදං.

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්ති. භික්ඛුනියො එවමාහංසු: "එථ සික්ඛමානා, ඉමං ජානාථ, ඉමං දෙථ, ඉමං ආහරථ, ඉමිනා අත්ථො, ඉමං කප්පියං කරොථා"ති. තා එවමාහංසු: න මයං අය්‍යෙ සික්ඛමානා. භික්ඛුනියො මයන්ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තීති. -පෙ- සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තීති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ, පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතිං දාතුං". එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: අහං අය්‍යෙ ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචාමීති. දුතියම්පි යාචිතබ්බා - තතියම්පි යාචිතබ්බා - බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

3. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.



Free Distribution www.aathaapi.org

## 4.7.7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරනලද පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවත්. භික්ෂුණීහු මෙසේ කීහු: "එවූ හික්මනුවෙනි, මෙය දනිවූ. මෙය දෙවූ. මෙය ගෙන එවූ. මෙයින් ප්‍රයොජන යැ. මෙය කැපකරවූ" යි. ඔහු මෙසේ කීහු: ආර්යාවෙනි, අපි හික්මනුවෝ නො වම්හ. අපි මෙහෙණෝ 'වම්හ යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරනලද පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවූහු ද"යි ... සැබෑද මහණෙනි, මෙහෙණෝ පිරිපුන් දෙළොස් වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරනලද පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවත් දු යි. සැබැවි, භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නො කරනලද පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක. 'මහණෙනි, පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියකට වුට්ඨාන සම්මුතිය දෙන්නට අනුදනිමි'යි. මෙසේ ද මහණෙනි, දිය යුතු යැ. පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියාවූ ඇය විසින් සඞ්ඝයා වෙත එළැඹ උතුරුසඟසිවුර එකස් කොට මෙහෙණන්ගේ පා වැඳ උළුයෙන් හිඳ ඇදිලි බැඳ මෙසේ කියයුතු වන්නේයැ: ආර්යාවෙනි, මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් දෙළොස් වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියාවූ මෙනම් ඇති මම සඞ්ඝයාගෙන් වුට්ඨාන සම්මුතිය යදිමි යි. දෙවනවට ද යැදිය යුතු යැ. තෙවනවට ද යැදිය යුතු යැ. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය.

3. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා: මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙනම් ඇති මෝ තොමෝ සඞ්ඝයාගෙන් වුට්ඨාන සම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති පිරිමිනියක්හු අතරට ගියාවූ මෙනම් ඇත්තියට වුට්ඨාන සම්මුතිය දෙන්නේය. මේ ඥප්ති යැ.



Free Distribution www.aathaapi.org

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය පරිපුණ්ණද්වාදසවස්සා ගිහිගතා ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතිං දෙති, යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතියා දානං, සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය ගිහිගතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨාන සම්මුති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

"යා පන භික්ඛුනී පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.

4. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

පරිපුණ්ණද්වාදසවස්සා නාම: පත්තද්වාදසවස්සා.

ගිහිගතා නාම: පුරිසන්තරගතා වුච්චති.

ද්වෙ වස්සානීති: ද්වෙ සංවච්ඡරානි.

සික්ඛිතසික්ඛා නාම; ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

අසම්මතා නාම: ඤත්තිදුතියෙන කම්මෙන වුට්ඨානසම්මුති න දින්නා හොති.

වුට්ඨාපෙය්‍යාති: උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙනම් ඇති මෝ නොමෝ සඞ්ඝයාගෙන් වුට්ඨාන සම්මුතිය යදියි. සඞ්ඝ තෙමේ පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇති පිරිමිනියක්හු අතරට ගියාවූ මෙනම් ඇත්තියට වුට්ඨාන සම්මුතිය දෙයි. පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇති පිරිමිනියක්හු අතරට ගියාවූ මෙනම් ඇත්තියට වුට්ඨාන සම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕ නොමෝ නිහඬ වන්නී යැ. යමකට නො රුස්නේ නම් ඕනොමෝ කියන්නි යැ. සඞ්ඝයා විසින් පිරිපුන් දෙළොස් වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇති පිරිමිනියක්හු අතරට ගියා වූ මෙනම් ඇත්තියට වුට්ඨාන සම්මුතිය දෙන ලද්දී යැ. සඞ්ඝයාට රුස්නේය. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරම් යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්ට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි ... මෙයේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යම් මෙහෙණක් පිරිපුන් දෙළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇති සංඝයා විසින් සම්මත නො කරනලද පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවානම් පචිතිවේ"යයි.

4. යා පන: යම්, යම්බඳු...හික්මුනී...මෝ නොමෝ මේ අර්ථයෙහිලා-අදහස්කරන ලද භික්ෂුණී යි.

**පරිපුණ්ණද්වාදසවස්සා** නම්: පැමිණි දෙළොස්වස් ඇතියා යැ.

**ගිහිගතා** නම්: පිරිමිනියක්හු අතරට ගියා කීයනු ලැබෙයි.

**ද්වෙ වස්සානි**: දෑවුරුද්දක්.

**සික්ඛිතසික්ඛා** නම්: සවැදෑරුම් දහම්හි හික්මුණු සිට ඇතියා යැ.

**අසම්මතා** නම්: ඤත්තිදුතියකම්යෙන් වුට්ඨානසම්මුතිය නො දෙන ලදුවා වෙයි.

**වුට්ඨාපෙය්‍ය**: උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇදුරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම්, සීමාව හෝ සම්මත කරවා නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. ඥකම්වදුයින් දුකුළා දෙකක් වෙති. කම්වදන් පිරියතැ උවදු මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාට ද ඇදුරට ද දුකුළා ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන සම්මතං වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං.

## 4. 7. 8

## අට්ඨමසික්ඛාපදං

1\. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හාති න අනුග්ගණ්හාපෙති. තා බාලා හොන්ති අබ්‍යත්තා. න ජානන්ති කප්පියං වා අකප්පියං වා. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හිස්සති, න අනුග්ගණ්හාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හාති, න අනුග්ගණ්හාපෙතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හිස්සති, න අනුග්ගණ්හාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යා පන භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හෙය්‍ය න අනුග්ගණ්හාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2\. යා **පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

පිරිපුන් දොළොස්වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිත ඇති සඞ්ඝයා විසින් සම්මත කරන ලද පිරිමිනියක්හු අතරට ගියක උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සත්වන සිකපද යි.**

## 4. 7. 8

## අටවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි - එසමයෙහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සහජීවිනියක උපසපන් කරවා දෙවසක් නො මැ අනුග්‍රහ කෙරෙයි. නො මැ අනුග්‍රහ කරවයි. ඔහු නො දනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද තොමෝ සහජීවිනියක උපසපන් කරවා දෙවසක් නො මැ අනුග්‍රහ කළා ද, නො මැ අනුග්‍රහ කරවූ ද''යි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සහජීවිනියක උපසපන් කරවා දෙවසක් නො මැ අනුග්‍රහ කෙරේ ද, නො මැ අනුග්‍රහ කරවා ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සහජීවිනියක උපසපන් කරවා දෙවසක් නො මැ අනුග්‍රහ කළා ද, නො මැ අනුග්‍රහ කරවූ ද, මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් සහජීවිනියක උපසපන් කරවා දෙවසක් නො මැ අනුග්‍රහ කෙරේ නම් නො මැ අනුග්‍රහ කරවා නම් පචිති වේ''යයි.**

2. **යා පන:** යම්, යම්බඳු ... භික්ෂුණී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**සහජීවිනී** නාම: සද්ධිවිහාරිනී වුච්චති.

**වුට්ඨාපෙත්වාති:** උපසම්පාදෙත්වා.

**ද්වෙ වස්සානීති:** ද්වෙ සංවච්ඡරානි.

**නෙව අනුග්ගණ්හෙය්‍යාති:** න සයං අනුග්ගණ්හෙය්‍ය උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා.

**අනුග්ගණ්හාපෙය්‍යාති:** න අඤ්ඤං ආණාපෙය්‍ය. ද්වෙ වස්සානි න අනුග්ගණ්හිස්සාමි න අනුග්ගණ්හාපෙස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සති අන්තරායෙ පරියෙසිත්වා න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

අට්ඨමසික්ඛාපදං.

## 4. 7. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන භික්ඛුනියො වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධන්ති. තා බාලා හොන්ති අබ්‍යත්තා න ජානන්ති කප්පියං වා අකප්පියං වා, යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධිස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී වුට්ඨාපිතං ද්වෙ වස්සානි නානුබන්ධෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.



Free Distribution www.aathaapi.org

**සහජීවිනී** නම: සැදිවිහාරිනිය කියනු ලැබෙයි.

**වුට්ඨාපෙත්වා** උපසපන් කරවා.

**ද්වෙ වස්සානි**: දැවුරුද්දක්.

**නෙව අනුග්ගණ්හෙය්‍ය**: තොමෝ උද්දෙශයෙන් පරිපුච්ඡායෙන්. අවවාදයෙන් අනුසාසනායෙන් නො මැ අනුග්‍රහ කරයි.

**න අනුග්ගණ්හාපෙය්‍ය**: මෙරමාහට නො අණවයි. දෙවසක් නො මැ අනුග්‍රහ කරන්නෙමි, අනුග්‍රහ නො කරවන්නෙමි යි ධුර-නික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා නො ලබා නම්, ගිලන්වූවාට, ආපදයෙහි ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

අටවන සිකපද යි.

## 4. 7. 9

## නවවන සිකපදය

1. ශ්‍රාවස්තිනිදන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ උපසපන් කැරැවූ උවදෑ මෙහෙණ දෙවසක් උවටැන් නො කෙරෙති. ඔහු නො දූනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: ''කෙසේ නම් මෙහෙණෝ උපසපන් කැරැවූ උවදෑ මෙහෙණ දෙවසක් උවැටන් නො කරන්නූ ද''යි...සැබෑ ද මහණෙනි, මෙහෙණෝ උපසපන් කැරැවූ උවදෑ මෙහෙණ දෙවසක් උවැටන් නො කෙරෙත් ද යි. සැබැවැ භාග්‍ය-වතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ උපසපන් කැරැවූ උවදෑ මෙහෙණ දෙවසක් උවටැන් නො කළහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

''යම් මෙහෙණක් උපසපන් කැරැවූ උවැදෑ මෙහෙණ දෙවසක් උවටැන් නො කෙරේ නම් පචිති වේ''යයි.

2. **යා පන**: යම්, යම්බඳු...භික්ඛුනී...මෝ නොමෝ මේ අර්ථ-යෙහි ලා අදහස් කරන ලද භික්ෂුණි යි.

3. වුට්ඨාපිතන්ති: උපසම්පාදිතං.

පවත්තිනී නාම: උපජ්ඣායා වුච්චති.

ද්වෙ වස්සානීති: ද්වෙ සංවච්ඡරානි.

නානුබන්ධෙය්‍යාති: න උපට්ඨහෙය්‍ය.[1] ද්වෙ වස්සානි නානුබන්ධිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: උපජ්ඣායා බාලා වා හොති අලජ්ජිනී වා, ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

නවමසික්ඛාපදං.

## 4. 7. 10

## දසමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙසි.[2] න වූපකාසාපෙසි. සාමිකො අග්ගහෙසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙස්සති, න වූපකාසාපෙස්සති, සාමිකො අග්ගහෙසි, සචායං භික්ඛුනී පක්කන්තා අස්ස න ච සාමිකො ගණ්හෙය්‍යා"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙසි, න වූපකාසාපෙසි, සාමිකො අග්ගහෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙස්සති, න වූපකාසාපෙස්සති, සාමිකො අග්ගහෙසි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙය්‍ය න වූපකාසාපෙය්‍ය අන්තමසො ඡප්පඤ්චයොජනානිපි පාචිත්තිය"න්ති.**

2. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

---

1. න සයං උපට්ඨහෙය්‍ය, - මජසං
2. නෙව වූපකාසෙති, නවූපකාසාපෙති,- මජසං

**වුට්ඨාපිතං**: උපසපන් කරවන ලද.

**පවත්තිනී** නම්: උවදෑ මෙහෙණ කියනු ලැබෙයි.

**ද්වෙ වස්සානි**: දෑවුරුද්දක්.

**නානුබන්ධෙය්‍ය**: උවටැන් නො කරයි. දෙවසක් උවටැන් නො කරන්නෙමි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

උවැදෑ මෙහෙණ නො දැනුමැතියක හෝ ලජ්ජා නැතියක හෝ වේ නම්, ගිලන්වූවාට, ආපදයෙහි ඇවැත් නැත. උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නවවන සිකපද යි.**

## 4. 7. 10

## දසවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සහජීවිනියක උපසපන් කරවා නො මැ ගෙනැ ගියා යැ. (ගෙනැ යන්නට) මෙරමාහට නො ඇණවූ යැ. සැමියා අල්වා ගත්තේ යැ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඕහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: "කෙසේ නම් ආර්‍ය්‍යා ථුල්ලනන්ද තොමෝ සහජීවිනියක උපසපන් කරවා නො මැ ගෙනැ ගියා ද, මෙරමාහට නො ඇණවූ ද, සැමියා අල්වා ගත්තේ ද. ඉදින් මේ මෙහෙණ තොමෝ බැහැරට ගියා නම් සැමියා නො අල්වා ගන්නේ යැ"යි ... සැබෑ ද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සහජීවිනියක උපසපන් කරවා නො මැ ගෙනැ ගියා ද, මෙරමාහට නො ඇණවූ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සහජීවිනියක උපසපන් කරවා නො මැ ගෙනැ ගියා ද, මෙරමාහට නො ඇණවූ ද, සැමියා අල්වා ගත්තේ ද. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් සහජීවිනියක උපසපන් කරවා යටත් පිරිසෙයින් සපස් යොත්නකුදු නො මැ ගෙනැ යා නම් මෙරමාහට නො අණවා නම් පචිති වේ"ය යි.**

2. **යා පන**: යම්, යම්බඳු ... භික්ඛුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

සහජීවිනිං නාම: සද්ධිවිහාරිනී වුච්චති.

වුට්ඨාපෙත්වාති: උපසම්පාදෙත්වා.

නෙව වූපකාසෙය්‍යාති: න සයං වූපකාසෙය්‍ය.

න වූපකාසාපෙය්‍යාති: න අඤ්ඤං ආණාපෙය්‍ය.

නෙව වූපකාසෙස්සාමි න වූපකාසාපෙස්සාමි අන්තමසො ඡප්පඤ්චයොජනානිපීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: සති අන්තරායෙ, පරියෙසිත්වා දුතියිකං භික්ඛුනිං න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසම සික්ඛාපදං.

## ගබ්භිනීවග්ගො සත්තමො

තස්සුද්දානං:

ගබ්භිං පායන්තිං ච ධම්මෙ අසම්මතූනද්වාදස
පරිපුණ්ණඤ්ච සංඝෙන සහ වුට්ඨා ඡප්පඤ්ච ච

**සහජීවිනී** නම්; සද්ධිවිහාරිනී කියනු ලැබෙයි.

**වුට්ඨාපෙත්වා:** උපසපන් කරවා,

**නෙව වූපකාසෙය්‍ය:** තොමෝ නො මැ ගෙනැ යයි.

**න වූපකාසාපෙය්‍ය:** මෙරමාහට නො අණවයි.

යටත්පිරිසෙයින් සපස් යොත්නකුදු නො මැ ගෙනැ යන්නෙම්, මෙරමාහට නො අණවන්නෙම් යි ධුර නික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි සොයා දැවන මෙහෙණක නො ලබා නම් ඇවැත් නැත. ගිලන් වූවාට, ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සිකපද යි.

## සත්වැනි ගබ්භිනී වර්ග යි.

එහි උද්දානය:

ගබ්භිනී යැ පායන්තී යැ ඡධම්ම යැ අසම්මත යැ ඌනද්වාදස යැ පරිපූණ්ණ (ද්වාදස) යැ සඞ්ඝ යැ සහජීවිනී යැ වුට්ඨාපිත යැ ඡපකඛ යොජන යැ යි.

## 4. 8. 1

## පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ඌනවීසතිවස්සං කුමාරීභූතං වුට්ඨාපෙන්ති. තා අක්ඛමා හොන්ති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසිකජාතිකා හොන්ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ඌනවීසතිවස්සං කුමාරීභූතං වුට්ඨාපෙස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ඌනවීසතිවස්සං කුමාරීභූතං වුට්ඨාපෙන්ති"ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ඌනවීසතිවස්සං කුමාරීභූතං වුට්ඨාපෙස්සන්ති. ඌනවීසතිවස්සා භික්ඛවෙ, කුමාරීභූතා අක්ඛමා හොති සීතස්ස උණ්හස්ස -පෙ- පාණහරානං අනධිවාසික ජාතිකා හොති. වීසතිවස්සා ච ඛො භික්ඛවෙ කුමාරීභූතා ඛමා හොති සීතස්ස උණ්හස්ස -පෙ- පාණහරානං අධිවාසිකජාතිකා හොති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ඌනවීසතිවස්සං කුමාරීභූතං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ඌනවීසතිවස්සා** නාම: අප්පත්තවීසතිවස්සා.

**කුමාරීභූතා** නාම: සාමණෙරා වුච්චති.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති, ආපත්ති දුක්කටස්ස, ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.



Free Distribution www.aathaapi.org

## 4. 8. 1

## පළමු සික‍පදය

1\. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසම්යෙහි විනාහි මෙහෙණෝ උනුවිසිවස් ඇති හෙරණිය උපසපන් කරවති. ඕහු සිහිලස උණුසුම සාගිනි පවස නො සිහිය හැකියෝ වෙති. ඩැහැමැසි මදුරු වා හිරු රැස් දිග්දැ පහස ද දුබැසි දුවදනා වදන්-මග ද සිරිරි පිළිබැඳි වැ උපන් නො සිහිය හැකි බහල තියුණු රළු නො මිහිරි නො මනවඩන දිවි හරන වෙයිනුදු නො ඉවසන සුල්ලෝ වෙත්.

2\. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඕහු ලමු කොට සිතති; නුගුණ පවසති; දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ උනුවිසිවස් ඇති හෙරණියක උපසපන් කරවූහු ද" යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණෝ උනුවිසිවස් ඇති හෙරණියක උපසපන් කරවත් ද යි ... සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ උනුවිසිවස් ඇති හෙරණියක උපසපන් කරවූහු ද, මහණෙනි, උනුවිසිවස් ඇති හෙරණිය සිහිලස උණුසුම් ... දිවිහරන (වෙයිනුදු) නො ඉවසනසුලු වූවා වෙයි. මහණෙනි, විසිවස් ඇති හෙරණිය සිහිලස උණුසුම් ... දිවිහරන (වෙයිනුදු) ඉවසනසුලු වූවා ද වෙයි. මහණෙනි, මෙය අප්‍රසන්න-යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් උනුවිසිවස් ඇති හෙරණියක උපසපන් කරවා නම් පචිති වේ"යයි.**

3\. **යා පන:** යම්, යම් බඳු ... **භික්ඛුනී** මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**ඌනවීසතිවස්සා** නම්: නො පත් විසිවස් ඇතියා යැ.

**කුමාරිභූතා** නම්: හෙරණිය කියනු ලැබේ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදතින් දුකුළා වෙති. කම් වදන් පිරියතැ උවදැ මෙහෙණහට පචිති ඇවැත් වෙයි. ගණයාහටද ඇජරහටද දුකුළා ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

ඌනවීසතිවස්සාය ඌනවීසතිවස්සසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ඌනවීසතිවස්සාය වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති දුක්කටස්ස. ඌනවීසතිවස්සාය පරිපුණ්ණසඤ්ඤා වුට්ඨාපෙති අනාපත්ති.

පරිපුණ්ණවීසතිවස්සාය ඌනවීසතිවස්සාති සඤ්ඤා ආපත්ති දුක්කටස්ස. පරිපුණ්ණවීසතිවස්සාය වෙමතිකා ආපත්ති දුක්කටස්ස, පරිපුණ්ණවීසතිවස්සාය පරිපුණ්ණසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ඌනවීසතිවස්සං පරිපුණ්ණසඤ්ඤා වුට්ඨාපෙති, පරිපුණ්ණවීසතිවස්සං පරිපුණ්ණසඤ්ඤා වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

පඨමසික්ඛාපදං.

## 4. 8. 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙන්ති. තා බාලා හොන්ති අබ්‍යත්තා, න ජානන්ති කප්පියං වා අකප්පියං වා. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙන්ති ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ අට්ඨාරසවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දාතුං." එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තාය අට්ඨාරසවස්සාය කුමාරිභූතාය සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: අහං අය්යෙ ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්යාය අට්ඨාරසවස්සා කුමාරිභූතා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචාමීති. දුතියම්පි යාචිතබ්බා- තතියම්පි යාචිතබ්බා- බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.



Free Distribution www.aathaapi.org

උනු විසිවස් ඇතියා කෙරෙහි උනු විසිවස් සන් ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. උනු විසිවස් ඇතියා කෙරෙහි විමති ඇතියා උපසපන් කරවා නම් දුකුළා ඇවැත් වෙයි. උනු විසිවස් ඇතියා කෙරෙහි පිරිපුන් සන්ඇතියා උපසපන් කරවා නම් ඇවැත් නැති.

පිරිපුන් විසිවස් ඇතියා කෙරෙහි උනු විසිවස් සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිරිපුන් විසිවස් ඇතියා කෙරෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. පිරිපුන් විසිවස්. ඇතියා කෙරෙහි පිරිපුන් සන් ඇතියා නම් ඇවැත් නැති.

උනු විසිවස් ඇතියක පිරිපුන් සන් ඇතියා උපසපන් කරවා නම්, පිරිපුන් විසිවස් ඇතියක පිරිපුන් සන් ඇතියා උපසපන් කරවා නම්, ඇවැත් නොවේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පළමු සිකපද යි.**

## 4. 8. 2

## දෙවන සිකපදය

1. **ශ්‍රාවස්ති** නිදාන යි – එසමයෙහි වනාහි මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදැරුම් දහම්හි නොහික්මුණු සිඛ ඇති හෙරණියක උපසපන් කරවති. ඔහු නොදනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නොකැපය හෝ නො දනිත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති; දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති සවැදැරුම් දහම්හි නොහික්මුණු සිඛ ඇති හෙරණියක උපසපන් කරවූහුද''යි...සැබෑද මහණෙනි, මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදැරුම් දහම්හි නොහික්මුණු සිඛ ඇති හෙරණියක උපසපන් කරවත් දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදැරුම් දහම්හි නොහික්මුණු සිඛ ඇති හෙරණියක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූ සේක. 'මහණෙනි, අටළොස් වස් ඇති හෙරණියකට දෙවසක් සවැදැරුම් දහම්හි ශික්ෂාසම්මුතිය දෙන්නට අනුදනිමි'. මෙසේ ද වනාහි මහණෙන් දිය යුතු යැ. ඒ අටළොස් වස් ඇති හෙරණිය විසින් සඞ්ඝයා වෙත එළැඹැ උතුරුසඟ සිවුර එකස් කොට මෙහෙණන්ගේ පා වැඳ උළුලුයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කිය යුතු වන්නේ යැ. ආර්යාවෙනි මෙ නම් ඇති ආර්යාව කෙරෙහි වූ අටළොස් වස් ඇති හෙරණි වූ මෙනම් ඇති මම සඞ්ඝයාගෙන් දෙවසක් සවැදැරුම් දහම්හි ශික්ෂාසම්මුතිය යදිමියි. දෙවනවට දු යැදිය යුතු යැ. තෙවනවට දු යැදිය යුතු යැ. ව්‍යක්ත වූ ප්‍රතිබලවූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

2. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය අට්ඨාරසවස්සා කුමාරීභූතා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමාය අට්ඨාරසවස්සාය කුමාරීභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.

3. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය අට්ඨාරසවස්සා කුමාරීභූතා සඞ්ඝං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමාය අට්ඨාරසවස්සාය කුමාරීභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතිං දෙති. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය අට්ඨාරසවස්සාය කුමාරීභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුතියා දානං. සා තුණ්හස්ස. යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමාය අට්ඨාරසවස්සාය කුමාරීභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛාසම්මුති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

4. සා අට්ඨාරවස්සා කුමාරීභූතා එවං වදෙහීති වත්තබ්බා: පාණාතිපාතා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කම්මසමාදානං සමාදියාමි -පෙ- විකාලභොජනා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කම්මසමාදානං සමාදියාමීති. අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

"යා පන භික්ඛුනී පරිපුණ්ණවීසතිවස්සං කුමාරීභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.

5. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

පරිපුණ්ණවීසතිවස්සා නාම: පත්තවීසතිවස්සා.

කුමාරීභූතා නාම: සාමණෙරා වුච්චති.

ද්වෙ වස්සානීති: ද්වෙ සංවච්ඡරානි.



Free Distribution www.aathaapi.org

2. ආර්යාවෙනි, සඞ්ඝතෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහිවූ අටලොස් වස් ඇති හෙරණිවූ මෙනම් ඇති මෝ තොමෝ සඞ්ඝයාගෙන් දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්‍ෂා-සම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාහට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝතෙමේ අටලොස් වස් ඇති මෙනම් ඇති හෙරණියට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්‍ෂාසම්මුතිය දෙන්නේ යැ. මේ ඥප්ති යි.

3. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ අටලොස් වස් ඇති හෙරණි වූ මෙනම් ඇති මෝ තොමෝ සඞ්ඝයාගෙන් දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්‍ෂා-සම්මුතිය යදියි. සඞ්ඝ තෙමේ අටලොස් වස් ඇති මෙනම් ඇති හෙරණියහට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්‍ෂාසම්මුතිය දෙයි. අටලොස් වස් ඇති මෙනම් ඇති හෙරණියට දෙවසක් සවැදෑ-රුම් දහම්හි ශික්‍ෂාසම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬවන්නී යැ, යමකට නොරුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ. සඞ්ඝයා විසින් අටලොස් වස් ඇති මෙනම් ඇති හෙරණියට දෙවසක් සවැදෑරුම් දහම්හි ශික්‍ෂා-සම්මුතිය දෙන ලද්දී යැ. සඞ්ඝයාහට රුස්නේයැ. එහෙයින් නිහඬ-ය හ. මෙසේ මෙය දරමි යි.

4. අටලොස් වස් ඇති ඒ හෙරණිය මෙසේ කියවයි කිය-යුත්තී යැ. දෙවසක් පණිවායෙන් වැළකීම නො ඉක්මවිය යුතු සමාදනයක් කොට සමාදන් වෙමි ... දෙවසක් විකල් බොජුනෙන් වැළකීම නො ඉක්මවියයුතු සමාදනයක් කොට සමාදන් වෙමි යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්ට නොයෙක් අයුරින් ගරහා දුබරබැව්හි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

"යම් මෙහෙණක් පිරිපුන් විසිවය් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි නොහික්මුණු සිඛ ඇති හෙරණියක උපසපන් කරවා නම් පචිති වේ"යයි.

5. යා පන: යම්, යම්බඳු ... භික්ඛුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරනලද භික්‍ෂුණී යි.

**පරිපුණ්ණවීසතිවස්සා** නම්: පැමිණි විසිවස් ඇතියා යැ.

**කුමාරීභූතා** නම්: හෙරණිය කියනු ලැබෙයි.

**ද්වෙවස්සානි:** දෑවුරුද්දක්.



Free Distribution www.aathaapi.org

**අසික්ඛිතසික්ඛා** නාම: සික්ඛා වා න දින්නා හොති දින්නා වා සික්ඛා කුපිතා

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං.**

## 4. 8. 3

## තතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සංඝෙන අසම්මතං වුට්ඨාපෙන්ති. භික්ඛුනියො එවමාහංසු. "එථ සික්ඛමානා, ඉමං ජානාථ, ඉමං දෙථ, ඉමං ආහරථ, ඉමිනා අත්ථො, ඉමං කප්පියං කරොථා"ති. තා එවමාහංසු: "න මයං අය්‍යා සික්ඛමානා භික්ඛුනියො මයන්ති".



Free Distribution www.aathaapi.org

**අසික්ඛිතසික්ඛා** නම්: ශික්‍ෂාව නො දෙන ලද්දී හෝ වෙයි. දෙන ලද ශික්‍ෂාව කොපා වූවා හෝ වේ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදෑ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහටද ඇජරහටද දුකුළා ඇවැත් වේ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්ම සංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියානම් දුකුළා ඇවැත් වේ.

පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදැරුම් දහම්හි හික්මුණු සිබ ඇති හෙරණියක උපසපන් කරවා නම් ඇවැත් නො වේ. උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**දෙවන සිකපද යි.**

## 4. 8. 3

## තෙවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි— එසමයෙහි වනාහි මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදැරුම් දහම්හි හික්මුණු සිබ ඇති සඞ්ඝයා විසින් සම්මත නොකරන ලද හෙරණියක උපසපන් කරවති. මෙහෙණෝ මෙසේ කීහු: 'එවූ හික්මනුවෙනි, මෙය දනිවූ, මෙය දෙවූ, මෙය ගෙනඑවූ, මෙයින් ප්‍රයොජන යැ, මේය කැප කරවූ'යි. ඔහු මෙසේ කීහු: ආර්යාවෙනි, අපි හික්මනුවෝ නො වම්හ. අපි මෙහෙණෝ වම්හ යි.



Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙස්සන්තී''ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. ''අනුජානාමි භික්ඛවෙ පරිපුණ්ණවීසතිවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතිං දාතුං''. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තාය පරිපුණ්ණවීසතිවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සඞ්ඝං උපසංකමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: ''අහං අය්යෙ, ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්යාය පරිපුණ්ණවීසතිවස්සා කුමාරිභූතා ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචාමී''ති. දුතියම්පි යාචිතබ්බා - තතියම්පි යාචිතබ්බා - බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සංඝො ඤාපෙතබ්බො.

3. සුණාතු මෙ අය්යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්යාය පරිපුණ්ණවීසතිවස්සා කුමාරිභූතා ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණවීසතිවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.

4. සුණාතු මෙ අය්යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමාය අය්යාය පරිපුණ්ණවීසතිවස්සා කුමාරිභූතා ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා සඞ්ඝං වුට්ඨානසම්මුතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණවීසතිවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතිං දෙති. යස්සා අය්යාය ඛමති ඉත්ථන්නාමාය පරිපුණ්ණවීසතිවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුතියා දානං, සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමාය පරිපුණ්ණවීසතිවස්සාය කුමාරිභූතාය ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය වුට්ඨානසම්මුති, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.



Free Distribution www.aathaapi.org

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් ''කෙසේ නම් මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නොකරනලද හෙරණියක උපසපන් කරවූහුද''යි...සැබෑද මහණෙනි, මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නොකරනලද හෙරණියක උපසපන් කරවත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත නොකරනලද හෙරණියක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක. 'මහණෙනි, පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති හෙරණියට වුට්ඨාන සම්මුතිය දෙන්නට අනුදනිමි.' මෙසේ ද වනාහි මහණෙනි, දිය යුතු යැ. පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති ඒ හෙරණිය විසින් සඞ්ඝයා වෙත එළැඹැ උතුරුසඟ සිවුර එකස් කොට මෙහෙණන්ගේ පා වැඳ උළුලුයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ: ආර්යාවෙනි, මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති හෙරණිය වූ මෙනම් ඇති මම සඞ්ඝයා ගෙන් වුට්ඨාන සම්මුතිය යදිමි යි. දෙවනවට ද යැදිය යුතු යැ. තෙවනවට ද යැදිය යුතු යැ. ව්‍යක්ත වූ ප්‍රතිබලවූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

3. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති හෙරණි වූ මෙනම් ඇති මෝ තොමෝ සඞ්ඝයාගෙන් වුට්ඨාන සම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ පිරිපුන් විසිවස් ඇති සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙනම් ඇති හෙරණියට වුට්ඨාන සම්මුතිය දෙන්නේ යැ. මේ ඥප්ති යි.

4. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. මෙනම් ඇති ආර්යාව කෙරෙහි වූ පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති හෙරණි වූ මෙනම් ඇති මෝ තොමෝ සඞ්ඝයාගෙන් වුට්ඨාන සම්මුතිය යදියි. සඞ්ඝ තෙමේ පිරිපුන් විසි වස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙනම් ඇති හෙරණියට වුට්ඨාන සම්මුතිය දෙයි. පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙනම් ඇති හෙරණියට වුට්ඨාන සම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬවන්නී යැ. යමකට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ. සඞ්ඝයා විසින් පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති මෙනම් ඇති හෙරණියට වුට්ඨාන සම්මුතිය දෙන ලද්දී යැ. සඞ්ඝයාට රුස්නේ යැ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි යි.



Free Distribution www.aathaapi.org

5. අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුභරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**“යා පන භික්ඛුනී පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය”න්ති.**

6. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පරිපුණ්ණවීසතිවස්සා** නාම: පත්තවීසතිවස්සා.

**කුමාරිභූතා** නාම: සාමණෙරා වුච්චති.

**ද්වෙ වස්සානීති:** ද්වෙ සංවච්ඡරානි.

**සික්ඛිතසික්ඛා** නාම: ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**අසම්මතා** නාම: ඤත්තිදුතියෙන කම්මෙන වුට්ඨානසම්මුති න දින්නා හොති.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති: ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති. සීමං වා සම්මන්නති, ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස, අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සංඝෙන සම්මතං වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං.**



Free Distribution www.aathaapi.org

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්ට නොයෙක් අයුරින් ගරහා දුබරබැව්හි...මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සංඝයා විසින් සම්මත නොකරනලද හෙරණියක උපසපන් කරවා නම් පචිති වේ''යයි.**

6. යා පන: යම්, යම්බඳු...භික්ඛුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පරිපුණ්ණවීසතිවස්සා** නම්: පැමිණි විසිවස් ඇතියා යැ.

**කුමාරිභූතා** නම්: හෙරණිය කියනු ලැබෙයි.

**ද්වෙවස්සානි:** දැවුරුද්දක්.

**සික්ඛිතසික්ඛා** නම්: සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇතියා යැ.

**අසම්මතා** නම්: ඤත්තිදුතිය කර්මයෙන් වුට්ඨාන සම්මුතිය නොදෙන ලද්දී වෙයි.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමැ යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහටද ඇජරහටද දුකුළා ඇවැත් වේ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

පිරිපුන් විසිවස් ඇති දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇති සඞ්ඝයා විසින් සම්මත කරනලද හෙරණියක උපසපන් කරවා නම් ඇවැත් නො වේ. උම්මත්තිකාවට...ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නෙවන සිකපද යි.**

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ඌනද්වාදස වස්සා වුට්ඨාපෙන්ති. තා බාලා හොන්ති අබ්‍යත්තා න ජානන්ති කප්පියං වා අකප්පියං වා. සද්ධිවිහාරිනියොපි බාලා හොන්ති අබ්‍යත්තා න ජානන්ති කප්පියං වා අකප්පියං වා. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ඌනද්වාදසවස්සා වුට්ඨාපෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො ඌනද්වාදසවස්සා වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො ඌනද්වාදසවස්සා වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ඌනද්වාදසවස්සා වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ඌනද්වාදසවස්සා** නාම: අප්පත්තද්වාදසවස්සා.

**උට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පරිපුණ්ණද්වාදසවස්සා වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං.**



Free Distribution www.aathaapi.org

## 4. 8. 4

## සතරවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදනයි — එසමයෙහි වනාහි ඌනු දෙළොස්වස් ඇති මෙහෙණෝ උපසපන් කරවත්. ඔහු නොදනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නොකැපය හෝ නො දනිති. සද්ධිවිහාරිනීහු ද නො දනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිත්. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ඌනු දෙළොස්වස් ඇති මෙහෙණෝ උපසපන් කරවූහු ද''යි ... සැබෑද මහණෙනි, ඌනු දෙළොස්වස් ඇති මෙහෙණෝ උපසපන් කරවත් දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ඌනුදෙළොස්වස් ඇති මෙහෙණෝ උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් ඌනු දෙළොස්වස් ඇතියා උපසපන් කරවා නම් පචිති වේ''යයි.**

2. යා පන: යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොරමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරනලද **භික්ෂුණී යි.**

**ඌනද්වාදසවස්සා** නම්: නොපත් දෙළොස්වස් ඇතියා යැ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම්වදත් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහටද ඇජරහටද දුකුළා ඇවැත් වේ.

පිරිපුන් දෙළොස්වස් ඇතියා උපසපන් කරවා නම් ඇවැත් නො වේ. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

සතරවන සිකපද යි.



Free Distribution www.aathaapi.org

## 4. 8. 5

## පඤ්චමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සා සංඝෙන අසම්මතා වුට්ඨාපෙන්ති. තා බාලා හොන්ති අබ්‍යත්තා න ජානන්ති කප්පියං වා අකප්පියං වා. සද්ධිවිහාරිනියොපි බාලා හොන්ති අබ්‍යත්තා න ජානන්ති කප්පියං වා අකප්පියං වා.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සා සංඝෙන අසම්මතා වුට්ඨාපෙස්සන්ති"ති –පෙ– සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සා සංඝෙන අසම්මතා වුට්ඨාපෙන්තීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සා සංඝෙන අසම්මතා වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "අනුජානාමි භික්ඛවෙ පරිපුණ්ණද්වාදසවස්සාය භික්ඛුනියා වුට්ඨාපනසම්මුතිං දාතුං". එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා. තාය පරිපුණ්ණද්වාදසවස්සාය භික්ඛුනියා සංඝං උපසංකමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛුනීනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං අය්‍යෙ ඉත්ථන්නාමා පරිපුණ්ණද්වාදසවස්සා භික්ඛුනීසඞ්ඝං වුට්ඨාපනසම්මුතිං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බා – තතියම්පි යාචිතබ්බා. සා භික්ඛුනී සඞ්ඝෙන පරිච්ඡින්දිතබ්බා[1] "බ්‍යත්තායං[2] භික්ඛුනී ලජ්ජිනී"ති. සචෙ බාලා ච හොති අලජ්ජිනී[3] න දාතබ්බා. සචෙ බාලා හොති ලජ්ජිනී[4] න දාතබ්බා. සචෙ බ්‍යත්තා ච හොති අලජ්ජිනී න දාතබ්බා. සචෙ බ්‍යත්තා ච හොති ලජ්ජිනී ච දාතබ්බා. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා. බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො.

3. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමා පරිපුණ්ණද්වාදසවස්සා භික්ඛුනීසංඝං වුට්ඨාපනසම්මුතිං යාචති. යදි සංඝස්ස පත්තකල්ලං සංඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය භික්ඛුනියා වුට්ඨාපනසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.

1. පරිපුච්ඡිතබ්බා, සීi
2. බ්‍යත්තාසි – සීමු i සීමු ii
3. ලජ්ජිනී ච – සීමු i සීමු ii.
4. අලජ්ජිනී ච – සීමු i සීමු ii.

# 4. 8. 5

## පස්වෙනි සිකපදය

1. ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි වනාහි පිරිපුන් දෙළොස්වස් ඇති මෙහෙණෝ සඞ්ඝයා විසින් සම්මත නොකරන ලද්දාවෝ උපසපන් කරවත්. ඔහු නොදැනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිති. සද්ධිවිහාරිනීහුද නො දැනුමැති අව්‍යක්තයෝ වෙති. කැපය හෝ නො කැපය හෝ නො දනිත්.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති; දෙස් පතුරුවත්. ''කෙසේ නම් පිරිපුන් දෙළොස්වස් ඇති මෙහෙණෝ සඞ්ඝයා විසින් සම්මත නොකරන ලද්දාවෝ උපසපන් කරවූහු දැ''යි...සැබෑද මහණෙනි, පිරිපුන් දෙළොස් වස් ඇති මෙහෙණෝ සඞ්ඝයා විසින් සම්මත නොකරන ලද්දාවෝ උපසපන් කරවත් දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, පිරිපුන් දෙළොස්වස් ඇති මෙහෙණෝ සඞ්ඝයා විසින් සම්මත නොකරන ලද්දාවෝ උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි .. ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක. මහණෙනි, පිරිපුන් දෙළොස්වස් ඇති මෙහෙණට වුට්ඨාපන සම්මුතිය දෙන්නට අනුදනිමි. මෙසේ ද වනාහි මහණෙනි, දිය යුතු යැ: පිරිපුන් දෙළොස්වස් ඇති ඒ මෙහෙණ විසින් සඞ්ඝයා වෙත එළැඹැ උතුරුසඟ සිවුර එකස් කොට වැඩිමහලු මෙහෙණන්ගේ පා වැඳ උළුලුයෙන් හිඳ ඇදිලි බැඳ මෙසේ කිය යුතු වන්නේ යැ: ආර්යාවෙනි, පිරිපුන් දෙළොස්වස් ඇති මෙනම් ඇති මම මෙහෙණසඟනගෙන් වුට්ඨාපන සම්මුතිය යදිමි යි. දෙවනවට දු යැදිය යුතු යැ. තෙවනවට දු යැදිය යුතු යැ. ඒ මෙහෙණ තොමෝ මෙහෙණ සඟන විසින් පිරික්සිය යුත්තී යැ. මේ මෙහෙණ තොමෝ ව්‍යක්ත වූවා ද ලජ්ජිනී වූවාදැ යි. ඉදින් නො දැනුමැති වූවා ද අලජ්ජිනී වූවා ද වේ නම් නො දිය යුත්තී යැ. ඉදින් නො දැනුමැති වූවා ද ලජ්ජිනී වූවා ද වේ නම් නො දිය යුත්තී යැ. ඉදින් ව්‍යක්ත වූවා ද අලජ්ජිනී වූවා ද වේ නම් නොදිය යුත්තී යැ. ඉදින් ව්‍යක්ත වූවා ද ලජ්ජිනී වූවා ද වේ නම් දිය යුත්තී යැ. මෙසේ ද වනාහි මහණෙනි, දියයුතු යැ. ව්‍යක්ත වූ ප්‍රතිබලවූ මෙහෙණක විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

3. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ ම වදන් අසාවා. පිරිපුන් දෙළොස්වස් ඇති මෙ නම් ඇති මෝ තොමෝ භික්ෂුණී සඞ්ඝයා ගෙන් වුට්ඨාපන සම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ පිරිපුන් දෙළොස් වස් ඇති මෙනම් ඇති මෙහෙණට වුට්ඨාපනසම්මුතිය දෙන්නේ යැ. මේ ඥප්ති යි.

4. සුණාතු මෙ අය්‍යෙ සංඝො අයං ඉත්ථන්නාමා පරිපුණ්ණද්වාදසවස්සා භික්ඛුනී සංඝං වුට්ඨාපනසම්මුතිං යාචති. සංඝො ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය භික්ඛුනියා වුට්ඨාපනසම්මුතිං දෙති. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය භික්ඛුනියා වුට්ඨාපනසම්මුතියා දානං, සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. දින්නා සංඝෙන ඉත්ථන්නාමාය පරිපුණ්ණද්වාදසවස්සාය භික්ඛුනියා වුට්ඨාපනසම්මුති. ඛමති සංඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

5. අථ ඛො භගවා තා භික්ඛුනියො අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යා පන භික්ඛුනී පරිපුණ්ණද්වාදසවස්සා සංඝෙන අසම්මතා වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.

6. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අය. ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

පරිපුණ්ණ ද්වාදසවස්සා නාම: පත්තද්වාදසවස්සා.

අසම්මතා නාම: ඤත්තිදුතියෙන කම්මෙන වුට්ඨාපනසම්මුති න දින්නා හොති.

වුට්ඨාපෙය්‍යාති: උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති, ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස ධම්මකම්මෙ වෙමතිකා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා වුට්ඨාපෙති ආපත්ති පාචිත්තියස්ස.



Free Distribution www.aathaapi.org

4. ආර්යාවෙනි, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. පිරිපුන් දෙලොස්වස් ඇති මේ මෙනම් ඇති මෙමෙහෙණ සඞ්ඝයාගෙන් වුටඨාපන සම්මුතිය යදියි. සඞ්ඝ තෙමේ පිරිපුන් දෙලොස් වස් ඇති මෙ නම් මෙහෙණට වුටඨාපන සම්මුතිය දෙයි. පිරිපුන් දෙළොස්වස් ඇති මෙ නම් මෙමෙහෙණහට වුටඨාපන සම්මුතිය දීම යම් ආර්යාවකට රුස්නේ නම් ඕ තොමෝ නිහඬ වන්නී යැ. යමකට නො රුස්නේ නම් ඕ තොමෝ කියන්නී යැ. සඞ්ඝයා විසින් පිරිපුන් දෙලොස් වස් ඇති මෙනම් ඇති මෙමෙහෙණට වුටඨාපන සම්මුති දෙනලද්දී යැ. සඞ්ඝයාහට රුස්නේ යැ. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි යි.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙමෙහෙණන්ට නොයෙන් අයුරින් ගරහා දුබරබැව්හි ... මෙසේ ද මහණෙනි, මෙමෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙමෙහෙණක් තොමෝ පිරිපුන් දෙලොස් වස් ඇතියා සඞ්ඝයා විසින් සම්මත නොකරනලද්දී උපසපන් කරවා නම් පචිති වේ"ය යි.**

6 **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මෝ තොමෝ මේ අර්-යෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**පරිපුණ්ණද්වාදසවස්සා** නම්: පැමිණි දෙලොස්වස් ඇතියා යැ.

**අසම්මතා** නම්: ඤත්තිද්‍විතිය කර්මයෙන් වුටඨාපන සම්මුති නො දෙනලද්දී වේ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙමෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරහට ද දුකුළා ඇවැත් වේ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්ම සංඥා ඇතියා උපසපන් කරවා නම් පචිති ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤා ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පරිපුණ්ණඡන්දවස්සා සඞ්ඝෙන සම්මතා වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඤ්චමසික්ඛාපදං.**

## 4. 8. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං -- තෙන ඛො පන සමයෙන **චණ්ඩකාළී භික්ඛුනී භික්ඛුනිසඞ්ඝං** උපසංකමිත්වා වුට්ඨාපනසම්මුතිං යාචි[1]. අථ ඛො **භික්ඛුනීසඞ්ඝො චණ්ඩකාළිං භික්ඛුනිං පරිවීමංසිත්වා** "අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනා"ති වුට්ඨාපනසම්මුතිං න අදසි. **චණ්ඩකාළී භික්ඛුනී සාධූති පටිස්සුණි.** තෙන ඛො පන සමයෙන භික්ඛුනීසඞ්ඝො **අඤ්ඤාසං භික්ඛුනීනං** වුට්ඨාපනසම්මුතිං දෙති. **චණ්ඩකාළී** භික්ඛුනී උජ්ඣායති ඛීයති විපාචෙති; "අහමෙව නූන බාලා අහමෙව නූන අලජ්ජිනී යං සඞ්ඝො අඤ්ඤාසං භික්ඛුනීනං වුට්ඨාපනසම්මුතිං දෙති, මය්හමෙව න දෙතී"ති.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති **ඛීයන්ති** විපාචෙන්ති: කථං හි නාම අය්‍යා චණ්ඩකාළී අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනා'ති වුච්චමානා සාධූති **පටිස්සුණිත්වා පච්ඡා ඛීයන** ධම්මං ආපජ්ජිස්සතී'ති -පෙ- සච්චං කිර භික්ඛවෙ **චණ්ඩකාළී භික්ඛුනී** අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනාති වුච්චමානා සාධූති **පටිස්සුණිත්වා** පච්ඡා ඛීයනධම්මං ආපජ්ජති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ **චණ්ඩකාළී භික්ඛුනී** අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනාති වුච්චමානා සාධූති **පටිස්සුණිත්වා පච්ඡා ඛීයන**-ධම්මං ආපජ්ජිස්සති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනාති වුච්ච-මානා සාධූති පටිස්සුණිත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තිය"න්ති.**

1. යාචති - මජසං

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියා නම් දුකුළා ඇවැත් වේ.

පිරිපුන් දෙළොස්වස් ඇතියා සඞ්ඝයා විසින් සම්මත කරනලද්දී උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පස්වන සිකපද යි.**

## 4. 8. 6

## සවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි– එසමයෙහි වනාහි චණ්ඩකාළී භික්ෂුණී තොමෝ මෙහෙණ සඟන වෙතැ එළැඹැ වුට්ඨාපන සම්මුතිය යැදූ යැ. එකල්හි මෙහෙණ සඟ තෙමේ චණ්ඩකාළී භික්ෂුණිය පිරිසිඳ ''ආර්යාවෙනි, වුට්ඨාපන සම්මුතිය දීමෙන් තිට කම් නැතැ'' යි වුට්ඨාපන සම්මුතිය නො දුන්නේ යැ. චණ්ඩකාළී භික්ෂුණී තොමෝ මැනැවැයි පිළිවදන් දුනු යැ. එසමයෙහි වනාහි මෙහෙණසඟ තෙමේ අන් මෙහෙණන්ට වුට්ඨාපන සම්මුතිය දෙයි. චණ්ඩකාළී භික්ෂුණී තොමෝ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි. ''මම් මැ එකැතින් බාලයෙම් ද, මම් මැ එකැතින් අලජ්ජිනියෙම් ද, යම් හෙයෙකින් සඞ්ඝ තෙමේ අන් මෙහෙණන්ට වුට්ඨාපනසම්මුතිය දේ ද, මට මැ නො දේ ද''යි.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්, ''කෙසේ නම් ආර්යා චණ්ඩකාළී තොමෝ 'ආර්යාවෙනි, වුට්ඨාපනසම්මුතිය දීමෙන් තොපට කම් නැතැ'යි කියනු ලබන්නී මැනැවැයි පිළිවදන් දී පසුවැ නුගුණ පවසන සැහැවියට පැමිණියාදැ''යි... සැබෑද මහණෙනි, චණ්ඩකාළී භික්ෂුණී තොමෝ 'ආර්යාවෙනි, වුට්ඨාපනසම්මුතිය දීමෙන් තොපට කම් නැතැ'යි කියනු ලබන්නී මැනැවැයි පිළිවදන් දී පසුවැ නුගුණ පවසන සැහැවියට පැමිණියා දැ''යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, චණ්ඩකාළී භික්ෂුණී තොමෝ 'ආර්යාවෙනි, වුට්ඨාපනසම්මුතිය දීමෙන් තිට කම් නැතැ'යි කියනු ලබන්නී මැනැවැයි පිළිවදන් දී පසුවැ නුගුණ පවසන සැහැවියට පැමිණියා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**'' යම් මෙහෙණක් තොමෝ ' ආර්යාවෙනි, වුට්ඨාපන සම්මුතිය දීමෙන් තොපට කම් නැතැ'යි කියනු ලබන්නී මැනැවැයි පිළිවදන් දී පසුවැ නුගුණ පවසන සැහැවියට අවදී නම් පචිති වේ'' ය යි.**

3. **සා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙනාති:** අලං තාව තෙ අය්‍යෙ උපසම්පාදිතෙන. සාධූති පටිස්සුණිත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** පකතියා ඡන්දා දොසා මොහා භයා කරොන්තං ඛීයති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසික්ඛාපදං.

## 4. 8. 7

## සත්තමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා සික්ඛමානා ථුල්ලනන්දං භික්ඛුනිං උපසංකමිත්වා උපසම්පදං යාචි. ථුල්ලනන්දා භික්ඛුනී තං සික්ඛමානං ''සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි, එවාහං තං වුට්ඨාපෙස්සාමී''ති වත්වා නෙව වුට්ඨාපෙති, න වුට්ඨාපනාය උස්සුක්කං කරොති. අථ ඛො සා සික්ඛමානා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා සික්ඛමානං සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා නෙව වුට්ඨාපෙස්සති, න වුට්ඨාපනාය උස්සුක්කං කරිස්සතී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සික්ඛමානං ''සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා නෙව වුට්ඨාපෙති, න වුට්ඨාපනාය උස්සුක්කං කරොතී''ති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සික්ඛමානං ''සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමී''ති වත්වා නෙව වුට්ඨාපෙස්සති න වුට්ඨාපනාය උස්සුක්කං කරිස්සති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

3. යා පන: යම්, යම්බඳු ... භික්ෂුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

අලං තාව තෙ අයෙයා වුට්ඨාපිතෙන: ආර්යාවෙනි, උපසපත් කැරැවීමෙන් තොපට කම් නැති. මැනැවැයි පිළිවදන් දී පසුවැ නුගුණ පවසන සැහැවියට පැමිණේ නම් පචිති ඇවැත් වේ.

ප්‍රකෘතියෙන් ඡන්දයෙන් දෙවෂයෙන් මොහයෙන් භයෙන් කරන්නහුට නුගුණ පවසා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

ස්වන සික්‍ෂපද යි.

## 4. 8. 7

## සත්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි වනාහි එක්තරා සික්මනුවක් තොමෝ ථුල්ලනන්‍දා භික්ෂුණිය වෙතැ එළැඹැ උපසපුව යැදූ යැ. ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ඒ සික්මනුවට ''ආර්යාවෙනි, ඉදින් තෙපි මා හට සිවුරක් දෙන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ''යි මෙසේ කියා නොමැ උපසපන් කරවයි. උපසපන් කැරැවීම පිණිස වෑයම් නො කරයි. එකල්හි ඒ සික්මනු තොමෝ මෙහෙණන්ට තෙල කරුණ ඇරෙවූ යැ.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිය් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද තොමෝ සික්මනුවට ආර්යාවෙනි, ඉදින් තෙපි මාහට සිවුරක් දෙන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා නොමැ උපසපන් කරවූ ද, උපසපන් කැරැවීම පිණිස වෑයම් නො කළා ද''යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සික්මනුවකට ආර්යාවෙනි, ඉදින් තෙපි මාහට සිවුරක් දෙන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා නො මැ උපසපන් කරවා ද, උපසපන් කැරැවීම පිණිස වෑයම් නො කෙරේ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ සික්මනුවකට ආර්යාවෙනි, ඉදින් තෙපි මාහට සිවුරක් දෙන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා නො මැ උපසපන් කරවූ ද, උපසපන් කැරැවීම පිණිස වෑයම් නො කළා ද, මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

“යා පන භික්ඛුනී සික්ඛමානං සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා පච්ඡා සා අනන්තරායිකිනී නෙව වුට්ඨාපෙය්‍ය න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තිය”න්ති.

3. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

සික්ඛමානා නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති: එවාහං තං උපසම්පාදෙස්සාමි.

සා පච්ඡා අනන්තරායිකිනීති: අසති අන්තරායෙ.

නෙව වුට්ඨාපෙය්‍යාති: න සයං වුට්ඨාපෙය්‍ය.

න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍යාති: න අඤ්ඤං ආණාපෙය්‍ය. නෙව වුට්ඨාපෙස්සාමි න වුට්ඨාපනාය උස්සුක්කං කරිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

අනාපත්ති: සති අන්තරායෙ පරියෙසිත්වා න ලභති, ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං.

## 4. 8. 8

## අට්ඨමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා සික්ඛමානා ථුල්ලනන්දං භික්ඛුනිං උපසඞ්කමිත්වා උපසම්පදං යාචි. ථුල්ලනන්දා භික්ඛුනී තං සික්ඛමානං[1] “සචෙ මං[2] ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමී”ති වත්වා නෙව වුට්ඨාපෙති න වුට්ඨාපනාය උස්සුක්කං කරොති. අථ ඛො සා සික්ඛමානා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි.

1. සික්ඛමානං එතදවොච - මජසං
2. මෙ-සීමු i සීමු ii



Free Distribution www.aathaapi.org

"යම් මෙහෙණක් සික්මනුවකට ආය්‍ර්‍යාවෙනි, ඉදින් තෙපි මා හට සිවුරක් දෙන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා පසුවැ ඕතොමෝ අනතුරක් නැත්තී නොමැ උපසපන් කරවා නම් උපසපන් කැරැවීම පිණිස වෑයම් නො කෙරේ නම් පචිති වේ" ය යි.

3. යා පන: යම්, යම්බඳු ... භික්ෂුණී ... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

සික්ඛමානා නම්, දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සික ඇතියා යැ.

සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි එවාහන්තං වුට්ඨාපෙස්සාමි: මෙසේ මම තා උපසපන් කරවන්නෙමි.

සා පච්ඡා අනන්තරායිකිනී: අනතුරක් නැති කල්හි,

නෙව වුට්ඨාපෙය්‍ය: නොමැ උපසපන් කරවයි.

න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය: මෙරමාහට නො අණවයි. නොමැ උපසපන් කරවන්නෙමි, උපසපන් කරවීමට වෑයම් නො කරන්නෙමි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා නොලබා නම්, ගිලන්වූවාට ආපදයෙහි, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

සත්වන සිකපද යි.

## 4. 8. 8

## අටවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි එක්තරා හික්මනුවක් තොමෝ ථුල්ලනන්ද භික්ෂුණිය වෙතැ එළැඹැ උපසපුව යැදූ යැ. ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ ඒ හික්මනුවට "ආර්යාවෙනි, ඉදින් තෙපි දෙවසක් මට උවටැන් කරන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ"යි මෙසේ කියා නොමැ උපසපන් කරවයි. උපසපන් කැරැවීම පිණිස වෑයම් නො කරයි. එකල්හි ඒ හික්මනු තොමෝ මෙහෙණන්ට තෙල කරුණ ඇරෑවූ යැ.



Free Distribution www.aathaapi.org

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: “කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා සික්ඛමානං සචෙ මං ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා නෙව වුට්ඨාපෙස්සති න වුට්ඨාපනාය උස්සුක්කං කරිස්සතීති –පෙ– සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී සික්ඛමානං සචෙ මං ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා නෙව වුට්ඨාපෙති න වුට්ඨාපනාය උස්සුක්කං කරොතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. –පෙ– කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී සික්ඛමානං සචෙ මං ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති: වත්වා නෙව වුට්ඨාපෙස්සති. න වුට්ඨාපනාය උස්සුක්කං කරිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු;

**“යා පන භික්ඛුනී සික්ඛමානං සචෙ මං ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමීති වත්වා සා පච්ඡා අනන්තරායිකිනී නෙව වුට්ඨාපෙය්‍ය න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍ය පාචිත්තිය”න්ති.**

3. **යා පනාති:** යා, යාදිසා –පෙ– **භික්ඛුනීති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සික්ඛමානා** නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**සචෙ මං ත්වං අය්‍යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසීති:** ද්වෙ සංවච්ඡරානි උපට්ඨහිස්සසි.

**එවාහං තං වුට්ඨාපෙස්සාමීති:** එවාහං තං උපසම්පාදෙස්සාමි.

**සා පච්ඡා අනන්තරායිකිනීති:** අසති අන්තරායෙ.

**නෙව වුට්ඨාපෙය්‍යාති:** න සයං වුට්ඨාපෙය්‍ය.

**න වුට්ඨාපනාය උස්සුක්කං කරෙය්‍යාති:** න අඤ්ඤං ආණාපෙය්‍ය නෙව වුට්ඨාපෙස්සාමි න වුට්ඨාපනාය උස්සුක්කං කරිස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** සති අන්තරායෙ පරියෙසිත්වා න ලභති, ගිලානාය උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

**අට්ඨමසික්ඛාපදං.**

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්‍ය්‍යා ථුල්ලනන්ද තොමෝ හික්මනුවකට ආර්යාවෙකි, ඉදින් තෙපි දෙවසක් මට උවැටන් කරන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා නොම උපසපන් කරවූ ද? උපසපන් කැරැවීම පිණිස වැයම් නො කළා" ද යි ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්‍ෂුණී තොමෝ හික්මනුවකට ආර්යාවෙනි, ඉදින් තෙපි දෙවසක් මට උවැටන් කරන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා නොමැ උපසපන් කරවා ද? උපසපන් කැරැවීම පිණිස වැයම් නො කෙරේ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්‍ෂුණී තොමෝ හික්මනුවකට ආර්යාවෙනි, ඉදින් තෙපි දෙවසක් මට උවැටන් කරන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැයි මෙසේ කියා නොමැ උපසපන් කරවූ ද? උපසපන් කැරැවීම පිණිස වැයම් නො කළා ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මෙහෙණෝ මේ සික‍පදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් තොමෝ හික්මනුවකට ආර්‍ය්‍යාවෙනි, ඉදින් තෙපි දෙවසක් මට උවැටන් කරන්නහු නම් මම තොප උපසපන් කරවන්නෙමැ යි මෙසේ කියා ඕ තොමෝ පසුවැ අනතුරක් නැත්තී නොමැ උපසපන් කරවා නම් උපසපන් කැරැවීම පිණිස වැයම් නො කෙරේ නම් පචිති වේ" ය යි.**

3. යා පන: යම්, යම්බඳු ... **භික්‍ෂුනී** ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**සික්‍ඛමානා** නම්: දෙවසක් සවැදැරුම් දහම්හි හික්මුණු සිථ ඇතියා යැ.

**සචෙ මෙ ත්‍වං අය්‍යෙ ද්‍වෙ වස්‍සානි අනුබන්‍ධිස්‍සසි:** දෙවසක් උවැටන් කරන්නෙහි නම්.

**එවාහන්‍තං වුට්‍ඨාපෙස්‍සාමි:** මෙසේ මම තොප උපසපන් කරන්නෙමි.

**සා පච්ඡා අනන්‍තරායිකිනී:** අනතුරක් නැති කල්හි.

**නෙව වුට්‍ඨාපෙය්‍ය:** තොමෝ නො මැ උපසපන් කරවයි.

**න වුට්‍ඨාපනාය උස්‍සුක්‍කං කරෙය්‍ය:** මෙරමාහට නො අණවයි. නොමැ උපසපන් කරවන්නෙමි උපසපන් කරවීමට වැයම් නො කරන්නෙමි යි ධුරනික්ෂෙපය කළ කෙණෙහි පචිති ඇවැත් වේ.

අනතුරක් ඇති කල්හි, සොයා නො ලබා නම් ඇවැත් නැත. ගිලන්වූවාට, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**අටවන සික‍පද යි.**

## 4. 8. 9

## නවමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකවස්සං සික්ඛමානං[1] වුට්ඨාපෙති. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකවස්සං සික්ඛමානං වුට්ඨාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකවස්සං සික්ඛමානං වුට්ඨාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකවස්සං සික්ඛමානං වුට්ඨාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකවස්සං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**පුරිසො** නාම: පත්තවීසතිවස්සො.

**කුමාරකො** නාම: අප්පත්තවීසතිවස්සො.

**සංසට්ඨා** නාම: අනනුලොමිකෙන කායිකවාචසිකෙන සංසට්ඨා.

**චණ්ඩී** නාම: කොධනා වුච්චති.

**සොකවස්සා** නාම: පරෙසං දුක්ඛං උප්පාදෙති සොකං ආවිසති.

**සික්ඛමානා** නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචා පරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අජානන්තී වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**නවමසික්ඛාපදං.**

---

1. සොකාවාසං මජ්ඣිමාලි· සික්ඛමානං, මජ්ඣං—සොකාවස්සං—සා.



Free Distribution www.aathaapi.org

# 4. 8. 9

## නවවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි – එසමයෙහි වනාහි ථුල්ලනන්දා භික්ෂුණී තොමෝ පිරිමිනියක්හු හා හැනීගිය කුමරුවන් හා හැනීගිය සැඩ වූ සෝ දනවන භික්මනුවක උපසපන් කරවයි. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්ය ථුල්ලනන්ද තොමෝ පිරිමිනියක්හු හා හැනීගිය කුමරුවන් හා හැනීගිය සැඩවූ සෝ දනවන භික්මනුවක උපසපන් කරවූ ද"යි... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පිරිමිනියක්හු හා හැනීගිය කුමරුවන් හා හැනීගිය සැඩ වූ සෝ දනවන භික්මනුවක උපසපන් කරවූ ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පිරිමිනියක්හු හා හැනීගිය කුමරුවන් හා හැනීගිය සැඩ වූ සෝ දනවන භික්මනුවක උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් පිරිමිනියක්හු හා හැනීගිය කුමරුවන් හා හැනීගිය සැඩවූ සෝ දනවන භික්මනුවක උපසපන්කරවා නම් පචිති වේ" යයි.**

2. යා පනා: යම්, යම්බඳු...භික්ෂුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පුරිස** නම්: පැමිණි විසිවස් ඇතියේ යැ.

**කුමාරක** නම්: නො පැමිණි විසිවය් ඇතියේ යැ.

**සංසට්ඨා** නම්: අනුලෝම් නො වූ කායික වාචසිකයෙන් මුසුවූවා යැ.

**චණ්ඩී** නම්: කිපෙනසුලු වූවා කියනු ලැබෙයි.

**සොකාවස්සා** නම්: මෙරමාහට දුක් උපදවයි, සෝ පිවිස්වයි.

**සික්ඛමානා** නම්: දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇතියා යැ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදතින් දුකුළා වෙති. කම් වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරට ද දුකුළා ඇවැත් වේ.

නො දන්නී උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**නවවන සිකපද යි.**



Free Distribution www.aathaapi.org

# 4. 8. 10

## දසමසික්ඛාපදං

සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී මාතාපිතූහිපි සාමිකෙනපි අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙති. මාතාපිතරොපි සාමිකොපි උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා අම්හෙහි අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙස්සතී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො මාතාපිතූනම්පි සාමිකස්සපි උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා මාතාපිතූහිපි සාමිකෙනපි අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී මාතාපිතූහිපි සාමිකෙනපි අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙතීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ථුල්ලනන්දා භික්ඛුනී මාතාපිතූහිපි සාමිකෙනපි අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී මාතාපිතූහි වා සාමිකෙන වා අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**මාතාපිතරො** නාම: ජනකා වුච්චන්ති.

**සාමිකො** නාම: යෙන පරිග්ගහිතා හොති.

**අනනුඤ්ඤාතාති**: අනාපුච්ඡා.

**සික්ඛමානා** නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**වුට්ඨාපෙය්‍යාති**: උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අජානන්තී වුට්ඨාපෙති, අපලොකෙත්වා වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දසමසික්ඛාපදං.**

## 4. 8. 10

## දසවන සිකපදය

1. ශ්‍රාවස්ති නිදාන යි - එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්‍ෂුණී තොමෝ දෙමාපියන් විසිනුදු හිමියා විසිනුදු නො අනුදත් සික්මනුවක උපසපන් කරවයි. දෙමාපියෝ ද හිමියා ද ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද තොමෝ අප විසින් නො අනුදත් සික්මනුව උපසපන් කරවූ ද''යි. භික්‍ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන දෙමාපියන්ගේ ද හිමියාගේ ද (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද තොමෝ දෙමාපියන් විසිනුදු හිමියා විසිනුදු නො අනුදත් සික්මනුව උපසපන් කරවූ''ද සී ... සැබෑද මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ දෙමාපියන් විසිනුදු හිමියා විසිනුදු නො අනුදත් සික්මනුව උපසපන් කරවා ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ දෙමා-පියන් විසිනුදු හිමියා විසිනුදු නො අනුදත් සික්මනුව උපසපන් කරවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් දෙමාපියන් විසින් හෝ හිමියා විසින් හෝ නො අනුදත් සික්මනුව උපසපන් කරවා නම් පචිති වේ''** යයි.

2. **යා පන:** යම්, යම්බඳු ... **භික්ඛුනී** ... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂුණී** යි.

**මාතාපිතරො** නම්: ජනකයෝ කියනු ලැබෙත්.

**සාමික** නම්: යමක්හු විසින් පරිගෘහීත වෙයි.

**අනනුඤ්ඤාතා:** නො පිළිවිසැ.

**සික්ඛමානා** නම්: දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිත් ඇතියා යැ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤප්තියෙන දුකුළා වෙයි. දෙකම් වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරට ද දුකුළා ඇවැත් වේ.

නො දන්නී උපසපන් කරවා නම්, පිළිවිසැ උපසපන් කරවා නම් ඇවැත් නැත, උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දසවන සිකපද යි.

# 4. 8. 11

## ඒකාදසමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී "සික්ඛමානං වුට්ඨාපෙස්සාමී"ති ථෙරෙ භික්ඛූ සන්නිපාතෙත්වා පහූතං ඛාදනීයං භොජනීයං පස්සිත්වා "න තාවාහං අය්‍යා සික්ඛමානං වුට්ඨාපෙස්සාමී"ති ථෙරෙ භික්ඛූ උය්‍යොජෙත්වා දෙවදත්තං කොකාලිකං කටමොරකතිස්සකං ඛණ්ඩදෙවියා පුත්තං සමුද්දදත්තං සන්නිපාතෙත්වා සික්ඛමානං වුට්ඨාපෙසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා ථුල්ලනන්දා පාරිවාසිකඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී පාරිවාසිකඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ථුල්ලනන්දා භික්ඛුනී පාරිවාසිකඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී පාරිවාසිකඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං **ඉමස්මිං** අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

3. **පාරිවාසිකඡන්දදානෙනාති:** වුට්ඨිතාය පරිසාය.

**සික්ඛමානා** නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අවුට්ඨිතාය පරිසාය වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඒකාදසමසික්ඛාපදං.



Free Distribution www.aathaapi.org

# 4. 8. 11

## එකොළොස්වන සිකපදය

1. එසමයෙහි වනාහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දකනිවාප නාම වේළුවන වෙහෙරෙහි වැඩවෙසෙති. එසමයෙහි වනාහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ භික්මනුවක උපසපන් කරවන්නෙමි යි ස්ථවිර භික්ෂූන් රැස් කරවා බොහෝ කෑ යුතු බිදිය යුතු දැ බලා "ආර්යාවෙනි, එතෙක් මම භික්මනුව උපසපන් නො කරවන්නෙමි"යි ස්ථවිර භික්ෂූන් නඟා යවා දෙවදත්ත යැ කොකාලිකයැ කටමොරකතිස්ස යැ ඛණ්ඩදෙවී පුත්‍ර යැ සමුද්දදත්ත යැ (යන මොවුන්) රැස් කරවා භික්මනුව උපසපන් කරවූ යැ. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආර්යා ථුල්ලනන්ද තොමෝ පිරිවෙස් සැද දීමෙන් භික්මනුව උපසපන් කරවූ ද"යි... සැබෑද, මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පිරිවෙස් සැද දීමෙන් භික්මනුව උපසපන් කරවූ ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පිරිවෙස් සැද දීමෙන් භික්මනුව උපසපන් කරවූ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් පිරිවෙස් සැද දීමෙන් සික්මනුවක උපසපන් කරවා නම් පචිති වේ" යයි.**

2. යා පන: යම්, යම්බඳු...භිකුනී...මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**පාරිවාසිකඡන්දදානෙන:** පිරිස නැගිටි කල්හි.

**සික්ඛමානා** නාම: දෙවසක් සවැදෑරුම් දහම්හි හික්මුණු සිඛ ඇතියා යැ.

**වුට්ඨාපෙය්‍ය:** උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම්වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහටද ඇජරට ද දුකුළා ඇවැත් වේ.

පිරිස නො නැගිටි කල්හි උපසපන් කරවා නම් ඇවැත් නැත, උම්මත්තිකාවට...ආදිකම්මිකාවට ඇවැත් නැති.

එකොළොස්වන සිකපද යි.

## 4. 8. 12

## ද්වාදසමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙන්ති, උපස්සයො න සම්මති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති[1] ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙස්සන්ති උපස්සයො න සම්මතී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙස්සන්ති"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අනුවස්සං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යා පනාති:** යා, යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අනුවස්සන්ති:** අනුසංවච්ඡරං.

**වුට්ඨාපෙය්‍යාති:** උපසම්පාදෙය්‍ය.

වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** එකන්තරිකං වුට්ඨාපෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**ද්වාදසමසික්ඛාපදං.**

---

1. මනුස්සා උජ්ඣායන්ති - මජසං.



Free Distribution www.aathaapi.org

# 4. 8. 12

## දෙළොස්වන සිකපදය

1. ශ්‍රාවස්ති නිදන යි – එසමයෙහි චනාහි මෙහෙණෝ වසක් පාසා උපසපන් කරවත්. මෙහෙණවර නො පොහෝනේ වෙයි. විහාරචාරිකායෙහි හැසිරෙන මිනිස්සු දැක ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ වසක් පාසා උපසපන් කරවූහු ද, මෙහෙණවර නො පොහෝනේ"යි. භික්ෂුණීහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ වසක් පාසා උපසපන් කරවූහුදැ"යි ... සැබෑද මහණෙනි, මෙහෙණෝ වසක් පාසා උපසපන් කරවත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ වසක් පාසා උපසපන් කරවූහු ද. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසන්වා:

"යම් මෙහෙණක් වසක් පාසා උපසපන් කරවා නම් පචිති වේ" යයි.

3. යා පන: යම්, යම්බඳු ... භිකුනී ... මෝ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි

අනුවසසං: වසක් පාසා.

වුට්ඨාපෙයා: උපසපන් කරවයි.

උපසපන් කරවන්නෙමි යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඥප්තියෙන් දුකුළා වෙයි. දෙකම්වදනින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරට ද දුකුළා ඇවැත් වේ.

එක්වසක් අතර තබා උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

දෙළොස්වන සිකපද යි.



Free Distribution www.aathaapi.org

## 4. 8. 13

### තෙරසමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන භික්ඛුනියො එකං වස්සං ද්වෙ වුට්ඨාපෙන්ති. උපස්සයො තථෙව න සම්මති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා තථෙව උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම භික්ඛුනියො එකං වස්සං ද්වෙ වුට්ඨාපෙස්සන්ති උපස්සයො තථෙව න සම්මතී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛුනියො එකං වස්සං ද්වෙ වුට්ඨාපෙන්තී"ති. සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො එකං වස්සං ද්වෙ වුට්ඨාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො එකං වස්සං ද්වෙ වුට්ඨාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී එකං වස්සං ද්වෙ වුට්ඨාපෙය්‍ය පාචිත්තිය"න්ති.**

**යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති; -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**එකං වස්සන්ති:** එකං සංවච්ඡරං.

**ද්වෙ වුට්ඨාපෙය්‍යාති** : ද්වෙ උපසම්පාදෙය්‍ය.

ද්වෙ වුට්ඨාපෙස්සාමීති ගණං වා ආචරිනිං වා පත්තං වා චීවරං වා පරියෙසති, සීමං වා සම්මන්නති, ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායාය ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරිනියා ච ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** එකං වුට්ඨාපෙති, උම්මත්තිකාය එකං වස්සං -පෙ- ආදිකම්මිකායාති.

තෙරසමසික්ඛාපදං.

### කුමාරිභූතවග්ගො අට්ඨමො.

**තස්සුද්දානං:**

කුමාරි ද්වෙ ච සඞ්ඝෙන ද්වාදසා සම්මතෙන ච
අලං චීවර ද්වෙ වස්සං සංසට්ඨා සාමිකෙන ච
පාරිවාසිකානුවස්සං දුවෙ වුට්ඨාපනෙන වා'ති.



Free Distribution www.aathaapi.org

# 4. 8. 13

## තෙලෙස්වන සික‍පදය

1. ශ්‍රාවස්ති නිදාන යි— එ සමයෙහි චන්‍ඩ‍කාලි මෙහෙණෝ එක්වසැ දෙදෙනකුන් උපසපන් කරවත්. මෙහෙණවර එසේම නො පොහොනේ වෙයි. විහාරචාරිකායෙහි හැසිරෙන මිනිස්සු දැක එසේ මැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් මෙහෙණෝ එක්වසැ දෙදෙනකුන් උපසපන් කරවූහු ද? මෙහෙණවර එසේ මැ නො පොහොනේ යැ යි. භික්ෂුණිහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවෝ ...... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණෝ එක්වසැ දෙදෙනකුන් උපසපන් කරවූහු ද''යි......සැබෑ ද මහණෙනි, මෙහෙණෝ එක්වසැ දෙදෙනකුන් උපසපන් කරවත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණෝ එක්වසැ දෙදෙනකුන් උපසපන් කරවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් එක්වසැ දෙදෙනකුන් උපසපන් කරවා නම් පචිති වේ" යයි.**

**යා පන**: යම්, යම්බඳු...... **භික්ඛුනී**......... මේ තොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

**එකං වස්සං**: එක්වසැ.

**ද්වෙ වුට්ඨාපෙය්‍ය**: දෙදෙනකුන් උපසපන් කරවයි.

දෙදෙනකුන් උපසපන් කරවන්නෙමැ යි ගණයා හෝ ඇජරක හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඥප්තියෙන් දුකුළා වෙයි. දෙකම්-වදතින් දුකුළා වෙති. කම්වදන් පිරියතැ උවදැ මෙහෙණට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරට ද දුකුළා ඇවැත් වේ.

එක්වසැ එකක උපසපන් කරවා නම් ඇවැත් නැත. උම්මත්තිකා-වට... ආදිකම්මිකාවට ඇවැත් නැති.

තෙලෙස්වන සිකපද යි.

## අට වැනි කුමාරීභූතවර්ග යි.

**එහි උද්දානය:**

කුමාරීභූත දෙසිනි යැ සඞ්ඝසම්මත යැ ඌනද්වාදසවස්ස යැ අසම්මත යැ අලංකාව යැ චීවර යැ ද්වෙවස්ස යැ සංසට්ඨ යැ (වර්ගය වේ.) සාමිකය සමඟ පාරිවාසික යැ අනුවස්ස යැ ද්වෙවුට්ඨාපනසික්ඛයෙන් ද යි



Free Distribution www.aathaapi.org

## 4. 9. 1

### පඨමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො ඡත්තුපාහනං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ඡත්තුපාහනං ධාරෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො ඡත්තුපාහනං ධාරෙස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො ඡත්තුපාහනං ධාරෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො ඡත්තුපාහනං ධාරෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

"යා පන භික්ඛුනී ඡත්තුපාහනං ධාරෙය්‍ය පාචිත්තිය"න්ති.

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ගිලානා හොති. තස්සා විනා ඡත්තුපාහනං[1] න ඵාසු හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ ගිලානාය භික්ඛුනියා, ඡත්තුපාහනං" එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

"යා පන භික්ඛුනී අගිලානා ඡත්තුපාහනං ධාරෙය්‍ය පාචිත්තිය"න්ති.

**යා පනාති:** යා, යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති:

**අගිලානා** නාම: යස්සා විනා ඡත්තුපාහනා ඵාසු හොති.

**ගිලානා** නාම: යස්සා විනා ඡත්තුපාහනා න ඵාසු හොති.

**ඡත්තං** නාම: තීණි ඡත්තානි සෙතච්ඡත්තං කිලඤ්ජච්ඡත්තං පණ්ණච්ඡත්තං මණ්ඩලබද්ධං සලාකාබද්ධං.

**ධාරෙය්‍යාති:** සකිම්පි ධාරෙති ආපත්ති පාචිත්තියස්ස.

---

1. ඡත්තුපාහනං-මජසං, සී



Free Distribution www.aathaapi.org

# 4. 9. 1

## පළමුවැනි සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මෙහෙණහු ඡත්‍ර හා වහන් ධරති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් ඡත්‍ර හා වහන් ධැරුහු දූ''යි. මෙහෙණහු ඒ ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන මිනිසුන්ගේ බස් ඇසූහ. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පෙච්ඡ වූවාහු ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් ඡත්‍ර හා වහන් ධැරුහු දූ''යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙණහු ඡත්‍ර හා වහන් ධරත් ලැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගර්හා කළහ ... මහණෙනි, ''කෙසේ නම් සවග මෙහෙණහු ඡත්‍ර හා වහන් ධැරුහු දූ''යි. මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක ඡත්‍ර හා වහන් ධරා නම් පචිති වේ''යයි.**

භාග්‍යවතුන් විසින් මෙසේත් මේ සිකපදය මෙහෙණන්ට පනවන ලද්දේ වෙයි.

2. එසමයෙහි එක්තරා මෙහෙණක් ගිලන් වූවා වෙයි. ඇයට ඡත්‍ර හා වහන් නැති වැ පහසු නො වෙයි. භාග්‍යවතුන්ට මෙකරුණ දන්වූහ ... ''මහණෙනි, ගිලන් මෙහෙණට ඡත්‍ර හා වහන් අනුදනිමි''. මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ සිකපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් නො ගිලන්වැ ඡත්‍ර හා වහන් ධරා නම් පචිති වේ'' යයි.**

3. යාපන යනු: යම්, යම් බඳු ... භික්ඛුනී යනු ... මෝ මෙ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂුණී යි.

අගිලානා නම්: යමකට ඡත්‍ර හා වහන් නැති වැ පහසු වේ ද ඕ තොමෝ ය.
ගිලානා නම්: යමකට ඡත්‍ර හා වහන් නැති වැ පහසු නො වේ ද ඕ තොමෝ ය.

ඡත්ත නම්: මඩු බැඳි ලහබැඳි සේසත යැ, කළාල්සත යැ, පත්සත යැ යි ඡත්‍ර තුනෙකි.

ධාරෙය්‍ය යනු: වරකුදු ධරා නම් පචිති ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

අගිලානා අගිලානසඤ්ඤා ඡත්තුපාහනං ධාරෙති ආපත්ති පාචිත්තියස්ස. අගිලානා වෙමතිකා ඡත්තුපාහනං ධාරෙති ආපත්ති පාචිත්තියස්ස. අගිලානා ගිලානසඤ්ඤා ඡත්තුපාහනං ධාරෙති ආපත්ති පාචිත්තියස්ස.

ඡත්තං ධාරෙති න උපාහනං ආපත්ති දුක්කටස්ස, උපාහනං ධාරෙති න ඡත්තං ආපත්ති දුක්කටස්ස. ගිලානා අගිලානසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ගිලානා වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ගිලානා ගිලානසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති**: ගිලානාය ආරාමෙ ආරාමූපචාරෙ ධාරෙති ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**පඨමසික්ඛාපදං.**

## 4. 9. 2

## දුතියසික්ඛාපදං

1. සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො යානෙන යායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො යානෙන යායිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො යානෙන යායිස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො යානෙන යායන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො යානෙන යායිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී යානෙන යායෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ගිලානා හොති න සක්කොති පදසා ගන්තුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "අනුජානාමි භික්ඛවෙ ගිලානාය භික්ඛුනියා යානං" එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අගිලානා යානෙන යායෙය්‍ය පාචිත්තිය"න්ති.**



Free Distribution www.aathaapi.org

නො ගිලන් වූවා නො ගිලන් සත් ඇති වැ ඡත්‍ර හා වහන් ධරා නම් පචිති ඇවැත් වෙයි. නො ගිලන් වූවා විමති ඇති වැ ඡත්‍ර හා වහන් ධරා නම් පචිති ඇවැත් වෙයි. නො ගිලන් වූවා ගිලන් සත් ඇති වැ ඡත්‍ර හා වහන් ධරා නම් පචිති ඇවැත් වෙයි.

ඡත්‍ර ධරා නම් වහන් නො ධරා නම් දුකුළා ඇවැත් වෙයි. වහන් ධරා නම් ඡත්‍ර නො ධරා නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූවා නො ගිලන් සත් ඇත්තී දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූවා විමති ඇත්තී දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූවා ගිලන් සත් ඇත්තී ඇවැත් නැති.

**අනාපත්ති:** ගිලන් වූවාට ද ආරාමයෙහි ආරාමූපචාරයෙහි ධරා නම් ඇයට ද ආපදයෙහි ද උම්මත්තිකාවට ද ... ආදිකම්මිකාවට ද ඇවැත් නැති.

**පළමු වැනි ශික්ෂාපද යි.**

## 4. 9. 2

## දෙවැනි ශික්ෂාපදය

1. සැවැත් නිදන යි – එසමයෙහි ඡබ්බග මෙහෙණහු යානයෙන් යෙති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් යානයෙන් ගියාහු ද''යි. මෙහෙණහු ඒ ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන මිනිසුන්ගේ බස් ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස් වූවාහු ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ඡබ්බග මෙහෙණහු යානයෙන් ගියාහු ද''යි ... සැබෑ ද මහණෙනි, ඡබ්බග මෙහෙණහු යානයෙන් යෙත් ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහූ ... මහණෙනි, කෙසේ නම් ඡබ්බග මෙහෙණහු යානයෙන් ගියාහු ද? මහණෙනි, කෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ ... මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් යානයෙන් යේ නම් පචිති ඇවැත් වේ''යයි.**

භාග්‍යවතුන් විසින් මෙසේත් මේ ශික්ෂාපදය මෙහෙණන්ට පනවන ලද වෙයි.

2. එසමයෙහි එක්තරා මෙහෙණක් ගිලන් වූවා වෙයි. පයින් යන්නට නො හැකි වෙයි. භාග්‍යවතුන්ට මෙකරුණ දන්වූහ ... මහණෙනි, ගිලන් මෙහෙණට යානය අනුදනිමි. මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් නො ගිලන් වැ යානයෙන් යේ නම් පචිති ඇවැත් වේ''යයි.**

3. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා' භික්ඛුනීති.

**අගිලානා** නාම: සක්කොති පදසා ගන්තුං.

**ගිලානා** නාම: න සක්කොති පදසා ගන්තුං.

**යානං** නාම: වය්හං රථො සකටං සන්දමානිකා සිවිකා පාටඞ්කී.

**යානෙනයායෙයාති:** සකිම්පි යානෙන යායති ආපත්ති පාචිත්තියස්ස.

අගිලානා අගිලානසඤ්ඤා යානෙන යායති ආපත්ති පාචිත්ති-යස්ස. අගිලානා වෙමතිකා යානෙන යායති ආපත්ති පාචිත්තියස්ස. අගිලානා ගිලානසඤ්ඤා යානෙන යායති ආපත්ති පාචිත්තියස්ස. ගිලානා අගිලානසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ගිලානා වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ගිලානා ගිලානසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**දුතියසික්ඛාපදං.**

## 4. 9. 3

## තතියසික්ඛාපදං

1. **සාවත්ථි** නිදානං - තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී අඤ්ඤතරිස්සා ඉත්ථියා කුලූපිකා හොති. අථ ඛො සා ඉත්ථී තං භික්ඛුනිං එතදවොච. "හන්දය්යෙ ඉමං සඞ්ඝාණිං අමුකාය නාම ඉත්ථියා දෙහී"ති. අථ ඛො සා භික්ඛුනී සචාහං පත්තෙන ආදාය ගමිස්සාමි[1] විස්සරො මෙ භවිස්සතීති පටිමුඤ්චිත්වා අගමාසි. තස්සා රථියාය[2] සුත්තකෙ ඡින්නෙ විප්පකිරියිංසු. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො සඞ්ඝාණිං ධාරෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති.* සා භික්ඛුනී තෙහි මනුස්සෙහි උප්පණ්ඩියමානා මඞ්කු අහොසි. අථ ඛො සා භික්ඛුනී උපස්සයං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනී සඞ්ඝාණිං ධාරෙස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනී සඞ්ඝාණිං ධාරෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනී සඞ්ඝාණිං ධාරෙස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී සඞ්ඝාණිං ධාරෙය්‍ය පාචිත්තිය"න්ති.**

---

1. ගච්ඡාමි — මජසං
2. රථිකාය — මජසං
* අයෙහාසුං ඛො භික්ඛුනියොත්‍යාදිපාඨොත්‍ර සංදිස්සතෙ මරම්මඡට්ඨසඞ්ගීති පිටකෙ



Free Distribution www.aathaapi.org

3. යා පන යනු: යම්, යම් බඳු ... භික්ඛුනී යනු: ... මෝ මෙ අර්ථයෙහි අභිප්‍රේත භික්ෂුණී යි.

අගිලාන නම්: පයින් යන්නට හැකි වෙයි.

ගිලාන නම්: පයින් යන්නට නොහැකි වෙයි.

යාන නම්: වය්‍ය යැ රථ යැ ශකට යැ ස්‍යන්දමානිකා යැ සිවිකා යැ පාටඞ්කා යි.

යායෙයාය යනු: වරකුදු යානයෙන් යේ නම් පචිති ඇවැත් වේ.

නො ගිලන් වූවා නොගිලන් සන් ඇති වැ යානයෙන් යේ නම් පචිති ඇවැත් වෙයි. නො ගිලන් වූවා විමති ඇති වැ යානයෙන් යේ නම් පචිති ඇවැත් වෙයි. නොගිලන් වූවා ගිලන්සන් ඇති වැ යේ නම් පචිති ඇවැත් වෙයි. ගිලන් වූවා නොගිලන් සන් ඇති වැ යේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූවා විමති ඇති වැ යේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූවා ගිලන් සන් ඇති වැ යේ නම් ඇවැත් නැති.

අනාපත්ති: ගිලන් වූවාට ද ආපදයෙහි ද උමතු වූවාට ද ... ආදිකම්මික වූවාට ද ඇවැත් නැති.

දෙවැනි ශික්ෂාපද යි.

## 4. 9. 3

## තුන්වැනි ශික්ෂාපදය

1. සැවැත් නිදන යි – එසමයෙහි එක්තරා මෙහෙණක් එක්තරා ස්ත්‍රියකට කුලුපග වෙයි. එසඳ ඒ ස්ත්‍රී ඒ මෙහෙණට තෙල කරුණ කීව: ''ඉඳ ආයර්‍යාවෙනි, මේ සඞ්ඝාණිය (කටි පලඳනාව) අසුවල් ස්ත්‍රියට දෙව''යි එසඳ ඒ මෙහෙණ ඉදින් මම පාත්‍රයෙන් ගෙන යන්නෙම් නම් මට නො සිහි වන්නේ යයි පැළඳගෙන ගියා යැ. වීථියෙහි දී එහි හුය සිඳුණු කල්හි බිමි විසිරිණ. මිනිස්සු ලමු කොට සිනහි නුගුණ පවසති දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් සඞ්ඝාණිය ධැරූහු ද''යි. ඒ මෙහෙණ ඒ මිනිසුන් විසින් කෙළිකවට කරනු ලබන්නී මකු වූයැ. ඉක්බිති ඒ මෙහෙණ මෙහෙණවරට ගොස් මෙහෙණන්ට තෙල කරුණ දන්වූ යැ. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පේච්ඡ වූවාහු ... ඔහු ලමු කොට සිනහි නුගුණ පවසති දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණක් සඞ්ඝාණිය දරූ ද''යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණක් සඞ්ඝාණිය දරූ ලැ'යි. සැබෑ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගර්හා කළහ ... මහණෙනි, කෙසේ නම් මෙහෙණක් සඞ්ඝාණිය දරූ ද? මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ ...මහණෙනි මෙහෙණහු, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

''යම් මෙහෙණක් සඞ්ඝාණිය ධරා නම් පචිති ඇවැත් වේ'' යයි.



Free Distribution www.aathaapi.org

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සඞ්ඝාණි** නාම: යා කාචි කටූපිකා.

ධාරෙය්‍යාති: සකිම්පි ධාරෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ආබාධපච්චයා, කටිසුත්තකං ධාරෙති, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**තතියසික්ඛාපදං.**

## 4. 9. 4

## චතුත්ථසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො ඉත්ථාලඞ්කාරං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ඉත්ථාලඞ්කාරං ධාරෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො ඉත්ථාලඞ්කාරං ධාරෙස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො ඉත්ථාලඞ්කාරං ධාරෙස්සන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො ඉත්ථාලඞ්කාරං ධාරෙස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ඉත්ථාලංකාරං ධාරෙය්‍ය පාචිත්තිය"න්ති.**

**යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ඉත්ථාලංකාරො** නාම: සීසූපගො ගීවූපගො හත්ථූපගො පාදූපගො කටූපගො.

ධාරෙය්‍යාති: සකිම්පි ධාරෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ආබාධපච්චයා උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**චතුත්ථසික්ඛාපදං**



Free Distribution www.aathaapi.org

2. යා පන යනු: යම්, යම් බඳු ... භික්ඛුනී යනු ... මේ මේ අර්ත්ථයෙහි අභිප්‍රෙත භික්ඛුනී යි.

**සඞ්ඝාණි** නම්: යම් කිසි කටි පලඳනාවකි.

**ධාරෙති** යනු: වරකුදු ධරා නම් පචිති ඇවැත් වේ.

**අනාපත්ති**: ආබාධ හෙතුයෙන් කටිසූත්‍ර ධරා නම් ඇවැත් නැත. උමතුවූවාට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**තුන්වැනි ශික්ෂාපද යි.**

## 4. 9. 4

## සතරවැනි ශික්ෂාපදය

1 සැවැත් නිදන යි – එසමයෙහි සවග මෙහෙණහු ස්ත්‍රී අලඞ්කාර ධරති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් ස්ත්‍රී අලංකාර දරුහු ද''යි. මෙහෙණහු ඒ ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන මිනිසුන්ගේ බස් ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පේච්ඡ වූවාහු... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණහු ස්ත්‍රී අලංකාර දරුහු ද''යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙණහු ස්ත්‍රී අලංකාර දරත්ලැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. බුදුහු ගැරූහු ... මහණෙනි, කෙසේ නම් සවග මෙහෙණහු ස්ත්‍රීඅලංකාර දරුහු ද? මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි .. මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා.

**''යම් මෙහෙණක් ස්ත්‍රී අලංකාර දරා නම් පචිති ඇවැත් වේ''යි.**

2. යා පන යනු: යම් යම් බඳු ... භික්ඛුනී යනු ... මෝ මේ අර්ත්ථයෙහි අභිප්‍රෙත භික්ඛුනී යි.

**ඉත්ථාලඞ්කාර** නම්: හිසැ පළඳනා යැ, ගෙල පළඳනා යැ, අත්පළඳනා යැ, පා පළඳනා යැ, කටි පළඳනා යි.

**ධාරෙය්‍ය** යනු: වරකුදු දරා නම් පචිති ඇවැත් වේ.

**අනාපත්ති**: ආබාධ හෙතුයෙන් ඇවැත් නැති. උම්මත්තිකාවට ... ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සතර වැනි ශික්ෂාපද යි.**

## 4. 9. 5

## පඤ්චම සික්ඛාපදං

1. සාවත්ථි නිදානං – තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො ගන්ධවණ්ණකෙන නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ගන්ධවණ්ණකෙන නහායිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො ගන්ධවණ්ණකෙන නහායිස්සන්ති"ති. –පෙ– සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො ගන්ධවණ්ණකෙන නහායන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. –පෙ– කථං හි නාම භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො ගන්ධවණ්ණකෙන නහායිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී ගන්ධවණ්ණකෙන නහායෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**ගන්ධො** නාම: යො කොචි ගන්ධො.

**වණ්ණකං** නාම: යං කිඤ්චි වණ්ණකං.

**නහායෙය්‍යාති:** නහායති. පයොගෙ දුක්කටං, නහානපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ආබාධපච්චයා උම්මත්තිකාය –පෙ– ආදිකම්මිකායාති.

පඤ්චමසික්ඛාපදං.

## 4. 9. 6

## ඡට්ඨසික්ඛාපදං

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤාකෙන නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤාකෙන නහායිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤාකෙන නහායිස්සන්ති"ති –පෙ– සච්චං කිර භික්ඛවෙ· ඡබ්බග්ගියා භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤාකෙන නහායන්තීති. සච්චං



Free Distribution www.aathaapi.org

## 4. 9. 5

## පස්වැනි ශික්ෂාපදය

1. සැවැත් නිදන යි – එසමයෙහි සවග මෙහෙණහු සුවඳින් හා පැහැගන්වන දූයින් යුතු වැ ස්නාන කෙරෙති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් ගන්ධවර්ණකයෙන් ස්නාන කළාහු ද''යි. මෙහෙණහු ඒ ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන මිනිසුන්ගේ බස් ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පේච්ඡ වූවාහු ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණහු ගන්ධවර්ණකයෙන් ස්නාන කළාහු ද''යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙණහු ගන්ධවර්ණකයෙන් ස්නාන කෙරෙත් ලැ''යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහූ ... ''කෙසේ නම් මහණෙනි, සවග මෙහෙණහු ගන්ධවර්ණකයෙන් ස්නාන කළාහු ද? මහණෙනි, නෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් ගන්ධවර්ණකයෙන් ස්නාන කෙරේ නම් පචිති ඇවැත් වේ''යයි.**

2. **යා පන** යනු: යම්, යම් බඳු ... **භික්ඛුනී** යනු ... මේ මේ අර්ත්ථයෙහි අභිප්‍රෙත භික්ෂුනී යි.

**ගන්ධ** නම්: යම් කිසි ගඳෙකි.

**වණ්ණක** නම්: යම් කිසි වර්ණයෙකි.

**නහායෙය්‍ය** යනු: ස්නාන කෙරෙයි. ප්‍රයොගයෙහි දුකුළා ඇවැත් වෙයි. ස්නාන කෙළවර පචිති ඇවැත් වේ.

**අනාපත්ති:** ආබාධ හෙතුයෙන් ඇවැත් නැත. උමතු වූවාට ... ආදිකම්මික වූවාට ඇවැත් නැති.

**පස්වැනි ශික්ෂාපද යි.**

## 4. 9. 6

## සවැනි ශික්ෂාපදය

1. සැවැත් නිදන යි – එසමයෙහි සවග මෙහෙණහු සුවඳ කැවූ තල මුරුවටයෙන් ස්නාන කෙරෙති. මිනිස්සු අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහීකාමභෝගිනීන් මෙන් සුවඳ කැවූ තලමුරුවටයෙන් ස්නාන කළාහු ද''යි. මෙහෙණහු අවමන් කොට සිතන නුගුණ කියන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පේච්ඡ වූවාහු ... ඔහු අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණහු සුවඳ කැවූ තලමුරුවටයෙන් ස්නාන කළාහු ද''යි ... සැබෑ ද මහණෙනි, සවග මෙහෙණහු සුවඳකැවූ තලමුරුවටයෙන් ස්නාන කෙරෙත් ලැයි. සැබැවැ



Free Distribution www.aathaapi.org

භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤාකෙන නහායිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී වාසිතකෙන පිඤ්ඤාකෙන නහායෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති**: යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**වාසිතකං** නාම: යං කිංචි ගන්ධවාසිතකං.

**පිඤ්ඤාකං** නාම: තිලපිට්ඨං වුච්චති.

**නහායෙය්‍යාති**: නහායති. පයොගෙ දුක්කටං, නහානපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති**: ආබාධපච්චයා පකතිපිඤ්ඤාකෙන නහායති උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

ඡට්ඨසික්ඛාපදං.

## 4. 9. 7

## සත්තමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භික්ඛුනියා උම්මද්දපෙන්තිපි පරිමද්දපෙන්තිපි. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො භික්ඛුනියා උම්මද්දපෙස්සන්තිපි පරිමද්දපෙස්සන්තිපි සෙය්‍යථාපි ගිහීකාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො භික්ඛුනියා උම්මද්දපෙස්සන්ති පි පරිමද්දපෙස්සන්ති පී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො භික්ඛුනියා උම්මද්දපෙන්ති පි පරිමද්දපෙන්ති පීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො භික්ඛුනියා උම්මද්දපෙස්සන්ති පි පරිමද්දපෙස්සන්ති පි. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී භික්ඛුනියා උම්මද්දපෙය්‍ය වා පරිමද්දපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**



Free Distribution www.aathaapi.org

භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහූ ... මහණෙනි, කෙසේ නම් සවග මෙහෙණහු සුවඳ කැවූ තලමුරුවටයෙන් ස්නාන කළාහු ද? මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි. ... මහණෙනි, මෙමෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් සුවඳ කැවූ තලමුරුවටයෙන් ස්නාන කෙරේ නම් පචිති ඇවැත් වේ"යයි.**

2. **යා පන** යනු: යම්, යම් බඳු ... **භික්ඛුනී** යනු ... මේ මේ අර්ත්ථයෙහි අභිප්‍රෙත **භික්ඛුනී** යි.

**වාසිතක** නම්: යම් කිසි සුවඳකවන ලද්දකි.

**පිඤ්ඤාක** නම්: තලපිටි යයි කියනු ලැබේ.

**නහායෙය්‍ය** යනු: ස්නාන කෙරෙයි. ප්‍රයොගයෙහි දුකුළා ඇවැත් වෙයි. ස්නාන කෙළවර පචිති ඇවැත් වේ.

**අනාපත්ති:** ආබාධ හෙතුයෙන් ඇවැත් නැත. පියවි මුරුවටයෙන් ස්නාන කෙරේ ද, උම්මත්තිකාවට .. ආදිකම්මිකාවට ඇවැත් නැති.

**සවැනි ශික්ෂාපද යි.**

## 4. 9. 7

## සත්වැනි ශික්ෂාපදය

සැවැත් නිදන යි- එසමයෙහි මෙමෙහෙණහු මෙහෙණක ලවා ඇඟඉලීම ද කරවති, සම්බාහන ද කරවත්. මිනිස්සු විහාරචාරිකා කරන්නාහු දැක අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙමෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් මෙමෙහෙණක ලවා ඇඟ ඉලීම ද සම්බාහන ද කරවූහුදැ යි. මෙමෙහෙණහු අවමන් කොට සිතන නුගුණ කියන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහු. යම් ඒ මෙමෙහෙණ කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔහු අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙමෙහෙණහු මෙමෙහෙණක ලවා ඇඟ ඉලීම ද සම්බාහන ද කරවූහු දැ"යි ... සැබෑ ද මහණෙනි, මෙමෙහෙණහු මෙමෙහෙණක ලවා ඇඟ ඉලීම ද සම්බාහන ද කරවත් ලැ"යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහූ ... කෙසේ නම් මහණෙනි, මෙමෙහෙණහු මෙමෙහෙණක ලවා ඇඟ ඉලීම ද සම්බාහන ද කරවූහු දැ යි. මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මහණෙනි, මෙමෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් මෙමෙහෙණක ලවා ඇඟ ඉලීම කරවන්නී නම් හෝ සම්බාහන කරවන්නී නම් හෝ පචිති ඇවැත් වේ"යයි.**



Free Distribution www.aathaapi.org

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුනියාති:** අඤ්ඤිස්සා භික්ඛුනියා.

**උම්මද්දපෙය්‍ය වා ති:** උබ්බට්ටාපෙති[1] ආපත්ති පාචිත්තියස්ස.

**පරිමද්දපෙය්‍ය වා ති:** සම්බාහාපෙති ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ගිලානාය, ආපදාසු, උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

සත්තමසික්ඛාපදං.

## 4. 9. 8 – 10

## අට්ඨම-නවම-දසමසික්ඛාපදං

1. සාවත්ථි නිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො සික්ඛමානාය උම්මද්දපෙන්තිපි පරිමද්දපෙන්තිපි -පෙ- සාමණෙරාය උම්මද්දපෙන්තිපි පරිමද්දපෙන්තිපි. -පෙ- ගිහිනියා උම්මද්දපෙන්තිපි පරිමද්දපෙන්තිපි. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ගිහිනියා උම්මද්දපෙස්සන්තිපි පරිමද්දපෙස්සන්තිපි සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො ගිහිනියා උම්මද්දපෙස්සන්තිපි, පරිමද්දපෙස්සන්තිපී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො ගිහිනියා උම්මද්දපෙන්තිපි පරිමද්දපෙන්තිපීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො ගිහිනියා උම්මද්දපෙන්තිපි පරිමද්දපෙන්තිපි. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී සික්ඛමානාය -පෙ- සාමණෙරාය -පෙ- ගිහිනියා උම්මද්දපෙය්‍ය වා පරිමද්දපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා, යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**සික්ඛමානා** නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**සාමණෙරා** නාම: දසසික්ඛාපදිකා.

**ගිහිනී** නාම: අගාරිනී වුච්චති.

---

1. උම්මද්දපෙති, මජ්ඣං· HO,

2. **යා පන** යනු: යම්, යම් බඳු ... **භික්ඛුනී** යනු ... මෝ මේ අර්ත්ථයෙහි අභිප්‍රෙත භික්ෂුණී යි.

**භික්ඛුනියා** යනු: අන් මෙහෙණක ලවා.

**උම්මද්දාපෙය්‍ය වා** යනු: ඇඟ උළවා නම් පචිති ඇවැත් වෙයි.

**පරිමද්දපෙය්‍ය වා** යනු: සම්බාහන කරවා නම් පචිති ඇවැත් වේ.

**අනාපත්ති:** ගිලන් වූවාට ද ආපදයෙහි ද උමතු වූවාට ද ... ආදිකම්මික වූවාට ද ඇවැත් නැති.

**සත්වැනි ශික්ෂාපද යි.**

## 4. 9. 8–10

## අට-නව-දසවැනි ශික්ෂාපද

1. සැවැත් නිදන යි – එසමයෙහි මෙහෙණහු ශික්ෂමාණාවක ලවා ඇඟ ඉළීම ද කරවති. සම්බාහන ද කරවත් ... හෙරණියක ලවා ඇඟ ඉළීම ද කරවති. සම්බාහන ද කරවත් ... ගෘහිණියක ලවා ඇඟ ඉළීම ද කරවති. සම්බාහන ද කරවත්. මිනිස්සු විහාරචාරිකා කරන්නාහු දැක අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහීකාමභොගිනීන් මෙන් ගෘහිණියක ලවා ඇඟ ඉළීම ද සම්බාහන ද කරවූහු දැ''යි. මෙහෙණහු අවමන් කොට සිතන නුගුණ කියන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පෙච්ඡ වූවාහු ... ඔහු අවමන් කොට සිතති, නුගුණ කියති. දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු ගිහී කාමභොගිනීන් මෙන් ගෘහිණියක ලවා ඇඟ ඉළීම ද සම්බාහන ද කරවූහු දැ''යි ... ''සැබෑ ද මහණෙනි, මෙහෙණහු ගෘහිණියක ලවා ඇඟ ඉළීමද සම්බාහන ද කරවත් ලැ''යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරැහූ ... කෙසේ නම් මහණෙනි, මෙහෙණහු ගෘහිණිය ලවා ඇඟ ඉළීම ද සම්බාහන ද කරවූහු ද? මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් ශික්ෂමාණාවක ... හෙරණියක ... ගෘහිණියක ලවා ඇඟ ඉළීම කරවන්නී නම් හෝ සම්බාහන කරවන්නී නම් හෝ පචිති ඇවැත් වේ''යයි.**

2. **යා පන** යනු: යම්, යම්බඳු...**භික්ඛුනී** යනු...මෝ මේ අර්ත්ථයෙහි අභිප්‍රෙත භික්ඛුනී යි.

**සික්ඛමානා** නම්: දැවුරුද්දක් සවැදෑරුම් ධර්මයෙහි හික්මුණු ශික්ෂා ඇත්තී.

**සාමණෙරා** නම්: දශ ශික්ෂාපද ඇත්තී.

**ගිහිනී** නම්: ගෘහිණී කියනු ලැබේ.



Free Distribution www.aathaapi.org

**උම්මද්දාපෙය්‍ය වාති:** උබ්බට්ටාපෙති, ආපත්ති පාචිත්තියස්ස.

**පරිමද්දාපෙය්‍ය වාති:** සම්බාහාපෙති, ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** ගිලානාය ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**අට්ඨම නවම දසම සික්ඛාපදානි.**

## 4. 9. 11

## එකාදසමසික්ඛාපදං

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදන්ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදිස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනියො භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනියො භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**''යා පන භික්ඛුනී භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදෙය්‍ය පාචිත්තිය''න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**භික්ඛුස්ස පුරතොති:** උපසම්පන්නස්ස පුරතො.

**අනාපුච්ඡාති:** අනපලොකෙත්වා.

**ආසනෙ නිසීදෙය්‍යාති:** අන්තමසො ඡමායපි නිසීදති, ආපත්ති පාචිත්තියස්ස.

අනාපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා ආසනෙ නිසීදති, ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ වෙමතිකා ආසනෙ නිසීදති, ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා ආසනෙ නිසීදති, ආපත්ති පාචිත්තියස්ස.

ආපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා, ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ආපුච්ඡා ආසනෙ නිසීදති, ගිලානාය, ආපදාසු උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

**එකාදසමසික්ඛාපදං**



Free Distribution www.aathaapi.org

**උම්මද්දපෙය්‍ය වා** යනු: ඇඟ ඉළීම කරවානම් පචිති ඇවැත් වෙයි.

**පරිමද්දාපෙය්‍ය වා** යනු: සම්බාහන කරවා නම් පචිති ඇවැත් වේ.

**අනාපත්ති**: ගිලන් වූවාට ද ආපදයෙහි ද උමතු වූවාට ද ... ආදි-කම්මික වූවාට ද ඇවැත් නැති.

**අට–නව–දසවැනි ශික්ෂාපද යි.**

## 4. 9. 11

## එකොළොස් වැනි ශික්ෂාපදය

1. සැවැත් නිදාන යි – එසමයෙහි මෙහෙණහු මහණකු ඉදිරියෙහි නො විචාරා අසුන්හි හිඳගනිති. මහණහු අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මෙහෙණහු මහණකු ඉදිරියෙහි නො විචාරා අසුන්හි හුන්හු ද"යි ... සැබෑ ද මහණෙනි, මෙහෙණහු මහණක්හු පෙරට වැ නො විචාරා අසුන්හි හිඳිත් ලැ''යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහු ... කෙසේ නම් මහණෙනි, මෙහෙණහු මහණක්හු පෙරට වැ නො විචාරා අසුන්හි හුන්හු ද? මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**"යම් මෙහෙණක් මහණක්හු පෙරට වැ නො විචාරා අස්නෙකැ හිඳගන්නී නම් පචිති ඇවැත් වේ"යයි.**

2. **යා පන** යනු: යම්, යම් බඳු ... **භික්ඛුනී** යනු ... මේ මේ අර්ථයෙහි අභිප්‍රෙත **භික්ඛුනී** යි.

**භික්ඛුස්ස පුරතො** යනු: උපසපනක්හු පෙරට වැ.

**අනාපුච්ඡා** යනු: අපලොකන නො කොට.

**ආසනෙ නිසීදෙය්‍ය** යනු: යටත් පිරිසෙයින් බිම ද හිඳී නම් පචිති ඇවැත් වේ.

නො විචාළ කල්හි නො විචාළ සංඥා ඇති වැ අස්නෙහි හිඳී නම් පචිති ඇවැත් වෙයි. නො විචාළ කල්හි විමති ඇති වැ අස්නෙහි හිඳී නම් පචිති ඇවැත් වෙයි. නො විචාළ කල්හි විචාළ සංඥා ඇති වැ අස්-නෙහි හිඳී නම් පචිති ඇවැත් වෙයි.

විචාළ කල්හි නො විචාළ සංඥා ඇති වී නම් දුකුළා ඇවැත් වෙයි. විචාළ කල්හි විමති ඇති වී නම් දුකුළා ඇවැත් වෙයි. විචාළ කල්හි විචාළ සංඥා ඇති වී නම් ඇවැත් නැති.

**අනාපත්ති**: විචාරා අස්නෙහි හිඳී ද ගිලන් වූවාට ද ආපදයෙහි ද උමතු වූවාට ද ... ආදිකම්මික වූවාට ද ඇවැත් නැති.

**එකොළොස් වැනි ශික්ෂාපද යි.**

## ද්වාදසමසික්ඛාපදං

1. සාවත්ථියං විහරති ජෙතවනෙ. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡන්ති. භික්ඛු උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛුනියො අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡිස්සන්ති"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛුනියො අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡන්තී"ති සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ භික්ඛුනියො අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- **භික්ඛුනීති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අනොකාසකතන්ති:** අනාපුච්ඡා.

**භික්ඛුන්ති:** උපසම්පන්නං.

**පඤ්හං පුච්ඡෙය්‍යාති:** සුත්තන්තෙ ඔකාසං කාරාපෙත්වා විනයං වා අභිධම්මං වා පුච්ඡති ආපත්ති පාචිත්තියස්ස. විනයෙ ඔකාසං කාරාපෙත්වා සුත්තන්තං වා අභිධම්මං වා පුච්ඡති ආපත්ති පාචිත්තියස්ස. අභිධම්මෙ ඔකාසං කාරාපෙත්වා සුත්තන්තං වා විනයං වා පුච්ඡති ආපත්ති පාචිත්තියස්ස.

අනාපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා පඤ්හං පුච්ඡති ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ වෙමතිකා පඤ්හං පුච්ඡති ආපත්ති පාචිත්තියස්ස. අනාපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා පඤ්හං පුච්ඡති ආපත්ති පාචිත්තියස්ස.

ආපුච්ඡිතෙ අනාපුච්ඡිතසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ආපුච්ඡිතෙ ආපුච්ඡිතසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ඔකාසං කාරාපෙත්වා පුච්ඡති, අනොදිස්ස ඔකාසං කාරාපෙත්වා යත්ථ කත්ථචි පුච්ඡති; උම්මත්තිකාය -පෙ- ආදිකම්මිකායාති.

දසමසික්ඛාපදං.



Free Distribution www.aathaapi.org

## 4, 9. 12

## දෙළොස්වැනි ශික්ෂාපදය

1. සැවැත් නිදාන යි – එසමයෙහි මෙහෙණහු අවකාශ නො කළ මහණහු අතින් පැන පුළුවුස්ති. මහණහු අවමන් කොට සිතති. නුගුණ කියති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණහු නො කළ අවකාශ ඇති මහණහු අතින් පැන පිළිවිසියාහු ද''යි ... 'සැබෑ ද මහණෙනි, මෙහෙණහු නො කළ අවකාශ ඇති මහණහු අතින් පැන පුළුවුසිත් ලැ'යි. සැබැව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහූ...කෙසේ නම් මහණෙනි, මෙහෙණහු නො කළ අවකාශ ඇති මහණහු අතින් පැන පිළිවිසියාහු ද? මහණෙනි, මෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි...මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් නො කළ අවකාශ ඇති මහණක්හු අතින් පැන පුළුවුස්නී නම් පචිති ඇවැත් වේ'' යයි.**

2. **යා පන** යනු: යම්. යම් බඳු ... **භික්ෂුණී** යනු ... මේ වෙ අර්ථයෙහි අභිප්‍රෙත භික්‍ෂුනි යි.

**අනොකාසකතං** යනු: නො විචාරා.

**භික්ඛුං** යනු: උපසපනක්හු

**පඤ්හං පුච්ඡෙය්‍ය** යනු: සූත්‍රාන්තයෙහි අවකාශ කරවා විනය හෝ අභිධර්මය හෝ පුළුවුසී නම් පචිති ඇවැත් වෙයි. විනයෙහි අවකාශ කරවා සූත්‍රාන්තය හෝ අභිධර්මය හෝ පුළුවුසී නම් පචිති ඇවැත් වෙයි. අභිධර්මයෙහි අවකාශ කරවා සූත්‍රාන්තය හෝ විනය හෝ පුළුවුසී නම් පචිති ඇවැත් වේ.

අවකාශ නො කළ කල්හි අවකාශ නො කළ සංඥා ඇති වැ පැන පුළුවුසී නම් පචිති ඇවැත් වෙයි. අවකාශ නො කළ කල්හි විමති ඇති වැ පැන පුළුවුසී නම් පචිති ඇවැත් වෙයි. අවකාශ නො කළ කල්හි අවකාශ කළ සංඥා ඇතිවැ පැන පුළුවුසී නම් පචිති ඇවැත් වෙයි.

අවකාශ කළ කල්හි අවකාශ නො කළ සංඥා ඇති වී නම් දුකුළා ඇවැත් වෙයි. අවකාශ කළ කල්හි විමති ඇති වී නම් දුකුළා ඇවැත් වෙයි. අවකාශ කළ කල්හි අවකාශ කළ සංඥා ඇති වී නම් ඇවැත් නැති.

**අනාපත්ති:** අවකාශ කරවා පුළුවුසී ද, අවධි නො කොට, අවකාශ කරවා යම් කිසි නැගෙන පුළුවුසී ද, උමතු වූවාට ද ... ආදි කම්මික වූවාට ද ඇවැත් නැති.

**දෙළොස්වැනි ශික්ෂාපද යි.**



Free Distribution www.aathaapi.org

## තෙරසමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී අසඞ්කච්චිකා[1] ගාමං පිණ්ඩාය පාවිසි. තස්සා රථිකාය වාතමණ්ඩලිකා සඞ්ඝාටියො උක්ඛිපිංසු. මනුස්සා උක්කුට්ඨිං අකංසු සුන්දරා අය්‍යාය ථනුදරන්ති[2]. සා භික්ඛුනී තෙහි මනුස්සෙහි උප්පණ්ඩියමානා මඞ්කු අහොසි. අථ ඛො සා භික්ඛුනී උපස්සයං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම භික්ඛුනී අසඞ්කච්චිකා ගාමං පවිසිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ, භික්ඛුනී අසඞ්කච්චිකා ගාමං පාවිසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ, භික්ඛුනී අසඞ්කච්චිකා ගාමං පවිසිස්සති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු:

**"යා පන භික්ඛුනී අසඞ්කච්චිකා ගාමං පවිසෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යා පනාති:** යා යාදිසා -පෙ- භික්ඛුනීති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

**අසඞ්කච්චිකාති:** විනා සංකච්චිකං.

**සංකච්චිකා** නාම:[3] අධක්ඛකං උබ්භනාභි තස්ස පටිච්ඡාදනත්ථාය.

**ගාමං පවිසෙය්‍යාති:** පරික්ඛිත්තස්ස ගාමස්ස පරික්ඛෙපං අතික්කාමෙන්තියා ආපත්ති පාචිත්තියස්ස. අපරික්ඛිත්තස්ස ගාමස්ස උපචාරං ඔක්කමන්තියා ආපත්ති පාචිත්තියස්ස.

**අනාපත්ති:** අච්ඡින්නචීවරිකාය, නට්ඨචීවරිකාය, ගිලානාය, අසතියා, අජානන්තියා, ආපදාසු, උම්මත්තිකාය ආදිකම්මිකායාති.

තෙරසමසික්ඛාපදං.

## ඡත්තුපාහනවග්ගො නවමො

උද්දිට්ඨා ඛො අය්‍යායො ඡසට්ඨිසතා පාචිත්තියා ධම්මා. තත්ථාය්‍යායො පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථාය්‍යායො. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

---

1. අසඞ්කච්චිකා,- සයා.
2. සුන්දරො අය්‍යාය ථනුදරොති-සිමු.
3. සංකච්චිකං නාම-මජසං.



Free Distribution www.aathaapi.org

## තෙළෙස්වැනි ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩවෙසෙති. එසමයෙහි එක්තරා මෙහෙණක් සඞ්කච්චිකා (සැට්ටය) රහිත වැ පිඩු පිණිස ගමට වන. වීථියෙහි වාසුළි ඇගේ සඟළ සිවුරු නඟාලී යැ. මිනිස්සු ආයඹාවගේ පයොධර හා උදරය සුන්දර යැ යි ඔල්වරසන් නැඟූහ. ඒ මෙහෙණ ඒ මිනිසුන් විසින් කෙළිකවට කරනු ලබන්නී මකු වූ ය. ඉක්බිති ඒ මෙහෙණ මෙහෙණවරට ගොස් මෙහෙණන්ට තෙල කරුණ දැන්වූ. යම් ඒ මෙහෙණ කෙනෙක් අල්පේච්ඡ වූවාහු ... ඔහු අවමන් කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් මෙහෙණ සඞ්කච්චිකා රහිත වැ ගමට පිවිසියා ද''යි. –පෙ– සැබෑ ද මහණෙනි, මෙහෙණක් සඞ්කච්චිකා රහිතවැ ගමට පිවිසියා ද යි. සැබැව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරැහුව ... කෙසේ නම් මහණෙනි, මෙහෙණක් සඞ්කච්චිකා රහිත වැ ගමට පිවිසියා ද? මහණෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මහණෙනි, මෙහෙණහු මෙසේත් මේ ශික්ෂාපදය උදෙසත්වා:

**''යම් මෙහෙණක් සඞ්කච්චිකා රහිත වැ ගම් වදී නම් පචිති ඇවැත් වේ''යයි.**

2. **යා පන** යනු: යම්, යම් බඳු ... භික්ෂුණී යනු ... මේ මේ අර්ත්ථයෙහිලා අභිප්‍රෙත භික්ෂුණී යි.

**අසඞ්කච්චිකා** යනු: සඞ්කච්චිකාව නැති වැ.

**සඞ්කච්චිකා** නම්: අකු ඇටින් යට, නාභියෙන් උඩ. එය වසනු සඳහා.

**ගාමං පවිසෙය්‍ය** යනු: පිරිකෙව් කරන ලද ගම්හි පිරිකෙව් ඉක්මවන්නියට පචිති ඇවැත් වෙයි. පිරිකෙව් නොකළ ගම්හි උපචාරයට බැසගන්නියට පචිති ඇවැත්වෙ යි.

**අනාපත්ති**: අසිදැගත් සිවුරු ඇතියාට, නට සිවුරු ඇතියාට, ගිලන් වූවාට, නොසිහියෙන් ගියාට, නොදන්නියට, ආපදයෙහි, උමතු වූවාට, ... ආදිකම්මික වූවාට ද ඇවැත් නැති.

**තෙළෙස් වැනි ශික්ෂාපද යි.**

## නවවැනි ඡත්තුපාහන වර්ග යි.

ආයඹාවෙනි, එක්සිය යසැටක් පාචිත්තිය ධර්මයෝ උදෙසන ලදහ. එහි ලා ආයඹාවන් පුළුවුස්මි. කිම පිරිසුදු වූහු ද? දෙවනවට ද පුළුවුස්මි. කිම පිරිසුදු වූහු ද? තෙවනවට ද පුළුවුස්මි. කිම පිරිසුදු වූහුද? මෙහිලා ආයඹාවෝ පිරිසුදු වෙති. එහෙයින් තුෂ්ණිම්භූතයහ. තෙල මෙසේ ධරමි'යි.



Free Distribution www.aathaapi.org

තස්සුද්දානං:

ඡත්තං යානඤ්ච සඞ්ඝාණි ලඞ්කාරා ගන්ධ පිඤ්ඤාකා
භික්ඛුනී සික්ඛමානා ච සාමණෙරා ගිහිනියා
'අනාපුච්ඡා අනොකාසා අසඞ්කච්චිකාය තෙරසා'ති.

වග්ගුද්දානං:

ලසුණං අන්ධකාරඤ්ච නග්ගා තුවට්ටකෙන ච
චිත්තා'රාම ගබ්භිනී ච කුමාරි ඡත්තුපාහනාති.

ඛුද්දකං නිට්ඨිතං.



Free Distribution www.aathaapi.org

**එහි උද්දානය:**

ඡත්‍ර යැ යාන යැ සඞ්ඝාණි යැ අලඞ්කාර යැ ගන්ධපිණ්ණාක යැ භික්ඛුනී සික්ඛමානා සාමණෙරා ගිහීනී සම්බන්ධ උම්මද්දන පරිමද්දන සික්ඛා යැ අනාපුච්ඡා යැ අනොකාස යැ අසඞ්කච්චිකා යි සික්ඛා තෙළෙසකි.

**වර්ග උද්දානය:**

ලසුන යැ අන්ධකාර යැ නග්න යැ තුවට්ටක යැ චිත්තාරාම යැ ගබ්භිනී යැ කුමාරී යැ ඡත්තුපාහන යි.

**ඛුද්දකය නිමි.**

# පාටිදෙසනීයා

## පඨමපාටිදෙසනීයසික්ඛාපදං

**ඉමෙ ඛො පනාය්‍යායො අට්ඨ පාටිදෙසනීයා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති :**

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති : ''කථං හි නාම භික්ඛුනියො සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති. කස්ස සම්පන්නං න මනාපං, කස්ස සාදුං න රුච්චතී''ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා –පෙ– තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති''ති –පෙ– සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ගිලානා හොන්ති. ගිලානපුච්ඡිකා භික්ඛුනියො ගිලානා භික්ඛුනියො එතදවොචුං: ''කච්චි අය්‍යෙ ඛමනීයං කච්චි යාපනීය''න්ති. ''පුබ්බෙ මයං අය්‍යෙ සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජාම. තෙන නො ඵාසු හොති. ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න විඤ්ඤාපෙම. තෙන නො න ඵාසු හොතී''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ– ''අනුජානාමි භික්ඛවෙ ගිලානාය භික්ඛුනියා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිතුං''. එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**යා පන භික්ඛුනී අගිලානා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති.**

4. **යා පනාති:** යා යාදිසා –පෙ– **භික්ඛුනීති** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.



Free Distribution www.aathaapi.org

# පාටිදෙසනීය

## පළමු පිළිදෙස්නී සිකපදය

ආර්යාවෙනි, මේ අෂ්ටපාටිදෙසනීය ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩැ වෙසෙති. එසමයෙහි සවග මෙහෙණෝ ගිතෙල් විනවා වළඳත්. මිනිස්සු ලමුකොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් මෙහෙණෝ ගිතෙල් විනවා වැළඳූහු ද" යි. කවරකුහට මිහිරිද්දය නො මැනැවි ද, කවරකුහට රසවත්ද්දය නො රුස්නේ ද යි. භික්ෂුණීහු ලමුකොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමුකොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් සවග මෙහෙණෝ ගිතෙල් විනවා වැළඳූහුද" යි ... සැබෑද මහණෙනි සවග මෙහෙණෝ ගිතෙල් විනවා වළඳත්දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ ගිතෙල් විනවා වැළඳූහුද. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නොවෙයි ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසන්වා.

**යම් මෙහෙණක් ගිතෙල් විනවා වළඳා නම් ඒ මෙහෙණ විසින් ආර්යාවෙනි ගැරහිය යුතුවූ නුසුදුසුවූ පිළිදෙස්නට නිසි ඇවතකට පැමිණියෙමි. එය පිළිදෙසමි යි පටිදෙසනා කළයුතුයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් මෙහෙණන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි මෙහෙණෝ ගිලන්වූවාහු වෙති. ගිලනුන් පුළුවුස්නා මෙහෙණෝ ගිලන් මෙහෙණන්හට තෙල කරුණ කීහු. "කිමෙක්ද ආර්යාවෙනි ඉවසියහැකිද යැපිය හැකිද්ද" යි. "ආර්යාවෙනි ඇපි පෙර ගිතෙල් විනවා වළඳමු. එයින් අපට පහසු වෙයි. දැන් වනාහි භාග්‍යවතුන් විසින් පිළිකෙව් කරන ලදැයි කුකුස්කරන්නමෝ නො විනවමු. එයින් අපට පහසු නො වෙයැ" යි. තෙල කරුණ භාග්‍යවතුන්හට ඇරෑජූහ....මහණෙනි ගිලන් මෙහෙණහට ගිතෙල් විනවා බුදින්නට අනුදනිමි. මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසන්වා.

**යම් මෙහෙණක් නොගිලන්වූවා ගිතෙල් විනවා වළඳා නම් ඒ මෙහෙණ විසින් ආර්යාවෙනි ගැරහියයුතු වූ නුසුදුසු වූ පිළිදෙස්නට නිසි ඇවැතකට පැමිණියෙමි, එය පිළිදෙසමියි.**

4. යා පන යනු: යම් යම්බඳු ... භික්ෂුණී යනු ... මෝ නොමෝ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද මෙහෙණ යි.



Free Distribution www.aathaapi.org

අගිලානා නාම: යස්සා විනා සප්පිනා ඵාසු හොති. ගිලානා නාම: යස්සා විනා සප්පිනා න ඵාසු හොති. සප්පි නාම: ගොසප්පි වා අජිකා සප්පි වා මාහිසං වා සප්පි[1]. යෙසං මංසං කප්පති තෙසං සප්පි.

අගිලානා අත්තනො අත්ථාය විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස.

අගිලානා අගිලානසඤ්ඤා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස. අගිලානා වෙමතිකා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස. අගිලානා ගිලානසඤ්ඤා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස.

ගිලානා අගිලානසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ගිලානා වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ගිලානා ගිලානසඤ්ඤා අනාපත්ති.

**අනාපත්ති:** ගිලානාය ගිලානා හුත්වා විඤ්ඤාපෙත්වා අගිලානා භුඤ්ජති, ගිලානාය සෙසකං භුඤ්ජති, ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, උම්මත්තිකාය, ආදිකම්මිකායාති.

පඨමපාටිදෙසනීයසික්ඛාපදං.

## දුතිය—අට්ඨම පාටිදෙසනීයසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො තෙලං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති. -පෙ- මධුං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති -පෙ- ඵාණිතං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති -පෙ- මච්ඡං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති -පෙ- මංසං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති -පෙ- ඛීරං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති -පෙ- දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම භික්ඛුනියො දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති, කස්ස සම්පන්නං න මනාපං, කස්ස සාදුං න රුච්චතී"ති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

1. මහිංසසප්පිවා, මජසං



Free Distribution www.aathaapi.org

**අගිලානා** නාම: යමකට ගිතෙලින් වෙන්වැ පහසු වේ නම් හෝ යැ. ගිලානා නාම: යමකට ගිතෙලින් වෙන්වැ පහසු නො වේ නම් හෝ යැ. **සප්පි** නාම: ගව ගිතෙල් හෝ එළු ගිතෙල් හෝ මීහි ගිතෙල් හෝ යි. යම් කෙනකුන්ගේ මස් කැප නම් ඔවුන්ගේ ගිතෙල් යැ.

නොගිලන්වූවා තමා උදෙසා විනවා නම් පියෝහි දුකුළා යැ. පිළිලැබීමෙන් වළඳන්නෙමියි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලාගෙහි පරගලාගෙහි පිළිදෙස්නී ඇවැත් වේ.

නොගිලන්වූවා නොගිලන්සන් ඇතිවැ ගිතෙල් විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වෙයි. නොගිලන්වූවා විමති ඇතිවැ ගිතෙල් විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වෙයි. නොගිලන්වූවා ගිලන්-සන් ඇතිවැ ගිතෙල් විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වේ.

ගිලන්වූවා නොගිලන්සන් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන්වූවා විමතිඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන්වූවා ගිලන්සන් ඇතියා නම් ඇවැත් නැති.

**අනාපත්ති:** ගිලනහට ගිලනක්වැ විනවා නොගිලනක්වැ වළඳා නම්, ගිලනකගේ ශෙෂය වළඳා නම්, නෑයන්ගේ, පැවරීයන්ගේ, අනෙකක්හු උදෙසා නම්, තමාගේ ධනයෙන්, උන්මත්තිකාවට, ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පළමු පිළිදෙස්නී සිකපදය නිමි.**

## දෙවන – අටවන පිළිදෙස්නී සිකපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි සවග මෙහෙණෝ තලතෙල් විනවා වළඳත්. ... මී විනවා වළඳත් ... උක්පැණි විනවා වළඳත් ... දියමස් විනවා වළඳත් ... ගොඩමස් විනවා වළඳත් ... කිරි විනවා වළඳත් ... දිහි විනවා වළඳත්. මිනිස්සු ලමුකොට සිතති. නුගුණ පවසති. දෙස්පතුරුවත්. "කෙසේ නම් මෙහෙණෝ දිහි විනවා ගෙන වැළඳූහුදැ" යි. කවරකුහට මීහිරිදය නොමැනැවිද, කවරකුහට රසවත්දය නොරුස්නේ දැ යි. භික්ෂුණීහු ලමුකොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. කෙසේ නම් සවග මෙහෙණෝ දිහි විනවා වැළඳූහුදැ යි ... සැබෑද මහණෙනි සවග මෙහෙණෝ දිහි විනවා වළඳත්දැයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු විගෑරූහු ... කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ දිහි විනවා වැළඳූහුද. මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.



Free Distribution www.aathaapi.org

යා පන භික්ඛුනී දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති.

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ගිලානා හොන්ති. ගිලානපුච්ඡිකා භික්ඛුනියො ගිලානා භික්ඛුනියො එතදවොචුං: "කච්චි අය්‍යෙ ඛමනීයං කච්චි යාපනීය"න්ති. "පුබ්බෙ මයං අය්‍යෙ දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජාම[1]. තෙන නො ඵාසු හොති. ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න විඤ්ඤාපෙම. තෙන නො න ඵාසු හොතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ ගිලානාය භික්ඛුනියා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිතුං". එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

යා පන භික්ඛුනී අගිලානා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති.

4. යා පනාති: යා යාදිසා -පෙ- භික්ඛුනීති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා භික්ඛුනීති.

අගිලානා නාම: යස්සා විනා දධිනා ඵාසු හොති. ගිලානා නාම: යස්සා විනා දධිනා න ඵාසු හොති. තෙලං නාම: තිලතෙලං සාසපතෙලං මධුකතෙලං එරණ්ඩතෙලං වසාතෙලං. මධු නාම: මක්ඛිකාමධු. ඵාණිතං නාම: උච්ඡුම්හා නිබ්බත්තං. මච්ඡො නාම: ඕදකො වුච්චති. මංසං නාම: යෙසං මංසං කප්පති තෙසං මංසං. ඛීරං නාම: ගොඛීරං වා අජිකාඛීරං වා මාහිසඛීරං වා, යෙසං මංසං කප්පති තෙසං ඛීරං. දධි නාම: තෙසඤ්ඤෙව දධිං.

අගිලානා අත්තනො අත්ථාය විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස. අගිලානා ගිලානසඤ්ඤා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස.

අගිලානා අගිලානසඤ්ඤා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස. අගිලානා වෙමතිකා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස. අගිලානා ගිලානසඤ්ඤා දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස.

ගිලානා අගිලානසඤ්ඤා ආපත්ති දුක්කටස්ස. ගිලානා වෙමතිකා ආපත්ති දුක්කටස්ස. ගිලානා ගිලානසඤ්ඤා අනාපත්ති.

1 භුඤ්ජිම්හා – මජසං,



Free Distribution www.aathaapi.org

**යම් මෙහෙණක් දිහි විනවා වළඳා නම් ඒ මෙහෙණ විසින් ආයර්‍යාවෙනි ගැරහියයුතු වූ නුසුදුසු වූ පිළිදෙස්නට නිසි ඇවැතකට පැමිණියෙමි. එය පිළිදෙසමියි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් මෙහෙණන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි මෙහෙණෝ ගිලන්වූවාහු වෙති. ගිලනුන් පුළුවුස්නා මෙහෙණෝ ගිලන් මෙහෙණන්හට මෙල කරුණ කීහු. ''කිමෙක්ද ආයර්‍යාවෙනි ඉවසියහැකිද කිම යැපියහැකිද''යි. ''ආයර්‍යාවෙනි, ඇපි පෙර දිහි විනවා වළඳමු. එයින් අපට පහසුවෙයි. දැන් වනාහි භාග්‍යවතුන් විසින් පිළිකෙව් කරනලදැයි කුකුස්කරන්නාමෝ නො විනවමු. එයින් අපට පහසු නො වේයැ'' යි. මෙල කරුණ භාග්‍යවතුන් හට ඇරෙවුහු. ... මහණෙනි, ගිලන් මෙහෙණහට දිහි විනවා බුදින්නට අනුදනිමි. මෙසේද මහණෙනි, මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**යම් මෙහෙණක් නොගිලන්වූවා දිහි විනවා වළඳා නම් ඒ මෙහෙණ විසින් 'ආයර්‍යාවෙනි ගැරහියයුතු වූ නුසුදුසු වූ පිළිදෙස්නට නිසි ඇවැතකට පැමිණියෙමි, එය පිළිදෙසමියි පටිදෙසනා කළයුතු යි.**

4. **යා පන යනු:** යම් යම්බඳු ... **භික්ඛුනී** යනු ... මෝතොමෝ මේ අර්‍ථයෙහිලා අදහස් කරන ලද මෙහෙණයි.

**අගිලානා** නම්: යමකට දිහියෙන් වෙන්වැ පහසු වේ නම් හෝ යැ. **ගිලානා** නම් යමකට දිහියෙන් වෙන්වැ පහසු නො වේ නම් හෝ යැ. **තෙල** නම් තලතෙල්, අබතෙල්, මීතෙල්, එරඬුතෙල්, වුරුණුතෙල් යැ. **මධු** නම් මැසිමීයැ, **ඵාණිත** නම් උක්පැණි යැ. **මච්ඡ** නම් දියමසයැයි කියනු ලැබේ. **මංස** නම් යම්කෙනකුන්ගේ මස් කැප නම් ඔවුන්ගේ මස්යැ, **ඛීර** නම් ගවකිරි හෝ එළුකිරි හෝ මීකිරි හෝ යම්කෙනකුන්ගේ මස් කැපනම් ඔවුන්ගේ කිරි යැ. **දධි** නම් ඔවුන්ගේමැ දිහියැ.

නොගිලන්වූවා තමා උදෙසා විනවා නම් පියෝහි දුකුළා යැ. පිළිලැබීමෙන් වළඳන්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වේ. පරගලායෙහි පරගලායෙහි පිළිදෙස්නී ඇවැත් වේ.

නොගිලන්වූවා නොගිලන්සත් ඇතිවැ දිහි විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වෙයි. නොගිලන්වූවා විමති ඇතිවැ දිහි විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වෙයි. නොගිලන්වූවා ගිලන්සත් ඇතිවැ දිහි විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වේ.

ගිලන්වූවා නොගිලන්සත් ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන්වූවා විමති ඇතියා නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන්වූවා ගිලන්සත් ඇතියා නම් ඇවැත් නැති.



Free Distribution www.aathaapi.org

අනාපත්ති: ගිලානාය ගිලානා හුත්වා විඤ්ඤාපෙත්වා අගිලානා භුඤ්ජති, ගිලානාය සෙසකං භුඤ්ජති, ඤාතකානං පවාරිතානං අඤ්ඤස්සත්ථාය අත්තනො ධනෙන උම්මත්තිකාය ආදිකම්මිකායාති.

අට්ඨමපාටිදෙසනීයසික්ඛාපදං.

7. උද්දිට්ඨා ඛො අය්‍යායො අට්ඨපාටිදෙසනීයා ධම්මා. තත්‍ථය්‍යායො පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්‍ථය්‍යායො, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

පාටිදෙසනීයානිට්ඨිතා.

## 6. සෙඛියා

ඉමෙ ඛො පනය්‍යායො සෙඛියාධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්ති[1] නිවාසෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම භික්ඛුනියො පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්ති නිවාසෙස්සන්ති සෙය්‍යථාපි ගිහීකාමභොගිනියොති. අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්ති නිවාසෙස්සන්තීති -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්ති නිවාසෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්ති නිවාසෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයාති.

3. පරිමණ්ඩලං නිවාසෙතබ්බං නාභිමණ්ඩලං ජාණුමණ්ඩලං පටිච්ඡාදෙන්තියා. යා අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්ති නිවාසෙති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච, අසතියා, අජානන්තියා, ගිලානාය ආපදාසු -පෙ- උම්මත්තිකාය ආදිකම්මිකායාති.

---

1 ඔලම්බෙත්වා, සිමු i සිමු ii,



Free Distribution www.aathaapi.org

**අනාපත්ති** ගිලනහට, ගිලනක් ව ව විනවා නොගිලනක් වැ වළඳා නම්, ගිලනකගේ ශෙෂය වළඳා නම්, නෑයන්ගේ නම්, පැවරියන්ගේ නම්, අනෙකක්හු උදෙසා නම්, තමාගේ ධනයෙන් නම්, උමතුවූවකට, ආදිකම්මිකාවට ඇවැත් නැති.

**අටවැනි පිළිදෙස්නී සිකපදයි.**

ආයුෂ්මවෙනි අෂ්ට පාටිදෙසනීය ධර්මයෝ උදෙසන ලදහ. එහිලා ආයුෂ්මාවන් පුළුවුස්මි, කිම පිරිසුදු වවූද? දෙවනවට ද පුළුවුස්මි, කිම පිරිසුදු වවූද? තෙවනවට ද පුළුවුස්මි, කිම පිරිසුදුවවූ ද? මෙහිලා ආයුෂ්මවෝ පරිශුද්ධයහ. එහෙයින් තුෂ්ණීම්භූතයහ. මෙල කරුණ මෙසේ දරමියි.

**පාටිදෙසනීය ශික්ෂා නිමි.**

## 6. සෙඛියා

ආයුෂ්මවෙනි මේ සෙඛියධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරමහි වැඩැ වෙසෙති. එසමයෙහි සවග මෙහෙණෝ ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් හඳිත්. මිනිස්සු ලමුකොට සිතති නුගුණ පවසති දෙස් පතුරුවත්. කෙසේ නම් මෙහෙණෝ කාමභොගී ගිහියන් මෙන් ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් හැන්දහුදැයි.

2. භික්ෂුණීහු ලමුකොට සිතන නුගුණපවසන දෙස්පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මෙහෙණෝ ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් හැන්දහුදැයි ... සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් හඳිත්දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් හැන්දහුද? මහණෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නොවෙයි ... මහණෙනි මෙසේ මේ සිකපදය ද මෙහෙණෝ උදෙසත්වා.

**පිරිමඬුලු කොට හඳින්නෙමියි හික්මිය යුතු යි.**

3. නැබමඬල දණමඬල වසන්නිය විසින් පිරිමඬුලු කොට හැන්ද යුතුයි. යම් මෙහෙණක් අනාදරිය පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් හඳිනම් දුකුළා ඇවැත් වෙයි.

**අනාපත්ති:** නො සිතා කරන්නියට, නො සිහියෙන්කරන්නියට, නො දන්නියට, ගිලනහට, ආපදයෙහි ... උමතුඇතියාහට, ආදිකම්මිකාවට ඇවැත් නැති.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරොන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති, "කථං හි නාම භික්ඛුනියො උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො"ති.[1]

අස්සොසුං ඛො භික්ඛුනියො තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛියන්තානං විපාචෙන්තානං.

2. යා තා භික්ඛුනියො අප්පිච්ඡා -පෙ- තා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති, "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරිස්සන්ති"ති. අථ ඛො භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛුසංඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි, සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරොන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛුනියො උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**න උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයාති.**

එවඤ්චිදං භගවතා භික්ඛුනීනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

4. තෙන ඛො පන සමයෙන ගිලානා භික්ඛුනියො උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කාතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ ගිලානාය භික්ඛුනියා උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කාතුං". එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු.

**න උදකෙ අගිලානා උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයාති.**

5. න උදකෙ අගිලානාය උච්චාරො වා පස්සාවො වා ඛෙළො වා කාතබ්බො. යා අනාදරියං පටිච්ච උදකෙ අගිලානා උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොති ආපත්ති දුක්කටස්ස.

---

1. ගිහිනියො කාමභොගිනියො—මජ්ඣං
ගිහිකාමභොගිනියො—සිමු



Free Distribution www.aathaapi.org

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැ වෙසෙති. එසමයෙහි සවග මෙහෙණෝ කාමභොගී ගිහියන් මෙන් දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කෙරෙත්. මිනිස්සු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්, ''කෙසේ නම් මෙහෙණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කොළෝද''යි.

**භික්ෂුණීහු** ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු.

2. යම් ඒ මෙහෙණ කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමුකොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මෙහෙණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කොළෝ දැයි. එකල්හි මෙහෙණෝ මහණුන්හට තෙල කරුණ ඇරෝජූහු. මහණුහු තෙල කරුණ භාග්‍යවතුන්හට සැලකළහ.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙහිලා මේ අවසරයෙහිලා බික්සඟන රැස්කරවා දහැමි කථා කොට මහණුන් පුළුවුත් සේක. සැබෑද මහණෙනි, සවග මෙහෙණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කෙරෙත්ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... ''කෙසේ නම් මහණෙනි සවග මෙහෙණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කොළෝ දැයි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළගැසීම හෝ නොකරන්නෙමි යි හික්මිය යුතු යි.**

මෙසේත් වනාහි භාග්‍යවතුන් විසින් මේ සිකපදය මෙහෙණන්හට පනවන ලද්දේ වෙයි.

4. එසමයෙහි ගිලන් වූ මෙහෙණෝ දියෙහි මහදියටනුද සුළුදියටනුද කෙළගැසීම ද කරන්නට කුකුසත්. තෙල කරුණ භාග්‍යවතුන්හට සැලකළහ...මහණෙනි ගිලන්මෙහෙණහට දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කරන්නට අනුදනිමි. මෙසේද මහණෙනි මෙහෙණෝ මේ සිකපදය උදෙසත්වා.

**නො ගිලන්වැ දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළගැසීම හෝ නොකරන්නෙමි යි හික්මිය යුතු යි.**

5. නොගිලන විසින් දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළගැසීම හෝ නොකළ යුතු යි. යම් මෙහෙණක් අනාදරීය පිණිස නොගිලන්වැ දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළගැසීම හෝ කරා නම් දුකුළා ඇවැත් වේ.



Free Distribution www.aathaapi.org

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තියා ගිලානාය ථලෙකතො උදකං ඔත්ථරති, ආපදාසු උම්මත්තිකාය ඛිත්තචිත්තාය වෙදනට්ටාය ආදිකම්මිකායාති.

### පණ්ණරසමසික්ඛාපදං.

උද්දිට්ඨා ඛො අය්‍යායො සෙඛියා ධම්මා. තත්‍ථාය්‍යායො පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්‍ථාය්‍යායො තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

### සෙඛියා නිට්ඨිතා.

## 7. අධිකරණසමථා

ඉමෙ ඛො පනාය්‍යායො සත්ත අධිකරණසමථා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දාතබ්බො, සතිවිනයො දාතබ්බො, අමූළ්හවිනයො දාතබ්බො, පටිඤ්ඤාය කාරෙතබ්බං, යෙභුය්‍යසිකා තස්සපාපිය්‍යසිකා තිණවත්‍ථාරකොති.

2. උද්දිට්ඨා ඛො අය්‍යායො සත්ත අධිකරණසමථා ධම්මා. තත්‍ථ අය්‍යායො පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්‍ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්‍ථාය්‍යායො තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

### අධිකරණසමථා නිට්ඨිතා

3. උද්දිට්ඨං ඛො අය්‍යායො නිදානං, උද්දිට්ඨා අට්ඨපාරාජිකා ධම්මා, උද්දිට්ඨා සත්තරස සඞ්ඝාදිසෙසා ධම්මා, උද්දිට්ඨා තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා ඡසට්ඨිසතා පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා අට්ඨපාටිදෙසනීයා ධම්මා, උද්දිට්ඨා සෙඛියා ධම්මා, උද්දිට්ඨා සත්ත අධිකරණසමථා ධම්මා, එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති. තත්‍ථ සබ්බාහෙව සමග්ගාහි සම්මොදමානාහි අවිවදමානාහි සික්ඛිතබ්බන්ති.

### භික්ඛුනීවිභඞ්ගො නිට්ඨිතො.

### පාචිත්තියපාළි නිට්ඨිතා.

---



Free Distribution www.aathaapi.org

**අනාපත්ති:** නොසිතා කරන්නියට, නො සිහියෙන් කරන්නියට, නො දන්නියට, ගිලනහට, ගොඩබිම කරන ලද්ද දියටබැසයේ නම්, ආපදයෙහි, උමතුඇතියාට, විසුරුණු සිත් ඇතියාට, වෙදනායෙන් පෙළුණියට, ආදිකම්මිකාවට ඇවැත් නැති.

**පසළොස්වනු සිකපද යි.**

ආයාවෙනි සෙඛියධම්යෝ උදෙසන ලදහ. එහිලා ආයාවන් පුළුවුස්මි. කිම පිරිසුදු වවුද? දෙවනවටද පුළුවුස්මි, කිම පිරිසුදුවවු ද? තෙවනවට ද පුළුවුස්මි, කිම පිරිසුදුවවු ද? මෙහිලා ආයාවෝ පරිශුද්ධයහ. එහෙයින් තුෂ්ණිම්භූතයහ. තෙල කරුණ මෙසේ දරමි යි.

**සෙඛිය ශික්‍ෂා නිමි.**

## 7. අධිකරණසමථ

ආයාවෙනි මේ සප්ත අධිකරණසමථධම්යෝ උදෙසීමට පැමිණෙත්.

1. උපනුපන් **(විවාදදි)** අධිකරණයන්ගේ ශමනය පිණිස ව්‍යුපශමය පිණිස සම්මුඛාවිනය දියයුත්තේ යැ. සතිවිනය දියයුත්තේ යැ, අමූළ්හවිනය දියයුත්තේ යැ. ප්‍රතිඥායෙන් කරවිය යුතුයැ, යෙභුය්‍යසිකායැ, තස්සපාපිය්‍යසිකා යැ, තිණවත්ථාරක යි.

2. ආයාවරුනි සප්ත අධිකරණසමථ ධම්යෝ උදෙසන ලදහ. එහිලා ආයාවන් පුළුවුස්මි, කිම පිරිසුදු වවුද? දෙවනවටද පුළුවුස්මි, කිම පිරිසුදුවවු ද? තෙවනවට ද පුළුවුස්මි, කිම පිරිසුදු වවුද? මෙහිලා ආයාවෝ පරිශුද්ධයහ. එහෙයින් තුෂ්ණිම්භූතයහ. මෙසේ තෙල කරුණ දරමියි.

**අධිකරණසමථයෝ නිමියාහුයි.**

ආයාවෙනි නිදානය උදෙසන ලදී. අෂ්ට පාරාජික ධම්යෝ උදෙසන ලදහ, සතළොස් සඝවෙසෙස් දහම්හු උදෙසන ලදහ. තිස් නිසැගි පචිති දහම්හු උදෙසන ලදහ. එක්සියසසැටක් පචිති දහම්හු උදෙසන ලදහ. අට පිළිදෙස්නි දහම්හු උදෙසන ලදහ. සෙඛිය දහම්හු උදෙසන ලදහ. සත් අධිකරණ සමථ දහම්හු උදෙසන ලදහ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ සූත්‍ර සංඛ්‍යාත භික්‍ෂුණී විභඩ්ගයෙහි ආවාවූ භික්‍ෂුණීවිභඩ්ගයට ඇතුළත් වූ මෙතෙක් ශික්‍ෂාවෝ අඩමසක් පාසා උදෙසීමට පැමිණෙත්. සමඟ වූ සතුටුවන විවාද නො කරන හැමදෙනා විසින් මැ මෙහිලා හික්මිය යුතු යි.

**භික්‍ෂුණී විභඩ්ගය නිමි.**

**පාචිත්තියපාළි නිමියා යැ.**

---



Free Distribution www.aathaapi.org

# පාචිත්තියපාළි භික්ඛුනීවිභඞ්ගය

## සඤ්ඤානාමානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| අචිරවතී | 184 |
| අනාථපිණ්ඩික | 30, 34, 40, 134, 184, 208, 234, 256, 350 |
| අරිට්ඨගද්ධබාධිපුබ්බ | 18 |
| කටමොරකතිස්සක | 344 |
| කපිලවත්ථු | 142, 274 |
| කලන්දකනිවාප | 154, 228, 230, 344 |
| කොකාලික | 344 |
| කොසල | 36, 44, 46 |
| කොසලෙසු | 174 |
| ඛණ්ඩදෙවියාපුත්ත | 344 |
| චණ්ඩකාළී | 48, 62, 70, 180, 220, 332 |
| ඡබ්බග්ගියා | 138 |
| ඡබ්බග්ගියා භික්ඛුනියො | 350 |
| ජෙතවන | 2, 14, 24, 30, 34, 40, 42, 44, 46, 158, 184, 234, 256, 350. |
| ථුල්ලනන්දා | 2, 14, 18, 30, 36, 48, 96, 98, 100, 104, 106, 122, 128, 134, 166, 172, 188, 196, 198, 200, 202, 204, 212, 214. 336, 340, 342, |
| දෙවදත්ත | 344 |
| නන්දවතී | 2, 134 |
| නන්දා | 2, 134 |
| නිග්‍රොධාරාම | 142, 274 |
| පසෙනදී කොසලො | 36, 124, 128 |
| භද්දාකාපිලානී | 40, 158, 160, 178, 212 |
| මහාපජාපතීගොතමී | 142 |
| රාජගහ | 154, 228, 230, 344 |
| වෙසාලී | 34 |
| වෙළුවන | 154, 228, 232, 344 |
| සමුද්දදත්ත | 344 |
| සාකෙත | 42, 216 |
| සාවත්ථි | 2, 14, 24, 30, 34, 350 |
| සාළ්හ (මිගාරනත්තා) | 2, 14 |
| සුන්දරීනන්දා | 2, 14, 54, 48, 134 |




Free Distribution www.aathaapi.org

# පාචිත්තියපාළි භික්ඛුනීවිභඞ්ග

## විසෙසපදානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අකතසහායං | 20 |
| අකාලචීවරං | 96,98 |
| අක්ඛන්තියා | 84 |
| අක්ඛමා | 294 |
| අච්චාවදථ | 32 |
| අචිණ්ණතා | 96 |
| අඤ්ඤදත්ථිකෙන | 110, 112, 114, 116, 120 |
| අඤ්ඤුද්දිසිකෙන | 110, 112. 114, 116, 120 |
| අට්ටකාරික | 34 |
| අට්ඨවච්ඡුකා | 26 |
| අඩ්ඪතෙය්‍යකංසපරමං | 130 |
| අඩ්ඪාළහකොදනං | 92 |
| අතිචාරිණී | 34 |
| අධක්ඛක | 8 |
| අධිකරණකාරිකා | 48 |
| අධොවාත | 142 |
| අනධිවාසිකජාතිකා | 294, 314 |
| අනනුඤ්ඤාතං | 342 |
| අනන්තරායිකිනී | 336, 338 |
| අනන්තරිකා | 58 |
| අනපලොකෙත්වා | 278 |
| අනභිරද්ධා | 64 |
| අනාපුච්ඡා | 364 |
| අනුපොසථිකං | 276 |
| අනුවස්සං | 346 |
| අනුවාදධිකරණං | 72 |
| අනුසංවච්ඡරං | 346 |
| අනොසාරිතො | 24 |
| අන්තරවාසක | 48 |
| අන්තොජාත | 34 |
| අන්වද්ධමාසං | 276 |
| අපක්ඛතාය | 86 |
| අපලොකෙත්වා | 342 |
| අප්පඤ්ඤත්තා | 50 |
| අප්පටිකාරං | 18 |
| අප්පධංසිත | 40, 42, 46 |
| අභිධම්මං | 366 |
| අයොපත්තො | 92 |
| අරුණුග්ගමන | 48 |
| අවඤ්ඤාය | 86 |
| අවලෙඛ | 150 |
| අවසතා | 14, 16 |
| අවස්සුත | 4, 54, 60 |
| අවීතික්කමසමාදනං | 300 |
| අසඞ්කච්චිකා | 368 |
| අසද්ධම්මස්ස | 24 |
| අසාතාතං | 294 |

| ආ | |
|---|---|
| ආජීවකසෙය්‍යා | 32 |
| ආදිස්සදින්නං | 98 |
| ආපණිකස්ස | 102, 116 |
| ආපත්තාධිකරණං | 72 |
| ආපන්නසත්තා | 282 |
| ආහතකො | 34 |
| ආමකධඤ්ඤං | 146 |
| ආමන්තිකාපණං | 92 |
| ආරාමූපචාරෙ | 352 |
| ආවසථො | 250 |
| ආසන්දිං | 236 |
| ආහතචිත්තා | 64 |
| ආහුන්දරිකා | 230 |




Free Distribution www.aathaapi.org

## විසෙසපදනුක්කමණිකා


| ඉ | පිටඞ්කා |
|---|---|
| ඉඞ්ග | 58 |
| ඉත්ථාලඞ්කාරං | 356 |
| **උ** | |
| උක්කුටිකං | 290 |
| උක්ඛිත්තානුවත්තිකා | 18, 20 |
| උඤ්ඤය | 84, 86 |
| උදකදන්තපොණ | 56, 60 |
| උදකසාටිකා | 184 |
| උදකසුද්ධිං | 142 |
| උද්දොසිතං | 30 |
| උපස්සයො | 346, 348 |
| උපොසථො | 276 |
| උපාණ්ඩියමාතා | 354 |
| උබ්භක්ඛක | 10 |
| උබ්භජානුමණ්ඩලං | 8 |
| උම්මුකං | 150 |
| උස්සයවාදිකා | 32 |
| උස්සවො | 134 |
| උස්සුක්කං | 336 |
| **ඌ** | |
| ඌනද්වාදසවස්සං | 294, 296 |
| ඌනද්වාදසවස්සා | 326 |
| ඌනවීසතිවස්සං | 314 |
| **එ** | |
| එකින්ද්‍රියං | 228 |
| **ඔ** | |
| ඔවාදෙ | 274, 276 |
| ඔහීන | 46 |
| **ක** | |
| කච්ඡු | 148 |
| කටාහෙ | 150 |
| කටුකාතං | 294 |

| ක | පිටඞ්කා |
|---|---|
| කටූපිකා | 356 |
| කප්පරං | 26 |
| කප්පා | 36, 38 |
| කම්බලං | 124 |
| කයං | 102, 106 |
| කරමරානීත | 34 |
| කලහකාරිකා | 48 |
| කවාටෙන | 162 |
| කහාපණ | 106 |
| **කා** | |
| කාමභොගිනියො | 350, 352 |
| කාලචීවරං | 98 |
| **කි** | |
| කිලඤ්ජකං | 350 |
| කිලඤ්ජෙන | 162 |
| **කු** | |
| කුක්කුච්චිකා | 62, 64 |
| කුඨාරි | 2 |
| කුඩ්ඩෙන | 162 |
| කුද්දාල | 2 |
| කුද්‍රූසකො | 148 |
| කුමාරකසංසට්ඨං | 340 |
| කුම්මාස | 56 |
| කුලානුද්දයතා | 354 |
| කුලූපිකා | 354 |
| **කූ** | |
| කූටාගාරසාලායං | 260 |
| **කො** | |
| කොඨලියා | 164 |
| කොධනා | 340 |
| **ඛ** | |
| ඛරාතං | 294 |




Free Distribution www.aathaapi.org

ඛි — පිට්ඨඞ්කා

ඛිලජාත 64

ඛී

ඛීයනධම්මං 332

ඛෙ

ඛෙත්තපාලො 134

ඛො

ඛොමං 130

ග

ගන්ධවණ්ණකත 358
ගරුපාපුරණං 126
ගරුභාරා 282

ගා

ගාමකාවාසෙ 272

ගි

ගිලානා 350
ගිහී 350, 352
ගිහිගතං 294
ගිහිගතා 304

ගො

ගොධුමො 148

ච

චණ්ඩිං 340
චතුක්කංස පරමං 126
චරණගිලානා 4

චා

චාවලසුත්තෙ 136

චි

චික්ඛල්ලො 268
චිණ්ණමානත්තො 90
චිත්තරූපං 54
චිත්තාගාරං 294

චී — පිට්ඨඞ්කා

චීවරකාලසමයො 202
චීවරසඞ්කමනීයං 194

චෙ

චෙතාපිතං 114
චෙතාපෙන්තියා 126
චේතාපෙය්‍යා 106, 114

ඡ

ඡත්තුපාහනං 350
ඡන්දකං (සංහරිත්වා) 110, 112, 116, 122
ඡන්දගාමිනී 70
ඡසු ධම්මෙසු 286, 288

ජ

ජතුමට්ඨකෙත 140
ජනකා 342

ජි

ජිඝච්ඡාය 294

ඩ

ඩංසමකසවාතාතපසිරිංසප-සම්ඵස්සානං 294

ත

තණ්ඩුලං 116
තල්ලසාතකං 138

ති

තිපොතනං 294

ථ

ථුල්ලදරා 368

දු

දුබ්බලාස 70
දුරාගතානං 294, 314
දුරුත්තානං 294, 314




Free Distribution www.aathaapi.org

## විසෙසපදානුක්කමණිකා


| දෙ | පිට්ඨඞ්කා |
|---|---|
| දෙසගාමිනී | 70 |
| **ධ** | |
| ධනක්කීත | 34 |
| **ධා** | |
| ධාති | 284 |
| **ධු** | |
| ධුත්තා | 224 |
| **නි** | |
| නිකූට | 2 |
| නිබාදන | 2 |
| නිස්සාරණීය | 32 |
| **ප** | |
| පක්ඛමානත්තං | 90 |
| පක්ඛස්ස ඛණ්ඩත්තා | 270 |
| පච්චක්ඛාමි | 62 |
| පච්චාකතා | 72 |
| පටවා | 122 |
| පටිකොක්කාස | 48 |
| පටික්කොසනති | 78 |
| පටිවත්තා | 50 |
| පණ්ඩක | 56 |
| පණ්ඩුපලාසො | 16 |
| පණ්ණවජ්ජත්තං | 350 |
| පත්තවාණිජ්ජං | 92 |
| පත්තවිසත්ථිවසෙනා | 340 |
| පහෙණාදනං | 92 |
| පරික්ඛිත්ත | 46 |
| පරිග්ගහිතා | 342 |
| පරිපුණ්ණද්වාදසවස්සං | 296, 298 |
| පරිපුණ්ණද්වාදසවස්සා | 328, 330 |
| පරිබ්බාජකො | 200 |
| පරිභව්‍යතාය | 86 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පරියුට්ඨිතො | 44 |
| පලණ්ඩුකෙ | 136 |
| පල්ලඞ්කං | 236 |
| පවත්තිනී | 310 |
| පසාඛං | 278 |
| පසාඛෙ (ජාතං) | 276, 278 |
| පසාරෙස්සති | 92 |
| පහූතං | 344 |
| **පා** | |
| පාටඞ්කී | 354 |
| පාණහරානං | 294 |
| පාදකඨලිකං | 50, 264 |
| පාදපීඨං | 50, 264 |
| පාදොදකං | 50 |
| පානීයථාලකං | 144 |
| පාපසද්ද | 76, 78, 84 |
| පාපසිලොකා | 76, 78, 84 |
| පාපාචාරා | 76, 78, 84 |
| පායන්තිං | 284 |
| පාරිවාසික ඡන්දදානෙන | 344 |
| පාවාරිකස්ස | 110, 112 |
| **පි** | |
| පිඤ්ඤාකං | 360 |
| පිපාසාය | 294 |
| **පු** | |
| පුග්ගලිකෙන | 122 |
| පුරිසන්තරගතා | 296, 300 |
| පුරිසසංසට්ඨං | 340 |
| **පූ** | |
| පූග | 36, 116, 118 |
| **පෙ** | |
| පෙත්තිකං | 30 |




Free Distribution www.aathaapi.org

| ඵ | පිට්ඨඞ්කා |
| --- | --- |
| ඵරසු | 2 |
| **බ** | |
| බබ්බුහ | 166 |
| බහාරාමකොට්ඨක | 4 |
| බහිද්වාරකොට්ඨක | 4 |
| **භ** | |
| භඤ්ජනකෙ | 136 |
| භණ්ඩනකාරිකා | 48 |
| භණ්ඩිකෙ | 134 |
| භත්තග්ග | 58 |
| භතකො | 34 |
| භයගාමිනී | 70 |
| භස්සකාරිකා | 48 |
| **භා** | |
| භාණිකා | 122, 124 |
| **ම** | |
| මණ්ඩලබද්ධං | 350 |
| මත්තිකාපත්තා | 92 |
| මහාජනිකෙන | 116, 120 |
| මහිච්ඡා | 126 |
| මුණ්ඩා | 32 |
| **මො** | |
| මොහගාමිනී | 70 |
| **ය** | |
| යවො | 148 |
| **යා** | |
| යාගු | 116, 118 |
| යාවජීවිකං | 268 |
| යාමකාලිකං | 268 |
| **ර** | |
| රත්තන්ධකාරෙ | 158 |
| රථියාය | 354 |
| රථො | 354 |

| රා | පිට්ඨඞ්කා |
| --- | --- |
| රාජාගාරං | 234 |
| **රු** | |
| රුහිතං | 278 |
| **ල** | |
| ලජ්ජිනියො | 62, 64 |
| ලසුනං | 134 |
| ලසුනෙන | 134 |
| ලහුපාපුරණං | 130 |
| ලූඛචීවරා | 96 |
| **ව** | |
| වචනපථානං | 294, 314 |
| වච්චෙන | 46 |
| වජ්ජපටිච්ඡාදිකා | 14, 76, 78, 84 |
| වණ්ණං | 36 |
| වණ්ණපත්තා | 38 |
| වඩ්ඪකිනියො | 32 |
| වැහං | 354 |
| වරකො | 148 |
| වරභණ්ඩං | 36 |
| **වා** | |
| වාතමණ්ඩලිකා | 368 |
| වාසිතකං | 360 |
| වාසිතකෙන පිඤ්ඤාකෙන | 358 |
| වාසි | 2 |
| වාළා | 268 |
| **වි** | |
| විකප්පනූපගපච්ඡිමං | 102 |
| විඝාසං | 150 |
| විවාදකාරිකා | 48 |
| විවාදාධිකරණං | 72 |
| විධූපනෙන | 144 |
| විබ්භන්තා | 270 |
| විස්සර | 4, 44 |




Free Distribution www.aathaapi.org

| වි | පිට්ඨඞ්කා |
|---|---|
| විඝාසෙරා | 354 |
| විසාරද | 122, 124 |
| විහෙසිකා | 76, 78, 84 |
| **වු** | |
| වුට්ඨානසම්මුති | 304, 328 |
| වුට්ඨාපිතං | 310 |
| **වෙ** | |
| වෙහාසා | 84 |
| වෙහාසිකතාය | 86 |
| **වො** | |
| වොහාරිකමහාමත්තා | 30 |
| **ස** | |
| සකටං | 354 |
| සඞ්කච්චිකා | 368 |
| සඞ්කාරං | 150 |
| සඞ්ඝාණි | 354, 356 |
| සංවච්ඡරානි | 338 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සංවාසා | 274 |
| සන්දමානිකා | 354 |
| සලාකාබද්ධං | 350 |
| සහජීවිනිං | 306, 308, 312 |
| **සා** | |
| සාමණෙරා | 362 |
| **සි** | |
| සික්ඛමානා | 286, 362 |
| සික්ඛාසම්මුති | 286, 288, 298 |
| සිවිකා | 354 |
| **සො** | |
| සොකවස්සං | 340 |
| **හ** | |
| හංසයොනිං | 134 |
| හංසරාජං | 136 |
| හරිතකෙ | 136 |




Free Distribution www.aathaapi.org